# දහම් සරණ විවරණය

( ප්‍රථම භාගය )


මුනිදාස කුමාරණතුංග

විසිනි


卐


කෝ. ඩී. පෙරේරා සහ පුත්‍රයා විසින්

ස්වීය 'විද්‍යාදශී' යන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවා ප්‍රකාශ

කරන ලදි

2473

# සංඥාපනය

## දහම් සරණ

බුද්සරණ යැ දහම් සරණ යැ සඟ සරණ යැ යි, එක් ක්‍රමයෙක්හි සිටැ ලියන ලද ග්‍රන්‍ථ තුනෙකි. එයින් බුද්සරණ විද්‍යාචක්‍රවර්ති **විද්‍යාචක්‍රවර්තින්** විසින් කැරුණු බව සුවිදිත යැ. ඉතිරි ග්‍රන්‍ථ ද්වයය ද ඔවුන් අතින් උපන යනු එක් මතයෙකි. සත්‍යයෙන් එ තරම් දුරු වියැ හැකි මතයෙක් තවත් නැත යනු අනෙක් මතයෙකි. අපට අභිමත වනුයේ ද මේ දෙ වන මතය යි.

ග්‍රන්‍ථ තුන මැ එක සේ පටන් ගැනීම මැ හෝ, ඡේද පරිච්ඡේදාදිය එක සේ කෙළවර කිරීම මැ හෝ, ඒ දෙක මැ හෝ, මේ ග්‍රන්‍ථ ත්‍රයය එක මැ අතින් නිපැයුණු බවට සාක්‍ෂ්‍ය නො වේ. එක සේ නමස්කාරයෙන් ඇරැඹුණු එක සේ ආශීර්වාදයෙන් නිමැවුණු ග්‍රන්‍ථයෝ එකක්හු ගේ මැ දස් කම් නො හඟවත්. බුද්සරණෙහි ආ පිළිවෙළ එය බලා කළ දහම් සරණෙහි ද ඇති වීම ආශ්චර්‍යයෙක් වේ ද? දෙඩා ගෙනැ එක්සිත් වැ දෙදෙනකු කළ ගත් දෙකක් නොයෙක් ලෙසින් එක්සැටි වුව හොත් ඒ පුදුමයෙක් ද? ග්‍රන්‍ථකාරයන් ගේ එකත්වය හෝ නානාත්වය හෝ නිර්ණය කැරැ ගැන්මට වහල් වනුයේ මේ බඳු දෑ නො වේ. වස්තු සංස්කාරය රස පෝෂණය සන්ධි රීතිය යන මේ ආදිය මෙ බඳු තන්හි සංශය නිරාකරණයට එකාන්තයෙන් සමත් වෙයි.

බුදුන් ගේ සිරිත මැ ශරීර කොටැ ගත් බුද්සරණ සූවිසි විවරණ කථා නො දක්වයි. බුදුන් ගේ සිරිත නො වැ වචන ශරීර කොටැ ගත යුතු දහම් සරණ සූවිසි විවරණ කථා මැ මුදුන් කෙරෙයි. දෙ පොතට දූතක් පිහිට වූ බවට මේ ප්‍රබල සාක්‍ෂ්‍යයෙකි. බුද්සරණ කාරයන් ගේ මැ කෘතියක් වූ ථූප වංශයෙහි විවරණ කථා මැනැවින් දක්විණ. පළමු

වැ කැරුණු ඒ ගත්හි ආ ඒ කථා දෙවනු වැ කැරුණු බුද්සරණට ඇතුළු නො වීම සවභාවානුකූල යැ. ඉදින් දහම් සරණ ද මේ කී දෙ ගත කළවුන් ගේ මැ කැරුමෙක් නම්, පළමු ගණෙහි ආ විවරණ කථා පුනරුක්ති භීතියෙන් දෙ වන ගතට නො වැද්ද දුන ද තුන් වන ගත්හි අභිෂික්ත වී නම්, ග්‍රන්ථකාරයන් ගේ සිහිය වෙදුන් ලවා පිරික්සැවීමට එ මැ පමණ වෙයි.

බුද්සරණ කාරයෝ ජාතක කථාවන් ගේ රස සාරය දක්වති. ඒ, ජාතක පොත පෙරළා ගෙනැ එහි වූ පිළිවෙළ නො විහිදූ කළ සඞ්ක්ෂෙපණයෙක් නො වේ. දක්ෂ චිත්‍ර ශිල්පියකු තැනට සුදුසු වර්ණාදිය යොදා කළ සිත්තමක් සේ, ජාතක පොත්හි ආ පිළිවෙළ නො සලකා සවකීය ග්‍රන්ථයට සුදුසු සේ තැනට තිසි කථාව ගෙනැ යෙදූ චිත්‍ර වින්‍යාසයෙකි. දහම් සරණ කාරයෝ ජාතක පොත තුබූ සේ මිරිකා දක්වත්. එ තරම් විසිතුරු සිතුවමක් පැ, එ තරම් රිසියෙන මිහිරක් ලා, ඒ පැ සිතුවම මැ, ඒ ලූ මිහිර මැ නැවැතැ රසොත කොටැ එළවන තරම් සිහි මූළා බවකට විද්‍යාචක්‍රවර්තීන් පැමිණිය හ යි සිතීමට මඳ වූ ද කරුණෙක් නො පෙනේ.

බුද්සරණ රසය ප්‍රධාන සථානයෙහි ලා ගෙනැ සැපැයුණෙකි. නිරස වූ ද වස්තුව එයට පැමිණැ රස පූර්ණ වෙයි. තුබූ රසය එයට වැදූ, කැට බිත් ගබකට වන් රුවක් සේ, ශත ගුණිත වෙයි. දහම් සරණ වාගාඩම්බරයට නායක කම් දී ගෙතුණෙකි. එයට රසය එතුමෙ, විදු ලිය බුබුළු සිය දහසකින් කෙළි වූ මහ මැදුරකට දෙරින් කඩුළුයෙන් සඳ කැලුම් හෙන්නා මෙනි. එ බඳු වූ බුද්සරණක් කළවුන් ගේ අගය නැති අත මැ මෙ බඳු වූ දහම් සරණක් කිරීමට සැලුණ හ යි සිතීම නො සිතීමෙන් කළ යුත්තෙකි.

ශබ්දය අර්ථයට අවනත කිරීම නියම මහා කවීන් ගේ ලක්ෂණය යි. ඔවුහු අර්ථය මවති. භක්තිමත් මෙහෙ කරුවන් මෙන්, ශබ්දයෝ තුමූ මැ ඔවුන් ගේ කාර්යයට එළැඹෙත්.

එ හෙයින් ශබ්දයන් තෝරතෝරා වෙසෙස ගැන්ම මහා කවීනට නුපුරුදු යැ. **බුද්සරණ** කරනා සමයෙහි මේ ලක්ෂණය **විද්‍යාචක්‍රවර්තීන්** කර එළැඹි, ඔවුන් විසින් භූෂිත වැ සිටියේ යැ. **දහම් සරණින්** පහළ වනුයේ මේ මහා කවි ලක්ෂණයට ඉඳුරා විරුද්ධ වූ ගුණයෙකි. අර්ථය බර වැ ඇත ද එය වළහන්නා වූ වාගාඩම්බරයට **දහම් සරණෙහි** විවරණ කථා අවකාශ වීයැ. අනුප්‍රාසය රක්නට පොහොසත් ශබ්දයන් තේරීමට **දහම් සරණ** කාරයන් මහත් ආයාස ගත් බවට සැක නැත. එ තරම් රසප්‍රධාන ග්‍රන්ථයක් පළමු මැ කළ කෙනකුන් මෙ තරම් ශබ්දප්‍රධාන ග්‍රන්ථයක් දෙවනු වැ කිරීමෙන් තමන් ගේ මැ අනුපම වූ ප්‍රතිභානයට තමන් මැ අකුල් හෙළති යි අපට නම් නො සිතෙයි.

**දහම් සරණ** කාරයෝ ශක්ති නැත්තානු මැ නො වෙති. ඔවුන් ගේ ශක්තිය ගියේ එක් අතෙකැ යැ. **විද්‍යාචක්‍රවර්තීන්** ගේ ශක්තිය ගියේ අන් අතෙකැ යැ. භින්නරුචි වූ ලෝකය පිනවන්නට ඒ දෙක මැ වුව මනා යැ. ඇතැමෙක් **කාලිදාසයන්** ගේ අලෝකසාමාන්‍ය වූ අමෘතරසධාරායමාණ සූක්ති මාලායෙන් මත් වැ ඔවුන් කවි ලෝකයෙහි අභිෂික්ත කෙරෙති. ඇතැමෙක් **මාඝයන්** ගේ ගාඪ පද සන්තතිය නිඃශේෂ කොටැ ගැලූ පියා, **කාලිදාසයන්** ගේ අභිෂේකය නො ඇසූ වන් වෙති. එ හෙයින් **බුද්සරණ** පසු කොටැ ලා **දහම් සරණ** ඉදිරියට ගන්නානු ද නැත්තානු මැ නො වෙත්.

**දහම් සරණ** කාරයන් සංස්කෘත භාෂා පරමේශ්වර වූ බවට බැහැරින් සාක්ෂ්‍ය නුවුව මනා යැ. ඇතැම් තන්හි සමානාන්ත වන සංස්කෘත ශබ්දයන් එක් කොටැ යොදා අනුප්‍රාස රක්ෂණය කළ පරිදි සැබැවින් ආශ්චර්යාවහ යැ. ඇතැම් තැන් කියවන කලැ කාදම්බරියෙහි අතිගාඪසන්ධානයන් කියවන කල්හි පහළ වන හැඟීම් හැඳිනැ ගත හැකි යැ.

ශෘඞ්ගාරය **දහම් සරණ** කාරයන් ගේ ප්‍රධාන රසය යි. මේ රසය පෝෂණය කරන්නට යැමෙන් බෝධි සත්ත්ව වරයන් ගේ අභාත ජන්මයට ඉඳුරා නො ගැළැපෙන සේ

පැනෙන චරිත විශෙෂයන් ද වැනුණු බවෙක් ප්‍රකාශ වෙයි. මුග්ධ විදග්ධ කාන්තාවන් ගේ රස භෙදය, ප්‍රණය රසයා ගේ උත්පාදනය පොෂණය උද්දීපනය, යනාදිය අති මනොහරා කාරයෙන් සඞ්ගෘහීත යැ. කවරෙක් සුමෙධ බොධිසත්ත්වයන් කල ඔවුන් ගේ මැ පඤ්චකාම සම්පත්ති වර්ණිතයෙන් මත් නො වේ ද? කවරෙක් ෂද්දන්ත විවරණ කථායෙහි වන වර්ණනය ද සිංහ වර්ණිතය ද බලා ''වැනුම් නම් මෙ බඳු වියැ යුතු යැ''යි නො සිතා ද?

**දහම් සරණ** කාරයෝ රාජ සේවාවට පැමිණැ සිටි බව **කකුසඳ** විවරණ කථායෙහි හැඟැවිණ. ඒ තත්ත්වයෙහි සිටැ රජුන් ද රාජ සේවාව ද පිළිබඳ සත්‍ය වර්ණනයක් කිරීමෙන් ප්‍රකාශ වනුයේ **දහම් සරණ** කාරයන් ගේ අනාදූර වූ ගුණ මහිමය යි. එ කලැ රජුන් ගේ තතු හඳුනන්නෝ ඒ රජුන් ගැනැ මැ මෙ බඳු දැ කියන රාජ සෙවකයකට කිමෙක් වේ ද යනු මැනැවින් දනිති. එ බන්දක් ගැනැ සැකයෙක් **දහම් සරණ** කාරයකට නො තුබුණු බව පෙනී යනුයෙන්, ඔවුන් ගේ ගුණ මහිමය මෙන් මැ අනෙකුදු කරුණෙක් සැලැකැවෙයි. එ නම් එ කලැ රජ තුමන් ගේ සත්‍ය ප්‍රියත්වය යි. තමන් ගේ අසාධාරණාධිකාරය මැ රැක්කැ යුතු යැ යි නො සිතා අප්‍රිය වුව ද පථ්‍ය වූ සත්‍යය මැ වැලැඳැ ගන්නා රජකු ඇති වීම තරම් භාග්‍යොදයයක් රටකට ඇති වියැ නො හැකි යැ.

**දහම් සරණ** පරිච්ඡෙද තුනකට බෙදන ලද්දේ යැ. පළමු වන පරිච්ඡෙදය විවරණ කථාවට ඇරුණේ යැ. දෙ වන පරිච්ඡෙදයෙහි ජාතක කථාවෝ සඞ්ගෘහීතයෝ යැ. 'පිටක ත්‍රයයෙහි පැනෙන්නා වූ කථා' තුන් වන පරිච්ඡෙදයට ගැනෙන බව **දහම් සරණ** කාරයෝ මැ කී හ. දෙවන පරිච්ඡෙදයෙහි දැක්වුණු ජාතක කථාවන් ද පිටක ත්‍රයයෙහි සඞ්ගෘහීත බැවින් මේ අනියත කීමෙකි. එහි ඇතැම් කථාවෙක් බුදුන් දවසැ වූවවුන් පිළිබඳ යැ, ඇතැමෙක් ජාතක කථා මැ යැ.

විද්‍යාචක්‍රවර්තීන් අතින් කැරිණි නම්, **දහම් සරණ** මෙයට ඉදුරා වෙනස් වන බව නිසැක යැ. එ කලැ ජාතක කථාදිය නිදර්ශන වශයෙන් ගැනුණ ද, දරුවනට ද සුඛාවබොධ වන පරිදි, රසවත් වන පරිදි, අත්‍යුපකාර වන පරිදි, නිපැයුණු අනුපම වූ ග්‍රන්ථ රත්නයක් ලැබෙනු එකාන්ත යැ. අභාග්‍යයෙකැ මහත! එ බන්දකට අවකාශයක් නුවූ සැටි යැ!

බුද්සරණ **දහම් සරණ** යන ගත් දෙකෙහි මැ අගැ විශ්වන්තර ජාතකය ආශෙය් යැ. එය විද්‍යාචක්‍රවර්තීන් ගේ පන්හිඳ නො වෙහෙසූ බව රචනා විලාසයෙන් ප්‍රත්‍යක්‍ෂ වෙයි. **දහම් සරණෙහි** මුහුණුවර හා නො සැසැඳෙන තැන් ඇති වුව ද, වස්තු වින්‍යාසයෙහි දී විශ්වන්තර කථාවට අවකාශ පෙනෙනුයේ **දහම් සරණෙහි** මැ යැ.

---

## විවරණය

මේ දක්වා අප විසින් නිපැයුණු විවරණ ග්‍රන්ථයන්හි නො කැරුණෙක් මෙහි ලා කැරිණ. එ නම් සුදුසු තන්හි සංස්කෘත ශබ්දයන් ගේ නිෂ්පත්තිය සවිස්තර කොටැ දැක්වීම සි. එය මඳ වශයෙන් වත් නො දතැ ඇතැම් තන්හි අර්ථාවබොධය නිසැක සේ නො කළ හැකි බව පෙනී ගිය හෙයින් මේ අතට අප සිත් නැමිණ. මේ ක්‍රමයෙන් හෙළි වියැ යුතු වුව ද අප විසින් නො දැනැ හෙළා පියන ලද තැනුදු ඇති වියැ හැකි යැ. එබඳු තැන් දක්නෝ අප ද දක්වත් වා.

**දහම් සරණෙහි** මුද්‍රණය ඉතා ශීඝ්‍ර වැ කැරුණෙකි. එ හෙයින් පොතට වැදූ සිටි මුද්‍රණ දොෂයන් ගේ ගණන ඉතා මහති. දුටු දුටු තැන් විවරණයෙහි දී ශුද්ධ කළම් හ. හෙළුණු තැනුදු ඇති වියැ හැකි. ද්විතීය මුද්‍රණයෙහි දී සියල්ල පිරිසුදු කරන්නට තැත් කෙරෙමු. විවරණයෙහි දු මුද්‍රණ දොෂ මහත් රාශියක් ඇති බව පෙනී යේ. එය ලිවීමට ද මුද්‍රණය කිරීමට ද ගියේ මසක් පමණ කාලයෙකි. එ හෙයින් ක්‍ෂමත් වා.

39 වන ශෝධාදියෙහි 7 වන ඡේදයට ලියූ විවරණයෙහි (191 වන පිටෙහි යැ.) 'වනුක්' යන්නට 'මහා රජන' යන අර්ථය පමණෙක් පෙනෙයි. ''ව්‍යවහාරයෙහි 'හෙන්දිරික්කා' නමින් ගැනෙයි'' යනු අනතුරු කොට යොදා ගත යුතු. එක් තැනෙකැ 'අපායෙහි වැටීම' යන අර්ථයෙහි 'අපායෙහි හීම්' යනු 'අපායෙහි හිමි' යනු කොට ගෙනැ අරුත් පැවැසූ සැටියෙක් මතක යැ. කො තන්හි ද යනු දැන් නො පෙනෙයි. එ බන්දෙක් වේ නම් ශුද්ධ කැර ගත මැනැවි.

**දහම් සරණ** වැනි ග්‍රන්ථයක් ශික්ෂකයන් අතට පැමිණිවීම සිංහල භාෂාවට කළ හැකි මහත් සඞ්ග්‍රහයෙකි. එහි විශිෂ්ට ඵල නිපැදවීම ශික්ෂකයන් විසින් මැ කළ යුත්තේ යැ. ඒ සඳහා ඔවුනට වහල් වන පිණිස යැ මේ විවරණය සැපැයුණේ. ශික්ෂකයන්, නො දත් බැවින් අග පැමිණියන් සේ ද, 'කීකීවන් කීකීවක්' හඳහන්නට මැ සැරැසුණන් සේ ද සලකා ගෙනැ අර්ථ වර්ණනය කිරීම ඉතා පහසු යැ. අපට නම් එ බන්දක් නො කළ හැකි යැ. එ හෙයින් මෙහි ලා අප විසින් ගන්නා ලද ආයාසය ඉතා මහත්. ශික්ෂකයන් ගේ අභිමතාර්ථ සාධනයට ද, ඒ අතින් භාෂාභිවෘද්ධියට ද, වහලෙක් වේ නම්, අප ගේ ආයාසය කො තරම් මහත් වුව ද ඒ අපට ප්‍රීතිය පිණිස මැ වෙයි.

මේ විවරණය පමණෙක් නො වැ මූල ග්‍රන්ථයෙහි අප විසින් කරන ලද විශේෂ ශුද්ධි ද අප අයත් බව සලකත් වා.

**මුනිදස කුමාරණතුංග**

2475 වප් අව 6,
කොළොම්බ වැල්ලේවත්තේ 34 වන පටු මඟැ
කුමාරගිරියේ දී යැ,

**කාව්‍යශේඛර විවරණය ළඟැ දී එයි.**

# දහම් සරණ විවරණය

## 1. දීපඞ්කර විවරණ කථා

1. **යත්**— කිසත් හොත්. **සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්‍ෂයක්**— කල්ප අසඞ්ඛ්‍ය සතරකුත් ලක්‍ෂයක්. සම්පාදි උපමා විසින් කල්පනය කළ යුතු වූ ප්‍රමාණ ඇති හෙයින් කල්ප නම්. සඞ්ඛ්‍යාවක් නැතියේ යමෙක්හි ද ඒ අසඞ්ඛ්‍ය සි. එකක් ද බින්දු එක් සිය සසාලිසක් ද ලියූ කලැ එයින් දැක්වෙන සඞ්ඛ්‍යාව අසඞ්ඛ්‍ය නමැ යි ද යෙති. ඇතැම් තන්හි විශෙෂණ වැ යෙදෙන 'සතර' ශබ්දයා ගේ 'ත' කාරය ලොප් වැ සවර්ණ දීර්ඝ වීමෙන් 'සාර' යනු වෙයි. **අනන්තයෙහි**— කෙළවර. **බෝ මැඩැ**— බොධි මණ්ඩයෙහි. බෝ ගස මුලැ. **වජ්‍රාසනයෙහි**— ස්ථිර වූ, අභිමතාර්ථ සිද්ධ කොටැ ගෙනැ මුත් නො බිඳුනා වූ ආසනයෙහි. ලොකයෙහි ඉතා මැ තද බව 'වජ්‍ර' නාමයෙන් හැඟැවෙයි. 'Adamant' යනු ඉංගිරිසි සි. 'වජ්‍ර' යනු විදුරම (දියමන්තියට) ද නම් වෙයි. යොගින් ගේ 'වජ්‍රාසන' යනු ධ්‍යානය පිණිස හිඳැ ගන්නා ආකාර විශෙෂයෙකි. පද්මාසන ස්වස්තිකාසන යනාදි නම ද ආකාර විශෙෂයෝ වෙති. එහි ලා වජ්‍රාසන නම් අත්‍යුත්කෘෂ්ට වූ ආසන විශෙෂය සි. පතුල් දෙක උරැ යුගමයෙහි ක්‍රමයෙන් පිහිටුවා තල්ල දෙසම හැරවූ ඇඟිලි ඇති අත් දෙක රඳවා ගෙනැ හුන් කලැ ඒ වජ්‍රාසන නම්. මෑතෙකැ දී බුද්ධ රජුන් ශරීර ප්‍රමාණාදියෙන් අභිනුෂ්‍යායකු කොටැ දක්වන්නට වන්නෝ වජ්‍රාසනය ද තුදුස් රියන් විදුරැ මිණිමුවා පුටුවක් කොටැ දැක්වූ හ. ඔවුන් ගේ මතයෙන් තණ සලා එ මතු පිටැ වජ්‍රාසනය බැඳැ හිඳැ ගැන්ම බුදු රදුනට නිසුවෙකි. **වැඩැ හිඳැ**— මෙයින් ලැබෙනුයේ 'හිඳැ' යන්නෙහි අර්ථය පමණෙකි. 'වැඩැ' යනු හුදෙක් ගෞරව සඳහා යෙදිණ. හිඳු- සිටු- හෝ- වස- යනාදි ධාතූන් නෙත් නිපන් පදයකට පූර්ව වැ 'වැඩැ' යනු ගෞරව පිණිස යෙදේ. **සව් නෝ**— සකල ඥෙය. සියලු දත යුතු දැ. **ගෙවා**— කෙළවර කොටැ. **කෙණෙහි**— ඛණ + එහි = ඛණෙහි = කෙණෙහි. ක්‍ෂණයෙහි. මොහොතෙහි.

**පසක් කළා වූ**— ප්‍රත්‍යක්‍ෂ කළා වූ. ඉන්ද්‍රිය විෂය කළා වූ. මෙහි ගැනෙනුයේ 'මන ඉන්ද්‍රියයට විෂය කළා වූ' (අවබොධ කළා වූ) යන අර්‍ථ යි. ප්‍රති + අක්‍ෂ. 'අක්‍ෂ' නම් ඉන්ද්‍රිය යි. ඉන්ද්‍රියයනට හමු කිරීම ප්‍රත්‍යක්‍ෂ කිරීම යි.

2. **සුවහී**— දිව්‍ය. **මොක්‍ෂ**— මිදීම. නිර්‍වාණය. **වියත්**— ව්‍යක්ත. බුද්ධිමත්. උගත්. **අවියත්**— අව්‍යක්ත. **සතහා**— සතප්පා. **අමෘත පරිභෝජනයක්**— අමාව ඉසීමක්. ඉන්ද්‍රියයන් අතිශයින් පිනවන්නා වූ කවර ද්‍රව්‍යයක් වුව ද අමෘත නාමයෙන් ගැනේ. 'අමෘත' යනු පළමු කොට දිව්‍ය භොජනයට කළ නාමය යි. එය වළඳුවෝ නො මැරෙත් නු යි අමෘත නම්. **ගල්වනු**— තවරනු. මෙහි ගැල්වීම නම් බුද්ධ චරිතය අසන්නට සැලැස්වීම යි. **ම හිමි වූ**— මා ගේ ස්වාමි වූ **ගෞතම ගෝත්‍රයෙහි**— ගොතම් නම් සෘෂිනු ගෙන් පැවැත ආවා වූ වංශයෙහි. **අග මැණ**— අග්‍ර මාණික්‍ය. මුදුන්. **ශාක්‍ය සිංහ**— ශාක්‍යොත්තම වූ. ශාක්‍ය වංශයෙහි වූවනට අග්‍ර වූ. සිංහ- ව්‍යාඝ්‍ර- ශාර්දූල- හස්ති- වෘෂභ- හංස- චන්‍ද්‍ර- සූර්‍ය- යනාදි අර්‍ථ ඇති නාමයෝ අන්‍ය නාමයකට පර ව යෙදී තුල්‍යාධිකරණ විශෙෂණ සමාස වූවාහු උත්තමාර්‍ථය ගෙන දෙති. "ශාක වෘක්‍ෂය වූ තන්හි කළ නුවරෙහි (කපිලවාස්තුයෙහි) විසුවෝ ශාක්‍ය නම් වූ හ" යනු අශ්වඝොෂ මතය යි. ඔක්කාවස් රජ සිය දරුවන් කුල වංශ රක්‍ෂණයට ශාක්‍යය හ සමර්‍ථ ය හ යි කී හෙයින් මොවුන් ශාක්‍ය නම් වූ හ යි යෙති. **මූල ප්‍රණිධානයෙහි**— පළමු වනු ව මැ පිහිටිවීමෙහි. සිත හෝ වචනය හෝ යමෙක පිහිටිවීම 'ප්‍රණිධාන' 'ප්‍රණිධි' යන නාමයන් ගෙන් ගැනේ. සිත පිහිටිවීම මනඃප්‍රණිධාන යි. වචනය පිහිටිවීම වාක්‍ප්‍රණිධාන යි. "මම බුදු වෙම් ව"යි පළමු කොට මැ සිතූ සිතිවිල්ල බොධි සත්ත්වයන් ගේ මනඃප්‍රණිධානය වෙයි. "මම බුදු වෙම් ව" යි වචනයෙන් කීම වාක්‍ප්‍රණිධානය වෙයි. මෙ තන්හි ගැනෙනුයේ වාක්‍ප්‍රණිධානය යි. ප්‍ර + නි + ධා. 'ධා' යනු පිහිටිවීමෙහි ධාතු යි. **හුණු**— වැටුණු. **මිල**— අගය. කනෙහි වැටුණු එක් එක් දහම් අකුරෙහි මිල- අගය- නම් අමා මහ නිවනි. එක් දහම් අකුරක් ඇසුව ද නිවන් ලැබිය හැකි බව මෙයින් කී හ. **සිනෙහැති ව**— සිනෙහ (ස්නෙහ, ආදරය) ඇති ව.

3. **අනූන**— (න + ඌන) අඩුවක් නැති. **ක්‍ෂීණ**— ක්‍ෂය. **විකළෙව**. එහි සියලු විපත්තීහු නැසුණාහු ය. එත ද

විපත්තියෙක් නැත. **අමර වර**......**අභිරාම** වූ— දෙවියන් ගේ උතුම් ශරීරයෙහි සුන්දර භාවය පිළිබඳ සාරයා ගේ සඞ්ග්‍රහයක් (එකතුවක්) සේ අභිරාම (අතිශයින් රමණීය) වූ. ඒ නුවර නර නාරී ගණයන් ගේ ශරීරයෝ කෙ බඳු ද යත්:- දෙවියන් ගේ උතුම් වූ ශරීරයන්හි යම් සුන්දර භාවයෙක් වේ නම් ඒ සුන්දර භාවයෙහි සාරය කැටි කළාක් මෙන් අභිරාම යැ- (අතිරමණීය යැ.) **විවිධ**— නා නා වි ධ. නා නා ප්‍ර කා ර. **විදග්ධ මුග්ධ නරනාරී ගණාකිණ්ණ** වූ— නිපුණ වූ බොළඳ වූ පුරුෂ ස්ත්‍රී ගණයා (සමූහයා) විසින් ආකීර්ණ (ගැවැසී ගත්තා) වූ. එහි නරයෝ විදග්ධයෝ යැ. නාරීහු මුග්ධයෝ යැ. **විදග්ධ**- වි + දහ් + ත. 'දහ්' යනු දැවීමෙහි ධාතු යි. 'ත' යනු කෘදන්ත ප්‍රත්‍යය යි. 'විශෙෂයෙන් දවන ලද' යනු 'විදග්ධ' යන්නෙහි අරුති. ග්‍රාමීණ ව්‍යවහාරයෙහි ''හොඳට පැසුණු මිනිසා'' යනාදි තන්හි 'හොඳට පැසුණු' යනුයෙන් යම් අර්ථයෙක් ලැබේ නම්, 'විදග්ධ' යනුයෙන් ලැබෙනුයේ ද එ මැ යැ. බොහෝ ඇසූ පිරූ තැන් ඇති වැ රටැ තොටැ ඇවිදැ කරුණු දැනැ අසා දැනැ පුරුදු වැ විදග්ධ වීම (පැසීම) පුරුෂ පක්ෂයට අවශ්‍ය ගුණයෙකි. **මුග්ධ**- (මුහ් + ත) 'මුහ්' යනු මුළා වීමෙහි ධාතු යි. මුග්ධ භාවය නම් විදග්ධ භාවයට විරුද්ධ වූ ගුණය යි. 'Innocence' යනු ඉංගිරිසි යි. යම් යම් බර කරුණු නො දන්නා බව, එහි මුළා වන බව, නො පැසුණු බව, බොළඳ බව මුග්ධ භාවය යි. තරුණියක අතිශයින් කමනීය වීමට මේ අවශ්‍ය ගුණයෙකි. **මෘදඞ්ග**- මිහිඟු. බෙර වෙසෙසෙකි. දැන් දෙමළ බෙර නමින් ගැනෙන්න යි. **සම්ම ශබ්දය**— 'සෞම්‍යය' 'යහළුව' යි අනුන් අමතන ශබ්දය. **සමන්විත**— යුක්ත වූ. සම් + අනු + ඉ + ත. 'ඉ' ගමන්හි ධාතු යි. 'මොනොවට අනු වැ ගිය' යනු අරු යි. **දුර්භික්ෂ යක්ෂ ප්‍රලයයෙන්**— දුභික්ෂ නමැති යක්ෂයා ගෙන් වන විනාශයෙන්. **දුර්භික්ෂ**— දුක සේ භික්ෂාව (සිඟීම) කළ යුත්තේ යම් කලෙක්හි ද ඒ දුභික්ෂ යි. අහර හිඟය. මිනිසුන් හිඟමන් දෙනුයේ සුලබ කලැ යැ. තමනටත් නැති වැ දුලබ කල්හි කෙසේ දෙත් ද? **ප්‍රලය**— විනාශය. **අනුපක්ෂීණ** වූ— (න + උපක්ෂීණ) ගෙවී යැමක්, හානියක්, විනාශයක්, නූ වූ. ඒ නුවර දුභික්ෂයෙක් නො වී යැ. යනු හි සේ යැ. **සුභික්ෂතාව**— අහර සුලබ බව. **නිරුපහතාන්නපාන සම්පත්තීන්**— නො නැසුණා වූ (නො කඩ වූ) කෑම් බීම් සැපත කරණ කොටැ ගෙනැ. නිර් + උප + හන් + ත. 'හන්'

ධාතු නැසීමෙහි වෙයි. **අන්න**— (අද් + ත) 'අද්' ධාතු කෑමෙහි වෙයි. **සා-පිපාසායෙහි රස නො දන්නා** වූ— සයෙහි (බඩ ගින්නෙහි). හෝ පිපාසායෙහි හෝ රසය (ස්වභාවය) නො දන්නා වූ. එ නුවර වැස්සෝ සා දුක් පිපාසා දුක් නො හඳුනති. **හෘෂ්ට ශිෂ්ට ජන සංසෙවිත** වූ— හෘෂ්ට වූ ශිෂ්ට වූ ජනයා විසින් මනා සේ සෙවනය කරන ලද්දා වූ. හෘෂ් + ත = හෘෂ්ට. සන්තුෂ්ට වූ. 'හෘෂ්' (සන්තොෂයෙහි) ධාතු යි. ශාෂ් + ත = ශිෂ්ට. හික්මවන ලද. පුහුණු කරවන ලද. උගත්. 'ශාස්' (ශාසනයෙහි, උපදෙශ දානයෙහි) ධාතු යි. සම් + සෙව් + ඉ + ත= සංසෙවිත. 'සෙව්' (සෙවනයෙහි) ධාතු යි. **විනෂ්ට දුෂ්ට ජනාව්‍යාහත** වූ—(ගුණ ධර්ම විසින්) විශෙෂණයෙන් නටුවා වූ කිලිටි වූ ජනයා විසින් අසම්බාධිත වූ. වි + නශ් + ත = විනෂ්ට. 'නශ්' (නැසීමෙහි) ධාතු යි දුෂ් + ත = දුෂ්ට. 'දුෂ්' (දූෂණයෙහි) ධාතු යි. න ව්‍යාහත = අව්‍යාහත. වි + ආ + හන් + ත. 'හන්' (පහර දීමෙහි) ධාතු යි. **පරිඛා**— නගරය වටා පවුරට පිටින් කණින ලද අගල. **ප්‍රාකාර**— පවුරු. **ප්‍රතොලි**— ('ප්‍රතොලි' යනු මුද්‍රණ දෝෂ යි,) මහා වීථි. **නගරාඞ්ගයෙන්**— ('නගර රක්ෂාඞ්ගයෙන්' යනු මුද්‍රණ දෝෂ යි.) නගරයෙකැ ඇති වියැ යුතු අඞ්ගයෙන්. **රාෂ්ට්‍ර**— රට. **දුර්ග**— දුක සේ යා හැකි තැන්. සතුරන් ගේ පැමිණීම වැළැක්වීම සඳහා ද තම්නට රක්ෂා සඳහා ද රටෙකැ ඇති වියැ යුතු දුර්ග ස්ථාන. **මිත්‍ර**— අනුන් හා සටනෙකැ දී තමනට , සහාය වීමට සිටින්නෝ. **සමෘද්ධික්**— සම්පූර්ණ භාවයෙන්. **නිර්විඝ්න** වූ— අනතරායෙන් දුරු වූ. විඝ්නයෙන් (අනතරායයෙන්) නිෂ්ක්‍රාන්ත (නිකුත්) වූයේ නිර්විඝ්න යි. නිර් + විඝ්න, වි + හන් + අ = විඝ්න. 'හන්' (නැසීමෙහි, පහර දීමෙහි) ධාතු යි. **ධර්මාර්ථ කාම මොක්ෂ ලක්ෂණ පුරුෂාර්ථ සම්පන්න**— ධර්ම යැ අර්ථ යැ කාම යැ මොක්ෂ යැ යන පුරුෂාර්ථයන් ගෙන් යුක්ත වූ. මරණින් මතු සුගතියට යනු සඳහා රැක්කැ යුතු ගුණ 'ධර්ම' නමි. 'අර්ථ' නම් ධනය යි. ඉන්ද්‍රියයන් පිනැවීම හෙවත් පඤ්ච කාම සම්පත්තිය 'කාම' නම් වේ. සංසාරයෙන් මිදීම මොක්ෂ යි. මේ ලොකයෙහි පුරුෂයක්හු විසින් අර්ථනය කළ යුත්තාහු- කැමැති වියැ යුත්තාහු- මොහු යැ. එ හෙයින් ධර්මාර්ථ- කාම- මොක්ෂයෝ පුරුෂාර්ථ නම් වෙති. 'චතුර්වර්ග' යනු ද මොවුනට නමි. **සඞ්කුල සුක්ෂම**..........**සමාකීර්ණ** වූ— ('ශිල්ප' යනු මුද්‍රණ දෝෂ යි. 'ශිල්පි' යැ යි ශුද්ධ කළ යුතු ) මහත් සියුම් කර්මාන්ත සැපැයීමෙහි ආශක්ත වූ සකල කර්මකාර

ශිල්පී සමූහයා ගේ දක්ෂ භාවයෙන් නිපදවනු ලබන්නා වූ අසමාන වූ කර්මාන්ත විස්තාරයෙන් මොනොවට ගැවැසී ගත්තා වූ. ඒ නගරය අසමාන වූ- ඉතා උසස් වූ- කර්මාන්ත සන්තානයෙන් හෙවත් විස්තාරිත වැ පැතිරී සිටි කර්මාන්ත සමූහයෙන් සමාකීර්ණ වූයේ යැ. ඒ කර්මාන්ත සන්තානයෝ ද සියලු කාරු කුලයන් (සමූහයන්) ගේ ද ශිල්පී කුලයන් ගේ ද දක්ෂ භාවයෙන් නිපදවනු (සම්පාදනය කරනු) ලබන්නෝ යැ. ඒ සමග්‍ර (සියලු) කාරු ශිල්පී කුලයෝ මහත් වූ ද සියුම් වූ ද කර්මාන්ත සම්පාදනයෙහි ව්‍යග්‍රයෝ යැ- ආශක්තයෝ යැ- මහත් ඇල්මෙන් යෙදුණෝ යැ. විගත වූ අග්‍රය යම්කිනු ගේ ද හේ ව්‍යග්‍ර සි. සම්පූර්ණ වශයෙන් යමෙකු ඇලී යෙදී සිටිනුයේ එහි ව්‍යග්‍ර සි. 'සමග්‍ර' යනු සියලු යන අර්ථ ඇත්තේ යැ. සමග හෙවත් සකලය යම් ලෙසෙකින් ගැනේ නම් එ සේ ග්‍රහණය (ගැනීම) සමග්‍ර සි. 'කාරු' යනු ශිල්ප කර්මාන්ත කරන්නාට නමි. 'ශිල්පින්' යනු ශිල්පය දන්නාට නමි. (ශිල්ප+ඉන්.) 'කාරු' යනු ද 'ශිල්පින්' යනු ද එකාර්ථ යැ. එහෙත් මෙහි ශිල්පියෝ නම් ශිල්ප දන්නාහු යැ සි ද, කාරුහු නම් ශිල්පින් විසින් දක්වන ලද සැටියේ කර්මාන්ත කරන්නාහු යැ සි ද ගත හැකි යැ. කුශලයා ගේ හෙවත් දක්ෂයා ගේ භාවය කෞශල්‍යය සි. 'කුශල' ශබ්දයෙන් වූ තද්ධිත සි. 'ය' ප්‍රත්‍යයය සි. **සමවායෙන්**— එක් වීමෙන්. සම් + අව + ඉ + අ. 'සම්' යනු ද 'අව' යනු ද උපසර්ග සි. 'ඉ' (ගමන්හි) ධාතු සි. 'අ' ප්‍රත්‍යයය සි. එකට පැමිණීම සමවායය සි. **සකෙළුව ප්‍රිය**............ **පරම මනොහර** වූ— පස් ඉඳුරන් පිනැවීමට විභක්ත වූ (විශෙෂ්‍යයන් බෙදූ හරින ලද්දූ වූ) විෂය (කාම) වර්ගයන් කරණ කොටැ ගෙනැ අතිශයින් සිත්කලු වූ. රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන පඤ්ච කාමයෝ 'විෂය' නමිහ. 'විශෙෂ' යනු වර්ගාර්ථ සි. **විමල සළුල**............ **හෙබි**— පිරිසුදු වූ මහත් වූ ද ඉතා මහත් වූ ද මුතු ඇට ආදි නානාවිධ රත්නයෙන් ඉහළ නැංගා වූ කාන්ති සියල්ලෙන් වර්ණ ජාතීන් ගේ සමෘද්ධියට පමුණුවන ලද නුවර මුදුනෙහි ආකාශ ප්‍රදෙශයෙන් ශොභමාන වූ. ඒ පුරයෙහි මස්තකාකාශය වර්ණ භෙද සමෘද්ධියට හෙවත් නානාවිධ වර්ණයෙන් සමෘද්ධ බවට පමුණුවන ලද්දේ යැ. කෙ සේ ද? නගරයෙහි අනෙක විධ රත්නයන් ගෙන් ඉහළ නැඟුණු කාන්ති සමූහයෙහි සකලයා ගේ භාවය සාකල්‍ය සි. (සකල+ය.) 'සමබන්ධ' යනු මෙහි 'සමෘද්ධි' යන අර්ථ ඇත්තේ යැ. **සර්වකාලික** වූ— සියලු කල්හි පවත්නා වූ. නො කඩ වන්නා වූ. **ශෞභාග්‍ය**- සුභග භාවය.

ශ්‍රීමත් බව. භාග්‍ය සම්පන්න බව. සුභගයා ගේ– භාග්‍යසම්පන්නයා ගේ– භාවය සෞභාග්‍ය යි (සුභග+ය.) **කණ්ණාම**— මයිසූර දේශයට අයත් රටෙකි. දැන් 'කාර්නැටික්' යැ යි කියති. **ලාට**— දැන් මෙ නමින් රටෙක් නැත. ගුජිර දේශයේ දකුණු කොටස අයත් ප්‍රදේශ යැ යි යෙති. **කීර**— කාශ්මීරයේ මැ කොටසෙකි. **කාම්බෝජ**— සියම් දෙස අසලැ පිහිටි මෙ නම් රටෙක් වෙයි. ඉන්දියාශයෙහි ද පෙර මෙ නමින් ප්‍රදේශයෙක් වියැ. **සවන**— ග්‍රීක දේශය ද අරාබියාව ද පෙර මෙ නමින් දන්නා ලද: **ශබර**— වැද්දන් ගේ රට. **බබ්බර**— වනචර මිනිසුන් ගේ රට. **ගුජිර**— දැන් ගුජරාත් නමින් ගැනෙන ප්‍රදේශය. **නානා දෙශ වාසි** ........ **සුන්දර වූ**— නොයෙක් දෙශයන්හි වසන්නා වූ කවි ජන සමූහයා විසින් මනා සේ දක්වන ලද නානා දෙශයට සුදුසු වූ දෙශ භාෂා වර්ගයන් මිශ්‍ර වීමෙන් මනොහර වූ. දෙශ + උචිත= දෙශොචිත. දෙශයට සුදුසු. **ශික්‍ෂා**— වර්ණයන් ගේ උච්චාරණය දක්වන්නා වූ වෙදාඞ්ගය. **කල්ප**— යාග කිරීම පිළිබඳ උපදෙශ දෙන්නා වූ වෙදාඞ්ගය. **ව්‍යාකරණ**— ශබ්දයන් ගේ සාධුත්වය (සුදුසු බව) උගන්වන වෙදාඞ්ගය. **නිරුක්ති**— ප්‍රකෘති ප්‍රත්‍යයාදි අවයවයන් ගේ අර්ථ දැක්වීම උගන්වන වෙදාඞ්ගය. නිරුක්ති + ඡන්දොවිචිති= නිරුක්තිච්ඡන්දොවිචිති. මෙ බඳු තන්හි 'ඡ' ද්විරූප වෙයි. පූර්‍ව වූ 'ඡ' කාරයට 'ච' කාරාදෙශ වෙයි. **ඡන්දොවිචිති**— වෘත්ත ලක්‍ෂණ දක්වන වෙදාඞ්ගය **ජ්‍යොතිෂ**— ග්‍රහ නක්‍ෂත්‍රාදීන් ගේ ගති ස්වරූපාදිය උගන්වන වෙදාඞ්ගය. **ෂඩඞ්ගයෙන්**— අඞ්ග සයෙන්. වෙදයෙහි අඞ්ග (අවයව) සයෙකි. ඒ පෙර දැක්විණ. **ඍග්**—අග්නි වායු ආදි දෙවියනට කරන යාච්ඤා ඇතුළත් වෙදය. **යජුස්**— ද්විතීය වෙදය. යාග සම්බන්ධ යි. **සාම**— තෘතීය වෙදය යි. ගීත ඇතුළති. **ආථර්‍වණ**— චතුර්ථ වෙදය. 'අථර්‍වන්' නම් මුනිනු විසින් කරන ලදුයෙන් එ නම්. මෙහි නානා ශාස්ත්‍ර ඇතුළති. **අවෙද්‍ය**— නො දත හැකි. **සම්පූර්ණ** වශයෙන් අවබොධ නො කළ හැකි. එ තරම් මහත් වූ. 'වෙද්‍ය' නම් දත හැකි යි. 'අවෙද්‍ය' නම් නො දත හැකි යි. **විද්‍යා ස්ථාන**— ශාස්ත්‍ර විශෙෂ. දැනැ ගත යුතු තැන්. **අග්‍රාම්‍ය**– නො පිටිසර. ශිෂ්ට. නාගරික. **තත්තද්විද්‍යොපජීවින් විසින් නිරන්තර** වූ— (තත් තත් විද්‍යා + උපජීවින්) ඒ ඒ විද්‍යාවන් නිසා ජීවත් වන්නවුන් ගෙන් අතරක් නැත්තා වූ (නැවැසී ගත්තා වූ.) **සන්ධි**— දෙ පක්‍ෂයේ බල එකතු කිරීම පිණිස මිත්‍ර වීම. **විග්‍රහ**— තමතම ජය පැතෙන තන්හි යුද්ධ කිරීම. **යාන**— සතුරන් ඉදිරියට යැම. **ආසන**— සතුරන් තමන් වෙතට පැමිණෙන

කූරු කඳවුරු බැඳැ සිටීම. **සංශ්‍රය**- බලවතුන් ආශ්‍රය කිරීම. **ද්වෛධීභාවය**— තමතම විරුද්ධ වූ දෙ පක්ෂයක් පැමිණි කලැ එක් පක්ෂයක් සමඟ මිත්‍ර වැ අනෙක් පක්ෂය පැරදවීම. **සන්ධි......... ද්වෛධීභාව ලක්ෂණ වූ**— සන්ධි... ......ද්වෛධී භාව සංඛ්‍යාත. සන්ධි.. .......ද්වෛධී භාව යන මොවුන් ලකුණු කොටැ ඇති. **ෂාඞ්ගුණ්‍යයන් ගේ**— ෂඩ්විධ වූ (ස වැදෑරුම් වූ) ගුණයන් ගේ. රාජ්‍ය කරණයෙහි ගුණ සයෙකි. සන්ධි ආදිය යි. **කාලෝචිත ස්ථානෝචිත ප්‍රයෝගයෙහි**— (කාල + උචිත, ස්ථාන + උචිත) කලට සුදුසු තැනට සුදුසු යෙදීමෙහි. කාලය බලා ස්ථානය බලා එයට සුදුසු සේ සන්ධි විග්‍රාහාදිය යෙදියැ යුතු. **ප්‍රවීණ**— නිපුණ. දක්ෂ. **රාජාරාජ ව්‍යසන- විනාශයෙන් ස්වධර්ම- කර්මයෙහි අනුදාසීන වූ**— රජ විසින් හෝ රජකු නැති වීමෙන් හෝ වන ව්‍යසනයෙන් හෝ විනාශයෙන් හෝ ස්වකීය ධාර්මික කර්මයෙහි උදාසීන නො වන්නා වූ. දුෂ්ට රජකු වූ කලැ ව්‍යසන (විපත්ති) ද විනාශ ද පැමිණෙයි. රට අරාජක වූ කල්හි ද ව්‍යසන හා විනාශ හා පැමිණෙයි. ඒ කෙබඳු වූ ව්‍යසනයක් විනාශයක් පැමිණිය ද, මෙ කියන ස්වාමි කුලයා ස්වකීය වූ ධාර්මික කර්මයෙහි- තමන් ගේ යුතු කම කිරීමෙහි- උදාසීන නො වෙති. වහා ඉදිරියට පැනැ යුතු කම කෙරෙති. 'උදාසීන' වීම නම් යම් කිසිවක් සිදු වන කලැ "අපට කිමැ" යි නිකම් උඩ බලා ගෙනැ සිටීම යි. **සත්‍ය-ශෞචාචරණ වූ**— සත්‍යාචරණ ද ශෞචාචරණ ද වූ. සත්‍යයෙහි ද ශෞචයෙහි ද හැසිරීම ඇති. සත්‍ය ආචරණ නම් අවඞ්ක වූ හැසිරීම යි. ශෞච ආචරණ නම් ශෞච ධර්මයෙහි හැසිරීම යි, පිරිසුදු පැවැතුම යි.

"අහඞ්කාරපරිහාරශ්ච සංසර්ගශ්චාප්‍යනින්දිතෛඃ
ස්වධර්මේ ච ව්‍යවස්ථානං ශෞචමිත්‍යභිධීයතෙ"

යනුයෙන් ස්මෘති ශාස්ත්‍රයෙහි ශෞචය දක්විණ. "නො කැ යුත්ත දුරු කිරීම ද අනින්දිතයන් හා සංසර්ගය ද ස්ව ධර්මයෙහි පිහිටීම ද ශෞච යැ යි කියනු ලැබේ" යනු අර්ථ යි. **ස්වාමි කුලයා ගේ**— අමාත්‍ය කුලයා ගේ. මේ ස්වාමි කුලයා ෂඩ්ගුණ්‍යයා ගේ ප්‍රයෝගයෙහි ප්‍රවීණය හ; කවර ව්‍යසනයක් විනාශයක් පැමිණිය ද ස්ව ධර්ම කර්මයෙහි අනුදාසීනය හ; සත්‍ය ශෞචාචරණය හ. එ බඳු ඒ ස්වාමි කුලයා ගේ සම්‍යක් පාලනයෙන් සංවර්ධිත වූ පෞර ජනයෝ ඒ ස්වාමි කුලයාට ජය ශබ්ද සහස්‍රයන් ද සාධු වාද සහස්‍රයන් ද පවත්වති.

ඒ නගරය ඒ ජය ශබ්ද සාධු වාද ශත සහස්‍රයෙන් සම්මිශ්‍ර යැ. **සම්‍යක් පාලන සංවර්ධිත** වූ— මනා පාලනයෙන් මොනොවට වැඩුණා වූ. **පෞර ජනයන්**— පුරයට අයත් ජනයන්. නගර වාසීන්. පුරයෙහි වූයේ 'පෞර' නම්. 'පුර' ශබ්දයට 'අ' ප්‍රත්‍යය වීමෙන් නිපන් තද්ධිතයෙකි. **සතතොද්ගීයමාන** වූ— (සතත + උද්ගීයමාන) සියලු කල්හි උස් හඬින් ගායනය කරනු ලබන. ස්වාමි කුලය පුර වැසියන් ඉතා මනා සේ පාලනය කෙරෙති. සතුටු වූ පුර වැසියෝ ස්වාමි කුලය සඳහා ජය ශබ්ද සාධුවාද ශත සහස්‍රයන් උස් හඬින් ගායනය කෙරෙති. **ජය ශබ්ද**— "ජය, ජය" යන ශබ්ද. "දිනේ වා, දිනේ වා" යනු අර්ථ යි. **සාධු වාද**— "සාධු, සාධු" යි කීම්. 'සාධු' යන්නෙහි අර්ථ 'මැනැවි' යනු යි. මොනොවට කීවා අසා මොනොවට කළා දැක 'සාධු' යි කියනුයේ "කී සේ යහපතැ" "කළ සේ මැනැවැ" යි පවසනු පිණිස යැ. **ශත සහස්‍රයෙන්**— සිය දහසින්. **සම්මිශ්‍ර** වූ— මනා සේ මිශ්‍ර වූ. ජය ශබ්ද ද සාධු වාද ද මනා සේ එක පමණට මිශ්‍ර වෙයි. **අන්‍යොන්‍ය සහයොග** වැ— උනුන් හා එක් වැ යෙදී. **ශුද්ධාෂ්ටකය**— (ශුද්ධ + අෂ්ටකය) ශුද්ධ වූ අට. පෘථිවී, අප්, තෙජස්, වායු, වර්ණ, ගන්ධ, රස, ඔජස්, යන මේ අට ශුද්ධ අෂ්ටක නම්. ලොකයෙහි ඇති කවර වස්තුවක් ගත ද, බෙදූ බැලූ කල්හි, වෙන් වනුයේ මේ අට යැ. 'පෘථිවි ධාතු යැ' කී කලැ අන් කිසිවක් හා අමිශ්‍ර හෙයින් ශුද්ධ යැ. සෙස්ස ද එ සේ මැ යි. මේ අට එක් එක් වස්තුයෙහි අන්‍යොන්‍ය සහයොග වැ පවත්නේ යැ. මේ ශුද්ධාෂ්ටකය සේ ඔවුනොවුන් නො හැර පවත්නාහු එ නුවර මිත්‍ර- පුත්‍ර- කලත්‍රාදීහු යැ. **කලත්‍ර**— අඹු. භාර්‍යා. **භික්ෂූනට** ..........**බඳු** වූ— භික්ෂූන් හට විවෙකය හෙවත් ජන සම්බාධයෙන් වෙන් වීම අවශ්‍ය යැ. ඒ පුරය භික්ෂූනට විවෙක විහාරයක් බඳු යැ යි කීමෙන් එහි භික්ෂූන් ඉන්නා තැන් විවේක සහිත බව හැඟැවූ හ. විහාරය නම් විහරණය -හැසිරීම- කරන ස්ථානය යි, පන් සල යි. **නාගරිකයනට** ..... **වැනි** වූ— නාගරිකයෝ ප්‍රීතියට කැමැත්තෝ යැ. එ හෙයින් නෘත්‍ය ශාලාදියට යෙති. එ නුවර නාගරිකයනට ප්‍රීතියට වුව මනා තරම් දෑ ඇත. **ශෘඞ්ගාර ශාලාවක්**— නෘත්‍ය ශාලාවක්. **වධ්‍ය භූමියක්**— වධ කරන තැනක්. මරන තැනක්. එ නුවර සියලු අධර්මයන් නසන බව කී සැටි යි. **ධර්මාධිකරණ ප්‍රවෘත්තින් විනිවර්තිත** වූ **මාත්‍යසී ඇති**— ධර්මානුකූල වූ නඩු විසැඳීම් පැවැත්වීමෙන් විශෙෂයෙන්

නවත්වන ලද දොෂය ඇත්තා වූ. මත්සරයා ගේ භාවය මාත්සර්ය යි. එ නම් දොෂය යි, අනුන් නො සහන බව යි. එ නුවර එ බඳු සිතිවිලි නැත. කවර හෙයින් ද? ධර්මාධිකරණ ප්‍රවෘත්තීන් වළක්වන ලද බැවිනි. **මුඛෑ**— මැත භාගයෙහි. මෙ සමයෙහි. **ශන්නා**— ඇති වන්නා වූ. **සර්වඥතාඥාන**— සියල්ල දන්නා නුවණ. බුදු නුවණ. **කල්ප වෘක්ෂයෙහි**— අභිමත වස්තු ප්‍රදානය කරන දිව්‍ය වෘක්ෂයෙහි. **පළමු බිජු වට හිඳිවූ**— ප්‍රථම බීජය **රොපණය** කරන ලද්දා වූ. අප බුදුන් පළමු කොටැ මැ බුදු බව පැතුයේ සුමෙධ කලැ යැ. සුමෙධයන් උපන්නේ මෙ කියන අමරවතී රාජධානියෙහි යැ. එ හෙයින් මෙ සේ කියත්. **තෝ තැන්න**— ආලවාලය. බිජු වටක් පැළයක් සිටුවන තන්හි වටා උස් කොටැ දිය රඳනා සේ කැරෙන තැන්න තෝ තැන්න යි. **අමර පුරවර ස්පර්ධි වූ**—('සපර්ධිත' යනු මුද්‍රණ දෝෂ යි.) දෙවියන් ගේ පුර වරයට සපර්ධා කරන්නා වූ. සපර්ධා කිරීම නම් තරඟ කිරීම යි. "මම නො පරදිමි" යි හඟවා සිටීම යි. මර නො වනුවයන් දෙවියෝ අමරයෝ යැ. අමරවතිය දිව්‍ය පුරයට කිසි සේත් නො අඩු බව මෙ සේ කී හ. **අමරවතී නම් රාජධානියෙහි**— මෙයට කළ විශෙෂණයන් දුන් පෙරළා බලනු. ඒ රාජධානිය සම්පත්තීන් අනූන යැ, විපත්තීන් ක්ෂීණ යැ, නරනාරීගණාකීර්ණ යැ, දශවිධ ශබ්දයෙන් සමන්විත යැ, හෘෂ්ට ශිෂ්ට ජන සංසෙවිත යැ, දුෂ්ට ජනාව්‍යාහත යැ, නගරාඞ්ගයෙන් සම්පූර්ණ යැ, සප්තාඞ්ග සමෘද්ධීන් නිවිසන යැ, පුරුෂාර්ථ සම්පන්න යැ, අසමාන කර්මාන්ත සන්තානයෙන් සමාකීර්ණ යැ, විෂය විශෙෂයෙන් පරම මනොහර යැ, වර්ණ භෙද සම්බන්ධයට පමුණුවන ලද පුර මස්තකාකාශ දෙශයෙන් හෙබියෙ යැ, සර්වකාලික සෞභාග්‍ය ඇතියෙ යැ, දෙශභාෂා විශෙෂ සංයොගයෙන් සුන්දර යැ, විද්‍යොපජීවීන් විසින් නිරන්තර යැ, ජය ශබ්ද සාධු වාද සහස්‍රයෙන් සම්මිශ්‍ර යැ, ඔවුනොවුන් නො හැර වසන මිත්‍ර- පුත්‍ර- කලත්‍රාදීන් විසින් සමාකීර්ණ යැ, භික්ෂූනට විවෙක විහාරයක් බඳු යැ, නාගරිකයනට ශෘඞ්ගාර ශාලාවක් වැනි යැ, ශිල්පයට විද්‍යා ශාලාවක් බඳු යැ, අධර්මයට වධ්‍ය භූමියක් බඳු යැ, විනිවර්තිත වූ මාත්සර්ය ඇත්තේ යැ, සර්වඥතාඥාන කල්ප වෘක්ෂයෙහි පළමු බිජුවට හිඳිවූ තෝ තැන්න බඳු යැ, අමර පුර වර සපර්ධි යැ **රාජධානියෙහි**— රාජ්‍යයෙහි ප්‍රධාන නගරය, රජු ඉන්නා නගරය, රාජධානි නම්. **නිරූපදෙශයෙන්**— (අනුන් ගේ) උපදෙශයක් නැති වැ. මෙධා

**සම්පත්තීන්**— ප්‍රඥා සම්පත්තියෙන්. මෙහි සම්පත්ති නම් සමෘද්ධිය යි. මේධාව ගේ (ප්‍රඥාව ගේ) සමෘද්ධ භාවය මේධා සම්පත්ති නමි. **වයෝභූතිධර**— නිරාමය (නිරෝග) වූ ශරීරය දරන්නා වූ. මෙහි 'වයස්' යනු නිරෝගත්වය ප්‍රකාශ කෙරෙයි. **සප්ත කුල**— සත් මුතුන්. **උදිතෝදිත**— (උදිත + උදිත) උසස් වූ උසස් වූ. ප්‍රථම පරම්පරාව උදිත යැ. ඊ ළඟ පරම්පරාව එයට වඩා උදිත යැ. ඊ ළඟ පරම්පරාව එයට ද වඩා උදිත යැ. උද් + ඉ + ත = උදිත. 'ඉ' ගමන්හි ධාතු යි. 'උදිත' වීම නම් ඉහළ යෑම යි. උදිතෝදිත වීම නම් වඩවඩා ඉහළ යෑම යි. **අධ්‍යයන**— ඉගැනීම. **අධ්‍යාපන**— ඉගැන්වීම. **යජන**— යාග කිරීම. **යාජන**— යාග කැරවීම. **දාන**— දීම. **ප්‍රතිග්‍රහණ**— පිළිගැනීම. **අධ්‍යයනාධ්‍යාපන**............**ප්‍රතිග්‍රහණ ලක්ෂණ**— ඉගැනීම ඉගැන්වීම.......... පිළිගැනීම යනු මේ ලකුණු කොට ඇති. **ස්වධර්මකර්මාභිරත** වූ— (කර්ම + අභිරත) ස්වකීය ධාර්මික කටයුත්තෙහි තදින් ඇලුණා වූ **සුජාත**— මනා ලෙස (පිරිසුදු ලෙස) උපන්. **ජාති වාදයෙන්**— ජාතිය පිළිබඳ කථායෙන්. **අසංකලිත** වූ— කිලුටු නුවූ. සුමේධයන් ගේ උත්පත්තිය පිළිබඳ වැ කිය හැකි කිසි ද දෝෂයක් නැති බව මෙයින් කී හ. **දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන්**— බුදු සිරුරෙහි ඇති මහා පුරුෂත්වය හඟවන ලකුණු තිස් දෙකින්. බුදු ගුණ අලඞ්කාරය හෝ ධර්මප්‍රදීපිකාව හෝ බලන්නේ යැ. **අශීත්‍යනුව්‍යඤ්ජනයෙන්**— (අශීති + අනු......) අසූවක් අනු ලකුණින්. මහා පුරුෂ ලක්ෂණයනට අනු වැ පිහිටි සුළු ලකුණු අසූව අනුව්‍යඤ්ජන නමි. ධර්ම ප්‍රදීපිකාව බලා දත යුතු. **කේතු මාලායෙන්**— බුදු මුදුනින්. කෙතුවක් මෙන් ඉහළට විහිදු සිටින රශ්මි මාලායෙන්. **ව්‍යාම ප්‍රභායෙන්**— බුදු සිරුර වටා ව්‍යාමයක් (බඹයක්) ඈතට විහිදු සිටින රස් වලල්ලෙන්. **බුද්ධ රූප වෛචිත්‍ර්‍යයට ගත් වැටි සතක් බඳු වූ**— බුදු රූ විසිතුරම ගත්තා වූ ආකාර මාත්‍රයක් වැනි වූ. බුද්ධ රූපය ඉතා විසිතුරු යැ. ඒ විසිතුරු සම්පූර්ණ වශයෙන් සිත්තම් කොට දක්වනු පිණිස පළමු කොට වැටි සතක් (වර්තිකා චිහ්නයක්) කැරැ ගත යුතු යැ. කිමෙක් ද මේ වැටි සත නම්? සිත්තම් කරන තෙල්ල (තූලිකාව = වර්තිකාව) 'වැටි' නමි. ඒ වැටියෙන් කැරෙන චිහ්න මාත්‍රය— ලකුණු මාත්‍රය— මතු විසිතුරු

කොටැ අදිනු ලබන සිත්තමෙහි ආකාර මාත්‍රය- කටු සටහන- 'වැටි සන' නම් වේ. සුමෙධයන් ගේ රූපය බුදු රුව සිතුරු ලෙස අදින්නට කළ වැටි සනක් වැන්නැ. මතු ඇති වන බුද්ධ රූප වෛචිත්‍ර්‍යයේ පූර්ව ලක්ෂණ සුමේධ රූපයෙහි ද වූ බව මේ හී සැටි යැ. **අවයව සම්පත්තීන්**— (ශරීර) අඞ්ගයන් ගේ සමෘද්ධ භාවයෙන්. **කුන්දෙන්දුචන්ද්‍රිකා කුමුදෙන්දීවරාදි වූ**-- කුන්ද (කොඳ = දෑ සමන්) යැ, ඉන්දු (චන්ද්‍ර) යැ, චන්ද්‍රිකා (සඳ රැස්) යැ, කුමුද (එළ මානෙල්) යැ, ඉන්දීවර (නිලුපුල්) යැ යන ආදි වූ. මධුර **වස්තූන් ගේ**— රමණීය (මනොහර) ද්‍රව්‍යයන් ගේ. **සථානොචිත වින්‍යාසයෙන්**-- තැනට සුදුසු සේ සකස් කිරීමෙන්. කුන්දාදි වස්තූන් සුදුසු තැනට බෙදූ යොදූ දක්වීමෙන්. කොඳ දතට ද, සඳ මුහුණට ද, චන්ද්‍රිකා හා කුමුද හා සිනාවට ද, ඉන්දීවර ඇසට ද යෙදුව හොත් සථානොචිත වින්‍යාසයක් වෙයි. **මනොඥ පරිණාමයෙන්**— මනොහර වූ අන්‍ය සවභාවයකට පෙරළීමෙන්. කුන්දෙන්දු ආදීන් ප්‍රකෘති සවභාවයෙන් මැ විනයාස කළ හොත්, සුමෙධයන් ගේ රූපය පමණ මනොහර නො වේ. ඒ වස්තු එ සේ විනයාස කොටැ මනොහර වූ පරිණාමයකට- පෙරළීමකට- අන්‍ය සවභාවයකට- පමුණුවන ලද හෙයින් මෙ සේ රමණීය වී. එක් ප්‍රකාරයෙකැ පැවැති වස්තුවක් කල් යෑමෙන් සවභාව ධර්මානුකූල වැ අන්‍ය සවභාවයකට පෙරළීම පරිණාම නම්. Evolution' යනු ඉංගිරිසි යි. **නිෂ්පන්න**— නිපන්. උපන්. ඇති වූ. **ජන නයන මනොරඤ්ජනෙක රසායන වැ**-- ජනයන් ගේ නෙත් සිත් සතුටු කිරීමට එක මැ රසායන වැ. 'රසායන' ඉතා මහත් පිනැවීම ඇති කරන්නා වූ ඖෂධ විශෙෂයෙකි. සුමෙධයන් ගේ රූපය ජනයන් ගේ ඇස් ද සිත් ද රඤ්ජනය (සතුටු) කැරැවීමට එක මැ (අසමාන- අසහාය-) රසායනයක් බඳු වී යැ. **අනන්‍යසාමාන්‍ය**— (න + අන්‍යසාමාන්‍ය) අන්‍යයන් හා සමාන භාවයක් නැති. **සෞභාග්‍ය භාග්‍ය දෙ දෙනා ගේ**— රමණීය රූප සෞන්දර්යයෙන් යුක්ත බව යැ පින් ඇති බව යැ යන දෙකෙහි. **යමක ප්‍රසවයක්**-- යුගල වැ ඉපැදීමක්. දෙ දෙනා එක් වැ ඉපැදීමක්. **ලොකොත්තර**-- ලෞකික භාවය ඉක්මැ සිටියා වූ. ලොකයෙහි ලැබියැ හැක්කකට වඩා උසස් වූ. අතිමානුෂ වූ. **පවිත්‍ර චිත්‍ර චාරිත්‍ර විශෙෂ පාත්‍ර වැ**— පිරිසුදු වූ විසමය ජනක සිරිත් වෛශෙෂයට ආධාර වැ. එ බඳු

සිරිත් වෙසෙස් ඇති වැ යැ යු සේ යි. **වේද ත්‍රයය**—වේද තුන. **විශුද්ධ බුද්ධි ප්‍රභාව භාවිත වූ විනෝත්පාද මාත්‍රයෙකින්**—විශේෂයෙන් පිරිසුදු වූ ප්‍රඥා ශක්තියෙන් වඩන ලද (පුරුදු කරන ලද) සිත ඉපැදවීම් පමණෙකින්. 'සිතූ සැණෙකින් මැ' යැ යි යු සේ යි. **ශ්‍රී හස්ත තල............විලාසයෙන්**--ශ්‍රී හස්ත තලයට ගන්නා ලද මෘදු වූ ආමලක (ඇඹුල = නෙල්ලි) ද, ලා දලු ද යනාදීන් ගේ අකාරයෙන්. කලිත = ගන්නා ලද. කොමල = මෘදු. 'කොමලාමල' යනු මුද්‍රණ දොෂ යි. 'කොමලාමලක' යනු ශුද්ධ පාඨ යි. 'ශ්‍රී හස්ත' යන තන්හි 'ශ්‍රී' යනු ගෞරව පිණිස වෙයි. අනට ගත් ඇඹුල ඵලය ද බාල පල්ලවාදිය ද, යම් සේ ඉතා පහසුයෙන් ක්‍ෂණයෙකින් අවබොධ කැරැ ගන්නා ලද ද, එ මෙන් මැ සුමෙධයෝ වෙද ත්‍රයය ක්‍ෂණයෙකින් උගත් හ. **නිෂ්තුෂ කොටැ**-- නොහො (පොතු) හැරැ. අසාර දැ හැරැ. 'තුෂ' යනු වී පොත්තට නම්. **නිශ්ශඞ්ක වැ**— සැක නැති වැ, **විශිෂ්ට ශිෂ්ට ගොචර වූ**-- උතුම් ශිෂ්ටයනට (පණ්ඩිතයනට) විෂය වූ. උතුම් පණ්ඩිතයන් විසින් අවබොධ කළ හැකි වූ. **චතුෂ්ෂෂ්ටි කලා**— සිවු සැට කලා. තක්‍ෂණ (වඩු කම්) ආදි ශිල්ප සැට සතර. **අෂ්ටාදශ විද්‍යා ස්ථාන**—අටළොස් (දහ අට) ශාස්ත්‍ර විශෙෂ. ශ්‍රැති ස්මෘති ආදිය. **ගුහ්‍ය ස්ථාන**— ගැඹු තැන්, දුර්බොධ තැන්. **ජීර්ණ ශීර්ණ පුට**-දිරූ කොළ ගොටු. පරණලා ගොටු. **ස්මෘති නාරාච නිපාතයෙන්**— සිහිය නමැති යහුල හෙළීමෙන්. **විද්ධ**-- සිදුරු කොටැ. **කොවිද කොබිදෘ දනා**— පණ්ඩිත ලීලායෙන් අවබොධ කොටැ. සංස්කෘතයෙහි 'කෝවිද' යනු පණ්ඩිතයාට නම්. කෝ නම් වෙදය යි. **එය** දනී නු යි පණ්ඩිත 'කෝවිද' නම් වේ. යහුල යම් සේ පරණලා පත විදී ද එ මෙන් මැ සුමෙධයන් ගේ ස්මෘති ශක්තිය චතුෂ්ෂෂ්ටි කලා ද අෂ්ටාදශ විද්‍යා ද ඉතිරි නො කොටැ විදු පි යැ. ඒ සියල්ල නිරවශෙෂ කොටැ ඉතා පහසුයෙන් දත් හ යි යු සේ යි. **ඒ ඒ විද්‍යා විෂයයෙහි**-- ඒ ඒ ශාස්ත්‍රය පිළිබඳ වැ. **අවිචාර්‍ය වූ ආචාර්‍ය භාවයට**— නො විමැසියැ යුතු වූ ඇදුරු බවට. කවර විද්‍යාවක් ගත ද සුමෙධයෝ එයට ආචාර්‍ය වෙති. එය උගන්වා ලීමට එකාහනයෙන් සමර්ථ වෙති. "හේ එය උගත්තේ ද? අසුවල් අසුවල් තැන් දනී ද? අප අසන ප්‍රශ්නයන් විසඳූ ද?" යනාදි විසින් ඒ ආචාර්‍ය භාවය ගැනැ විචාරණය කළ යුතු නො වේ, විචැසියැ යුතු නො වේ, සැක කළ යුතු නො වේ

ඒ ආචාර්‍ය්‍ය භාවය සර්‍ව සම්පූර්‍ණ යැ. **උන්නත**— උසස්. **විමල**— පිරිසුදු. **සීලයෙන්**— පැවැත්මෙන්. **නව යුවති ජන මනොහරෛක භෙෂජායමාන** වූ—(මනොහර + එක...) අභිනව තරුණී ජනයා ගේ සිත ඇදී ගැන්මට අසහාය (එකු මැ) බෙහෙද වැනි වූ. නව යුවතීන් ගේ සිත් දිනීමට (වශීකරණ) බෙහෙත් දෙති. සුමෙධයන් ගේ අසමාන වූ නව යෞවන සම්පත්තිය එයට ඉතා මැ ප්‍රශස්ත බෙහෙද යැ. ඒ සමාන අනෙක් බෙහෙදෙක් නැති. සුමේධයන් ගේ නව යෞවන සම්පත්තියට ස්ත්‍රීන් ගේ සිත් ඇදී යන බව මේ කී සැටි යැ. **නව යෞවන සම්පත්තීන්**— අභිනව තාරුණ්‍යය පිළිබඳ වූ සමෘද්ධියෙන්. යුවයා ගේ (තරුණයා ගේ) භාවය තාරුණ්‍යය සි. 'යුවන්' ශබ්දයට 'ය' ප්‍රත්‍යය වී නිපන් තද්ධිතය සි. 'යෞවන' යන්නෙහි අර්‍ථ එබදු වන බැවින් තරුණයාට 'යෞවනයා' යැ සි කීම ද තරුණ භාවයට **'යෞවන භාව'** යැ සි කීම ද මහා දෝෂ සි. **ලොකොත්තර වූ**— ලෞකික භාවය ඉක්මවා අතිමානුෂ වූ. **මෙ සේ** වූයේ උන්නත කුල, විමල ශීල, අසමාන යෞවන සම්පත්ති යන තුනිනි. **විරාජමාන**— බබළන්නා වූ. **විශද**— පිරිසුදු **ශරදාකාශ ගර්‍භයෙහි**— ශරත් කාලයෙහි අකාශ කුක්ෂියෙහි. සරා කලැ වලා නැතියෙන් අහස පිරිසුදු යැ. සඳ වෙසෙසින් බබළයි. **දෙදීප්‍යමාන** වූ— අතිශයින් බබළන්නා වූ. **ශාරද**— ශරත් කාලයට අයත්. ශරදෙහි වූයේ ශාරද සි. 'ශරද්' සදින් 'ය' පස සි. **ලොකොත්සවෛක කාරණ වූ**— (ලොක + උත්සව + එක........) ලොකයා ගේ උත්සවයට (ආනන්දයට = ප්‍රීතියට) අසහාය (එක මැ) කාරණය වූ. **විකසිත**— පිපුණු. 'විකසිත' සි ලියුව ද නිවැරැදි යැ. **කමල ගර්‍භයෙහි**— නෙළුම් මල ඇතුළෙහි. **කර්‍ණිකාවක්**— කෙමියක්. කමලෙහි ප්‍රධාන ස්ථානය කෙමිය සි. සුමෙධයන් අමරවතියෙහි සර්‍වොත්තම බව මෙසින් හැඟැවූ හ. **නිසර්‍ග ශොභා විශෙෂ සංසර්‍ගයෙන්**— ස්වාභාවික කාන්ති විශෙෂයන් ගේ (උත්තම කාන්තීන් ගේ) එක් වීමෙන්. **පරම මධුර වූ**— අතිශයින් රමණීය වූ. **මන්දාර ලතායෙහි**— දිව්‍ය ලොකයෙහි වූ මන්දාර නම් වූ වැලෙහි. **සඤ්ජාත**—උපන්. හට ගත්, **සාම ප්‍රබුද්ධ**—අඩක් පිපුණු. 'සාමි' යනු 'අඩ' යන අර්‍ථයෙහි වෙයි. 'Semi-circle' යනාදි තන්හි වූ 'Semi' යනු ද සමාන කැරැ බලන්නේ යැ. සුමෙධයන් ගේ සම්පූර්‍ණ විකාසය පසු වැ වන හෙයින් මෙ සේ කී හ. **අමිත මකරන්ද සුගන්ධ සම්බන්ධ බන්ධුර වූ**—

**අප්‍රමාණ** වූ මුවරඳ සුවඳ සමෘද්ධියෙන් මනොහර වූ. න + මිත = අමිත. මනන ලද්දේ මිත යි. මිත නො වනුයේ අමිත යි මකරන්ද නම් මල් රෙණු යැ. 'බන්ධුර' යනු රම්‍යාර්ථයෙහි වෙයි. **සනවකයක්**— සැත්තක්. කැනක්, පොකුරක් **ලොචනාහ්ලාදක වැ**— (ලොචන + ආහ්ලාදක) ඇසට ප්‍රීති ජනක වැ. **අප්‍රතිමල්ල**— අසදෘශ. අතුල්‍ය. අසමාන. 'මල්ල' යනු බාහු යුද්ධ කාරයාට නම්. ඔහුට විරුද්ධ වැ ඔහු හා තරගයට එනුයේ ප්‍රතිමල්ල යි. ප්‍රතිමල්ලයෙක් යමක්හු හට නො වේ නම් හේ අප්‍රතිමල්ලයෙකි. ඔහුට විරුද්ධ වැ සමාන වැ එන්නට සුදුස්සකු නැති බව යි, එයින් හැඟැවෙනුයේ. මෙහි වෛපුල්‍ය පර්වතය අප්‍රතිමල්ල යැ කීමෙන් ඒ පර්වතයට සමාන කළ හැකි අන්‍ය පර්වතයක් නැති බව හැඟැවූ හ. **වෛපුල්‍ය පර්වතොදරයෙහි**— (පර්වත + උදර) වෛපුල්‍ය නම් පර්වතයා ගේ අභ්‍යන්තරයෙහි. රජගහා නුවර 'වෛපුල්‍ය' නමින් පර්වතයෙක් වී යැ. **ප්‍රවර්තමාන වූ**— පවත්නා වූ. මේ කියැවෙන මණි රත්නය පවත්නේ වෛපුල්‍ය පර්වතයෙහි යැ. චක්‍රවර්ති රජකු නැති කලැ ඒ එහි සැඟැවී සිටැ ඇති කලැ ඔහු සමීපයට පැමිණේ. **වර්ධිෂ්ණු**—වැඩෙන්නා වූ. **රොචිෂ්ණු**—බබළන්නා වූ **සමුත්පතිෂ්ණු**— ඉහළ නැඟෙන්නා වූ. **මරීචි මාලා සමාකුල වූ**— රශ්මි මාලාවන් ගෙන් මොනොවට ආකුල වූ. ඒ රශ්මි මාලාවෝ වර්ධිෂ්ණුව හ, රොචිෂ්ණුව හ, සමුත්පතිෂ්ණුව හ. **ලොකාතිවර්ති චක්‍රවර්ති නරවර භොග්‍ය වූ**— ලොකය ඉක්මැ පවත්නා වූ චක්‍රවර්ති නරොත්තමයක්හු (රජක්හු) විසින් පරිභොග කටයුතු වූ. චක්‍ර රත්නයා ගේ බලයෙන් වර්ති වූ, පවත්නා වූ, රජ චක්‍රවර්ති නම්. ඔහු ගේ බලය මුළු ලොව මැඩැ ගෙනැ ඉක්මැ ගෙනැ ලොවට අධික වැ පවත්නේ යැ. මේ කියැවෙන මණි රත්නය චක්‍රවර්තියක්හු විසින් මැ ප්‍රයෝජන වින්ද යුතු යැ. **ලොක බහුමාන භාජන වැ**— ලොකයා ගේ බහුමානයට (මහත් ගෞරවයට) පාත්‍ර වැ (සුදුසු වැ.) කෙසේ ලොක බහුමාන භාජන වැ ද? චක්‍රවර්තිහු ගේ මහා මණි රත්නය සේ. **ගන්ධ ගජ කුම්භයෙහි**— ගන්ධ හස්තියා ගේ හිසෙහි. හස්ති කුම්භයෙහි මුතු උපදිති යි පුරාතනයේ කී හ. ගන්ධ ගජ කුම්භයෙහි උපන් මුත්ත විශෙෂ ශොභායෙන් යුක්ත වියැ යුතු. ගන්ධ ගජයා මෙ සේ වැනිණ:—

"**යස්‍ය ගන්ධං සමාඝ්‍රාය න තිෂ්ඨන්ති ප්‍රතිද්විපාඃ**
**ස චෛව ගන්ධගජො නාම නෘපාණාං විජයාවහඃ**"

යමක්හු ගේ ගන්ධය අසා විරුද්ධ හස්තීහු නො සිටිත් ද, රජුනට විජය එළවන්නා වූ හේ වනාහි ගන්ධ ගජ නම්. **සර්ව දොෂ විනිර්මුක්ත**— සියලු දොසින් විශෙෂයෙන් මිදුණා වූ. **මුක්තා ඵලයක්**— මුතු ඇටයක්. **නිරූපධි මධුර ලක්ෂ්මී නිවාස වූ**— අව්‍යාජ රමණීය ශොභාවට ස්ථාන වූ. 'ලක්ෂ්මී' යනු ශ්‍රීයට නම්. මෙ තන්හි ශ්‍රී නම් ශොභාව යි. මුතු ඇටය සැබැවින් මැ ශොභාවට නිවාස යැ. (ශොභායෙන් යුක්ත යැ.) කෙබඳු ශොභාවට නිවාස ද? **මධුර** වූ (රමණීය වූ) ශොභාවට. මිනිස් නුවණින්නුදු මුතු ඇටයක් වැනි වස්තුවක් නිපැදවියැ හැකි යැ. එ ද රම්‍ය ශොභා සම්පන්න යැ. එ හෙත් ඒ නිරුපධි රම්‍ය ශොභාවෙක් නො වේ. උපධියෙන්- ව්‍යාජයෙන්- වඤ්චනයෙන් රම්‍ය කරන ලද ශොභාවෙකි. ගන්ධ ගජ කුම්භයෙහි සඤ්ජාත වූ මුත්ත එ සේ නො වේ. නිරුපධි මධුර ලක්ෂ්මී නිවාස යැ. **සම්භාවන**— බුහුමන්. ගෞරව. **ඥානයෙන් වෘද්ධාවස්ථායෙහි**— නුවණින් වැඩි සිටි **අවස්ථායෙහි. ප්‍රලය සමය දිවසකර කරොපප්ලුත තුහින බින්දු ද්වයක් සෙ**— ලොක විනාශ කාලයෙහි දිවාකරයා ගේ (සූර්යා ගේ) රශ්මියෙන් වනසන ලද පිනි බිඳු දෙකක් සේ. 'ප්‍රලය' නම් විනාශය යි. විශෙෂයෙන් ලොක විනාශයට ඒ නම්. දිවස හෙවත් දවල කරනුයෙන් සූර්ය දිවසකර යි. කර + උපප්ලුත. 'කර' නම් රශ්මිය යි. උපප්ලුත = උපප්ලොපන (විනාශය) කරන ලද. **දුර්වාර මාරාහඞ්කාර ගොචර වූ**— නො වැළැක්වියැ හැකි වූ මරුවා ගේ අහඞ්කාරයට ගොදුරු වූ. "සියලු සතුන් මම නසමි" යනු මාර අහඞ්කාරය යි. එය වැළැක්වියැ හැකි නො වේ. 'දුර්වාර' යන්නෙහි අර්ථය 'දුක සේ වැළැක්වියැ හැකි— වැළැක්වීම දුෂ්කර වූ' යනු යි. එ හෙත් මෙහි 'නො වැළැක්වියැ හැකි' යන අර්ථය ලැබේ. **කථාශෙෂ වූ කල්හි**— මළ කල්හි. යමකු මළ කලැ ශෙෂ (ඉතිරි) වනුයේ ඔහු පිළිබඳ කථා යැ; නැත හොත් ඔහු ගේ නාමය යැ. එ හෙයින් යමකු "කථා ශෙෂ වූ හ"යි "නාම ශෙෂ වූ හ"යි කී කලැ හැඟෙනුයේ ඔහු මළ බව යි. **නානා ද්‍රව්‍ය...... නිරත්නාමාත්‍ය වර්ගයා**— විවිධ වස්තු සමූහයෙන් සම්පූර්ණ වූ භාණ්ඩාගාරය රැකීම් සඞ්ඛ්‍යාත කාර්යයෙහි නියුක්ත වූ අමාත්‍ය උත්තමයා. 'ව්‍යාපාර' නම් කම්යුත්ත යි. 'නිරත'

(නි + රම් + ත) යනු විශේෂයෙන් ඇලුණු (යෙදුණු) යන 'අර්ථය දෙයි. **භක්ති භාරවනත භස්ත ඇති වූ**— භක්තියේ (ආදරයේ) බරින් අවනත වූ (පහත් කරන ලද්දා වූ) අත් ඇති වූ. ගෞරවයට සුදුස්සකු ගේ ඉදිරියට එන කල්හි දෑත් පහත් කොටැ ගෙනැ එනු පුරාතනයන් ගේ සිරිති. **නිජ මස්තක**.........**ප්‍රාණ ලාභ ඇති වූ**— තමා ගේ මුදුනෙහි පිහිටුවන ලද ශ්‍රී පාද නමැති **උත්තංසයෙන්** (මුදුන් මලින්) සඵල භාවයට පමුණුවන ලද්දා වූ දිවි ලැබුම් ඇති වූ. ඒ අමාත්‍ය වරයා තමා ලැබූ දිවි සඵල කෙළේ යැ. කෙසේ ද? සුමේධයන් ගේ ශ්‍රී පාද නමැති මුදුන් මල් කඩ තමා ගේ හිසෙහි පිහිටුවා ගැනීමෙනි. හෙවත් සුමේධයන් ගේ පා වැඳීමෙනි. ඒ පාදයන් වඳින්නට ලැබීම ඔහුට එ තරම් ප්‍රීතියෙකි. වි + න්‍යස් + ත. 'න්‍යස්' (පිහිටුවීමෙහි) ධාතු යි. 'උත්තංස' යනු හිස් මුදුනෙහි පැළැඳෙන මල් මාලාවට නමි. 'සඵලීකෘත' යනු සඵල කරන ලද යන අර්ථ ඇත්තේ යැ. 'කෘ' ධාතුයෙන් ද 'භූ' ධාතුයෙන් ද නිපන්නක් මෙ සේ පර වැ සිටි කල්හි පූර්ව ශබ්දාන්තයෙහි 'ඊ' වෙයි. සඵල + කෘත = සඵලීකෘත. ගුණ + භූත = ගුණීභූත. **පරමාදර**— (පරම + ආදර) උත්තම ආදරය. **ස්වර්ගස්ථ වූ බැවින්**— මැරුණු හෙයින්. ස්වර්ග + ස්ථ = ස්වර්ගයෙහි සිටි. මළවුනට ගෞරව සඳහා ඔවුන් ස්වර්ගයට ගිය බව හඟවන 'ස්වර්ගස්ථ වූ' යනු යොදති. **කුල ක්‍රමානුගත වූ**— කුල පරම්පරායෙන් ලැබුණා වූ. 'අනුගත' යනු 'අනු වැ ගියා වූ,' යන අර්ථ ඇත්තේ යැ. වස්තුවක් අනුගත වීම නම් ඒ වස්තුව ලැබීම යි. **සමන්වා**— එක් කරවා. ගණන් බලා. **අමිශ්‍ර**— නුමුසු. අසාර දූසින් මිශ්‍ර නුවූ. **සප්ත රත්න**— සත් රුවන්.

"සුවණ්ණං රජතං මුත්තා මණිවෙළුරියානි ච
වජිරං ච පවාලං ච සත්තාහු රතනානි මෙ" .....

යනුයෙන් දැක්වුණු රන්, රිදී, මුතු, (රතු) මැණික්, වෛදූර්‍ය, වජ්‍ර, ප්‍රවාල, යන රුවන් සත. **වූ නිසා**-- වූ ආකාරය. "කො තරම් ද යත හොත්" යන්නක් හෙළා ගෙනැ අර්ථ සමන්වා ගත යුතු. **ව්‍යවස්ථිත**— ව්‍යවස්ථා කරන ලද "අය මුඛ මෙ පමණ යැ. එක් එක් අය මුඛයෙන් මෙ පමණ මෙ පමණ උපදනේ යැ. ව්‍යය මුඛ මෙතෙකැ. එක් එක් ව්‍යය මුඛයෙන් මේ පමණ මෙ පමණ වියදම් වන්නේ යැ" යනාදීන් නියම ඇති. **අය වියදම ස්වරූප දන්නා**— අයෙහි ද වියදමෙහි ද තත්ත්වය දන්නා වූ. **අනවස්ථිත** — පෙර

කී පරිදි ව්‍යවස්ථා (නියම) නැති. **විය දම් කරන්**— විය දම් කරන කල්හි දු. වියදම් කරතත්. **එක් පුරුෂායුෂයකින්**— එක් පුරුෂයක්හු ගේ ජීවිත කාලය ඇතුළතැ දී. **සාධා වදාල**— සිද්ධ කොටැ ගත හොත්. මෙහි 'වදාල' යනු ගෞරව පිණිස යෙදිණ. එයින් විශෙෂ අර්ථයෙක් නො ලැබේ. 'සැබව' යි කිව ප්‍රමාණ වෙයි. ප්‍රකාශ කළ යුතු ක්‍රියාර්ථය පූර්ව ක්‍රියා රූපයෙන් දක්වා, එයට පර කොටැ 'වදාර' ධාතුයෙන් නිපන් පදයක් යොදනු හුදු ගෞරව පිණිස වෙයි. නො එ සේ වන තන්හි 'වදාර' ධාතුව කීමෙහි වැටේ. එ ද ගෞරවාර්ථයෙන් යුක්ත යැ. **එක් දවසක්**— මේ කියන්නට යනුයේ සුමෙධයනට පහළ වූ සිතිවිල්ලෙකි. එ බඳු අපූර්ව වූ විස්මය ජනක වූ සිතිවිල්ලෙක් කුමකට පහළ වී ද? මේ තැන් පටන් කියැවෙන දෑ සිදු වූව ඉනා හෙයින් පහළ වී යැ. **අප වැන්නනුදු "නිවන් දකුම් හ"යි සිතුව මනා කල්හි**— දහම් සරණ කනීයන් වැන්නන් පවා "නිවන් දකුම්හ"යි සිතුව මනා කාලයෙක් පැමිණියේ යැ. එ නම් මේ බුද්ධොත්පාදය යි. ඒ කාලය පැමිණියේ එ දා සුමෙධයන් ඒ සිතිවිල්ල සිතූ බැවිනි. "එ සේ නො කැරිණි නම් අප වැන්නෝන් 'නිවන් දකුම් හ'යි සිතත් ද?" යනු මේ හැඟැවූ සැටි යැ. **දහම් පිළියමක්**— ධර්ම නමැති ප්‍රතිකර්මයක්. සසර නම් මහා විෂයෙකි. එයට පිළියම (බෙහෙද) ධර්මය යි. එ දා සුමෙධයන් සිතූ සිතිවිල්ල කරණ කොටැ ගෙනැ සංසාර නමැති මහා විෂයට දහම් පිළියමෙක් පැවැත්විණ හෙයින ද මේ තයින් සලකන්නේ යැ. **සුවිසි අසඞ්ඛ්‍යයක්**— අසඞ්ඛ්‍ය විසි සතරක්. සුමන මාලාකාර සමාගමය ආදි සුවිසි තැනෙක්හි දි බුදුනු, එක් එක් තන්හි දී අසඞ්ඛ්‍යය බැගින්, සුවිසි අසඞ්ඛ්‍යයක් සත්ත්වයන් නිවන් දක්වූ හ. සෙසු තන්හි දී සිය දහස් ඈ ගණනින් නිවන් දුටුවෝ මෙහි නො ගැනුණ හ. **ත්‍රිභුවන මර්දනයෙහි**— (ස්වර්ග මර්ත්‍ය පාතාල යන) තුන් ලොව මැඩීමෙහි (පෙළීමෙහි) **නිරන්තර තත්පර** වූ— නිරතුරු ඇරැණා වූ. සියලු කල්හි (එහි මැ = ත්‍රිභුවන මර්දනයෙහි මැ) යෙදුණා වූ. **වශවර්ති මාරයා**— මෙ නම් දෙවියෙක් වේ ල. ඔහු ගේ ව්‍යාපාරය සත්ත්වයන් පුණ්‍ය කර්මයෙන් වැළැක්වීම යැ යෙත්. බොධි සත්ත්වයන් බුදු වන්නට හුන්තවුන් හා ඔහ් මහා යුද්ධයක් කොටැ පැරැදී පලා ගියේ ල. තුන් ලෝ වැස්සන් තමා ගේ වශයෙහි පවත් වන හෙයින් ඔහුට

වශවතී නාමය වී ල. කවීහු රාගය අනඞ්ග නම් දෙවියකු
කොටැ ලූ හ. ඔහුට ද 'මාර' යන නාමයක් වෙයි. හෙ ද
වශවර්ති යැ. දෙ දෙන එකෙක් මැ යැ යනු ඇතැම්
තත්ත්වඥයන් ගේ මතය යි. **අවශවර්ති වූ**— තමා ගේ වශයෙහි
නො පවත්වන්නකු වැ. බෝ සතුන් පරදවන්නට— තමා
වශයෙහි (යටතෙහි) ලන්නට— නො හැකි වූයෙන් අවශවර්ති
වී යැ. **පිට හඬහඬා**— පිට තමතමා. ගොනකු ගේ පිටට
වැරින් පහර දෙන්නට වන් කලැ හේ පිට හඬහඬා දිවෙයි.
**මුහුණැ දුලි ගෑවුණ මනා කලැ**— පැරැදී විළි වැදුණ මනා
කල්හි. ලජ්ජාවට පැමිණියවුන් ගේ මුහුණ කළු වෙයි, දුලි
ගෑවුණාක් මෙන් වෙයි. එ හෙයින් ලජ්ජාවට පැමිණීම ද
මුහුණෙහි දුලි ගෑවීමෙකි. **මෙ කපැ**— මේ කල්පයෙහි.
**හෙබැවී**— ශොභිත වී. අලඞ්කෘත වී. **භද්‍ර කල්ප**— සුන්දර
කල්පය. පස් බුදු කෙනකුන් නිසා භද්‍ර වී නු යි— සුන්දර වී නු යි—
කල්පය ද භද්‍ර නම් වී. **හෙබූ**— වැතිරු. ශයනය කොටැ. 'හෙ'
ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. **යමා මහ පෙළහර**—
(එකකට අනෙක විරුද්ධ වූ දෙකක් එක් වර කරන හෙයින්)
යමක නම් වූ මහා ප්‍රාතිහාර්යය. 'යමක' යනු 'දෙක යැ'
යන අර්ථ ඇත්තේ යැ. සෘද්ධි බලයෙන් කැරෙන අතිමානුෂ
ක්‍රියාවෝ ප්‍රාතිහාර්ය නම් වෙත්. එක් වර ගිනි කඳ හා දිය
කඳ හා පිට කිරීම් ආදිය යමක ප්‍රාතිහාර්ය යි. **තුන්
පියවෙයකින්**— පොළොවෙහි එක් පියවරක් ද, යුගන්ධරැ
මුදුනෙහි එකක් ද, මෙර මුදුනෙහි එකක් ද තුබූ බැවින්
තුන් පියවර සරි යැ. **තව්තිසා වැඩැ**— ත්‍රයස්ත්‍රිංශත්
(තාවතිංස) නම් දිව්‍ය ලොකයට ගොස්. දෙවියන් තුන්
තිස් දෙනා ගේ දිව්‍ය ලොකය ත්‍රයස්ත්‍රිංශත් නම්. **පාණ්ඩු
කම්බල ශිලාසනය**— පාණ්ඩු (සුදු) කම්බල (කම්බිලි) වර්ණ වූ ගල්
අසුන. ශක්‍රයා ගේ ආසනය. **විජම්**— අභිධර්මය. බුදුහු තව්තිසා
වැඩැ මාතෘ දිව්‍ය පුත්‍රයා ඇතුළු දෙවියනට තෙ මසක්
අභිධර්මය දෙසූ හ. **නිවන් සෙව්ව මනා කල්හි**— නිර්වාණය
සෙවනය කළ මනා හෙයින්. 'සෙව්ව' යනු 'සෙවු'
(සෙවුම්හි) ධාතුයෙන් වූ අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි.
අතීත රූප යි. සෙවු + අ = සෙව් + අ = සෙව්ව. අතීත
අසම්භාව්‍ය ප්‍රත්‍යය 'අ' යනු යි. එය පර කල්හි ධාතුව
අතීත කෘදන්ත නාම රූපය ගනී. **තුනුරුවන් රකවරණ**—
බුද්ධ ධර්ම සඞ්ඝ යන ත්‍රිවිධ රත්නයෙන් වන රක්ෂාවරණය.
**පස් වා දහසකට**— පඤ්ච වර්ෂ සහස්‍රයකට. හවුරුදු පන්

දහසකට. ‘වං’ යනු වර්ෂයට (හවුරුද්දට) නමි. **පැවැත්ත**— පවත් + අ = පැවැති + අ = පැවැත්ත. **පිළිසඳ ගත් නුවර**— (මවු කුසෙහි) ප්‍රතිසන්ධිය ගත්තා වූ නගරය. කපිලවාස්තුව. **උපන් උයන**—ලුම්බිනිය. **සත් පියවර එබූ තෙන**— උපන් විගසැ පියුම් පිපිත් සත් පියවරක් තබා ගිය තැන. **සිංහ නාදය**— “අග්ගො’හමස්මි ලොකස්ස. ජෙට්ඨො’හමස්මි ලොකස්ස. සෙට්ඨො’හමස්මි ලොකස්ස. අයමන්තිමා ජාති. නත්ථි’දානි පුනබ්භවො” යනුයෙන් කළ අභීත නාදය. “මම ලොවට අග වෙමි. මම ලොවට දෙටු වෙමි. මම ලොවට සෙට වෙමි. මේ අන්තිම ජාතිය යැ. ඉතින් නැවැතැ වීමෙක් නැති” යනු අර්ථ යි. **කාල දෙවලයා මුදුනෙහි තුබූ පය යැ**— සුදොවුන් රජු බුදු වන පුතකු ලද බව අසා කාළ දෙවල නම් සෘෂීනු ඔහු දක්නට ආ හ. රජ බිළිඳු කුමරුන් ගෙනැ අවුත් සෘෂීන් වන්දන්නට සැරැසිණ. කුමරුන් ගේ පතුල් පෙරළී ගොස් සෘෂීන් ගේ මුදුනෙහි පිහිටියේ යැ. **නො හැරැ ගිය දඹ සේයා යැ**— වප් මඟුල් දා පිය රජ බිළිඳු කුමරුහු ද කුඹුරට ගෙනැ ගොස් දඹ රුක් සෙවණෙකැ හොවා කෙතට බට. හිරු හැරී ගිය ද දඹ රුකෙහි සෙවණ කුමරුන් සිටි තැන හැරැ නො ගොස් එ තෙන මැ වසා සිටියේ යැ. **එකුන් තිස් හවුරුද්දක් හිඳිවූ**— විසි නව හවුරුද්දක් (තමන් ගේ වයස විසි නව හවුරුද්දක් වන තෙක්) සෙවනය කළ (සමීපයෙහි හිඳුවා ගත්.) **ඇඹණියෝ**— බිරින්ද. යශොධරා දෙවිය. ‘අඹු’ ශබ්දයෙන් පර වැ ගෞරවාර්ථයෙහි ‘අණි’ ප්‍රත්‍යය වෙයි. අඹු + අණි = (‘අ’ අතාමාත්‍ර වීමෙන්) ඇඹණි. **පුතණුවෝ**— රාහුල කුමාරයා. **කෙළි උයන**— ක්‍රීඩා කළා වූ උයන. **දුටු සිව් නිමිති**— ජරා රූප, ව්‍යාධිත රූප, මෘත රූප, ශ්‍රමණ රූප, යන සතර පෙර නිමිති. **නැගි අසා**— මහබිනික්මන් කරන කලැ නැඟී ගිය ‘කන්ථක’ නම් අශ්වයා. **සමය**—වේලාව. **සකිස වැ මැ**—සිතීම හා සමඟ මැ. **පෙරළා බැලූ**— නුවර හැරැ බොහෝ දුර ගිය විටැ සිදුහත් කුමරුනට යළි දු සිය නුවර දක්නා රිසි උපන. පොළොව ඇඹැරී නුවර ළං කොටැ දක්වී යැ. **සිනු ගඟ**— පැනැ ගිය (‘අනොමා’ නම්) නදිය. **වැල්ල**— ගං තෙර වැලි තලාව. **හළ මල සළු**— දුරැ කළා වූ හැඳි වස්ත්‍ර. හැන්ද වූ සළු කිලුටු නුවුව ද මල සළු නමි. ‘මල සළු’ යන්නෙහි අර්ථ නම් ‘කිලුටු වස්ත්‍ර’ යනු යි. **අට පිරිකර**— හඳනය, තනි පට පොරෝනය, දෙපට පොරෝනය, පටිය,

පාත්‍රය, කරය, ඉඳි කටුව, පෙරහන, යන පරිෂ්කාර අට. මහ බඹ මේ පිරිකර අළ. **සිඟා වන් ගම—** අහර සිඟමින් පැමිණි ගම. රජගහා නුවර. **මෙහෙ කළ—** මෙහෙවර (උපස්ථාන) කළා වූ. **පස් වග මහණ—** කොණ්ඩඤ්ඤ, භද්දිය, වප්ප, මහානාම, අස්සජි, යන පස් මහණෝ. **පැන් පැනෑහූ—** ජල ස්නානය කළා වූ. **තොට—** නෙරඤ්ජරා ගඟෙහි තීර්ථය. **පත පත සෙලා—** විනත්‍ය සි. 'පත පත' යන්නෙන් 'නැවැත නැවැත' යන අර්ථය ගත හැකි යැ. **මඟුල් මෙහෙ—** උත්සව පිළිබඳ කට යුතු. බුදු මඟුලෙහි බඹු සේ සත් නැඟීම සක් දෙව් සක් පිඹීම යනාදි මඟුල් මෙහෙ යැ. **තුන් යම්හි—** රාත්‍රියෙහි ප්‍රථම මධ්‍යම පශ්චිම යන යාම ත්‍රයයෙහි. **තුන් විදුව—** පූර්වේනිවාසානුස්මෘතිඥානය (පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණ) දිව්‍යචක්ෂුරභිඥානය (දිවැස් නුවණ) ආශ්‍රවක්ෂය කර ඥානය (ආශ්‍රවයන් නසන නුවණ) යන තුන් නුවණ. **අරුණෝදයෙහි—** (අරුණ+උදය.) අරුණාලෝකය උදා වන කාලයෙහි.

"චතස්‍රො ඝටිකාඃ ප්‍රාතරරුණොදය උච්‍යතෙ''

සි යූ බැවින් සූර්යෝදයයට ඝටිකා (පැ) සතරක් පළමු අරුණෝදය වෙයි. හෝරා යන්ත්‍රයෙහි පෙර වරු සතර වන හෝරාව පසු වී මිනිත්තු සූවිස්සක් වන විටැ මේ වෙලාව පැමිණෙයි. **සම්බුද්ධ රාජ්‍යය—** බුද්ධත්වය. **වැදෑ ගෙනෑ හොත් ඇතා—** නාලාගිරියා. **සක්මන—** දෙවියන් මැවූ රුවන් සක්මන. **දෙව් ලොවින් බට හිණ—** විජම් දෙසා දෙව් ලොවින් බස්නා දවස් මෙර මුදුනෙහි සිටැ මිනිස් ලොවට දෙවියන් මැවූ රුවන් හිණි මග. **උපස්ථාන කළ මකැතා—** පාරිලෙය්‍යක නම් හස්තියා. **මීහි—** මී. **වඳුරා—** බුදුන් පාරිලෙය්‍ය වනයෙහි වසන කලැ වඳුරෙක් මී වදයක් කඩා ගෙනැ අවුත් පිළිගැන්වී යැ. **දරණ ගැබැ වඩා හිඳිවූ නාගා—** දරණ වැල ඇතුළෙහි වඩා හිඳුවා ගත් ('මුචලින්ද' නම්) නාගයා. **පිරිමැසූ—** කට යුතු සම්පූර්ණ කළා වූ. **බාල මැණියන් වහන්සේ—** මහා ප්‍රජාපතී ගෝතමීන් වහන්සේ. **සෙනසුන් හැමැදි වහන්සේ—** විහාරය අතු ගෑ (ආනන්ද) ස්ථවිරයන් වහන්සේ. **වෙහෙර කැරවූ සිටාණෝ යෑ—** ජෙතවනාරාම විහාරය කැරවූ අනේපිඬු සිටාණෝ. **උපාසිකාවෝ—** විශාඛාවෝ. **සල් වනය—** කුසිනාරා නුවර මල්ල රජුන් ගේ 'උපවර්තන' නම් සල් උයන. **පියවර එබූ තෙන—** සිරි පතුල් ලකුණු පිහිටිවූ සමනොළ ආදි තැන්.

**සැදැහැයෙන්**— ශ්‍රද්ධායෙන්. හැදෑහිල්ලෙන්. **තුඩැ වනා පුවන්**— මුඛයෙහි තවරා පූ ජනයන්. කටින් කියූවන්. යම් නමක් කියන කලැ එය තුඩෙහි (කටෙහි) වැකෙන්නේ (නැවැරෙන්නේ- ගැවෙන්නේ) නම් වෙයි. 'වනා පූ' යන තන්හි 'පූ' යනු 'පිය' (හැරීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම සි. මේ ධාතුව පියා- පියති- පියි, පී- පියූ, පූ, පී- ඈ විසින් වරනැඟෙයි. 'පියූ' 'පූ' 'පී' යන තුන මැ සමානාර්ථ සි. **එක හෙළා**— එක් වරැ මැ. 'එක එල්ලේ' යනු ග්‍රාමීණ ව්‍යවහාරයෙහි එයි. **තමන් වන්**— තමන් වැදුණා වූ (පැමිණියා වූ.) **වන මනා කල්හි**— වැදුණ (පිවිසුණ) මනා හෙයින්. **මෙ වැනි යක් බිමෙකැ**— මේ ලඞ්කාව වැනි යක්ෂ භූමියෙකැ. ලක් දිව 'යක්ෂ' නම් අමනුෂ්‍ය වර්ගයකට නිවාස වූ හ යි පිට රටුන් කී සේ අදහා මෙ සේ කියතු දූ, මේ ග්‍රන්ථය කෙළේ ද යක්ෂයෙක් මැ යැ. අනුන් ගේ කියුම් අදහා අප ගේ මැ මුත්තනට පරිභව කිරීමට සිදු වීම මහත් අභාග්‍යයෙකි. **ගැත්තම් හ**— ගැතියම් හ. දාසයම් හ. **නො බා**— බිය නො ගෙනැ. **සතර අපාය**— නරක, තිරිසන්, ප්‍රේත, අසුරකාය, යන සතර. අයෙන්- අභිවෘද්ධියෙන්- අපගත වූයේ අපාය සි. **දෙව් බඹ ලෝ**— දිව්‍ය ලොක බ්‍රහ්ම ලොක.

4. **සමෘද්ධීන්**— සම්පත්ති කරණ කොටැ ගෙනැ. **ප්‍රසාදකර වූ**— සිත් පැහැදීම කරන්නා වූ. **අතුල**— අසමාන. උපමා රහිත. 'තුලා' නම් සමාන බව සි. තුලාව නො වනුයේ යමකට ද ඒ අතුල සි. **පලග් බැඳැ**— බද්ධ පර්යඞ්ක වැ, අරමිණිය ගොතා. 'පලග' යනු ප්‍රකෘතිය සි. අන්ත්‍ය ස්වර ලොපයෙන් 'පලඞ්' යනු ද අඝොෂාදෙශයෙන් 'පලක්' යනු ද වෙයි. පුරාතන භාෂායෙහි අඝොෂාදෙශය නො වී යැ. **සත්ත්වසහට**— සත්ත්වයා හට. ඇතැම් තන්හි 'හට' පර කලැ පූර්ව පදාන්ත 'ආ' කාරය හ්‍රස්ව වෙයි. **පිළිසඳ පෙරළිම්**— ('පිළිසිඳැ' යනු මුද්‍රණ දොෂ සි.) ප්‍රතිසන්ධිය පෙරළීම (වෙනස් වීම.) මේ ප්‍රතිසන්ධි විපර්යාසයට නිදර්ශන දස වන ඡේදයෙහි පටන් දැක්වෙයි. **දුකැ**— දුක් යැ. මෙ බඳු තන්හි 'යැ' නිපාතයේ ද 'සි' නිපාතයේ ද ව්‍යඤ්ජන ලොපය වෙයි. දුක් + සි = දුකි. **ජාතසහට**— උපන්නහු හට. **ජීර්ණසහට**— ජරාවට පැමිණියහුට. දිරා ගියහුට. **ව්‍යාධි**— රොග. **අමුක්ත වැ**— නො මිදී, මුච් + ත = මුක්ත. 'මුච්' (මිදීමෙහි) ධාතු සි. **අජර**— ජරා නැති. **අමර**— මර (මරණය) නැති. **ක්‍ෂෙම**— නිර්භය. සුරක්ෂිත. **ශාන්ත පුරය**— නිර්වාණය.

**මෝහයෙන්**— මූළ්‍හ බව නිසා. කාරණාකාරණ තත්ත්වාකාරයෙන් නො වැටැහෙන හෙයින්. **අශුචියෙන් අශුචි වදනේ යැ**— අපවිත්‍රයෙන් අපවිත්‍රය **නිකුත්** කරන්නේ යැ. ශුචි නම් පිරිසුදු සි. ශුචි නො වනුයේ අශුචි සි. අශුචි වූ ශරීරයෙන් අශුචි වූ මල මූත්‍ර සෙම් සොටු ආදිය නිකුත් කරන්නේ යැ. **නියත වැ**— නියම කරන ලදු වැ. **නව දොරක්**— දෑස, දෙ කන, දෙ නාසා පුඩය, මුඛය, ගුදය, මූත්‍ර මාර්ගය, යන දොර නවය. **තිමිරි ගෙය**— වදන ගෙය. තිමිරි නම් අන්ධකාරය සි. පුරාතනයෝ සූතිකාගාරය (වදන ගෙය) අඳුරු කොට තැනූ හ. **මඬෝර ගෙය**— වැසි කිළිය. **සැවයට**— ශවයට. මිනියට. 'සැව' යනු මෘත ශරීරයට නමි. **කළ**— පිට කළ. **නො සතස්**— අපිරිසුදු දෑ. අශුචි. **බලාද්**— බලා ද. . බැලූ කලැ ද. **එළවන්නේ යැ**— පමුණුවන්නේ යැ. **දුඃඛ කාරණය**— දුකට හෙතුව. **වැඩි වැඩි සේ**— වැඩි වැඩි වූ පමණට. **බරුසුලා**— බර උසුලා. මේ ශරීර භාරය ධරා ගෙනැ.

**5. ප්‍රතිපක්‍ෂ**— විරුද්‍ධ, **ශරීර සන්තාපකාර වූ**— සිරුර තැවීම කරන්නා වූ. **ගුණක්**— ලක්‍ෂණයක්. **අනුමානයෙන් මැ**— අනු වැ මැනීමෙන් (කල්පනා කිරීමෙන්.) එකක් වන සේ බලා එය අනු වැ අනෙකක් වන පරිදි සිතා ගැනීම අනුමාන නමි. ඉංගිරිසියෙහි 'Inference' යනු වෙයි. සැකයට දූන් අනුමාන යැ යි යෙති. ඒ මග දොසෙකි. **අවශ්‍යයෙන් මැ**— නො වැරැදූ මැ. යමක් නැති වැ කටයුතු සිදු වේ නම් ඒ 'වශ්‍ය' යැ, යට පත් කළ හැකි යැ, නො ගෙනැ කළ හැකි යැ යමක් නැති කලැ කටයුතු නො මැ සිදු වේ නම්, ඒ අවශ්‍ය යැ. **ඇත මැනැව**— ඇති වියැ යුතු යැ. **භරිත වූ**— බර ඇති වූ. පිරුණා වූ. **අපරාධ බව මුත්**— වරද බව විනා. **විවිධායුධහස්ත වූ**— නානාප්‍රකාර ආයුධ ගත් අත් ඇත්තා වූ.

**6. මහා ව්‍යාධින්**— මහත් රොගයෙන්. 'ව්‍යාධින්' යන්නෙහි තුන් වන විබති. **ශාන්තියට**— සංසිඳීමට. **අෂ්ටාඞ්ගායුර්වේදයෙහි**— (අෂ්ට + අඞ්ග + ආයුර්වේද ද) අඞ්ග අටකට බෙදුණු ආයුර්වේදයෙහි (වෙද කමෙහි) ශල්‍ය, ශාලාක්‍ය, කායචිකිත්සා, භූත විද්‍යා, කෞමාරභෘත්‍ය, අගද තන්ත්‍ර, රසායන තන්ත්‍ර, වාජීකරණ තන්ත්‍ර, යන මේ අට අඟි. එහි ශල්‍ය නම් සැත් කම් යැ. ශාලාක්‍ය නම් හිසෙහි රොගයනට ප්‍රතිකාර යැ. කාය චිකිත්සා නම් ශාරීරික රොගයනට කරන

පිළියම් යැ. භූත විද්‍යා නම් අමනුෂ්‍යොපද්‍රවයන් පිළිබඳ කටයුතු යැ. කෞමාරභෘත්‍ය නම් කුමරකුමරියන් (ළදරුවන්)ගේ රෝගාදියට පිළියම් යැ. අගද තන්ත්‍ර නම් විෂෞෂධ උගන්වන තන්ත්‍රය සි. රසායන නම් ජරාව වළක්වා දීර්ඝායුෂ දෙවන ඖෂධ යැ. වාජීකරණ නම්—

“යද්ද්‍රව්‍යං පුරුෂං කුර්‍යාද්වාජිවත්සුරතක්‍ෂමම්
තද්වාජීකරණං ඛ්‍යාතම්”

යනාදීන් දක්වන ලද, පුරුෂ ශක්ති හීන වූවුන් වාජියකු (අශ්වයකු) මෙන් ශක්ති යුක්ත කරන්නා වූ ඖෂධ සි. **ගන්නි**— මේ පුරාණ ව්‍යවහාර සි. වර්තමාන ව්‍යවහාරය ‘ගනී’ යනු සි. **ව්‍යාමොහ බව**— අතිශයින් මුළා වූ බව., වි + ආ + මුහ් + අ = ව්‍යාමොහ. ‘මුහ්’ (මුළා වීමෙහි) ධාතු සි. **ව්‍යසනයෙහි**— උපද්‍රවයෙහි විපත්තියෙහි.

**7.** ශුචිකාමී— පිරිසුදු බව කැමැති. **සැධියැ යුතු යැ**— සිද්ධ කළ යුතු යැ. **දුදුරු වූ**— ජර්ජර වූ. දිරා ගියා වූ. **නවච්ඡිද්‍ර වූ**— (නව + ඡිද්‍ර) සිදුරු නවයක් ඇති වූ. නව සිදුරු නම් චක්‍ෂුරාදි නව ද්වාරය සි. **මහඇඟි**— මහාඞ්ගී. මහත් අඟය ඇති. බොහෝ වටිනා. ‘හ’ කාර ලොපය වැ මෙය ‘මාඇඟි’සි .වියැ හැකි. ‘මාහැඟි’ යනු නො වියැ හැක්කෙකි. **දෙහොසි**— ද + හෝ = (ස්වර පර රූපයෙන්) දෙහෝ. ‘ද’ යනු එක් නිපාතයෙකි. ‘හෝ’ යනු එක් නිපාතයෙකි. දෙහෝ + සි = දෙහොසි. ‘සි’ පර කල්හි පූර්‍ව දීර්ඝය හ්‍රස්ව වෙයි. ‘සි’ යනු වාක්‍ය සම්බන්ධයෙහි නිපාත සි. **සසර පමණින්**— සංසාර ප්‍රමාණයෙන්. සංසාරය ඇති තාක්. **වැළැහි**— මහ හැර. (ශරීර නමැති මහ සොරු කෙරෙන්) මිදී.

8. **උපකරණ**— (ආහාර පානාදිය පිණිස) වුව මනා දෑ. විය පැහිදුම්. **කාවණුවකුදු**— කාවණුවක් + දු = (ස්වරාගමයෙන්) කාවණුවකුදු. කහවණු = (‘හ’ ලොපයෙන්) ක + අවණු = (සවර්ණ දීර්ඝයෙන්) කාවණු. කහවණුව (කාර්ෂාපණය) නම් මසුරන් විස්සක් පමණ අගනා රන් මිලෙකි. මසුරන් සොළොසක් වටනේ යැ සි ද යෙති. **අනාථ ගමනින්**— අශරණ ගමනින්: ‘නාථ’ යනු ස්වාමියා යැ, ප්‍රධානයා යැ, පිහිට වන්නට සිටියේ යැ යන අර්ථ ඇත්තේ යැ. නාථයකු නො වනුයේ යමක්හු හට ද ගේ අනාථ සි. **අඥාන විජෘම්භණය යැ**— මෝඩ වැජැඹීමෙ කැ. **නුනුවණින්**

පැවැත්මෙකැ. **ශත සහස්‍ර ගුණයෙන්**— සිය දහස් වාරයක්. **වඩා**— වැඩි කොටැ. පොළී කොටැ. **නිර්වාණාධිගමය**— (නිර්වාණ+අධිගමය) නිර්වාණය අවබොධ කිරීම. **කෙතෙැ ඝන බව**— කුමක් ද? ධන රාශිය. **අඞ්කුරයක්**— පැළයක්. සුමෙධයනට එ කලැ ඇති වූ ඥානය සර්වඥතාඥානයට හට ගත් අඞ්කුරයක් වැන්නැ. **අසාධාරණ**— අසමාන. අනුනට නැති ඥාන **මහිමයෙන්**— ඥානයා ගේ මහත් බැවින්. 'මහිමන්' යනු මහත් බවට නම්. **අසාරාර්ථය**— සාර වූ අර්ථයක් නැති බව. අරටුවක් නැති බව. **උත්සාහ සම්පත්තියක්**— උත්සාහයා ගේ සමෘද්ධියක්. **පරාක්‍රම**— බලය. ශාරීරික සාමර්ථ්‍යය. **අභිමත**— ඉෂ්ට. කැමැති. **ස්වාර්ථ**— (ස්ව + අර්ථ) තමාට වැඩ. **පරාර්ථ**— (පර + අර්ථ) අනුනට වැඩ. **භවය**— උත්පත්ත්‍ය. **අජල නිර්වාපණීය**— නිවියැ හැක්කේ නිර්වාපණීය සි. ජලයෙන් නිවියැ හැක්කේ ජලනිර්වාපණීය සි. ජලනිර්වාපණීය නො වනුයේ අජලනිර්වාපණීය සි. 'දියෙන් නො නිවියැ හැකි' යනු අර්ථ සි. **අමන්ත්‍රශමනීය**— මන්ත්‍රයෙන් ශමනය නො කළ හැකි. **අනෞෂධසාධ්‍ය**— ඖෂධයෙන් සන්හිඳිවියැ නො හැකි. **මහා වහ්නි ත්‍රයෙකින්**— මහ ගිනි තුනෙකින්. **ආදීප්ත වැ**— සියලු අතින් ඇවිළී ගෙනැ. **මුත්භරෙකැ**— මූත්‍රාගාරයෙක් යැ. **බුද්ධින්**— හැඟීමෙන්. කල්පනායෙන්. **ඝොර විෂවූ**— දරුණු වූ විෂ ඇති. ඝොර වූ විෂ යමක්හු ගේ ද හේ ඝොරවිෂ සි. **සකල දුඃඛ නිදාන වූ**— ('නිධාන' යනු මුද්‍රණ දොෂ සි.) සියලු දුකට හෙතු වූ (ආදි කාරණය වූ.) **පඤ්ච කාම ගුණයන්**— පස් කම් රස. **සලිල**— දිය. **සුඛ ශූන්‍ය**— සුව සුන්. සුවයක් නැති. **සංසාරයෙන්**—

"ඛන්ධානං පටිපාටි ධාතුආයතනාන ච
අබ්බොච්ඡින්නං වත්තමානං සංසාරොති පවුච්චති"

සි යූ බැවින්, ස්කන්ධයන් ගේ ද ධාතු ආයතනයන් ගේ ද පරිපාටිය අව්‍යවච්ඡින්න වැ (නො කඩ වැ) පවත්නේ සංසාර නම්. **සිත් දී**— සිත් යොමු කොටැ. සිත බැඳැ. **ස්ථිර වූ බුද්ධියෙන්**— 'ස්ථිර යැ'- 'නිත්‍ය යැ'- යන කල්පනායෙන් **පෙළී**— මිරිකී. පීඩිත වැ. **අශුචියෙහි ශුචි සංඥයෙන්**— අපවිත්‍රයෙහි 'පවිත්‍ර යැ' යන හැඟීමෙන්. **ආතුර වැ**— ලෙඩ වැ. පෙළී. **අනවරතයෙන්**— (න + අවරත) නිරන්තරයෙන්. අවරතය (විරාමය- වැළැක්ම) නැත්තේ යමෙක්හි ද ඒ අනවරත සි. 'අවරත' යන තන්හි 'රත' නම් ඇල්ම සි. රතයෙන් (ඇල්මෙන්) තොරවූයේ අවරත නම්.

විරාමය (වැළැකීම) යැ යනු අර්ථ සි. **ස්වරූප නිරූපණය කරන** —තත්ත්වය (ඇති සැටි) ප්‍රකාශ කරන (දක්වන.) **එ සේ වූ චිත්ත ඛේද කාරණයෙක්**— එ තරම් වූ සිත පෙළන (සිතට දුක් උපදවන) කරුණෙක්. සංසාරය සේ වූ දුකක් නැතැ සි යූ සේ සි. **විපරිණාම දුඃඛ යැ**— පෙරළීම් (වෙනස් වීම්) වශයෙන් දුක යැ. සුඛ යැ සි යමෙක් ලෙවිකි වේ නම් එය නැති වැ පෙරළී ගිය කලැ එ මැ දුකෙකි. ඒ දුකට හෙතු වූයේ අර 'සුඛ යැ' සි ගත් දෑය යැ. මේ යැ විපරිණාම දුඃඛ නම්. **උපෙක්ෂා වෙදනාව**— මධ්‍යස්ථ හැඟීම. සුවත් නො වන දුකුත් නො වන හැඟීම. වෙදනා හෙවත් හැඟීම් තුනෙකි, සුඛ යැ දුඃඛ යැ උපෙක්ෂා යැ සි. **සංස්කාර දුඃඛ යැ**— සකස් කිරීම් වශයෙන් දුක් යැ. උපෙක්ෂාව සකස් කළ සුත්තෙකි. සුව අතට හෝ දුක් අතට හෝ පෙරළීයැ නො දී සකස් කිරීම දුකෙකි. **දුඃඛ හෙයින් ම යැ**— ප්‍රකෘති වශයෙන් මැ දුක යැ. දුක නම් දුක මැ යැ. සුවය පෙරළුණු කලැ දුක යැ. උපෙක්ෂාව සකස් කිරීම් විසින් දුකි.

9. **තත්ත්ව විචාර ලොලසහට**— තතු (ඇති සැටි) විමැසීමට ලොල් වූවහුට. **චන්‍දන ශඞ්කාවක්**— 'සඳුන් යැ' යන සැකයක්. **ශුචි ශඞ්කාවෙක්**— 'පිරිසුදු යැ' යන සැකයෙක්. **අවිද්‍යා භාවිත චිත්ත සන්තාන ඇති**— අවිද්‍යායෙන් (නො දැන්මෙන්) වඩනා ලද (පුරුදු කරන ලද) සිත් සතන් ඇති. 'සිත්' යනු ද 'සතන්' යනු ද එකාර්ථ සි සිත් පරම්පරාව යැ සි ද ගත හැකි. **මහා පාශයෙකැ**— මහත් බන්ධනයෙක් යැ. මුව ආදි සත්ත්වයන් අසු කැරැ ගනු පිණිස අටවනු ලබන මල 'පාශ' නම්. **මොහ මධුර වූ**— මොහය කරණ කොටැ ගෙනැ රමණීය සේ පෙනෙන්නා වූ. **නව යෞවන ශ්‍රී නොමෝ**— අභිනව තරුණ භාව සම්පත්ති නොමෝ. මෙහි ශ්‍රී නම් සම්පත්තිය සි. (සමෘද්ධිය සි.) **ජරාව හා**— යෞවන ශ්‍රීය ද ජරාව ද සත්‍රීන් ලෙස සැලැකුණ හ. එ දෙ දෙන යුද්ධයක් කළ හ. යෞවන ශ්‍රී නොමෝ පැරැදුණු. ජරා දිනූ යැ. **කෙශාකෙශි**— ('කෙසාකෙසි' යනු මුද්‍රණ දොෂ සි.) කෙස් වැටි අල්ලා ගෙනැ. ඔවුනොවුන් ගේ කෙස් වැටි අල්ලා ගෙනැ කැරෙන යුද්ධය කෙශාකෙශි යුද්ධය සි. **ජයක් නො ලද්විරැව**— (...විරැ + හ= විරැ + ව=විරැව) ජයක් ලද්විරැ නො වේ. මේ තාක් කිසි කලෙක ජයක් ලැබුවා නැත. පෙරැ යටත් පිරිසෙයින් වරක් වත් ජය ලද්දේ 'ජය ලද්විරැ' නම් වෙයි. **ප්‍රසන්න ශත ගුප්ත වූ**— උත්සාහ සිය ගණනින් රක්නා ලද. ජීවිතය ගොපනය

කිරීමට (රැකීමට) සිය ගණන් උත්සාහයෝ කැරෙති. එ හෙත් මරුවා ගෙන් නො ගැලැවුණුවිරි යැ. ගුප් + ත=ගුත්ත. 'ගුප්' (රැකීමෙහි) ධාතු සි. **කබළ නො වූ**— ගොදුරු නො වී. 'කබල' යනු ආලොපයට (එක් වර කටට ගත හැකි තරම් අහර පිඩට) නම් වේ. **ගැලැවුණු**—'ගල' (ගිලීමෙහි) ධාතුයෙන් වූ ප්‍රයොජ්‍ය කර්මකාරක අතීත කෘදන්ත නාම සි. මෙය නිපන් අයුරු නො දක්නෝ 'ගලව' ධාතුවක් දකිති. අකර්මක 'ගල' ධාතු 'බම' ආදි පර පද සි. ගලා– ගලති– ගිලී– ගුළු. "අඹය කටුයෙන් ගලයි" යන තන්හි 'ගලා' යනු 'ගිලිහේ' යන අරුත දෙයි. "ඔහු අඹය කටුයෙන් ගලවයි" යන තන්හි 'ගලවා' යනු ප්‍රයොජ්‍ය රූප සි. ප්‍රයොජ්‍යයෙහි වරනැගීම මෙ සේ යැ:— (කතෘ කරු) ගලවා–ගලවති– ගැලැවී– ගැලැවූ. (කර්ම කරු) ගැලැවේ– ගැලැවෙති– ගැලැවිණි– ගැලැවුණු.

10. **මත් ඇතුන්**— (මදයෙන්) මත් වූ ඇතුන් ගේ. **කුඹු**— කුම්භය. ඇතු ගේ හිසෙහි ඉදිරි පස 'කුඹු' නම්. සිංහයෝ එය පළා හිස් මුල් බිඳිත් ල. **මුතු පිරා**—මුතු පුරා හැර. ඇතුන් ගේ කුම්භයෙහි මුතු උපදිති යි පුරාතනයෝ කී හ. **ඝන මේදස්**— ඝන වූ (තුනී නුවූ) මස් තෙල්. **කෙශර සිංහ රාජයෝ**— ගෙල වටා කෙසුරු ඇති සිංහ රාජයෝ. **කාලාන්තරයෙක්හි**— (කාල + අන්තර) අන්‍ය කාලයෙක්හි **ග්‍රාමාන්තර පරිඛායෙහි**— ගම් අතර වූ අගලෙහි. **අශුචි ද්‍රව**-- මල ජලය. අපිරිසුදු දිය. **සර්ව ලොක පරිභූත**— සකල ලොකයා විසින් නින්දා කරන ලද. **ගර්හාස්පද**— (ගර්හා+ආස්පද) ගර්හාවට (නින්දාවට) ස්ථාන. නින්දාවට සුදුසු. නින්දා ලබන්නාහු. එක් කලෙක සිංහ වැ උපන්නවුන් මැ තවත් කලෙක බල්ලන් වැ උපදනා බව මෙ කී පරිදි යැ.

11. **යොදුන්**— යොදුන මිසිලු (Miles) අටක් පමණ වෙයි. සැතැපුමෙක් මිසිලයෙකින් අඩක් පමණ යැ. **ගුඤ්ජා ඵල මාත්‍ර වූ**— ඔළිඳ ඇටයක් පමණ වූ. **ශරීර ප්‍රදෙශයෙහි**— සිරුරෙහි කොටසෙක. **පරීත ප්‍රභා සංයොගයෙන්**—(ශරීරය පමණක්) වට කොට ගත් කාන්ති-යුක්ත වීමෙන්. පරි + ඉ + ත= පරීත. 'පරි' යනු 'හාත්පස්හි' යන අර්ථයෙහි උපසර්ග සි. 'ඉ' ගමන්හි ධාතු සි. 'හාත්පස ගිය' යනු 'පරීත' යන්නෙහි නිර්වචනාර්ථ යි **පරිභාස්‍ය**— පරිභාස (අවමන්) කළ යුතු. වරක් මහා බ්‍රහ්ම වැ උපන්නවුන් වරක් කණමැදිරි වැ උපදනා බව මෙ කී සැටි යැ.

**12. වෘන්දාරක වෘන්දානන්ද සන්දොහ නිදාන** වූ— දිව්‍ය සමූහයා ගේ සන්තොෂ සමූහයට හෙතු වූ. 'වෘන්දාරක' යනු දෙවියනට නමි. වෘන්ද= සමූහය. ආනන්ද= සන්තොෂය. සන්දොහ= සමූහය. සියල්ල. වෘන්දාරක වෘන්දයන් නන්ද පුෂ්කරණියෙහි දිය කෙළැ මහත් ප්‍රීතියට පැමිණෙන හෙයින් මෙ සේ කියත්. **නන්ද පුෂ්කරිණීයෙහි**— නන්ද නම් පොකුණෙහි. 'පුෂ්කර' යනු නෙළුම්ට නමි. පුෂ්කරයන් (නෙළුම්) ඇතියේ 'පුෂ්කරින්' නම් වේ. පුෂ්කර + ඉන්. 'ඉන්' යනු අස්ත්‍යර්ථයෙහි තද්ධිත ප්‍රත්‍යයය යි. 'පුෂ්කරින්' යන්නට ස්ත්‍රී අර්ථයෙහි 'ඊ' ප්‍රත්‍යයය වීමෙන් 'පුෂ්කරිණී' යනු වී. ('පුෂ්කරණීයෙහි' යනු මුද්‍රණ දොෂ යි.) **චණ්ඩාල කුල ශරීර මල භගින** වූ— සැඬොල් (රොඩී) සමූහයා ගේ ශරීර අශුචියෙන් පිරුණා වූ. **පූති ගතීයෙහි**— කුණු වළෙහි. වැසිකිළි ආදියෙහි. **ගී**— වැටී. **ඓශ්වර්‍ය ක්‍රීඩාභියොග ව්‍යාපෘත වැ**— ඊශ්වර භාවයෙන් (අධිපති භාවයෙන්) යුක්ත වැ ක්‍රීඩායෙහි අභියොගයෙහි (යෙදීමෙහි) නියුක්ත වැ. ක්‍රීඩා + අභියොග. වි + ආ + පෘ + ත = ව්‍යාපෘත. 'පෘ' (නියුක්ත වීමෙහි) ධාතු යි. එ තන්හි ගේ ඊශ්වර යි, අධිපති යි. එ හෙයින් ඓශ්වර්‍ය ක්‍රීඩාභියොගය වෙයි. ඊශ්වරයා ගේ භාවය ඓශ්වර්‍ය යි. ඊශ්වර + ය = ඓශ්වර්‍ය. **සුඛිකයන්**— සුව ඇත්තවුන්. සැප විඳින්නවුන්. වරක් ශක්‍ර වූවකු වරක් කුණු වළෙකැ අශුචි පණු වැ හෝ මැසි වැ හෝ උපදනා බව මෙයින් කී හ.

**13. විශද**— පිරිසුදු වූ. **ශරදාකාශයෙහි**— ශරත්කාල ආකාශයෙහි. **විප්‍රකීර්ණ තාරා ගණ පරිවාරයෙන් යුක්ත වැ**— විසුරුණා වූ තාරකා සමූහ පිරිවරින් යුක්ත වැ (පිරිවර සහිත වැ.) **චන්ද්‍ර මණ්ඩල ගත වැ**— සඳ මඬුල්ලට (විමනට) වැදී. ගත=ගියේ. චන්ද්‍ර මණ්ඩලය නම් දිව්‍ය පුත්‍රයකු ගේ විමානයෙකැ යි ඇතැම් පුරාතනයෝ සිතූ හ. **විවිධ විදග්ධ විබුධ වධූ ගාඪාලිඞ්ගන මනොහර මහොත්සව පාත්‍ර වැ**— නානාවිධ වූ නිපුණ වූ දිව්‍ය ස්ත්‍රීන් විසින් තර කොටැ වැළැඳැ ගැනීමෙන් සිතෙහි මහත් ප්‍රීතියට භාජන වැ (සිතෙහි මහත් ප්‍රීති ඇති වැ.) පුරුෂයන් ගේ සිත් ගන්නා නානාවිධ ක්‍රම ආදිය ඉගෙනැ පැසුණා වූ ස්ත්‍රීහු 'විදග්ධ' නම් වෙති. 'විබුධ' යනු මෙහි දෙවියනට නමි. "ත්‍රිදශා විබුධාඃ සුරාඃ" යනු අමර වචන යි. විබුධ වධූහු නම් දිව්‍ය ස්ත්‍රීහු යැ 'වධූ' යනු ස්ත්‍රී පර්‍යාය යි.

ගාඪ + ආලිඞ්ගන. 'අතිශයින් දෘඪ' යන අර්ථයෙහි 'ගාඪ' ශබ්ද වෙයි. ආලිඞ්ගනය නම් වැළඳ ගැන්ම යි. **ව්‍යෝම යාත්‍රා කළ**— ආකාශයෙහි ගමන් කළ. 'ව්‍යෝමන්' නම් ආකාශය යි. **තමා මෑ තම හට බැඳි කෝටු මීවිය යමෑ**— වරක් චන්ද්‍ර දිව්‍ය පුත්‍රයා මනුෂ්‍ය වැ ඉපැද වනයට ගොස් කෝටු කපා මීවියක් බැඳැ ගෙනැ තත්ක්ෂණයෙහි මැරී ඒ කෝටු මීවිය යමෑ මැ පණුවකු වැ ඉපැද සෙල්වී යන නොහී මහත් දුක් විඳියේ ල. පුරාතන යුරෝපීයයෝ ද චන්ද්‍ර මණ්ඩලයෙහි කෝටු මීවියක් හා පහනක් හා ගත් මිනිසකු වෙති සි සිතූ හ. **නොයෙක් තෙනින්**— වැතිර සිටී ස්ථානයෙන්. **අනය ව්‍යසනයට**— අවාසනාවත් විපත්තියට, 'අය' නම් ශුභාවහ වූ (යහපතක් ගෙනැ දෙන්නා වූ) විධිය සි. අය නො වනුයේ යමෙක්හි ද ඒ අනය සි.

**14. උදය ශිඛර තිරෝධාන විමුක්ති සමසමය සමුද්ගීර්ණ ඝෘණි ශ්‍රේණී විශකලිත තමඃසෙනාම සාහස ඇති**— උදය (පර්වත) මුදුනෙහි පියන මිදීම හා සමාන සමයෙහි (පියන මිදීම හා සමග මැ) මැනැවින් ඉහළ විසුරුවන ලද්දා වූ රශ්මි සමූහයෙන් නසන ලද අන්ධකාර සමූහයා ගේ බලාත්කාර කම් ඇති. අන්ධකාර සමූහය බලාත්කාර කම් කෙරෙමින් රාත්‍රියෙහි ලොකය පෙළයි. උදය පර්වතයෙහි පියන මිදීම (හැරීම) හා සමග මැ (සූර්යයා ගේ) රශ්මි සමූහය මැනැවින් ඉහළට විසිරී යෙයි. බලාත්කාර කම් කළ අන්ධකාර සමූහය එයින් විශකලිත වෙයි. (කැබැලි කැබැලි වැ යෙයි, සුනු විසුනු වෙයි, විනාශ වෙයි.) 'තිරෝධාන' නම් පියන යි (වැස්ම යි.) උදය පර්වතයෙහි පියන උදය කාලයෙහි හැරෙති සි ද එයින් සූර්ය රශ්මි සමූහය ඉහළට විහිදී යති සි ද ගත් සේ පෙනේ. 'විමුක්ති' නම් විශේෂයෙන් මිදීම යි. 'විමුක්ති සම සමය' යනු විමුක්තියට සමාන වූ සමයය යැ (කාලය යැ) යන අර්ථ ඇත්තේ යැ. විමුක්ති සමයයත් රශ්මි සමුද්ගිරණ සමයයත් සම (සමාන) නම් එ දෙක එක් වර සිදු වූ බව හැඟෙයි. සම් + උත් + ගෘ + ත = සමුද්ගීර්ණ. මතා සේ ඉහළ විසිරී ගිය. මෙ බඳු තන්හි අතීත කෘදන්ත 'ත' ප්‍රත්‍යයයට 'න' කාරාදෙශ වෙයි. 'ර' කාරයෙන් පර හෙයින් 'න' හම් 'ණ' වෙයි. 'ඝෘණි' යනු රශ්මියට නමි. සමූහය 'ශ්‍රේණී' නමුදු 'ශ්‍රේණි' නමුදු වෙයි. 'ශකල' නම් කැබැල්ල යි. කැබැලි බවට පමුණුවන

ලද්දේ ශකලිත යි. විශෙෂයෙන් ශකලිත වූයේ විශකලිත යි. *සුනු විසුනු කරන ලද' 'විනාශ කරන ලද' යන අර්ථය මෙයින් ලැබේ. 'තමස්' නම් අන්ධකාරය යි. 'සොම' නම් සමූහය යි. එ හෙයින් අන්ධකාර සමූහයට 'තමඃ සොම' යනු ද 'තමසොම' යනු ද නම්. **චක්‍රවාලාන්තරාලාපූරිත සහස්‍ර රශ්මි ඇති**— (චක්‍රවාල + අන්තරාල + ආදි + ආපූරිත) සක්වළ ඇතුළු ආදිය හාත් පසින් පුරවන ලද සහස් රැස් ඇති. 'අන්තරාල' යනු 'ඇතුළත' යන අර්ථ ඇත්තේ යැ. ආ + පූර් + ඉ + ත = 'ආ' යනු හාත්පසින් යන අර්ථයෙහි උපසර්ග යි. (පිරීමෙහි) 'පූර්' ධාතු යි. 'ත' කෘදන්ත ප්‍රත්‍යය යි. 'ඉ' යනු ධාතු ප්‍රත්‍යය දෙදෙනා මධ්‍යයෙහි ආගම යි. සහස්‍ර යනු මෙහි ඉතා මහත් ගණනක් බව හඟවන්නට යෙදිණ. **සුයී විමානොදර වර්ති වූ**—(විමාන+උදර) සුයී විමානය ඇතුළෙහි පවත්නා වූ. (සිටින්නා වූ.) **සුති මාංසයෙහි**— කුණු මසෙහි. **කෘමි**— පණු. **දෙරෙහි**— ගෙයින් පිටතැ. වරක් සුයී වූවකු වරක් පණු වැ උපදනා බව යැ මෙයින් කියැවුණේ.

**15. ආත්ම භාවයෙන්**— ශරීරයෙන්. **සුවාසූ**— (සිවු + අසූ= සූ + අසූ = සූවාසූ) අසූ සතර. **ගො කුරෙහි** — ගොපදයෙහි. ගවයා ගේ කුරය බිම එරී වළ ගැසුණු තැන ගොකුර නම්. **වට**— වැස්සා වූ. 'වස්' (වර්ෂණයෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'වස්' ධාතු 'බස්' ආදි ගණ පර පද යි. වසී- වසිති- වට- වටු. 'වටු' යන්නෙහි අන්ත්‍ය ස්වර ලොපය වැ 'අ' කාර වීමෙන් 'වට' යනු වෙයි. **වැසි දියත්තක්**— වැසි දිය ස්වල්පයක්. දිය + ඉති = දියති. 'ඉති' යනු ස්වල්පාර්ථයෙහි තද්ධිත ප්‍රත්‍යය යි. **ක්‍ෂුද්‍ර ප්‍රාණි ජාතිනටද්**— කුඩා සතුන් ජාතිවලටත්. ප්‍රාණ ඇතියේ 'ප්‍රාණීන්' නම් වෙයි. එ තරම් මහත් මනුෂ්‍යයෝ ද මෙ තරම් කුඩා සත්තු වෙති.

**16. මහ හිඹුල් රුකින්**— හිමාලයයෙහි වූ හිඹුල් වනයෙහි ගුරුළන් වෙසෙති යි යෙති. **ප්‍රබල පක්‍ෂ වාත ප්‍රහාරයෙන්**— ඉතා බලවත් වූ පියා පත් (ගැසීමෙන් ඇති වූ) සුළං පහරින්. 'පක්‍ෂ' නම් පියා යැ. පක්‍ෂ ඇති හෙයින් කුරුල්ලෝ 'පක්‍ෂීන්' නම් වෙති. පක්‍ෂ + ඉන් = පක්‍ෂීන්. **දෙ බෙදී කොටැ**— දෙබෙද කොටැ. දෙකට බෙදා හැරැ. **නා ගොදුරු ගත්**— නාගයන් ගොදුරට අල්ලා ගත්. මුහුදු පත්ලෙහි නාගයන් වෙති යි ද, ගුරුළන් පියාපයන් ගසා මුහුදු දිය දෙ බෙදී කොටැ පතුලට

වැදූ නයින් ගෙනැ නැවැතැ දෙ දිය එක් වන්නට පෙර මැ පෙරළා, එති සි ද ඇතැම් පුරාතනයෝ සිතූ හ. **කුනුහර— ශරීර-ප්‍රමාණ** වූ— ඉතා කුඩා ශරීර ප්‍රමාණය (සිරුරෙහි උස මහත) ඇත්තා වූ. **ගැඩවිල්**— 'ගැඩහුල්' යනු ග්‍රාමීණ ව්‍යවහාර යි. **අමේධ්‍ය ගොචර ග්‍රහණයෙන් චරිතාර්පි—** අශුචිය නොදුරු කොටැ ගැනීමෙන් හැසුරුණු අර්ථ ඇති. චරිත+ අර්පි. අර්ථ නම් අර්ථය යි. අර්ථය (අර්ථය) ලබනු පිණිස සමෘද්ධ) කැරැ ගනු පිණිස) හැසුරුණ මනා යැ. (ක්‍රියායෙහි යෙදුණ මනා යැ) චරිත වූ අර්ථය චරිතාර්ථ යි. චරිතාර්ථය ඇත්තේ චරිතාර්පි යි. චරිතාර්ථ+ඉන්. නිල මැස්සෝ කෙසේ චරිතාර්පි වන්නාහු ද? අමේධ්‍ය ගොචර ග්‍රහණයෙන් චරිතාර්පි වන්නාහු යැ. එ තරම් මහත් බලවත් ගුරුළෝ ද මෙ තරම් කුඩා දුබල නිල මැස්සෝ වෙති.

**17. සතර මහා ද්වීපයෙහි**— පූර්ව විදෙහ, ජම්බු ද්වීප, අපර ගොයාන, උත්තර කුරු, යන මේ මහ මෙර සතර දිශායෙහි පිහිටි සතර මහා ද්වීප යැ යෙති. **එකාතපත්‍ර රාජ්‍යය**— එකතපත් රජය. එක මැ රාජ්‍යය. සකල ලොකයට එක රජ බව. ඒක+ආතපත්‍ර. 'ආතප' නම් අව්ව යි. ආතපයෙන් ත්‍රාණය (රැකීම) කරනුයේ 'ආතපත්‍ර' යි. කුඩයට මේ නම්. මෙහි ගැනෙනුයේ ප්‍රධාන රාජ. චිහ්නය (රජ ලකුණ) වූ ශ්වෙතච්ඡත්‍රය යි. ලොකයෙහි ඇති ශ්වෙතච්ඡත්‍ර ගණන ද රජවරුන් ගේ ගණන ද සමාන යැ. ලොකය එකාතපත්‍ර නම්- එකච්ඡත්‍ර නම්- එයින් හැඟෙනුයේ මුළු ලොවට මැ එක රජ බව යි. **කිඹාවට**— මුඳුනට. හිසට. **වැඩූ**— නහන ලද. ඔසවන ලද. **විලුම් පහරින් තළා**— (පා) විලුඹින් පහර දී. මුළු ලොවට එක රජය කළාහු ද අසරණ මෙහෙකරු වැ උපදිති.

**18. රජනීකර කර නිකර සංයොග ද්විගුණීකෘත ශ්වෙත කාන්ති සුකාන්ත**— චන්ද්‍රයා ගේ රශ්මි සමූහය හා එක් වීමෙන් දෙ ගුණ කරන ලද සුදු කැලුම් යුතු වූ. 'රජනී' යනු ද 'රජනි' යනු ද රාත්‍රියට නම්. රජනිය කරනුයේ 'රජනිකර' යි. ('රජනීකර' යි කිව ද නිවැරැදි යි.) 'කර' නම් රශ්මිය යි. 'නිකර' යනු සමූහාර්ථ යි. චන්ද්‍ර ශාලාව සුදු යැ. සඳ රැස් වැටීමෙන් එහි සුද දියුණු වෙයි. **චන්ද්‍ර ශාලායෙහි**— සඳලුතෙහි. ප්‍රාසාදයෙකැ උපරිම තලයෙහි සඳ රැස් වැටෙන සේ තැනුණු ශාලා චන්ද්‍ර ශාලා නම්.

**ආස්තීර්ණ**— අතුරන ලද. ආ + ස්තෘ + ත = ආස්තීර්ණ. 'ස්තෘ' (වැතිරවීමෙහි) ධාතු යි. **මුක්තා ශයනයෙහි**— මුතු ඇඳෙහි. මුතු ඔබා කරන ලද හෙයින් හෝ ඇතිරිලි ආදියෙහි වටා මුතු එල්වන ලද හෙයින් හෝ ඒ මුක්තා ශයන නම් වෙයි. **යෙහෙන්**— සුව සේ. යහ + එන් = යහෙන් = යෙහෙන්. භාග්‍ය— පින්. වාසනා. **අනල්ප කල්ප කාල සම්භූත මහෝෂ්ම විෂම වූ**— ('විසම්‍ය' යනු මුද්‍රණ දෝෂ යි.) බොහෝ වූ කල්ප කාලයක් මුළුල්ලෙහි ඇති වූ මහා උෂ්ණය කරණ කොටැ ගෙනැ භයඞ්කර වූ. අල්ප (මඳ) නො වනුයේ අනල්ප යි. 'කල්ප ගණන් කාලයෙහි' යන අර්ථයෙහි 'කල්ප කාල' යනු යෙදිණ. මහා + උෂ්ම 'විෂම' යනු භයඞ්කරාර්ථයෙහි දු යෙදේ. **ප්ලුෂ්ට**— පිලිස්සී. එ තරම් සිසිලෙහි සුව වින්දෝ ද මෙ තරම් උෂ්ණයෙහි දුක් විඳිති.

19. **උත්සව ශෘඞ්ගාර පිණ්ඩ**— උත්සවයෙහි අලඞ්කාර පිණ්ඩ. ශෘඞ්ගාර යනු මෙහි ආභරණාදි අලඞ්කාර විශේෂයෙහි වැටේ. මන්දාර කුසුම් මාලාව උත්සව ශෘඞ්ගාරයයි. **ලෙහි**— හෘදයයෙහි. වක්ෂස්හි. **මන්දාර කුසුම භාරය**— මඳර මල්හි බර. 'මන්දාර' නම් දිව්‍ය කුසුම විශේෂයෙකි. **ක්ෂමා කොටැ ගත නො හෙන්නා වූ**— ඉවසා ගත නො හැකි වූ. **කෝමල**— මෘදු. **බැරෙහි නගා හෙළා ලියැ නො හෙන**— බරට ගෙනැ ඔසවා හෙළා දැමියැ නො හැකි. ඒ පොරෝ එ තරම් බර යැ. **යපොරෝ**— ලෝහයෙන් කළ පොරෝ. **කිලිල්**— රුක් ගොබ. එ කලැ එ තරම් මල ද ඉසිලියැ නො හැකි යැ. දූන් මෙ තරම් පොරෝ පහර ද උසුලති.

20. **භීරූ**— භීණි මනහි. **ඉසුරෝ**— ඊශ්වරයෝ. අධිපතීහු. **ශත යෝජන**— සිය යොදුන්. **අඞ්ගාර පර්වතය**— අඟුරු කන්ද. **අනෙක ලක්ෂ කෝටි වර්ෂ සඞ්ඛ්‍යායෙන්**— නො යෙක් ලක්ෂ කෝටි හවුරුදු ගණනින්.

21. **රක්තෝත්පල** ශ්‍රී සේ— රතු උපුල්හි ඇතුළත මෙන්. මලෙහි වැඩියක් මැ මෘදු වනුයේ ඇතුළත යැ. **විදුනා ලද**— ඉසිනු ලැබූ. ගසනු ලැබූ. ජල ක්‍රීඩායෙහි දී දිය ඉසැ ගැනිම සිරිති. **කර්කශ කොටැ**— රළු කොටැ. රළු යැ සි. **බැරහි ගෙනැ**— බරට ගෙනැ. ලෝහො දිය කඳ යම පලුතට පවා එ තරම් බර යැ. **කල්පක් දවස්**— කල්පයක් කල් මුළුල්ලෙහි. **කෘවී**— උණු වී. පැසෙමින්. **ළා තල් කඳ සා**— තරුණ තල් කඳ පමණ (මහත්) වූ.

නහඹ = න + අඹ = නාඹ. මේ 'නහඹ' ව්‍යවහාරය ආයේ ගොනා ගෙනි. ගොනා මහත් ශරීර ප්‍රමාණයෙන් යුක්ත වනුයේ (කර) හඹින්නට පළමු යැ. නො හැඹූ හෙයින් එ කලැ හේ 'නහඹ' නම්. 'නහඹ' යන්නෙන් තරුණාවය ලැබෙන්නට වූයේ මෙසේ යැ. **නමත්**— නමිත කල්හි. වත් කරන කල්හි. **දමින්**— පිළිස්සෙමින්. **විරෙමින්**— ද්‍රව වෙමින්. එ තරම් කොමළ දූ ද කැකුළු කොමැ සිතුවෝ මෙ තරම් කැකුළු දූ ද විඳිති.

**22. අව්‍යවස්ථිත යැ**— ව්‍යවස්ථා රහිත යැ. අස්ථිර යැ. අනියත ස්වභාව ඇත්තේ යැ. **සාදීනව යැ**— (ස + ආදීනව) ආදීනව (දොෂ) සහිත යැ.

**23. ගෞරව පාත්‍ර වූ**— ගෞරව භාජන (ගෞරවයට සුදුසු ස්ථාන) වූ. **නිර්ලජ්ජ වූ**— ලජ්ජා නැත්තා වූ ලජ්ජායෙන් නිර්ගත වූයේ (පිට වූයේ) නිර්ලජ්ජ සි. මේ සමාස විග්‍රහයෙහි අන්ත්‍ය 'ආ' කාරය හ්‍රස්ව වෙයි. එ හෙයින් 'නිර්ලජ්ජ' යනු මැ ප්‍රකෘති සි. ශොභා- ප්‍රභා- යන දෙ සද 'ආ' කාරාන්ත වතුදු නිශ්ශොභ- නිෂ්ප්‍රභ- යන දෙ සද 'අ' කාරාන්ත වෙයි. **ශෘඞ්ගාර චෙෂ්ටාවට පාත්‍ර වූ**— කාමයෙන් හැසිරීමට ස්ථාන (සුදුසු) වූ. රතිය (ස්ත්‍රී සඟීයෙහි ඇල්ම) උපදවනුයේ ශෘඞ්ගාර සි. ශෘඞ්ග + ඍ + අ = ශෘඞ්ගාර. අධික කාමයට 'ශෘඞ්ග' යනු නමෙකි. 'ඍ' (නැඟීමෙහි) ධාතු සි. 'අ' ප්‍රත්‍යය සි. ශෘඞ්ගය (අධික කාමය) නඟා නු සි ශෘඞ්ගාර නම් වේ. හැසිරීම- ක්‍රියායෙහි යෙදීම- චෙෂ්ටා නම්. 'චෙෂ්ට්' ධාතු සි. **පයින් පෑවා හිසින් කරන**— ("මෙය කරව"යි) පය දික් කොටැ දක්වූ (නියම කළ) දෑය හිස් මුදුනින් (එ තරම් යටත් පහත් වැ) නො හොත් හිසැ පිටැ තබා ගෙනැ) කරන්නා වූ. **ගැති වූවෝ**— දාස වූවාහු. **හුන් පන හිසින් දම්මන**— හිඳැ හත්තා වූ පත්‍රය (කොළය) හිස මිනැ තබා ගෙනැ ගොසින් දමන්නට සලස්වන්නා වූ. **අයස**— අපකීර්තිය. **යස**— කීර්තිය. **අෂ්ට ලොක ධර්මයෙන්** – ලොක ධර්ම අටින්. ලොක ධර්ම නම් ලොක ස්වභාව සි. **හෝවිලියෙහි මාගම් දරුවන් අතැ හුණු කෙළි පෙඬක් සේ**— උන්සිල්ලායෙහි ගැනු දරුවන් අතට වැටුණු (පැමිණි) ක්‍රීඩා පන්දුවක් මෙන්. හෝවිලි පදින අතර මැ පන්දුව ද ඒ මේ අත උනුන් අතට දමා අල්ලා ගනිමින් ඇතැම් දූරියෝ තමන් ගේ චාතුර්‍ය්‍ය දක්වති. එ කලැ පන්දුව කවර අතින් එයි ද යනු නො පෙනේ.

**24. අසුරක් ගසනා කලුදු**— මොහොතකදු. 'අසුර' නම් අතෙහි මහ පට ඇඟිල්ල හා මැදැඟිල්ල හා එක් කොටැ සැටීමෙන් ශබ්දයක් නිපැදවීම සි. එයට යනුයේ මොහොතෙකි කල් + දු = කලුදු සවරාගම සි. **අසම්මිශ්‍ර**— නුමුසු. **ප්‍රණීත**— පිනවන්නා වූ. ප්‍ර + නී + ත. උත්කෘෂ්ට ලෙස සිද්ධ කරන ලද (පිළියෙළ කරන ලද) යනු අර්ථ සි. 'නී' (ඉදිරියට ගෙනැ යැමෙහි) ධාතු සි. මැනැවින් සිද්ධ කරන ලද ආහාරය අනුභව කරන්නනු පිනවයි. එ හෙයින් ප්‍රණීත ආහාරය නම් පිනවන ආහාරයෙකි.

**25. ගිවිසෑ**— කැමැති වී. **යාචක චාතක සමූහයා**— යදියන් නමැති කැදැත්තන් සමූහයා. කැදැත්තා නම් වසිනා කලැ අහස්හි හැසිරෙමින් දිය බොන පක්ෂියෙක් ල. **ඝන ධාරා නිපාතයෙන්**— ඝන නමැති (දිය) දහර හෙළීමෙන්. වස්තු නමැති වැස්සෙන්. **සකලාර්ථි ජන නීයමාන**— සියලු යාචක ජනයා විසින් ගෙනැ යනු ලබන. සකල + අර්ථි. අර්ථ (අර්ථය - අභිලාෂය) ඇත්තේ අර්ථි සි. අර්ථ + ඉන්. **සඤ්චයයා ගේ**— රාශියෙහි. **අතිබහුත්වය**— ඉතා බොහෝ බව. **අක්ෂයය**— ක්ෂය නො වීම. නො ගෙවීම. කෙළවරක් නො වීම. **ධන ක්ෂයයෙහි**— ධන කෙළවර වූ කල්හි. **ආයුෂ්කල්පය**— ආයුෂ කාලය. ජීවිත කාලය. **ධාන්‍ය**— වී තිරිඟු ආදිය. ධනයට හිත වනුයේ ධාන්‍ය සි. එය විකුණා ධන ඉපැදවියැ හැකි බැවින් වී තිරිඟු ආදිය ධාන්‍ය නම්. **නිරර්ගල යඥ ඝෝෂ**— විවෘතද්වාර දානයෙහි ඝෝෂය. ධනාගාරයන්හි සියලු දොර හැර, "කැමැති කෙනෙක් කැමැති පමණක් කැමැති පරිදි ගෙනැ යෙත් ව" යි රට පුරා ප්‍රකාශ කිරීම 'නිරර්ගල යඥ ඝෝෂ' නම්. මෙහි 'යඥ' නම් දානය සි. 'නිරර්ගල' යන්නෙහි අර්ථ 'අර්ගල (දොර අගුලු) නැති' යනු සි. **ද්‍රවිණ**— වස්තු. **ද්වාර**— දොර. **විවෘත කරවා**— හරවා. **ප්‍රබල දවානල සරභස සම්පාතයෙන් සන්දහ්‍යමාන වූ**— ඉතා බලවත් වූ ළැව් ගින්න වෙගයෙන් වැටීමෙන් දවනු ලබන්නා වූ. 'දව' නම් වනය සි. 'අනල' යනු ගින්නට නමි. දවයෙහි හට ගත් අනල දවානල සි. 'සරභස' යනු වෙගාර්ථයෙහි නිපාත සි. **වෘක්ෂ වල්ලී ගුල්මාදි සංකීර්ණ වූ**— ගස් වැල් ගොමු ආදියෙන් ගැවැසී ගත්තා වූ. 'ගුල්ම' නම් පඳුරු සි. ගුල්ම + ආදි. **වන ගහනයෙකින්**— ඝන වනයෙකින්. 'ගහන' යනු ඝනාර්ථයෙහි යෙදේ. වන ගහනය නම් වනයෙහි ඝන වූ ප්‍රදෙශය සි. **දහාතිරේකය**—

(දුඃඛ + අතිරේකාය) දුඃඛයේ අධික බව. උෂ්ණයේ මහත් බව. **ක්‍ෂමා කොටැ ගත නො හී**— ඉවැසියැ නො හැකි වැ. **මත්ත මාතඞ්ගයකු**— මත් ඇතකු. 'මාතඞ්ග' යනු හස්ති පර්‍යාය යි. 'මාතඞ්ග' නම් මුනිහු ගෙන් උපන් හෙයින් ඇත් 'මාතඞ්ග' නමි. මතඞ්ග + අ = මාතඞ්ග. **විවිධ ශරීර මල සම්පූර්ණ**— ශරීරයෙහි නානාවිධ වූ අශුචියෙන් (මල මූත්‍ර ආදී වූ) අපවිත්‍ර ද්‍රව්‍යයෙන් පිරුණා වූ **ශුචි කාමී**— පිරිසුදු බව කැමැති. **ශාර්දූල**— ව්‍යාඝ්‍ර. **සමාකීර්ණ**— බෙහෙවින් ගැවැසී ගත්. **ප්‍රාණ රක්‍ෂණාර්ථී වූ**— පණ රැකියටි වූ. **සම්බාධ වූ පඤ්ච කාමයෙන් සාදීනව වූ**— සම්පූර්ණ පඤ්ච කාමය කරණ කොටැ ගෙනැ ආදීනව සහිත වූ (දෝෂ සහිත වූ, අනර්ථ කර වූ.) **වනාභිමුඛ වැ**— (වන + අභිමුඛ) වනය ඉදිරියට. වනය දෙසට මුහුණ ලා.

**26.** **ව්‍රතය**— නියමය. පින් සිදු කැරැ ගැනීම පිණිස නියම කැරැ ගත් පැවැත්ම ව්‍රත නමි. **ආශ්චර්‍යයෙක් හා**— ආශ්චර්‍ය (පුදුම) සැටි යැ. අහෝ! මෙහි 'හා' යනු විස්මයාර්ථය හඟවන නිපාත යි. **උදාර**— මහත්. **අශූන්‍ය**— නො සිස්. **සිතුවෙක්හි**— සිතූ දැයෙක්හි. **තත්පර කම්**— "එය මැ කෙරෙමි"යි ඇලුණු බව. තත් = එය. පර = උතුම්. එය පර (උතුම්) වනුයේ යමක්හු හට ද හේ තත්පර යැ. **නිරපේක්‍ෂකාව**— අපේක්‍ෂා රහිත බව. තැකීමක් නැති බව. නිර් + අපේක්‍ෂා. අපේක්‍ෂායෙන් නිෂ්ක්‍රාන්ත වූයේ නිරපේක්‍ෂ යි. **මහාභිනිෂ්ක්‍රමණය**— මහා අභිනිෂ්ක්‍රමණයට. ගිහි සැප හැරැ ප්‍රව්‍රජ්‍යාව පිණිස නික්මැ යෑම 'අභිනිෂ්ක්‍රමණ' නමි. 'මහා' යනු උත්තමාර්ථයෙහි වෙයි. **මොහොතක් ඉතා ශුද්ධ සේ**— "ශුද්ධ වූ ශුභ වූ මුහූර්තයෙකින් කට යුතු පටන් ගත් කලැ සඵල වෙයි" යනු ලෝක සම්මත යි. එය සලකා මෙසේ කියති. **නො වලකා ගත හැකි පඤ්චේන්ද්‍රියයනට**— පඤ්චේන්ද්‍රියයෝ නො වැළැක්වියැ හැක්කෝ යැ. රිසි අනට මැ ඇදී යෙති. එ හෙත් මෙ තන්හි සුමේධයෝ ඔවුන් වළකා ඔවුනට අකුල් හෙළූ හ. පස් කම් හළ හ යි යූ සේ යි. **උද්දීප්ත වූ යෞවනයෙහි දූ**— උසස් වැ බබළන්නා වූ තරුණ බව ඇති කල්හි දූ. **මදයක්**— මත් වීමක්. යෞවනය ද මත් වීමට හෙතුවෙකි. **අපූර්ව**— පුදුම. න + පූර්ව. පූර්වයෙහි (පෙරැ) නුවූයේ අපූර්ව යි. **සෞන්දර්‍යයෙහි**— සුන්දර භාවයෙහි. සුමේධයෝ අහඞ්කාර වීමට තරම් වූ සොඳුරු වූ සිරුරින් යුක්තයහ. එ සේ වුව ද අහඞ්කාරයෙක් නො වී යැ. සුන්දරයා ගේ භාවය

සෞන්දර්‍ය සි. සුන්දර+ය. මෙහි 'ය' ප්‍රත්‍යය සි. **අහඞ්කාරයක්**— "මම යැ" සි සිතීමෙන් වන උඩඟු බවක්. සංස්කෘතයෙහි 'අහං' යනු 'මම' යන අර්ථ ඇත්තේ යැ. 'අහං' යන හැඟීම කැරෙනුයේ යමෙකින් ද ඒ අහඞ්කාර සි. **අචින්ත්‍ය**— නො සිතිය හැකි. **ගෘහස්ථයනට**— ගෙහි සිටියවුනට. ගිහියනට. පැවිද්දෝ ගෘහස්ථ නො වෙත් ද? ඔහු ගෙහි නො සිටිත් ද? මෙහි 'ගෘහ' යන්නෙහි අර්ථය නිවාස යැ යනු නො වේ. කියන ලද මැ සි—

"න ගෘහං ගෘහමිත්‍යාහුර්ගෘහිණී ගෘහමුච්‍යතෙ"

යනුයෙන්, "ගෘහය ගෘහය යැ සි නො කියති. ගැහැනිය ගෘහය යැ සි කියනු ලැබේ" යනු. **ජුගුප්සාවක්**— පිළිකුලක්. **අතුල්‍ය**— අසමාන. **පක්ෂපාතයක්**— ඒ පක්ෂයම වැටුණු බවක්. පක්ෂයට ඇදී ගිය බවක්. **ලෝකෝත්තර**— අලෞකික. අතිමානුෂ. **නිමාවක්**— කෙළවරක්. **උදා දුන් පරිදි**— පල දුන් ආකාරය. මෙහි 'උදා' නම් උදය සි, උසස් වූ ඵල සි, අභිවෘද්ධිය සි. උත්+අය=උදය. **විචිත්‍ර**— පුදුම. **ශුද්ධෛකල්‍ය වැ**— තනි වැ. ශුද්ධ+ඒකල්‍ය=ශුද්ධෛකල්‍ය. 'ශුද්ධ' යන්නෙහි 'ශුද්ධ' යනු අර්ථ සි. 'ඒකල්‍ය' යන්නෙහි අර්ථ 'තනි' යනු සි. සාකල්‍යයෙන් (සියලු අන්දමින්) තනි වැ යනු පද ගත අර්ථ සි.

**27. උදාරාධ්‍යාශයයෙකින්**— (උදාර+අධ්‍යාශය) උසස් අදහසෙකින්. **විශ්ව කර්ම**— සියලු කර්මාන්ත කරන්නෙන් ගේ ඒ නම්. **සකල සමෘද්ධි සාරය**— සියලු සම්පත්ති සාරය. **පර්ණ ශාලාදිය**— පන්සල් ආදිය. පර්ණයෙන් (කොළයෙන්-කොළ සෙවිලි කොට) කළ ශාලා පර්ණ ශාලා යැ. කිමෙකින් කළ ද පැවිද්දන් වසන තෙනට දූන් 'පන් සල්' යනු නම්. **සමු දින**— අවසර දුන්නේ ය.

**28. ධර විෂමතා**— රළු වූ ද විෂම වූ ද බිම ඇති බව. **ගහනයෙන් මුක්ත බව**— ඝන වූ වනයෙන් මුවහ වූ බව. **ඉතා හ්‍රස්ව බව**— ඉතා කුඩා බව. 'හ්‍රස්ව' යනු සඞ්කුචිත- හැකුළුණු- කුඩා- යන අර්ථයෙහි වෙයි. මෙයට විරුද්ධ වනුයේ මහත් බව යි. **පඤ්ච දෝෂ වර්ජිත**— පස් දොසින් දුරු වූ. **නියතයෙන්**— නියම වශයෙන්. ඒකාන්තයෙන්. **ශ්‍රමණ භාවයෙහි නිබද්ධ වූ අභිලාෂ ඇති**— මහණ බවම විශේෂයෙන් බඳනා ලද ආශා ඇති. **මහඇගි බව**— මහාර්ඝ භාවය. බොහෝ වටිනා බව. **පර පිළිබඳ බව**— අනුනට අයත් බව. **අනුභව කාල කල්හි**— ප්‍රයෝජන ගත් කලැ.

**ඇපිලැවිය යුතු බව**— සෝද පිරිසුදු කැරවිය යුතු බව. **කිවීම්**— සිදුරු වසන පිණිස එළ ලීම්. **ගෙත්තම්**— මැසීම්. **සාධාරණ**— සමාන. සතුරන් විසිනුදු එයින් මෙ සේ මැ ප්‍රයෝජන ගත හැකි යැ. එ හෙයින් සළු ධවනට ද පැවිද්දනට ද සාධාරණ වෙයි. **විභූෂණ වැ**— අලඞ්කාර වැ. සැරසිල්ලක් වැ. **අපිච්ඡ**— අල්පෙච්ඡ. මඳ කැමැති ඇති. අල්ප වූ ඉච්ඡාව (කැමැත්ත) යමක්හු ගේ ද හේ අල්පෙච්ඡ යි. නිරුක්තිය මෙ සේ වුව ද ‘අල්පෙච්ඡ’ යනු ‘ඉච්ඡා නැති’ යන අර්ථයෙහි වැටේ ලු. **මහෙච්ඡ**— මහත් වූ ඉච්ඡාව යමක්හු ගේ ද හේ මහෙච්ඡ යි. ‘ඉච්ඡා’ ශබ්දය ‘ආ’ කාරාන්ත වුව ද ‘මහෙච්ඡ’ යනු ‘අ’ කාරාන්ත වූ පරිදි සලකන්නේ යැ. **හන්**— හැඳි. හැඳැ සිටි. ‘හන්’ යනු ‘හඳ’ හැඳීමෙහි ධාතුයෙන් වී. මේ ධාතුව ‘බස්’ ආදි පරපද යි. (කතු කරු) හඳී- හඳිති- හනි- හනු. ‘හනු’ යන්නෙහි අන්ත්‍ය ස්වර ලොපයෙන් ‘හන්’ යනු වී. **පරිභොගයෙන්**— ප්‍රයොජන ගැනීමෙන්. අනුභවයෙන්. **සරූප්**— සරූප. සුදුසු. **චීවර ප්‍රත්‍යයෙහි**— සිවුරු පසයෙහි. පැවිද්දනට දිවි පැවැත්වීම සඳහා වුව මනා ද්‍රව්‍ය ප්‍රත්‍යය නම්. **වැහැරි**— වාක. ගස් පට්ටා. **නට කල්හි**— නැසී ගිය කලැ. **ප්‍රව්‍රජ්‍යා ස්වීකාර කොටැ**— පැවිද්ද (මහණ කම) තමාට අයත් කොටැ. පැවිදි වැ. ‘ස්ව’ යනු තමා යැ යන අර්ථ ඇත්තේ යැ. ස්ව + කාර = ස්වීකාර. තමාට අයත් කිරීම. **ප්‍රත්‍යූෂ වේලායෙහි**— උදය කාලයෙහි. **ප්‍රත්‍යවෙක්ෂා**— සිහිපත්. ප්‍රති + අව + ඊක්ෂ් + ආ. ‘ඊක්ෂ්’ බැලීමෙහි ධාතු යි.

29. මේ ඡේදයෙහි කැරෙනුයේ සුමෙධයන් අත් හැර ගිය භෝගයෙහි වර්ණනය යි. **පුරුෂායුෂ මාත්‍රයෙහුදු**— පුරුෂයකු ගේ ආයුෂ පමණෙකිනුත්. ආයු ඇති තාක් කල්. අනුභව කොටැ ද. **අනුරක්ත**— ඇලුණු. **ක්‍රමාගත වූ**—(ක්‍රම + ආගත) කුල පරම්පරා පිළිවෙළින් තමනට පිරිවර වැ පැවැතැ ආවා වූ. **පරිවාර සමෘද්ධීන්**— පිරිවර සැපතින්. **ශෛල දුර්ග**— ගිරි දුර්ග. ඒ කොටු ගෙවල් කොතරම් පිරිණි ද යත හොත් කිසි කලෙකැ දුර්භික්ෂ භයක් නො පැමිණියැ හැකි යැ. එ හෙයින් දුර්භික්ෂ භය නො වදින්නට කළ ශෛල දුර්ග බඳු යැ. **විචිත්‍ර වස්ත්‍ර විශෙෂයෙන්**— විසිතුරු වූ වස්ත්‍ර වර්ගයෙන්. ඒ වස්ත්‍ර නානාවිධ යැ, සියුම් යැ, ශරීරයට සැප පහසු දෙන්නේ යැ. අග්‍ර ආභරණ යැ යි ප්‍රසිද්ධ යැ, ඒ ඒ ඍතු ගුණයට සුදුසු පරිද්දෙන් ප්‍රයොජන ගත හැකි යැ. **ගෙසි දඩැ කාම්භානයෙහි**—

ගෙයි කරනු ලබන කර්මාන්තයෙන් හා (Indoor work) ගෙයින් බැහැර කෙත් වතු ආදියෙහි කැරෙන කර්මාන්තයෙන් හා (Out door work.) **සිද්ධ වන**— උපදින. සැපැයෙන. **නො දූරැ**— ඈත් නො වන. **ලතා මණ්ඩපයෙන්**— ලියා මඩුයෙන්. උයන් වතු ආදියෙහි වැල්වලින් මඩුවක් සේ වූ තැන් ලතා මණ්ඩප නම්. **හැලි**— ඉහළ සිටැ පහළට දිය පහර කඩා හැලෙන තැන්. **කොකිලාවන් ගේ**— කෝකිල ධෙනූන් ගේ. **කුල ගෘහ**— කුලයට හිමි ගෙය. පුරැදු ගෙය. **චක්‍රවාක**— සක්වා ලිහිණි. **චකෝර**— ඇටි කුකුළු. **ක්‍රෞඤ්ච**— කොස් ලිහිණි. **ජීවඤ්ජීවක**— එ නම් ලිහිණි. **කපෝත**— කොබෝ. **පාරාපත** - පරෙවි. **කීර**— ගිරා. **ශාරිකා**— සැල ලිහිණි. **ස්ථල චර**— ගොඩැ හැසිරෙන. **ජල චර**— දියෙහි හැසිරෙන. **සැමැහුම් ගන්නා**—රැස් වීම් (එකතු වීම්) පවත්වන. **චම්පක**— සපු. **අශෝක**— හෝපලු. **ආම්‍ර**— අඹ. **ගන්ධිනී**— මුරු නම් ගන්ධ ද්‍රව්‍යය. මුරමාංසි. **ශීත ගන්ධ**— ('සිතගන්ධ' යනු මුද්‍රණ දෝෂ යි ) සුදු සඳුන්. ශීත වූ ගන්ධය යමෙක්හි ද ඒ. **කර්ණිකාර**— කිණිහිරි. **සහකාර**— මී අඹ. **ශාල**— සල්. **තාල**— තල්. **තමාල**— කොල්ලම්. **වකුල**— මූණ මල්. **කුමුක**— පුවක්. **කුරවක**— රත් කරවු. **නාරිකෙල**— පොල්. **කන්නිර**— තැඹිලි. **පනස**— කොස්. **අසන**-- පියා ගස්. **සර්ජ**— දුම්මල. **අර්ජුන**— කුඹුක්. **විවිධ**— නානාප්‍රකාර. **තරු වර**— වෘක්ෂෝත්තමයන්. උතුම් ගස්. **පද්ම ගර්භයෙන්**--පියුම් ගැබින්. **මධුර මධු පාන මත්ත වූ**— මිහිරි (මල්) පැණි බීමෙන් මත් වූ. **පරම රමණීය වූ**— අතිශයින් මනොහර වූ. **තෙරෙහි**— (මේ කියැවෙන ගෘහ දීර්ඝිකාවන් ගේ) තීරයෙහි. **ලියා මඩුලුයෙන්** ලතා මණ්ඩපයෙන්. දිය **කෝල්හි** (මේ කියැවෙන ගෘහ දීර්ඝිකාවන් ගේ) දිය කෙළවර. 'කෝල්' යනු නො ගැඹුරැ වූ දිය ඇති තීරාසන්නාංශම නම්. **රාත්‍රින්දිවයෙහි**— රෑ දවල්හි. **නයනොත්සවාවහ වූ** (නයන+උත්සව + ආවහ) ඇසට ප්‍රීති පමුණුවන්නා වූ. **ගෘහදීර්ඝිකායෙන්**— ගෙ දිගු විලින්. ගෙය අසල වූ දිගු විල් 'ගෘහ දීර්ඝිකා' නම්. පළලට වඩා දිග ඇති හෙයින් දීර්ඝිකා යැ. **කෙළි නළුයෙන්**— ක්‍රීඩා නාට්‍යයෙන්. **යහළු යෙහෙළියන් ගේ** (ඔවුනොවුනට) සහාය වූ සත්පුරුෂයන් ගේ. 'යහළු' සද ඉතිරි පස ගත් කලැ 'යෙහෙළි' යනු වෙයි. අනම්‍ය විධියෙන් 'යැහැළි' යි වියැ යුත්තෙහි දු මෙහි නො වේ. 'අ' 'එ' වෙයි. මහණ- මෙහෙණ, මණවු- මෙණෙවි, යනාදියෙ ද සලකන්නේ යැ. **හෘදයඞ්ගම**

වූ— හෘදයයම යන්නා වූ. සිතට වදින්නාවූ. මනොනුකූල වූ. **සමාන කුල ශීල යෞවනාභිරාම වූ**— සමාන වූ කුල යැ ආචාර යැ තරුණ භාවය යන මෙයින් ඉතා රමණීය වූ. මෙ තැන් පටන් විශෙෂණයෝ මෙහි අනැ එන 'අඹුවන්' යන්න හා සම්බන්ධ වෙති. **පිරුණු ඝනා භාර සේ ඝෙනහයෙහි මහත් වැ පිරුණා** වූ— ඒ අඹුවන් ගේ පයෝධර භාරයෝ පිරුණා හ. ඒ පයොධර භාරයන් මෙන් උන් ගේ ශෙනහය ද මහත් වැ පිරුණේ යැ. **තුනු වූ**— සිහින් වූ. **වලග**— ඉහටිය. **අවගුණයෙහි තුනු වූ**— අවගුණ පක්ෂයෙන් සිහින් වූ. ඔවුන් ගේ අවගුණ ඉතා අඩු යැ. **පුරුදු කම්හි දිග් වූ**— උන් ගේ පුරුදු කම් දිග යැ. දීර්ඝ කාලයක් පුරුදු වැ වසන්නා හ. **අධර**— යටි තොල්. **අනුරාගයෙහි— ඇල්මෙහි රක්ත**— 'රතු' 'ඇලුණු' යනු අර්ථ දෙක මැ ලැබෙයි. **නුරු වලාහි**— නූපුර වලයයෙහි. පයෙහි ලන ගිගිරි වළල්ලෙහි. **රැවූ**— රාවය. නාදය. **මණි මෙඛලා බන්ධනයෙන් සිත් බැඳැවූ**— මිණි මෙවුල් බැඳුමෙන් සිත බැන්දූ. මිණි මෙවුලෙහි හඩ අසන්නහු ගේ සිත බැඳී යෙයි. "මෙහනස්‍ය ඛස්‍ය මාලා" යන පද ත්‍රයයෙන් මෙ- ඛ- ලා- යන අකුරු තුන ලැබැ 'මෙඛලා' යනු නිපනි ල. "මෙහන (යෝනි) ඉන්‍ද්‍රියයා ගේ මාලාව" යැ යනු එ කී පද ත්‍රයයා ගේ අර්ථ යි. 'ඛ' යනු ඉන්‍ද්‍රිය වාචී යි. **ශරීරයෙන් මැ වෙන් වූ**— ඒ අඹුවෝ ශරීරයෙන් පමණක් මැ ස්වාමියා ගෙන් වෙන් වූ හ. ජීවිතයෙන් නම් නො වෙන් හ. **ඇසි පිය හීම් පමණක් කප් සිය දහසක් කොටැ සිතන**— ස්වාමියා ගේ ඇසි පිය වැටීම් පමණ කාලයක් (වුව ද) කල්ප සිය දහසක් පමණ කොටැ සිතන්නා වූ. ඒ කාලයෙහි ද ස්වාමියා ගෙන් වෙන් වූ සේ හැලැකීම ක්ෂණය එ තරම් දීර්ඝ ලෙස හැඟීමට හෙතු යැ. **සිපැ ගත්**— (ස්වාමියා විසින් තමන්) වැලැඳැ ගත්තා වූ. **ජීවිතයෙහි ආශා ද ලිහිල් කරන**— ඉතින් ජීවත් වනුයේ කුමකට ද යි සිතන. ස්වාමියා ගේ අත මඳක් බුරුල් වීම එ තරම් නො ඉවැසියැ හැකි යැ. ඒ අඹුවෝ එ තරම් ස්වාමීයාට ඇලුණෝ යැ.

"ඇසි පිය හෙන ක ලේ
වැලැඳි අත කළ ලිහි ලේ
තබන පිය නොපල ලේ
හිමින් වියොව යි සිතව එක ලේ"

යන පද්‍යය බඳනා වූ සිරි රහල් මහ තෙරහු ද මේ අර්ථය සිහි කළ හ. **වෙන් වූ රාත්‍රිය ඒ තෙර මැ ගත නො හෙන—**

හිමියා නැති වැ සිතට ප්‍රීති නැති හෙයින් රාත්‍රිය එ තරම් දික් වැ පෙණෙනයි. අඹුවෝ ඒ රෑ ගෙවා ගත නො හෙති. **බොළඳ කමට මැ බෑවෙන**— මුග්ධ භාවයට මැ පුරුදු වැ සිටින්නා වූ. බැහැවෙන = බෑවෙන. 'බැහැවෙන' යනු 'බහ' ධාතුයෙන් වූ ප්‍රයෝජ්‍ය කර්මකාරක වර්තමාන කෘදන්ත නාම සි. යමෙකු බැහැවීම නම් එහි මැ හෙළනු ලැබැ එහි මැ ගැලී සිඳීම සි. එ නම් එයට ඇරි වීසීම සි. **නියැළෙනා**— බැඳෙන්නා වූ. මේ අඹුවෝ තමන් ගේ බොළඳ කමට මැ බැහැවෙති. සවාමියා ගේ විදග්ධ කමට මැ (නිපුණ භාවයට මැ) නියැළෙති. (බැඳෙති, ආශක්ත වෙති.) **ඔබර කොටැ ද...... මිහිරි කරන**— මේ අඹුවෝ (මෙන අඹුවන්) සේ මැ හිමියා සමඟ ඔබර (ප්‍රණය කලහ) ද කෙරෙති. එ සේ කොටැ, දුඃඛ වැ ගෙනැ, සිත තද කොටැ ගෙනැ, සිටින්නට උත්සාහ කෙරෙති. කො තරම් උත්සාහ කළ ද, ඒ දුඃඛ කම් බොහෝ කලක් ස්ථිර කොටැ ගත නො හෙති. ඉතින් ඉවැසියැ නො හැකි යැ. එ හෙයින් යළි දු සවාමියාට ළැඟෙන (ළං වන, සමීප වන) උපායයක් සිතන්නට වෙති. එ සේ උපායයක් සිතා තමින් මැ ළං වූ කලැ, එ දා සවාමියාට ඔබර මිහිරි කෙරෙති. ("මෙ තරම් මිහිරක් මේ ඔබරය නිසා ලදිම්" සි සිතැවීමෙනි.) සවාමියා ලැබූ ජීවිතයෙහි විශේෂ ඵල එ දා අනුභව කරවති. සවාමියා ගේ අනුභව සම්පත්තිය මිහිරි කෙරෙති. **ළැඟෙන**— ('ලැගෙන' යනු ද ලැගි යනු ද මුද්‍රණ දෝෂ සි.) ළං වන. 'ළඟ' ධාතු සි. මෙහි 'ළඟ' ධාතු 'රක්' ආදි අත් පද සි. ළැඟේ- ළැඟෙති- ළැඟිණි, ළැඟි- ළඟුණු, ළැඟි. **අග හස්**— අග්‍ර ශස්‍ය. ශස්‍ය කපා පාගා පළමු කොටැ මැ දෙන බත 'අග හස් බත්' නමි. මෙහි දිවියෙහි අග හස් දීම නම්, "දිවි ලද තැන් සිටැ මෙ තරම් මිහිරක්' නො දතිමි. මේ පළමු කොටැ මැ ලද මෙ බඳු මිහිර යැ" සි සිතන්නට සැලැස්සීම සි. **නරක සත්ත්වයක්හු**— නරකයෙහි දුක් විඳුනා සතකු.

30. **මාහ සමහාරයෙන්**— මහත් උපකරණයෙන්. යම් කිසිවක් තනන්නට ලබා ගත යුතු උපකරණයෝ 'සමහාර' නම් වෙති. ගෙයකට නම් දැව දඬු උළු හුණු ආදිය සි. **පරිහරණ**— ශුද්ධ කිරීම. **සෙනසුන්**—ශයනාසන. පදුරු නම් හැඳ පුටු යනු සි. එ හෙත් ආගම් ධර්මයෙහි 'වාස ගෘහ' යන අර්ථයෙහි දු 'සෙනාසන' යනු යෙදෙයි. නිදන තැන් හිඳුනා තැන් එහි වන හෙයිනි. **වැඩි මාල්ලනට පැමිණෙනා බැවින්**— වැඩි මහලු

වුවනට කිසි වන බැවින්. මහල්ලන් දුටු කලැ ඔවුනට සෙනසුන් දියැ යුතු බැවිනි. **නො වේලෙහි**— සුදුසු වේලාව නො පැමිණි කල්හි. **උට්ඨාපනීය භාවය**— නැගී සිටියැ යුතු බව. **ශීතොෂ්ණ දෙක ඇග නො ගත දී**— ගෙයි ඉන්නා කලැ ශීතය ද උෂ්ණය ද ශරීරයට ගන්නට අවකාශ නො ලැබෙයි. **සියුමැලි**— සුකුමාර. මොළොක්. **ඇත**— ඇත් නම්. **මුවහ කරන බව යැ**—ගෙයි කිදැ පව් කරන්නෝ බැහැරට නො පෙනෙති. එ හෙයින් නො පෙනී පව් කිරීමට ගෙය වහල් වෙයි. **මමත්වය**— ම ගේ යැ සි සිතන බව. 'මම' යනු සංස්කෘතයෙහි 'මා ගේ' යන අර්ථ ඇත්තේ යැ. 'ත්ව' යනු භාවයෙහි කෘදන්ත ප්‍රත්‍යයයකි. **සඤ්චයිත භාවය**— සඤ්චය කළ බව (ද්‍රව්‍යයන් රැස් කළ බව.) **මඳ සත්ගෙසෙකින්**— අල්ප උත්සාහයෙකින්. **ගිලිහී**— ගැලැවී. **අනිත්‍ය සංඥාව**— 'අනිත්‍ය යැ' යන හැඟීම. සියලු සංස්කාරයන් අනිත්‍ය බව ගිලිහෙන පරඬලා මුල් කොටැ ගෙනැ මෙනෙහි කළ හැකි යැ. **මෙනෙහි කොටැ**— සිත්හි කොටැ. සිහි කොටැ. මන + එහි = මනෙහි = මෙනෙහි. **ශයනාසන මාත්සර්යෙන්**— ('මේ මා ගේ ශයනාසන යැ' සි) සෙනසුනෙහි උපදවන මසුරු බැවින්. මත්සරයා ගේ භාවය මාත්සර්ය සි. මත්සර + ය. **රහසක් නො වන බව**— ගෙයි මෙන් මුවාවක් නැති හෙයිනි. **හරන**— දුරු කරන. **දස ගුණයෙන්**— මෙහි. දුක්වුණු සේ දසය නො පිරෙයි. **ආහාරයක් අරුම හෙයින්**— කෑම දුර්ලභ නිසා. 'අරුම' යන්නෙහි අර්ථ 'පුදුම' යනු සි. ඇතැමකුට ආහාර අරුම යැ. ඔවුනට එය ලැබෙනුයේ ඉතා කලෙකිනි. එ හෙයින් ලැබුණු විටැ පුදුමයට හේතු වෙයි. එයින් හැඟැවෙනුයේ ඔහුට ආහාර ඉතා දුර්ලභ බව සි. සුමෙධයනට ආහාර කිසි කලෙකැ අරුම නො වී යැ. **පෑ**— පෙන්වා. මහණ වෙස් දැකැ මිනිස්සු ආහාර දෙන්නට කැමැති වෙති. **නො වත්**— නො වී නම්. 'වත්' යනු අසම්භාව්‍ය කෘදන්ත නිපාත සි. **ආහාර පර්යේෂණ දුඃඛය**— ආහාර සෙවීමේ දුක. **බොහෝ වුව**— බොහෝ වී නම්. වුව— යනු ද අසම්භාව්‍ය කෘදන්ත නිපාත සි. මේ අතීත රූප සි. ව + අ = වූ + අ = වුව. 'වත්' යනු වර්තමාන රූප සි. ව + තු = වතු. 'වත්' 'වත' යන රූප දෙක ද සාධු සි. **තමා මැ තම හට වැටී හුණු**— තමා මැ තමා උදෙසා වැටී ගියා වූ. අනුන් ගේ ප්‍රයෝගයක් නැති වැ වැටුණා වූ. **පඤ්චාභිඥ**— (පඤ්ච + අභිඥ) ඉතා උසස් නුවණ

පස. ඍද්ධි විධ, දිව්‍ය ශ්‍රොත්‍ර, පරචිත්ත විජානන, පූර්වේනිවාසානුස්මෘති, දිව්‍ය චක්ෂුස්, යනු ඒ පස යි. **අෂ්ට සමාපත්ති**— ප්‍රථම ධ්‍යාන, ද්විතීය ධ්‍යාන, තෘතීය ධ්‍යාන, චතුර්ථ ධ්‍යාන, අකාසනඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන යන ධ්‍යාන අට. **ආභාස්වර බ්‍රහ්ම ලොකයෙහි**— ආභාස්වර නම් වූ බ්‍රහ්ම ලොකයෙහි. ඒ බඹ ලොවැ බඹුන් ගේ ආහාරය ප්‍රීතිය පමණෙකි. **ධ්‍යාන සුඛයෙන්**— ධ්‍යානයෙන් (සිත එකඟ කිරීමෙන්) ඇති වන මානසික සුවයෙන්.

**31. පූරිත පාරමිතා බල ප්‍රතිලබ්ධ වූ ප්‍රඥා පරිණාම ඇති**— පුරන ලද පැරුම් බලයෙන් ලබන ලද්දා වූ නුවණ මිහිකිරීම් (මේරීම්) ඇති. **මහී**— පෘථිවී. **බොධිසත්ත්වාවස්ථායෙහි**— (සත්ත්ව + අවස්ථා) බෝසත් සමයෙහි. බුදු බව පතා පැරුම් පුරන්නාහු 'බොධිසත්ත්ව' නම් වෙති. **මස්තක ප්‍රාප්ත වැ**— මුදුන් පැමිණැ. සම්පූර්ණ කොටැ. **සැවැ**— ච්‍යුත වැ. මියැ ගොස්. **රසාස්වාදය**— (රස + ආස්වාදය) රස විඳීම. **මතු**— එයින් ඉහළ. **පඤ්ච මහා විලොකනය**— පස් මහ බැලුම්. කාල, දෙශ, ද්වීප, කුල, මාතෘ, යන කරුණු පස බැලීම. **පිළිසඳ**— ප්‍රතිසන්ධිය. තැනෙකැ පඤ්ච ස්කන්ධය හැරැ යළි සන්ධි වීම. **අභූතපූර්ව**— නුවූවිරූ. ආශ්චර්ය වූ. **ඈවැමෙහි**— ඉකුත් වූ කලැ. **පුනරුක්ත කොටැ**— නැවැතැ කියන ලද්දන් කොටැ. නැවැතැ පවත්වා. **නව යුවති නයන මධුකර නිපෙය වූ යෞවන මකරන්ද සම්පූර්ණ වූ ප්‍රභාත සමය ප්‍රබුද්ධ වූ පද්මයක් සේ**— අභිනව තරුණීන් ගේ ඇස් නමැති බමරුන් විසින් පියැ යුතු වූ තරුණ බව නමැති මුවරඳ පිරුණා වූ උදය කාලයෙහි පිපුණා වූ පියුමක් සේ. යුවන් + ති = යුවති. මෙහි 'ති' යනු ස්ත්‍රී ප්‍රත්‍යය යි. මධු (මී පැණි) කරනුයේ මධුකර යි. නිපෙය. නි + පා + ය. 'නි' උපසර්ග යි. 'පා' (බීමෙහි) ධාතු යි. 'ය' (කළ යුතු යන අර්ථයෙහි) කෘදන්ත ප්‍රත්‍යය යි. **ලොකානන්දකර වැ**— (ලොක + ආනන්ද.) ලොවට ප්‍රීතිකර වැ (සන්තොෂ ජනක වැ.) **හිම**— හෙමන්ත. ඉල් මසින් පටන් ගන්නා සතර මාසය හෙමන්ත ඍතුව යි. **ගිම්**— ග්‍රීෂ්ම. මැදින් මසින් පටන් ගන්නා සතර මාසය ග්‍රීෂ්ම ඍතුව යි. **වසන්ත**— ඇසළ මසින් පටන් ගන්නා සතර මාසය වසන්ත ඍතුව යි. **සන්නද්ධ නව යෞවන ඇති**— සැරැසී සිටියා වූ

අභිනව තරුණ භාවය ඇති. **විලාසිනීන් ගේ**— ස්ත්‍රීන් ගේ විලාස ඇත්තාහු ස්ත්‍රීහු විලාසිනීහු යි. විලාස + ඉන් + ඊ. **මුඛාම්බුජයෙහි**— මුඛ නමැති අම්බුජයෙහි (පියුමෙහි.) අම්බුයෙහි (ජලයෙහි) ජාත වූයේ (උපන්නේ) 'අම්බුජ' යි. **රාජ හංස වැ**— රාජ හංසයා පියුම් මී බොහු පිණිස පියුම් සෙවුනේ යැ. මේ බොධි සත්ත්වයෝ ඒ ස්ත්‍රීන් ගේ මුඛ සෙව්යෝ. **ප්‍රණය සුධා රසයට පවිත්‍ර පාත්‍ර වැ**— ප්‍රෙම නමැති අමෘත රසයට පිරිසුදු භාජන වැ. 'සුධා' නම් දිව්‍ය භොජනය යි. අමෘතය යි. 'පියූෂමමෘතං සුධා' යනු ඒ සඳහා අමරසිංහ වචන යි. **ප්‍රණය මධුර කටාක්ෂ නික්ෂෙප භ්‍රමරාවලියට විකසිත සහකාර කුසුම වැ**— ප්‍රෙමයෙන් ප්‍රීතිජනක වූ නෙත් කොන් හෙළීම නමැති බමර වැලට පිපුණු මී අඹ (මල්) පොකුරක් වැ. කටයෙහි (ගණ්ඩයෙහි = කපොලයෙහි) අක්ෂණය (ව්‍යාප්තිය = පැතිරීම) කෙරේ නු යි. 'කටාක්ෂ' නම්. ඇසෙහි සිඟින් කොන යි. 'නික්ෂෙප' නම් හෙළීම යි. 'කටාක්ෂ නික්ෂෙප' යනු ඇස් කොනින් බැල්මට යෙදේ. භ්‍රමර + ආවලී. බමර වැල. ස්ත්‍රීන් ඒ බෝ සතුන් දෙස කො තරම් ආශායෙන් බලත් ද යනු මෙයින් හැඟැවිණ. බමරු මහත් ආශායෙන් අඹ මලට යෙති. ස්ත්‍රීන් ගේ ඇස් කොන් එ තරම් මැ ආශායෙන් බෝ සතුන් වෙතට යේ. **බාහු ලතාශ්ලෙෂයට**— (ලතා + ආශ්ලෙෂ) බාහු නමැති ලතායෙන් (අත් නමැති වැලින්) වැලැඳැ ගැනීමට. **සුජාත පාරිජාත ද්‍රැම වැ**— මනා වැ උපන් පරසතු ගස වැ. පරසතු ගසෙහි වැල් එතෙන්නා සේ ඒ බොධි සත්ත්වයන් ගේ සිරුරෙහි (ස්ත්‍රීන් ගේ) අත් එතෙයි. **මන්ද ස්මිත කාන්ති නිෂෙකයට චන්ද්‍ර කාන්ත පාෂාණ වැ**— මඳ සිනා රශ්මි නිකුත් කිරීමට සඳ කත පහණ වැ. චන්ද්‍ර කාන්ත පාෂාණය චන්ද්‍ර රශ්මිය උරා ගෙනැ දිය බවට හරවා නිකුත් කෙරෙයි. එ මෙන් මැ ඒ බොධි සත්ත්වයෝ ඒ ස්ත්‍රීන් ගේ මඳ සිනා රශ්මිය උරා ගෙන යළි නිකුත් කෙරෙති. **පීන ස්තන රාජ හංසයන් ගේ ස්වෙච්ඡා ක්‍රීඩාවට තමන් ගේ විශාල වක්ෂස මැ රුචිර සරස් කොට වැ**— පුන් තන නමැති රාජ හංසයන් ගේ සිය කැමැති සේ කෙළීමට තමන් ගේ විශාල වූ උරඃ ප්‍රදෙශය මැ (පපුව මැ) සිත්කලු වූ විලක් කොට වැ. ඒ ස්ත්‍රීන් ගේ පයොධරයන්, රජ හසුන් විලෙකැ මෙන්, බොධි සත්ත්වයන් ගේ වක්ෂස්හි හැසුරුණ හ යි කී සේ යැ. රුචිය දෙනුයේ 'රුචිර'යි. රුච් + රා + අ. 'රා' (දීමෙහි) ධාතු යි. **අනුක්‍රමයෙන්**—

ක්‍රමානුකූල වැ. කල් යත් යත්. **උද්‍යාන යාත්‍රා ගමනයෙහි**— උයන් යෑමේ ගමනෙහි දී. **බ්‍රහ්මෝපනීත**— (බ්‍රහ්ම + උපනීත) බ්‍රහ්මයා විසින් සමීපයට එළවන ලද (දක්වන ලද.) උප+නී+ත. **ජීර්ණ ව්‍යාධිත මෘත නිර්මිත සංදර්ශනයෙන්**— ජරාවට පැමිණි, රෝග ඇති, මළ නිමිති දැකීමෙන්. 'ව්‍යාධි' යනු රෝගය යි. රෝග ඇත්තේ ව්‍යාධිත යි. **සඤ්ජාත උද්වේග ඇති වූ**— හට ගත් ව්‍යාකූල සිත් ඇති වැ. ව්‍යාකූලිත වූ සිත 'උද්වේග' නම්. **ප්‍රව්‍රජිත රූප**— පැවිදි රුව. ශ්‍රමණ රූපය. **සොත්සාහ වූ**— උත්සාහ සහිත වැ. **සදන ලද**— සරසා පිළියෙළ කරන ලද. **හස්ති ස්කන්ධාධිරූඪ වූ**— (සකන්ධ + අධි...) ඇත් කඳට නැඟී. **ප්‍රවර කුඤ්ජර ස්කන්ධාධිරෝහණ චාතුරී සංදර්ශිත විස්මිත විශ්ව ලෝකයා විසින්**— ඉතා උතුම් ඇත් කඳට නැඟීමේ දක්ෂ බව දැකීමෙන් පුදුම වූ සියලු ලොකයා විසින්. **පිළිරැවු දෙවන ලද**— ප්‍රතිරාව දෙවන ලද්දා වූ. / මොබින් රාවයක් ඇති කළ කලැ එය පෙරළා ඔබින් මොබට එන සේ ඇසීම ප්‍රතිරාවය යි. මෙහි මිනිසුන් ජය ශබ්ද සිය දහස් ගණන් නඟත් මැ ඒ ශබ්දයා ගේ ප්‍රතිරාවය සියලු අතින් ඇසෙන්නට වියැ. **දික් චක්‍රවාල**— දිශා මණ්ඩල / **දිවා භාගයෙහි**— දවල් කාලයෙහි. **විහාරයෙන්**— විහරණය කිරීමෙන්. ක්‍රීඩා පිණිස දෙ පසින් ගමන් කිරීම විහාර නම්. **මඟුල් සල වටා**— මඞ්ගල. ශිලා පට්ටයෙහි. මඟුල් ගල් පුවරුවෙහි. **ප්‍රව්‍රජ්‍යාභිමුඛ**— පැවිද්දට මුහුණ ලා සිටි. ප්‍රව්‍රජ්‍යාව බලා සිටි. **හිස කෙස් බහා**— හිසැ කෙස් කපා. **රාජ වේශෝචිත**— (වේශ + උචිත) රජ වෙසට (ඇඳුමට) සුදුසු. **යුගල**— යුගලය. දෙක. **කාෂාය වස්ත්‍ර**— කසා වත්. කහ වන් වස්ත්‍ර. **මහා වීර්‍ය**— මහත් උත්සාහ. දුෂ්කර ක්‍රියා. **සකල සර්වඥ වර ඥානාධිගම මහෝත්සව නිධාන වූ**— සියලු සර්වඥ වරයෝ වෙසක් මසැ මැදි පොහෝ දවස්හි මැ ඥාන අධිගම (බුද්ධ ඥානය අවබෝධ කිරීම) කෙරෙති. එ හෙයින් මෙ සේ කියත්. **මහෝත්සව නිධාන**— මහොත්සවය රැඳූ සිටි. **මැදි පොහෝ**— අමා වක් පොහෝ දින දෙකක් අතර මාසයෙක් වෙයි. පුර පසළොස් වක් පොහොය එනුයේ මාස මධ්‍යයෙහි දී යැ. එ හෙයින් ඒ මැදි පොහෝ නම්. **භික්ෂාර්ථි වූ**— අහර සිඟීමේ අටි ඇති වැ. **නගරාභ්‍යන්තරයකට**— (නගර + අභ්‍යන්තර) අභ්‍යන්තරයකට. **බලි කර්මාන්ත**— බිලියම්. පූජා. **අසම්භින්න ක්ෂෛරෙය භෝජනය**— නුමුසු කිරි බොජුන්. සම් + භිද් + ත = සම්භින්න.

බිඳුනා ලද. හෙදයට (චෙතසට) පමුණුවන ලද. එසේ නුවූයේ අසම්භින්න සි. ක්ෂීරයෙහි සකස් කරන ලද්දේ 'ක්ෂෛරෙය' සි ක්ෂීර + ඒය **කෝටිමාත්‍ර**— කෝටි ප්‍රමාණ. **ප්‍රක්ෂිප්ත**— බහන ලද. **ඔජස්**— සාරය. **එකූන් පනස්**— එකක් උනු පනස්. සතළිස් නව. **ප්‍රාන්තයෙහි**— සමීපයෙහි. **දිවා විහාර**— දවල් කාලයෙහි විහරණය. **ගණයෙන්**— සමූහයෙන්. **සානන්ද**— (ස+ආනන්ද) ආනන්ද (ප්‍රීති) සහිත වූ. **සුනන්දා**— ('විසින් දෙන ලද කුස තණ අට මිට පිළි ගෙනැ' යනු අඩු යැ. එය යොදා ගත යුතු.) **පිසපල්**— පුලිල. **තණ ඇතිරිය**— තණ ඇතිරිල්ල. තෘණාස්තරණය. **අතුරන් මැ**— අතුරන කල්හි මැ. අතුරනු හා සමඟ මැ. **අසනයට**— බැසීමට. නො පෙනී යැමට. **ඝෝර මාර වීර වීර්‍ය**— දරුණු වූ මාර වීරයා ගේ බලය. දරුණු වූ වීර වූ මාරයා ගේ බලය. වීරයා ගේ භාවය වීර්‍ය සි. වීර + ය. **නිජ**— ස්වකීය. **උන්මූලනයට**— මුල් උදුරා දැමීමට. විනාශයට. **යාම ත්‍රයාධිගත ඥාන ත්‍රය**— (ත්‍රය + අධිගත) තුන් යම්හි අවබොධය කළ තුන් නුවණ. ප්‍රථම යාමයෙහි පූර්වේනිවාසානුස්මෘති ඥානය ද මධ්‍යම යාමයෙහි දිව්‍ය චක්ෂුරභිඥානය ද පශ්චිම යාමයෙහි ආශ්‍රවක්ෂයකර ඥානය ද අධිගම කැරිණ. **වාසනා සහිත**— වාසනාව ද ඇතුළත් වූ. කෙලෙසුන් හා සමඟ විසූ පුරුද්ද වාසනා නම්. **කල්මෂ**— කිලුටු. **ප්‍රක්ෂාලනයෙන්**— සේදීමෙන්. **ශාන්තිකර** වූ— සෙත් කරන්නා වූ. **කරුණාකර**— (කරුණා + ආකර) කරුණාව උපදනා ස්ථානය. **මොහාන්ධකාර දිවාකර**— මොහ නමැති අන්ධකාරයට සූර්‍ය. අන්ධ කෙරේ නු සි 'අන්ධකාර' නම්. අඳුර අන්ධ කෙරෙයි. අඳුරෙහි ඇස් නො පෙනෙන හෙයිනි. දිවා (දවල) කරනුයේ දිවාකර සි. **සූක්ති සුධා නිෂේක නිශාකර**— (සු + උක්ති) යහපත් වචන (කියුම්) නමැති අමෘතය ඉසින්නා වූ චන්ද්‍රයා. දෙවියන් ගේ අමෘතය (සුධාව) රැක් කරන ලද්දේ චන්ද්‍ර මණ්ඩලයේ ල. එ හෙයින් චන්ද්‍ර සුධාකර නම්. ඒ අමෘතාකරයා ගේ රශ්මිය නම් සුධා නිෂේකය සි අමාව ඉසීම සි. නිශාව (රැය) කරනුයේ නිශාකර සි. **ක්ෂෙමඞ්කර** වූ— ක්ෂෙමය (නිර්භය භාවය) කරන්නා වූ. **මාර භයඞ්කර** වූ— මාරයාට භය උපදවන්නා වූ. **ධර්ම චක්‍ර**— සියලු බුදුවරයන් තමන් ගේ ධර්මයේ සාරය පිඬු කොටැ ගෙනැ චතුරාර්‍ය සත්‍යය ප්‍රකාශ කොටැ කරන පළමු වන දෙශනාව ධර්මචක්‍ර නම්. **තෘෂ්ණා දාස** වූ— තෘෂ්ණාවට දැඩි ලොභයට) දාස වූ. **නිර්දාස්‍ය**— නිදහස්. දාස භාවයෙන් මුක්ත. දාසයා ගේ භාවය

දෘස්‍ය සි. දෘස්‍යයෙන් නිෂ්ක්‍රාන්ත (නික්මුත්) වූයේ නිර්දෘස්‍ය සි. නිර්දෘස- නිර්දෘස්‍ය- යන දෙකෙහි මේ මහත් වෙනස වෙයි. දෘසයා ගෙන් වෙන් වූයේ- දෘසයකු නැතියේ- නිර්දෘස සි. දෘස භාවයෙන් මිදුණේ නිර්දෘස්‍ය සි. **සද්ධම්මාඞ්කුර**—(සද්ධම්ම+අඞ්කුර) සදහම් අකුරු. සදහම් පැළ. **උන්වමින්**— ඉදෙන්නට සලස්වමින්. 'උද' ධාතු සි. උදවමින්= උන්ද්වමින්= උන්වමින්. **අභය භෙරිං ලවමින්**— අභය බෙරය ගස්වමින්. “දැන් සතුනට සසර හයින් මිදීම ලැබෙයි” යන ප්‍රකාශය කරවමින්. **චාරිකායෙහි**— ගමින් ගමට නුවරින් නුවරට රටින් රටට හැසිරීමෙහි.

**32. මාර විජයොත්සව ප්‍රතිලබ්ධ සද්ධර්ම ධ්වජ ඇති**— මාරයා දිනූ උත්සවයෙන් ලැබුණු සදහම් (ජය) කොඩි ඇති. **තත්කාලොද්භූත** – (කාල + උද්භූත) ඒ කාලයෙහි පහළ වූ (ඇති වූ) **හර්ෂ සම්භ්‍රම**— සන්තොෂ වෙග. 'සම්භ්‍රම' යනු ආදරයට ද නම් වන බැවින් 'සන්තොෂ ආදර' සි ද අරුත් ගත හැකි. **උපචිත රුචිර ප්‍රචුරොපහාර පරිගත හස්ත සම්පුට ඇති වැ**— (ප්‍රචුර + උපහාර) රැස් කරන ලද සිත්කලු වූ බොහෝ වූ පූජාවන් පිරුණා වූ දොහොත් ඇති වැ. උප+චි+ත. 'චි' (රැස් කිරීමෙහි ධාතු සි.) 'ප්‍රචුර' යනු 'බොහෝ' යන අර්ථයෙහි වෙයි. උප + හෘ + අ= උපහාර. (ළඟට, පූජා පිණිස, ගෙනැ ඒම) 'පූජාව' යැ යනු අර්ථ සි. පරි + ගම් + ත= පරිගත. හාත්පස්හි ගියා වූ. පිරුණා වූ. 'පුට' යනු 'ගොටුව' යන අර්ථ ඇත්තේ යැ. 'සම්පුට' නම් යහපත් ගොටුව සි. හස්ත සම්පුටය නම් හොඳ කොටුවක් සේ එක් කළ දොහොත සි. **තත් පූර්වාපූර්ව ස්වරූප**— ඔවුන් (ඒ බුදුන්) පූර්ව වූ (ප්‍රධාන කොට ඇති) අපූර්ව වූ (පෙර නුදුටු විරූ) ආකාර. බුදුන් පෙරටු කොට ඇති පිරිස ගේ අපූර්ව වූ ආකාර. **එකත්පස් වැ**— එක් පසෙකට වී.

“න පච්ඡතො න පුරතො නාපි ආසන්න දූරතො
න කච්ඡෙ නො පටිවාතෙ න චාපි ඔනතුන්නතෙ
එතෙ දොසෙ විවජ්ජෙත්වා එකමන්තං ඨිතා වුච්චති”

යනු හෙයින්, පසුත් නො වැ ඉදිරිත් නො වැ ළඟත් නො වැ දුරැත් නො වැ යටි සුළඟෙහිත් නො වැ උඩු සුළඟෙහිත් නො වැ අවනතයෙහිත් නො වැ උන්නතයෙහිත් නො වැ හිඳිනු එකත්පසැ හිඳිනු නම් වෙයි. **අශ්‍රුතපූර්ව**— නො ඇසූවිරූ. **ශ්‍රවණ නිර්වාපණීය වූ**— කනට නිවිල්ලක් වූ. **මනොරථයෙහි අඩු පුරා**— අභිලාෂයෙහි අඩු බව පුරා ගෙනැ (පිරෙන සේ.)

බුදුන් දක්නා ඇස් තිවිණ. බණ අසා කන් නිවිණ. තව ද ඒ මිනිසුන් ගේ මන දෙළෙහි අඩුවෙක් පෙනෙයි. එ නම් දනක් දෙන අභිලාෂය නො පිරිණ. එය ද පූරවා ගන්නා සේ මිනිස්සු බුදුන් පැවැරූ හ. **පවරා**— ආරාධනා කොටැ. **උදෘසනක් සේ මැ**— උදය කාලයක් පරිද්දෙන් මැ. මිනිස්සු ද උදය කාලයෙක් වූ නම්, උදය කාලය ද එ සේ මැ මිනිස්සු ද එක් වරට නැඟී සිටිති. **අලලන්නවුන්**— කලඹන්නවුන්. එහි එ තරම් මහත් කලකලයෙකි. **කුල පර්වතයන්**—

"යුගන්ධරො ඊසධරො කරවීකො සුදස්සනො
නෙමින්ධරො විනතකො අස්සකණ්ණො කුලාචලා"

යනුයෙන් බෞද්ධ ග්‍රන්ථයන්හි සත් කුල පව් දක්විණ. මහ මෙර වටා මේ පව් වළලු වැ සිටිති යි යෙති. සංස්කෘත ග්‍රන්ථයන්හි දැක්වුණේ—

"මහෙන්ද්‍රො මලයඃ සහ්‍යඃ ශුක්තිමානෘක්ෂපර්වතඃ
වින්ධ්‍යශ්ච පාරියාත්‍රශ්ච සප්තෛතෙ කුලපර්වතාඃ"

යන විසිනි. කුල වැ ප්‍රධාන වැ සිටි හෙයින් මේ කුල පර්වත යි. (මෙහි සතර වැන්න 'ශුක්තිමත්' නම් ද පස් වැන්න 'ඍක්ෂ පර්වත' නම් ද වෙයි.) **හශා**— ඇඳ ගෙනැ. **උපූරා**— උගුළුවා. ඔසොවා. **චන්දනාගරු කල්කයෙන්**— සඳුන් අගිල් මඬින්. **පරිභණ්ඩ ගන්නා ලද**— බිම ගානා ලද. **භූමි භාග**— බිම් කොටස. ගෙ බිම. **ලද පස් මල්**— ලාජ පඤ්චම පුෂ්ප. විලඳ පස්වනු කොට ඇති හෙයින් මෙ නම්. ගී තණ, සුන් සහල්, තෙල අබ, සමන් කැකුළු, විලඳ. මේ උපචාර වශයෙන් මල් නම්. **ස්ථානස්ථානයෙහි**— තන්තන්හි. **වින්‍යස්ත**— පිහිටුවන ලද. **පූර්ණ ඝට**— පුන් කුඹු. පිරුණු කළ. **ස්වර්ණරජතමය තාරකා වින්‍යාස මනොහර වූ ශ්වෙත විතානයෙන්**— රනින් රිදීයෙන් කළ තරු පිහිටිවීමෙන් මනහර වූ සුදු වියනින්. වියනෙහි තරු පිහිටුවනු දක්නුදු සිරිති. **මුක්තා ලැල්**— මුක්තා ලතිකා. මුතු ලිය. මුතු වැල්. **මහනෙල් දම්**— ගුත්තිල දෑයෙහි—

"සු දු පිරි සුදු වියනුත් උඩ බ ඳ වා
මු දු ඉඳුවර මල් දම් එහි ර ඳ වා"

යනු එයි. **ආකාශය මැඩැ ගෙනැ**— අහස වසා ගෙනැ. **කර්පූර කාලාගරු ධූපයෙන්**— කපුරු (කාල + අගරු) කළු අගිල් දුමින්. **අඛණ්ඩ ලක්ෂ්මී මණ්ඩිත වූ**— නො කඩ වූ ශ්‍රීයෙන් (ශොභායෙන්) අලඞ්කෘත (භූෂිත) වූ. **මණ්ඩපයක්**—

මඹුවක්. **දුනා** — දිනා. 'දුන' දිනීමෙහි ධාතු 'බම' ආදී උභය පද සි. (කතු කරු– පර පද) දුනා - දුනති- දිනී- දුනු. (අත් පද) දෙනේ- දෙනෙති. (කම් කරු) දූණේ- දූනෙති- දූනිණි- දූනුණු. **පඤ්චවණ්ණ** — පස් පැහැයෙන් යුත්. නීල, පීත (කසාවන්), ලොහිත (තද රතු), අවදාත (සුදු), මාඤ්ජෙෂ්ඨ (වැල් මදට වන්,) යනු පඤ්ච වර්ණ සි. **ධවජ** — සතරැස් කොඩි. **පතාකා** — තුන් හුලස් කොඩි. **පිළි තොරණ** — වස්ත්‍රයෙන් කළ තොරණ. **සුනු කොටා පී** — චූර්ණ කොට ගත්තා වූ. සුනුකළ. 'පී' යනු මෙහි නිරර්ථක සි. 'කා පූ' යනාදි තන්හි මෙනි. **පස් වණක්** — පඤ්ච වර්ණයෙකැ.

33. **බුද්ධාඞකුර** — (බුද්ධ + අඞකුර.) බුදුකුරු (බුදු පැළය) වූ. බොධි සත්ත්ව වූ. මහ බුදු ගසක් වැ වැඩෙන්නට සිටි හෙයින් බුද්ධාඞකුර සි. **ආශ්‍රම පදයෙන්** — අසපු පියසින්. ආශ්‍රමය වූ ස්ථානයෙන්. **තාපස වෙශධර වූ සුස්ථිර වූ මැවි ගිය විදුලියක් සේ** — සුමෙධයන් අහසින් යන කලැ පෙනෙනුයේ විදුලියක් සේ යැ. විදුලිය නම් ක්ෂණික යැ, අස්ථිර යැ. මේ එක්වන් පෙනෙයි, සුස්ථිර යැ. එ හෙයින් මේ, වෙන විදුලිය මෙන් නො වැ, සුස්ථිර වැ මැවී ගිය විදුලියක් සේ යැ. විදුලිය අහස්හි ඇඳි සවර්ණ රේඛාවක් සේ පෙනේ. එ හෙත් මේ පෙනෙනුයේ තාපසයකු මෙනි. එ හෙයින් මේ, වෙන විදුලිය මෙන් නො වැ, තාපස වෙශධර වැ මැවී ගිය විදුලියක් සේ යැ. **බ්‍රහ්මචාරී වූ ගෙනා** — ('බ්‍රහ්මචරිය ගෙනැ' යනු මුද්‍රණ දොෂ සි.) බ්‍රහ්මචාරියකු වී. බඹ සර වස් රකින්නකු වී. බ්‍රහ්ම වූ (උත්තම වූ) චරියාව (හැසිරීම) යමක්හු ගේ ද හේ බ්‍රහ්මචාරී සි. **අවයව සම්පන්න වූ** — හිස් අත් පා ආදි අඞගයන් ගෙන් යුක්ත වැ. දෙව් දුනු කලඹ මෙ බඳු අවයව ඇත්තේ නො වේ. බ්‍රහ්මචාරී වීමේ විපාක වශයෙන් මෙ සේ වී. **දෙව් දුනු කලඹක්** — දෙව් දුනු කලාපයක් (මිටියක්.) **ස්ථානෝචිත වින්‍යාසයෙන්** — (නිල සුදුසු තැනට නිල යැ, රත සුදුසු තැනට රත යැ යනාදි වශයෙන්) තැනට සුදුසු යෙදීමෙන්. **එකතැන් වූ** — එකස්ථාන වැ. එකතු වැ. **කාලාකාල විභාගයක් නො කොට** — (ඍතු වශයෙන් හෝ දිවාරාත්‍රී වශයෙන් හෝ "මේ අසුවල් මල නැති කලැ. අසුවල් මල දවල් නො පිපෙයි" යනාදීන්) කාල යැ අකාල යැ යන බෙදීමක් නො කොටැ. **හැනී** — මිශ්‍ර වී. **නානා විචිත්‍ර වූ** — සවර්ණ කර්මයෙන් විසිතුරු වූ. **සනතාන සනතද්ධ වූ** — සනතානය

ලා ගෙනැ. සම් + නශ් + අ. මොනොවට නහනය (සිරුරු වැසීම) එයින් කැරේ තු සි 'සන්නාහ' නම්. වර්මය සි. යුද්ධයෙහි දී ශරීර රක්ෂණය පිණිස ලන අයෝමය හෝ චර්මමය හෝ වූ ඇඳුම සි. සම් + නහ් + ත = සන්නද්ධ. මොනොවට හඳනා ලද (වසන ලද) **ඓරාවණ**— ශක්‍රයා ගේ ඇතා. හේ 'ඓරාවණ' නමුදු වෙයි. **මත් වූ**— ප්‍රීත වූ. **ආකාශස්ථ**— අහස්හි සිටුනා. ආකාශයෙහි වූ විමන්හි වසන්නාහු ආකාශස්ථයෝ යැ. **භූමිස්ථ**— භූමියෙහි විමානයන් වසන්නාහු භූමිස්ථයෝ යැ. **එක පැහැර**— එක් විටැ. **එක සේ එ සා**— එ තරම්. **මාර්ග සංස්කරණයෙහි**— මඟ සකස් කිරීමෙහි. **යුගාන්ත වාත ප්‍රහාරයෙන්**— (යුග + අන්ත) කල්පාය කෙළවර (ලොව නසන්නට ඇති වන) වාතයා ගේ පහරින් (වාතය වැදීමෙන්.) **දෛව**— භාග්‍ය. වාසනා. පින්. දෙවියන් කෙරෙන් ආයේ දෛව සි. දෙව + අ දෙවියන් ගේ අනුග්‍රහයෙන් වැඩ සිදු කැර ගන්නට බැලුවන් ගේ මේ ව්‍යවහාර සි **මාර්ග ඥාන සලිල ධාරා ක්ෂාලිත වූ ක්ලේශ පඞ්ක ඇති**— (සතර) මාර්ගයෙහි පැවැති නුවණ නමැති ජල ධාරායෙන් සෝදා හරින ලද කෙලෙස් නමැති මඩ ඇති. ක්ෂල් + ඉ + ත. 'ක්ෂල්' සේදීමෙහි ධාතු සි. එයින් කෙලෙසේ නුසි ක්ලේශ නම්. ක්ලිශ් + අ. **අනන්‍ය සාධාරණ වූ**— අන්‍යයන් හා සාධාරණ (සමාන) වූයේ අන්‍යසාධාරණ සි. න + අන්‍යසාධාරණ. අන්‍යසාධාරණ නො වූයේ අනන්‍යසාධාරණ සි. **ප්‍රවර්තනයෙන්**— පැවැත්වීමෙන්. ප්‍ර + වෘත් + අන = ප්‍රවර්තන. 'වෘත්' (වැටීමෙහි, පැවැත්මෙහි) ධාතු සි. 'අන' යනු භාවයෙහි ප්‍රත්‍යය සි. මෙහි ධර්ම චක්‍ර ප්‍රවර්තනය නම් දහම් සක පෙරළීම සි, ධර්ම චක්‍ර සූත්‍රය දෙසීම සි. **විශ්ව ලෝක මනස්සන්තර්පණය**— සකල ලොකයා ගේ සිත් සැතැප්පීම (සැනැසීම.) **සම්පාදනා**— සැපැයීමෙහි. **අනිරූපිතපූර්ව**— නො දක්නා ලදවිරූ. නි + රූප් + ඉ + ත = නිරූපිත. 'දක්නා ලද' යනු අර්ථ සි. 'රූප්' (දර්ශනයෙහි) ධාතු සි. **රූපාමෘත රසාස්වාදනයෙන්**— රූප නමැති අමෘත රසය විඳීමෙන්. **අශ්‍රුතපූර්ව**— නො ඇසූවිරූ. ශ්‍රැ + ත = ශ්‍රැත. අසන ලද. 'ශ්‍රැ' (ඇසීමෙහි) ධාතු සි. **සියලු සන්තෝෂ තාක්**— ඇති තාක් (තරම්) සියලු සන්තෝෂ. **මහත් සේ යැ**— මහත් සැටි යැ. මහත් වුවා වැන්නැ. **තන් ලද්දෙහි**-- තන් ලැබූ බවෙහි. ලද් + එහි = ලද්දෙහි. 'ලදුයෙහි' යනු ද සාධු සි. **ජන්මලාභ**—

උත්පත්තිය ලැබීම. **අනුසස්**— ඉෂ්ට ඵල. බලය. **නිශ්ශේෂයෙන්**— ඉතිරි නො කොටැ. සම්පූර්ණ වශයෙන්. **බාධා**— පීඩා. දුක්. **සන්නද්ධ වූ**— සැරැසී. යුද්ධයට සැරැසුණේ සන්නද්ධ වූයේ නමැ. සෙසු තන්හි ද 'සන්නද්ධ' යනු සැරැසීම් අර්ථය දෙයි. **පෙලැඹී**— එල්බී. අත් නො හැරැ. **බිම් හැපිලිසා වූ**— දුරු වැ. නො පෙනී. මේ ග්‍රාමීණ ව්‍යවහාරයෙහි ද එයි. උත්පත්ති විනාශ ය සි. **මෙ තෙකින් වඩා**— මෙ පමණට වැඩී. "බුදුනු උපන් හ, මිණ වඳුරමින් සිටිය හ, මෙ තෙනට වඩිමින් සිටිය හ" යනාදි වූ බසට (වචනයට) වැඩි. **උපස්ථාන**— උවටැන්. ළඟැ සිටැ රිසි දැනැ සපයා දීම් ආදිය උපස්ථාන සි. උප + ස්ථා + අන. 'උප' යනු සමීපාර්ථයෙහි උපසර්ග සි. 'ස්ථා' යනු සිටීමෙහි ධාතු සි. **ඉඳි කොටැ**— සදා. **සලිල ප්‍රවාහයෙන්**— දිය වතුරින්. නදින් බැස එන දිය පහරින්. **බිඳී**— හැරී. **වල වූ**—. වල ගැසී. **කන්දරක්**— කඳුරයක්. ගිරි ද්‍රෝණියක්. මැදූ හැරී ගිය දෙණි බිමක්. **පැලා**— දක්වා ලා. **සින්දුවාර**— නික. **අශගතයෙන්**— උත්සාහයක් නො කො මැ. නිකම් මැ. **ලඝු කොටැ**— අගරු සේ. **නිරන්තර**— (නිර් + අන්තර) අතරක් නැති. නො කඩ. **වතාවතා**— තවරතවරා කියමින්. **විඳැ විඳැ**— ඒ කියමනෙහි රසය විඳැ විඳැ. **පුළුන් පෙදක්**— පුළුන් රළක්.

**34. ප්‍රවාල සාගරයෙහි**— පබළු මුහුදෙහි. පබළු හෙයින් ඒ රතු වියැ යුතු. මේ බුදුන් ගේ සිවුර සඳහා කියැවිණ. බුදුහු මහ මෙර වැන්නෝ යැ. පෙරෙවැ සිටි සිවුර නිසා ඒ මෙර කුළ දක්වා පබළු සයුරෙහි ගැලුණා වැන්නැ. **කුළ දක්වා**— (මෙරෙහි) කූටය (මුදුන) ඉතිරි කොටැ. 'දක්වා' යන්නෙහි අර්ථය 'පෙනෙන්නට හැරැ යනු' සි. **කර**— ග්‍රීවාව. ගෙල. **රතිඳු ගොච්චන්**— රක්ත වර්ණ වූ ඉන්ද්‍ර ගෝපකයන්. 'රතිඳු ගොවු' යනු ඉතා රතු කීට විශේෂයෙකි. **තථාගතෝචිත**— (තථාගත + උචිත) බුදුනට සුදුසු වූ. **වර**— උතුම්. **ශ්‍රීමත්**— ශෝභාවත්. ශ්‍රී ඇතියේ ශ්‍රීමත්, 'මත්' යනු අස්ත්‍යර්ථයෙහි තද්ධිත ප්‍රත්‍යයෙකි. 'ඉ' හෝ 'උ' හෝ නො වන්නා වූ ස්වරයෙකින් පර කල්හි මේ ප්‍රත්‍යය 'වත්' වෙයි. **ධීමත්**— බුද්ධිමත්. 'ධී' යනු බුද්ධියට (ප්‍රඥාවට) නමි. **ශාන්ත**— සන්සිඳුණා වූ. ශම් + ත = ශාන්ත. 'ශම්' (ශමනයෙහි) ධාතු සි. 'අ' දීර්ඝ වෙයි. **දාන්ත**— දමුණා වූ. දමනය කළ ඉඳුරන් ඇති. දම් + ත. 'දම්' (දමනයෙහි) ධාතු සි. **සන්තුෂ්ට**— සතුටු. සම් + තුෂ් + ත. 'තුෂ්'

(තොස්හි) ධාතු සි. **විනීත**— හික්මුණු. වි + නී + ත. 'නී' (ශාසනයෙහි) ධාතු සි 'විනය' යනු නිපදිනුයේ මේ 'වි' පූර්ව 'නී' ධාතුයෙනි. **ශීල සම්පන්න**— ශීලයෙන් (ශොභනාචාරයෙන්) යුත්. **සමාධි**— චිත්තෛකාග්‍රතාව. සිත එකඟ බව. **චතුරාශ්‍රව ප්‍රතිපක්ෂ**— සතර ආශ්‍රවයට විරුද්ධ (විපක්ෂ, සතුරු.) කාම, භව, දෘෂ්ටි, අවිද්‍යා යන සතර ආශ්‍රව නමි. **ශීලස්කන්ධාදි**— (ස්කන්ධ + ආදි) සිල් කඳු (සමූහ) ආදි වූ. **පරම**— උත්කෘෂ්ට. **ගුණ ගණාන්වෙෂණයෙහි**— (ගණ + අන්වෙෂණ) ගුණ සමූහයන් සෙවීමෙහි. අනු + ඉෂ් + අන = අන්වෙෂණ. 'ඉෂ්' (කැමැතිවීමෙහි) ධාතු සි. **ප්‍රවීණ**— දක්ෂ. නිපුණ. **අනුගීත නිජ කීර්ති ශ්‍රවණ ව්‍යග්‍ර ත්‍රිභුවන ජනොපජන්‍යමාන සාධුකාර ශත සහස්‍ර ඇති**— අනු කොටැ ගායනය කරන ලද ස්වකීය කීර්තිය ඇසීමෙහි ඇලුණා වූ තුන් ලොව ජනයා විසින් උපදවනු ලබන සාධුකාර සිය දහස් ඇති. මේ කියැවෙන ක්ෂීණාශ්‍රවයන් ගේ කීර්තියට අනු වැ (කීර්තිය මාතෘකා කොටැ ගෙනැ බඳනා ලද ගී) ගායනය කරනු ඇසීමෙහි තුන් ලෝ වැස්සෝ ඉතා ශක්තයෝ යැ. ඔහු ඒ ගී අසා සාධුකාර සිය දහස් ගණන් උපදවති (නගති.) අනු + ගෛ + ත = අනුගීත. 'ගෛ' ගායනයෙහි ධාතු සි. උප + ජන් + ය + මාන = උපජන්‍යමාන. 'ජන්' ඉපදීමෙහි ධාතු සි. **ප්‍රතිෂිද්ධ වූ පුනර්භව ප්‍රතිසන්ධි ඇති**— වළක්වන ලද (නවතන ලද) යළි භවයෙහි පිළිසිඳීම් ඇති. සත්ත්වයෝ භවයෙහි පුනපුනා නැවැතැ නැවැත ප්‍රතිසන්ධි ගනිති. එ හෙත් මේ ක්ෂීණාශ්‍රවයෝ පුනර්භවයෙහි ප්‍රතිසන්ධිය ප්‍රතිෂෙධ කළා හු යැ, වැළැක්කුවා හු යැ. රහත් මඟින් මැ එය කැරෙන හෙයිනි. ප්‍රති + සිධ් + ත = ප්‍රතිෂිද්ධ. 'සිධ්' වැළැකීමෙහි ධාතු සි. භූ + අ = භව. වීම. ''භූ' වීමෙහි ධාතු සි. **ක්ෂීණාශ්‍රවයන්**— රහතුන්. යමක්හු විසින් ආශ්‍රවයෝ ක්ෂීණයෝ ද (නසන ලද්දාහු ද) හේ ක්ෂීණාශ්‍රව සි. **වීතරාග**— වීත වූ රාගය යමකු දු හේ වීතරාග. වී + ත = වීත. 'වී' (නැසීමෙහි) ධාතු සි. **අද්වෙෂී**— ද්වෙෂ නැති. ද්වෙෂ ඇතියේ (ද්වෙෂ + ඉන්) ද්වෙෂින්. න ද්වෙෂී අද්වෙෂී. **අමොහී** මොහ නැති. මොහ (මුළාබව) ඇතියේ (මොහ + ඉන්) මොහින්. **විමුක්ත**— (කෙලෙසුන් ගෙන්) මිදුණු. වි + මුච් + ත. 'මුච්' (මිදීමෙහි) ධාතු සි. **ශුද්ධ** — (ශුධ් + ත) 'ශුධ්' (පිරිසුදු වීමෙහි) ධාතු සි. **ධීර**— ස්ථිර. නො පසු බස්නේ- ස්ථිර වැ සිටිනුයේ- ධීර සි. **කාරුණික**— කරුණා ඇති. **දක්ෂිණීය**— දක්ෂිණාවට

(දානයට සුදුසු.) දක්ෂිණා + ඊය. **ආරාධනීය**— ආරාධනය කළ යුතු. ආ + රාධ් + අනීය. 'රාධ්' (පැහැදවීමෙහි) ධාතු යි. **මානනීය**— බුහුමන් කළ යුතු. මාන් + අනීය. 'මාන්' පිදීමෙහි ධාතු යි. **වන්දනීය**— (වන්ද් + අනීය) වැඳිය යුතු. **අමානී**— (න + මානී) මාන නැති. මාන ඇත්තේ (මාන + ඉන්) මානින්. **භාවනීය**— සිත්හි ලා (එකඟ කොට) වැඩිය යුතු. භාවනාවට අරමුණු කළ යුතු. **ශරණාගී**— (ශරණ + අගී) ශරණයට (පිහිට කොට ගැනීමට) සුදුසු. **ගම්භීර**— ගැඹුරු. ගුණාදියෙනි. **ස්මරණීය**— සිහි කළ යුතු. 'ස්මෘ' (සිහිවිල්ලෙහි) + අනීය. **ශ්‍රමණීය** – ("අනුන් විසින් ගුරු කමට ගෙන මා විසිනුදු මෙ බඳු විය යුතු යැ"යි) ශ්‍රම කළ යුතු. (එ බඳු වන්නට) උත්සාහ කළ යුතු. 'ශ්‍රම්' (ශ්‍රමයෙහි) + අනීය. **රමණීය**—ඇල්ම කළ යුතු. රම් (ඇලීමෙහි) + අනීය. **අවිසංවාදි වූ**—('අවිසංවාද' යනු මුද්‍රණ දොෂ යි.) විසංවාදි නො වී. 'සංවාද' නම් මනා සේ කීම යි. සම් + වද් (කීමෙහි) + අ. 'විසංවාද' නම් ක්‍රියායෙහි දී විරුද්ධ වන්නා වූ (සිඳිනු ලබන්නා වූ) සංවාද යි. හැකෙවින්, එකක් කියා නො කැර හැරීම විසංවාද නමි. විසංවාද ඇත්තේ (විසංවාද + ඉන්) විසංවාදී යි. න විසංවාදි (විසංවාදී නො වනුයේ) **අවිසංවාදි** යැ. **සුප්‍රතිපන්න**— මනා සේ පිළිපදනේ. සු + ප්‍රති + පද් (පැමිණීමෙහි) + ත = සුප්‍රතිපන්න. **සම්පූර්ණ වූ**— සමෘද්ධියට (සිද්ධ වීමට) පැමිණියා වූ. **මනොරථ**— අභිලාෂ. **උසාභ**— නගා ගෙනැ. **සමස්ත**— සියලු. **ප්‍රසව**— ඉපැදීම. ප්‍ර + සූ (ඉපැදීමෙහි) + අ. **සුහුසුලු**— ශීඝ්‍රශීලි. **ඉක්මන්**. **පහණ**— පාෂාණ. ගල්. **සකුරු**— ශර්කරා. කුඩා ගල් කැට. **පෑනිපෑනී**— පෙනෙමින්. **නෘත්‍ය- ගීත- වාද්‍යයෙන්**— නැටුමෙන්, ගැයුමෙන්, (තූර්‍ය) වාදනයෙන්. නැටියැ යුතු නෘත්‍ය යි. 'නෘත්' (නැටුම්හි) + ය. ගයන ලද්දේ ගීත යි. ගෛ + ත. වැයියැ යුතු වාද්‍ය යි. වාද් + ය. **අකනිට්ඨා**— අකනිට්ඨ නම් බ්‍රහ්ම ලොකය. අනන්තිම බ්‍රහ්ම ලොකය. **ෂඩ්වර්ණ**— පඤ්ච වර්ණය ද ස වැන්න වූ ප්‍රභාස්වරය ද ගත් කලැ ෂඩ්වර්ණ යි. සියලු වර්ණ එක් වීමෙන් නිපන්නේ ප්‍රභාස්වර නමි.

**35.** **අපරිමිත**— ('මෙ තෙකැ'යි) ප්‍රමාණ නො කරන ලද. න පරිමිත අපරිමිත. පරි + 'මා' (මිනුම්හි) + ත. භාත්පසින් මනනා ලද. **විලාසයෙන්**— ශොභායෙන්.

**අශ්‍රාන්ත**— නො නැවැති. **පෙළෑ ගි**— පෙළට වැටී. **ක්ෂීණාශ්‍රව පුත්‍රයනට**— සඞ්ඝයා බුදුනට පුත්‍ර නම් වෙත්. එ හෙයින් මෙ සේ කියැවිණ. **නෙත්‍ර නමැති නාටකයන් නටන්නා වූ රඟ මඬලක් බඳු**— ලොකවාසීන් ගේ නෙත්‍රයෝ (ඇස්) නාටකයෝ (නැටුම් කරුවෝ) වෙත් නම්, ඒ නාටකයන් නටන්නා වූ රඟ මඬල (නැටුම් බිම) ඒ බුදුන් ගේ රූපය යි. සියලු ලොකවාසීන් එ දෙස මැ බලන බව මේ හී සැටි යැ. **මසිඳ්**— මාත්. මා + දු = මා + සිදු = මසිදු. දීර්ඝ ස්වරයෙන් පර වැ 'දු' නිපාතය යෙදුණු කලැ මධ්‍යයෙහි 'සි' ආගම සි. 'සි' පර කලැ පූර්ව හ්‍රස්වය සි. **කේශාන්තයෙහි**— (කේශ + අන්ත.... .........) හිස් මුදුනෙහි. **නඛාන්තය**— (නඛ + අන්තය.) (පයෙහි) නිය කෙළවර. සකල ශරීරය මේ ගත් සැටි යැ. **ගිවී**— පැතිරී. 'ගිව' (පැතිරීමෙහි) ධාතුව 'බල' ආදි පර පද සි. (කතු කරු) ගිවා- ගිවති- ගිවී- ගිවූ. (කම් කරු) ගිවේ- ගිවෙති- ගිවිණි- ගිවුණු **රුචිරතර**— ඉතා සිත් කලු වූ. **සඳිඳ විභ්‍රමයෙන්**— බුද්ධ ශොභායෙන්. **වාග්විෂයාතික්‍රාන්ත**— වචන ශක්තිය (කියා නිමැවීමට හැකි බව) ඉක්මැ සිටියා වූ. වචනයෙන් නො කියැ හැකි. අති + ක්‍රම් (පිය තැබීමෙහි) + ත. **උපමා විෂය**— සමාන වස්තු දක්වීමේ ශක්තිය. **මනොවිෂය**— සිතීමේ ශක්තිය. **ලොක විෂය**— ලොකයෙහි ශක්තිය. ඒ බුද්ධ ශ්‍රීය ලොකයෙහි කිසිවකු විසින් කියා නො නිමැවියැ හැකි යැ. එයට සමාන වන්නක් නො සෙවියැ. හැකි යැ. එය සිතා නො නිමැවියැ හැකි යැ. **හුදක් බුද්ධ විෂයයට මැ**— කෙවල බුද්ධ ශක්තියට මැ. බුදුන් ගේ ශක්තියට පමණක් මැ. **සම තිස් පැරුමන් ගේ**— සම්පූර්ණ තිසක් වූ පාරමිතාවන් ගේ. පැරුම් දසයෙකි. දාන පාරමී, දාන උප පාරමී, දාන පරමත්ථ පාරමී යැ යි දාන පාරමිතාව තුනට බෙදේ. මෙ සේ සෙස්ස ද එක එක තුනට තුනට බෙදුණු කල්හි සම තිස පිරෙයි. **අත් මෙහෙයට මැ**— හස්ත කර්මාන්තයට මැ. බුදු රුව සම තිස් පැරුමින් ගේ හස්ත කර්මාන්තයක් වැන්නැ. එ තරම් සර්ව සම්පූර්ණ වූ මනොහර රූපයක් පැරුමන් විසින් මැ මුත් අන් කිසිවකුන් විසින් නො කළ හැකි සේ හැඟැවිණි. **සක්බුමු**— සප්ත භූමක. සත් පෙළක් පෙති ඇති. **කනක පද්මයක්**— රන් පියුමක්. **විශිෂ්ට ශොභා භ්‍රාජිත වැ**— උතුම් වූ ශොභාවට පැමිණැ (ශොභා ඇති වැ.) **ඉපිලී**— ('ඉපිළී' යනු මුද්‍රණ දෝෂ සි.) දිය මතු පිට පා වී.

ඉල්පි. 'උපුල්' ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. පුරාතන ව්‍යවහාරය ඉපිලේ- ඉපිලෙති- යනාදිය වුව ද ඉල්පේ- ඉල්පෙති- යනාදි වර්තමාන ව්‍යවහාරයෙහි වර්ණ විපර්යාසයෙක් පැනේ. **බුදු රූ සඬරූ**— බුද්ධ රූපය නමැති තැගි. **සතුටු කඳුළු උවදෙස් දෙමින්**— බුදු රූ දුටුවවුන් ගේ ඇසින් සතුටු කඳුළු නික්මෙයි. ඉතින් ඒ සතුටු කඳුළු නික්මෙන්නට උපදෙශ දුන්නේ කවරෙක් ද? බුදු රුව යි. **ලොමුදහ ගැන්මට එකාචාරී වෙමින්**— (ලොම් + උදහ; එක + ආචාරී) බුදු රුව දුටුවවුන් ගේ රෝමොද්ගමය වෙයි. (ලොම් කෙළින් වැ සිටී.) එසේ වීමට උවදෙස් දෙමින් අසහාය ආචාරී වූයේ කවරෙක් ද? බුදු රුව යි. **ඉපිලෙන**— ('ඉපිරෙන' යනු මුද්‍රණ දෝෂ යි.) ඉල්පෙන්නා වූ. **චාමර**— සෙමෙර. වල් විදුනා. **තල් වට**— වටා පත්. විජිනි පත්. **රන් සැන**— විතාන යි. පැන් පුරා ලූ බඳුන් වෙසෙසෙකැ යි හැඟේ. **පූජෝපකරණ** - පූජා + උපකරණ. පූජා වස්තු. **උනැනි කොමැ**— උත්තාන කොමැ. නො ගැඹුරු කොමැ. **පුළුන් පෙදක්**— පුළුන් රළක්. **ගුරුත්වයක්**— ගුරු බවක්. බර බවක්. **මහාත්ම තමක්**— උදාර භාවයක්. **සුයාම සනතුෂිත ආදීන් ගේ**— සුයාම සන්තුෂිත ආදි දෙවියන් ගේ. **සෞභාග්‍යය**— සුභග බව. සුන්දර බව. **අරුචි උපදවන පරිද්දෙන්**— දෙවියන් ගේ සෞන්දර්යයට සිය දහස් ගුණයෙන් වඩනා සෞන්දර්යය බුදු රුවෙහි ඇති බැවින් මෙය ඇති කලැ එය අරුචි උපදවනු වෙයි. **මැඩූ**— යටත් කොමැ. **ගබා**— තබා. සපයි කොමැ. **පුෂ්පාඤ්ජලී**— මල් ඇඳිලි. මල් දෝත්. **විදූහි**— විදහන ලදු වැ. **වැනී**— පැතිරී. "අවුවේ වී වතා" යනාදි තන්හි මෙන් 'වත' ධාතු මෙ තන්හි මේ අර්ථයෙහි වෙයි. **අඳුන් දිව් සම්**— අජින ද්වීපි චම්. ශයනාසනාදිය පිණිස ද ශරීරාවරණ පිණිස ද ගැනෙන මුව සම අජින නම්. ඇතැම් විටැ දිවි සම ද මේ සඳහා ගැනේ. සංස්කෘතයෙහි එයට ද අජින නාමය වේ. මෙහි දෙකක් සේ සැලැකිණ. **වාක චීවර**— වැහිරි සිවුරු. වල්කල වස්ත්‍ර.

**36.** (මෙයිනුදු 37 වන ඡේදයෙනුදු කියැවෙනුයේ දහම් සරණ කතෘන් ගේ සිතිවිලි යි.) **එ පැ**— ඒ පැවා වූ (පෙන් වූ) **සසරට පැ පිට මෑ යෑ**— යමකට පිට පෑම නම් එය හැරැ යෑම යි. සසර හැරැ යන්නට වූ බව මෙයින් හැඟැවිණ. බුදු **වන්නවුන්**— මේ සුමේධයන් සඳහා කියැවිණ. **මා**—

මේ කියන "දහම් සරණ" කතිකාත්. **පිනැති කලැ**— පින් ඇති හෙයින්. **මා තුමෙඩහි බුදු ගුණ වැකුණ මනා කලැ**— මා විසින් බුදු ගුණ කියුව මනා හෙයින්. **මා දසාවට**— මා දෙසට **ධර්ම කථිකයන්**— බණ කියන්නන්. **ඔහු**— ඒ සුමේධයෝ. **හොත්තු**— හොත්හු. **තමා ළය**— මා ගේ ළය. සුමේධයෝ ළය බිම ගහා බුදුනට දිවි පුදා හොත්තු ල. එ සේ වූ සුමේධයන් මම මා ගේ ළය බිම ගහා නො වදිම් නම්. **ළ දැඩි කමෙකි නිමාමෙකැ**— ළය (සිත) දැඩි බවෙහි අන්තිම ප්‍රමාණයේ මහත් බවෙකැ. එයට වඩා ළ දැඩි කමක් ඇති වියැ නො හේ. **ලෑහේ ද**— ලං වේ ද? ඔහු **ගේ ගෙ දෙරැ**— ගෙ දොර කප් රුක් වේ නම් අභිමතාර්ථ සිද්ධියෙන් අඩුවෙක් නැත්? සුමේධයන් වැන්නවුන් සිහි කිරීම මැ සකලාභිමතාර්ථ සාධනයෙහි සමර්ථ බව මෙසින් හැඟැවිණ. **පෙරළා වැන්දෙ**— නැවැතැ නැවැතැ වැන්දේ. **පිටු වහල්**— පිටු පසැ සිටැ කරන උපකාර. යම් ක්‍රියාවෙකැ යෙදෙන්නකුට පිටු පසින් සිටැ දෙන වහල් ඉතා ප්‍රයොජනවත් යැ. වෙහෙසුණු කලැ වහල ලැබෙ මැ යැ. එ හෙයින් කායික නො නැසේ. **පලා බත්**— මාර්ගෝපකරණ. මඟැ දී කන්නට ගෙනැ යන පලා මුසු බත් පලා බත් යැ. නිවන් යන කලැ ජාතිජාතියෙහි තමන් ගේ පිටු වහලට පින් වුව මනා යැ. එ සඳහා සුමේධයන් වැන්නවුන් සිහි කිරීම මැ ප්‍රමාණ වෙසි. ඒ එ තරම් පිනෙකි. **හෑමෙඩ**— ප්‍රමාණ වේ. සෑහේ.

"ඇඹෙසි මට මෙතෙකින්"

යනු ගුත්තිල දැ බසි.

**37. සහභක්ති බව**— භක්ති සහිත බව. **නියත**— අව්‍යාජ. නිබොරු. **මා ගේ සාමින්**— මේ රජ කුලය සඳහා කියැවිණ. දහම් සරණ කාරයෝ රජ සෙවය කළ කෙනෙක් වූ හ. එ හෙයින් මෙහි ස්වකීය ස්වාමීන් විශේෂයෙන් සඳහන් කෙරෙති. **අනන්තාපරිමාණ**— (අනන්ත + අපරිමාණ) කෙළවරක් නැති. පරිමාණයක් නැති. අන්තයක් නො වනුයේ යමෙක්හි ද ඒ අනන්ත (න + අන්ත) සි. පරිමාණයක් (හාත්පසින් මිනුමක්, ගණනක්) නො වනුයේ යමෙක්හි ද ඒ අපරිමාණ සි. දෙකෙහි අරුත්හි වෙනසෙක් නැති. කවර දෙසින් වුව ද ඇති සක්වළවලැ ගණනෙක් නම් නැත් මැ යැ. **නීරොග**— නො ලෙඩ. රොගයෙන් නිෂ්ක්‍රාන්ත වූයේ නීරොග සි. **නිර් + රොග**. 'ර' කාරයක් පර කලැ පූර්ව 'ර' කාරය ලොප් වෙසි.

ලොප් වූ 'ර'කාරයෙන් පූර්ව වූ ස්වරය දීර්ඝ වෙයි. නිර් + රස= නීරස. නිර් + රන්ධ්‍ර= නීරන්ධ්‍ර. නිරොග- නිරස- යනාදිය සංස්කෘතයෙහි නො ලැබේ. **කුසිනාරා යම සලැ**— කුසිනාරා නුවර යමක ශාලයෙහි. යම (යමක) නම් දෙක සි. 'සල්' යනු ශාල වෘක්ෂයට (සල් ගසට) නමි. බුදුන් පිරිනිවන් පාන්නට වැදූ හොත් යහන පනවන ලද්දේ සල් ගස් දෙකක් අතරෙහි යැ. **වැඩැ හෝනා**— ශයනය කරන. 'වැඩැ' යනු හුදක් ගෞරව පිණිස යෙදිණ. **දෑතුරෙහි**— දෙ + අතුරෙහි. 'එ+අ' දෙකට 'ඈ' ආදෙශ වෙයි. **සදහම් කම්යෙහි**— සත්ත්වයාට සද්ධර්මය අවබොධ කැරැවීමට කළ කටයුතු සද්ධර්ම කම් සි. **හඬනා සත්ත්වයා**— ජාති ජරා ව්‍යාධි මරණ ආදි සසර දුකින් පෙළී හඬන්නා වූ. ලොකයා **වැහෙනා**— ගලන. **දළ සෝ කඳුළු**— දෘඪ ශොක වාෂ්පය. මහත් ශොකයෙන් ඇති වන කඳුළු. **සෙහෙන්**— සුව සේ. අනායාසයෙන්. **වාසනා වේ වා**— බුදුන් දුටු සුමෙධයනට යම් පමණ සතුටෙක් වී ද, තමතමන් ගෙ දොර මිදුලෙහි නැයන් දුටු ජනයනට ද එ තරම් මැ සතුටෙක් වේ වා. බුදුන් දැකැ සතුටු වූ සුමෙධයන් ගේ පුණ්‍ය මහිමයෙන් එ තරම් මැ සතුටෙක් බුදුන් නුදුටු සත්ත්වයනට ද වේ වයි කී සේ සි. **කලඞ්කයක්**— කැළැලක්. දොෂයක්. **බුද්ධ ගත ප්‍රසාදයෙන්**— බුදුන් කෙරෙහි වූ පැහැදීමෙන්. ගම් + ත=ගත. 'ගියා වූ' යනු අර්ථ සි. බුදුනට ගියේ බුද්ධගත සි. **ඔවුන් ගේ**— ඒ බුදුන් ගේ. **ඉෂ්ටාර්ථ සිද්ධියට**— (ඉෂ්ට + අර්ථ) අභිමතාර්ථය සිදු වීමට. 'ඉෂ්' (කැමැති වීමෙහි) + ත= ඉෂ්ට. සිධ් + ති= සිද්ධි. 'සිධ්' (සිදු වීමෙහි) ධාතු සි. අතීත භාවයෙහි 'ති' කෘදන්ත ප්‍රත්‍යය සි. 'සිද්ධි' නම් සිදු වූ බව සි සිදු වීම සි.

**39. සඞ්ඝ නවක වැ**—ශ්‍රමණ ගණයා අතුරෙහි අභිනව වැ. (බාල වැ.) අලුතැ උපසම්පන්න වූයේ නවක නමි. 'සඞ්ඝ' යනු සමූහය යන අර්ථ ඇත්තේ යැ. සමූහ වැ, ගණ වැ, නො බෙදී ඉන්නා හෙයින් බුද්ධ පුත්‍රයනට 'සඞ්ඝ' යනු නමි. **අග්‍ර දක්ෂිණීය වැ**— උත්තම වූ දක්ෂිණාර්හ වැ. දක්ෂිණාවට- දානයට සුදුසු වූයේ දක්ෂිණීය සි. **තොරා**— 'තනි වැ' යන අර්ථයෙහි යෙදිණ. සුමෙධයෝ අසඞ්ඛ්‍ය වූ සත්ත්වයන් නිවන් යවන්නට සමර්ථයෝ යැ. එ සේ වුවකු තමන් ගැනැ මැ සලකා තනි වැ නිවන් යෑම සුදුසු නො වේ. **හුදෙකලා වැ**— (හුදු + එකලා) අත්‍යර්ථයෙන් (සම්පූර්ණ වශයෙන්) මැ තනි වැ. **ගත දී**— 'ගත්' යනු මුද්‍රණ දොෂ සි.) ගන්නට හැරැ. 'ගත' යනු අසම්භාව්‍ය කෘදන්ත නිපාත සි. ගත් + අ = ගතු + අ = ගත.

**නිෂ්කරුණයෝ**— ('නිෂ්කාරුණිකයෝ' යනු මුද්‍රණ දෝෂ යි.) කරුණා රහිතයෝ. කරුණායෙන් නිෂ්ක්‍රාන්ත වූයේ නිෂ්කරුණ යි. 'නිෂ්කාරුණික' යනු 'කරුණා ඇත්තවුන් කෙරෙන් නොර වූ' යන අර්ථය දෙයි. **ළ දැඩියෝ**— ළය (හෘදයය, සිත) දැඩි (තද) වූවෝ. **නො පිරිමි වූවෝ**— පෞරුෂය (පුරුෂ වීර්‍යය) නැති වූවෝ. **ආත්ම සෙනහයට ගැති වූවෝ**— තමාට මැ ඇති ආදරයට දාස වූවෝ. **දීඝ දර්ශි නො වන්නෝ**— දුරින් දැකීම් ඇති නො වන්නෝ. දුරින් නො දකින්නෝ කල් තබා මැ සිදු වන දෑ දක්නෝ- සිදු වන දෑ ගැනැ කල්පනා කරන්නෝ- 'දීඝදර්ශි' නම් වෙති. **දරුවනට වළහා**— දරුවන් ගෙන් සඟවා. දරුවනට නො දී. **අමා**— අමෘතය. ප්‍රණීතාහාරය. **නො දක් වන් වූවෝ**— දුටු ද නො දන්නාක් මෙන් වූවෝ. **සායෙහි**— සාගතයෙහි. දුර්භික්ෂයෙහි. **මිහිරෙක්** – මධුරයෙක්. මිහිරි දෙයෙක්. **අවීරත්වයෙක්**— වීර නො වන බවෙක්. ආත්මාර්ථය වඩා පරාර්ථය බලන්නේ වීර නම් වෙයි. **අශූරත්වයෙක්**— ශූර (දක්ෂ) නො වන බවෙක්. **නිමග්න වූ**— ගැලුණා වූ. නි+මජ්+ත= නිමග්න. 'මජ්' ගැලීමෙහි ධාතු යි. **පෙරැ මැ**— පූර්වයෙහි මැ. **ධ්‍යානාභිඥාදි ගුණ සම්පත්තිය යැ**— (ප්‍රථම ධ්‍යානාදි) ධ්‍යාන යැ (පඤ්ච) අභිඥා යැ යනාදි ගුණ සමෘද්ධිය යැ. **අෂ්ට ධර්ම සමවධානයෙන්**— ධර්මයන් අට දෙනා එක් තැන් වීමෙන් (එකතු වීමෙන්.) "මිනිස් බව යැ" යනාදීන් කියැවුණාහු ඒ අෂ්ට ධර්මයෝ යැ. පළමු කොටැ මැ බුදු බව පතන්නහුට මේ අට එක් වියැ යුතු. **සංසිද්ධ වන්නා වූ**— මනා සේ සිදු වන්නා වූ. **දෘඪ ග්‍රහණයෙන්**— දැඩි කොටැ සිතා ගැන්මෙන්. **එ දෑ තමන් වැදූ හොත් ඒ උදාර අධ්‍යාශයය**— යම් බඳු වූ උදාර (උසස්) අදහසෙකින් සුමේධයෝ තුමූ එ දෑ බුදුනට දිවි පුදා වැදූ හොතු ද, ඒ උදාර වූ අදහස. **රිස්සෙන්**— (රිසි+එන්) අචියෙන්. **අනුග්‍රහයෙන්**— ප්‍රසාදයෙන්. යම් කිසිවක්හු ගේ අභිමතය සිද්ධ කැරැ දීමට ඇති වන ඉච්ඡාව අනුග්‍රහ නම්. **මුහුකුරන**— මෝරන්නා වූ. **සිළිසඳ ගනුක්**— උපදුත්. උපදනා කල්හි. **දෙළ ගෙනැ**— ආශා කොටැ. **සනාද්ධ වූවාහු**—සැරැසුණාහු. **සසරට නො බැවු**— ('සසර' යනු මුද්‍රණ දෝෂ යි.) සංසාරයට භය නුවූවාහු. බැ+හු= බැවු= බැවු. 'බා' (බියෙහි) ධාතුයෙන් සිදු අතීත කෘදන්ත නාමය වූ 'බැ' යනු පෙර විබත් බුහු බස ගත් තැනි. **පර දුඃඛයෙහි දුඃඛිත වූවාහු**— අනුන් ගේ දුකෙහි (තමන් ගේ දුකෙහි මෙන්) දුක් ඇති වූවාහු. **නිෂ්කරුණයෙහි**—

කරුණා නැති තන්හි. **ආත්ම සුඛයෙහි**— තමන් ගේ සුවයෙහි. **අරුචි**— නො රිසි. අනුත්තම සුව එළැවීමෙහි ඔහු රුචි කළ හ. **ආභරණ**— සැරැසීම. අලඞ්කාර. **නාම කට**— ඒ තෘෂ්ණාවට. තෘෂ්ණාව සකල ලෝකය නාම කට ගැති (දාස) කෙළේ යැ. සුමේධයෝ ඒ තෘෂ්ණාව තමනට ගැති කළ හ. **හසින්නට** පිරිසුදු කරන්නට. මාර්ගයෙහි තණ පත් ආදිය හුදල්ලෙන් කපා හැරීම හැසීම යි. **එලෙන්නට**— එල්ලෙන්නට. **කුල දෙවි**— කුල දෙවතා. පුරුදු දෙවතා. කුලයා විසින් සිරිතක් වශයෙන් පුදනු ලබන දෙවි කුල දෙවි යි. **දෙ සැට දෘෂ්ටිසට**— මිථ්‍යා දෘෂ්ටි සැට දෙකට. බ්‍රහ්මජාල සූත්‍රය හෝ ධර්ම ප්‍රදීපිකාව හෝ බලා දත යුතු. **මාර සේනාවට**— මාරයා ගේ සෙනඟට. කාමාදි අකුශලයෝ මාරයා ගේ සේනාවෝ යැ. **ගබ්සා බෙහෙද්**— ගර්භය ක්ෂය කරන බෙහෙත්. දරු ගැබ වනසන (හෙලන) බෙහෙත්. ඉපැදීම වනුයේ තෘෂ්ණාව විසිනි. තෘෂ්ණාවට 'ගබ්සා බෙහෙද්' දුන හොත් ඉපැදීමෙක් නො වේ. **සත්ත්වානුග්‍රහ විද්‍යාවට**— සත්ත්වයනට අනුග්‍රහ කිරීමේ ශාස්ත්‍රයට. **ආචාර්ය කමට**— ඇදුරු බවට. "සත්ත්වානුග්‍රහ විද්‍යාව ලොවට උගන්වන්නට පමන් ගත්තාහු ද "නෙපි මැ යැ" යනු කී පරිදි යි. **නො පිරිහෙළන්නට**— නො කඩ කරන්නට.

**39.** **ඉන්ද්‍ර ජාලය**— ඇස් බැන්දුම. නැති දෑයක් ඇති සේ පෙන්වා රැවැටීම. **පිස්නට**— පිසැ දමන්නට. **නො හැකිළී**— නො මැලි වැ. පසු නො බැසැ. **නිරා දුකට පවා සිසිල් වැ සිටි**— නරක දුඃඛයෙහි දී පවා සිසිල් වැ සිටියා වූ. නරකය ඉතා උෂ්ණ යැ. එහි සිසිල් වැ සිටීම නො හැකි වේ. එ හෙත් සුමේධයෝ නරක දුඃඛයට ද සිසිල් වැ සිටිය හ. **හෙල් මැලි කලඹෙක්**— එළ මානෙල් (මල්) මිටියෙක්. 'කහ්ලාර' 'කුමුද' යනාදි නාමයන් ගෙන් ගැනුණේ ද මේ එළ මානෙල් යැ.

**40.** **ව්‍යර්ථ යැ**— නිෂ්ඵල යැ. අර්ථයෙන්- ඵලයෙන්- විගත වූයේ- තොර වූයේ- ව්‍යර්ථ යි. වි+අර්ථ. **බසැ**— බස් යැ. **කනැ හෙළහෙළා**— අසඅසා. **ශිෂ්‍යයෝ**— ශාසනය (ශික්ෂණය, හික්මැවීම) කළ යුත්තෝ ශිෂ්‍ය යි. ශාස්+ය. 'ශාස්' (ශාසනයෙහි) ධාතු යි.

**41.** **ගිලිහී**— මිදී. **පරනිර්මිත වශවර්ති**— දිව්‍ය ලෝක අතුරින් ස වැන්න මෙ නමි. **වඩනේ යැ**— වැඩි වන්නේ යැ. **සිහි කරන්නා කඩා**— සිහි කිරීම තිබියැ දී.

**42. අමා නමමින්**— අමෘතය වත් කෙරෙමින්. එ තරම් ප්‍රීත කෙරෙමින්. දීපඞ්කර බුදුන් ගේ නම සිහි කරන විටැ අද දක්වාත් මා ගේ සිතට අමෘතය වත් කරන්නා වැන්නැ. **කලල්**— මඩ. **කෙ පැලෑගි වී**— කෙ බඳු වී ද? 'පැලෑගි' යනු සදෘශ යන අර්ථ ඇත්තේ යැ. **හා**— ආශ්චර්ය සි.

**43. හිස් දෙරු**— හිස ළඟැ. 'හිස් දෙර' යනු 'ඉද්දර' යැ සි ග්‍රාමීණ ව්‍යවහාරයෙහි එයි. 'අස් දෙර' යනු 'අද්දර' යැ සි එන්නා මෙනි. **කැඳවා**— අමතා. බණවා. **පැ ලා**— දක්වා. 'පැ' යනු එක් පූර්ව ක්‍රියා නිපාතයෙකි. 'ලා' යනු 'ල' ලීමෙහි දයින් වූ අන්‍ය පූර්ව ක්‍රියා නිපාතයෙකි. **සාධාරණ**— සාමාන්‍ය. **සත් ලොවන්**— සත්ත්ව ලොකයන්. **අමා පිඬෙකැ**— අමෘත පිණ්ඩයෙක් යැ. **ජාති භෙදයෙන්**— ජාති වෙනස් වීමෙන්. නානාජාති වශයෙන්. **ගනුත්**— ගනිත් හොත්. ගන්නා කල්හි ද. ගන් + තු = ගන් + ඉ + තු = ගනිතු = ගනුතු. ගනුත්- ගනුත- යන රූපයෝ ද සාධුනු යැ. **භූෂණ කාරක වූ**— අලඞ්කාරය කරන්නා වූ. **ගඟ හෙළන**— ගඟ උපදවන්නා වූ (නික්මවන්නා වූ.) **තපස්වි වෙශ ධර වූ**— තාපස වෙශය දරන්නා වූ. **අනුවාත ප්‍රතිවාත විභාග නො කොටැ**— යටි සුළඟ යැ උඩු සුළඟ යැ යි වෙනසක් නො කොටැ. යම් අතකට වාතය හමා යේ නම් ඒ අනුවාත සි. එයට විරුද්ධ අත ප්‍රතිවාත සි. සුවඳ යන්නේ වාතය සමඟ යැ. එ හෙයින් ඒ අනුවාතයට යෙයි, ප්‍රතිවාතයට නො යෙයි. දසබල ගුණ සුවඳ වනාහි එ බඳු දිශා විභාගයක් නො කෙරෙයි, අනුවාතයටත් යෙයි, ප්‍රති වාතයටත් යෙයි, සියලු අතට මැ යෙයි. **අමා බස්නා වූ**— හමා බසින්නා වූ. විහිදී යන්නා වූ. **දශ බල ගුණ**— බුදුන් ගේ නුවණ බල දසයේ ගුණ. ස්ථානාස්ථාන ඥාන, කර්මවිපාක ඥාන, සර්වත්‍ර ගාමිනී ඥාන, ධාතු ඥාන, අධිමුක්ති ඥාන, ඉන්ද්‍රිය පරොපරත්ව ඥාන, ධ්‍යානාදී සංකෙලශාදි ඥාන, පූර්වෙනිවාසානුස්මෘති ඥාන, දිව්‍ය චක්ෂුර්ඥාන, ආශ්‍රවක්ෂයකර ඥාන, යන මොහු තථාගතයන් ගේ දශ ඥාන බලයෝ යැ. **දශ විධ**— දශ ප්‍රකාර වූ. **ජඞ්ගම**— ඇවිදුනා. අස්ථාවර. Moving. සියලු වස්තූහු ස්ථාවර යැ ජඞ්ගම යැ යි දෙ පක්ෂයකට බෙදෙති. පර්වතයෝ ස්ථාවර පක්ෂයට වැටෙත්. සුමෙධයෝ ගන්ධමාදනය පර්වතය යැ. එ හෙත් ඒ පර්වතය මෙන් ස්ථාවර නො වේ, ජඞ්ගම යැ. ගම් + අ. 'ගම්' (යැමෙහි) ධාතු සි. ධාතුව ද්විරූප වැ 'ගම්ගම් + අ' යනු වෙයි. ආදි 'ග' හට 'ජ' වෙයි. ජඞ්ගම්.

'ගමන ශක්ති ඇති' යනු අර්ථ සි. **ගන්ධමාදන පර්වතය**— මෙරු පර්වතයට පෙර දිගින් පිහිටි පර්වතයෙකි. සුගන්ධවත් වූ වනයන් ගෙන් යුක්ත හෙයින් ගන්ධමාදන නම්. ගන්ධයෙන් මාදනය (මත් කිරීම) කරනුයේ ගන්ධමාදන සි. **සත් ගුණ**— යහපත් ගුණ. **උන්වා ලූ**— හිඳුවා ලූ. **අද මේ පිපි වනින් මැ**— අද මේ පිපුණු ලෙසින් මැ. **නො මලා**— ම්ලානික නො වී. පර නො වී. 'ම්ලා' ධාතු සි. 'ඛල' ආදි පර පද සි. ම්ලා- මලති- මැලෑ. **නමාම වැඩක් කරම්හ සි**— ආනාමාභිවාදනයක් කරම් හ සි. **සිතම පෑ**— සිතම ප්‍රකාශ කොටැ.

44. මඩු **කවුවෙකු**— මඬුවා ගේ කවුව ගසට **වීෂ සහිත** යැ. **පඩක දුගීයෙන්**— යා නො හැකි මිඩින්. **මහ හෙළයකු**— මහා සෙතුවෙක් යැ (පාලමෙකි.) **අනවලෝ මුඳුන් වන්නම**— අනවලොක්‍යමස්තක වන්නට. නො බැලියැ හැකි (හිස්) මුදුන ඇති වන්නට. බුදුන් ගේ මුදුන කිසිවකු විසිනුත් නො බැලියැ හැකි යැ. එ හෙයින් කී හ, බුද්ධානුස්මෘතියෙහි—

"අනොමලොකිත්‍යමුද්ධාසි"

යනු. **පෙහෙවස්**— පොහෝ දා වස. **පෙහෙළ** ශීලය. අට සිල්. **සසර පමණින්**— සසර වසනා තාක්. **පසැව මහා පරිත්‍යාගයම**— පස් මහ දනට. ධනය යැ, පුත්‍රදාරයෝ යැ, රාජ්‍යය යැ, ශරීරාඞ්ගය යැ, ජීවිතය යැ, යන මොවුන් දීම පසැව මහා පරිත්‍යාග සි. පරි + ත්‍යජ් + අ= පරිත්‍යාග. 'ත්‍යජ්' (හැරීමෙහි) ධාතු සි. **ප්‍රස්තාවනාවෙකු**— ඇඳින්වීමෙකැ. ඉදිරිපත් කිරීමෙකැ. නාටකයක් අරඹින්නට පෙරැ, "දැන් මෙ නම් වූ මෙ බඳු වූ නාටකයක් දක්වනු ලැබේ" යනාදීන් කැරෙන හැඳින්වීම 'ප්‍රස්තාවනා' නමි. පොත් ආදියෙ හැඳින්වීමට මුලැ මැ පළ කැරෙන නිබන්ධය ද ප්‍රස්තාවනා නාමය ලබයි. සුමෙධයන් බුදුනට දිවි පුදා කලල් පිටැ වැදැ හෙවැ සිටීම, "මේ පුරුෂයා මෙ වක් පටන් පස් මහ දන් දෙන්නේ යැ" යි කළ ප්‍රස්තාවනාවක් වැන්නැ. ප්‍ර + ස්තු + අන + ආ = ප්‍රස්තාවනා. 'ප්‍ර' උපසර්ග සි. 'ස්තු' කීමෙහි ධාතු සි. 'අන' භාවයෙහි ප්‍රත්‍යය සි. 'ආ' ස්ත්‍රී ප්‍රත්‍යය සි. **සැරුසුමෙකු**— සැරැසීමෙකි. පිළියෙළ වීමෙකි **ශ්‍රම කරවා**— අභ්‍යාස (පුරුදු) කරවා. ශ්‍රම් + අ 'ශ්‍රම්' (උත්සාහයෙහි) ධාතු සි. 'හරඹ'යනු සාමාන්‍ය ව්‍යවහාර සි. 'කඩු හරඹ' යනාදි තැන්හි ඒ පෙනේ.

45. **නො ලැබෙති**— දුර්ලභයෝ යැ. **සනාථ**— නාථ සහිත. සශරණ. **කරත්**— කරත් හොත්. **තමන් ගේ**

**ආශ්චර්යයෙහි**— තමන් විසින් කරනු ලබන අද්භූත ක්‍රියායෙහි දී. **සැලී**— සෙලැවී. කම්පිත වී. **විධා වනා**— වෙහෙස වන්නා වූ. බෝධි සත්ත්ව කාලයෙහි ද බුද්ධ කාලයෙහි ද ආශ්චර්යයන්හි දී මහා පෘථිවිය කම්පිත වැ වෙහෙස ගනී. එ හෙයින් දූන් මැ සිපැ සනසා ලීම සුදුසු මැ නු? **සිපෑ ගෙනෑ**— වැලැඳැ ගෙනැ. 'සිප්' ධාතු යි. 'සිපැ' යනු 'සිඹැ' යන්නෙන් අන්‍ය යි. **විපුල**— බොහෝ. **කපිලවාස්තු**— කිඹුල්වත්. 'කපිල' නම් මහර්ෂිහු හුන් තැනැ කළ හෙයින් එ කපිලවාස්තු නම් වී. 'වාස්තු' යනු ගෘහ භූමි යැ යන අර්ථ ඇත්තේ යැ. **පීන පයොධර ශ්‍රෝණිධර වූ**— පිරුණා වූ පයොධරයන් ද ශ්‍රෝණිය (උකුළ) ද දරන්නා වූ. **නිරපෙක්ෂ වැ**— අපෙක්ෂා රහිත වැ. තැකීමක් නැති වැ. අපෙක්ෂායෙන් නිෂ්ක්‍රාන්ත වූයේ නිරපෙක්ෂ යි. **නිසඞ්ග වැ**— නො ඇලී. **රුචිර ගති කාන්තාමන්ථර**— (කාන්ත + අමන්ථර) රුචි උපදවන්නා වූ ගමනයෙන් කාන්ත වූ ශීඝ්‍ර වූ. ගම් + ති = ගති. යෑම. කම් + ත = කාන්ත. ඇලුම් කළ. 'කම්' (ඇල්මෙහි) ධාතු යි. මන්ථර (මන්ද, අශීඝ්‍ර) නො වනුයේ අමන්ථර යි. **කන්ථකාභිධාන**— (කන්ථක + අභිධාන) කන්ථක නම් වූ. අභිධාන නම් නාමය යි. **හය වරාධිරූඪ වැ**— (හය වර + අධි....) අශ්වොත්තමයා අරා. උතුම් අසු පිටැ නැඟී. අධි + රුහ් + ත = අධිරූඪ 'රුහ්' නැඟීමෙහි ධාතු යි. හයනට (අශ්වයනට) වර (උතුම්) හයවර **අච්ඡන්නපක්ෂපාත**— නො වැසුණු පක්ෂපාතය ඇති. ඡද් + ත = ඡන්න. 'ඡද්' (වැසීමෙහි) ධාතු යි. න ඡන්න = අච්ඡන්න. **පක්ෂයෙහි** (න්‍යාය විරොධ වූ සහායයෙහි-සහාය භාවයෙහි) පාතය (වැටීම) පක්ෂපාත යි. **ඡන්නාමාත්‍ය-සහාය වැ**— ඡන්න නම් අමාත්‍යයා සහාය කොටැ ඇති වැ. සහ (සමඟ) යනුයේ සහාය යි. සහචරයාට නමි. සහ + ඉ + අ = සහාය. 'ඉ' (ගමන්හි) ධාතු යි. **භ්‍රූකුටි කුටිල කටාක්ෂ නික්ෂෙප මාත්‍රයෙකින් මැ**— බැම බිඳීමෙන් (හැකිළීමෙන්) කුටිල (ඇද, වක්) වූ ඇස් කොන් හෙළීම් පමණෙකින් මැ. බැම හකුළුවා ඇස් කොනින් බැලූ පමණෙකින් මැ. මෙ සේ බලනුයේ කෝපය හැඟැවීමට යැ. **නිර්භර්ත්සිත කොටෑ**— නැති ගන්වා. නිර් + භර්ත්ස් + ඉ + ත = නිර්භර්ත්සිත. 'භර්ත්ස්' (නැති ගැන්වීමෙහි) ධාතු යි. **ජාත්‍යන්තරයෙහි**— (ජාති + අන්තර) අන්‍ය ජාතියෙක්හි. **සහචර**— සහාය. සහ (සමඟ) සරනුයේ සහචර යි. සහ + චර් + අ = සහචර. **ජොතිපාල මාණවක සමයයෙහි** කුම්භකාර වූයේ දූන් ඝටීකාර

නම් බ්‍රහම සි. **විනිවෘත්ත චිත්ත විකාර ඇති**— විශේෂයෙන් නැවැතුණු චිත්ත විපර්‍යාස (සිත් පෙරළීම්) ඇති. සිත මැඬ, රහත් වූ, සිටි හෙයින් මෙසේ කියත්. වි + නි + වෘත් + ත= විනිවෘත්ත. 'වෘත්' (පැවැත්මෙහි) ධාතු සි. **සවිකාර මහා බ්‍රහ්මොපනීත**— (බ්‍රහ්ම + උපනීත) සවිකාර නම් මහ බඹු විසින් ළඟට පමුණුවන ලද. **විශිෂ්ටාෂ්ට පරිෂ්කාර සවිකාර පූජොපගම වූ**— (විශිෂ්ට + අෂ්ට) උතුම් අට පිරිකර පිළිගැනීම පෙරටු කොට ඇති වූ. **සාවුරුද්දක්**— ස + හවුරුද්දක්= ස + අවුරුද්දක් = සාවුරුද්දක්. **මහා වීර්‍ය**— (බුදු වීමට) මහත් උත්සාහ. දුෂ්කර ක්‍රියා. **ප්‍රචලබාලප්‍රවාලාජපාල මූල ගත වූ**— (ප්‍රවාල + අජපාල) අතිශයින් චලිත වන්නා වූ ළා දළු ඇති අජපාල (නම් නුග රුක්) මුලට ගොස්. ප්‍ර + චල් + අ = ප්‍රචල. 'චල්' (සෙලැවීමෙහි) ධාතු සි. 'ප්‍රවාල' යනු පල්ලවයට ද නමි. ප්‍රකර්ෂයෙන් (අතිශයින්) වලනය (අවකම්පනය) වනුයේ ප්‍රවාල සි. ප්‍ර + වල් + අ = ප්‍රවාල. වල් (අවකම්පනයෙහි) ධාතු සි අජපාලයන් (එළු ගොව්වන්) හුන් හෙයින් ඒ රුක අජපාල නම් වී. ගම් + ත = ගත. 'ගියේ' යනු අර්ථ සි. **උභය කුල සුජාත**— මවු පිය දෙ කුලයෙන් මනා සේ උපන්. උභය කුලයෙන් පිරිසුදු වූ. **සුජාතාභිධාන**— (සුජාතා + අභිධාන) සුජාතා නම් වූ. **වනිතා කර කමලෝපනීත**— (කමල+උපනීත) වනිතාව ගේ (ස්ත්‍රිය ගේ) අත් නමැති පියුමින් වෙතට පමුණුවන ලද (එළවන ලද.) 'වනිතා' යනු ස්ත්‍රියට නමි. **අසම්භින්න පායසාන්න ප්‍රතිග්‍රහණ පූර්වක වූ**— නො බිඳුණු කිරි බත් පිළි ගැනීම පෙරටු කොට ඇති වූ. න සම්භින්න= අසම්භින්න. සම් + භිද් + ත = සම්භින්න. කිරි බත කිරින් පිසියැ යුතු යැ. ඉදින් දිය මුසු වී නම් ඒ සම්භින්න වි යැ, බිඳුණේ යැ, 'කිරි බත්' යන නමෙහි අර්ථ බිඳුණේ යැ. ඉදින් කිරින් මැ (දිය මුසු නො කොට) පිසන ලද්දේ නම් ඒ අසම්භින්න සි. පයසින් (කිරින්) සංස්කෘත වූයේ (සකස් කැරුණේ) පායස සි. පයස් + අ = පායස. 'පයස්' යනු කිරට නමි. කිරින් පිසුණේ හෝ කැරුණේ හෝ පායස සි. ඇතැමෙක් මෙය 'පායාස' යැ යි වහරට ගනිති. එ හෙත් 'පයස්' ශබ්දයෙන් 'පායාස' යන්නෙක් අසාධ්‍ය යැ. ප්‍රත්‍යය ගන්නා කලැ වෘද්ධියට පැමිණෙනුයේ ශබ්දයෙහි ආදි ස්වරය පමණෙකි. 'සරස්' යනුයෙන් 'සාරස' යනු වෙයි. 'සාරාස' යන්නෙක් නො වෙයි. අද් + ත= අන්න. 'අද්' (කෑමෙහි) ධාතු සි. කෑමට (විශේෂයෙන් බතට) 'අන්න' යනු නමි.

“ශස්‍යං ක්ෂෙත්‍රගතං ප්‍රොක්තං සතුෂං ධාන්‍යමුච්‍යතෙ
ආමං තු විතුෂං ප්‍රොක්තං ස්වින්නමන්නමුදාහෘතම්”

යනු සමෘති වචන සි. ක්ෂෙත්‍රගත වූයේ ශස්‍ය යැ යි කියන ලද. තොමහා (පොතු) සහිත වූයේ ධාන්‍ය යැ යි කියනු ලැබේ. තොමහො රහිත වූයේ ආම යැ යි කියන ලද. හුයන (පිසින) ලද්දේ අන්න යැ යි පැවැසිණ. මේ ශ්ලොකාර්ථ සි. **ජලාවගාහායාත නව යුවති පීන ස්තන මර්දන ජර්ජරිත**— (ජල + අවගාහ+ආයාත) ජල ස්නානයට පැමිණියා වූ අභිනව තරුණියන් ගේ පුන් තෙනෙන් මැඩීමෙන් දුදුරු වූ (දුර්වල වූ.) ස්නාන කල්හි යුවතීන් ගේ තන වැදීමෙන් ගඟෙහි දිය කඳ සිඳී බිඳී යෙයි. අව + ගාහ් + අ= අවගාහ. 'ගාහ්' (ගැලීමෙහි, කිමිදීමෙහි) ධාතු සි. ආ+යා + ත= ආයාත. 'යා' (ගමන්හි) ධාතු සි. මෘද් + අන= මර්දන. 'මෘද්' (මැඩීමෙහි) ධාතු සි. 'ජර්ජරිත' යනු 'දුර්වල කරන ලද' යන අර්ථයෙහි වෙයි. **ශෛවාලාවගාහනාහත ශරීර කලමථ ඇති වූ**— ශෛවාල + අවගාහන + ආහත) සිය කැමැති පරිදි නෑමෙන් නසන ලද සිරුරු විඩා ඇති වූ. අව + ගාහ් + අන= අවගාහන. ආ + හන් + ත= ආහත 'හන්' (නැසීමෙහි) ධාතු සි. කලම් + අථ= කලම්ථ. 'කලම්' (ගිලන් වීමෙහි) ධාතු සි. 'අථ' ප්‍රත්‍යය සි. **එකුන් පනස**— එකක් ඌනු පනස. සතලිස් නව. **උඩු හොයට**— හොයෙහි (දිය පහරෙහි) උඩු අතට. **තමනුදු**— තමන් + දු. ස්වරාගම සි. **තෘෂ්ණා ප්‍රවාහයට අනු නො වූ**— තෘෂ්ණා (දැඩි ලොභය) නමැති වතුරට (දිය පහරට) අනු නො වී. තෘෂ්ණා ප්‍රවාහය සමඟ නො ගොස්. **උඩු හෝ බලා යන බව**— තෘෂ්ණාවෙන් මිදෙන බව. **කුසුමාමොද මුදිත මඤ්ජු සිඤ්ජිත මධුකර නිකර නිරන්තර** – (කුසුම + ආමොද) මල් සුවඳින් ප්‍රීත වූ මනොහර නාද ඇති භෘඞ්ග සමූහයා ගෙන් අතුරු නැති වූ. ආ (හාත්පසින්) මොදනය (පිනැවීම) කරනුයේ ආමොද සි. දුර විහිදුනා සුවඳට මේ නමි. ආ+මුද් + අ = ආමොද. මුද් (පිනීමෙහි) ධාතු සි. මුද් + ඉ + ත= මුදිත. 'මඤ්ජු' යනු 'මනොහර' යන අර්ථයෙහි වෙයි. 'සිඤ්ජිත' යනු ලොහාභරණයන් ගෙන් (විශෙෂයෙන් නූපුරයෙන්) නැඟෙන හඬට නමි. මෙහි බමර රැව්වට යෙදිණ. සිඤ්ජ් + ඉ + ත = සිඤ්ජිත. 'ශිඤ්ජිත' යනු ද යෙදේ. 'සිඤ්ජ්' (හඬෙහි) ධාතු සි. **පාවන**— පවිත්‍රත්වය ඇති කරන්නා වූ. පිරිසුදු කරන්නා වූ. පූ + අන=පාවන. 'පූ' (පිරිසුදු කිරීමෙහි) ධාතු සි. **ශාල වන**— සල් වනයට. 'ශාල' යනු ද යෙදෙ සි. **ප්‍රවිෂ්ට වූ**—

පිවිසැ. ඇතුළු වී. ප්‍ර + විශ් + ත= ප්‍රවිෂ්ට. 'විශ්' (ඇතුළු වීමෙහි) ධාතු යි. **විකසිත කුසුම නෙත්‍ර**— පිපුණු මල් නමැති ඇස්-**දල්වා**— අයා. **හැර. දිවා විහාර**— දවල් කාලයෙහි විහරණය. **සැදූ**— සැරසූ. **ප්‍රදක්ෂිණා කොට**— පැදකුණු කොට. මධ්‍යයට දක්ෂිණාංශය හැරී සිටුනා සේ වටා යෑම ප්‍රදක්ෂිණා නම්. **ප්‍රබලාහඞ්කාර පුරස්සර වූ**— (ප්‍රබල + අහඞ්කාර) ඉතා බලවත් වූ අහඞ්කාරය පෙරටු කොට ඇති වූ. **විජිගීෂා සමුපස්ථිත වූ**— ජය ගන්නා අභිලාෂයෙන් චෙතට එළැඹිනා වූ. වි + ජි + ස + අ+ආ= විජිගීෂා. විජය ලබනු කැමැත්ත යි. මේ 'ස' ප්‍රත්‍යය පර කල්හි ධාතුව ද්විරූප වෙයි. 'ජි' (ජයෙහි) ධාතු යි. ද්විරූප වූ කලැ 'ජිජි' යි සිටී. ද්විතීය 'ජ' කාරයට 'ග' කාරාදේශ වෙයි. • 'ජිගි' යනු වනුයේ මෙ ලෙසිනි. සම් + උප+ස්ථා+ත= සමුපස්ථිත. 'ස්ථා' (සිටීමෙහි) ධාතු යි. මොහොවට ළං වැ සිටීම (එළැඹීම) සමුපස්ථාන යි. **සනාථ කොටැ**— සඵල කොට. **ද්වාදශාඞ්ග ප්‍රතීත්‍ය සමුත්පාද ප්‍රත්‍යවෙක්ෂා ක්ෂණයෙහි**— දොළොස් අඞ්ගයක් ඇති ප්‍රතීත්‍ය සමුත්පාද (හෙතු ඵල) ධර්මය සිහි කරන කෙණෙහි (මොහොතෙහි.) "අවිජ්ජාපච්චයා සඞ්ඛාරා" යනාදීන් දක්වුණේ ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය යි. අවිද්‍යා, සංස්කාර, විඥාන, නාමරූප, ෂඩායතන, ස්පර්ශ, වෙදනා, තෘෂ්ණා, උපාදාන, භව, ජාති, ජරා- මරණ- ශොක- පරිදෙව- දුඃඛ- දෞර්මනස්‍යොපායාස යන මේ ද්වාදශාඞ්ග යි. ප්‍රති+අව+ඊක්ෂ්+අ+ආ= ප්‍රත්‍යවෙක්ෂා. සිහි කිරීමට මේ නම්. 'ඊක්ෂ්' බැලීමෙහි ධාතු යි. **අරුණොදය**— (අරුණ+උදය) අරුණ උදා වීම. **සර්වඥතාඥානොදයයෙන්**— සියල්ල දන්නා නුවණ උදා වීමෙන්.

46. **තම්හි මුත් සිත්හි මායාවක් නැති**— තම 'මායා' වන බැවින් තමෙහි මායාවක් හෙවත් 'මායා' යන්නක් ඇතැ යි කියැ හැකි. සිතෙහි නම් මායාවක් නැති. **දුඃඛ විනොදනය කරන**— දුක් දුරු කරන. වි+නුද්+අන= විනොදන. 'වි' පූර්ව 'නුද්' ධාතුව දුරු කිරීමෙහි වැටේ. **කෙලෙශ විකාරයෙන්**— කෙලෙශයන් ගෙන් ඇති වන විපර්යාසයෙන්. 'විකාර' යනු රොග යැ, සිත් පෙරළී යැ, භ්‍රම යැ යනාදි නොයෙක් අර්ථයන්හි වැටේ. ඒ කුමක් වුව ද මෙහි යෙදේ යි. වි + කෘ + අ= විකාර. 'වි' පූර්ව 'කෘ' ධාතුව වෙනස්හි වැටෙයි. **අචලිත වූ**— නො සෙල්වෙන්නා වූ. න චලිත අචලිත. චල් + ඉ + ත= චලිත. **සංසාර ව්‍යසනයෙහි**— සංසාර විපත්තියෙහි. **අනාකුල වූ**— ආකුල (අවුල්) නුවූ. න ආකුල අනාකුල. ජින

**ශාසනාකාශයෙහි**— (ශාසන + ආකාශ) බුදු සසුන් නමැති අහසෙහි. සසර දිනත් හු සි 'ජින' නම් වෙත් බුදුහු. ජි+න=ජින 'ජි' (ජයෙහි) ධාතු සි. ශාසනය නම් හික්මැවීම සි (විනයනය සි.) Government. ශාස්+අන= ශාසන. 'ශාස්' (අනුශාසනයෙහි) ධාතු සි. **උදා කල**— ප්‍රකාශ වූ. **ප්‍රභාස්වර වූ**— අතිශයින් කාන්තිමත් වූ. ප්‍රභාස්+වර. 'භාස්' යනු කාන්තියට නම්. ප්‍රකෘෂ්ට වූ කාන්තිය 'ප්‍රභාස්' නම් වේ. එය ඇතියේ ප්‍රභාස්වර සි. **පුෂ්‍ය නම් නක්ෂත්‍ර තාරකාව**— පුස නම් නැකත් තාරකාව. පුෂ්‍ය යනු අට වැනි නැකත සි. එහි තාරකා තුනෙකි. 'තිෂ්‍ය' යනු ද 'පුෂ්‍ය' නක්ෂත්‍රයට නමෙකි. **සමරණ මාත්‍රයෙකින් මැ**— සිහි කළ පමණෙකින් මැ. ස්මෘ + අන= ස්මරණ. 'ස්මෘ' (සිහි කිරීමෙහි) ධාතු සි. **ලෝකානන්ද එළවන**— (ලෝක+ආනන්ද) ලොවට ආනන්දය (සන්තොෂය) පමුණුවන්නා වූ (ඇති කරන්නා වූ.) **උපස්ථායක**— උපස්ථාන කරන. උප + ස්ථා + අක=උපස්ථායක. උපස්ථානය නම් වෙතැ සිටීම සි. වෙතැ සිටැ වුව මනා දෑ සපයන්නුයේ උපස්ථායක සි. **ක්ෂෙමඞ්කර වූ**— ක්ෂෙමය (අභය) කරන්නා වූ. **මෙහෙණණි**— 'මහණ' ශබ්දය ස්ත්‍රී ප්‍රත්‍යය ගත් කලැ වනුයේ 'මෙහෙණ' යනු සි. 'මෙහෙණ වර' යන තන්හි ඒ පෙනේ. ඇතැමෙක් 'මෙහෙණි' යන්නක් ද, තවත් කෙනෙක් 'මෙහෙණිනි' යන්නක් ද, නතු නො දැනැ ලියති. 'මෙහෙණ' යන්නට ගෞරවාර්ථයෙහි 'අණි' ප්‍රත්‍යය වූ කලැ 'මෙහෙණණි' යනු නිපදී. **අවිවර්ණ වූ**— විවර්ණ නුවූ. කිලිටි නුවූ. විරුද්ධ වූ වර්ණය යමක්හුගේ ද හේ විවර්ණ සි. **අස්වස්ථතාව**— ආයාසය. ස්වයෙන් (ස්වභාවයෙන්, සුවයෙන්) ස්ථානය කරනුයේ (සිටිනුයේ) ස්වස්ථ සි. ස්ව + ස්ථා + අ. වෙනසක් නො වැ, ආයාසයක් නැති වැ, ස්වභාවානුකූල වැ සුවයෙන් සිටිනුයේ ස්වස්ථ සි. එ සේ නො වනුයේ අස්වස්ථ සි. අස්වස්ථයා ගේ භාවය 'අස්වස්ථතා' නම්. 'තා' යනු භාවයෙහි තද්ධිත ප්‍රත්‍යයය සි. **අශුවත්**— ඇසටු.

**47. මැංඩෑ හැකි**— මැඬියැ හැකි. මැඬියැ = මැංඩි යැ= මැංඩිඇ = මැංඩැ. **උන්**— ඒ සුමෙධයන්. **අෂ්ටාඞ්ග මාර්ගයේ ගණනින් මැ**— බුදු වන කලැ ලබන ආර්ය මාර්ගයේ අඞ්ග අටෙකි. දූන් දිවකුරු බුදුන් පුදන මල් ද අට මිටෙකි. දෙ කෙහි මැ ගණන සමාන යැ. සම්‍යග්දෘෂ්ටි, සම්‍යක්සඞ්කල්ප, සම්‍යග්වාචා, සම්‍යක්කර්මාන්ත, සම්‍යගාජීව, සම්‍යග්ව්‍යායාම, සම්‍යක්ස්මෘති, සම්‍යක්සමාධි, යන මේ යැ ආර්ය අෂ්ටාඞ්ග මාර්ග නම්.

48. **තාව**— මේ තාක්. **නම් නො දනැ**— නම් පමණකුත් නො දනැ. **ත්‍රිවිධ අර්ථ වසී**— තුන් වැදෑරුම් අභිවෘද්ධිය පිණිස යෙදීම. ඥානාර්ථ වසී, ඥාත්‍යර්ථ වසී, ලෝකාර්ථ වසී, යනු ත්‍රිවිධ අර්ථ වසී යැ. ඥානාභිවෘද්ධිය පිණිස හැසිරීම, ඥාතීනම අභිවෘද්ධි පිණිස හැසිරීම, ලෝකාභිවෘද්ධිය පිණිස හැසිරීම, යනු අර්ථ සි. **බසකුදු මුවෙහි නො වකා**— (ත්‍රිවිධ අර්ථ වසී යැ යන) වචනයක් පමණ වත් මුඛයෙහි නො තවරා. ත්‍රිවිධ අර්ථ වසී යැ යන වචනය පමණකුත් මුවින් නො කියා. **තුන් ලොවින් පූජා ලබන්නෝ**— බුදුවරු. සුමේධයන් “බුදු වෙමි” යි සිතූ පමණින් මැ දිවකුරු බුදුහු ද ඔවුනට මල් පිදූ හ, ඔවුන් පැදකුණු කොටැ වැඳිය හ. එ හෙයින් මෙ සේ කියත්. **සක හත්ථෙන්**— සිය අතින්.

49. **ශ්‍රී හත්ථෙන්**— මෙහි ‘ශ්‍රී’ යනු ගෞරව පිණිස යෙදිණ. ‘ශ්‍රී’ යනු කවර නාමයනට පූර්ව කොටැ යෙදියැ යුතු ද යනු මෙ සේ දැක්විණ:—

“දෙවං ගුරුං ගුරුස්ථානං ක්ෂෙත්‍රං ක්ෂෙත්‍රාධිදෙවතාම්
තීර්ථං තීර්ථාධිකාරාංශ්ච ශ්‍රීපූර්වං සමුදීරයෙත්”

“දෙවි යැ ගුරු යැ ගුරු ස්ථාන යැ ක්ෂෙත්‍ර යැ ක්ෂෙත්‍රාධිෂ්ඨිත දෙවතා යැ තීර්ථ යැ තීර්ථාධිකාරයෝ යැ යන මොවුන් ශ්‍රී ශබ්ද පූර්ව කොටැ දක්වන්නේ යැ” යනු අර්ථ සි. **දස්සන විසයය**— දැක්මට පිළිවන් දුර. **ඉක්මැ**— පසු කොටැ. ‘ඉකුම්’ දයින් වූ පෙර කිරිය සි. **මල් ඇතිරිය**— පුෂ්පාස්තරණය. මල් ඇතිරිල්ල.

50. **පැනේ නම්**— ප්‍රකාශ වේ නම්. **අතිශීත**— අධික ශීතල. **අච්චුණ්හ**— (අති + උෂ්ණ) අධික උෂ්ණ. **වසන්ත සමයයෙහි**— වසන්ත ඍතුයෙහි. බක් වෙසක් දෙ මස ඇතුළත් කාලය වසන්ත සි. **ප්‍රභාත වේලාව**— උදය කාලය. **සම ඍතු**— සම වූ වාත ගුණ. සම ශීතොෂ්ණතාව.

51. **ප්‍රචණ්ඩ වූ**— ඉතා සැඩ වූ (දරුණු වූ.) **මඞ්ගලයෙහි**— උත්සවයෙහි. **විවරණ පතුල්**— නිරාවරණ කිරීම- ප්‍රකාශකිරීම- විවරණ නම්. “මේ මතු බුදු වන්නේ යැ” යි කැරෙන ප්‍රකාශය මෙහි විවරණ සි. වි + වෘ + අන = විවරණ. ‘වි’ පූර්ව ‘වෘ’ ධාතුව හැරීමෙහි (විවෘත කිරීමෙහි) වැටේ. ‘පතුල්’ යනු ආධාරාර්ථයෙහි වෙයි

මින් මතු බොධි සත්ත්වයෝ මේ විවරණය පිටැ සිටැ කටයුතු කෙරෙති. ඒ ක්‍රියා මාර්ගයට විවරණය පතුල් වෙයි, ආධාරය වෙයි. **ප්‍රචණ්ඩ වාත**— ඉතා සැඩ සුළඟ **තෘෂ්ණා ශ්‍රොතස**— දුස් ලොභ්‍ය නමැති හොය (දිය පහර.) **ශ්‍රී ශරීර රශ්මින්**— ශ්‍රීමත් වූ ශරීරයෙහි කාන්තීන්. **වැනි**— විසිරී. **කෘතාධිකාර**— (කෘත + අධිකාර) කරන ලද පින් ඇති. අධි + කෘ + අ= අධිකාර. යම් කිසිවක් සිඞ් වීමට සුදුසු කම 'අධිකාර' නම්. මෙහි 'අධිකාර' නම් පූර්ව ජන්මයන්හි කරන ලද පිනුයි මාර්ග ඵලාදිගමයට සුදුසු වූ පින් කළාහු ඒ සඳහා කෘතාධිකාරයෝ යැ. **ලොකොත්තර මාර්ග ඵල ගන්නට**— ශ්‍රොතආපත්ති, සකෘදාගාමී, අනාගාමී, අර්හත් යන ලොකොත්තර මාර්ගයන් ඵල ගන්නා බවට. **නො වැළැකී**— නො වැළැකී.

**52.** **ප්‍රාදුර්භාවයෙහි**— (බුදු වැ) පහළ වීමෙහි. ප්‍රාදුස්+භූ + අ= ප්‍රාදුර්භාව. පෙනෙන සේ- ප්‍රත්‍යක්ෂ සේ- යන අර්ථයෙහි 'ප්‍රාදුස්' යන අව්‍යය ශබ්දය වෙයි. 'භාව' නම් වීම යි. **සප්ත බොධ්‍යඞ්ග රත්නයන් ගේ**—බොධි අඞ්ග සත නමැති රත්නයන් ගේ. චතුරාර්‍ය සත්‍යයන් ගේ අවබොධය බොධි නම්. බුධ් + ඉ= බොධි. ඒ අවබොධයට වහල් වන්නා වූ අවයව සත සප්ත බොධ්‍යඞ්ග නාමයෙන් ගැනේ. ස්මෘති, ධර්මවිචය, වීර්‍ය, ප්‍රීති, ප්‍රශ්‍රබ්ධි, සමාධි, උපෙක්ෂා යන මොහු යැ සප්ත බොධ්‍යඞ්ගයෝ. ශ්‍රෙෂ්ඨ වන බැවින් රත්න නම් වූ හ. **උජ්ජ්වල වීම**— උසස් වැ බබළනු වීම. උද් + ජ්වල් + අ= උජ්ජ්වල. 'උද්' යනු උපසර්ග යි. 'ජ්වල්' (දිලීමෙහි) ධාතු යි. **ධර්ම විජය භෙරී ලවන බවට**— ධර්ම නමැති විජය බෙර හසුරුවන (ගස්වන) බවට. විජයයෙහි වයනු ලබන භෙරී විජය භෙරී යි. 'ලවන' යනු 'ල' (ලීමෙහි) දයින් වූ ප්‍රයොජ්‍ය වර්තමාන කෘදන්ත නිපාත යි. මෙහි 'බෙර ලැවීම' නම් බෙර ගැස්වීම යි. **කවා මැ නව හට ශබ්ද පවත්වන පරිදි**— කිසිවකු විසින් වැයීමක් නැති වැ බෙරයෙන් නිතම් මැ හඬ නැගෙන සැටි. **වස්නට**— වසින්නට. **ජාති මහොත්සවයෙහි**—උත්පත්ති මහා මඞ්ගලයෙහි. ජන් + ති=ජාති. 'ජන්' (ඉපැදීමෙහි) ධාතු යි. 'ති' භාවයෙහි ප්‍රත්‍යය යි. උද් + සු + අ= උත්සව. 'සු' (නිපැදීමෙහි) ධාතු යි. **ඉපිලැ සෙන**— (ප්‍රීති වෙගයෙන්) උස් වැ නැඟී බස්නා.

**53.** **මිථ්‍යා දෘෂ්ටි**— වැරැදි ලබ්ධි. 'දෘෂ්ටි' නම් දැක්ම යි. මේ දැක්ම වනුයේ මසැසින් නො වේ, මනැසිනි. දෘශ් + ති=දෘෂ්ටි.

'දෘශ්' (දැකීමෙහි) ධාතු යි. **උද්ධත වූ**— උඩඟු වූ. උද් + හන් + ත= උද්ධත. (උඩට ගසන ලද.) **සැලෙන සැලුම්**— (උඩඟු වූ) 'දඟ ලන දැඟැලුම්' යනු ග්‍රාමීණ ව්‍යවහාරයෙහි එන පරිදි යි. **විනීත වන්නා සේ**— විනය යුක්ත (සුශික්ෂිත) වන්නාක් මෙන්. හික්මෙන්නා සේ. වි + නී + ත= විනීත. **තරඞ්ග වික්ෂොභයෙන්**— රළ කැලැඹීමෙන්. වි+ක්ෂුභ්+අ=වික්ෂොභ. 'ක්ෂුභ්' (කැලැඹීමෙහි) ධාතු යි. **උද්ධත වූ**— උඩ නැඟී. සාගරයෙහි රළ ඉහළ නැඟෙන හෙයින් මෙ සේ කීයේ. **නිශ්චල වූ**— නො සෙල්වී. චලයෙන් (සෙලැවීමෙන්) නිෂ්ක්‍රාන්ත වූයේ නිශ්චල යි. චල් + අ = චල. නිශ් + චල= නිශ්චල. **වහ්නිස්කන්ධයන්**— ගිනි කඳු. **මෛත්‍රී**— මිත්‍ර භාවය. බෞද්ධ මතයෙහි "නිදුක් නීරොග සුව පත් වේ වා" යන සිතිවිල්ල මෛත්‍රී නම්. මිත්‍රයා ගේ භාවය මෛත්‍ර යි. මිත්‍ර + අ= මෛත්‍ර. ස්ත්‍රී අර්ථයෙහි 'ඊ' ප්‍රත්‍යයය වීමෙන් 'මෛත්‍රී' යනු වේ. **චිරානුගත**— (චිර+අනුගත) බොහෝ කල් අනු වැ ගියා වූ (පැවැතැ ආවා වූ.) අනු + ගම් + ත= අනුගත. **විරොධය**— විරුද්ධ භාවය. වි + රුධ් + අ= විරොධ. 'රුධ්' (වැළැකීමෙහි) ධාතු යි. **හැලෙඹන**— හැසිරෙන. **අනස්ත වූ**— අස්ත නූ වූ. නො පෙනී නො ගියා වූ. සූර්යචන්ද්‍රයන් ක්ෂිතිජයෙන් බැසැ යෑම ද, ග්‍රහයන් සූර්යයාට හමු වීමෙන් නිෂ්ප්‍රභ වැ නො පෙනී යෑම ද අස්ත වීම නම්. අස් + ත= අස්ත. 'අස්' (දැමීමෙහි) ධාතු යි. න අස්ත අනස්ත.

54. **අඛණ්ඩ ප්‍රසාදෝදයට**— (ප්‍රසාද + උදය) නො කඩ වූ පැහැදීම උදා වීමට (ඇති වීමට.) ඛණ්ඩ් + අ= ඛණ්ඩ. 'ඛණ්ඩ්' (කැඩීමෙහි) ධාතු යි. න ඛණ්ඩ අඛණ්ඩ. ප්‍ර+සද්+අ= ප්‍රසාද. 'ප්‍ර'පූර්ව 'සද්' ධාතුව පැහැදීමෙහි වැටේ. **තාල ස්කන්ධ**— තල් (ගස්) කඳ. **වෘක්ෂ පරම්පරායෙහි**— රුක් පෙළෙහි. **දළ වූ**— මහත් වූ. **සුහුඹුල් වූ**— සැප ඇති වැ වැඩී. **කඳවෙලෙපක්**— සකන්ධ විටපයක්. කඳ ද වෙලෙප් ද කඳවෙලෙප්. 'වෙලෙප්' නම් ශාඛා (අතු) යැ. **සැලැඹීම්**— පැවැතුම්. **නක්ෂත්‍ර තාරකාවන්**— නකත් තරු. **සවිශෙෂ වූ**— විශෙෂ සහිත වූ. **දශ දිග්මණ්ඩලයෙහි**— (දිග් + මණ්ඩල) දශ දිශා භාගයෙහි. **කීර්ති පුඤ්ජය**— යශස් සමූහය. **විසා නකත**— විශාඛා නම් නක්ෂත්‍රය. නක්ෂත්‍ර මණ්ඩලයෙහි සොළොස් වැන්න යි. තරු දෙකෙකි.

55. **සැඟැවී තුබූ ධම් තත්වය**— ප්‍රකාශ නො වී (අවබොධ කළ නො හැකි වැ) තුබූ ධම් සද්භාවය. **බිලයෙහි**—

සිදුරෙහි. **නික්මැ**— 'නිකුම්' දයින් වූ පෙර කිරිය යි. **අප්‍රීතියක්**— ප්‍රීති නැති බවක්. **නිශ්ශෙෂයෙන්**— ඉතිරි නො වැ. සම්පූර්ණයෙන්. **තුනු**— කෘශ. තුනී. අඩු. **මානාතිමාන ස්තම්භ සාරම්භාදි**— (මාන + අතිමාන, සාරම්භ + ආදි) 'මාන' නම් "මම උසස්මි" යනාදි විසින් තමා මැ හුවා (උසස් කොටැ) දැකීම යි. 'අතිමාන' නම් අධික වූ මානය යි. 'ස්තම්භ' නම් තද බව යි (අවවාදයෙන් විනාර්තය නො කළ හැකි බව යි.) 'සාරම්භ' නම් කලාම වැඩියක් කරන බව යි. **රජසුන්**— ධූලීන්. 'රජස්' ශබ්දය 'උන්' විබත් ගත් තැනි.

**56. අධම් තාක්**— ඇති තාක් අධම්. සියලු අධම්. **අනිෂ්ට**— අනභිමත. නපුරැ. න ඉෂ්ට අනිෂ්ට. **පියුම් ගබක්**— පද්ම ගර්භයක්. පියුමෙකැ ඇතුළ. **විචිත්‍ර වූ**— විසිතුරු වූ. ආශ්චර්‍ය වූ. **අරූ කෙලෙහි**— අරූප තලයෙහි. අරූප බ්‍රහ්ම ලෝකවලැ.

"සිත මිසැ කය නැති බඹ ලොව **සතරෙහි**"......

යනුයෙන් කියැවුණු තන්හි. **ජාති ආදි**— ඉපැදීම් ආදි. **මේ වනැයි**— මෙ බඳු යැ යි. **නරක**— අවීචි ආදිය.

**57. අවවාදයෙහි සිටි**— අවවාදයට අනු වැ පැවැති. **ස්වර්ගාවරණයක්**— (ස්වර්ග + ආවරණයක්) ස්වර්ගය ඇවිරීමක්. දෙව් ලෝ යෑම වැළැක්වීමක්. දෙව් සැප ලැබීමට බාධාවක්. **මාර්ගාවරණයක්**— (මාර්ග + ආවරණයක්) ආර්ය මාර්ගය ඇවිරීමක්. ආ + වෘ + අන = ආවරණ. 'ආ' පූර්ව 'වෘ' ධාතුව වැළැකීමෙහි වෙයි. **ශෛලකැ**— ගලෙක් යැ. පාෂාණයෙක් යැ. **සෛලකැ**— සෙලෙක් යැ. ශෛලයෙක් යැ. ගල් පර්වතයෙක් යැ. **ඒකාඞ්ගණ**— (එක + අඞ්ගණ) එක මිදුලක්. එක තැන්නක්. **නිරුපධිශෙෂ නිර්වාණ ධාතුයෙන්**— උපධි ශෙෂයක් (උපධි ඉතිරි වීමක්) නැති නිර්වාණ ස්වභාවයෙන්. මෙහි 'උපධි' නම් පඤ්චස්කන්ධය යි. නිර්වාණය ද්විවිධ යැ, සොපධිශෙෂ යැ නිරුපධිශෙෂ යැ යි. රහත් වැ නිවන් දුටු නමුත් පඤ්ච ස්කන්ධය ඉතිරි නම් (තව ජීවත් වේ නම්) සොපධිශෙෂ යි. පඤ්ච ස්කන්ධය බිඳුණු (මැරුණු) ද සිටැ නිරුපධිශෙෂ යි. **පිරිනිවි**— පිරිනිවුණා වූ. පිරිනිවන් පෑවා වූ. **මෙ කෙණෙහි**— මේ මොහොතෙහි.

**58. කෘතපුණ්‍යසම්භ**— කරන ලද පින් ඇත්තම් හ. **ශොකී කැමින්**— දුක භාවය හේතු කොටැ ශොකැ. ක්‍රම් + ඉන් = කැමින්.

59. **අනෙක් පරිද්දකට නො යන්නා** වූ— අන් සැටියකට නො පෙරළෙන්නා වූ. බොරු නො වන්නා වූ. **ආකාශයට.........නො නවත්නා සේ**— අළගිය වන්නයෝ ද මෙ මැ කියති-

'කැටක් ගෙනැ තුබ තු ස
දමුව නො රඳසි බිමැ මි ස''.....සි.

**පහන් වේලෙහි**— ප්‍රභාත වෙලායෙහි. උදය කාලයෙහි. **අවශ්‍යයෙන් මැ**— නො වැළැකැ මැ. ඒකාන්තයෙන් මැ.

60. **සර්ව ලොක ශාන්තිකර** වූ— සියලු ලොවට සෙත් කරන්නා වූ. ශම් + ති = ශාන්ති. 'ශම්' (ශමනයෙහි, නිවීමෙහි) ධාතු සි. **අධර්ම ඝර්ම සන්තප්ත** වූ— අධර්ම නමැති ග්‍රීෂ්මයෙන් ඉතා තවන ලද්දා වූ. සම් + තප් + ත = සන්තප්ත. 'තප්' (තැවීමෙහි) ධාතු සි. **මෙ ගත් පටනින්**— මේ ගත්තා වූ පටන් ගැන්මෙන් (ආරම්භයෙන්.) **මාර වීර තිමිර නිකර දිවාකර වූ**— මාර වීර නමැති අන්ධකාර සමූහයට සූර්‍ය වූ. **පූරිත පාරමිතා ලතා මඤ්ජරීභූත සර්වඥතා ඥාන ලීලා විලාස විශෙෂ පරමාධාර වූ**— (පරම + ආධාර) පූරන ලද පාරමිතා නමැති ලියෙහි මල් පොකුර වූ සර්වඥතා ඥානයා ගේ ක්‍රීඩා ශොභා වර්ගයනට උතුම් වූ ආධාර වූ. පූරන ලද පාරමිතාව ලතාවෙකි. සර්වඥතා ඥානය එහි මල් කැන සි. ඒ මල් කැන ක්‍රීඩා කෙරෙයි. ඒ ක්‍රීඩා ශොභා විශෙෂයනට (විවිධ වූ ක්‍රීඩා ශොභාවනට) ඉතා උතුම් ආධාරය වනුවෝ බුදු වන තෙනැත්තෝ යැ. පූර් + ඉ + ත = පූරිත. 'පූර්' (පිරීමෙහි) ධාතු සි. මෙහි 'මඤ්ජරී' යනු මල් කැනට නමි. 'ලීලා' නම් ක්‍රීඩාව සි. මඤ්ජරියෙහි ක්‍රීඩා ලෙළ දීම් ආදිය සි. 'විලාස' යනු ද ක්‍රීඩාවට නමි. ඒ අර්ථයෙහි 'ලීලා' යනු පෙරළැ යෙදුණෙන් 'විලාස' නම් ශොභා යැ යි ගත යුතු. 'විශෙෂ' යනු 'සත්ත්ව විශෙෂ' 'වෘක්ෂ විශෙෂ' යනාදි තන්හි මෙන් වර්ගාර්ථය දෙයි. **ධර්මචක්‍ර වික්‍රමාක්‍රාන්ත විනෙය බන්ධු ක්ලෙශ බන්ධන ඇති වූ**— (වික්‍රම + ආක්‍රාන්ත) ධර්ම චක්‍රයෙහි වික්‍රමයෙන් මඩනා ලද විනෙය (ජන) නමැති බන්ධුන් ගේ කෙලෙස් නමැති බැඳුම් ඇති වූ. ධර්ම චක්‍රය පවත්වා එහි බලයෙන් විනෙය ජන බන්ධුන් ගේ කෙලෙස් බැඳුම් මැඩැ (විනාශ කොටැ.) ආ + ක්‍රම් + ත = ආක්‍රාන්ත. 'ආ' පූර්ව 'ක්‍රම්' ධාතුව පයින් මැඩීමෙහි යෙදෙයි. විනයනය කළ යුත්තාහු **විනෙයයෝ** සි. වි + නී + ය = විනෙය. නික්මැවීමට

සුදුසු. 'බන්ධු' යනු නෑයනට ද මිත්‍රයනට ද නම්. කවුරුන් වුව ද මෙහි සම යැ. විනෙය බන්ධූන් ගේ බැඳුම් වෙයි. ඒ නම් කෙලෙස් යැ. නිවනට පමුණුවන්නට මේ බැඳුම් කැපියැ යුතු යැ. ඒ ධර්මචක්‍ර වික්‍රමයෙන් කැරෙයි. **කාල දෙශ ස්ථානොචිතාද්භුත බුද්ධ විභ්‍රම ප්‍රකටන ප්‍රහෘෂ්ට ත්‍රෛලොක්‍ය ප්‍රගීයමාන සාධු වාද ශත සහස්‍ර සමුච්ඡ්‍රිත දික් චක්‍රවාල ඇති වැ** — (ස්ථාන + උචිත + අද්භූත) කාලයට ද දෙශයට ද ස්ථානයට ද සුදුසු වූ ආශ්චර්‍ය වූ බුද්ධ විලාසය ප්‍රකට කිරීමෙන් පහටු වූ (අතිශයින් සතුටු වූ) තුන් ලෝ වැස්සන් විසින් උසස් කොටැ ගායනු ලබන සාධු නාද සිය දහසින් ඉහළ නඟන ලද දිශා මණ්ඩල ඇති වැ. කලට දෙසට තැනට සුදුසු වූ බුදු විලස් පහළ කිරීමෙන් තුන් ලෝ වැස්සෝ පහටු වෙති. පහටු වැ සාධු නාද සිය දහස් ගණන් නඟති. සකල දිශා මණ්ඩලය එයින් පිරී ඉහළ නැඟෙන්නා මෙන් වෙයි. 'ප්‍රකටන' නම් පෙන්වීම සි. ප්‍ර + හෘෂ් + ත = ප්‍රහෘෂ්ට. 'ප්‍ර' පූර්ව 'හෘෂ්' ධාතුව ප්‍රකර්ෂයෙන් (අතිශයින්) සතුටු වීමෙහි යෙදේ. ත්‍රිලෝකයන් ගේ සමාහාරය ත්‍රෛලොක්‍ය සි. ත්‍රිලොක + ය = ත්‍රෛලොක්‍ය මෙහි 'ය' ප්‍රත්‍යය ස්වාර්ථ සි. සම් + උද් + ශ්‍රි + ත = සමුච්ඡ්‍රිත. අතිශයින් උස් කරන ලද. 'උද්' පූර්ව 'ශ්‍රි' ධාතුව උඩට නැඟීමෙහි යෙදේ. **නිරාලොක ලොකාලොක කරණයෙන්** — (ලොක + ආලොක) ආලොක නැති ලොකය ආලොක කිරීමෙන්. ධර්මය නැති හෙයින් ලොකය නිරාලොක යැ. ධර්මය දෙසීමෙන් එය ආලොක කැරෙයි. ආ + ලුක් + අ = ආලොක. 'ලුක්' (දැකීමෙහි) ධාතු සි.

61. **බුද්ධත්වය** — ('බුද්ධත්තවය' යනු මුද්‍රණ දෝෂ සි.) බුද්ධ භාවය. 'ත්ව' යනු ද ('තා' යනු මෙන් මැ) භාවයෙහි තද්ධිත ප්‍රත්‍යය සි. **බුද්ධ කාරක ධර්‍ම** — බුද්ධත්වය සිද්ධ කරන ධර්‍ම. දශ පාරමිතා. **පූර්ව සර්වඥ ප්‍රවරොපසෙවිත වූ** — (ප්‍රවර + උපසෙවිත) පූර්ව බුද්ධ ප්‍රවරයන් විසින් සෙවුනා ලද්දා වූ. ප්‍රකර්ෂයෙන් වර (අතිශයින් උතුම්) වූයේ ප්‍රවර සි. උප + සෙව් + ඉ + ත = උපසෙවිත. 'සෙව්' (සෙවනයෙහි) ධාතු සි. **සර්වඥ ලක්ෂ්මී නාටිකා ප්‍රස්තාවනා විධි කුශල වූ ප්‍රකට නට විභ්‍රමාභිරාම වූ** — බුද්ධ ශ්‍රී නම්වැති නාටිකාව හඳුන්වා දීමේ විධියෙහි දක්ෂ වූ ප්‍රකාශ වූ නට විලාසයෙන් අතිරමණීය වූ. මේ කියැවෙන දශ පාරමිතාව අභිරාම යැ (අතිශයින් රමණීය යැ.) කිමෙකින් අභිරාම ද? ප්‍රකට වූ නට විභ්‍රමයෙන්

(ප්‍රකාශ වූ නට විලාසයෙන්- නළු විලසින්) අභිරාම යැ. කොබඳු වූ ප්‍රකට නට විභ්‍රමයෙන් ද? බුද්ධ ශ්‍රී නමැති නාටිකාව හැඳින්වීම කිරීමෙහි දක්ෂ වූ ප්‍රකට නට විභ්‍රමයෙන්. බුද්ධ ශ්‍රීය නාටිකාවකි. 'නාටිකා' නම් රූපක විශෙෂයෙකි. Drama. මේ නාටිකාවෙහි ප්‍රස්තාවනාව (හඳුන්වා දීම) කරන නටයා (Actor) නම් දාන පාරමිතාව සි. ඒ නටයා ඒ නාටිකාවෙහි ප්‍රස්තාවනා විධියට (හැඳින්වීම කරන්නට) දක්ෂ යැ. ප්‍රකාශ වැ පෙනෙන්නා වූ නට විලාසයෙන් හේ අභිරාම යැ. සර්වඥතාවයට මූල පිරියැ යුත්තේ දාන පාරමිතාවෙනැ යි මේ හැඟැවූ සැටි යැ. **ශ්‍රාවක චාතක මනො නිර්වාපණෛක ධාරාධර ප්‍රථමාරම්භාගමෝන** වූ— (නිර්වාපණ + එක, ප්‍රථම + ආරම්භ.....) යදියන් නමැති කැදැත්තන් ගේ සිත නිවීමට එක මැ වැසි වලාවෙහි පළමු ආරම්භය වැනි වූ. නිර් + වා + ආප් + අන = නිර්වාපණ. 'නිර්' පූර්ව 'වා' ධාතුව නිවීමෙහි වැටේ. 'ආප්' යනු ප්‍රයොජ්‍ය ප්‍රත්‍යයය යි. 'අන' යනු භාව ප්‍රත්‍යයය සි. ධාරා (වැසි දහර) ධරනුයේ ධාරාධර සි. වැසි වලාවට නම්. කැදැත්තන් විසින් දිය පියැ හැක්කේ වැසි වස්නා විටැ යැ. **සකල දශබල නිශෙවිත** වූ— සියලු බුදුන් විසින් සෙවනය කරන ලද්දා වූ දශයක් බල යමක්හු හට ද හේ දශබල සි. නුවණ බල දශයක් ද ශරීර බල දශයක් ද ඇති හෙයින් බුදුහු දශබල නම් වෙත්. දස නුවණ බල පෙරැ දක්විණ. දශ ශරීර බල නම් කවරැ යත්:—

"කාලාවකංච ගඞ්ගෙය්‍යං පණ්ඩරං තම්බපිඞ්ගලං
ගන්ධමඞ්ගලහෙමං ච උපොසථ ඡද්දන්ති මෙ දස"

යනුයෙන් දක්වුණු ඇත් කුල දසයෙකි. පුරුෂයන් දස දෙනකු ගේ බල කාලාවක කුලයෙහි එක් ඇතකුට වෙසි. ඒ ඇතුන් දස දෙනකු ගේ බල එක් ගඞ්ගෙය්‍යයකුට වෙසි. සෙස්සවුන් කෙරෙහි දු මෙ මැ නය යි. ඡද්දන්ත ඇතුන් දශ දෙනකු ගේ බල බුදුනට වෙසි. මේ දශ කාය බල සි. නි + සෙව් + ඉත = නිශෙවිත. 'නි' පූර්ව 'සෙව්' ධාතුව සෙවනයෙහි වැටේ. **ශ්‍රී ඝන වචන විලාසයම මැ විෂය වූ අනුසස් ඇති**— බුදුන් ගේ වචන දීප්තිම මැ ගොචර වූ ආනිසංස (ඵල) ඇති. දූතයා ගේ අනුසස් අන් කිසිවකු විසින් කියා නිමැවියැ නො හැකි යැ. කියැ හැක්කේ බුදුන් ගේ වචනයෙන් මැ යැ. ශ්‍රීයෙන් ඝන වූයේ ශ්‍රීඝන සි

බුදුනට මේ නමෙකි. වච් + අන = වචන. කීම යි. 'වච්' (කීමෙහි) ධාතු යි. මෙහි 'විලාස' නම් දීප්තිය යි. **වජ්‍රාසනාරෝහණයට**— (වජ්‍ර + ආසන + ආරෝහණ) විදුරසුනට නැඟීමට. **පියවර ඔබා ගන්නා**— අඩිය තබා ගන්නා. **වෙදිකා ස්ථානයෙහි සිටියා වූ** — පිළ් වැ සිටියා වූ. පිළ බවට පැමිණියා වූ. පිළ වියැ යුතු තන්හි සිටියා වූ. උස් අසුනකට නැඟීමට පිළක් හෝ පඩියක් හෝ වුව මනා යැ. එක් වර මැ අසුනට නො නැඟිය හැකි හෙයිනි. වජ්‍රාසනට නැඟීම පිණිස පය තබා ගන්නට වූයේ දාන පාරමිතා නමැති වෙදිකාව යි. Platform. බුදු වන්නට නම් පළමු කොටැ දාන පාරමිතාව පිරියැ යුතු බව මෙසේ කියැවිණ. **දායකයා**— දෙන්නා. දන් දෙන තැනැත්තහු. දායක තෙමේ සකල ලොකයාට ප්‍රිය වෙයි. **වශ්‍යාඤ්ජනායමාන වූ**— (වශී + අඤ්ජන) වශග කරන (බැඳැ ගන්නා) අඳුනක් වැනි වූ. **ඉෂ්ටාර්ථ පුෂ්ටි කරන්නා වූ**— අභිමතාර්ථ වඩා (සිද්ධ කොටැ) දෙන්නා වූ. පුෂ් + ති = පුෂ්ටි. 'පුෂ්' (පොෂණයෙහි) ධාතු යි. **මාතෘ ස්ථානයෙහි** - මවු තන්හි. මවු තනතුරෙහි. **සිටිය**— සිටියා යැ. **සඛී ස්ථානයෙහි**— යෙහෙළි තනතුරෙහි. සර්වඥ ශ්‍රීය කාන්තාවකි. ඒ කාන්තාව ගෙනැ අවුද් සුමෙධයන් හා එක් කළ යුතු යැ. ඒ එක් කරන්නී දාන පාරමිතා නමැති සඛී තොමෝ යැ. **හො මැ**— ඕ තොමෝ මැ. දාන පාරමිතාව මැ. **කාමෞඝාදි චතුරෞඝ නිස්තරණයට**— (කාම + ඔඝ + ආදි) කාම ප්‍රවාහය ආදි සතර ප්‍රවාහයෙන් එ තෙර වීමට. ඔඝ නම් ප්‍රවාහය යි (සැඩ පහර යි.) යම් සේ ප්‍රවාහය අසු වූ සත්ත්වයා ඇදැ ගෙනැ ගොස් සාගරයෙහි හෙළා ද එ මෙන් මැ කාමාදීහු අසු වූ සත්ත්වයා ඇදැ සංසාරයෙහි හෙළයි. කාම දෘෂ්ටි භව අවිද්‍යා යන මොහු චතුරෞඝයෝ යැ. නිස් + තෘ + අන = නිස්තරණ 'නිස්' පූර්ව 'තෘ' ධාතුව එ තෙර වීමෙහි වැටේ. **සේතු ස්ථානයෙහි**— හෙය (පාලම) වියැ යුතු තන්හි. සේ බැවෙහි. හෙය වැ. **ආහ්වානයෙහි**— කැඳැවීමෙහි. ආ + හ්වෙ + අන = ආහ්වාන. 'ආ' පූර්ව 'හ්වෙ' ධාතුව කැඳැවීමෙහි වැටේ. **මහා මුද්‍රා වැ**— මහා මුද්‍රා ස්ථානයෙහි. මහා මුද්‍රාව (The great seal) ඔබා (පිහිටුවා) යැවූ කැඳැවීම කවුරුන් වුව ද ගෙන්වීමට සමර්ථ යැ. ඒ අණ කඩ කළ නො හැකි යැ. රජුගේ මහා මුද්‍රාව හංස රූපයෙකින් යුක්ත යැ. එ හෙයින් එයට හංස මුද්‍රා යනු ද නම්. 'හස් ඔබා' 'අස් ඔබා' යනාදිය කියැවුණේ මේ මුද්‍රාව පිහිටිවීම

සලකා ගෙනැ යැ. **රක්ඛණීය**— රැකියැ යුතු. රක්ෂ් + අනීය = රක්ෂණීය. **සබ්බ සත්ත සාධාරණ** වූ— සියලු සත්ත්වයනට සමාන වූ. සියල්ලනට එක සේ ඇති. **බලී කොටැ දීද්**— බිල්ල කොටැ දී වුව ද. (ජීවිතය) පුදා වත්. **එ මැ**— ඒ දාන පාරමිතාව මැ.

**62.** **කබමි**— ඉ ති රි කො රෙ මි. **වමි වමි**— හ ල මි. වැහෙන්නට හරිමි. 'වම' ධාතුව (කළයෙකින් දිය මෙන්) නිකුත් වීමෙහි වැටේ. 'වම්වමි' යනු ප්‍රයොජ්‍ය රූප යි. **ආධ්‍යාත්මික**— ශරීරයට **අයත්**. ආත්මය (ශරීරය) අධිකෘත කොටැ (සම්බන්ධ කොටැ) වූයේ ආධ්‍යාත්මික යි. අධි + ආත්මන් + ඉක = ආධ්‍යාත්මික. **වෛදූර්‍ය**— වෙරළු. නිල් වන් මිණි වෙශෙසෙකි. **බාහ්‍ය**— බැහැරි වූ. ශරීරයට අයත් නුවූ. බැහැරැ වූයේ බාහ්‍ය යි. බහිර් + ය = බාහ්‍ය. **සම්ප්‍රාප්ත** වූ— සැපැමිණියා වූ. සම් + ප්‍ර + ආප් + ත = සම්ප්‍රාප්ත. 'ආප්' (පැමිණීමෙහි) ධාතු යි. **සසර කතර**— සංසාර නමැති කාන්තාරය. **දාන පාරමිතා අවලම්බන යෂ්ටිය**— දාන පාරමිතාව නමැති එල්බෙන ලීය (සැර යටිය.) ශක්ති මඳ වූ විටැ එල්බෙන හෙයින් (එයට වැර දී එහි පිහිට ලැබැ සිටුනා හෙයින්) සැර යටිය අවලම්බන යෂ්ටි නමි. අව + ලම්බ් + අන = අවලම්බන. 'අව' පූර්ව 'ලම්බ්' ධාතුව එල්බීමෙහි වැටේ. **අධිෂ්ඨාන**— ඉටා. සිතින් ස්ථිර වැ සිටැ. අධි + ස්ථා + අන = අධිෂ්ඨාන. 'අධි' පූර්ව 'ස්ථා' ධාතුව පිහිටා සිටීමෙහි වැටේ.

**63.** **ප්‍රතිඥා**-- පිළිණ. ලොකයෙහි 'පොරොන්දු' යැ යි කියති. ප්‍රති + ඥා. 'ඥා' දැනීමෙහි ධාතු යි. **භඞ්ගයක්**— බිඳීමක්. කඩ කිරීමක්. **ශක්‍ර බ්‍රාහ්මණයාට**— බ්‍රාහ්මණ වෙශයෙන් ආ ශක්‍රයාට. **පස් පෑ දිස්නා**— පස් පැහැය (පඤ්චවර්ණය) දෘශ්‍යමාන වන්නා වූ (පෙනෙන්නා වූ.) '**ශාමි**' යි— 'බඩැ ගිනි ඇත්තෙමැ' යි. **සහ වෑ**— ශක වැ. සාවා වැ. **සගින්**— බඩැ ගින්නෙන්. සා + ඉන් = සගින්.

**64.** **මෙ තෙක් මතු**— මෙ පමණක් මැ. **ඔහු**— ඒ බුද්ධකාරක ධර්මයෝ. **සකල මනොමල ප්‍රක්ෂාලනෛක සලිල ස්‍රොතසමාන** වූ— (ප්‍රක්ෂාලන + එක.) සියලු සිත් කිලුටු සේදීමට එක මැ (අසහාය) දිය ඉසිමක් වැනි වූ. මනස් + මල = මනොමල රාගද්වෙෂාදීහු සිත කිලුටු කෙරෙත් නු යි මනොමල නම් වෙත්. ප්‍ර + ක්ෂල් + අන = ප්‍රක්ෂාලන. 'ප්‍ර' පූර්ව

‘ක්ෂල්’ ධාතුව සේදීමෙහි වැටේ. සිච් + අ = සේක. ‘සිච්’ (ඉසීමෙහි) ධාතු යි. **සකල දශබල බලාධාර සනම්භාශමාන වූ**— (බල + ආධාර) සියලු බුදු බලයට ආධාර වැ සිටි මැඩික් බඳු වූ. ආ + ධෘ + අ = ආධාර. ‘ධෘ’ (දැරීමෙහි) ධාතු යි. **ව්‍යාප්ත වූ**— පැතිරී. වි + ආප් + ත = ව්‍යාප්ත. ‘වි’ පූර්ව ‘ආප්’ ධාතුව පැතිරීමෙහි වෙයි. **වසන්ත මාරුතානීත**— (මාරුත + ආනීත) වසන්ත (ඍතුයෙහි) සුළඟින් ගෙනැ එන ලද. වසන්තය මල් සමය යි. එ කලැ සුළඟ එ හෙයින් සුවඳවත් යැ. වාතයට අධිපති දෙවි ‘මරුත්’ නම් වෙයි. මරුත්හු අයත් වූයේ මාරුත යි. මරුත් + අ = මාරුත. ආ+ණී + ත = ආනීත. ‘ආ’ පූර්ව ‘නී’ ධාතුව ගෙනැ ඒමෙහි වැටේ. **මන්දාකිනී ජල බින්දු සන්දොහයෙනුදු**— අහස් ගඟෙහි දිය බිඳු සමූහයෙන් පවා. අහස් ගඟට ‘මන්දාකිනී’ යනු නාමෙකි.

“මන්දාකිනී වියද්ගඞ්ගා ස්වර්නදී සුරදීර්ඝිකා” ......

යනු ඒ සඳහා අමර වචන යි. සම් + දුහ් + අ = සන්දොහ. ‘දුහ්’ යනු (කිරි) දෙවීම් අර්ථයෙහි ධාතු යි. ‘සම්’ පූර්ව ‘දුහ්’ ධාතුව එක් වරැ (එකට) දෙවීමෙහි වැටී. එක් වරැ දෙවූ කිරි රැස සන්දොහ නම් වේ. පසු වැ කවර රාශියක් වුව ද ‘සන්දොහ’ නාමයෙන් ගැනෙන්නට වියැ. **ක්ලේශ සන්තාපය**— ක්ලෙශ තැවුලිය. කෙලෙස් නමැති දැහාය. **චතුස්සාගර වාරි ධාරා පරිෂෙකයෙනුදු**— සතර සාගරයෙහි දිය දහර ඉසීමෙන් පවා. පරි + සිච් + අ = පරිෂෙක. සතර දිගැ පිහිටි සාගරයෝ සතර සාගරයෝ යැ. **අශමනීය වූ**— සන්සිඳුවියැ නො හැකි වූ. **රාග රජස්**— රාග නමැති ධූලි. **තද්දශිතොද්භූත වසන්ත මාරුත සන්තොෂ කොශ නිර්භීත හෘදය ඇති වූ**— (තත් + දශිත + උද්භූත) (‘උද්භූත වූ’ යනු මුද්‍රණ දොෂ යි. ‘වූ’ යන්න අධික යි. ‘නිර්භීත’ යනු ‘නිර්භාත’ යැ යි ශුද්ධ කළ යුතු.) එය (ශීල පාරමිතාව) දැකීම් නමැති ඉහළ නැඟුණු වසන් සුළඟින් සන්තොෂ වූ මල් කැකුළක් මෙන් පෙනුණා වූ හද ඇති වැ. “අතිශයින් සතුටු සිත් ඇති වැ” යැ යූ සේ යි. දෘශ් + අත ශිත. උද් + භූ + ත = උද්භූත. ‘උද්’ පූර්ව ‘භූ’ ධාතුව ඉහළ නැඟීමෙහි වැටේ. සම් + තුෂ් + අ = සන්තොෂ. මෙහි සන්තොෂ නම් මල් කැකුළ පිපීම යි: වසන් සුළඟින් මල් කැකුළු පිපෙයි. ‘කොශ’ යනු මෙහි මල් කැකුළට නමී. නිර් + භා + ත = නිර්භාත. ‘නිර්’ පූර්ව ‘භා’ ධාතුව ප්‍රකාශ වීමෙහි වැටෙයි.

**සකල බුද්ධ කාරක ධම්ම ගණ සිඛා මණි** වූ— සියලු බුද්ධ කාරක ධර්ම (බුදු කුරු දහම්) සමූහයට සිළු මිණි (මුදුන් මිණි) වූ. සියලු බුදුකුරු දහම් අතුරෙහි අත්‍යුත්තම වූ. **එක ඇසක්**— තමාට ඇති එක මැ ඇස. **කියන ලද මැ යි**—

"කිකී ව අණ්ඩං චමරී ව වාලධිං
පියං ව පුත්තං නයනං ව එකකං
තථෙව සීලං අනුරක්ඛමානකා
සුපෙසලා හොථ සදා සගාරවා" ......යි.

කිරළ බිජුවට (රක්නා) මෙන් ද, සෙමෙර වාලධිය (රක්නා) මෙන් ද, එක මැ පිය පුතු, එක මැ ඇස, (රක්නා) මෙන් ද, එ සේ මැ සීලය රක්නාහු, සියලු කල්හි සුපෙශල වවු, ගෞරව සහිත වවු **කිරළක**— කිරළ දෙන ඉතා මහත් ප්‍රේමයෙන් බිජු රකී ල. **සෙමරක**— සෙමර මුව දෙන ඉතා මහත් ආදරයෙන් වාලධිය රකී ල. **බිය සක් වැ**— ඉතා මහත් සැලැකිල්ලෙන්. "මා ගේ සිල් කොපස් බිඳේ දෝහෝ" යි බිය ඇති වැ (සුපරීක්ෂ්‍යකාරි වැ.)

**65. ශ්වාස මාත්‍රයෙකින්**— සුසුම් හෙළූ පමණෙකින්. ශ්වස් + අ = ශ්වාස. 'ශ්වස්' (ශ්වාසයෙහි) ධාතු යි. **භෙදයෙක්**— බිඳීමෙක් කඩ වීමෙක්. භිද් + අ = භෙද. 'භිද්' (බිඳීමෙහි) ධාතු යි. **තීක්ෂ්ණ**— තියුණු. **කණ්ටක**— කටු. **රාජාභිෂෙකයෙහි**— (රාජ+අභිෂෙක) රජ බවට පමුණුවනු පිණිස හිසැ දිය ඔතා කල්හි. අභි + සිච් + අ = අභිෂෙක. තුන් කුලයෙහි ඇත්තන් තුන් සකින් හිසැ පැන් වත් කිරීම අභිෂෙකය යි පෙරෙවි බමුණු දක්ෂිණාවර්ත ශඞ්ඛයක් ද ක්ෂත්‍රිය කන්‍යාව ස්වර්ණ ශඞ්ඛයක් ද වෛශ්‍ය කන්‍යාව රජත ශඞ්ඛයක් ද ගනී. **උෂ්ණීෂ පට්ටය**—නළල් පට. **ද්වෙෂ විකාරයක්**— ක්‍රොධයෙන් හට ගත් චිත්ත විපර්‍යාසයක්.

**66. ද්වන්ද්වය**— දෙක.

**67. නිරවධි නිරුපධි ගුණ ගණ නිධාන** වූ— සීමා රහිත වූ ද වංචා රහිත වූ ද ගුණ සමූහයට නිධාන වූ. අවධි නම් සීමාව යි. අව + ධා + ඉ = අවධි 'අව' පූර්ව 'ධා' ධාතුව බහා තැබීමෙහි වැටේ. 'උපධි' නම් වංචාව යි (රැවැටීම යි.) උප + ධා + ඉ = උපධි. 'උප' පූර්ව 'ධා' ධාතුව සැඟැවීමෙහි වැටේ. නි + ධා + අන = නිධාන. 'නි' පූර්ව 'ධා' ධාතුව ඇතුළත්හි බැහීමෙහි වැටේ. **සකල බොධි සත්ත්ව වික්‍රමෛක සාධ්‍ය**— (වික්‍රම + එක) (පෙළෙහි 'බොධි' යනු ඌනය යැ.)

සියලු බෝ සතුන් විසින් වික්‍රමයෙන් මැ (වික්‍රම නම් වූ එකින් මැ) සිද්ධ කළ යුතු වූ. සාධ් + ය = සාධ්‍ය. 'සාධ්' (සිද්ධ කිරීමෙහි) ධාතු යි. **නෛෂ්ක්‍රම්‍ය**— ගෘහි වාසයෙන් නික්මී තපසට යෑම නෛෂ්ක්‍රම්‍ය යි. 'නිෂ්ක්‍රම' නම් නික්මීම යි. නිස් + ක්‍රම් + අ. = නිෂ්ක්‍රම. 'නිස්' පූර්ව 'ක්‍රම්' ධාතුව නික්මීමෙහි වැටේ. නිෂ්ක්‍රමය මැ නෛෂ්ක්‍රම්‍ය යි. නිශ්ක්‍රම + ය = නෛෂ්ක්‍රම්‍ය. මෙහි 'ය' ප්‍රත්‍යය ස්වාර්ථ යි. සිද්ධිය මෙසේ දක්වුව ද 'නෛෂ්ක්‍රම්‍ය' යනු ශුද්ධ සංස්කෘතයෙහි නො ලැබෙන්නෙකි. එහි ලැබෙනුයේ 'නෛෂ්කාම්‍ය' යනු යි. නිෂ්කාමියා ගේ භාවය නෛෂ්කාම්‍ය යි. ගෘහීන් පිළිබඳ වූ කාමයෙන් වෙන් වූයේ නිෂ්කාමී යි. **සර්ව බෝධි සත්ත්ව සන්දෘෂ්ට**— සියලු බෝ සතුන් විසින් මනා සේ දක්නා ලද. සම් + දෘශ් + ත = සන්දෘෂ්ට. **මහා බෝධි සත්ත්ව ප්‍රභව සාමර්ථ්‍ය විශේෂ ඇති**— මහ බෝ සතුන් ඉපැදවීමෙහි විශේෂ වූ සමර්ථ බව ඇති. සමර්ථයා ගේ භාවය සාමර්ථ්‍ය යි. සමර්ථ + ය. **සකල ප්‍රව්‍රජ්‍යා ගුණ ගණ මාණික්‍ය මහා නිධාන** වූ— සියලු පැවිදි ගුණ සමූහ නමැති මැණික් (පිරූ) මහා නිධානය වූ. **භවාශාව**— (භව + ආශාව) සසරෙහි ආශාව. (භූ + අ) භව නම් වීම යි. නැවැත නැවැත ඉපැදීම් වශයෙන් වනුයෙන් සසර භව නම් වේ. **නිරන්තරාභ්‍යාසිත**— (නිරන්තර + අභ්‍යාසිත) නිරතුරු පුරුදු කරන ලද. අභි + අස් + ඉ + ත = අභ්‍යාසිත. 'අභි' පූර්ව 'අස්' ධාතුව පුරුදු කිරීමෙහි වැටේ. **විභවාභිප්‍රායයෙන්**— නිර්වාණාධාශයයෙන්. භවයෙන් විගත වූයේ විභව යි. සසරින් මිදෙනු නිවන් ලද වීමැ යැ. එ හෙයින් විභව නම් නිවනි. අභි + ප්‍ර + ඉ + අ = අභිප්‍රාය. 'අභි' 'ප්‍ර' පූර්ව 'ඉ' ධාතුව සම්මතියෙහි වැටේ. **අහිවාතක රෝග උපද්‍රුත**— අහිවාතක නම් රෝගයෙන් උවදුරු සහිත වූ අහිවාතක නම් සංක්‍රමණ (බෝ වන) රෝග විශේෂයෙකි. දැන් මහාමාරි නාමයෙන් ගැනෙන රෝගය වැන්නෙකි. 'අහි' යනු නයාට නමි. සඳුන් ගස්හි මල් පිපුණු කලැ නයින් ඒ ගස් වෙළා ගෙනැ මලට තුඹු දී සුස්මති යි ද, ඒ විෂ, වාතය හා එක් වැ අවුත්, මේ රෝගය උපදවති යි ද, එ හෙයින් රෝගය අහිවාතක නම් වෙති යි ද යෙති. රුජ් + අ = රෝග. 'රුජ්' (රිදීමෙහි) ධාතු යි. උප + ද්‍රු + ත = උපද්‍රුත. 'උප' පූර්ව 'ද්‍රු' ධාතුව පහර දීමෙහි වැටේ. **ජනපදයෙන්**— දෙශයෙන්. ජනයෝ ගමනට පදිත් ද

(යෙත් ද) ඒ ජනපද යි. පද් + අ = පද. **භිත්ති බිඳැ ගෙනැ—** යම් ගෙදරකට අහිවාතක රෝගය පැමිණියේ නම්, රෝගයෙන් දුරු වනු කැමැත්තවුන් විසින් ගෙයි භිත්ති බිඳැ ගෙනැ පලා යා යුතු ය. භිද් + ති = භිත්ති. බෙදිම යැ යනු අර්ථ යි. 'භිද්' (බිඳීමෙහි) ධාතු යි. **නිරපෙක්ෂ වැ—** අපෙක්ෂා රහිත වැ. තවත් ඒ ගෙය ගැනැ තැකීමක් නැති වැ. **පඤ්ච කාමානුභවයෙහි—** පස් කම් සැප විඳීමෙහි. කම් + අ = කාම. 'කම්' (ඇල්මෙහි) ධාතු යි. අනු + භූ + අ = අනුභව. 'අනු' පූර්ව 'භූ' ධාතුව විඳීමෙහි වැටේ. **සඤ්ජාත** වූ— හට ගන්නා වූ. සම් + ජන් + ත = සඤ්ජාත. 'ජන්' (ඉපැදීමෙහි) ධාතු යි. **සංවේගයෙන්—** තැති ගැන්මෙන්. සම් + විජ් + අ = සංවේග 'සම්' පූර්ව වූ 'විජ්' ධාතුව තැති ගැන්මෙහි වැටේ. **නරණ්—** පලිතයක්. පැසුණු කෙසක්. 'නරෙරෙ' යනු දෙමළ යි. **චක්‍රවර්ති—** චක්‍ර රත්නානුභාවයෙන් සතර මහ දිවයින මැ අනුශාසනය කරන රජ. චක්‍රයෙන් වර්තනය (පැවැත්ම) ස්වභාවය වූයේ යමක්හු ගේ ද, හේ චක්‍රවර්ති යි. චක්‍ර + වෘත් + ඉන් = චක්‍රවර්තින්. මේ චක්‍ර රත්නය නම් රථාඞ්ගයෙකි (රථ චක්‍රයෙකි.) කී හ ගුත්තිල කාරයෝ-

“ සක් රුවන නම් ස          කි
නොයෙක් රුවනුදුල එක් රතහෙ          කි” ......යී.

චක්‍ර රත්නානුභාවයෙන් සපිරිවර රජ අහසින් යෙයි.

68. **සම්බෝධි ඥාන සම්භවෛක බීජායමාන** වූ— (සම්භව + එක) බුදු නුවණ ඉපැදීමට එක මැ බිජුවට වැනි වූ. **නෙත්‍රයට වඩා අති නෙත්‍ර** වූ— ඇසට වඩා අධික ශක්තිය ඇති ඇසක් වූ. ඇසට නො පෙනෙන දෑ ප්‍රඥාවට පෙනෙන හෙයින් ප්‍රඥාව අතිනෙත්‍රයෙකි. හසුරුවනුයේ නෙත්‍ර යි. නී + ත්‍ර = නෙත්‍ර **සකලාකුශල ප්‍රපඤ්ච ප්‍රතික්ෂේපක ප්‍රතිහාරී ධුරන්ධර** වූ— (සකල + අකුශල) සියලු පාපයන් ඇතුළු වීම වළකන්නා වූ ද්වාරපාලිකා ධුරය ධරන්නා වූ. ප්‍රඥාව සියලු අකුසල් දුරු කෙරෙයි. ප්‍රඥායෙන් ආදීනව සැලැකු කලැ අකුශලයම රිසි නූපදී. ප්‍රති + ක්ෂිප් + අක = ප්‍රතික්ෂේපක. 'ප්‍රති' පූර්ව 'ක්ෂිප්' ධාතුව වැළැක්වීමෙහි වැටේ. ප්‍රති + හෘ + අ = ප්‍රතිහාර. ද්වාර පාලයා යැ. ස්ත්‍රීලිඞ්ගයෙහි 'ඊ' ප්‍රත්‍යය වීමෙන් 'ප්‍රතිහාරී' යනු වෙයි. උපසර්ගාන්තයෙහි ස්වරය දීර්ඝ වීමෙන් 'ප්‍රතීහාරී' යනු ද වේ. 'ප්‍රති' පූර්ව 'හෘ' ධාතුව පරාවර්තනයෙහි (ඉදිරියම එන්නවුන් හරවා යැවීමෙහි)

වැටේ. ධුරය දරනුයේ ධුරන්ධර සි. **අනුජාත වූ**— අනු වැ උපන්නා වූ. සියලු බෝ සතුන් අනු වැ ප්‍රඥාව ද උපදී. **ආත්ම ද්විතීය කොට**— තමා (තමාට මැ) දෙවනු කොටැ. තමා මැ අම්තා එකෙක් අන්‍යකකු අම්තා නම්, එ තන්හි ඇමැතුණේ ඇමැතුවහුට ද්විතීය වෙයි. **සර්ව ගුණ පවිත්‍ර චිත්‍ර නිෂ්පාදනෛක වර්ණ තූලිකායමාන** වූ -(නිෂ්පාදන+එක) සියලු ගුණ නමැති පිරිසුදු සිතියම **නිපැදවීමට** එක මැ සායම් තෙල්ල වැනි වූ. ප්‍රඥාව නම් සියලු ගුණ සිතියම් කොටැ දක්වන එක මැ තෙලි තුර යැ. **නිස් + පද් + අන = නිෂ්පාදන.** 'නිස්' පූර්ව 'පද්' ධාතුව ඉපැදීමෙහි වැටේ 'වර්ණ' යනු සායමට නම්. 'තූලිකාව' නම් තෙල්ල සි. 'Paint brush' යනුයෙන් ඉංගිරිසියෙන් ගැනෙනුයේ වර්ණ තූලිකාව සි. **විඥයන්**— පණ්ඩිතයන්. ප්‍රාඥයන් විශෙෂයෙන් දනී නු සි විඥ නම් වේ. වි + ඥ + අ = විඥ. 'ඥ' (දැනීමෙහි) ධාතු සි. **සුදුසු මැ නු**— සුදුසු මැ නො වේ ද? 'නු' යනු පරිවිතර්කයෙහි නිපාත සි. **නිපීඩ්‍ය ජාඩ්‍ය නිගඩ බන්ධ විච්ඡෙදන විද්‍යා බද්ධකක්ෂ වූ**— නිඃශෙෂයෙන් පෙළියැ යුතු වූ ජඩ බව නමැති ය දම් බැඳුම සිඳීමේ ශාස්ත්‍රයෙහි කැස පට කවා ගත්තා වූ (සැරසුණා වූ) නි + පීඩ් + ය = නිපීඩ්‍ය. 'නි' පූර්ව 'පීඩ්' ධාතුව පෙළීමෙහි වැටේ. නිපීඩ්‍ය වනුයේ ජාඩ්‍යය සි. ජඩයා ගේ (මෝඩයා ගේ) භාවය ජාඩ්‍ය සි. ජඩ + ය = ජාඩ්‍ය. 'නිගඩ' නම් හැකිල්ල සි, පා බඳනා ය දම සි. බන්ධ් + අ = බන්ධ. 'බන්ධ්' (බැඳීමෙහි) ධාතු සි. වි + ඡිද් + අන = විච්ඡෙදන විශෙෂයෙන් සිඳැ දැමීම සි. 'ඡිද්' (සිඳීමෙහි) ධාතු සි. දත යුත්ත විද්‍යා යැ. විද් + ය + ආ = විද්‍යා, 'විද්' දැනුම්හි ධාතු සි. 'ආ' යනු ස්ත්‍රී ප්‍රත්‍යයය සි. 'විච්ඡෙදන විද්‍යා' නම් සිඳීමේ (කැපීමේ) ශාස්ත්‍රය සි. 'කක්ෂ' යනු කැස පටට (වස්ත්‍ර නතායට නම්. බර කාර්යකට සැරසෙනුයේ කැස පට ගෙනැ ඉණෙහි ගන්නා ගති මේ යැ. 'කැස පට කවා ගැනීම' නම්. බද්ධ වූ කක්ෂය (කවන ලද කැස පට) ඇතියේ බද්ධකක්ෂ සි. 'විච්ඡෙදන විද්‍යා බද්ධකක්ෂ' නම් සිඳැ දැමීමේ ශාස්ත්‍රයට (සිඳැ ලන්නට) සැරසුණේ යැ. **සකල බුද්ධ කාරක ධර්ම** ධුර්‍ය වූ සියලු බුදුකුරු දහම් **දැරීමට** සුදුසු වූ. ධුරයට (දැරීමට) සුදුසු වූයේ (ධුර් + ය) ධුර්‍ය සි **දිවස භාගය හා අවිනාභාවී වූ**— දවල් කාලය හා නො වෙන් වන සුලු වූ. විනාභාවතාය (වෙන් වීම) විනාභාව සි. විනාභාවය ස්වභාවයා

වූයේ **යමක්** හට ද හේ විනාශභාවී. න විනාශභාවී අවිනාශභාවී. සූර්යයා දිවස භාගයෙන් නො වෙන් වීම සවභාවය යි. එ හෙයින් සූර්යයා දිවස භාගය හා අවිනාශභාවී යැ. **අක්‍රම විවර්තමානාතික්‍රාන්ත නක්‍ර චක්‍රාකුල** වූ— (විවර්තමාන + අතික්‍රාන්ත; චක්‍ර + ආකුල) ක්‍රම රහිත වැ (එක් වරැ) භ්‍රමණය වන්නා වූ ඉක්මවන ලද (පසු කරන ලද) කිඹුල් සමූහයා විසින් ආකුල වූ (ගැවැසී ගත්තා වූ.) ක්‍රමය නැත්තේ යමෙක්හි ද ඒ අක්‍රම යි. 'පිළිවෙළක් නැති වැ' 'එක් වරැ' යනු අර්ථ යි. සමුද්‍රජ සත්ත්වයන් පෙරළෙන අයුරු මෙයින් කී හ. 'විවර්තමාන' යන්නෙහි අර්ථ නම් 'කර කැවෙන්නා වූ'— 'ඒ මේ අතැ පෙරළෙන්නා වූ' යනු යි. අති + ක්‍රම් + ත = අතික්‍රාන්ත. 'ඉක්මවන ලද' යනු අර්ථ යි. කවුරුන් විසින් අතික්‍රාන්ත ද යනු අප්‍රකාශ යැ. ඌනපදයෙකැ යි හැඟේ. 'නක්‍ර' යනු කිඹුලාට නම්. එ හෙත් කිඹුල්ලු මුහුදෙහි නැති. 'නක්‍ර රාජ' යැ යි මෝරාට නමෙක් වෙයි. 'චක්‍ර' නම් සමූහය යි. **සාගර කුක්ෂියෙහි**— සයුර තුළැ. **පඤ්ච වර්ණ පද්මයෙන්**— පස් වණෙහි පියුමින්. **සැදුම් ගත්තා** වූ— අලඞ්කෘත වූ. **ගෙ දිග් විලෙකැ**— ගෘහදීර්ඝිකා තටාකයෙකැ.

**70. ප්‍රඥාවිරොධ නිරොධ නිෂ්ප්‍රත්‍යූහ ප්‍රබොධ ඇති**— (ප්‍රඥා + අවිරොධ) ප්‍රඥාවට අවිරොධ වූ නිරොධයට (නිර්වාණයට) බාධක නුවූ පිබිදීම (වැටැහීම්) ඇති. නුවණ අනු වැ ගියා වූ නිවනට අනුකූල වූ අවබොධ ඇති. වි + රුධ් + අ = විරොධ. 'රුධ්' (වැළැක්මෙහි) ධාතු යි. න විරොධ අවිරොධ නි + රුධ් + අ = නිරොධ. නිර්වාණයට නම්. ප්‍රති + ඌහ් + අ = ප්‍රත්‍යූහ. 'ප්‍රති' පූර්ව 'ඌහ්' ධාතුව සම්බාධයෙහි වැටේ. ප්‍රත්‍යූහ නම් සම්බාධය යි. ප්‍රත්‍යූහයෙන් නික්මුත් වූයේ නිෂ්ප්‍රත්‍යූහ යි. නිස් + ප්‍රත්‍යූහ. ප්‍ර + බුධ් + අ = ප්‍රබොධ. **ක්ෂාන්ති**— ඉවැසීම. ක්ෂම් + ති = ක්ෂාන්ති. 'ක්ෂම්' ඉවැසීමෙහි ධාතු යි. **සර්වගුණවත්**— සකල ගුණයෙන් යුක්ත වූ. **සකල සාධු ජන කාන්ත** වූ— සියලු සත්පුරුෂ ජනයනට ප්‍රිය වූ. **පිරි යැ යුත්තී යැ**— සම්පූර්ණ කළ යුතු යැ. **සත් මැසි**— වයස සත් මසක් වූ. **සුකුමාර**— ඉතා කොමල වූ. **තීක්ෂ්ණ** වූ **ධාරා**— තියුණු වූ මුවහත්. **අශ්‍රාන්ත** වූ— විඩා නුවූ. **මෛත්‍රී ධාරායෙන්** මෛත්‍රී නමැති දිය දහරින්. **ආර්ද්‍ර** වූ තෙත් වූ. **නෙත්‍රොත්පල පත්‍ර**— නෙත්‍ර + උත්පල) ඇස් නමැති මහනෙල් (මල්) පෙති. තමන් මරවන රජු දෙස මෛත්‍රියෙන් බැලූ බව මේ කී සැටි යැ.

**71. චතුරාර්‍ය සත්‍ය ප්‍රතිවේධයට**— උතුම් වූ සත්‍ය සතර අවබෝධ කිරීමට. සත්‍ය සතර නම් දුඃඛ සමුදය නිරෝධ මාර්ග (දුක, දුකට හේතුව, දුකට හේතුව නැති කිරීම, දුකට හේතුව නැති කිරීමේ මාර්ගය යන මේ යැ. 'ප්‍රතිවේධ' යනු පටිවේධ යන පාලිය බලා සංස්කෘත කැරුණක් සේ පෙනේ. **මහා කාරණ** වූ— මහත් හෙතුව වූ **සද්ගුණාවිරෝධ**— (ගුණ + අවිරෝධ) සත් ගුණයට (යහපත් ගුණයට) විරුද්ධ නුවූ. **නිත්‍ය** වූ— නො වැනැසෙන්නා වූ. **ප්‍රාණය නාශා ද**— දිවි යතත්. **නො සිතා**— නො සලකා. **ඕහට**— පෝරිසාදයාට. **බත් වන්නට**— ආහාර වන්නට.

**72. සකල බොධිපාක්ෂික ධර්මාධිෂ්ඨාන** වූ— සියලු බොධි පාක්ෂික ධර්මයනට උතුම් ස්ථාන වූ. සත්‍යාවබොධයට පක්ෂ වූ ධර්මයෝ බෝධි පාක්ෂික ධර්ම නම් වෙත්. සතර සම්‍යක්ස්මෘත්‍යුපස්ථාන (සතිපට්ඨාන), සතර සම්‍යක් ප්‍රධාන, සතර ඍද්ධිපාද, පඤ්චෙන්ද්‍රිය, පඤ්ච බල, සප්ත බොධ්‍යඞ්ග, ආර්‍ය අෂ්ටාඞ්ග මාර්ග යන මොහු යැ. **සකල ලෝක දුඃඛ ව්‍යපශමයෙහි එක දීක්ෂිත** වූ— සියලු ලෝකයා ගේ දුක් සන්සිඳිවීමෙහි අසහාය පුරෝහිත වූ. වි + අප + ශම් + අ = ව්‍යපශම. 'ශම්' (සන්සිඳිවීමෙහි) ධාතු යි. දීක්ෂ් + ඉ + ත = දීක්ෂිත. ''දීක්ෂ්' ධාතුව යාග (දෙව පූජා) කිරීමට ගුරු කම් ආදිය ලැබීමෙන් සැරැසීමෙහි වැටේ. එ සේ යාග ක්‍රියාවට සැරැසුණේ දීක්ෂිත යි. පුරාතනයෝ දුක් පැමිණි කලැ එය සන්සිඳිවීමට යාගාදිය කැරැවූ හ. **සර්ව තථාගත මනොරථ නිෂ්ඨා නිර්දිෂ්ට පරාක්‍රම ඇති**— සියලු බුදුවරයන් ගේ අභිලාෂයේ නිෂ්ඨායෙන් (නිමා වීමෙන්) දක්වන ලද බලය ඇති. සියලු තථාගතයන් ගේ මනොරථය නිෂ්ඨා වනුයේ අධිෂ්ඨානයෙනි. අධිෂ්ඨානයා ගේ පරාක්‍රමය එ බඳු නිෂ්ඨායෙන් මැ දක්වෙයි. තථා (එ සේ) ගත වූයේ යැ (ගියේ යැ) ආගත වූයේ යැ (ආයේ යැ) යන අර්ථයෙන් බුදුහු තථාගත නම් වෙත්. 'එ සේ' නම් පෙරැ බුදුවරුන් කළ සේ යැ. නි + ස්ථා + අ = නිෂ්ඨා. ස්ත්‍රීවියෙහි 'ආ' ප්‍රත්‍යය වීමෙන් නිෂ්ඨා. 'නි' පූර්ව 'ස්ථා' ධාතුව සම්පූර්ණ (කෙළවර) කිරීමෙහි වැටේ. නිර් + දිශ් + ත = නිර්දිෂ්ට. 'නිර්' පූර්ව 'දිශ්' ධාතුව දැක්වීමෙහි වැටේ. **ඉන්ද්‍රිය විකාරයක්**— ඉන්ද්‍රියයන් ගේ පෙරළියක් (වෙනස් වීමක්.) රූපාදි ආලම්බනයන් හමු වීමෙන් චක්ෂුරාදි ඉන්ද්‍රියයන් එයට ඇදීමෙන් වන විකාරය ඉන්ද්‍රිය විකාර යි.

**73. සමස්ත බුද්ධාඞ්කුරෛක මිත්‍ර**— (බුද්ධ + අඞ්කුර + එක) සියලු බොධි සත්ත්වයන් ගේ අසහාය (එක මැ) මිත්‍ර. **මනොරථ**

**නිෂ්පාදනෛක චරිත්‍ර**— (නිෂ්පාදන + එක) අභිලාෂ සමෘද්ධ කිරීමට අසහාය සිරිත වූ. 'චරිත්‍ර' යනු පැවැත්ම යැ ක්‍රියාව යැ ව්‍රත යැ යනාදි අර්ථ ඇත්තේ යැ. මේ කුමක් වුව ද මෙහි ගැළැපෙයි. චර් + ඉත්‍ර = චරිත්‍ර 'චර්' (හැසිරීමෙහි) ධාතු යි. **චිත්‍ර වූ**— ආශ්චර්ය වූ. 'පවිත්‍ර' යනු ද පාඨ යි. 'පිරිසුදු වූ' යනු අර්ථ යි. **නිජනෙත්‍ර නිර්විශෙෂ කොටැ**— සිය ඇස හා නො වෙනස් කොටැ. සිය ඇස මෙන්. **අසාධාරණෝත්සාහයෙන්**— (අසාධාරණ + උත්සාහයෙන්) අසමාන උත්සාහයෙන් අනුන් විසින් නො කළ හැකි උත්සාහයෙන්. උද් + සහ් + අ = උත්සාහ 'උද්' පූර්ව 'සහ්' ධාතුව (උත්සාහයෙහි, වෑයම් කිරීමෙහි) වැටේ. **ශ සාල්ලෙහි**— (පෙළෙහි 'ශ' යනු ඌනක යැ. පූරවා ගත යුතු.) අයොමය උද්බන්ධකයෙහි. 'සාලු' (සහලු) යනු යම් කිසිවක් උඩ එල්ලා තබන උපකරණයට නම්. 'උඩ හල්ල' යනු දනුදු ඇතැම් පෙදෙස්හි ව්‍යවහාර යි. කඳෙහි දෙ කෙළවරැ එල්වෙනුයේ ද සාලු නම්.

**74. මත්තෙහි ද**— ඔබෙහි ද. **සකල බුද්ධ සිංහ සමන්තචක්ෂුඃ ප්‍රතිලාභයට නිරපෙක්ෂෛක කාරණ වූ**— (නිරපෙක්ෂා + එක) සියලු බුදු උතුමන් ගේ සමතැස ලැබීමට අපෙක්ෂා නැති බවට අසහාය හෙතු වූ. අපෙක්ෂා නැති බව (තකා නෙතැ නො ඉන්නා බව) සමතැස් ලැබීමට අවශ්‍ය යැ. ඒ අපෙක්ෂා නැති බවට එක මැ හෙතුව නම් මේ කියැවෙන උපෙක්ෂාව යි. හාත්පස (සියල්ල) දක්නා ඇස් (දැනැ ගන්නා නුවණ) සමන්ත චක්ෂුස් නම්. ප්‍රති + ලභ් + අ = ප්‍රතිලාභ. 'ප්‍රති' පූර්ව 'ලභ්' ධාතුව ලැබීමෙහි වැටේ. මෙහි උපසර්ගය කුමක් සඳහා දැ යි අසතොත් මේ සැලැකිය යුතු:—

“ධාත්වර්ථං බාධතෙ කශ්චිත් කශ්චිත්තමනුවර්තතෙ
තමෙව විශිනෂ්ට්‍යර්ථං උපසර්ගගතිස්ත්‍රිධා”

කිසිවෙක් (කිසි උපසර්ගයෙක්) ධාත්වර්ථයට බාධා කෙරෙයි. කිසිවෙක් එය මැ (ඒ ධාත්වර්ථය මැ) අනු වැ වැටේ. (කිසිවෙක්) ඒ (ධාතු) අර්ථය මැ වෙසෙසයි. (මෙ සේ) උපසර්ග ගතිය ත්‍රිවිධ යැ. **බොල්**— සත.

**75. උත්කලිතොත්කලිත භව කල්මෂ දුර්ලබ්ධි ලසිත ඇති**— පලවන ලද පලවන ලද භවයට කිලුටු වූ මිථ්‍යා දෘෂ්ටිය ගේ දීප්ති ඇති. භව කල්මෂ වූ දුර්ලබ්ධිය ගේ දීප්තිය බොධි සත්ත්වයෝ පලවති, දුරු කෙරෙති, වනසති. එ හෙයින්

බෝ සත්හු නැවැත නැවැත පලවා හරින ලද භවදුෂ්කර මිථ්‍යා දෘෂ්ටීන්ගේ ලසිත ඇත්තෝ යැ. උද් + කල් + ඉ + ත = උක්කාලිත. 'උද්' පූර්ව 'කල්' ධාතුව පලවා හැරීමෙහි වැටේ. මෙහි ආම්‍රෙඩිතය (නැවැත නැවැත කීම) පුනඃපුනා උක්කාලිතය කළ බව හඟවීමට යැ. 'කල්මෂ' යනු මලිනත්වය (කිලුටුව) නම්. ලභ් + ති = ලබ්ධි. හැදෑහීම සි 'ලභ්' ධාතුව ලැබීමෙහි වැටේ. දුෂ්ට වූ ලබ්ධි (දුර් + ලබ්ධි) දුර්ලබ්ධි සි. ලස් + ඉ + ත = ලසිත. 'ලස්' ධාතුව දීප්තියෙහි වැටේ. **සුචරිතාදුල්ලලිත** වූ— (සුචරිත + අදුල්ලලිත) සුසිරිත කරණ කොටැ ගෙනැ දුශ්චෙෂ්ටිත (දුෂ්ට පැවැතුම් ඇති) නුවූ. ලල් + ඉ + ත = ලලිත. 'ලල්' (ලාලනයෙහි- සුරතල් කිරීමෙහි) ධාතු සි. දුෂ්ට සේ ලලිත වූයේ, ලාලනයෙන් දුෂ්ට වූයේ, දුල්ලලිත සි. න දුල්ලලිත අදුල්ලලිත. 'සුඤර' යනු ගත යුතු අර්ථය සි. **අනුමාර්ගණීය** වූ— සෙවියැ යුතු වූ. අනු + මාර්ග් + අනීය = අනුමාර්ගණීය. 'අනු' පූර්ව 'මාර්ග්' ධාතුව සෙවීමෙහි වැටේ. **ස්වීකරණීය සම්බොධි— සංසිද්ධි— සිද්ධාන්තොපදෙශාසමාචාර්‍ය— සඵානීය** වූ— (සිද්ධාන්ත + උපදෙශ + අසම + ආචාර්‍ය) තමාගේ බවට පැමිණිවියැ යුතු (කිම් කැරැ ගත යුතු) බුදු නුවණ මනා සේ සිදු කැරැ ගැනීමට ඒකාන්ත (නොවරදින) උවදෙස් දීමෙහි අසම වූ ආචාර්‍ය භාවයට සුදුසු වූ (ඇදුරු වැ සිටියැ යුතු වූ.) 'දස පැරුමන්' යන්නට විශෙෂණ සි. ඒ දස පැරුම්හු ඇදුරු වැ සිටියැ යුත්තෝ යැ. කෙබඳු වූ ඇදුරු වැ ද? අසම වූ- අතුල්‍ය වූ- අන් ඇදුරන් හා අසමාන වූ- ඇදුරු වැ. කුමකට ඇදුරු වැ ද? සිද්ධාන්ත උපදෙශ (නොවරදින ගුරුකම්) දීමට ඇදුරු වැ. කුමකට සිද්ධාන්ත උපදෙශ ද? සම්බොධිය මනා සේ සිද්ධ කැරැ ගැනීමට. කෙබඳු සම්බොධිය ද? ස්වීකරණීය වූ සම්බොධිය. ස්ව + කෘ + අනීය = ස්වීකරණීය. 'ස්ව' යන්නෙහි 'අ' කාරය 'කෘ' ධාතු පර හෙයින් ඊ වී යැ. 'ස්වකීය කළ යුතු' යනු අර්ථ සි. සම් + බුධ් + ඉ = සම්බොධි, මනා සේ (සත්‍ය) අවබොධ කිරීම, බුදු බව. සම් + සිධ් + ති = සංසිද්ධි. සිද්ධ වූ (නිශ්චිත වූ) අන්තය යමෙකින් ද ඒ සිද්ධාන්ත සි. උප + දිශ් + අ = උපදෙශ. 'උප' පූර්ව 'දිශ්' ධාතුව උපදෙශයෙහි (ගුරුකම් දීමෙහි) වැටේ. සම යනු නො වනු යමක්හු හට ද හේ අසම සි. ආ + චර් + ය = ආචාර්‍ය. 'ආ' පූර්ව 'චර්' ධාතුව හැසිරීමෙහි වැටේ. සඵා + අනීය = සඵානීය. **අනුලොමයෙන්**— මුලැ සිටැ අගට. **ප්‍රතිලොමයෙන්**— අගැ සිටැ මුලට. **ප්‍රත්‍යවෙක්‍ෂා කරන්**—

සිහි කරන කල්හි **ප්‍රති + අව + ඊක්ෂ් + අ + ආ = ප්‍රත්‍යවෙක්ෂා.** ‘ප්‍රති’ ‘අව’ පූර්ව ‘ඊක්ෂ්’ ධාතු සිහි කිරීමෙහි වැටේ. ‘ආ’ යනු ස්ත්‍රී ප්‍රත්‍යයය යි. **සියලු සර්වඥතා ඥානයට ධුර පැමිණි සිටි මහා පුරුෂයාණන්**— සියලු බුදු නුවණට බර උසුලන්නහු වැ සිටි (සියලු බුදු නුවණ දරා සිටි) උත්තම පුරුෂයාණන්. මේ දිවකුරු බුදුන් උදෙසා කියැවිණ. ‘ධුර’ යනු බර උසුලන්නහුට නම්. **නිරුපදේශයෙන්**— අන්‍යයක්හු ගේ උපදේශයක් නැති වැ. **බහල**— තද. ස්ථිර. **පවත්ත**— ආරම්භය. පටන් ගැන්ම. **ඔවුන් ගේ**— සුමේධයන් ගේ. **හඬා නො විඩා වන්නට**— හඬා (ගුගුරා) විඩා නො වන්නට. පළමු වර මැ ගුගුරන කලැ විඩා වෙයි. නුපුරුදු හෙයිනි. මහා පෘථිවියට ගුගුරන්නට මතු නො යෙක් වාර පැමිණෙයි. දැන් මැ ගුගුරන්නට පටන් ගෙනැ පුරුදු වූ කලැ මතු ගුගුරන කල්හි නො විඩා වෙයි. **අනුපම**— උපමා රහිත. උපමා නැතියේ යමකට ද ඒ (න + උපමා) අනුපම යි. **සන්දර්ශනයෙන්**— මනා සේ දැකීමෙන්. **යුවයක්හු**— තරුණයකු. සංස්කෘතයෙහි ‘යුවන්’ යනු තරුණයාට නම්. **සප්ත කුලාචල බබ්බර කුලය හා එක් වැ**— (කුල + අචල) සත් කුල පවු නමැති අසභ්‍ය සමූහයා හා එකතු වී. මහා මෙරුව **අධික සුරා පානයෙන් මත් වූ තරුණයකු මෙන්** නටයි. **කුල පර්වතයෝ ද අසභ්‍යයන් මෙන් නටත්.** දෙ පසෙහි ඇත්තෝ එක් වැ නටන්නවුන් වැන්නෝ යැ. පෘථිවිය කම්පිත වූ කලැ මෙරු පර්වතාදීන් චලිත වූ බව මේ හී සැටි යැ. සැලෙනුයේ චල යි. චල් + අ = චල. ‘චල්’ සැලුම්හි ධාතු යි. න චල අචල. පර්වතයට නම්. රා පිම් කලහ කිරීම් ආදි අශිෂ්ට පැවැතුම් ඇත්තෝ බබ්බර නාමයෙන් ගැනෙති. ඉංගිරිසියෙහි ‘Barbarion’ යනු ද ‘බබ්බර’ යනු ද රූපයෙන් පමණක් නො වැ අර්ථයෙනුදු සමාන යැ. බබුරන් ගේ පැවැතුම් රහල් මහ තෙරහු මෙ සේ දක්වති:—

“ අ රා අ ත ය පණ අමොරා මුහුරැ හෙ ල
බොරා ම ත ය තන් දෙබිමින් කල විකා ල
පු රා මැ ත ය සහවන මොළ බබුරැ සැ ල
ප රා ප ත ය බල පෙර මිහැ බේරැව ල ”

**අනවස්ථිත වැ**— අස්ථිර වැ. කෙළින් සිටි යැ නො හැකි වැ. වැනෙමින්. අධික වැ සුරා පානය කළවුන් ගේ නැටුම් එ බඳු මැ නු? අව + ස්ථා + ත = අවස්ථිත. ‘අව’ පූර්ව

'ඨා' ධාතුව ස්ථිර වැ සිටීමෙහි වැටේ. න අවස්ථිත අනවස්ථිත.

**76. ලෝකෝත්සව**— (ලෝක + උත්සව, ලෝක ප්‍රමෝදය ලෝකයාට ප්‍රීති ජනක ක්‍රියා උද් + සූ + අ = උත්සව 'උද්' පූර්ව 'සූ' ධාතුව ප්‍රීති ජනක ක්‍රියායෙහි වැටේ 'සූ' ධාතුව සමාන්‍යයෙන් වැටෙනුයේ ඉපැදවීමෙහි (වැදීමෙහි) යැ **නරාමර**— (නර + අමර) මිනිස්හු දිව්‍යා. **පූර්වංගම කොට**— පෙරටු කොට. පූර්වයෙහි (පුරා වැ) යනුයේ පූර්වංගම යි. පූර්වං + ගම් + + අ = පූර්වංගම. 'පූර්වං' යනු විභක්ති ගෙනැ සිටියේ යැ. **ව්‍යාකරණ ප්‍රතිලාභයෙන්**— විවරණ ලැබීමෙන්. වි + ආ + කෘ + අන = ව්‍යාකරණ. 'වි' 'ආ' පූර්ව 'කෘ' ධාතුව ප්‍රකාශනයෙහි වැටේ. **ශෝචක**— සුදු. ඒ ස්ථානය සමන් මලින් වැසී තුබූ හෙයින් ශෝභන පදම වනයක් වැන්නැ. **පිය පැහැරැ**— පියා පත් (පක්ෂ) ගසා. **ධාතරාෂ්ට්‍ර**— මේ හංස කුලයෙකැ නාමය යි. **පුෂ්පාසනයෙන්**— පුෂ්ප + (ආසනයෙන්) (බුදු පාමොක් මහා සඞ්ඝයා විසින් පුදන ලද) මලින් තැනුණු අස්නෙන්.

**77. ෂඩභිඥ**— සයක් අභිඥ වනු යමක්හු හට ද හේ ෂඩභිඥ යි. බුදුනට මේ නමි. අභිඥ නම් උතුම් නුවණ යි. දිව ඇස් නුවණ, දිව කන් නුවණ, පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණ, පර සිත් දන්නා නුවණ, ඍද්ධි විධ නුවණ, ආශ්‍රවයන් ක්‍ෂය කරන නුවණ, යන මේ යැ ෂඩභිඥ නමි. **සමන්තභද්‍ර** – සියල්ලෙන් සුන්දර. බුදුනට නමී. **සර්ව මඞ්ගලෛක නිදාන වූ**—(මඞ්ගල+එක) සියලු මඞ්ගලයනට එක මැ හේතු වූ. මෙහි මඞ්ගල නම් ශුභ කාරණ යි **අභිමත**— ඉෂ්ට. කැමැති. අභි + මන් + ත= අභිමත. 'අභි' පූර්ව 'මන්' ධාතුව රිසියෙහි වැටේයි **ඵලවත්නා වූ** පමුණුවන්නා වූ. උපදවන්නා වූ. **ආදි මධ්‍යාන්ත කල්‍යාණ වූ**— (මධ්‍ය + අන්ත) මුල මැද අග ශුභ වූ (යහපත් වූ.) සර්ව සුන්දර වූ.

---

## 2. කෞණ්ඩින්‍ය විවරණ කථා

---

**1. ගාම්භීර්‍ය මකරාකර වූ**— ගැඹුරු බව කරණ කොටැ ගෙනැ සාගරය වැනි වූ. ගම්භීරයා ගේ භාවය (ගම්භීර+ය) ගාම්භීර්‍ය යි. මකරයනට (මොරුනට) ආකර මකරාකර යි. **විශ්වලෝක ප්‍රියංකර වූ**— සර්වලෝකයට ප්‍රියය කරන්නා වූ. **ශ්‍රී පාද මූල ප්‍රතිලබ්ධ**— සිරි පා මුල්හිදී ලැබූ. ප්‍රති + ලභ් + ත=

ප්‍රතිලබ්ධ. **පූරණාභිප්‍රායයෙන්**— (පූරණ + අභිප්‍රාය) පූරන අදහසින්. **දුස්තර**— දුක සේ තරණය කළ යුතු එතෙර වීම දුෂ්කර වූ දුස්+තෘ+අ= දුස්තර. 'තෘ' ධාතුව එතෙර වීමෙහි වෙයි. **සංසාර සාගරාවතීර්ණ වූ**— (සාගර+අව...) සසර සයුරට බැසැ. අව + තෘ + ත= අවතීර්ණ. 'අව' පූර්ව 'තෘ' ධාතුව (යම් කිසිවකට) බැසැ ගැන්මෙහි වැටේ. **විචිත්‍ර පවිත්‍ර චරිත්‍ර සම්බන්ධයෙන්**— විසිතුරු පිරිසුදු සිරිත් (හැසුරුම්) කරණ කොටැ ගෙනැ. **ත්‍රිභුවන**— තුන් ලොව. ස්වර්ග මර්ත්‍ය පාතාල යනාදි විසින් ලොව ත්‍රිවිධ වේ. **පාවනය**— ශුද්ධිය. පිරිසුදු කිරීම. පූ+අන= පාවන. 'පූ' (පිරිසුදු කිරීමෙහි) ධාතු යි. **භව- යෝනි- ගති- විඥානස්ථිති- සත්ත්වාවාසයෙහි**— භව යැ යෝනි යැ ගති යැ විඥාන ස්ථිති යැ. සත්ත්වාවාස යැ යන මෙහි. 'භව' නම් ලෝකය යි. එය ත්‍රිවිධ යැ කාම රූප අරූප විසින්. 'යෝනි' නම් උත්පත්ති ක්‍රමය යැ. අණ්ඩජ ජලාබුජ සංසේදජ ඖපපාතික විසින් ඒ චතුර්විධ යැ.

> "අණ්ඩජා පක්ඛිසප්පාදි නරාදී තු ජලාබුජා
> සේදජා කිමිඩංසාදි දේවාදි ත්වොපපාතිකා"......

පක්ෂි සර්පාදීහු අණ්ඩජයෝ යැ (බිජු වලින් උපදනාහු යැ) මිනිස්සාදීහු ජලාබුජයෝ යැ (දලබුවෙන් උපදනාහු යැ.) කෘමි දංශකාදීහු සේවදජයෝ යැ (සේවදයෙන් උපදනාහු යැ.) දේවාදීහු ඖපපාතිකයෝ යැ (නිකම් මැ පහළ වැ උපදනාහු යැ.) 'ගති' නම් ජන්මය යි. දිව්‍ය මනුෂ්‍ය තිරශ්චීන ප්‍රේත නරක යැ යි. ඒ පඤ්ච විධ වෙයි. 'විඥාන ස්ථිති' නම් විඥානය සිටුනා පරිදි යි. ඒ සප්ත විධ යැ, නානත්තකායා නානත්තසඤ්ඤී යැ නානත්තකායා ඒකත්තසඤ්ඤී යැ, ඒකත්තකායා නානත්තසඤ්ඤී යැ, ඒකත්තකායා ඒකත්තසඤ්ඤී යැ, ආකාසානඤ්චායතන යැ, විඤ්ඤාණඤ්චායතන යැ, ආකිඤ්චඤ්ඤායතන යැ යි. විස්තර ධර්මප්‍රදීපිකාදියෙන් දත යුතු. 'සත්ත්වාවාස' නම් සත්ත්වයන් වසනා තැනි. ඒ නව විධ යැ. සප්ත විඥාන ස්ථිතියට අසඤ්ඤසත්ත නෙවසඤ්ඤානාසඤ්ඤා යන දෙක එක් කළ කල්හි නවය පිරෙයි. **කරුණා ව්‍රත පරිණතත්වයෙන්**— කරුණා ව්‍රතය (කරුණායෙහි පැවැත්ම) පිළිබඳ මුහුකළ (මේරූ) බැවින්. 'ව්‍රත' නම් පින් සිදු කරන පැවැතුම්. උපවාසාදිය යි. කරුණාදියෙන් පැවැත්ම කරුණා ව්‍රත යි. පරි + නම් + ත= පරිණත. 'පරි' පූර්ව 'නම්' ධාතුව (මිහිකිරීමෙහි) වැටේ. පරිණතයා ගේ භාවය (පරිණත + ත්ව) පරිණතත්වය යි. **ලෝකාර්ථ පාණ්ඩිත්‍යයෙන්**— (ලෝක+අර්ථ) ලොවට වැඩ සිදු කිරීමෙහි පණ්ඩිත භාවයෙන්.

පණ්ඩිතයා ගේ භාවය (පණ්ඩිත + ය) පාණ්ඩිත්‍ය සි. **විවිධාශවසී සාහිත්‍යයෙන්**— (විවිධ + ආශවසී) නානාවිධ වූ ආශවසීයන් සහිත බැවින්. නොයෙක් ආශවසීයන් ගෙන් යුක්ත බැවින්. විභින්න වූ (වෙනස් වෙනස් වූ) විධයන් (ආකාරයන්) වනු ලූමෙකැ ද ඒ (වි + විධ) විවිධ සි. සහ් + ඉ + ත = සහිත. 'සහ්' (ඉසිලීමෙහි) ධාතු සි. 'උසුලන ලද' 'ඇති'— යනු 'සහිත' යන්නෙහි අර්ථ සි. සහිතයා ගේ භාවය (සහිත+ය) සාහිත්‍ය සි. **අඥාන රාහිත්‍යයෙන්**— නුනුවණ රහිත භාවයෙන් (නැති බැවින්.) 'ඥාන' නම් (ඥා + අන) දැන්ම සි. 'ඥා' (දැනුම්හි) ධාතු සි. න ඥාන අඥාන. 'හරන ලද' — 'දුරු කරන ලද' යනු 'රහිත' යන්නෙහි අර්ථ සි. රහ්+ඉ+ත රහිත. 'රහ්' (ත්‍යාගයෙහි-හැරදැමීමෙහි) ධාතු සි. රහිතයා ගේ භාවය (රහිත+ය) රාහිත්‍ය සි. **සාඞ්ගත්‍යයෙන්**— එක් වැ ගිය (එකතු වූ) බැවින්. සම්+ගම්+ත= සඞ්ගත. 'සම්' පූර්ව 'ගම්' ධාතුව එක් වැ යැමෙහි වැටේ. සඞ්ගතයා ගේ භාවය (සඞ්ගත + ය) සාඞ්ගත්‍ය සි. **ලෝකෝත්සව ප්‍රසවය**— ලෝක ප්‍රීති නිපැදවීම **එක් අසඞ්ඛ්‍යයක්**— එක් අසඞ්ඛ්‍ය කල්පයක්. **සර්වඥාලෝක විරහයෙන්**— (සර්වඥ + ආලෝක) බුද්ධ නමැති ආලෝකය දුරු වීමෙන්.* වි+රහ්+අ= විරහ. 'රහ්' ත්‍යාගයෙහි ධාතු සි. **එකාන්ධකාර** වූ— (එක+අන්ධකාර) එකම අඳුරු වූ. ඝනාන්ධකාර වූ. නිරතුරු අඳුරු වූ. **ජගත්හි**— ලෝකයෙහි. 'ජගත්' යනු ලෝකයට නමි. **අනල්ප සඞ්කල්ප සිද්ධ කාරණ** වූ— නො මඳ වූ (බොහෝ වූ) අදහස් සිදු වීමට හෙතු වූ. න අල්ප අනල්ප. සම් + කෲප් + ප= සඞ්කල්ප. 'සම්' පූර්ව 'කෲප්' ධාතුව අදහස්හි වැටේ. ඉච්ඡා, අධිෂ්ඨාන, ප්‍රාර්ථනා ආදී අනෙකාර්ථයන්හි 'සඞ්කල්ප' යනු යෙදෙයි. කෘ+අණ= කාරණ කරවන්නේ කාරණ සි. **අලෝකසාමාන්‍ය** වූ— (අවශේෂ ලෝකයා හා සමාන බවක් නැත්තා වූ. ලෝකෝත්තර වූ. සමානයා ගේ භාවය (සමාන+ය) සාමාන්‍ය සි. ලෝකයා හා සාමාන්‍යය වනු යමක්හු හට ද ඒ ලෝකසාමාන්‍ය සි. න ලෝකසාමාන්‍ය අලෝකසාමාන්‍ය. **සර්ව සම්මාන්‍ය** වූ— සියල්ලන් විසින් බුහුමන් කළ යුතු වූ. සම්+මාන්+ය= සම්මාන්‍ය. 'මාන්' (බහුමානයෙහි) ධාතු සි. **නිරතාතිශය ප්‍රාධාන්‍ය ධන්‍යතා සම්බන්ධ බන්ධුර** වූ— යෙදුණා වූ අතිශය ප්‍රධාන භාවය හා පුණ්‍යවද්භාවය හා සම්බන්ධයෙන් රම්‍ය වූ. නි + රම් + ත= නිරත. 'රම්' (ඇලීමෙහි) ධාතු සි. අති+ශි+අ= අතිශය. 'ශි' (වැතිරීමෙහි) ධාතු සි. බෙහෙවින් වැතිර (හෙවැ) සිටීම අතිශය සි. ප්‍රධානයා ගේ භාවය

(ප්‍රධාන + ය) ප්‍රාධාන්‍ය යි. ධනයට හිත වූයේ (ධන + ය) ධන්‍ය යි. 'පින්වත්' යනු අර්ථ යි. ධන්‍යයා ගේ භාවය ධන්‍යතා යැ. අතිශය ප්‍රධාන භාවය ද ධන්‍ය භාවය ද ඒ කෞණ්ඩින්‍ය ස්වාමීන් කෙරෙහි නිරත යැ (ඇලුණේ යැ.) ඒ සම්බන්ධයෙන් ඒ ස්වාමීහු බන්ධුරයෝ යැ (රම්‍යයෝ යැ.) **පරම සෞජන්‍ය සම්භාවිත වූ**— ඉතා උතුම් සුජන භාවය (දයා ක්ෂමාදිය) කරණ කොටැ ගෙනැ බුහුමන් කරන ලද්දා වූ. සුජනයා ගේ භාවය (සුජන+ය) සෞජන්‍ය යි. සම් + භූ + ඉ+ත= සම්භාවිත. 'සම්' පූර්ව 'භූ' ධාතුව බුහුමනෙහි වැටේ. **දෞර්මනස්‍යය සම්බන්ධයෙන් අකලුෂිත වූ**— දෞර්මනස පිළිබඳ වැ (දොම්නස් අතින්) නො කිලිටි වූ. දොම්නසක් නැති.) දුෂ්ට වූ මනස යමක්හු ගේ ද හේ (දුර්+මනස්) 'දුර්මනස්' නම් වේ. දුර්මනස්හු ගේ භාවය දෞර්මනස්‍ය යි. කලුෂ+ඉ+ත= කලුෂිත. කිලුටු කරන ලද. **රුචිරාමර චාමර ග්‍රාහිණී විභ්‍රම භූෂිත වූ**— (රුචිර+අමර) සිත් කලු වූ දිව්‍ය චාමර ගත්තවුන් ගේ (චාමර ගත් දිව්‍ය ස්ත්‍රීන් ගේ) ලීලායෙන් අලඞ්කෘත වූ. චමරයා ගෙන් (චමරයා ගේ වාලධියෙන්) කැරුණේ (චමර+අ) චාමර යි. 'චමර' යනු සෙමෙර මුවාට නම්. ගන්නේ 'ග්‍රාහින්' (ග්‍රහ්+ඉන්) නම් වේ. 'ග්‍රහ්' ගැනීමෙහි ධාතු යි. ස්ත්‍රී ප්‍රත්‍යයය (ඊ) වීමෙන් 'ග්‍රාහිණී' යනු වෙයි. වි+භ්‍රම්+අ= විභ්‍රම. 'වි' පූර්ව 'භ්‍රම්' ධාතුව විශෙෂයෙන් භ්‍රමණයෙහි වැටේ. භූෂ්+ඉ+ත= භූෂිත. 'භූෂ්' (අලඞ්කාරයෙහි) ධාතු යි. **ච්‍යුත වූ**— සැවැ. අනක් වී. මැරී. ච්‍යු+ත= ච්‍යුත. 'ච්‍යු' (අස් වැ යෑමෙහි) ධාතු යි. **සමස්තාභීෂ්ට වස්තු සාඞ්ගත්‍යයෙන් පරම රම්‍ය වූ**— (සමස්ත+අභීෂ්ට) සියලු අභිමත වස්තු එකතු වීමෙන් අතිශයින් සිත් කලු වූ. අභි + ඉෂ් + ත= අභීෂ්ට. **සකලාද්භුත ප්‍රසූති නන්ද වූ**—(සකල+අද්භුත) සියලු ආශ්චර්යයන් ඇති වීමෙන් සන්තුෂ්ට වූ. ප්‍ර+සූ+ති= ප්‍රසූති. ඉපැද්මට නමි. **අති විශිෂ්ට සම්පත් පුෂ්ටින්**— ඉතා උතුම් සම්පත් වැඩීමෙන්. පුෂ් + ති= පුෂ්ටි. **ප්‍රසවයෙන්**— (මවු කුසින්) බිහි වීමෙන් ප්‍ර + සූ + අ= ප්‍රසව. **සර්වාද්භුත**— සියලු ආශ්චර්ය. **දෙ තිස් පෙර නිමිති**. **නව යුවති නයන චුලුක නිපේය නව යෞවන ශ්‍රී මදිරායෙන්**— අභිනව තරුණීයන් ගේ ඇස් නමැති චුලුකයෙන් (ගෙනැ) පානය **කළ යුතු** වූ අභිනව තරුණ භාව නමැති සුරායෙන්. ඒ බෝසතුන් ගේ නව යෞවනය සුරාවක් බඳු යැ. මත් කරවන හෙයිනි. 'චුලුක' යනු අතොළොස්සට ද ඔබමට ද නමි. කුමක් වුව ද මෙහි යෙදේ. නි + පා+ය= නිපෙය. 'පා' (බීමෙහි) ධාතු යි. **ජන නයන මොහනය**— ජනයන් ගේ ඇස් මුළා කිරීම (ප්‍රීතියෙන්

**මත් කිරීම.**) මුහ්+අන= මොහන. **ස්ව දෙහ රුචි**—'රුචිර' යනු මුද්‍රණ දෝෂ යි. ස්වකීය ශරීර දීප්ති. (කාන්ති.) **විදිත**— දන්නා ලද. විද් + ඉ + ත= විදිත. 'විද්' (දැනීමෙහි) ධාතු යි. **ශුද්ධාවාස**— 'ශුද්ධාවාස' නම් බඹ ලොවෙකි. **උද්විග්න වූ**— තැති ගෙන. කලකිරී. උද් + විජ් + ත = උද්විග්න. 'උද්' පූර්ව 'විජ්' ධාතුව තැති ගැන්මෙහි වැටේ. **සාභිලාෂ වූ**— අභිලාෂ ඇති වූ. අභිලාෂ සහ වූයේ සාභිලාෂ යි. **සුරෙන්ද්‍ර සමාන** - ශක්‍රයා වැනි. **ආඪ්‍ය**— ධනවත්. **චාරු බිම්බාධර වූ**— (බිම්බ + අධර) මනොඥ වූ බිඹු පල (කෙම් ගෙඩි) වැනි යටි තොල් ඇති වූ. **ගණයා**— සමූහයා. **ආජීවකයා**— භික්ෂූහු. සිහමින් තපස් කරන්නා. **කල්‍යාණ**— ශුභ. **ශාල-කල්‍යාණ**— පෘථිවිය ඇතුළත්හි දී මැ සර්වාඞ්ග සම්පූර්ණ වැ මතු වන වෘක්ෂයෙකැ යි යෙති. බුදු කෙනකුට බෝධි වන කාලයෙකැ මැ පහළ වේ ල. සෙසු කල්හි පෘථිවිය ඇතුළත්හි ම වේ ල. **චතුරඞ්ග වීර්‍ය්‍යාධිෂ්ඨාන පූර්වඞ්ගම වූ**— අඞ්ග සතරෙකින් යුත් ස්ථිර වූ අධිෂ්ඨානය පෙරටු කොටැ ඇති වූ. "ශරීරයෙහි සම ගැලැවී විසිර ගියා ද බුදු වූ මිසැ නො නැගෙමි" යනු එක් අඞ්ගයෙකැ, "නහර- ඇට- ගැලැවී විසිර ගිය ද.....නො නැගෙමි" යනු දෙකෙකැ, මස් ලේ වියැළී ගියා ද.....නො නැගෙමි" යනු එකෙකැ යි මෙ සේ අඞ්ග සතරෙකි. **මාරාන්ධකාර නීහාර සංහාර දිවාකර වූ**— (මාර + අන්ධකාර) මාරයා ගේ අන්ධකාර නමැති පිනි වැනැසීමට සූර්‍ය්‍යයා වූ. මාරයා ගේ අන්ධකාරය පිනි නම් බුදුහු සූර්‍ය්‍යයා යැ. 'නීහාර' යනු පින්නට නමි. සම් + හෘ + අ= සංහාර. 'සම්' පූර්ව 'හෘ' ධාතුව විනාශයෙහි වැටේ. **සමධිගත**— මනා සේ අධිගම (අවබොධ) කරන ලද. සම් + අධි + ගම් + ත = සමධිගත. 'අධි' පූර්ව 'ගම්' ධාතුව අවබොධයෙහි වැටේ. **නිගම**— මහ ගම්. **ධර්මානුවර්ති වූ** — (ධර්ම + අනුවර්ති) ධර්මයට අනු වැ පවත්නා වූ. අනු + වෘත් + ඉන් = අනුවර්තින්. **විනයානුවර්ති වූ**— විනයයට අනු වැ පවත්නා වූ. **නවොදිත**— (නව + උදිත) අභිනව වැ උදා වූ. **චන්ද්‍ර මණ්ඩලාභිමුඛ වූ**— සඳ මඬලට ඉදිරි වැ. සඳ මඬල දෙසට මුහුණ ලා. **පීයූෂ පාන රසික වූ**— අමෘත පානයෙහි ආශා ඇති වූ. මෙහි අමෘතය නම් චන්ද්‍ර රශ්මිය යි. චකෝරයෝ සඳ රස් බොත් ල. රස දන්නෝ (රස + ඉක) රසික යි. **චකෝර ශාවකයක්හු**— ('සාවකයක්හු' යනු මුද්‍රණ දෝෂ යි.) ඇටි කුරුළු පැටියකු. 'ශාව' යනු පැටියාට නමි. ශාවයා මැ

(ශ්‍රාව + ක) ශ්‍රාවක යි. 'ක' යනු ස්වාර්ථයෙහි තද්ධිත ප්‍රත්‍යයය යි. **බුද්ධප්‍රමුඛ**— බුදුන් ප්‍රධාන කොටැ ඇති. බුදුපාමොක්. ප්‍රකෘෂ්ට වූ මුඛය (ආරම්භය) ප්‍රමුඛ යි. ප්‍රධානයාට නම්. **ආහාර-විහාරයෙන්**— ආහාරයෙන් හා විහාරයෙන් හා. විහාර නම් වසනා තැන් (සෙනසුන්.)

**3. අස්ථිර** වූ— ස්ථිර නුවූ. අනිත්‍ය වූ. **නිරභිලාෂ වැ**— අභිලාෂ නැති වැ. **පිටක ත්‍රයක**— සූත්‍ර, අභිධර්ම, විනය, යන පිටක තුන. **පර්‍යවසානයෙහි**— කෙළවර. පරි + අව + සෝ + අන = පර්‍යවසාන. 'සෝ' ධාතුව කෙළවර කිරීමෙහි වැටේ. **සප්ත රත්න සමලඞ්කෘත** වූ— සත් රුවනින් මනා සේ අලඞ්කාර කරන ලද. චක්‍ර, හස්ති, අශ්ව, මාණික්‍ය, පුත්‍ර, ගෘහපති, ස්ත්‍රී, යන මොහු චක්‍රවර්තිහු ගේ සප්ත රත්නයෝ යැ. සම් + අලම් + කෘ + ත = සමලඞ්කෘත. 'අලම්' පූර්ව 'කෘ' ධාතුව සැරසීමෙහි යෙදෙයි. **සතර ඍද්ධියෙකින්**— සතර අද්භූත බලයෙකින්. සිරුරින් දිව සුවඳ හැමීම, මුවින් මහනෙල් මල් සුවඳ හැමීම, දෙව් පුතුන් සතර දෙනකු කඩු ගෙනැ සතර දිගැ රකවල් ගැන්ම, අහසින් යෑම, යන මේ සක්විත්තන් ගේ සතර ඍද්ධි යි. ඍධ් + ති = ඍද්ධි. ඍධ් (වෘද්ධියෙහි) ධාතු යි. **නානාවිධ**— අනේකප්‍රකාර වූ. **ශව ශත නිචිත** වූ — මළ සිරුරු සිය ගණනින් පිරුණා වූ. 'ශව' යනු මළ සිරුරට නම්. ශව් + අ = ශව. 'ශව්' (විකාරයෙහි) ධාතු යි. නි + චි + ත = නිචිත. 'චි' (රැස් කිරීමෙහි) ධාතු යි. **බොධි සම්භාර ධර්මයන්**— බුද්ධ කාරක ධර්මයන්. **ස්වයම්භූ ඥානයෙන්**— පරොපදෙශ රහිත වැ තමා විසින් මැ ඇති වූ නුවණින්. **පසක් කළා** වූ— ප්‍රත්‍යක්ෂ කළා වූ.

## 3. මඞ්ගල විවරණ කථා

**1. අශබල දශබල ගුණ ෂණ්ඩ මණ්ඩිත**— කබර නො ඉසුණා වූ (පිරිසුදු වූ) බුද්ධ ගුණ සමූහයෙන් සැරසුණා වූ. 'ශබල' ('ශවර' යි ද සිටී) නම් කබර ඉසුණාක් මෙන් තන්හි තන්හි විවිධවර්ණ වැ සිටීම යි. ශබල නැතියේ යමෙක්හි ද ඒ අශබල යි. මණ්ඩ් + ඉ + ත = මණ්ඩිත. 'මණ්ඩ්' (සැරසීමෙහි) ධාතු යි. **අන්තර්ධානයෙහි**— අතුරුදහන් වීමෙහි. අන්තර් + ධා + අන = අන්තර්ධාන 'අන්තර්' යනු ඇතුලෙහි යන අර්ථ ඇත්තේ යැ. 'ධා' (බැහීමෙහි) ධාතු යි. **ශ්‍රීඝන ඝන ඝන**

**ප්‍රවචනාමෘත ධාරාභිෂෙකනෙසන්**— (ප්‍රවචන + අමෘත; ධාරා+ අභිෂෙක) බුද්ධ නමැති ඝන වූ මෙඝයන් (වැසි වලා කුළින්) ධර්ම නමැති අමෘත ධාරා ඉසීමෙන්. වැසි වළා කුලට 'ඝන' යනු නමෙකි ප්‍රකෘෂ්ට වූ (අත්‍යුත්තම වූ) වචනය ප්‍රවචන යි. තෙවලා බුදු බණට මේ නමෙකි. 'අමෘත' යනු ජලයට ද නම් වේ. **ලොක නිර්වෘතියක්**— ලොව සැනැසීමක්. නිර් + වෘ + ති = නිර්වෘති, 'නිර්' පූර්ව 'වෘ' ධාතුව සැනැසිල්ලෙහි වැටේ **පරම දුඃඛාක්‍රාන්ත** වූ— (දුඃඛ + ආක්‍රාන්ත) ඉතා මහත් දුකින් මඩනා ලද්දා වූ. ආ + ක්‍රම් + ත = ආක්‍රාන්ත. 'ආ' පූර්ව 'ක්‍රම්' ධාතුව ඇක්මෙහි- (පසින් මැඩීමෙහි) වැටේ **ස්වර්ගාපවර්ග රසානභිඥ වූ**— (ස්වර්ග + අපවර්ග, රස + අනභිඥ) ස්වර්ග මොක්ෂ රසය (සුවය) නො දන්නන් වූ. අප + වෘජ් + අ = අපවර්ග. 'අප' පූර්ව 'වෘජ්' ධාතුව මොක්ෂයෙහි වැටේ න අභිඥ අනභිඥ. එ කලැ දහම් නැති හෙයින් සත්ත්වයන් සතර අපා දුකට මැ වැටුණු බව මේ කී සැටි යැ. **නිමග්න** වූ— ගැලුණා වූ. නි + මජ් + ත = නිමග්න. 'මජ්' ධාතුව ගැලීමෙහි වැටේ. **නිර්විකල්ප ධර්ම සංකල්ප නිරන්තර** වූ— නියත වූ ධර්මාධ්‍යාශයයන් ගෙන් නිරතුරු වූ. අනවරතයෙන් නිර්විකාර වූ ධර්ම ආධ්‍යාශයයන් ඇති. විහිතනා වූ (අනියත වූ, එක් ලෙසකින් මැ නො වැ අන් ලෙසිනුදු වියැ හැකි) කල්පනය (යෙදීම) විකල්ප යි. විකල්පයෙන් නිර්ගත වූයේ නිර්විකල්ප යි. නිර්විකල්ප නම් නියම ලෙසින් මැ වියැ යුතු යි. අන් ලෙසෙකින් නො වියැ හැකි යි. **එක් කල්පාන්තරයෙක්හි**— එක්තරා අන්‍ය කල්පයෙක්හි.

2. **ආවිර්භාවිතවිශ්වලොකෛකමඞ්ගල** වූ— පහළ කරන ලද සකල ලොකයට අසහාය වූ මඞ්ගල ඇති. සකල ලොකයට අසහාය මඞ්ගලය පහළ කළා වූ මුළු ලොව එක මිඟුල් නොයෙක් සේ කළ. ආවිස් + භූ + ඉ + ත = ආවිර්භාවිත. 'ආවිස්' පූර්ව වූ 'භූ' ධාතුව පහළ වීමෙහි වැටේ. මෙහි ප්‍රයොජ්‍ය යි. **ස්වධර්මදෙශනා වසන්ත ශ්‍රී සම්පාත විකසිත කෘතාධිකාර සුමනසුන් ඇති**— සවකීය ධර්ම දෙශනා නමැති වසන්ත ශ්‍රීය පැමිණීමෙන් පිපුණා වූ පිනැත්තවුන් නමැති මල් ඇති. පින් කළවුන් නමැති මල් සවකීය ධර්ම දෙශනා නමැති වසන්ත ශ්‍රීය හෙළීමෙන් පිබිදි වූ. දිශ් + අන + ආ = දෙශනා. 'දිශ්' (දැක්වීමෙහි) ධාතු යි. 'ආ' යනු ස්ත්‍රී ප්‍රත්‍යය යි. 'ශ්‍රී' යනු ශොභා සම්පත්ති යනාදී අර්ථයන්හි වැටේ. සම් + පත් + අ = සම්පාත. 'පත්' වැටීමෙහි ධාතු යි. වි + කස්+

ඉ + ත = විකසිත. 'වි' පූර්ව 'කස්' ධාතුව පිපීමෙහි වැටේ. ශෝභන වූ මනස (සිත) ඇති වනුයේ යමෙකින් ද ඒ සුමනස් නම්. දුටුවන් ගේ සිත පහදවන හෙයින් මල් මෙ නම්. **ධර්මාමෘත රසාස්වාද සුමනස් ඇති**— ධර්ම නමැති අමෘත රසය විඳීමෙන් ප්‍රීත සිත් ඇති වූ (සොම්නස් වූ.) ආ + ස්වද් + අ = ආස්වාද. 'ආ' පූර්ව 'ස්වද්' ධාතුව අනුභවයෙහි වැටේ. ශෝභන වූ මනස (සිත) යමෙක්හු ගේ ද හේ 'සුමනස්' නම්. **නිජාද්භූත විශේෂ විරාජිත වසුන්ධරා මණ්ඩල ඇති**— (නිජ + අද්භූත) ස්වකීය ආශ්චර්ය විශේෂයෙන් බබළවන ලද පෘථිවී මණ්ඩල ඇති. මුළු පොළොව ස්වකීය (යමක ප්‍රාතිහාර්යාදි) ආශ්චර්ය විශේෂයෙන් බැබැළුවූ. වි + රජ් + ඉ + ත = විරාජිත. 'වි' පූර්ව 'රජ්' ධාතුව බැබැළීමෙහි වැටේ වසුන් (රත්නයන්) ධරන්නී වසුන්ධරා යැ. වසුං + ධෘ + අ + ආ = වසුන්ධරා. 'වසු' යනු රත්න, ධන, ආදි අර්ථයන් දෙයි. 'ධෘ' (දැරීමෙහි) ධාතු යි. 'ආ' යනු ස්ත්‍රී ප්‍රත්‍යය යි. **නිර්ව්‍යාජ ධර්මරාජ ලක්ෂ්මී ශෝභිත** වූ— නිබොරු වූ බුද්ධ ශ්‍රීන් හෙබියා වූ. වි + අජ් + අ = ව්‍යාජ. 'වි' පූර්ව 'අජ්' ධාතුව රැවටීමෙහි වැටේ. 'ව්‍යාජ' නම් නැති දෑයක්, ගුණයක්, ඇති සේ හැඟැවීම යි. ව්‍යාජයෙන් නිර්ගත වූයේ නිර්ව්‍යාජ යි. 'ධර්මරාජ' යනු බුදුනට නම්. ශුභ් + ඉ + ත = ශෝභිත. 'ශුභ්' (හෙබීමෙහි) ධාතු යි.

3. **නිරස්තසමස්තාමඞ්ගල** වූ— (සමස්ත + අමඞ්ගල) පහ කරන ලද සියලු අමිඟුල් (අශුභ, පාප) ඇති. සියලු අමඞ්ගලයන් දුරු කළා වූ. නිර් + අස් + ත = නිරස්ත. 'නිර්' පූර්ව 'අස්' ධාතුව දුරු කිරීමෙහි (හැර දැමීමෙහි) වැටේ. **තුන් වන— ආත්මභාවයෙන්**— බුදු වන ජාතිය පටන් පෙරට ගිණූ කලැ තුන් වැනි ජාතියෙන්. **මරීචි**— රශ්මි. **අධිරූඪ වූ**— නැඟී. අධි + රුහ් + ත = අධිරූඪ. **ශ්‍රී**— සම්පත්ති. **කායයෙන්**— ආත්මභාවයෙන්. **නිරුත්තර** වූ— උත්තරයක් (තම හට වැඩියක්) නැත්තා වූ. උද් + තර = උත්තර. වඩා උසස්. උත්තරයක් (තම හට වඩා උසස් වූවක්) නැතියේ නිරුත්තර යි. **ලෝකෝත්තර ගුණ ගණාභිරාම** වූ— (ගණ + අභිරාම) අලෞකසාමාන්‍ය වූ ගුණ සමූහයෙන් අතිශයින් රම්‍ය වූ. **සෞභාග්‍ය ලක්ෂ්මීන්**— පින් සිරින්. සුභගයා ගේ භාවය සෞභාග්‍ය යි. **සුන්දරතර**— ඉතා සොඳුරු. **ප්‍රභව ශ්‍රීයෙන්**— උසස් ආකාරයෙන්. 'ශ්‍රී' යනු ආකාරාර්ථයෙහි ද යෙදේ. **සකල ලෝකානන්ද සන්දෝහ නිදාන වූ**— (ලෝක + ආනන්ද) සියලු ලෝකයා ගේ සන්තෝෂ සමූහයට හේතුව වූ

**පඤ්චෙන්ද්‍රිය මධුකර බාල සන්තර්පිතෙන මධු රස පඤ්ච කාම ගුණෙන නිධාන** වූ— පස් ඉඳුරන් නමැති බඹර පැටවුන් පිනැවීමට එක මැ මී රසය වූ පස් කම් සුවයට **අසහාය** (එක මැ) රක්ෂණ ස්ථාන වූ යශස්වතී දෙවිය පඤ්ච කාම ගුණයට එක මැ නිධාන යැ. පඤ්ච කාම ගුණය රක්ෂිත කොටැ තුබූ අතුල්‍ය ස්ථානයක් වැන්නැ. ඒ පඤ්ච කාම ගුණය ද පස් ඉඳුරන් නමැති මී මැසි පැටවුන් තෘප්තියට පමුණුවන අතුල්‍ය වූ මී රසය (මල් පැණි රසය) වැන්නැ. සම් + තෘප් + අන= සන්තර්පණ. 'තෘප්' ධාතුව තෘප්තියෙහි (පිනා යැමෙහි) වෙයි. **ශීලවතී**— සිල් ඇත්තී. ශීල + වත් + ඊ= ශීලවතී. **කුලවතී**— උතුම් කුල ඇත්තී. උතුම් කුලයෙහි උපන්නී. **යශස්වතී**— ('යශවතී' යනු මුද්‍රණ දොෂ යි.) **මදන දහ නිර්වාපණයෙහි අභිනව කර්පූර භාර වූ**— රාග නමැති දැවිල්ල නිවීමෙහි අලුත් කපුරු මාලයක් වැ. එයින් මත් වේ නු යි (මද්+අන) මදන යි. 'මද්' (මත් වීමෙහි) ධාතු යි. දවනුයේ (දහ්+අ) දහ යි. කපුරු හර දෙහ දහය නිවන්නා සේ බෝසත්හු ඒ ස්ත්‍රීන් ගේ කාම දහය නිවූ හ. **ප්‍රියශීලී** වූ— ප්‍රිය වන සුලු වූ. ප්‍රිය ස්වභාවය ඇති. **ශීලවත් කුමාර මඤ්ජරී ග්‍රහණයෙන්**— ශීලවත් (නම්) කුමාරයා නමැති මල් කැන (හටි) ගැනීමෙන්. යශස්වතී දෙවිය ලතාවකි. ඒ ලතාවෙහි හට ගත් මල් කැන යම් ශීලවත් කුමාරයා යැ. **සනාථ**— සශරණ. (නාථයකු සහිත– පිහිට සහිත.) ස්ත්‍රිය දරුවකු ලැබීමෙන් සනාථ වෙයි. කවර හෙයින් ද? මිතු තමාට පිහිට වන්නට සුදුස්සකු ඇති වූ හෙයිනි. **ජිතශරදභ්‍රපිණ්ඩ පාණ්ඩුර** වූ— (ශරද් + අභ්‍ර) දිනන ලද ශරද් වලා පිඬ ඇත්තකු මෙන් සුදු වූ. ශරදභ්‍ර පිණ්ඩය ජිත වූයේ යමක්හු විසින් ද හේ ජිතශරදභ්‍රපිණ්ඩ යි. ජිත- ශරදභ්‍රපිණ්ඩයා මෙන් පාණ්ඩුර වූයේ ජිතශරදභ්‍රපිණ්ඩ පාණ්ඩුර යි. ජි + ත= ජිත. 'ජි' (ජයෙහි) ධාතු යි. ශරත් කාලයෙහි අභ්‍රයෝ (වලා) ඉතා සුදු යැ. අප් (ජලය) භරණය (දැරීම) කරනුයේ අභ්‍ර යි. අප් + භෘ + අ= අබ්භ්‍ර. 'අභ්‍ර' යි ද ව්‍යවහාර යි. 'භෘ' (දැරීමෙහි) ධාතු යි. පාණ්ඩු (සුදු) වර්ණය ඇත්තේ (පාණ්ඩු + ර) පාණ්ඩුර යි. **භාගධෙයෛක** වූ— (භාගධෙය + එක) එක මැ භාග්‍යය වූ. එක මැ වාසනාව (පින) වූ. භාගය මැ (භාග + ධෙය) 'භාගධෙය' නම්. 'භාග' යනු ද 'භාග්‍ය' යනු ද සමානාර්ථ යි. 'ධෙය' යනු ස්වාර්ථයෙහි වෙයි. **බොධි සත්ත්ව රාග ක්ෂයකර** වූ— බොධි සත්ත්වයන් ගේ රාගය ක්ෂය කරන්නා වූ (නැති කරන්නා වූ.) බෝධි මූලයෙහි සිදු

රාග ක්ෂය කරනුයෙන්, ඒ රාග ක්ෂයයම වහල් වී හු යි, බොධිය 'බොධි සත්ත්ව රාග ක්ෂය කර' යෙ යි ගැතිණ. **විෂ්‍යන්දමාන ඝන පරාග ධාරා සුරභිභූත** වූ ගලන්නා වූ ඝන වූ රොන් දහරින් සුවඳ වූ. වි+ස්‍යන්ද්+අ+මාන= විෂ්‍යන්දමාන. 'ස්‍යන්ද්' (නැලීමෙහි—වහනයෙහි) ධාතු යි. 'පරාග' යනු පුෂ්ප රජසට නමි. සුරභි+භූ+ත= සුරභිභූත. 'සුරභි' යනු සුවඳට නමි. **නිජ රූප ලක්ෂ්මී දිදෘක්ෂොන්මිලිත**— (දිදෘක්ෂා+උන්මීලිත) සවකීය රූපශ්‍රීය දක්මේ ආශායෙන් පුබුදුවන ලද (අයත ලද, විවෘත කරන ලද.) 'කුසුම කලාප නෙත්‍ර' යන්නට විශෙෂණ යි. ඒ බොධි වෘක්ෂයා ගේ කුසුම කලාප නමැති නෙත්‍රයෝ අයත (විවෘත කරන) ලද්දෝ යැ. කවර හෙයින් ද? ඒ බොධි සත්ත්වයන් ගේ රූප ශ්‍රීය දක්නා ආශායෙනි. දෘශ්+ස+ආ= දිදෘශ්+ස+ආ= දිදෘක්ෂා මේ 'ස' ප්‍රත්‍යය පර කල්හි ධාතුහු ගේ ප්‍රථමාක්ෂරය ද්විරූප වෙයි. උද්+මිල්+ඉ+ත= උන්මිලිත. 'මිල්' ධාතුව ඇස් පියා ගැන්මෙහි වැටේ. 'උද්' පූර්ව 'මිල්' ධාතුව ඇස් ඇරීමෙහි යෙදේ. **මත්ත මධුකර කෘෂ්ණ මණ්ඩලොපශොභිත**— (මණ්ඩල+උපශොභිත) මත් බමරුන් නමැති කළු මඬුල්ලෙන් (කළු ඉංගිරියායෙන්) හෙබියා වූ. 'කුසුම කලාප නෙත්‍ර' යන්නට විශෙෂණ යි. පිපුණු නා මල මැද්දෙහි බමරා හිටිනා කලැ, මල ඇස වැන්නැ, මැද හිටිනා බමරා ඇසෙහි කෘෂ්ණ මණ්ඩලය වැන්නැ. මද්+ත= මත්ත. මල් පැණි බී මත් වූ. උප+ශුභ්+ඉ+ත= උපශොභිත. 'ශුභ්' (හෙබීමෙහි) ධාතු යි. **කුසුම කලාප නෙත්‍ර**— මල් සමූහ නමැති ඇස්. **රූප කාන්ති**— රූප ශොභාව. බොධි සත්ත්වයන් බෝ මුලට එළැඹෙන කලැ බොධිය මල් නමැති ඇස් අයා සිටී. බොධි සත්ත්වයන් ගේ රූප කාන්තිය ගස දෙසට පැතිරී සිටී. බෝධි සත්ත්වයෝ ද මඳින් මඳ ගස දෙසට ඇදෙති. එ හෙයින් බොධිය විසින් බෝධි සත්ත්වයන් ගේ රූප කාන්තිය බොන්නා වැන්නැ. කම්+ති= කාන්ති. 'කම්' ධාතු යි. **ඛර නඛර ප්‍රකරාප්‍රතිම ප්‍රමථන දුර්වාර ඝොර කිශොර හුංකාර ශ්‍රවණ කාතරීභූත කලභ කුල ලීලායෙන්**— (ප්‍රකර+අප්‍රතිම) දරුණු වූ නිය සමූහයෙන් (කරන) අසමාන වූ මැඩීම (පෙළීම) කරණ කොටැ ගෙනැ නො වැළැක්විය හැක්කා වූ සිංහ පොතකයා ගේ ගජිතය ඇසීමෙන් භීත (බිය) වූ ඇත් පොව්වන් සමූහයක්හු ගේ ආකාරයෙන්. සිංහ පොතක තෙමේ තමා ගේ නාදය අසා බිය ගත් හස්ති පොතක සමූහයා යම් සේ පලාය ගෙනේ ද, එ සෙයින් මැ බෝ සත්හු මාර බල පලයනු කළ හු.

**දරුණු, තියුණු,** තද, රළු, යනාදිය 'බර' යන්නෙහි අර්ථ යි. 'නඛ' යනු ද 'නඛර' යනු ද නියට නමි. ප්‍ර + හෘ + අ = ප්‍රහාර. සමූහය. 'ප්‍ර' පූර්ව 'හෘ' ධාතුව විසිරීමෙහි වැටේ. **ප්‍රතිමාවක්** (සමාන බවක්) නැත්තේ යම්කම ද ඒ (න + ප්‍රතිමා) අප්‍රතිම යි. ප්‍රකර්ෂයෙන් මථනය ප්‍රමථන නමි. ප්‍ර + මථ් + අන = ප්‍රමථන. 'මථ්' ධාතුව මථනයෙහි (මැඩීමෙහි— පෙළීමෙහි) වැටේ. දුක සේ වැළැක්කේ හැකි දුර්වාර යි. දුර්+වෘ+අ= දුර්වාර. 'වෘ' (වැළැක්මෙහි) ධාතු යි. **කෙසරී කිශෝරයා** දුර්වාර වූයේ බර නඛප්‍රහාරයෙන් අප්‍රතිම සේ ප්‍රමථනය කරන හෙයිනි. **කෙශර ඇතියේ** (කෙශර+ඉන්) කෙශරින් නමි. සිංහ යි. **කවර සත්ත්වයක්හු** ගේ වුව ද පැටියා 'කිශෝර' නාමයෙන් ගැණේ. 'හුම්' යැ යි (ශබ්ද) කිරීම හුඞ්කාර යි. **කාතර වූයේ** (කාතර + භූ + ත) කාතරීභූත යි. 'කාතර' යනු භීතයාට නමි. 'කලභ' යනු ඇත් පොව්වාට නමෙකි. **මාර බල ප්‍රලයය**— මාරයා ගේ බල විනාශය. ප්‍ර + ලී+අ= ප්‍රලය. 'ප්‍ර' පූර්ව 'ලී' ධාතුව වැනැසීමෙහි වෙයි. **අරුණෝදය සමධිගත**— අරුණෝදයයෙහි අවබෝධ කළා වූ. **සර්වඥතා ඥාන විලාසයෙන්**— බුදු නුවණ දීප්තියෙන්. **විශ්ව ඥෙය මණ්ඩල ප්‍රතිච්ඡාදක මෝහ ස්තෝම විධ්වංසන කොට**— සකල ඥෙය චක්‍රය වසන්නා වූ මෝහ සමූහය නැසීම කොට. දත යුත්තේ (ඥා + ය) ඥෙය යි. දත යුතු දෑ සියල්ල එක් කොට සැලැකූ කලැ ඒ ඥෙය මණ්ඩල (ඥෙය චක්‍ර) නම් වෙයි. ප්‍රති+ඡද්+අක= ප්‍රතිච්ඡාදක. 'ඡද්' වැසීමෙහි ධාතු යි. **බෝධි සත්ත්ව භූමිහි දී**— බෝධි සත්ත්ව අවස්ථාවෙහි (කාලයෙහි) දී. **දන් ගත්**— දානය කොට ගත්තා වූ. **මූල පලා**— රාබු. **දෙ කොළින්**— ('දෙ තොලින්' යනු මුද්‍රණ දෝෂ යි.) මුව දෙ කොනින්. **ශරීර ප්‍රභා** ශරීර කාන්ති. **විරූවා සී**— දිය කොට (ද්‍රව කොට) ලූ. **රන් රසයෙන්**— රන් දියෙන්. **තුත්තක්**— උතු වලඳක්. පොල් බෑයෙකැ කටුවක් මෙන් හැඩ ගැසුණු වලඳ 'තුතු' නම් වේ. 'උතු' යි ද කියත්. 'පොල් උතු කටු' යනු ගැමි වහර යි. **වෛචිත්‍ර්‍යයට**— විසිතුරට. විචිත්‍රයා ගේ භාවය වෛචිත්‍ර්‍ය යි. **චිත්‍ර පට**— සිතියම් පට. සිතියම් අඳනා වියන් බණ්ඩය.

4. **හළ**— දුරු කළා වූ. **ආත්ම ප්‍රේමයට**— තමා හට (කරන) ආදරයට. **එක චිත්තෝත්පාද මාත්‍රයක් කල්හු**— (කල් + හු) එක සිතක් උපදනා පමණ කාලයෙහි ද. නොමොහොතකුත්. **බෝධිසම්භාර ධර්මාර්ජනයෙහි**—(ධර්ම+අර්ජනයෙහි)

බුද්ධ කාරක ධර්‍ම සැපැයීමෙහි අර්ජ්+අත=අර්ජිත. 'අර්ජ්' (සැපැයීමෙහි- **රැස් කිරීමෙහි**) ධාතු යි. **සද්ධර්මෛකාරුචි වූ**— (සද්ධර්ම+එක) සද්ධර්මය එකම රුචිය (අභිලාෂය) කොට ඇත්තා වූ. සදහම්හි ම රිසි ඇත්තා වූ. **බ්‍රාහ්මණෝත්තමයෙක් වූ**— බ්‍රාහ්මණ + උත්තමයෙකු + වූ. 'උත්තමයකු' යන තන්හි අන්ත්‍ය 'උ' කාර ලොප යි. **සුගන්ධ සම්බන්ධ බන්ධුර පද්මෝදර නිපාතශීලි වූ**— (පද්ම+උදර) සුවඳ සම්බන්ධයෙන් රම්‍ය වූ පියුම් තබට (ඇතුළට) බස්නා සුලු වූ. නි+පත්+අ = නිපාත. 'පත්' ධාතුව වැටීමෙහි වෙයි. **සද්ධර්ම රස ලෝල වූ**— සදහම් රසයෙහි ලොල් වූ. **ගෙන් ගෙන්**— වැටෙත් වැටෙත් ම. ක්‍රමයෙන් වැටෙන කල්හි. **ලය චන්ද්‍රකාන්ත පාෂාණයක් සේ ද්‍රව කෙරෙමින්**— සිත සඳකාන්ත පහණක් (ගලක්) මෙන් දිය කෙරෙමින්. සිත මහත් සතුටට පමුණුවමින්. චන්ද්‍රකාන්ත චන්දුගේ යම්කට ද . ඒ චන්ද්‍ර කාන්ත යි. කම්+ත = කාන්ත. ඇලුණු. ද්‍රු+අ = ද්‍රව. 'ද්‍රු' (දිය වීමෙහි) ධාතු යි. **මඞ්ගල සර්වඥ දිවාකරයා ගේ**— මඞ්ගල බුද්ධ නමැති සූර්යයා ගේ. **නානාරස මධුර වචන කර නිකර ස්පර්ශයෙන්**— විවිධ රසයෙන් මිහිරි වූ වචන නමැති රශ්මි සමූහය වැදීමෙන්. ස්පෘශ්+අ = ස්පර්ශ 'ස්පෘශ්' (පහසෙහි) ධාතු යි. **විකසිත මඞ්ගල දශබල කමලෝදරයෙහි**— පිපුණු මඞ්ගල බුදුන් නමැති පියුම් ගැබෙහි. මඞ්ගල බුදුන් නමැති පිපුණු පියුම ඇතුළෙහි. **නිරන්තර සම්පූර්ණ වූ**— අතුරු නොතබා මනා සේ පිරුණා වූ සම්+පූර්+ත = සම්පූර්ණ. **මකරන්ද**— මුවරඳ. රොන්. **ශ්‍රවණය**— කන. **මත්ත භ්‍රමර විභ්‍රමයෙන්**— මත් වූ බමරකු ගේ ලීලායෙන්. කිමෙකින් මත් වූ ද? ධර්‍ම මකරන්ද සෙවනයට කළා වූ ආශාවෙන් මත් වූ. ධර්මය මුවරඳ යැ. කන එයට යොමු කළ මත් බමර යැ. **යොමු කෙරෙමින්**— උන්මුඛ කෙරෙමින්. නමමින්. **සුවර්ණ කාන්තිය**— රන් රස. රන් වන් රශ්මිය. **විජෘම්භ**— විජෘම්භිත වූ. හැසිරු. **ගෝස්තන යෑ**— පරළ යැ. ගොප්තනයි යැ. **ජේ කඩ යෑ**— පිය කඩ යැ. මැඹ මුදුන්හි උඩු යටි කළ පඩි පෙළක් සේ තැනුණේ ජේ කඩ යි. **දූව කඩ යෑ**— දූවියෙන් (ලීයෙන්) කැටයම් කළ කොටස යැ. **ඝනාදී ලෙසින් සිටෑ ගත්තා සේ**— රන් වන් බුදු රස් එ කැටයම් අඳින් ඝන වැ ගෝස්තැස් ආදි ආකාරයට පෙරළී සිටියා මෙන්. **විලම්බමාන වූ**— එල්ලෙන්නා වූ. වි+ලම්බි+අ+මාන = විලම්බමාන.

**කිඞ්කිණීක ජාල**— ('ජාලා' යනු මුද්‍රණ දෝෂ යි) කිකිණි දැල්. රසු වැල්. **සමාකුල**— මොනොවට අවුල් වූ. සම් + ආ + කුල් + අ = සමාකුල. 'කුල්' (රැස් වීමෙහි) ධාතු යි. **සප්තරත්නමය**— සත් රුවනින් කළ. 'මය' යනු තත්ප්‍රකෘති වචනයෙහි (එයින් කෙළේ යැ යි කීමෙහි) තද්ධිත ප්‍රත්‍යය යි. සිංහලයෙහි 'මුවා' පස යි. 'සත්රුවන්මුවා' යනාදි තන්හි මෙනි. **ගයන්නා**— අදින්නා. **චතුර් මධුරයෙන්**— සිවු මියුරින්. ගිතෙල්, වෙඬරු, මී පැණි, උක් සකුරු යන මෙයින්. **අනන දවස්**— කෙළවර දවස්හි. **තුන් සිවුරු**— අඳනය, තනි පට පොරෝනය, දෙපට පොරෝනය යන තුන. **හැම දෙනා වහන්සේ කෙරෙන් පස්සේ වහන්සේ**— හැමට මෑ බාල වහන්සේ. **මෙහි ඵලෙන්**— මේ දානයෙහි ඵලයෙන් (අනුසසින්.) **නව ලොකොත්තර සද්ධර්මයන්**— සතර මාර්ගය සතර ඵලය නිර්වාණය යන ලොකොත්තර ධර්ම නවය.

5. **උදාරාධ්‍යාශයෙ**— (උදාර + අධ්‍යාශය) උසස් වූ අදහස. 'අධ්‍යාශය' යනු පාළි 'අජ්ඣාසය' යන්න සංස්කෘත කිරීමෙන් ලැබුණු සේ යැ. **නිබද්ධ වූ**— බැඳුණා වූ. නි + බන්ධ + ත = නිබද්ධ. **මුළුල්ලෙ**— සියල්ල. 'මුළුලු' ශබ්දය යි. **සිවු පසයට**— චතුර්විධ ප්‍රත්‍යයට. චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලාන ප්‍රත්‍යය යන සතර පසයට. **සතර බ්‍රහ්ම විහාර**— මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂා යන බ්‍රහ්ම විහාර සතර. බ්‍රහ්මයෝ මේ සතර විහරණයෙන් යුක්ත වැ වෙසෙත් ල. එ හෙයිනි බ්‍රහ්ම විහාර නාමය වූයේ.

"සැප වැඩි සහ වෙ තා
සතුටු වන සේ මුදි තා" ..... යැ යි

රහල් තෙරණුවෝ කී හ. උපෙක්ෂා නම් මධ්‍යස්ථතා යැ. **සැදූ**— අලඞ්කාර කොට. බෝ සතුන් බඹ ලොවැ ඉපැදීම එය අලඞ්කාර කිරීමෙකි.

6. **අසන්නයෙන්**— උත්සාහ රහිත වැ.

## 4. සුමන විවරණ කථා

1. **ස්ව ශරීර ජ්‍යොතිස්ථිරාචිරද්‍යුති විලසිත විහත ලොකාන්ධකාර පටල ඇති**— (ජ්‍යොතිස් + ස්ථිර+අචිරද්‍යුති, ලොක+අන්ධකාර.) ස්වකීය ශරීර රශ්මි නමැති ස්ථිර වූ

විදු ලිය කැල්මෙන් විශෙෂයෙන් නසන ලද ලොවැ අඳුරු. කඳ ඇති. ලොකයෙහි අන්ධකාර ස්කන්ධය ස්වකීය ශරීරයෙහි රශ්මි නමැති ස්ථිර වූ විදු ලිය එළියෙන් නැසූවා වූ. විදු ලිය අස්ථිර යැ, ක්ෂණික යැ. බුද්ධ ශරීරයෙහි රශ්මිය ස්ථිර යැ. එ හෙයින් බුද්ධ රශ්මීන්ට සමාන වන් හොත් ස්ථිර වූ විදු ලියෙකි. ද්‍යුත් + ඉස් = ජ්‍යොතිස්. 'ද්‍යුත්' (දිලිහීමෙහි) ධාතු යි. ද්‍යු + ති = ද්‍යුති. දිලිහීම යි. චිර වූ (බොහෝ කල් පවත්නා වූ) ද්‍යුති යමෙකු ද ඒ චිරද්‍යුති යි. න චිරද්‍යුතී අචිරද්‍යුති. විදු ලියට මේ නමි. වි + ලස් + ඉ + ත = විලසිත. 'ලස්' (දිලිහීමෙහි) ධාතු යි. වි + හන් + ත = විහත. විශෙෂයෙන් නසන ලද. **වර්ණ ප්‍රත්‍යාපත්ති**— වර්ණය පෙරළා යෑම. බුදුන් පිරිනිවි කලැ බුදු සිරුරෙහි නීල වර්ණය නීල-වර්ණ වස්තූන් කරා පෙරළා ගියේ යැ. පීත වර්ණය පීත-වර්ණ වස්තූන් කරා පෙරළා ගියේ යැ. සෙසු වර්ණයෝ ද තත්තද්වර්ණ වස්තූන් කරා පෙරළා ගිය හ. ප්‍රති + ආ + පද් + ති = ප්‍රත්‍යාපත්ති. 'ප්‍රති' 'ආ' පූර්ව 'පද්' ධාතුව පෙරළා යෑමෙහි වැටේ. **ස්වයංචරණ ස්වාභිලාෂ විරචිත විශ්ව ලොකාධිගමන ඇති**— (ස්ව + අභිලාෂ, ලොක + අධිගමන) තමා මැ හැසිරීමෙන් ද තමා ගේ මැ අභිලාෂයෙන් ද සිදු කරන ලද සකල ලොකය පිළිබඳ අවබොධය ඇති. ස්වයං (තමා මැ) චරණය ස්වයංචරණ යි. චර් + අන = චරණ. 'චර්' (හැසිරීමෙහි) ධාතු යි. වි + රච් + ඉ + ත = විරචිත. 'රච්' ධාතුව රචනයෙහි - සිද්ධ කිරීමෙහි- වැටේ. අධි + ගම් + අන = අධිගමන. 'අධි' පූර්ව 'ගම්' ධාතුව අවබොධයෙහි වැටේ. සුමන බුදුහු සකල ලොකය අවබොධ කළ හ. කෙසේ ද? තමන් මැ හැසිරීමෙන් ද තමන් ගේ මැ අභිලාෂයෙන් ද අවබොධ කළ හ. **මතු පත් වැ**— මස්තක ප්‍රාප්ත වැ. මුදුන් පැමිණැ. සම්පූර්ණ කොටැ. **කාමාවෙශ විවශ ලලිත වනිතා වදන පද්ම වන රාජ හංස වැ**— (කාම + ආවෙශ) කාමය ආවෙශ වීම (සිතට නැඟීම- ඇවිස්සීම) කරණ කොටැ ගෙනැ ඉවැසිලි නැත්තා වූ රමණීය වූ (දිව්‍ය) ස්ත්‍රීන් ගේ මුහුණු නමැති පියුම් වනයට රාජ හංසයකු වැ. කාමොන්මත්ත වූ දිව්‍ය ස්ත්‍රීන් හා රමණය කෙරෙමි නැයි සූ සේ යි. මෙහි කාමය නම් රාගය යි. ආ + විශ් + අ = ආවෙශ. 'ආ' පූර්ව 'විශ්' ධාතුව නැඟීමෙහි වැටෙයි. විගත වූ වශය (ආත්ම සංයමය - ස්වතන්ත්‍රතාව) යමකු ගේ ද හේ විවශ යි. වශ් + අ = වශ. 'වශ්' (දමනයෙහි) ධාතු යි. ලල් + ඉ + ත = ලලිත. 'ලල්' (රමණයෙහි) ධාතු යි: 'වනිතා' යනු ස්ත්‍රී

පසීාය සි. **අක්ෂීණවිතත වූ**— ('විචිතත' යනු මුද්‍රණ දෝෂ සි.) ක්ෂය නුවූ ධන ඇත්තා වූ. ක්ෂි + ත = ක්ෂීණ. 'ක්ෂි' (ක්ෂය වීමෙහි) ධාතු සි. න + ක්ෂීණ අක්ෂීණ. විද් + ත = විත්ත. ධනයට නමි. 'විද්' (ලැබීමෙහි හෝ රැස් කිරීමෙහි හෝ) ධාතු සි. අක්ෂීණ වූ විත්තය යමක්හු ගේ ද හේ අක්ෂීණවිත්ත සි. **සුවිනීතචිත්ත වූ**— මනා වැ හික්මවන ලද සිත් ඇති. සු + වි + නී + ත = සුවිනීත චිත් + ත = චිත්ත 'චිත්' (සිතීමෙහි) ධාතු සි. **දශසහස්‍ර ලෝක ධාතුව**— ලෝක ධාතු දස දහසක් එක් වූ කලැ ඒ 'දශසහස්‍රී' නමි. දශසහස්‍ර + ඉන්. එක් සූර්යයකු එක් චන්ද්‍රයකු ඇතියේ එක් ලෝක ධාතුවෙකි. **සඳ**— අලඞ්කෘත කොටැ. **සරස**— ශෘඞ්ගාර රස සහිත වූ. **මධුර**— මිහිරි. රම්‍ය. **කටාක්ෂ නිරීක්ෂණය පාත්‍ර වැ**— කටාක්ෂයන් බැලීමට එක මැ පාත්‍රය (භාජනය) වැ. ඇස් කොණින් ආදරයෙන් බලන ලද්ද වැ. **චන්ද්‍රෝපවන ගමන සෞන්දර වාරි විහාර සඞ්ගීත ප්‍රසඞ්ගාදි විවිධානුභව විශේෂයෙන්**— (චන්ද්‍රා + උපවන, ප්‍රසඞ්ග + ආදි, විවිධ + අනුභව) ('විවිධානුභාව' යනු මුද්‍රණ දෝෂ සි.) චන්ද්‍රාවට ද උපවනයට ද යෑම යැ සිය කැමැති පරිදි ජලයෙහි (ජල ක්‍රීඩායෙහි) හැසිරීම යැ සඞ්ගීතයෙහි යෙදීම යැ යන ආදි අනේකප්‍රකාර වූ විඳීම් වෙසෙසින් (විඳීම් ප්‍රභේදයන් ගෙන්.) 'චන්ද්‍රා' නම් චන්ද්‍රිකා ශාලා යැ (සඳලු යැ.) අභිරමණීය කරන්නෝ සුදුසු කල්හි එයට යෙති. 'උපවන' නම් නගරාසන්න වනය සි. 'වාරි විහාර' නම් ජල ක්‍රීඩා යැ. 'වාරි' යනු ජල පසීාය සි.

"නෘත්‍යං ගීතං ච වාද්‍යං ච ත්‍රයඃ සඞ්ගීතමුච්‍යතෙ"

සි යු බැවින් නැටුම් ගැයුම් වැයුම් යන තුන එක් වූ කලැ සඞ්ගීත නම් වෙයි. ප්‍ර + සංජ් + අ = ප්‍රසඞ්ග. 'සංජ්' එක් වීමෙහි ධාතු සි. සඞ්ගීතයෙහි යෙදීම-සඞ්ගීත සේවනය-සඞ්ගීත ප්‍රසඞ්ග නමි. අනු + භූ + අ = අනුභව. විඳීමට නමි. **අවතංසක**— මුදුන් මල් කඩ. රූප ශ්‍රී ආදීන් සියලු යුවතීන් පරදවා සිටි හෙයින් ඕ සකල යුවති ජනයාට අවතංසකයක් බඳු යැ. අව + තංස් + අ = අවතංස. 'තංස්' සැරසීමෙහි ධාතු සි. කර්ණ භූෂණ විශේෂයකට ද ශිරෝභූෂණ විශේෂයකට ද 'අවතංස' යනු නමි. අවතංසය මැ අවතංසක සි. **සුන්දරී සාගරයෙන්**— (ඒ වතංසිකා) සුන්දරිය නමැති සයුරින්, සාගරය රත්නාකරය සි. එ හෙයින් රත්නයක් සාගරයෙන් ප්‍රසව වන සේ කීම යෙදෙසි. **කුමාර රත්නය**— කුමාරයා නමැති රුවන. **චතුෂ්ටය නිමිත්ත සන්දර්ශනයෙන්**— සතර

නිමිති දැකීමෙන්. 'චතුෂ්ටය' ශබ්දය 'සතර' යන අර්ථ ඇත්තේ යැ. **විචිත්‍ර සජ්ජා විශේෂ බන්ධුර සින්ධුර වරාධිරූඪ වැ** — විසිතුරු වූ සැදුම් (සැරැසුම්) වෙසෙසින් රම්‍ය වූ හස්ති රාජයාට නැඟී. සංජ් + ත + ආ = සජ්ජා. 'සංජ්' (බැඳීමෙහි-සැදීමෙහි) ධාතු සි. 'ආ' ස්ත්‍රී ප්‍රත්‍යය සි. 'අසු සද' යනාදි තන්හි 'සද' ධාතුව ද මේ අර්ථ දෙයි. 'සජ්ජා' යනු (ඇඳුම් පැලැඳුම් ආදීන්) සැරැසීමට නමි. ඇතාට 'සින්ධුර' යනු නමෙකි. 'වර' යනු උත්තමාර්ථ සි. විශ්ව **විභවානවම** වූ— (විභව + අනවම) සියලු සම්පත්තීන් පහත් (අධම) නුවූ. විශිෂ්ට වස්තුයේ විභව සි. වි + භූ + අ = විභව. ධනයට නමි. 'අවම' යන්නෙහි අර්ථ 'පහත්' (අධම) යනු සි. න අවම අනවම. උසස්. **විගතොපම** වූ— පහ වූ උපමා ඇති. උපමාරහිත. යමකු කෙරෙන් උපමාවෝ වීත වූවාහු ද හේ 'වීතොපම' සි වි + ඉ + ත = වීත. 'වි' පූර්ව 'ඉ' ධාතුව අස් වැ යැමෙහි වැටේ **මන්ද මන්ථර නාග විභ්‍රමයෙන්**— ඉතා සෙමෙන් යන හස්තියකු ගේ ලීලායෙන්. 'මන්ථර' යනු 'මඳ ගමන් ඇති' යන අර්ථ දෙයි. 'මන්ද' යනු පූර්ව වැ යෙදිණ. මන්දාර්ථ දෙ වරක් යෙදුණෙන් අතිශයාර්ථ ලැබේ. **මාර සේනාභිමාන මර්දිත ප්‍රඛ්‍යාත කීර්ති පිණ්ඩ පාණ්ඩුරීකෘත භුවනාභොග ඇති වැ**— (සේනා + අභිමාන, භුවන + ආභෝග) ('පාණ්ඩුරිත' යනු මුද්‍රණ දොෂ සි.) මාර සේනාව ගේ මහත් එඩි මැඩීමෙන් පතුරුවන ලද යශඃ පිණ්ඩය කරණ කොටැ ගෙනැ සුදු කරන ලද ලොක වස්තු ඇති වැ. මර සෙනඟ පරදවා ඒ කීර්තිය මුළු ලොවැ පතුරුවා. 'කීර්තිය සුදු යැ' යනු කවි සමයය සි. එ බඳු කීර්තිය මුළු ලොව පැතිර ගියේ නම් ලොක කුක්ෂිය සුදු වනු යෙදෙයි. අභි + මාන් + අ = අභිමාන. මෘද් + අත = මර්දිත. 'මෘද්' (මැඩීමෙහි) ධාතු සි. ප්‍ර + ඛ්‍යා + ත = ප්‍රඛ්‍යාත. 'ඛ්‍යා' ධාතු කීමෙහි වැටේ. ප්‍රකර්ෂයෙන් (උසස් කොටැ) කියන ලද්දේ ප්‍රඛ්‍යාත සි. කීර්තිය නම් යම් කිසිවකු ගේ සමත් කම් ගුණවත් කම් ආදිය ගැනැ ප්‍රශංසා මුඛයෙන් ලොකයා විසින් කැරෙන කථාව සි. එ හෙයින් 'ප්‍රඛ්‍යාත කීර්ති' යනු යෙදෙයි කෘත් + ති = කීර්ති. 'කෘත්' කීමෙහි ධාතු සි. 'පිණ්ඩ' නම් පිඩ සි 'පාණ්ඩුරීකෘත යන්න හා අනුප්‍රාස වීම පිණිස මුත් 'පිණ්ඩ' යන්නෙන් මෙහි අන් වැඩෙක් නැති. පාණ්ඩුර+කෘ+ත= පාණ්ඩුරීකෘත. එහි වේ නූ සි (භූ+අන) භුවන සි. ලොකයට නමි. ආ + භුජ් + අ= ආභොග. 'භුජ්' ධාතුව වක්‍ර වීමෙහි වැටේ යම් කිසිවක් වටා ගෙනැ හාත්පසැ

වූ චන්ද්‍රයා ආභෝග නාමයෙන් ගැනෙයි. භුවනාභෝග නම් භුවන චන්ද්‍රයා යි. ලෝකය මුළුල්ල යි. **විඥ ත්‍රාශ**– ඥාන ත්‍රාන. **බ්‍රාහ්ම මුහූර්ත ප්‍රාදුර්භාව සමයාවිර්භූත බ්‍රහ්මාතිබ්‍රහ්ම භාව විභාවිත සද්ගුණ විලාශ ඇති වූ**— (සමය + ආවිර්භූත, බ්‍රහ්ම + අතිබ්‍රහ්ම) බ්‍රාහ්ම මුහූර්තය පහළ වීමේ කාලයෙහි ප්‍රකාශ වූ බ්‍රහ්මාතිබ්‍රහ්ම භාවයෙන් පළ කරන ලද සද්ගුණ ලීලාව ඇති වූ. බ්‍රාහ්ම මුහූර්තය පහළ වන වේලෙහි මැ සම් ලෝකාග්‍ර භාවය පහළ වියැ. එයින් සද්ගුණ විලාසය ප්‍රකාශ කරන ලද්දේ යැ.

“රාත්‍රශ්ච පශ්චිමෙ යාමෙ මුහූර්තො බ්‍රාහ්ම උච්‍යතෙ” යි යූ බැවින් රාත්‍රියෙහි පශ්චිම යාමයෙහි (අලු යම්හි) බ්‍රාහ්ම මුහූර්තය වෙයි. සූර්යෝදයෙන් පූර්ව වූ සතර වන දෙ වන ඝටිකාවන් (පැ) අතර මේ මුහූර්තය වෙති යි යෙති. බ්‍රාහ්ම මුහූර්තය නම් අරුණෝදය යැ යි ද මතයෙක් වෙයි. බ්‍රහ්මයා ගේ නු යි (බ්‍රහ්මන්+අ) බ්‍රාහ්ම යි. ඝටිකා ද්වයක් (පැ දෙකක්– මිනිත්තු සතලිස් අටක්) පමණ වූ කාලය මුහූර්ත නාමයෙන් ගැනේ. ක්ෂණයට ද මුහූර්ත යනු නමෙකි. ‘ප්‍රාදුස්’ ‘ආවිස්’ යන අව්‍යය දෙක සමානාර්ථ යැ. දෙදෙනුයේ ‘භූ’ ‘කෘ’ ‘අස්’ යන ධාතූන් ගෙන් එකකට පූර්ව වැ යැ. බ්‍රහ්මයනට ද අතිබ්‍රහ්ම (වඩා උසස් බ්‍රහ්ම) බ්‍රහ්මාතිබ්‍රහ්ම යි. බුදුනට නමෙකි. වි + භූ + ඉ + ත = විභාවිත. ප්‍රයෝජ්‍ය වන හෙයින් ‘භූ’ ධාතුයෙහි ස්වරයට වෘද්ධි වී යැ. ‘වි’ පූර්ව ‘භූ’ ධාතුව ප්‍රකාශ වීමෙහි වැටෙයි. **සකල ජගදානන්ද**-- (ජගත් + ආනන්ද) සියලු ලොවට සන්තෝෂය. **කන්කන්හි**— කනක් කනක් පාසා.

2. **නිජ වාද නිහිත**— ස්වකීය වාදයෙහි (කීමෙහි) පිහිටුවන ලද. වද් + අ = වාද. ‘වද්’ කීමෙහි ධාතු යි. නි + ධා + ත = නිහිත. ‘නි’ පූර්ව ‘ධා’ ධාතු පිහිටීවීමෙහි වැටේ. **අශූන්‍ය වූ**— හිස් නො වූ. පිරී. **රමණීය**—සිත් ඇලැවියැ යුතු. රම්+අනීය ‘රම්’ (ඇලීමෙහි) ධාතු යි. **ප්‍රබල**— මහත් බල ඇති. ප්‍රකෘෂ්ට වූ බලය යමක්හු ගේ ද හේ ප්‍රබල යි. **තුලනාතික්‍රාන්ත**— (තුලනා + අතික්‍රාන්ත) සමාන කිරීම ඉක්මැ සිටියා වූ. අසමාන වූ. අතුල්‍ය වූ. තුල් + අන + ආ= තුලනා. ‘තුල්’ (සමාන කිරීමෙහි) ධාතු යි. ‘ආ’ ස්ත්‍රී ප්‍රත්‍යය යි. **අඥ ලෝක ප්‍රඥාලෝක දායක** – (ප්‍රඥා + ආලෝක) අඥ වූ (මෝඩ )වූ ලෝකයට ප්‍රඥා නමැති එළිය දෙන්නා වූ. දන්නේ ඥ යි ඥා+අ= ඥ. න ඥ අඥ. **බුද්ධාලම්බන ප්‍රීති සඤ්ජනිත ප්‍රාදුර්භාව නිභෘතාත්මභාව ඇති වූ**— (බුද්ධ+ආලම්බන, නිභෘත+ ආත්ම...) (‘නිහීරිත’ යනු ‘නිභෘත’ වියැ යුතු.) බුදුන් අරමුණු

කොටැ උපන් ප්‍රීති පරම්පරා පහළ වීමෙන් පිරුණා වූ ආත්මභාව (ශරීර) ඇති වැ. **කඬුපුල්**— නාග ලෝකයෙහි ඇති පුෂ්ප විශෙෂයෙකි **කාලාගරු**— (කාල+අගරු) කළු අගිල්. **ධූප ද්‍රව්‍ය**— දුම් දෙන ද්‍ර. **කරණ්ඩක**— කරඬු **සන්තතින්**— පෙළින්. සම්+තන්+ති= සන්තති. 'තන්' (පැතිරීමෙහි) ධාතු සි. **දිව්‍ය කර්පූර චන්දනාදි සෞරභ්‍ය ප්‍රබන්ධ බන්ධුර**— (චන්දන+ආදි) දිව කපුරු සඳුන් ආදි සුවඳ ද්‍රව්‍ය සමූහයෙන් රම්‍ය. **නාගවල්ලි දලයෙන්**— බුලත් පතින්. **හරිත වූ**— පිරුණා වූ. හෘ+ඉ+ත= හරිත. 'හෘ' (දැරීමෙහි) ධාතු සි. **විතාන**— වියන්. **වින්‍යාසයෙන්**— බැඳීමෙන්. **නිරවකාශ**— ඉඩ නැති. අවකාශයෙන් නිර්ගත වූයේ නිරවකාශ සි. **මිණි දඬු මැම පහනින්**— මැණික් මුවා විලක්කු (පන්දම්) එළියෙන්. **කණ්ඨ මණි**— කණ්ඨයෙහි (ග්‍රීවායෙහි) වූ මැණික්. **රුචිරතර**— අතිශයින් රම්‍ය වූ. **තාරකා නිකරාවකීර්ණ වූ**— තාරකා සමූහයන් බැසැ ගත්තා වූ. **ගගනාඞ්ගණය**— ආකාශ මාලකය. අහස් මළුව. **අමිත**— අප්‍රමාණ, මා+ත=මිත. 'මා' (මිනීමෙහි) ධාතු සි. 'මිත' යන්නෙහි අර්ථ 'මනින ලද' 'ප්‍රමාණ කරන ලද' යනු සි. න මිත අමිත. **වලිතාවලිත**— (වලිත+අවලිත) වෙළෙන්නා වූ ලිහෙන්නා වූ. සුළඟින් කොඩිය යටින් වටා වරක් වෙළෙයි, වරක් වෙළුම් හැරෙයි. වල්+ඉ+ත= වලිත. 'වල්' (වෙළුමෙහි) ධාතු සි. න වලිත අවලිත. **කෙතු**—කොඩි. **විජෘම්භණයෙන්**—වැජැඹීමෙන්. පැවැත්මෙන්. **සම්භූත**— ඇති වූ. **නෙත්‍රොත්සව**— (නෙත්‍ර+උත්සව) ඇසට කෙළි. ඇස් පිනැවුම් **මෙහෙසනු**— යනු. ඉදිරියට යවනු. (නල්ලු කරනු.) **ගලා**— ගිල්වා. **නිරවද්‍ය**— වැරැදි නැති. කියැ යුත්තේ (වද්+ය) වද්‍ය සි. 'වද්' කීමෙහි ධාතු සි න වද්‍ය අවද්‍ය පුරාතන ශිෂ්ටයෝ වැරැදි නම් දැය ප්‍රකාශයේ නො කියැ යුතු සේ සැලැකූ හ එ හෙයින් වරද අවද්‍ය නම් වී අවද්‍යයෙන් නිර්ගත වූයෙ නිරවද්‍ය සි. **ආතොද්‍ය වාද්‍යයෙන්**— ගැසියැ යුතු වාද්‍යයෙන්. ආ+තුද්+ය= ආතොද්‍ය 'ආ' පූර්ව 'තුද්' ධාතු (ගැසීමෙහි) වැටේ. මෙහි ගැසීම නම් ශබ්ද පැවැත්වීමට කළ යුතු ක්‍රියා යැ. බෙරය අතින් හෝ දඬුයෙන් හෝ ගැසියැ යුතු. වීණාව ද අතින් හෝ උපවීණායෙන් හෝ සපගී කළ යුතු. නළා පිඹියැ යුතු. ඝන එකට පැතැරියැ යුතු. වාදනය කළ යුත්තේ වාද්‍ය සි. වාදනය නම් කියැවීම සි (ශබ්ද කැරැවීම සි.) වද්+ය = වාද්‍ය. චතුර්විධ වූ තූර්යයෝ වාද්‍ය නම් වෙති. **විවිධ ලයානුවර්ති**— (ලය+අනුවර්ති) නානාප්‍රකාර වූ ලයානට (තාලයට) අනු වැ

පවත්නා. **රස නිභෘත**— රසයෙන් පිරුණා වූ. **සහෘදය හෘදය හරණ ප්‍රවීණ** රසිකයන් ගේ සිත් ඇද ගැනීමෙහි දක්ෂ වූ. හෘදය සහිත වූයේ සහෘදය යි. මෙහි 'හෘදය' නම් රස හඳුනන හද යි (සිත යි.) එ හෙයින් 'සහෘදය' යනු රසඥයාට නමි. හෘ + අන = හරණ. 'හෘ' (පැහැර ගැනීමෙහි) ධාතු යි. **චාරු වාණියෙන්**— මනොහර (ප්‍රශංසා) වචනයෙන්. 'වාණී' යනු වචනයට නමි **රස විශෙෂ නිරංශ වංශ නාදයෙන්**— රස විශෙෂයෙන් සම්පූර්ණ වූ වස් කුලල් හඬින්. අංශයෙන් (අසම්පූර්ණ භාවයෙන්) තොර වූයේ නිරංශ යි **ආවිර්භාවිත හෘදයානන්ද කන්දල මදීල මෙඝ නාදයෙන්**— (හෘදය + ආනන්ද) පහළ කරන ලද චිත්ත සන්තොෂ නමැති කඳල (මල්) ඇති මත්තාලම් (බෙර හඬ) නමැති වැසි හඬින්. අහස ගෙරවීම මෙඝ නාද නමි. වැසි කලට කඳල මල් ඇති වන හෙයින් මෙඝ නාදයෙන් එය ඇති වෙති යි යෙති. මදීල නාදය ඇසූවවුන් ගේ සිත්හි සන්තොෂ ඇති වීම මෙඝ නාදය අසා කඳල මල් ඇති වන්නා වැන්නැ. 'කඳල' යනු කඳලට මෙන් මැ අඞ්කුරයට ද කෙසෙල් ගසට ද නම් වේ. **සඞ්ගීත විද්‍යොපයොගි වූ**— (විද්‍යා + උපයොගි) සඞ්ගීත ශාස්ත්‍රයට අයත් වූ. උප + යුජ් + අ = උපයොග. යෙදීම යි, ප්‍රයොජනය යි. 'උප' පූර්ව 'යුජ්' ධාතුව යෙදීමෙහි වැටේ. උපයොග ඇත්තේ (උපයොග + ඉන්) උපයොගි යි. **පසක් කට හෙම් වසි**— (හෙම් වා + සි) ප්‍රත්‍යක්ෂ කළ හැකි වෙම් වසි.

3. **සිවු වණක් පිරිස්**— සතර වර්ගයේ පිරිස්. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා. **දෘඪ ග්‍රහණය**— දැඩි වැ ගැනීම. ස්ථිර වීම.

4. **සර්ව බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ නිෂෙවිත**— සියලු බුදු පසේ බුදුවරුන් විසින් සෙවුනා ලද. නි + සෙව් + ඉ + ත = නිෂෙවිත. 'සෙව්' (සෙවනයෙහි) ධාතු යි. **චිත්ත ශුද්ධි කාරණ**— සිත පිරිසුදු වීමට හෙතු.

## 5. රෙවත විවරණ කථා

1. **ශිඛා මණි**— සිළු මිණි. මුදුන් මිණි. **පරිනිෂ්පන්න වූ**— සර්ව ප්‍රකාරයෙන්- සිද්ධ වූ. පරි + නිස් + පද් + ත = පරිනිෂ්පන්න. 'පරි' යනු 'හාත් පසින්' (සර්ව ප්‍රකාරයෙන්) යන අර්ථයෙහි උපසර්ග යි. 'නිස්' පූර්ව 'පද්' ධාතු ඉපැදීමෙහි වැටෙයි. **බුද්ධ කෘත්‍යය**— බුදු කිස. බුදු කෙනකුන් විසින් කළ යුතු දෑ. කෘ + ය = කෘත්‍ය. **පාරමිතා පූරණ ප්‍රවීණ**

**ප්‍රතිලබ්ධ ප්‍රඥා ප්‍රකර්ෂ**— පැරුම් පිරීමේ ප්‍රවීණ භාවයෙන් ලබන ලද ප්‍රඥායෙහි උසස් බව. ප්‍ර + කෘෂ් + අ = ප්‍රකර්ෂ. 'ප්‍ර' පූර්ව 'කෘෂ්' ධාතු බලවත් ලෙස ඇදීම යැ වඩිනය යැ යනාදියෙහි වැටේ. **ලලිතාමිත**— (ලලිත + අමිත) 'වනිතා' යන්නට විශේෂණයකි. **ශූල කොටි**— උල් කොනින්. **සමුන්මූලිත**— මනා සේ මුල් ඉදිරූ (දුරු කළ.) සම් + උද් + මූල් + ඉ + ත = සමුන්මූලිත 'උද්' පූර්ව 'මූල්' ධාතු මුල් උදුරා ලීමෙහි වැටේ. **මාන බන්ධ**— මානය බැඳීම. ආඩම්බරය. "මම ඔවුන් හා නො බැඳෙමි" යනාදීන් මන් බැඳැ සිටුනා කලැ, දෙව් ස්ත්‍රීන් ඇස් කොනින් බැලූ විටැ, ඒ සියලු මන් දුරු වෙසි. උල් කොනින් මුල් ඉදිරූ ගස් මෙනි. **මධු පාන කෙළි රසික වූ**— මී බීම් කෙළියෙහි රස ඇති වැ (ලොල් වැ.) 'මධු' නම් මෘද්වීක පාන ආදිය සි. කේල් + ඉ = කෙළි. 'කේල්' (ක්‍රීඩායෙහි) ධාතු සි. **රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය සව්‍යපෙක්ෂ**— රූ- සද- ගඳ- රස- පහසෙහි ව්‍යපෙක්ෂා (තැකුම්, රිසි) ඇති. ස්පෘශ් + තව්‍ය = ස්ප්‍රෂ්ටව්‍ය 'ස්පෘශ්' (පහස්හි) ධාතු සි. 'තව්‍ය' 'කළ යුතු යැ' යන අර්ථයෙහි කෘදන්ත ප්‍රත්‍යයය සි. ව්‍යපෙක්ෂා සහ වූයේ සව්‍යපෙක්ෂ සි. වි + අප + ඊක්ෂ් + අ + ආ = ව්‍යපෙක්ෂා. 'වි' 'අප' පූර්ව 'ඊක්ෂ්' ධාතු (තකා ගෙනැ- පතා ගෙනැ- සිටීමෙහි) වැටේ. 'ආ' යනු ස්ත්‍රී ප්‍රත්‍යයය සි. පස් ඉඳුරෝ රූපාදිය අපෙක්ෂා කෙරෙති: **පඤ්චවිධාක්ෂ සන්තර්පණෛක සාපෙක්ෂ වූ**— (විධ + අක්ෂ) පඤ්චප්‍රකාර වූ ඉන්ද්‍රියයන් පිනැවීමෙහි එක මැ අපෙක්ෂාව ඇති වැ. 'අක්ෂ' යනු ඉන්ද්‍රියයට නමි. අපෙක්ෂා සහිත වූයේ සාපෙක්ෂ සි. පඤ්චෙන්ද්‍රියයන් පිනැවීම මැ එක මැ අපෙක්ෂාව කොටැ ගෙනැ විසූ බව මේ කී පරිදි සි. **අමිත ධනාචිත**— (ධන + ආචිත) අප්‍රමාණ ධනයෙන් පුරවන ලද. ආ + චි + ත = **ආචිත**. 'ආ' පූර්ව 'චි' ධාතු පිරවීමෙහි වැටේ. **ධනධාන්‍යාභිධාන**— (ධනධාන්‍ය + අභිධාන) ධනධාන්‍ය නම් වූ. 'අභිධාන' නම් නාමය සි. **ත්‍යාග**— දීම. ත්‍යජ් + අ = ත්‍යාග **ශෞර්ය**— ශූර භාවය. **විපුල**— බොහෝ. **මහිෂීන්**— බිසොවුන්. **'මහිෂී'** යනු අභිෂික්ත රාජ පත්නියට නමි **දශමාසාත්‍යයෙන්**— **(මාස + අත්‍යය)** දස මස් ඇවෑමෙන් (ඉකුත් වීමෙන්.) **අති + ඉ + අ = අත්‍යය.** 'අති' පූර්ව 'ඉ' ධාතුව ඉක්මැ යෑමෙහි වැටේ. **ප්‍රණය- රස- මධුර- දර්ශන වූ**— සෙනහ රසයෙන් මිහිරි වූ (ප්‍රියජනක වූ) දැකුම් ඇති. **කුච කලශ**

**පයෝධර සඞ්කුචාරයම** -- පයෝධර නමැති කලස් සිය කැමැති සේ හැසිරීමම. ‘කුච’ යනු තනයට නමි. කුච් + අ = කුච. ‘කුච්’ (සම්පකීයෙහි- පැහැසීමෙහි) ධාතු යි. **භවනොපාන්ත සරසි වැ**— (භවන + උප + අන්ත.) ගෙය අසලැ තටාකය (විල) වැ. ‘භවන’ (භූ + අන) යනු නිවාසයම නමි. එහි වේ නු යි භවන යි. උපාන්තය නම් සමීපය යි. සෘ + අස් = සරස්. ‘ඊ’ පස වීමෙන් සරසී. ‘සෘ’ (ගතියෙහි) ධාතු යි. ‘සරස්’ යනු ද ‘සරසී’ යනු ද විලට නමි. ‘භවනොපාන්ත සරසී’ නම් ගෘහදීර්ඝිකාව යි. ගෙ දිගු විල්හි කලස් යම් සේ හැසිරේ ද බොධි සත්ත්වයන් කෙරෙහි ඒ ස්ත්‍රීන් ගේ කුචයෝ එ සේ මැ හැසුරුණ හ. සඞ්කුචාරය කියැවෙන හෙයින් මෙහි ‘කලස’ යනු විනත්‍ය යි. ‘කල හංස’ යන්නෙහි ‘හං’ යනු ඌන වී ද? ‘කල හංස’ යනු රාජ හංසයාට නමි. **හෘදශ හරණ වූ**— සිත පැහැර ගන්නා වූ (ඇදගන්නා වූ.) සිත් අලවන. **සංසාර විරාග**— සංසාරයෙහි රාගය (ඇල්ම) නැති බව. සසර එපා වීම. වි + රඤ්ජ් + අ = විරාග. ‘වි’ පූර්‍ව ‘රඤ්ජ’ ධාතුව එපා වීමෙහි වැටේ. **ප්‍රව්‍රජ්‍යා රාග**— පැවිද්දට (මහණ වීමට) ඇල්ම. ප්‍ර + ව්‍රජ් + ය + ආ = ප්‍රව්‍රජ්‍යා. ‘ප්‍ර’ පූර්‍ව ‘ව්‍රජ්’ ධාතුව පැවිදි වීමෙහි. වැටේ. ‘ආ’ යනු ස්ත්‍රී ප්‍රත්‍යය යි. **ආජානෙය රථයෙන්**— (‘ආජානීය’ යනු මුද්‍රණ දෙෂ යි.) ආජානෙය නම් වූ උත්තම අශ්වයන් යෙදූ රියෙන්. ආජානෙය ලක්ෂණ මෙ සේ කියත්:—

“ ශක්තිනිර්භිත්තහෘදයාඃ ස්ඛලන්තොපි පදෙ පදෙ
ආජානන්ති යතඃ සංඥාමාජානෙයාස්තතඃ ස්මෘතාඃ ”

අඩයටියෙන් ඇනැ බිඳුනා ලද හෘදය ඇත්තාහු පියෙහි පියෙහි පැකිලෙන්නාහු ද (අසරුවා විලුඹින් කළ) සංඥාව යම් හෙයෙකින් දනිත් ද, එ හෙයින් ආජානෙයයනැ යි දන්නා ලද හ. තව ද මතයෙක් වෙයි. අජයෙහි ද (විකෂෙපයෙහි දු) අසරුවා යමකු විසින් යොග්‍ය ස්ථානයම ආනෙය ද (පැමිණිවියැ යුතු ද) හේ අජානෙය යි. අජ + ආනෙය. ‘අජ’ නම් විකෂෙපය යි, බොහෝ ශස්ත්‍ර ප්‍රහාරයන් ගෙන් ඇති වන ප්‍රතිරොධය යි. ආ + නී + ය = ආනෙය. ‘ආ’ පූර්‍ව ‘නී’ ධාතුව නෙතැ ඊමෙහි වැටේ. ‘ආනෙය’ යනු ‘නෙතැ අව යුතු’ යන අර්‍ථය දෙයි. අජානෙයයා මැ ආජානෙය යි. **කොටි ප්‍රමාණ**— කෙළක් පමණ. **අකලඞ්ක යශොධර**— (යශස් + ධර) කැලැල් නැති කීර්ති දරන්නා වූ.

කලඞ්කයක් නැත්තේ යමෙකු ද ඒ අකලඞ්ක යි. **යශොධරාභිධාන වනිතොපනීත**— (යශොධරා + අභිධාන, වනිතා + උපනීත) **පායසානුභව පූර්වඞ්ගම වූ**— (පායස + අනුභව) කිරි බත වැළැඳීම පෙරටු කොට ඇති වූ. පළමු කොට කිරි බත වළඳා ඉක්බිති. **විකච කුසුමොදර ප්‍රස්‍යන්දමානාමන්ද මකරන්ද බින්දු සම්බන්ධ සුරභීභූත**— (කුසුම+ උදර, ප්‍රස්‍යන්දමාන + අමන්ද) ('ප්‍රස්‍යන්දමාන මන්ද' යනු මුද්‍රණ දෝෂ යි ) පිපුණ මල් ගැබින් වහනය වන නො මඳ (බොහෝ) වූ මුවරඳ බිඳු කරණ කොට ගෙන සුවඳවත් වූ. වි + කච් + අ = විකච. 'කච්' (බැඳුම්හි) ධාතු යි. 'බැඳුම් හැරුණා වූ' යනු 'විකච' යන්නෙහි අර්ථ යි. ප්‍ර + ස්‍යන්ද් + අ + මාන = ප්‍රස්‍යන්දමාන. 'ප්‍ර' පූර්ව 'ස්‍යන්ද්' ධාතුව වහනයෙහි වැටේ. **ද්‍රුමොපසඞ්කීර්ණය**— (ද්‍රුම + උපසඞ්කීර්ණය) ද්‍රුමයම (ගසම) ළං වීම. උප + සෘජ් + අත = උපසඞ්කීර්ණ. 'උප' පූර්ව 'සෘජ්' ධාතුව ළං වීමෙහි වැටේ. **මාර වාරණ මාන විදාරණෛක පඤ්චානන වූ**— මාර නමැති ඇතා ගේ මානය (එඩිය) බිඳීමෙහි එක මැ සිංහයා වූ. 'වාරණ' යනු ඇතාට නමි. වි + දෘ + අන = විදාරණ 'දෘ' ධාතුව ඉරා දැමීමෙහි- පැළීමෙහි- කඩ කඩ කොට ලීමෙහි- වැටේ. පඤ්ච වූ (පළල් වූ) ආනනය (මුඛය) යමක්හු ගේ ද හේ පඤ්චානන යි. පළල් වූ මුඛයක් ඇති හෙයින් සිංහයාට මේ නමි. 'පඤ්ච' යනු 'පැතුරුණා වූ' යන අර්ථ ඇත්තේ යැ. එයින් අනනය (ජීවනය- ජීවත් වීම) කෙරේ නු යි ආනන යි. ආ + අන් + අන = ආනන. 'අන්' (ජීවත් වීමෙහි) ධාතු යි. **සප්ත සප්තාහාතික්‍රමණයෙන්**— (සප්ත + අහ + අතික්‍රමණ) සත් සති ඉක්මීමෙන්. සප්තයක් අහයෝ (දිනයෝ) යමෙක්හි ද ඒ සප්තාහ යි. 'අහන්' යනු දිනයට නමි. **අනන්‍යප්‍රවර්තනීය**— අන්‍යයකු විසින් නො පැවැත්විය හැකි. න අන්‍ය ප්‍රවර්තනීය අනන්‍යප්‍රවර්තනීය. **විනිවර්තිත**— නවත්වන ලද. වි + නි + වෘත් + + ඉ + ත = විනිවර්තිත. 'නි' පූර්ව 'වෘත්' ධාතු නැවැත්මෙහි වැටේ. අතීත කෘදන්ත 'ත' ප්‍රත්‍යයය ආදියෙම් මුලින් මේ යෙදෙන 'ඉ' යනු ආගමයෙකි. ඇතැම් ධාතූන් කෙරෙන් මේ වෙයි, ඇතැමක් කෙරෙන් නො වෙයි. කෘත- ශ්‍රැත- භූත- + වෘත්ත - දෘෂ්ට- පූර්ණ- යනාදිය නො වන තැනි. රක්ෂිත - පූජිත- මානිත- ගණිත- යනාදි තන්හි වෙයි. ප්‍රයොජ්‍ය වූ තන්හි ද වෙයි කාරිත- මාරිත- යනාදි තන්හි මෙනි. **සංසාර දොෂ වෛෂම්‍ය**— සසර දොස්හි විෂම බව

(දරුණු බව.) විරුද්ධ වූ සමය විෂම යි. විෂමයා ගේ භාවය (විෂම + ය) වෛෂම්‍ය යි. **බහන්නක්හු—** හෙළන්නාහු. හරවන්නාහු. **ලෝකාස්වාදසෙහි—** (ලෝක + ආස්වාද) ලෝකයා ගේ රසයෙහි. ලෝකයෙහි යමෙක් නියම රසයෙන් යුක්ත ද එහි. **අස් බිඳුනක්හු—** මුද්‍රා බිඳැ දමන්නක්හු. ලෝකයෙහි උතුම් රස සාමාන්‍යයන් විසින් නො විඳිය හැකි යැ. කවර හෙයින් ද මුද්‍රා තැබුවාක් මෙන්- අස් එබුවාක් මෙන්- රක්ෂිත වැ සිටි හෙයිනි. බුදුහු ඒ අස් බිඳැ මෙන් ලෝක රසය සත්ත්වයනට ලබා දෙති. **සමාධියට—** සිත එකඟ කිරීමට. සම් + ආ + ධා + ඉ = සමාධි. 'සම්' 'ආ' පූර්ව 'ධා' ධාතු එක් කොටැ පිහිටීමෙහි වැටේ. **ආඥයෙහි—** අණෙහි. ආ + ඥා + අ + ආ = ආඥා 'ආ' පූර්ව 'ඥා' ධාතු ශාසනයෙහි වැටේ. ප්‍රඥාව ගේ ආඥායෙහි මුළු ලොව පැවැත්වීම නම් ප්‍රඥාව විසින් මෙහෙයන ලද සේ කට යුතු කිරීමට සියලු ලෝකයා යෙදවීම යි.

2 **සෞජන්‍යයෙහි කුළු ගන්වමින්—** සුජන භාවය සම්පූර්ණ කෙරෙමින්. 'කුළු' (කූට) නම් ගෙයෙකැ මුදුන යි. එය ගැන්වූ විටැ- සෙවි කළ විටැ- ගෙය සම්පූර්ණ යි. කළ යුතු සියල්ල කෙළවර යැ. එ හෙයින් යම් කිසිවෙකැ කුළු ගැන්වීම නම් ඒ පිළිබඳ කට යුතු සමාප්ත කිරීම යි. **නිමාම්—** සමාප්ති කර්මය. සම්පූර්ණ කිරීම. නිම + කම් = නිම + හම් = නිම + අම් = නිමාම්. **කාරුණ්‍යයෙහි තාරුණ්‍යය දුරු කෙරෙමින්—** දයාවෙහි තරුණ භාවය (ළා බව) නැති කෙරෙමින්. කරුණාව (දයාව) මුහුකුරුවමින්. කරුණාව මැ කාරුණ්‍ය යි. කරුණා + ය. මෙහි 'ය' ස්වාර්ථයෙහි තද්ධිත ප්‍රත්‍යය යි. **සංසරණය—** හැසිරීම. සම් + සෘ + අන = සංසරණ. **පාර ගත වැ—** කෙළවරට ගොස්. පෘ + අ = පර. 'පෘ' (පිරීමෙහි- සමාප්තියෙහි) ධාතු යි. සීමා පරිච්ඡේදය පර නමි. පරය මැ පාර යි. පර + අ = පාර. 'අ' ස්වාර්ථයෙහි තද්ධිත ප්‍රත්‍යය යි. **නානානුභාවයෙන්—** (නානා + අනුභාවයෙන්) විවිධ වූ සාමර්ථ්‍යයෙන්. අනුභාවනය- උද්බෝධනය- කරනුයේ අනුභාව යි. අනු + භූ + අ = අනුභාව. **භක්ති ප්‍රසාද පුරස්සර වැ—** ආදරය ද පැහැදීම ද පෙරටු කොටැ ඇති වැ. පුරඃ (පුදිරියෙහි) සරනුයේ පුරස්සර යි. සෘ + අ = සර. **නිරූපණයෙන්—** දැක්මෙන්. **කර්ණාමෘත—** (කර්ණ + අමෘත) කනට අමා (බඳු) වූ. **ප්‍රවචනාකර්ණනයෙන්—** බුද්ධ ධර්ම ඇසීමෙන්. ආ + කර්ණ් + අන = ආකර්ණන. 'කර්ණ්' (ඇසීමෙහි)

ධාතු සි. **ලෙන්**— හෘදයෙන්. **උතුරුවන්නාක්හු මෙන්**— පිට කරන්නකු (පිටතට ගලා යන්නට හරින්නකු) සේ. **සොලෝ**— ශල්‍යක **දසරුවෙසකි**— උර හිමෙසකි.

**3. චිත්තාචාරය**— (චිත්ත + ආචාරය) සිතෙහි ගතිය. සිත පැවැති සැටි.

## 6. ශෝභිත විවරණ කථා

**1. භගවත්**— පුණ්‍ය- ශ්‍රී- කීර්ති- රමණීයත්ව- ප්‍රේම- ගුණ උත්සාහ- තෘෂ්ණාක්ෂය- මොක්ෂ- ශක්ති- යනාදි අනේකාර්ථයෙහි 'භාග' යනු වැටේ. ඒ එකක් එකක් ඇති හෙයින් බුදුහු භගවත් නම් වෙත්. **අර්හත්**— සත්කාර ගුරුකාර පූජන මානන ආදියට සුදුසු වූයේ 'අර්හත්' නම්. අර්හ් + අත්. 'අර්හ්' (සුදුසු වීමෙහි) ධාතු සි. **සම්‍යක්සම්බුද්ධ**— 'මනා සේ (සියල්ල) අවබෝධ කළ' යනු අර්ථ සි. 'සම්‍යක්' යනු 'මනා සේ' යන අර්ථයෙහි අව්‍යය සි. **අනන්තර්හිත**— අතුරුදහන්. අනන්තර් + ධෘ + ත = අනන්තර්හිත. 'ධ' කාරයට 'හ' කාරාදේශ වූයේ යැ. **බුද්ධාන්තරයක්**— (බුද්ධ + අන්තර) බුදුවරුන් දෙදෙනකු අතර කාලය බුද්ධාන්තර නම්. **අකාරණ කරුණා ප්‍රලෝභිත වූ**— නිෂ්කාරණ කරුණාව විසින් පොලොඹවන ලද (ආශාවෙන් බැඳැ ගන්නා ලද.) ලෝකයෙහි බොහෝ දෙන කීර්ති ප්‍රශංසාදි වූ යම් කිසි කාරණයක් නිසා මැ කරුණාව දක්වති. එ බඳු කිසි අපේක්ෂාවක් නැති වැ- කාරණයක් නැති වැ- හේතුවක් නැති වැ- දක්වන කරුණාව 'අකාරණ කරුණා' නම්. කාරණයක් නැත්තේ යමකට ද ඒ අකාරණ සි. ප්‍ර + ලුභ් + ඉ + ත= ප්‍රලෝභිත. 'ලුභ්' (ලෝභනයෙහි) ධාතු සි. බුදුන් ගේ සිත අකාරණ කරුණායෙන් පොලොඹවන ලද්දේ යැ- අකාරණ කරුණාවට කළ දාස ලෝභයෙන් බඳනා ලද්දේ යැ. **ධර්මිෂ්ඨ**— අතිශයින් ධාර්මික. ධර්ම ඇත්තේ (ධර්ම+ඉන්) 'ධර්මින්' නම් වේ. **අතිශයින්** ධර්මි වූයේ (ධර්මින් + ඉෂ්ඨ) ධර්මිෂ්ඨ සි. **'ඉෂ්ඨ'** යනු අතිශයාර්ථයෙහි ප්‍රත්‍යයය සි. 'ඉෂ්ඨ' පර කල්හි 'ඉන්' ප්‍රත්‍යයය ලොප් වෙයි. **පතිව්‍රතා ධර්ම පරවශ වූ**— පතිව්‍රතා ධර්ම සඞ්ඛ්‍යාත අන්‍යයාම වශ (යටත්) වූ. පතිව්‍රතා ධර්මයෙහි ලා ස්වාධීන නුවූ. පති සේවනය ව්‍රතය වූයේ යමකට ද ඕ පතිව්‍රතා යැ. පතිව්‍රතාව ගේ ධර්මය පතිව්‍රතා ධර්මය සි. පරයාට

(අන්‍යයාට) වශ (යටත්) වූයේ පරවශ යි. මෙහි අන්‍යයා නම් පතිව්‍රතා ධර්මය යි. 'පතිව්‍රතා ධර්මය විසින් මැ හසුරුවන ලද' යනු මේ හි සැටි යැ. **විචකිල දශීන් වූ—** 'විචකිත' යනු සුමන විශෙෂණයකට නමි. එ හෙයින් 'සමන් මල් වැනි දතුම් ඇති' යැ යි අරුත් පැවැසියැ හැකි. විනත්‍ය යි. **අඛිල ගුණ ගණාභිරාම වූ—** (ගණ+අභිරාම) සියලු ගුණ සමූහයන් කරණ කොටැ ගෙනැ අතිශයින් රමණීය වූ. **රති කෙලි ශ්‍රාන්ත කුචාන්ත නිර්වාන්ත ස්වෙදාම්බු ධාරා නිර්වාර රති කලම්ප්‍ර ඇති වැ—** (කුච+අන්ත, ස්වෙද+අම්බු) රති කෙළියෙන් ස්‍රාන්තයට පැමිණි තන කෙළවරින් වැහුණු ඝන දිය දහරින් වළක්වන ලද රති පිඩා ඇති වැ. බෝසතුනට රති කෙළියෙන් පිඩා ඇති වූ කලැ ඒ පීඩාව වළකනුයේ, එ සේ මැ රති කෙළියෙන් පිඩාවට පැමිණි සත්‍රීන් ගේ පයොධරාග්‍රයෙන් වැගෙන ඝන දිය දහරිනි. රම්+ති= රති. 'රම්' (රමණයෙහි) ධාතු යි. නිර්+වම්+ත= නිර්වාන්ත. 'නිර්' පූර්ව 'වම්' ධාතුව වහනය කිරීමෙහි වැටේ. ස්විද්+අ= ස්වෙද. 'ස්විද්' ධාතුව සිදීමෙහි වැටේ. නිර්+වෘ+අ= නිර්වාර. 'වෘ' (වැළැක්මෙහි) ධාතු යි. කලම්+අප්‍ර= කලම්ප්‍ර, 'කලම්' (ආයාසයෙහි— කලාන්ත වීමෙහි) ධාතු යි. 'කලම්පු' 'කලම්ප' යන දෙක මැ සමානාර්ථ යි. **පුරුෂ සිංහ—** පුරුෂොත්තම. **පශ්චිම යාම සමනන්තර සම්බොධක—** පශ්චිම යාමයට (අලුයමට) අනතුරු වැ මොහොතට අවබොධ කළා වූ. එකකට සමනන්තර වැ අනෙකක් වීම නම් අතර කාලයක් නො හැර දෙක මැ සිදු වීම යි.

2. **රූපධෙය—** රූපය. රූපය මැ රූපධෙය නමි. 'ධෙය' යනු ස්වාර්ථයෙහි වේ. **රූපගත වූ භාග්‍යධෙය ඇති—** රූපයට ගියා වූ (රූපයෙහි පිහිටියා වූ) භාග්‍ය (පින්) ඇති. පින් ලකුණු රූපයෙහි පිහිටි හෙයින් මෙ සේ කියත්. **සර්වඥතා ඥාන ධෙය ඇති—** සියල්ල දන්නා ඥානයා ගේ පොෂණය ඇති. සියල්ල දන්නා නුවණෙහි පටන්ගැන්ම දතුදු ඇති. එය වැඩෙමින් පවතී. දුන් එ හෙයින් ඒ ධෙය යි. ධා+ය= ධෙය. 'ධා' (පොෂණයෙහි) ධාතු යි. **ශ්‍රද්ධෙය වූ—** හැදැහියැ යුතු වූ. 'ශ්‍රත්' යන අව්‍යය පූර්ව කොටැ ඇති 'ධා' ධාතු හැදෑහීමෙහි වැටේ. **කරුණා විධෙය වූ—** කරුණාව විසින් විධාන (නියම) කළ යුතු වූ. බෝසතුනට කායී විධානය කරණුයේ කරුණාව යි. කරුණාව විසින් විධාන කරන ලද කට යුතු ඔහු කෙරෙති. 'වි' පූර්ව 'ධා' ධාතු විධානයෙහි වැටේ. **සකල ලොකාභිධෙය වූ—** (ලොක+අභිධෙය) සියලු ලොකයා විසින් (නම) සඳහන්

කළ යුතු වූ 'අභි' පූර්ව 'ධා' ධාතු නම සඳහන්කිරීමෙහි වැටේ. බෝ සතුන් ගේ නම සකල ලොකයා විසින් කියැ යුත්තෙකි. **හෘදය සන්නිධෙය** වූ— හෘදයයෙහි (සිතෙහි) නිධාන කළ යුතු වූ (බැහියැ යුතු වූ) මෙනෙහි කළ යුතු වූ. 'සම්' 'නි' පූර්ව 'ධා' ධාතු බහා තැන් පත් කිරීමෙහි වැටේ. **සුජාත නාමධෙය** වූ— සුජාත නම් වූ. **පඤ්ච මහා ගඞ්ගා ප්‍රවාහය**— පස් මහ ගඟෙහි වතුර. ගඞ්ගා, යමුනා, අචිරවතී, සරභූ, මහී යන මොහු පුරාතන ජාම්බුද්වීපිකයන් ගේ පස් මහ නදිය යි. ප්‍ර + වහ් + අ= ප්‍රවාහ. 'වහ්' (වහනයෙහි—ගැලීමෙහි) ධාතු යි. **නමන්නා සේ**— හරවන්නා මෙන්.

3. **අනාගතාංශ ඥානයෙන්**— (අනාගත + අංශ) අනාගත පක්ෂය දක්නා නුවණින් ආ + ගම් + ත= ආගත. 'ආවා වූ' යනු අර්ථ යි. න ආගත අනාගත.

---

## 7. අනවමදර්ශි විවරණ කථා

---

1. **ඒකාලෝකීකෘතවිශ්වලෝක** වූ— (ඒක + ආලෝකී...) එක සේ හෙළි කරන ලද සමස්ත ලොක ඇති වූ. සියලු ලොව ඒකාලොක කළා වූ. **කර්තව්‍ය යෑ**— කළ යුතු යැ. කෘ + තව්‍ය= කර්තව්‍ය. 'තව්‍ය'—'අනීය'—'ය'— යන ප්‍රත්‍යය තුන මැ එකාර්ථ යි. කර්තව්‍ය—කරණීය—කාර්ය— යනු එකාර්ථ වනුයේ එ හෙයිනි. **සාවද්‍ය**—අවද්‍ය (වරද) සහිත. **විභාගයක්**— බෙදා ගැනීමක්. වෙන් කැරැ ගැන්මක්. වි+භජ් + අ= විභාග. 'භජ්' (බෙදීමෙහි) ධාතු යි. **බුද්ධාදිත්‍ය විගමයෙන්**— (බුද්ධ + ආදිත්‍ය) බුදුන් නමැති සූර්යයා පහ වීමෙන්. බුදු හිරු නැත්තෙන්. න දිති අදිති. අදිතිය ගේ පුත් ආදිත්‍ය. විශෙෂයෙන් සූර්යයාට ද සාමාන්‍යයෙන් දෙවියනට ද නමි. 'කශ්‍යප' නම් ආදි පුරුෂයා ගේ පළමු වන භාර්යාව 'දිති' නම් යැ. ඇය ගෙන් පැවැතෙන්නෝ 'දෛත්‍ය' නම් වෙති. ලක් වැස්සෝ මේ ගොත්‍රයට අයත් හ. කශ්‍යපයා ගේ දෙ වැනි භාර්යාවක් ද වූව. දිතියට විරුද්ධ වූයෙන් ඇයට 'අදිති' නාමය වී. ඇය ගෙන් පැවැතෙන්නෝ 'ආදිත්‍ය' නම් වෙති. 'සුර' යනු ද ඔවුනට නාමෙකි. යම් කරුණෙකින් ඔහු 'සුර' නම් වූ හු ද ඒ කරුණ පිළිකුල් කොටැ සිතූ දෛත්‍යයෝ තමන් 'අසුර' නාමයෙන් හැඳින්වූහ. වි + ගම් + අ= විගම. 'වි' පූර්ව 'ගම්' ධාතුව වෙන් වැ (පහ වැ) යෑමෙහි වැටෙයි.

**2. මනොරථෛක නිෂ්පාදනෛක කල්ප වෘක්ෂ** වූ - අභිලාෂයා ගේ අසහාය නිෂ්පාදනයට (අසමාන සේ—අන් කිසිවකු විසින් නො කළ හැකි සේ—සැපැයීමට) එක මැ කප් රුක වූ. **පරමාර්ථ දර්ශි** වූ—(පරම+අර්ථ) ඉතා උතුම් අර්ථය දක්නා සුලු වූ. **අනවමදර්ශී**—'අනවමය (පහත් නුවූ දය—උතුම් දය) දක්නා සුලු' යනු අර්ථ යි. **ශ්‍රමණ පද්ම** වූ—ශ්‍රමණ උත්තම වූ. 'පද්ම' යනු මෙහි උත්තමාර්ථය දෙයි. ශ්‍රම්+අන= ශ්‍රමණ. 'ශ්‍රම්' ධාතුව ශ්‍රමයෙහි (අභ්‍යාස කිරීමෙහි) වැටේ. **අනවරාග්‍ර සංසාර සාරද** වූ— ('සංසාර දැඩු' යනු මුද්‍රණ දෝෂ යි.) අග් මුල් නැති සංසාරයෙහි සාරය දෙන්නා වූ. අවරය (කෙළවර) ද අග්‍රය (මුල) ද අවරාග්‍ර යි. අවරාග්‍රයන් නැත්තේ යමෙක් ද ඒ අනවරාග්‍ර යි. සංසාරය කෙළවර වන තැනක් පටන් ගත් තැනක් නො පෙනෙන හෙයින් අනවරාග්‍ර වෙයි. සාරය දෙනුයේ සාරද යි. මෙහි සාරය නම් සත්‍යය යි. බුදුහු ලොකයට චතුරාර්‍ය සත්‍යය දෙන්නාහු 'සාරද' නම් වෙති.

**3. සාන්ද්‍ර**— ඝන. 'මනොඥ' යනු ද 'සාන්ද්‍ර' යන්නෙහි එක් අර්ථයකි. එ ද මෙහි ගැළැපෙයි. **දුරවග්‍රාහ්‍ය ප්‍රතාප භාස්වත්** වූ— ('දූරවගාහ' යනු මුද්‍රණ දෝෂ යි.) ළං වියැ නො හැකි තේජස කරණ කොට ගෙනැ සූර්‍යා වූ. දුර්+අව+ග්‍රහ්+ය = දුරවග්‍රාහ්‍ය 'අව' පූර්ව 'ග්‍රහ්' ධාතු ළං වීමෙහි වැටේ. ළං වියැ හැක්කේ අවග්‍රාහ්‍ය යි. දුක සේ ළං වියැ හැක්කේ දුරවග්‍රාහ්‍ය යි. ප්‍රකර්ෂයෙන් තවනුයේ ප්‍රතාප යි. ප්‍ර+තප්+අ. 'තප්' ධාතුව (තැවීමෙහි) වැටේ.) 'ප්‍රතාප' යනු තෙජසට ද සූර්‍ය රශ්මියට ද නම්. භාස් (රශ්මි. ඇතියේ භාස්වත්. **යශස්වත්**— ('යශවත්' යනු මුද්‍රණ දෝෂ යි ) **අප්‍රතිහත යශොධර** වූ - නො වළක්වන ලද කීර්ති දරන්නා වූ. ප්‍රති+හන්+ත = ප්‍රතිහත. 'ප්‍රති' පූර්ව 'හන්' ධාතු වැළැක්වීම, මැරීම, විනාශ කිරීම, යනාදි අර්ථයන්හි වැටේ. **නයනොන්මාදයෞවනශ්‍රීමත්** වූ— (නයන+උන්මාද) ඇස් උමතු කරවන යොවුන් සිරි ඇති. උද්+මද්+අ = උන්මාද. 'උද්' පූර්ව 'මද්' ධාතු අතිශයින් මත් කැරැවීමෙහි වැටේ **වදන වනජ විකාස භාස්කර** වූ— මුනුණු නමැති පියුම් පුබුදු කිරීමෙහි සූර්‍යා වැ. වනයෙහි (ජලයෙහි) දූනුයේ (උපන්නේ) වනජ යි. 'වන' යනු ජලයට ද නම්. 'ජන්' (ඉපැදීමෙහි) ධාතු යි. භාස් (රශ්මීන්) කරනුයේ භාස්කර යි. **සිව් ගෙසෙකින්**— ද්වෙලාවෙකින්. **විශොකාඪ**— ශොකරහිත

බවට. ශුච් + අ = ශෝක. 'ශුච්' (ශෝකයෙහි) ධාතු යි. විගත වූ ශෝකය යමක්හු ගේ ද හේ විශෝක යි. විශෝකයා ගේ භාවය (විශෝක + ත්ව) 'විශෝකත්ව' නම්. **විශාඛ—** වෙසක්. **පුණ්ණමාසිය—** පුන් සඳ ඇති දවස. පුණ් වූ මාසයා (චන්ද්‍රයා) යමෙක්හි ද ඒ පුණ්ණමාස යි. ස්ත්‍රී ප්‍රත්‍යය ('ඊ') වූ කල්හි 'පුණ්ණමාසී' යනු වෙයි. **සජ්ජන පූජිත—** (සත් + ජන) සත්පුරුෂයන් විසින් පුදනා ලද. **මාර තජ්ජනකර—** මාරයාට තජ්ජනය කරන්නා වූ තර්ජ් + අන = තජ්ජන. 'තර්ජ්' (තැති ගැන්වීමෙහි) ධාතු යි. **අර්ජුන—** කුඹුක්. **දුර්වාර මාර තරුණ තරණි මණ්ඩලාග්‍රාසෛක ධූමග්‍රහ වූ—** (මණ්ඩල + ආග්‍රාස + ඒක) දුක සේ වැළැක්විය හැකි මාර නමැති තරුණ වූ සූර්ය මණ්ඩලය කටට ගැන්මෙහි එක මැ රාහු ග්‍රහයා වැ. තෘ + අණි = තරණි. 'තෘ' ධාතුව අභිව්‍යාප්තියෙහි වැටේ. ආකාශයෙහි අභිව්‍යාප්ත වැ (පැතිරී) සිටී නු යි සූර්ය 'තරණි' නම් වේ. ආ + ග්‍රස් + අ = ආග්‍රාස. 'ග්‍රස්' (කෑමෙහි, කටට ගැන්මෙහි, ග්‍රහණයෙහි) ධාතු යි. **ධූම ග්‍රහ** රාහු ග්‍රහයා. **අග සස්—** අග්‍ර ශස්‍ය. අග්‍ර ඵල පරම ඉෂ්ට විපාක. **රූව අඳිමින්—** (සජීවී) රූපය පාමින්. **නිවන් දොරක්—** නිවනට යන තීර්ථයක් (තොටු පළක්.) **කුසල් බඩු පටනක්—** කුසල් නමැති බඩු ඇති නගරයක්. 'පටුනු' යනු නගරයට නම්. සංස්කෘතයෙහි 'පට්ටන' යනු ද 'පත්තන' යනු ද වෙයි. **ඇඳුරු හලක්—** ආචාර්ය ශාලාවක්. උගන්වන තැනක්. **කුලයෙන් කුලයෙහි—** ගෙයින් ගෙහි. 'කුල' යන්නෙහි අර්ථය නම් 'සමූහය' යනු යි. එක ගෙයි ඇත්තන් කුල වැ- සමූහ වැ- වසන හෙයින් එ ද 'කුල' නම්. **මොහ නිද්‍රා—** මුළා බව (මෝඩ බව) නමැති නින්ද. **මෞන මුද්‍රාව—** තූෂ්ණීම්භාවය (නො බැණ සිටීම) නමැති අස්. ලෝක වාසිනු සත්‍යය නො දන්නාහු නො බැණ අස් එබුවාක් මෙන්, මුද්‍රා (Seal) තුබුවාක් මෙන් සිටිති. බුදුහු ඒ මුද්‍රාව බිඳිති. මුනිහු ගේ භාවය (මුනි + අ) මෞන යි. තාපස්විහු බිණුම් (දෙඩුම්) හැර භාවනා කෙරෙති. නො බිණීම ඔවුනට අයත් ව්‍රතයෙකි. එ හෙයින් 'මෞන' නම්. **නිෂේකය—** ඉසීම නි + සිච් + අ.

4 **ඇසිල්ලකුදු—** (ඇසිල්ලක් + දු) මොහොතකුත්. **ඔද වඩනා—** සතුටු වැඩි කරන. සසර දික් කරන පාපයෝ සසරට ඔද වඩනා හ. **බොධි සත්ත්ව ධුරය කරහමින්—**

කවර කම්පුත්තක් කළ ද එය බෝධි සත්ත්ව ධුරයම අලඞ්කාරයක් කළ බව මේ කී සැටි යැ.

5. වුව— වී නම්. දෙවතා වුව— දෙවියෙක් වී නම. මේ 'දෙවතා' යනු 'යක්ෂ' යන්නට සමාන කොටැ යෙදිණ. සිංහලයන් ගේ මී මුත්තන් වූ යක්ෂයන් ගරහන්නන් ගේ ඇස් ඇසීමට මේ පමණි. දුටු— දිටි නම්. පමන් ගත— පමන් ගත් නම්. බෝධි සත්ත්ව කෙනකුන් දෙත දන නම් විසිතුරු මැ යැ. ඒ බෝධි සත්ත්වයෝ ද දෙවිතා වූ නම්, දන වඩා ලාත් විසිතුරු වෙයි. එ සේ ද වී බුදු කෙනකුන් දූ කැ දෙත දනෙක් නම්. එහි විසිතුරු කෙ සේ කියැ හැකි ද? එකද්වාර කරන්නා සේ— එක දොරකින් නික්මවන්නා සේ.

---

## 8. පද්ම විවරණ කථා

---

1. **ත්‍රිකාල**— අතීතානාගත වර්තමාන යන කාල ත්‍රයය **අතීත**— ඉක්මුණු. අති + ඉ + ත = අතීත. 'අති' පූර්ව 'ඉ' ධාතුව ඉක්මැ යෑමෙහි වැටේ. **නිරූපම වූ බුද්ධ- ශ්‍රී- පද්ම වූ**— උපමා රහිත බුද්ධ ශ්‍රීය නම් පියුමක් වූ. 'ශ්‍රී' යනු විෂ්ණු භාර්යාවට (ලක්ෂ්මියට- ශ්‍රී කාන්තාවට) ද නමි. ඇය වසනුයේ පියුමෙකැ යැ. බුද්ධ ශ්‍රීය ශ්‍රී කාන්තාව නම් ඒ බුදුහු පියුම වෙති. **විකසිතමුඛපද්ම වූ**— පිපුණු මුඛ නමැති පියුම ඇත්තා වූ. මුඛය පිපි පියුමක් වැනි වූ. **සකල ලෝකාර්ථ සම්පාදක වූ**— (ලෝක + අර්ථ) සියලු ලොවට වැඩ සපයන්නා වූ. **අප්‍රතිසම වූ**— ප්‍රතිසමයකු (සමාන වන්නකු) නැත්තා වූ. **කල්‍යතාසම වූ**— (කල්‍යතා + අසම) මනෝහර භාවය කරණ කොටැ ගෙනැ අසමාන වූ. කල්‍යතායෙන් ඒ ශරීරයට සමාන කළ හැකි අන්‍ය ශරීරයෙක් නැති. කල් + ය = කල්‍ය. 'කල්' (චෝදනයෙහි- ප්‍රේරණයෙහි- මෙහෙයීමෙහි) ධාතු යි. කල්‍යයා ගේ භාවය කල්‍යතා යැ. **තනු ලතා විලාස**— ශරීරය නමැති ලතායෙහි ලීලාව. **රුචිර යෞවනාවතාර පරම මධුරීභූත**— (යෞවන + අවතාර) රිසි උපදවන්නා වූ යෞවනය පැමිණීමෙන් අතිශයින් රමණීය වූ මධුර+භූත= මධුරීභූත. **ලෝකෝත්තර වූ**— අලෞකසාමාන්‍ය වූ. **මධුරාධර ව්‍යඤ්ජනෝපනීත ගණ්ඩූෂ මධු පාන මත්ත වැ**— (මධුර+අධර ව්‍යඤ්ජන+උපනීත) මීහිරි වූ යටි තොල් නමැති ඔබමින් (පාන පාත්‍රයෙන්) එළවන ලද මුව

පිරූ මිහි පැණින් මත් වැ. ස්ත්‍රී අධරය, ඔඩමක් මෙන්, මධු පානයෙන් බෝ සතුන් ගේ මුඛය පුරවයි. මුව පුරන තරම් ප්‍රමාණයට 'ගණ්ඩූෂ' යනු නමි. 'චෂක' නම් මද්‍ය පානයට ගැනෙන පාත්‍රය යි. **නිරතිශය ස්නේහෝත්තර** වූ— (ස්නේහ + උත්තර) අතිශයින් අධික වූ ස්නේහය උතුරුවන්නා වූ. ස්නිහ් + අ = ස්නේහ. 'ස්නිහ්' (ස්නේහයෙහි) ධාතු යි. **නිර්ව්‍යාජ මනෝරථ සාධන** වූ— ('සාධනීය' යනු මුද්‍රණ දෝෂ යි.) නිබොරු වූ අභිලාෂ සිද්ධ කරන්නා වූ. අභිලාෂය සත්‍ය පරිද්දෙන් සිද්ධ කරන්නා වූ. එයින් සාධනු ලැබේ නු යි සාධන යි. සාධ් + අන. **ශ්‍රෙෂ්ඨිනු ගේ**— සිටුනු ගේ. **අතිධන්‍ය**— ඉතා පින්වත්. (භාග්‍යසම්පන්න.) **නයනමනෝහර** වූ— ඇස් ද සිත් ද පැහැර ගන්නා වූ (ඇදූ ගන්නා වූ.) නෙත් සිත් පිනවන්නා වූ. නයන ද මනස් ද නයනමනස්. නයනමනසුන් හරණය කරනුයේ නයනමනෝහර යි. හෘ + අ = හර. **මධුකරාකර**— (මධුකර + ආකර) බමරුනට ආකර වූ (උත්පත්ති ස්ථානයක් වැනි වූ.) බොහෝ බමරුන් ඇති. **සහකාර වනයෙහි**— මී අඹ වනයෙහි. **නාස්තිකාජීවකොපනීත**— (නාස්තික + ආජීවක + උපනීත) නාස්තික නම් ආජීවකයා විසින් එළවන ලද. පව් පින් පල නැතැ යි සන දෘෂ්ටි විශේෂයෙක් ද නාස්තික නාමයෙන් ගැනේ. **අෂ්ට නාණ මුෂ්ටි ග්‍රහ** වැ— නාණ මිටි අට ගෙනැ. මුෂ් + ති = මුෂ්ටි. 'මුෂ්' (සැඟැවීමෙහි) ධාතු යි. යම් කිසිවක් අතෙහි සැඟැවුව මනා කලැ මිට මොළවනු ලැබේ. මිටින් ගන්නා දූය ද 'මිටි' නාමයෙන් ගැනේ. ගනුයේ ග්‍රහ යි. ග්‍රහ් + අ = ග්‍රහ. 'ග්‍රහ්' (ගැනීමෙහි) ධාතු යි. **තරුණ ශෝණ පල්ලවාභිරාම**— (පල්ලව + අභිරාම) ළා රතු දළුයෙන් ඉතා රමණීය වූ. ශෝණ් + අ = ශෝණ. 'ශෝණ්' (රතු වීමෙහි) ධාතු යි. **මහාශෝණ**— නොවිල. **මාර සාහස ප්‍රභාව නව භානු ප්‍රතාප තුහින ලේශයට පමුණුවා**— ('ප්‍රතාන' යනු ද 'ලේසයට' යනු ද මුද්‍රණ දෝෂ යි.) මාරයා ගේ දුෂ්ට ක්‍රියා සාමර්ථ්‍යය අභිනව සූර්යයා ගේ උෂ්ණයෙහි පිනි මෙන් කුඩා බවට පමුණුවා. සහසා (වහා-නො විමසා) කැරෙනුයේ සාහස යි. දුෂ්ට කර්මයට නමි. ප්‍ර + භූ + අ = ප්‍රභාව. පුළුවන් කම යි (සමර්ථ බව යි.) දිලියෙනුයේ භානු යි. භා + නු. 'භා' දීප්තියෙහි ධාතු යි. ප්‍රකර්ෂයෙන් තවනුයේ ප්‍රතාප යි. ප්‍ර + තප් + අ = ප්‍රතාප. කුඩා බව 'ලේශ' නමි. ලිශ් + අ = ලේශ. 'ලිශ්' කුඩා වීමෙහි ධාතු යි. **සකල කාල දේශ ස්වභාව ව්‍යවහිත කාරණ ශුක්ල භින ප්‍රණීත**

**සාවද්‍යානවද්‍ය නෛක වස්තු විස්තර තත්ත්ව විභාවි වූ**— ('තත්ත්වාවභාවි' යනු මුද්‍රණ දෝෂ යි.) (සාවද්‍ය + අනවද්‍ය) සියලු කාල දෙශ ස්වභාව විසින් බෙදන ලද කළු යැ සුදු යැ පහත් යැ උසස් යැ සවරද යැ නිවරද යැ යන නොයෙක් වස්තූන් ගේ විස්තර තත්ත්වය දක්වීම් ඇති. සර්වඥතා ඥානය අනෙක ප්‍රකාරයෙන් භින්න වූ සමස්ත වස්තූන් ගේ විස්තාර තත්ත්වය දක්වයි. වස්තූහු කෙසේ භින්නයෝ ද? කාල වශයෙන් දෙශ වශයෙන් ස්වභාව වශයෙන් භින්නයෝ යැ. යළි දු කළු යැ හෙවත් පාප යැ සුදු යැ හෙවත් පුණ්‍ය යැ පහත් යැ උසස් යැ සවරද යැ නිවරද යැ යනාදි විසින් නෛක-විධයෝ යැ (විවිධයෝ යැ.) සර්වඥතා ඥානය ඒ සකල වස්තූන් ගේ විස්තර තත්ත්ව දක්වයි. ස්ව (තමා ගේ) භාවය ස්වභාව යි. වි + අව + ධා + ත = ව්‍යවහිත. 'වි' 'අව' පූර්ව වූ 'ධා' ධාතු වෙනස් වීමෙහි වැටේ. හා + ත = හීන. 'හා' ක්ෂයයෙහි ධාතු යි. න අවද්‍ය අනවද්‍ය. න එක නෛක. වි + ස්තෘ + අ = විස්තර. 'වි' පූර්ව ''ස්තෘ' ධාතුව පැතිරීමෙහි වැටේ. වි + භූ + අ = විභාව. 'වි' පූර්ව 'භූ' ධාතුව දක්වීමෙහි වැටේ. විභාව ඇතියේ (විභාව + ඉන්) විභාවින්.

2. **මධුර ගුමු ගුමු රව මුඛර මධුකර නිකර නිරන්තර වූ**— මිහිරි ගුමු ගුමු නාදයෙන් දොඩමළු වූ (ඝොෂ සහිත වූ) බමර සමූහයා ගෙන් අතුරු නැති වූ. 'ගුමු' යනු බමරු ගේ නාදය යි. රු + අ = රව. 'රු' ශබ්දයෙහි ධාතු යි. **ප්‍රචල ප්‍රවාල ජාල දන්තුර වූ**— ('ජාලා' යනු මුද්‍රණ දෝෂ යි.) අතිශයින් සැලෙන්නා වූ පල්ලව සමූහය කරණ කොට ගෙන දත් සහිත වූ. ප්‍රකර්ෂයෙන් චලනය වන්නේ (ප්‍ර + චල් + අ) ප්‍රචල යි. උස් දත් ඇතියේ (දන්ත + උර) දන්තුර යි. උස් දත් ඇතියා මෙන් උල් සහිත වූයේ ද දන්තුර යි. ලා දළු ඇති වැ උල් මෙන් සිටි හෙයින් 'දන්තුර' යි කියැවිණ. **තරුණ සහකාරාඞ්කුරාස්වාද චපල**— (සහකාර + අඞ්කුර + ආස්වාද) ලා මී අඹ දළු රස විඳීමෙන් චපල වූ (මත් වූ.) කොවුලන් අඹ දළු කා මත් වෙති යි යෙති. **කොකිල කුලයා**— කොවුල් සමූහයා. **කුහු කුහු රවයෙන්**— කුහු කුහු නාදයෙන්. 'කුහු' යනු කොකිල නාදය යි. **ශීතලච්ඡායායෙහි**— (ශීතල + ඡායා.) සිසිල් සෙවණෙහි. **තරුණාරුණ හරිණ ගණයා**— (තරුණ + අරුණ) බාල වූ අරුණවර්ණ වූ මුව සමූහයා. මඳ රත් පැහැය 'අරුණ' නම්. **රෝමන්ථයෙන්**— වමාරා කෑමෙන්. ඇතැම් සිවුපාවෝ **තණ** පත් ආදිය වහවහා කපින් කඩා

ගෙනැ, මනා කොටැ නො වීකා ගිලැ, සෙවණ ඇති තැනකට වී හෙවැ, ඒ ගුලි අහර වමාරා මුඛයට ගෙනැ, මැනැවින් වීකා ගිලිති. මෙ සේ වමාරා වීකීම ‘රොමන්ථ’ නම් වේ. **මන්ථර**— සම්බාධ වූ. එ සේ තැනින් තැනැ මුවන් හොත් කලැ වනය සසම්බාධ යැ. **මන්ද මාරුතාන්දොලිත වූ නව ලතා වනිතාවන් ගේ පල්ලව කරාභිඝාතයෙන් සන්තුෂ්ට වැ ගත්තා වූ තරුණ පුෂ්පාඞ්කුර නමැති රොමාඞ්කුර ඇති**— (‘පල්ලවාඞ්කුරාභිඝාතයෙන්’ යනු මුද්‍රණ දොෂ සි.) (මාරුත + ආන්දොලිත, කර + අභිඝාත, පුෂ්ප + අඞ්කුර, රොම + අඞ්කුර) මඳ සුළඟින් සෙලවන ලද්දා වූ අලුත් ලිය (වැල්) නමැති ස්ත්‍රීන් ගේ දළු නමැති අතින් ගැසීමෙන් සතුටු වැ ඇති වූ මල් කැකුළු නමැති රොමොද්ගම (ලොමුදහ) ඇති. මේ කියැවෙන ඡායා වෘක්ෂයන් ගේ මල් කැකුළු වෙසි. ඒ ලොම් කෙළින් වැ සිටියා වැන්නැ. කවර හෙයින් ලොම් කෙළින් වේ ද? මඳ සුළඟින් සෙලවන ලද ලතාවන් ගේ පල්ලවයෝ වෘක්ෂයනට වදිති. ඒ නව ලතා නමැති ස්ත්‍රීන් දළු නමැති අතින් ගසන්නා වැන්නැ. තරුණ ස්ත්‍රියක ආදරයෙන් කොමල අතින් ගැසූ කලැ කවර නම් රසිකයකුහු ගේ රොමොද්ගමය නො වේ ද? ආන්දොල් + ඉ + ත = ආන්දොලිත ‘ආන්දොල්’ ධාතුව දොලනයෙහි (හෝවිලියෙකැ මෙන් ඒ මේ අතට පැද්දීමෙහි) වැටේ. ‘කර’ යනු හස්ත පර්යාය සි. අභි + හන් + ත = අභිඝාත. ‘හන්’ (ගැසීමෙහි) ධාතු සි. ‘ගත්තා වූ’ යනු මෙහි ‘හට ගත්තා වූ’ ‘ඇති වූ’ යන අර්ථයෙහි වෙසි. ‘පල ගත්තා වූ’ යන තන්හි මෙනි. පුෂ්පාඞ්කුර නම් මල් කැකුළු සි. ‘රොමාඞ්කුර’ යන තන්හි ‘අඞ්කුර’ යනු ‘තුඩ’ යන අර්ථයෙහි වෙසි. තුඩු කෙළින් වැ සිටීම මෙහි අභිප්‍රෙත සි. **ඡායා ද්‍රැමයෙන්**— සෙවණ ඇති ගසින්. සෙවන දෙන ජණීස වවන ලද ගස් ද මෙ නම්. **සන්තතාරබ්ධ වූ**— (සන්තත + ආරබ්ධ) සියලු කල්හි අරඹනා ලද (පටන් ගන්නා ලද.) ‘සන්තත’ යනු ද ‘සතත යනු ද එකාර්ථ සි. සම් + තන් + ත = සන්තත. ‘සම්’ පූර්ව ‘තන්’ ධාතු එකට පැතිරීමෙහි වෙසි. ආ + රභ් + ත = ආරබ්ධ. ‘ආ’ පූර්ව ‘රභ්’ ධාතු ඇරඹීමෙහි වැටේ. **සිද්ධ- විද්‍යාධරයන් ගේ**— සිද්ධයන් ගේ ද විද්‍යාධරයන් ගේ ද. සිද්ධ යනු ද විද්‍යාධර යනු ද දෙව යොනි දෙකකට නම්. අෂ්ටවිධ සිද්ධියෙන් යුක්තයෝ සිද්ධයෝ යැ. අෂ්ට සිද්ධිහු නම්—

"අණිමා ලඝිමා ප්‍රාප්තිඃ ප්‍රාකාම්‍යං මහිමා තථා
ඊශිතා වශිතා චෛව තථා කාමාවශායිතා"

යනුයෙන් දක්වුණු කුඩා වීම, ලුහු වීම, ලැබීම, නො වැළැක්විය හැකි ඉච්ඡාව, මහත් වීම, ප්‍රභුත්වය, වශිත්වය, කාමය අභිභවනය කිරීම්, යන මොහු සි. (ගුළි අඳුන් ආදී) විද්‍යාව ධරනුයේ විද්‍යාධර සි. විද්‍යා බලයෙන් අහසින් යෑම් ආදිය කරනුයේ යැ. **සඞ්ගීත ප්‍රසඞ්ග**— සඞ්ගීතයෙහි යෙදීම. ප්‍ර+සඤ්ජ්+අ = ප්‍රසඞ්ග. 'ප්‍ර' පූර්‍වී 'සඤ්ජ්' ධාතු යෙදීමෙහි වැටේ. **වන මහිෂ විශාණ ඝාතයෙන් ඝූර්ණිත වූ සරො රොධස් ඇති**— (සරස්+රොධස්) වල් මීනිවුන්ගේ අඟින් පහර දීමෙන් පෙරළන ලද විල් ඉවුරු ඇති. හන්+ත = ඝාත. 'හන්' (පහර දීමෙහි) ධාතු සි. ඝූර්ණ්+ඉ+ත = ඝූර්ණිත. 'ඝූර්ණ්' (පෙරළීමෙහි, සෙවිල්ලීමෙහි) ධාතු සි. 'සරස්' යනු විලට නම්. රුධ්+අස් = රොධස්. 'රුධ්' (වැළැක්මෙහි) ධාතු සි. පිටතැ ගලා යෑම වළකන හෙයින් තීරය (ඉවුර) 'රොධස්' නම්. **මත්ත මාතඞ්ගයන්ගේ**— මත් ඇතුන්ගේ. **ස්ථූල**— මහත්. **කපොල භිත්තීන්**— ගණ්ඩ ප්‍රදෙශයන්. කොපුල් පෙදෙසින්. **දාන**— මද. ඇතුන්ගේ කපොලාදි ස්ථානයන් ගෙන් වැහෙන ද්‍රව්‍ය 'මද' නමුදු 'දාන' නමුදු වෙයි. **නිපාතයෙන්**— වැටීමෙන්. **ශිඛණ්ඩි මණ්ඩලයාගේ ඒක ජීවිකායමාන වූ**— මයූර සමූහයාගේ එක මැ ජීවිකාව (දිවි රැක්මේ මාර්ගය) වැනි වූ. ශිඛණ්ඩය (සිළුව) ඇතියේ (ශිඛණ්ඩ+ඉන්) ශිඛණ්ඩින් නම් වේ. මොණරුගේ හිස් මුදුනෙහි වූ පෙළ සිළුව ශිඛණ්ඩ නම්. මෙ කියන ජලය මොනරුනට එක මැ ජීවන උපක්‍රමය වැන්නැ. **විස්තීර්ණ**— පැතුරුණු. වි+ස්තෘ+ත= විස්තීර්ණ. 'වි' පූර්‍වී 'ස්තෘ' ධාතු පැතිරීමෙහි වැටේ. **නව ශාද්වල කම්බලාවගුණ්ඨිත වන ස්ථලී සීමන්තිනීන්**— (කම්බල+අවගුණ්ඨිත) අලුත් හී තණ නමැති කම්බිලි පෙරෙවිසා වූ වන බිම් නමැති ස්ත්‍රීන්. අව+ගුණ්ඨ්+ඉ+ත= අවගුණ්ඨිත. 'අව' පූර්‍වී 'ගුණ්ඨ්' ධාතුව වැසීමෙහි වැටේ. 'වසන ලද' යනු 'අවගුණ්ඨිත' යන්නෙහි අර්ථ සි. 'ස්ථල' යනු ද 'ස්ථලී' යනු ද ගොඩට (දිය නැති බිමට) නම්. සීමන්+අන්ත= සීමන්ත. ස්ත්‍රීන්ගේ කෙස් බෙදූ පීරූ කලැ පෙනෙන ඉර සීමන්ත නම් සීමන්ත ඇති ස්ත්‍රී සීමන්තිනී. සීමන්ත+ඉන්+ඊ. **චම්පක**— සපු. **වනොද්භූත**— (වන+උද්භූත) වනයෙහි ඇති වූ. **සෞරභ්‍ය ප්‍රසරයෙන්**— සුවඳ පැතිරී යෑමෙන්. ප්‍ර+සෘ+අ= 'ප්‍රසර' 'ප්‍ර' පූර්‍වී 'සෘ' ධාතුව පැතිරී යෑමෙහි වැටේ. **උද්ගන්ධි භිතගන්ධ විටප විගලිත**

**පුෂ්පාඞ්කුරයෙන් කරාල වූ**— ('උද්ගන්ධ' යනු මුද්‍රණ දෝෂ සි.) මහත් සුවඳ ඇති සුදු සඳුන් (ගස්හි) වෙළෙපින් ගිලිහුණු මල් කැකුළින් විෂම වූ. මල් කැකුළු හුණු තැන් උස් වෙයි. හුහුණු තැන් පහත් වෙයි. එ හෙයින් බිම විෂම වේ. උස් වූ ගන්ධය ඇත්තේ උද්ගන්ධි සි. ශීත වූ ගන්ධය යමෙකු ද ඒ ශීතගන්ධ සි. සුදු සඳුනට නමි. වි + ගල් + ඉ + ත= විගලිත. 'ගල්' (ගිලිහීමෙහි) ධාතු සි. 'පුෂ්පාඞ්කුර' යන්නෙන් පුෂ්ප අඞ්කුර (මල් දළු) යන දෙක ද ගත හැකි. **සාල තරු වරයන්ගේ**— උතුම් සල් ගස්වලැ. **නූතන**— අලුත්. නව වූයේ මැ 'නූතන' සි. 'නව' යන්නට 'නූ' ආදෙශ සි. 'තන' යනු ස්වාර්ථයෙහි ප්‍රත්‍යය සි. **ප්‍රසූන**— මල්. ප්‍ර+සූ + ත= ප්‍රසූත. 'සූ' ධාතුව ඉපැදවීමෙහි වැටේ. **සම්පාතියෙන්**— එක් වීමෙන්. ආශ්‍රයෙන්. සම් + පත් + අ= සම්පාති. 'සම්' පූර්ව 'පත්' ධාතුව සමාගමයෙහි වැටේ. **විකසිත වකුල ධූලි පටලානයන පරිශ්‍රාන්ත මන්ද මාරුත සන්තානයෙන්**— (පටල + ආනයන) පිපුණු මූණ මල් රෙණු පටලය ගෙනැ ඊමෙන් විඩා වූ මඳ සුළං පැතිරීමෙන්. 'වකුල' යනු මූණමල් ගසට නමි. 'ධූලි' නම් මල්හි වූ රෙණු සුනු යැ. පටක් මෙන් (වස්ත්‍රයක් මෙන්) පැතිරී සිටියේ පටල සි. රෙණු රැසක් පැතිරෙන කලැ ඒ පටලයෙකි. ආ + නී + අන= ආනයන. පරි + ශ්‍රම් + ත= පරිශ්‍රාන්ත. සම් ප්‍රකාරයෙන් විඩා වූ. වකුල රෙණු ගෙනැ ඊමෙන් සුළඟ බෙහෙවින් වෙහෙසට පැමිණේ සි. බරක් උසුලන හෙයිනි. මූහුණ මල් රෙණුයින් සුළඟ සුවඳ වූ බව මේ හි සැටි යැ. **විනිද්‍ර සාන්ද්‍ර නාග පරාගානුරාගයෙන් පිඤ්ජරිත වූ**— (පරාග+ අනුරාගයෙන්) පිපුණු ගැවැසී ගත් නා රොන්හි පැහැයෙන් රන්වන් කරන ලද නිද්‍රාව (නින්ද) විගත වූයේ යමෙකින් ද ඒ විනිද්‍ර සි. මෙහි නිද්‍රාව නම් මුකුලිත වැ (හැකිළී) සිටීම සි. මුකුලිත භාවය හැරීම නිද්‍රාව හැරීම සි. නිදි කලැ ඇස පියැවෙයි. පිබිදි කලැ ඇස හැරෙයි. මල ද නිදි කලැ පියැවුණේ යැ, පිබිදි කලැ හැරුණේ යැ. එ හෙයින් විනිද්‍ර වීම නම් පිපීම සි. නාග—නා මල්. පරාග—රොන්. අනු+ රඤ්ජ්+අ=අනුරාග. අනුගත වූ වර්ණය. 'රඤ්ජ්' (රඤ්ජනයෙහි) ධාතු සි. 'පිඤ්ජර' යනු රන් පැහැයට නමි. රන් පැහැයෙන් යුක්ත කැරුණේ පිඤ්ජරිත සි. **පර්වත නිකුඤ්ජ**— ගිරි ලිය මඬු. ලතාදීන් ගෙන් පිහිත වූ (වැසුණා වූ) ස්ථානයෝ 'නිකුඤ්ජ' නම් වෙති. පර්වතයන්හි වූ නිකුඤ්ජයෝ පර්වත නිකුඤ්ජයෝ යැ. නා මල් රෙණු වැදීමෙන් මේ පර්වත

**නිකුඤ්ජයෝ** රත්වන් වූවාහු යැ. **ගිරි ශිඛරයෙන්**— පර්වත මස්තකයෙන්. ශිඛාව (මුදුන) ඇතියේ තු යි ශිඛර යි. **නිර්ඣර ඣල්ලරීන් ගේ** ගහුල් හැලි නමැති බෙරෙහි. පර්වතයෙන් වැගෙන ජල ප්‍රවාහය නිර්ඣර නම්. 'ඣල්ලරී' යනු හෙරි (බෙර) විශෙෂයකට නම් වේ. **ඣංකාරයෙන්**— පහත් හඬින්. 'ඣං' යන අව්‍යක්ත (පහත්) ශබ්දය කිරීම 'ඣඞ්කාර' නම්. බඹර නද වැනි නදෙකි. **ස්වෛර විහාර නිරත**—සිය කැමැති සේ හැසිරීමෙහි ඇලුණා වූ. **ශබර පුලිඤ්ද සුන්දරීන් ගේ**— ශබර වර්ගයේ ද පුලිඤ්ද වර්ගයේ ද ස්ත්‍රීන් ගේ. 'ශබර' යනු කඳු පෙදෙස්හි වසන ම්ලේච්ඡ වර්ගයකට නමි. ලක් දිවැ 'සබර' නමින් ගැනෙන්නෝ වැද්දෝ යැ. 'පුලිඤ්ද' යනු ද චාණ්ඩාල විශෙෂයකට නම් වේ. **ගායනයෙන්**—ගැයීමෙන්. ගී කීමෙන්. ගෛ + අන= ගායන. **අචෙතස්ක**—සිත් නැති. අචෙතන. 'අචෙතස්' යනු පමණි. 'ක'යන්න අධික යැ යි හැගේ. චෙතස (සිතීම්) නැත්තේ යමකට ද නේ 'අචෙතස්' නම්. **මන්දානිලාන්දෝලිත වූ**— (මන්ද+ අනිල + ආන්දෝලිත) මඳ සුළඟින් ලෙලවන ලද. **නව මඤ්ජරී චාමරයෙන්**— අලුත් මල් කැන් නමැති සෙමෙරින් (වල් විදුනායෙන්.) **ව්‍යාධූයමාන වූ**—පවන් සලනු ලැබූ. වෘක්ෂයෝ මඳ පවන් වැදී ලෙලෙන නව මල් කැන් සෙමෙරින් බුදුනට පවන් සලන්නවුන් වැන්නෝ යැ. වි + ආ + ධූ + ය + මාන= ව්‍යාධූයමාන. මෙහි 'වි' 'ආ' පූර්ව 'ධූ' ධාතුව පවන් සැලීමෙහි වැටේ. 'ය' යනු කර්ම කාරක විකරණය යි. **පුෂ්පාස්වාද විදග්ධ වූ**— (පුෂ්ප + ආස්වාද) මල් රස විඳීමෙන් ප්‍රෞඪ වූ (දක්ෂ වූ ) **කෝකිලාවන්**— කොවිල්ලුන් කොවුල් දෙනුන්. **සඞ්ගීයමාන වූ**— මනා සේ ගායනය කරන ලදු වූ. සම්+ ගෛ + ය + මාන= සඞ්ගීයමාන. **වන සරසුන්**— වන තටාකයන්. වන විල්. 'සරස්' යනු විලට නම්. **ශංඛින්**—ශඞ්ඛයෙන්. පියුම්හි තුඹු දෙමින් රාජ හංසයන් නාද පවත්වන කලැ, වන තටාකය සකක් මුවෙහි තබා පිඹින්නා වැන්නැ. **පුම්භිතා ලදින්**— පිඹිනා ලදු වැ. 'පුම්භ' (පිඹීමෙහි) ධාතු යි. පිඹී- පිඹිති- පිඹි- ඈ විසින් වරනැගේ. 'සුම්භ' ධාතුව ද මෙ බඳු යැ. **අන්‍යොන්‍ය ප්‍රීතියෙන්**— ඔවුනොවුන් කෙරෙහි ප්‍රීතියෙන්. **නිත්‍ය විරොධි සත්ත්වයන්**— (මීයන් බළලුන් සේ ඔවුනොවුනට) සියලු කල්හි විරුද්ධ වූ සතුන්. **පරම මෛත්‍රියෙහි රස දන්වමින්**— ඉතා උතුම් මිත්‍ර භාවයෙහි රසය (සැපය) හඳුන්වමින්. නිත්‍ය විරොධි සත්ත්වයෝ බුදු බලයෙන් අන්‍යොන්‍ය ප්‍රීතියෙන් යුක්ත වූවාහු, පරම මෛත්‍රියෙහි රස දැනැ ගනිති. **ප්‍රශාන්ත**--

අතිශයින් සන්හිඳුණා වූ. ප්‍ර+ශම්+ත. **චෛතන්‍යාවිරොධ වූ**— (චෛතන්‍ය + අවිරුධ) චෙතනාවට විරුධ නුවූ. චෙතනාව මැ චෛතන්‍ය යි. චෙතන+ය. 'චෙතනා' යනු බුද්ධියට නම්. චිත් + අන + ආ = චෙතනා. 'චිත්' සිතීමෙහි ධාතු යි. 'ආ' යනු ස්ත්‍රී ප්‍රත්‍යය යි. **නිරොධ සමාපත්තියට**— සිත නිරුද්ධ කරන්නා වූ (වළක්වන්නා වූ) ධ්‍යානයට. **සමවැදී**— පැමිණැ. වැදී.

**3. පරායණ**— පරම ප්‍රතිෂ්ඨාව වූ. පර + අයන= පරායණ. 'පර' යනු 'පරම' යන අරුත්හි වෙයි. ඉ + අන= අයන. 'ඉ' ගමන්හි ධාතු යි. පිහිට පිණිස යම් තැනකට යේ නම් ඒ අයනයි **දංෂ්ට්‍රා**— දළ. මහත් දත්. දංශනය (ඩැසීම) කරනුයෙන් දංෂ්ට්‍රා නම්. දංශ් + ත්‍ර + ආ = දංෂ්ට්‍රා. 'දංශ්' (ඩැසීමෙහි) ධාතු යි. **බාහු**— හස්ත. **උදර**— කලවා. **සම්පන්න**— යුක්ත. සම්පූර්ණ. සම් + පද් + ත = සම්පන්න. 'සම්' පූර්ව 'පද්' ධාතුව යුක්ත වීමෙහි- සම්පූර්ණ වීමෙහි- වැටේ. **රුචිර කෙසර විසර විසාර සම්බන්ධයෙන් බන්ධුර වූ**— සිත් කලු වූ කෙසුරු සමූහය සැලීම සම්බන්ධයෙන් රම්‍ය වූ. සිංහයා ගේ ග්‍රීවායෙහි කෙසුරු සැලෙන කලැ ඒ රම්‍ය යැ. වි + සෘ + අ = විසර. 'වි' පූර්ව 'සෘ' ධාතුව පැතිරීමෙහි වැටේ. වි + ස්ඵුර් + අ = විසාර. 'ස්ඵුර්' ධාතුව සැලීමෙහි- ලෙල දීමෙහි- වැටේ. මෙහි 'උ' කාරය 'අ' කාර බවට පැමිණෙයි. **ස්කන්ධ සන්ධි**— ග්‍රීවාව. කෙල. ස්කන්ධ නම් දසරැව (උර හිස) යි. එය හිස හා සන්ධානය කරනුයේ ස්කන්ධ සන්ධි යි. 'ස්කන්ධ' යනු ශරීරයට ද නම්. **සංස්ථානොචිත වර්ණ විශෙෂයෙන් විරාජමාන වූ**— (සංස්ථාන + උචිත) තැනට සුදුසු පැහැ වෙසෙසින් බබළන්නා වූ. ඒ හංසයා ගේ ශරීරාවයව එකඑකට සුදුසු වූ වර්ණයෙන් යුක්ත යැ. **අඞ්ග ප්‍රත්‍යඞ්ග ශොභා**— අඟ පසඟ හෙබීම. හිස් අත් පා ආදිය අඞ්ග යි. අඞ්ගයන්හි වූ කන් නාසා ඇඟිලි ආදිය ප්‍රත්‍යඞ්ග යි.

**4. වන ෂණ්ඩායෙන්**— වන සමූහයෙන් (පඞක්තියෙන්.) ෂණ්ඩ් + අ + ආ = ෂණ්ඩා. 'ෂණ්ඩ්' (ගැළැපීමෙහි) ධාතු යි. **පවනානුපාත විචලිත**— (පවන + අනුපාත) සුළඟ හමා බැසීමෙන් සෙලැවුණු. 'සුළං පමණට සෙලැවුණු' යැ යි ද අරුත් ගත හැකි. අනු + පත් + අ = අනුපාත. 'අනු' පූර්ව 'පත්' ධාතුව බැසීමෙහි වැටේ 'අනුපාත' යනු ප්‍රමාණයට ද නම් වේ **ඇගින්**— අගින්. අග්‍රයෙන්. අග + ඉන් = ඇගින්. **හැල්ලෙන්**— නිර්ඣරයෙන්. **ඇඟෑ ගන්වමින්**— ශරීරයෙහි

වද්දමින්. **රන් රිදී අහලෙහි**— රන් තලායෙහි රිදී තලායෙහි. **සුපක්ව**— මනා සේ විලිකුන්. (ඉදුණු.) සු + පච් + ත = සුපක්ව. 'ත' කාරයට 'ව' කාරාදේශ යි. 'පච්' (ඉදීමෙහි) ධාතු යි. **අඹු**— අඹ. **තුඩු දී**— තුඩ ඇනැ. 'අඹ රස බී'යැයූ සේ යි.

"ගිය ඹ රසඹ පානය කෙමෙරමින් වැහෙ න
නිල ඹ පැහැති පරපුටු කැල තුටු රැව් න"......

යනාදිය අලඞ්කාරවන්තයෝ ද කියති. **කර බිඳෑ**— ගෙල නමා. (කිස හරවා.) ඇනැ ඇසෙන ශබ්දයකට කන් දෙන කලැ මෙ සේ කැරෙයි. **පෑනෑ පෑනෑ කී**— පැනැ පැනැ වැටෙමින්. වේගයෙන් පනතුා කලැ වැටෙනු වෙයි. **දප්හෙන්**— එඩියෙන්. දප් + අ = දප්හ. 'දප්' (එඩියෙහි) ධාතු යි. **කර**— ග්‍රීවාව. **පිපාසිත වෑ**— පවස් ඇති වැ. 'පිපාසා' නම් බොනු කැමැත්ත යි. පා + ස + අා = පා පා + ස + අා = පිපාසා. 'පා' (බීමෙහි) ධාතු යි. **තුඩු**— තුණ්ඩය. මුඛය. **ද්‍රව වෑ ගියා වූ ඉන්ද්‍රනීල මාණික්‍ය රසායමාන වූ**— දිය වී ගිය. ඉඳු නිල් මිණි සාරයක් වැනි වූ. ඒ ජලය කොතරම් ප්‍රසන්න වැ සිටියේ ද යත හොත් ඉන්ද්‍රනීල මාණික්‍ය සාරය දිය වී ගොස් (ජලය බවට පැමිණැ) සිටියා වැන්නැ. 'ඉන්ද්‍රනීල' යනු ඉතා නිල් මිණි වෙසෙසකට නම්. එය ලක් දිවැ උපදිති යි ද කිරෙහි ලූ කලැ කිර ද නිල් වෙති යි ද පුරාතනයෝ කී හ. 'රස' යනු සාරයෙහි ද වැටේ. **සලිල**— ජලය. සල් + ඉල = සලිල. 'සල්' (යෑමෙහි) ධාතු යි. නිම්නයට (පහත් තැනට) යේ නු යි ජලය සලිල නම් වේ. **මොහාන්ධකාර වෑ**— (රාගයෙන් වූ) මුළා බව නිසා අඳුරු වැ (යන මග නො පෙනී.) **තරුණතර**— ඉතා තරුණ වූ. **සිංහින් ගේ**— සිංහ ධෙනුන් ගේ. **අතරුණ**— තරුණ නුවූ. අල්ප නුවූ. මහත් වූ. **සෙනහසෙහි**— ප්‍රේමයෙහි. **දශාවතට**— දශාවතට. **ඇසිපිය ..... සිතමින්**— ඇසි පිය හෙළැ කලැ බුදුන් නො පෙනෙන හෙයින් ඒ ඇසිල්ල කල්ප ශත සහස්‍රයක් සේ දික් වෙයි. **නිර්ෂාද වූ**— ('නිර්ෂාද' යනු මුද්‍රණ දෝෂ යි.) විෂාදයක් (දුර්වල භාවයක්) නැත්තා වූ බලවත් වූ. 'විෂාද' යනු ශෝකයට ද නමි. වි + ෂද් + අ = විෂාද. 'වි' පූර්ව 'සද්' ධාතු පහත් වීමෙහි (බැසීමෙහි) වැටේ. **උද්ගාරය**— මුවින් නිකුත් කිරීම. උතුරුවා හැරීම. වමනය කිරීම උද් + ගෘ + අ = උද්ගාර. 'උද්' පූර්ව 'ගෘ' ධාතුව මුවින් නිකුත් කිරීමෙහි වැටේ. **ගොචරයෙහි**— මනාදුරෙහි. ඉන්ද්‍රියයෝ එහි සරත් නු යි රූප ශබ්දාදිය ගොචර නම් වේ. 'ගො' යනු ඉන්ද්‍රිය

පදීය සි. මෙහි විශේෂණයෙන් ආහාරය ගැනේ.) **සිත්නමැ—** සිතියමෙහි **නිරාහාර වූ—** අහර නැති වූ. ආ + හෘ + අ = ආහාර. 'ආ' පූර්ව 'හෘ' ධාතුව ගැනීමෙහි වෙයි.

5. **දෙදළින්—** ආශායෙන්.

---

# 9. නාරද විවරණ කථා

---

1. **මනෝමල දහන දවානල** වූ—(මනස් + මල, දව + අනල) සිතෙහි කිලුටු (කෙලෙස්) දවන්නා වූ ලැව් ගින්නක් වැනි වූ. දන් + අන = දහන. 'දන්' (දැවීමෙහි) ධාතු සි. 'දව' යනු වනයට නම්. 'අනල' නම් ගින්න සි. දවයෙහි (වනයෙහි) හට ගත් අනල (ගින්න) දවානල සි. **ලෝක ලොචන චකෝර චන්ද්‍රිකායමාණ** වූ— ලෝකයා ගේ ඇස් නමැති ඇටි කුකුළනට සඳ රැස් බඳු වූ. 'සුවණ්ණ කාන්තීන්' යන්නට විශේෂණ සි. ලෝච් + අන = ලොචන, 'ලෝච්' (බැලීමෙහි) ධාතු සි. එයින් බලා තු සි ඇස ලොචන නම්. 'චන්ද්‍රිකා' නම් චන්ද්‍ර රශ්මිය සි. චකෝරයෝ සඳ රැස් බොත් ල. **සුවණ්ණ කාන්තීන්—** රන්වන් රැසින්. බුදු සිරුරින් නික්මෙන රශ්මියෙන්. **ශ්‍රවණීය පීයූෂ නිෂේක මනෝහර භාරතී විලාසයෙන්—** ඇසියැ යුතු වූ අමා ඉසීමක් මෙන් මනහර වූ වචන ලීලායෙන්. ශ්‍රැ + අනීය = ශ්‍රවණීය. 'ශ්‍රැ' (ඇසීමෙහි) ධාතු සි 'භාරතී' යනු වචනයට නම්. ඒ බුදුන් ගේ වචනය අමා ඉසීමක් මෙන් මනොහර යැ. ඒ අමා මුවින් වින්දැ යුතු නො වේ, කනින් වින්දැ යුතු යැ. එ හෙයින් ශ්‍රවණීය සි. **ජගදානන්දය—** (ජගත් + ආනන්දය) ලෝකයට ප්‍රීතිය. **අනනයෙහි—** කෙළවරෙහි දී. **නියති න්‍යෝගාතික්‍රමණාසමර්ථ වූ—** (නියෝග + අතික්‍රමණ + අසමර්ථ) නියමයා ගේ යෙදීම ඉක්මැවීමට අපොහොසත් වූ. වෙනස් නො කළ හැකි සිදු වීම් 'නියති' නම්. දෛව යැ සි ද කියත්. ජාති ජරා මරණ ආදිය සි. නි + යම් + ති = නියති. 'නි' පූර්ව 'යම්' ධාතුව නියමනයෙහි වැටේ. බුදුහු ද නියති නියෝගය වැළැක්වීමට අසමර්ථ වෙති. **අන්තර්හිත—** අන්තර්ධාන. අන්තර් + ධා + ත= අන්තර්හිත. **තෘෂ්ණාභිලාෂ ලතොන්මූලන කෙළි ද්විරද** වූ— (තෘෂ්ණා + අභිලාෂ, ලතා + උන්මූලන) මෙහි 'අභිලාෂ' යනු නො ගැළැපෙයි. 'තෘෂ්ණා' යනු ද 'අභිලාෂ' යනු ද අර්ථයෙන් සමාන යැ. 'තෘෂ්ණා' යනු යෙදුණු හෙයින් 'අභිලාෂ' යනු

අන්‍යාර්ථයෙන් නිරර්ථක යැ. ස්ත්‍රීලිඞ්ග වූ තෘෂ්ණාවට ලතාව උපමාන කිරීම යෙදෙයි. පුල්ලිඞ්ග වූ අභිලාෂයට නම් කවීහු ලතෝපමානය නො කෙරෙති. 'තෘෂ්ණාභිධාන' යනු නම් නිවරද වේ. 'තෘෂ්ණා නම් වූ ලතාව (පිය) ඉදිරීමට ක්‍රීඩා ලෝල හස්තියකු වූ' යනු එ කලැ අර්ථය වෙයි. 'අභිධාන' නම් නාමය යි. අභි + ධා + අන = අභිධාන 'අභි' පූර්ව 'ධා' ධාතු කීමෙහි වැටේ. 'කෙලි' නම් ක්‍රීඩාව යි. ද්වයක් රදයක් (දත්) වනුයේ යමක්හු හට ද හේ ද්විරද. ඇතාට නම්. ඇත්තු වනයෙහි කෙළිමින් යන කලැ ගස් වැල් උදුරා දමත්. **සමස්ත ලෝක ශෝක විනෝද විද්‍යා විශාරද**— සකල ලෝකයා ගේ ශෝක දුරු කිරීමේ ශාස්ත්‍රයෙහි දක්ෂ වූ. වි + නුද් + අ = විනෝද. 'වි' පූර්ව 'නුද්' ධාතුව දුරු කිරීමෙහි වැටේ. 'විශාරද' යනු දක්ෂ- පණ්ඩිත- යනාදි අර්ථ ඇත්තේ යැ. **දත්තාධ්‍යාශයානපෙක්ෂිතප්‍රියපුත්‍රදාර** වූ— (දත්ත+අධ්‍යාශය+අනපෙක්ෂිත) දන් අදහස කාරණ කොටැ ගෙනැ අපේක්ෂා නො කරන ලද ප්‍රිය පුත්‍රදාරයන් ඇති. දන් දීමේ අදහස කො තරම් ද යත හොත් ප්‍රිය වූ පුතුනු ද අඹුවනු ද අපේක්ෂා නො කෙරෙති. ඔවුහුදු දන් පිණිස දෙත්. 'දාර' යනු භාර්‍යාවට නම්. බැයන් (සොහොවුරන්) දාරණය (වෙන් කිරීම) කරන්නෝ දාරයෝ යැ. අඹුවක ගත්තේ සොහොවුරන් ගෙන් වෙන් වෙයි. දෘ + අ = දාර. **භුවනාභෝග ව්‍යාපි ශ්වෙත කීර්ති පූරාපාර** වූ— ('භවන' යනු ද 'ව්‍යපි' යනු ද මුද්‍රණ දෝෂ සි) (භුවන + ආභොග, පූර + අපාර) ලෝක චක්‍රයෙහි පැතිරැ සිටි සුදු යසස පිරීම හෙතු කොටැ ගෙනැ පර තෙරක් නැත්තා වූ. වි + ආප් + ඉන් = ව්‍යාපින්. 'වි' පූර්ව 'ආප්' ධාතු පැතිරීමෙහි වැටේ. පාරයක් (පර තෙරක්) නැත්තේ යමකට ද ඒ අපාර යි. **චරණ ශරණොපනත ජනතා බ්‍රහ්මවිහාරද** වූ— (ශරණ + උපනත) ශ්‍රී පාදය ශරණය (පිහිට) කොටැ ගෙනැ නැමුණා වූ ජන සමූහයාට (සතර) බ්‍රහ්ම විවරණය දෙන්නා වූ. බුදුන් සරණ ගොස් පා වැන්දවුනට බ්‍රහ්ම විහාර දෙන බව මෙයින් කී හ. උප + නම් + ත = උපනත. 'උප' පූර්ව 'නම්' ධාතු ළං වැ නැමීමෙහි වැටේ. ජනයන් ගේ සමූහ යැ (ජන + තා) ජනතා යැ. **සකල කලි කල්මෂාපහරණ ප්‍රවීණ මහා නීරද** වූ— (කල්මෂ + අපහරණ) සියලු පව් නමැති ග්‍රීෂ්මය පහ කිරීමෙහි දක්ෂ මහා මේඝයක් (වැසි වලාවක්) වූ. 'කලි' නම් පාපය සි. අප + හෘ + අන = අපහරණ. 'අප' පූර්ව 'හෘ' ධාතුව පහ කිරීමෙහි වැටේ. නීරය (ජලය) දෙනුයේ

නිරද යි. **නිහිත මහිත පරිචිත පාරමිතා මහිමෝපනීත මති පරිණාම ඇති වූ**— (මහිම + උපනීත) ('මහිමොපනීත' යනු මුද්‍රණ දොෂ යි) පිහිටුවන ලද පුදන ලද පුරුදු කරන ලද පැරුම් මහිමයෙන් එළවන ලද නුවණ මිහිකිරීම් ඇති වූ. නුවණ මේරීම් එළවන (උපදවන) ලද්දේ ය. කෙසේ ද? පාරමිතාවන් ගේ මහිමයෙනි. කෙබඳු පාරමිතාවන් ගේ ද? තමන් විසින් පිහිටුවන ලද්දා වූ පුදන ලද්දා වූ පුරුදු කරන ලද්දා වූ පාරමිතාවන් ගේ. මහ් + ඉ + ත = මහිත. 'මහ්' (පිදීමෙහි) ධාතු යි. පරි + චි + ත = පරිචිත. 'පරි' පූර්ව 'චි' ධාතු පුරුදු කිරීමෙහි වැටේ. මන්+ති=මති. 'මන්' (සිතීමෙහි) ධාතු යි. **දෙව සපර්ධි වූ**—('සපර්ධී' යනු මුද්‍රණ දොෂ යි) දෙවියනට සපර්ධා (සැහැසීම) කරන්නා වූ. 'සපර්ධා' යනු සමාන බවෙහි යෙදෙයි. **ප්‍රතාප**— තෙජස්. **දෛව**— භාග්‍ය. **සකල කාම සේනා නායක වූ**— සියලු කම් සැප නමැති සේනාවට නායක වූ. රූප ශබ්දාදිය කාම යි. ඒ සියල්ලෙන් ඒ දෙවි ආඪ්‍ය යැ. **චරණ ප්‍රණාම ප්‍රණය ප්‍රසාද විද්‍යා විදග්ධ වූ**— පා වැඳීමෙන් ද යාවඤාවෙන් ද සිත පැහැදවීමේ ශාස්ත්‍රයෙහි නිපුණ වූ. ප්‍රියාවන් කිපුණු කලැ පා මුල්හි හී යාවඤා කොටැ සිත පහදවා ගන්නා සේ කාම ශාස්ත්‍රයෙහි නියමිත යැ. **නයන මනොනන්දනොත්තර වූ**— (නන්දන + උත්තර) නෙත් සිත් සතුටු කිරීම ප්‍රධාන කොටැ ඇති. 'උත්තර' යනු ප්‍රධානාර්ථයෙහි දු වැටේ. **නමා ගත්**— හැරී ගත්. යන්නම පිටත් වූ. **සෑදී**— සැරසී. **පැහැදී**— සතුටු වැ. 'ආභරණ ලා' යන අර්ථය ද 'පැහැදී' යන්නෙන් ලැබේ. **සකල ලොක සුදර්ශන වූ**— සියලු ලොකයාට ශොභන දර්ශනයක් වූ. **ස්වර්ගාපවර්ග මාර්ග රොපණය**— (ස්වර්ග+අපවර්ග) දිව්‍ය මොක්ෂ මාර්ගය තැනීම (ඉපැදවීම.) මෘග්+අ= මාර්ග. 'මෘග්' (සෙවීමෙහි) ධාතු යි. රුහ් + අන= රොපණ. 'රුහ්' (ඉපැදීමෙහි) ධාතු යි. මෙහි 'හ'කාරයට 'ප'දෙශ යි **ලක්ෂ්මීන්**— ශ්‍රීයෙන්.

**2. අනුග්‍රහ**— ප්‍රසාද. එනම් අභිමත දෑ සිදු කැරැ දීමේ ඉච්ඡාව යි.

**3. නාරද ශ්‍රීඝන ශ්‍රීමුඛ සඳර්ශන ප්‍රසඞ්ගාවිර්භූත වූ**— ('සන්දර්ශනයෙන්' යනු මුද්‍රණ දොෂ යි. (ප්‍රසඞ්ග+ආවිර්භූත) නාරද බුදුන් ගේ ශ්‍රී මුඛය දැකීම සම්බන්ධයෙන් පහළ වූ **ප්‍රමොද පරම්පරායෙන් පරිපූරිත වූ අන්තඃකරණ ඇති වූ**— සන්තොෂ පෙළින් හාත්පසින් පිරුණා වූ සිත් ඇති වූ. ප්‍ර+මුද්+අ = ප්‍රමොද. 'මුද්' (සතුටෙහි) ධාතු යි.

'අන්තර්' යනු 'ඇතුළු' යන අර්ථ ඇත්තේ සි. 'කරණ' නම් ඉන්ද්‍රිය සි. ඇතුළෙහි වූ ඉන්ද්‍රිය අන්තඃකරණ නම්. එ නම් සිත සි. **ආගන්තුක සත්කාර**— 'ආගන්තුය' යනු දොෂ සි. අමුත්තනට කළ යුතු සැලැකිලි. ආ + ගම් + තු = ආගන්තු. එන සුලු. ආගන්තු මැ ආගන්තුක සි. **අභිඥා බලයෙන්**—උසස් නුවණෙහි බලයෙන්. සෘද්ධියෙන්. **ආශ්‍රම පදයක්**— ආශ්‍රම ස්ථානයක්. ආ + ශ්‍රම් + අ= ආශ්‍රම. 'ශ්‍රම්' (අභ්‍යාසයෙහි) ධාතු සි. බ්‍රහ්මචර්‍ය්‍යාභ්‍යාසය කරන තැන ආශ්‍රම සි. **ජය**— දිනුව. දිනේවා! **ශ්‍රමණ පද්ම**— ශ්‍රමණොත්තමය. **සිංහ- මෘගේන්ද්‍ර- චන්ද්‍ර—භාස්කර- වතංස- රාජහංස**- මේ එකෑඑක උත්තමාර්ථ ද්‍යොතක වෙසි. 'අවතංස' යන්නෙහි ආදි 'අ'කාර ලොපයෙන් 'වතංස' යනු නිපදී. 'වතංස' නම් ශිරොභූෂණ විශෙෂයෙකි. මුදුන් මල් කඩ යැ යෙති. **ධීර**— ප්‍රඥා ඇත්ත. පැනවත. ධී (ප්‍රඥාව) ඇත්තේ ධීර සි. **පීයූෂපූර**— අමෘතපූර. චන්ද්‍රයාට පීයූෂපූර යැ සි කියැ හැකි. 'පීයූෂ' නම් අමෘතය සි. පූර්ණ වනුයේ- වන්නුයේ- පූර සි. **ප්‍රදීප**— පහන. ශ්‍රමණයනට පහනක් වැනි වූයේ ශ්‍රමණ ප්‍රදීප සි. **ප්‍රතිවාදි විශව ගර්වාබ්ධි ශොෂණ ප්‍රලය මාර්තණ්ඩ**— ('ගර්ව විශොෂණ' යනු මුද්‍රණ දොෂ සි) (ගර්ව + අබ්ධි) විරුද්ධ වාදීන් ගේ සියලු ආඩම්බර නමැති සාගරය වියැළීමට කල්පාන්ත සූර්‍ය්‍ය.

"ඓශ්වර්‍ය්‍යරූපතාරුණ්‍යකුලවිද්‍යාබලෛරපි
ඉෂ්ටලාභාදිනාන්‍යෙෂාමවඥා ගර්ව ඊරිතඃ"

යැ සි යු බැවින්, ඓශ්වර්‍ය්‍ය රූප තාරුණ්‍ය කුල විද්‍යා බලයන් ගෙන් ද ඉෂ්ට ලාභාදියෙන් ද අන්‍යයනට අවඥාව (අවමන් කිරීම) ගර්ව නම්. අප් (ජලය) බහනු ලැබේ නු සි සාගරය අබ්ධි නම්. අප් + ධා+ඉ= අබ්ධි. ශුෂ් + අන= ශොෂණ. 'ශුෂ්' (වියැළීමෙහි) ධාතු 'ප්‍රලය' නම් ලොක විනාශය සි. මෘතාණ්ඩයෙහි (මළ අණ්ඩයෙහි— බිජුවටෙහි) වූයේ මාර්තණ්ඩ සි. සූර්‍ය්‍යාට නම්. **හරිණ ශාබ**— මුව පැටවුන්. **විදාරණ**— මැරීමෙහි. වි + දෘ+අන= විදාරණ. **එක පඤ්චානන**— එක මැ සිංහයා. **තාල පර්ණ සඤ්චූර්ණන**— තල් පත් මනා සේ සුනු කිරීමෙහි. **එක නිර්ඝාත ඝාත**— එක මැ හෙණ පහර. නිර් + හන් + ත = නිර්ඝාත. පුරාතනයෝ නිර්ඝාතය මෙ සේ දක් හ:—

"පවනඃ පවනාභිහතො ගගනාදවනෞ යදා පතති
භවති තදා නිර්ඝාතඃ"

මාරුතය මාරුතය විසින් පහර දෙන ලද්දේ අහසින් පොළොවෙහි යම් විටෙක වැටේ ද එ විට නිඝාතය වෙයි. 'පාත' නම් වැටීම යි. **ප්‍රතිවාදී මෘණාල නාල වික්ෂෝභ කේලි දන්තාවල**— විරුද්ධවාදීන් නමැති නෙළුම් දඬු කැලඹීමෙහි කෙළි ලොල් හස්තිය. වි + ක්ෂුභ් + අ = වික්ෂෝභ. 'වි' පූර්ව 'ක්ෂුභ්' ධාතු විශේෂයෙන් කැලඹීමෙහි වැටේ. මෙහි කැළැඹීම නම් නෙළුම් දඬු උදුරා විසුරුවා සුනු විසුනු කොට දැමීම යි. දන්තයන් ඇතියේ දන්තාවල යි. දන්ත + වල. අස්ත්‍යර්ථයෙහි 'වල' ප්‍රත්‍යය පර කල්හි පූර්ව ස්වරය දීර්ඝ වී යැ. **ප්‍රතිවාදි ගොෂ්පද වාරි විශෝෂණෛක ඝර්මාවතාර**— (විශෝෂණ + ඒක ඝර්ම + අවතාර) විරුද්ධවාදීන් නමැති ගොකුර දිය වියැළැවීමෙහි අසහාය ග්‍රීෂ්ම අවතාරය. වි + ශුෂ් + අන = විශෝෂණ. 'ඝර්ම' නම් ග්‍රීෂ්මය යි. 'අවතාර' නම් බැසීම යි, පැමිණීම යි. **මශක චක්‍ර**— මදුරු සමූහයාට. **දුර්ග**— දුක සේ යා යුතු. ගිය නො හැකි. **භාස්කර**— සූර්යය. මදුරුවෝ, සූර්යයාට ළං වුව හොත්, දැ වැනැසෙති. **උත්තරකුරු දිවින්**— උත්තරකුරු නම් ද්වීපයෙන්. **ලොහිත චන්දනයෙන්**— රත් සඳුනින්.

4. **අද්වෛතවචන**— දෙ පරිද්දකට නො ගියා වූ (වෙනස් නො වන්නා වූ) කීම් ඇති. වචන දෙකක් නැති ද්වි ප්‍රකාරයට ගියේ ද්විත යි. ද්වි + ඉ + ත = ද්විත. ද්විතයා ගේ භාවය (ද්විත + අ) ද්වෛත යි. ද්වෛතය නැත්තේ යමෙක්හි ද ඒ අද්වෛත යි.

5. **සකල කල්‍යාණ වූ**— (ආදිමධ්‍යාවසාන යන) සියලු තන්හි යහපත් වූ. **ත්‍රිභුවනෛක ශරණ වූ**— (භුවන + ඒක) තුන් ලොවට අසහාය පිහිට වූ.

---

## 10. පද්මෝත්තර විවරණ කථා

1. **ශාසන- සද්ධර්මාමෘත- වර්ෂි වූ**— ස න් හි දු ණා වූ සද්ධර්ම නමැති අමා වසින සුලු වූ. වෘෂ් + ඉන් = වර්ෂින්. 'වෘෂ්' (වැස්සෙහි) ධාතු යි. **සම්බුද්ධ- සුධාරසානභිඥ**— (රස + අනභිඥ) සම්බුද්ධ නමැති අමෘත රසයෙහි දැනීමක් නැති. අභිඥව (දැනීම) නැත්තේ යමකුට ද හේ අනභිඥ යි. **චතුරපායෛකාන්ත නියත වැ**— (චතුර් + අපාය) සතර අපායයෙහි වැටීම ඒකාන්ත වැ. **මහාශුභ භාජන**— මහා අශුභයට

(අයහපතට) කීම්. එයින් වෙන් කරනු ලැබේනු යි 'භාජන' නම්. භාජ් + අන. 'භාජ්' (වෙන් කිරීමෙහි- බෙදීමෙහි) ධාතු යි.

2. **සමස්ත භුවන ශඞ්කර** වූ— සකල ලොකයට ශුභය (සැප) කරන්නා වූ. 'ශ' යනු මඞ්ගලයට නම්. 'ශං' යි ද්විතීයා විභක්ත්‍යන්ත වැ සිටියේ යැ. **පරම මහත්තර** වූ— ලොකයෙහි අන්‍යයනට වඩා අතිශයින් මහත් වූ. මෙහි මහත් වීම ගුණාදියෙනි. දෙ පක්‍ෂයෙකින් එක් පක්‍ෂයක් යම් කිසි ගුණයෙකින් වැඩි සිටි බව හැඟැවියැ යුතු තන්හි 'තර' ප්‍රත්‍යය යෙදෙයි. මහත් + තර. සියල්ලවුන් කෙරෙන් වැඩි. සිටි බව හැඟැවුව මනා තන්හි 'තම' ප්‍රත්‍යයය වෙයි. මහත්තම. **පවිත්‍ර ස්නානය**ට— පිරිසුදු නෑමට. ස්නා + අන = ස්නාන. 'ස්නා' (නෑමෙහි) ධාතු යි. **ධර්ම මහා හ්‍රදය**— දහම් නමැති මහා ජලාශයය. ඉතා ගැඹුරු වූ ජලාශයය 'හ්‍රද' නම්. **සංස්කරණයෙහි**— සකස් කිරීමෙහි. සම් + කෘ + අන= සංස්කරණ. උපසර්ගයට ද ධාතුවට ද අතරැ 'ස'කාරාගමය වෙයි. **බැගෑ**— දීන භාවය. **බැහැවුම්**— ආඩම්බරය. **අභිෂෙක ලද පසිඳි**— රජ වූ සැටි. **නිෂ්පන්න**— සිද්ධ. සම්පූර්ණ වූ කටයුතු ඇති. **මාත්සර්ය**— මසුරු බව. **එකාශවර්ති ලද** බව— එක මැ ආශවර්තිය (පුදුම වියැ යුතු බව) ලැබූ බව. මාත්සර්ය එ කලැ කොතරම් ශ්‍රෙෂ්ඨ ද යත හොත් එ තරම් ආශවර්තියෙක් වෙන නැති. **ව්‍යාපාදය**— ක්‍රොධය. **විශාරද**— දක්‍ෂ. අභීත. **නිගන් බව**— නිගෘහීත භාවය. නිඥා කරනු ලැබූ බව. 'නි' පූර්ව 'ගන්' ධාතු නිඥායෙහි වැටේ. නිගනී- නිගනිති- නිගති- නිගනු- ඈ විසිනි වරනැඟෙනුයේ. **අවිවෙකය**— තතු නො දන්නා බව. ඇති සේ වස්තු ස්වරූප අවබොධ කිරීම විවෙක යි. න විවෙක අවිවෙක. වි + විච් + අ = විවෙක. 'වි' පූර්ව 'විච්' ධාතුව ගුණාගුණ බෙදා වෙන් කොටැ අවබොධ කිරීමෙහි වැටේ. **පැලැඹි**— බලවත් වැ. 'පලඹ්' ධාතු බලවත් වැ පැවැත්මෙහි වැටේ. 'රක්' ආදී අත් පද යි. පැලැඹේ- පැලැඹෙති- පැලැඹිණි, පැලැඹි- පැලැඹුණු, පැලැඹි. **තත්ප්‍රතීකාර තත්පර වූ පුරුෂාන්තරාන්වෙෂණ ව්‍යග්‍ර වැ**— (පුරුෂ + අන්තර + අන්වෙෂණ) එයට පිළියම් කිරීමෙහි යෙදුණු එක්තරා පුරුෂයකු සෙවීමෙහි ඇලී යම් කිසිවකට විරුද්ධ වැ කැරෙනුයේ 'ප්‍රතිකාර' නමුදු 'ප්‍රතීකාර' නමුදු වෙයි. ප්‍රති+ කෘ + අ = ප්‍රතිකාර. 'ඉ' කාර දීර්ඝයෙන් 'ප්‍රතීකාර' යනු වේ.

'අනන්තර' යනු මෙහි 'එක්තරා' යන අර්ථය දෙයි. අනු+ ඉෂ්+අන = අන්වෙෂණ. 'අනු' පූර්ව 'ඉෂ්' ධාතු සෙවීමෙහි වැටේ. **උදිතොදිත රාජ හංස නිෂෙවිත** වූ— (උදිත+උදිත) (රජ බවට) නැඟුණු නැඟුණු (පැමිණි පැමිණි) රාජ උත්තමයන් විසින් සෙවුනා ලද්දා වූ. උද්+ඉ+ත = උදිත. 'උද්' පූර්ව 'ඉ' ධාතු ඉහළ ගමන්හි– නැඟීමෙහි– පහළ වීමෙහි– වැටේ. 'හංස' යනු උත්තමාර්ථය දෙයි. එ හෙයින්—

"තොප තම් ඉදිරි කළ තමවිත් උතුමැ යෙති"

යනු හංස ප්‍රශංසා යැ. පත් වූ සියලු රජවරු ඒ නුවර මැ සෙවිති. එ හෙයින් එ නුවර උදිතොදිත රාජ නිෂෙවිත යැ. **සර්වාඞ්ග සුන්දර**— (සර්ව + අඞ්ග) සියලු අවයවයෙන් සොඳුරු. **ධෛර්ය මන්දිර**— ධීර භාවයට මැඳුරු. ධෛර්ය්‍ය වසන ගෘහය. **කීර්ති සාන්ද්‍ර**— යසසින් ඝන. 'යසසින් මනොඥ' සි ද කියැ හැකි. **වනිතා නයන මධුකර නිෂෙවිතාරවින්ද**— (නිෂෙවිත+ අරවින්ද) කතුන් ගේ ඇස් නමැති බමරුන් විසින් සෙවුනා ලද පියුමක් වූ. අරයන් වින්දනය කරනුයේ අරවින්ද සි. 'අර' නම් රථ චක්‍රයෙහි දැවි යැ. ඒ දැවි මෙන් වටා සිටි හෙයින් පද්ම පත්‍රයෝ ද අර නම් වෙති. විද්+අ = වින්ද. 'විද්' (ලැබීමෙහි) ධාතු සි. **අභිනව යෞවන පත්තන**— අලුත් යොවුන් බවට පටුන (නගරය.) අලුත් යොවුන් බව නමැති බඩු පුරා සිටි නගරයක් වැනි වූ. **ප්‍රණය ප්‍රසාද දත්තා** වූ— යාචඤායෙන් ඇති වූ ප්‍රසාදය විසින් දෙන ලද්දා වූ. දා + ත = දත්ත. 'දා' (දීමෙහි) ධාතු සි. **විදග්ධ මුග්ධ ශෘඞ්ගාර කෙලි විනොද රසිකා** වූ— නිපුණ වූ ද බොළඳ වූ ද රතිය උපදවන ක්‍රීඩායෙන් ප්‍රීත වීමෙහි ලොල් වූ. 'විනොද' නම් ප්‍රීතිය සි. වි + නුද් + අ = විනොද. 'වි' පූර්ව 'නුද්' ධාතු ප්‍රීති වීමෙහි වැටේ. **ආශ්‍රාන්ත චිත්ත සන්තර්පණ භූයිෂ්ඨ** වූ— නො විඩා වූ සිත පිනැවීම අතිශයින් බහුල වූ. 'භූයස්' යනු 'බොහෝ' යන අර්ථ ඇත්තේ යැ. 'ඉෂ්ඨ' යනු අතිශයාර්ථයෙහි ප්‍රත්‍යයය සි. අතිශයින් බොහෝ වූයේ භූයිෂ්ඨ සි. ඒ බොධි සත්ත්වයන් ගේ හිත ක්‍රීඩාදියෙන් අශ්‍රාන්ත වී යැ. බෙහෙවින් මැ කරන ලද්දේ ඒ හිත පිනැවීම සි. **ප්‍රෙම දුස්තර** වූ— ප්‍රෙමය කරණ කොටැ ගෙනැ එ තෙර වීම දුෂ්කර වූ. එ තරම් ප්‍රෙම කළ යුතු වූ. **භාග්‍ය විස්තර** වූ— භාග්‍යයා ගේ අධිකභාවය ඇති. වි + ස්තෘ + අ = විස්තර. 'වි' පූර්ව 'ස්තෘ' ධාතු පැතිරීමෙහි වැටේ. **ප්‍රාසාදයෙන්** මැ— ප්‍රාසාදය මැ අහසට නැඟී ගිය

**හෙයින්** මෙ සේ කියත්. **අතක්‍ය වූ**— නො සිතියැ හැකි වූ. තර්ක්+ය = තර්ක්‍ය. ‘තර්ක්’ සිතීමෙහි ධාතු සි. **තරුණතර තරල පල්ලවාභිරාම**— (පල්ලව+අභිරාම) ඉතා තරුණ (ළා) වූ චඤ්චල වූ දළුයෙන් අභිරමණීය වූ. ‘තරල’ යනු කම්පිත වන— සැලෙන- යන අරුත් දෙයි. **තුමුල මාරබලාවලෙප විලොප**— දරුණු වූ මාර සෙනාව ගේ අහඞ්කාරය නැසීම. අව+ලිප් + අ= අවලෙප. අහඞ්කාරයට නම්. ‘අව’ පූර්‍ව ‘ලිප්’ ධාතු අහඞ්කාර වීමෙහි යෙදේ. වි + ලුප් + අ= විලොප. ‘ලුප්’ ධාතු නැති කිරීමෙහි වැටේ. **ප්‍රත්‍යූහ ශූන්‍ය වූ**— සම්බාධ රහිත වූ **ධර්‍ම රාජ්‍යාධිගම**— (රාජ්‍ය+අධිගම) ධර්‍ම රාජ්‍යය (බුදු බව) ලැබීම. **පද්ම වර්‍ෂය**— පියුම් වැස්ස. වෘෂ් + අ= වර්‍ෂ.

**8. පුත්‍රීකෘත වූ සර්‍ව සත්ත්වයන් ඇති**— පුත්‍ර භාවයට (දරු බවට) පමුණුවන ලද්දා වූ සියලු සතුන් ඇති. සියලු සතුන් තමන් ගේ දරුවන් කොට සලකන්නා වූ. පුත්‍ර+කෘත= පුත්‍රීකෘත. **රාෂ්ට්‍රික වැ**—රාෂ්ට්‍රාධිපතියකු වැ. රටෙකැ අධිපතියකු වැ. රාෂ්ට්‍ර නම් රාජ්‍යය සි. රාජ්+ෂ්ට්‍ර=රාෂ්ට්‍ර. රාෂ්ට්‍රය ඇත්තේ රාෂ්ට්‍රික සි. රාෂ්ට්‍ර+ඉක= රාෂ්ට්‍රික **පරිණාමොන්මුඛ වූ**— (පරිණාම+උන්මුඛ) මීහිකිරීමට උන්මුඛ වැ (ඉදිරි වැ- මුහුණ ලා- ළං වැ) සිටියා වූ **දිව්‍යෞෂධ**— (දිව්‍ය+ඖෂධ) දිව ඔසු වූ. දිව බෙහෙද වූ.

**5. හෘදය නිර්‍වාපණය**— හද (සිත) නිවීම. **සර්‍ව දුඃඛ සමතික්‍රාන්ත වූ**— සියලු දුක් මැනැවින් ඉක්මැ සිටියා වූ.

---

## 11. සුමෙධ විවරණ කථා

---

**1. නිරුපහතාඥානාලොක ඇති**— (නිරුපහත + අඥාන+අනාලොක) නිරවශෙෂ කොටැ නසන ලද නුනුවණ නමැති අඳුරු ඇති. නිර් + උප + හන් + ත= නිරුපහත. න ආලොක අනාලොක. ආලොක නො වනුයේ අන්ධකාරය සි. **ප්‍රජා**— ජනයා ගේ ප්‍ර+ජන්+අ+ආ= ප්‍රජා. ‘ජන්’ ධාතු ඉපැදීමෙහි වැටේ. ‘ආ’ යනු ස්ත්‍රී ප්‍රත්‍යය සි. **හරන ලද මාරොත්සෙක ඇති**— (මාර + උත්සෙක) (‘හරන’ යනු මුද්‍රණ දොෂ යි ) දුරු කරන ලද්දා වූ මාර අහඞ්කාර ඇති. උද් + සිච් + අ= උත්සෙක. ‘උද්’ පූර්‍ව ‘සිච්’ ධාතු අහඞ්කාරයෙහි වැටේ. **ධර්‍මානීක**— (ධර්‍ම+අනීක) ධර්‍ම සේනා. දහම් නමැති සෙනඟ. එයින් දිවි රකිතු යි අනීක සි. සෙනාවට නම්. අන් + ඊක= අනීක. ‘අන්’ ජීවිත රක්‍ෂණයෙහි) ධාතු සි. **කර්‍ම විපාක**— කර්‍ම ඵල.

**නිරවධි**— සීමා නැති. අප්‍රමාණ. **කරුණාමෘත සේචක**— (කරුණා+අමෘත) කරුණා නමැති අමා ඉසිම. **බුද්ධ බන්ධු කෙනෙක්**— බුද්ධ නමැති නෑ කෙනෙක්. 'මිත්‍ර කෙනෙකැ'යි ද කියැ හැකි.

**2. ප්‍රාවීණ්‍යයෙන්**— ප්‍රවීණ (දක්ෂ) භාවයෙන්. **සම්ප්‍රාප්ත වූ**— පැමිණියා වූ (ලැබුවා වූ.) සම්+ප්‍ර+ආප්+ත. **ප්‍රඥා ප්‍රකර්ෂ**— ප්‍රඥාව ගේ උසස් බව. **අමත්ත වූ**— මත් නුවූ. මද්+ත = මත්ත. න් මත්ත අමත්ත. **නව යෞවනාවතාර**— (යෞවන+අවතාර) අභිනව යොවුන් බව පැමිණීමෙන්. **හෘදය මධුකර චාරණ සුමනස් වූ**— හෘදයය (සිත) නමැති බමර චාරණයනට කුසුමයක් වූ. සිත ඇදගන්නා වූ. මලට බමරු යම් සේ ඇදෙත් ද සුමනාවනට (බැලුවන් ගේ) සිත් එසේ මැ ඇදෙන බව මෙයින් කී හ. තන්හි තන්හි චරණය (හැසිරීම) කොටැ රාජාදීන් ගේ කීර්තිය වනා බැඳි ගී ගයන්නෝ චාරණ නම් වේත්. Wandering bards. දූත් විරිදු කාරයන් වැන්නෝ යැ. චර්+අන= චාරණ. කීර්තිය චාරණය (හැසිරවීම) කෙරේ නු යි චාරණ නම් බමරු ද මලින් මලට යෙමින් ගායනය කෙරෙති. එ හෙයින් 'මධුකර චාරණ' යනු යෙදෙයි. **කුච කමල කුඩ්මල සන්නිවේශ මනොහර වූ වක්ෂඃස්ථල නමැති මහා සරසින් මනොහර වූ**— පියොවුරු නමැති නෙළුම් කැකුළු ඇතුළු වීමෙන් සිත් කලු වූ උර තල (ළය) නමැති මහ විල කරණ කොටැ ගෙනැ මනහර වූ. ඒ සත්‍රීන් වැලැඳැ ගෙනැ යැ යූ සේ යි. පිපෙන්නට සැරැසී සිටි මල් කැකුළු 'කුඩ්මල' නම්. සම්+නි+විශ්+අ= සන්නිවේශ. 'විශ්' (ඇතුළු වීමෙහි) ධාතු යි. 'වක්ෂස්' යනු ළයට නම්. 'මනොහර' යනු මෙහි දෙවරක් මැ යෙදුණු සේ නො මැනැවි. දහම් සරණ කාරයන් වැනි වශ්‍යවචස් වූවකු අතින් නො කැමරන්නෙකි. ලේඛක විභ්‍රමයෙකැ යි හැගේ. **සකල සමෘද්ධි සඞ්කුල**— සව් සම්පත්තීන් සඞ්කීර්ණ (ගැවැසී ගත්.) සම්+කුල්+අ= සඞ්කුල. 'කුල්' (බැඳීමෙහි- එක් වීමෙහි) ධාතු යි. **ලොක දීප**— ලොවට පහනක් වැනි. දීප්+අ= දීප. 'දීප්' (දීප්තියෙහි) ධාතු යි. **ඉෂ්ටාර්ථ සමීප**— (ඉෂ්ට+අර්ථ) අභිමතාර්ථයට ආසන්න. **නීප**— බක්මී. **පාදප**— ගස. පාදයෙන් (මුලින්) බොනුයේ පාදප නම්. පාද+පා+අ= පාදප. **ප්‍රබල මාර බල ශලභ කුල ප්‍රලය ප්‍රදීපායමාන වූ**— අතිශය බලවත් වූ මාර සේනා නමැති පළගැටි සමූහයා ගේ විනාශයට පහනක් බඳු

වැ. පහනට ළං වූ සියලු පළඟැටියෝ වැනැසෙති. 'ශලභ' යනු පළඟැටියාට නමි. ප්‍ර+දීප්+අ=ප්‍රදීප. පහන. **සම්භාවිත**— උපදවන ලද. සම්+භූ+ඉ+ත= සම්භාවිත.

**3. මාණවක**— තරුණ. මනුහු ගේ දරු වූයේ මානව යි. මනු+අ - මානව. මනුෂ්‍යයාට නමි. මනුෂ්‍යයෝ මනුහු ගෙන් පැවැතෙත් ල. 'අ' යනු අපත්‍යාර්ථයෙහි තද්ධිත ප්‍රත්‍යය යි. 'මානව' යන තැන්හි 'න' කාරය අල්පාර්ථ හඟවන පිණිස ණත්වයට ගියේ යැ. මාණව මැ මාණවක යි. 'ක' යනු ස්වාර්ථ ප්‍රත්‍යය යි. **නිර්ජිත සංසාරාඞ්කුර ඇති**— දිනන ලද (පරදවන ලද) සසර දළු ලීම් ඇති. සසර ලියැ ලීම නැවැත්වූ. නිර්+ජි+ත. **ක්ෂපිත** වූ **ක්ලේශ චමත්කාර ඇති**— දුරු කරන ලද කෙලෙසුන් ගේ ආනන්දය ඇති. කෙලෙසුන් ගේ සන්තොෂය දුරු කළා වූ. කෙලෙසුන් නැසූ. ක්ෂප් + ඉ + ත= ක්ෂපිත. 'ක්ෂප්' (දුරු කිරීමෙහි) ධාතු යි. අලෞකසාමාන්‍ය වූවක් දැකැ විස්මිත වැ 'චමත්' යන මිඳ හඬ නඟා ආනන්දය ප්‍රකාශ කිරීම 'චමත්කාර' නමි. චමත් + කෘ + අ. **ප්‍රේම ප්‍රසාද ප්‍රහ්වී ප්‍රවණීකෘතාත්ම ඇති වැ**— (කෘත + ආත්ම) ප්‍රේමයෙහි ද පැහැදීමෙහි ද උසස් බැවින් නමු (අවනත) කරන ලද ශරීර ඇති වැ. ඉතා බලවත් වූ ප්‍රේමයෙන් ද ප්‍රසාදයෙන් ද නැමී. ප්‍රවණ + කෘත = ප්‍රවණීකෘත. යමෙකු බැස්ම- නැමීම- යම් දෙසකට වී නම්, එය එ දෙසට ප්‍රවණ වී යැ යි කියති. **ගාම්භීර්‍යයෙක්**— ගැඹුරු බවෙක්. **ඖචිත්‍යයෙක්**— උචිත භාවයෙක්. සුදුසු බවෙක්. උචිතයා ගේ භාවය (උචිත + ය) ඖචිත්‍ය යි. යම් කිසිවකට යමෙක් මැනැවැ යි කියැවිණි ද ඒ උචිත යි. වච් + ඉ + ත = උචිත. මෙහි 'ව' කාරයට සම්ප්‍රසාරණය වෙයි. ය- ව- ර- ල- යන ව්‍යඤ්ජනයනට ක්‍රමයෙන් ඉ- උ- ඍ- ඏ- යන ස්වරයන් වීම සම්ප්‍රසාරණ නමි. **අසන්දෙහ මධුර වූ**— නිසැක බව කරණ කොටැ ගෙනැ මිහිරි (රම්‍ය) වූ. සම් + දිහ් + අ = සන්දෙහ. සැකය යි. 'සම්' පූර්ව 'දිහ්' ධාතු සැකයෙහි වැටේ. සන්දෙහය නැත්තේ යමෙක්හි ද ඒ අසන්දෙහ. **විඥානයෙක්**— විශේෂයෙන් දැනීමෙක්. වි + ඥා + අන = විඥාන. බුදුන් ගේ දැනීමෙහි කිසි මැ සැකයෙක් නැති. සියල්ල ඇති සේ නිසැක කොටැ දනිති, කියති. එ හෙයින් ඒ විඥානය මධුර යැ. **ධර්ම පක්ෂපාතයෙක්**— ධර්මයට ලැදි කමෙක්. **කර්ණාමෘත වහන**— (කර්ණ + අමෘත) කන්හි අමා ඔතා. **තාපස්වි භාවයෙක්**— තාපස භාවයෙක්. තපස්

ඇතියේ (තපස් + වින්) තපස්වින්. අස්ත්‍යර්ථයෙහි 'වින්' ප්‍රත්‍යය යි. කෙලෙස් තවනුයේ තපස් යැ. තප් + අස්. 'තප්' (තැවීමෙහි) ධාතු යි. **නිර්විකාර**— විකාර රහිත වූ. නො වෙනස් වන්නා වූ **පුරුෂ දම්‍ය ශික්‍ෂා ප්‍රකාරයෙක්**— පුරුෂ දම්‍යයන් හික්මවන්නා වූ විධියෙක් ද? දම්‍යැ යුත්තේ- දමනය කළ යුත්තේ- හික්මැවියැ යුත්තේ- දම්‍ය යි. දම්+ය. 'දම්' (දමනයෙහි) ධාතු යි. පුරුෂ වූයේ ද හෙ මැ දම්‍ය වූයේ ද හෙ මැ නු යි පුරුෂ දම්‍ය යි. සාමාන්‍යයෙන් දම්‍ය නාමය ලබනුයේ පුරුදු කැරැවියැ යුතු වූ බාල ගොනා යැ. ඔහු නො ගන්නා පිණිස මෙහි 'පුරුෂ' යන්නෙක් යෙදිණ. **අභූෂණ සුභග වූ**— ආභරණ නැති වැ ද දර්ශනීය වූ. භූෂ් + අන = භූෂණ. ආභරණ යි. 'භූෂ්' (අලඞ්කාර කිරීමෙහි) ධාතු යි. භූෂණ නැත්තේ යමෙක්හි ද ඒ අභූෂණ යි. ශොභන වූ භගය යමක්හු ගේ ද හේ සුභග යි. සාමාන්‍යයෝ භූෂණයෙන් සුභග වෙති. බුදුහු අභූෂණ සුභගයෝ යැ. **විලාසයෙක්**— දීප්තියෙක්.

4. **උගහට යැ**— දුෂ්කර යැ.

5. **සතර පැයක් විසි අසුරක්**— පැ සතරකුත් අසුරැ විස්සක්. පැයෙක් නම් මිනිත්තු සූවිස්සෙකි. පැ දෙක හමාරෙක් හෝරා වෙකි. එය ම ඉංගිරිසියෙන් 'hour' යනු නමි. Hour යනු ද 'හෝරා' යනු ද එක මැ අර්ථ දෙන්නා වූ සමාන ශබ්ද රූප දෙකෙකි. එ හෙත් හවුරුදු දහස් ගණනක් භාවිත වූ දනුදු භාවිත වන්නා වූ 'හෝරා' ශබ්දය තිබියැ දී මැ, හෝරාව පාඨශාලාවලැ දුන් හැඳින්වෙනුයේ 'පැ' යන නමින් මැ යැ. ඉතින් සිංහල භාෂාවට කවර පිහිටෙක් ද? අසුර ගැසීමට ගත වන කාලය ද 'අසුර' නමින් ගැනෙයි. ක්‍ෂණයෙකි. **කෙතෙකැ යි**— කො තරම් දිග කාලයෙකැ යි. දිවතුරැ බුදුහු, සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්‍ෂයෙකින් බුදු වෙති යි කී හ. බෝ සත්තු එය සතර පැයකුත් විසි අසුරක් සේ ලඝු කොටැ සිතූ හ. එ හෙයින් "තිස් දහසක් කපින් මත්තෙහි බුදු වෙති" යි කී කලැ කාලයේ දිග ගැනැ කෙසේ නම් ගරු කෙරෙත් ද?

## 12. සුජාත විවරණ කථා

1. **සද්ධර්ම සාම්‍රාජ්‍ය ධුරන්ධර වූ**— සදහම් නමැති සාර්වභෞම රාජ්‍යයෙහි ධුරය දරන්නා වූ. සද්ධර්ම මහා රාජ්‍යයෙහි රජ වූ. 'සම්‍රාජ' නම් සියලු ලොකයෙහි රජ හි·

සර්ව භූමියට රජ වන බැවින් ඔහුට 'සාර්වභෞම' යන නම ද වෙයි. ඔහු ගේ භාවය සාම්‍රාජ්‍ය යි. සම් + රාජ් + ය. සද්ධර්ම සාම්‍රාජ්‍යයෙහි ධුරය නම් සද්ධර්ම සාම්‍රාජ්‍යයෙහි රජ බව යි. **සකල කාරුණික සුජාත** වූ— ('සඤ්ජාත' යනු මුද්‍රණ දෝෂ යි.) සියලු කරුණාවතුන් කෙරෙහි අතිප්‍රශස්ත වූ. කරුණා ඇති යේ කාරුණික යි. කරුණා + ඉක. යහපත් වැ ජාත වූයේ (උපන්නේ) සුජාත යි. සු + ජන් + ත = සුජාත. 'ජන්' (ඉපැදීමෙහි) ධාතු යි. 'ජාත' යනු ප්‍රශස්තාර්ථයෙහි ද වැටේ. එ හෙයින් 'සුජාත' යන්නට 'අතිප්‍රශස්ත' යැ යි අරුත් පැවැසිණ. **බොධි සත්ත්ව පුරුෂකාරය මැ**— ('පුරුෂාකාරය' යනු මුද්‍රණ දෝෂ යි.) බොධි සත්ත්ව වික්‍රමය මැ. 'පුරුෂකාර' යනු පෞරුෂය— වික්‍රමය— නම්. පුරුෂයා ගේ කාරය— පැවැත්ම— භාවය— පුරුෂකාර යි. "ඒ ක්‍රියාව පිරිමි කමට හරි නැත" යනාදි ව්‍යවහාරයෙහි එන 'පිරිමි කම' යනු මේ 'පුරුෂකාර' යන්නට සමාන යැ. **තෘතීය**— තුන් වැනි. **සකල ලෝක මඞ්ගල භාජන** වූ— සියලු ලොවට වන ශුභයට හිමි (ස්ථාන) වූ. සියලු ලොවට සෙත් කරන බුදුන් එහි උපදනා හෙයින් කියත්. **සර්ව සම්පත් සමුද්ගත** වූ— සියලු සම්පත්ති කරණ කොටැ ගෙනැ උසස් වූ. සම් + උද් + ගම් + ත = සමුද්ගත. 'සම්' 'උද්' පූර්ව 'ගම්' ධාතු ඉහළ යෑමෙහි වැටේ. **නිරුපමාඞ්ග ප්‍රත්‍යඞ්ග ප්‍රභාවතී** වූ— (නිරුපම + අඞ්ග) උපමාරහිත (අසම) වූ අඟ පසඟ කැලුම් ඇත්තී වූ. **සමර ජ්වර ජර්ජරිත නව යුවති හෘදයාහ්ලාද කහ්ලාර කර්පූර හාරායමාණ** වූ— (හෘදය + ආහ්ලාද) රාග නමැති උණින් දුර්වල කරන ලද අභිනව තරුණියන් ගේ හද පිනැවීමට හෙල්මැලි කපුරු මාලා වැනි වූ. උණ රෝගයක් මෙන් රාගය නැඟී යුවතීන් ගේ හෘදයය දුර්වල වූ කල්හි, බෝ සතුන් ගේ යෞවනය ඒ උණ නිවීමට හෙල්මැලි මාලාවක් කපුරු මාලාවක් වැන්නැ. සමෘ + අ = සමර. අනඞ්ගයාට නම්. 'සමෘ' (සිහි කිරීමෙහි) ධාතු යි. ස්මරණය කැරේ නු යි අනඞ්ග (රාගය) සමර නම්. ජ්වර් + අ = ජ්වර. 'ජ්වර්' (උණ ගැනීමෙහි) ධාතු යි. ආ + හ්ලාද් + අ = ආහ්ලාද. 'ආ' පූර්ව 'හ්ලාද්' ධාතු ආනන්දයෙහි වැටේ. **යෞවනාශ්‍රයෙහි සිටෑ**— ('සිටි' යනු මුද්‍රණ දෝෂ යි. 'සිටැ' යන්නට අකතුරු කොටැ කොමාවක් යෙදියැ යුතු.) ශෘඞ්ගාර සාන්ද්‍ර චාරු **චෙතො සහස්‍ර** මිශ්‍රිත වූ **භාවභාවයනට භාජන වැ**— 'චාරු' යනු 'චාරු යි' ශුද්ධ කළ යුතු.) රතිය (ඇල්ම) උපදවන යැදීම්

රැවැටිලි ක්‍රියා දහසින් මිශ්‍ර වූ ලීලාවනට ද චිත්තාචාරයනට ද හිමි වැ. හාවභාවයන් ලැබැ යැ යූ සේ සි. 'මම චුම්බනයක්' දෙව යනාදීන් කැරෙනුයේ ශෘඞ්ගාර යාච්ඤා යැ. සිත නළවන්නට කියන වචන චාටු යැ. මෙහි 'චාටු' යනු 'චෙෂ්ටා' යන්නට විශෙෂණ සි. එ හෙයින් 'නළවන' 'ප්‍රියජනක' යන අර්ථය දෙයි. සිත ප්‍රිය කරන ක්‍රියාවෝ චාටු චෙෂ්ටාවෝ යැ. මෙ බඳු ශෘඞ්ගාර යාච්ඤා චාටු චෙෂ්ටා දහස් ගණනින් මිශ්‍ර වූ හාවභාවයනට බොධි සත්ත්වයෝ ලක්ෂ්‍ය වූ හ. 'හාව' නම් සිත් ඇදී ගන්නා ශාරීරික ව්‍යාපාර සි. (ලීලාවෝ යැ.) 'භාව' නම් සිතෙහි ඇත්තා වූ ප්‍රේම ආදිය සි. භාවය ද ප්‍රකාශ වනුයේ හාවයෙනි. ඇස් කොනින් බැලීම් මඳ සිනා ආදි හාවයනට ද එයින් හඟවනු ලබන ප්‍රේමය ආදි භාවයනට ද ලක් වූ බව මෙ සේ කි යැ වි ණ. යාචි + න + ආ = යාච්ඤා. 'යාචි' (යැදීමෙහි- පැතීමෙහි) ධාතු සි. චෙෂ්ටි + අ + ආ = චෙෂ්ටා. 'චෙෂ්ටි' (ය ත න යෙ හි- අවයව චලනයෙහි) ධාතු සි. මිශ්‍ර් + ඉ + ත = මිශ්‍රිත. 'මිශ්‍ර්' (යෙදීමෙහි – එක් කිරීමෙහි) ධාතු සි. හු + අ = හාව. 'හු' (කැඳැවීමෙහි) ධාතු සි. එයින් කැඳවනු ලැබේ නු සි ලීලා 'හාව' නමි. භූ + අ = භාව. (සිතෙහි) වූ සැටි භාව සි. **ප්‍රණය ලතා ප්‍රසූන වූ**— ප්‍රේමය නමැති ලියෙහි (වැලෙහි) පුෂ්පය වූ. 'ප්‍රසූන' 'ප්‍රසුන' යන ශබ්දද්වය ය මැ මලට නම් වේ. **මිනිස් කෙළක්**— කෝටියක් මිනිසුන්. **විවිරත වූ නර සුර නන්ද ඈති**— ('නර සුරා නන්ද' යනු මුද්‍රණ දෝෂ සි ) සලසන ලද්දා වූ (ඇති කරන ලද්දා වූ) මිනිසුන් ගේ ද දෙවියන් ගේ ද සතුටු ඇති. මිනිසුන් දෙවියන් සතුටු කළා වූ. 'සුර නර' සි බොහෙවින් යෙදෙන පිළිවෙළ බිඳැ 'නර සුර' සි යොදනු ලදුයේ 'සුරනන්ද' යන නාමයට සමාන වන 'සුරනන්ද' යන්නක් මෙහි දු ලැබෙන පිණිස යැ. නන්ද්+අ= නන්ද. **අමන්ද**— මඳ නුවූ. බොහෝ වූ. **දූරීකරණ ප්‍රවීණ**— දුරු කිරීමෙහි දක්ෂ. දූර + කරණ = දූරීකරණ. **වෙණු**— හුණ. **මාර මාන ගිරි භඞ්ග විදූරමෛණක නිර්ඝාත පාත වූ**— මාරයා ගේ එඩි නමැති පර්වතය බිඳීමෙහි සුනු කිරීමෙහි අසහාය අශනි පාතය (හෙණ ගැසීම) වූ. හෙණ වැදුණු ගිරි බිඳී පැළී සුනු විසුනු වෙයි. භඤ්ජ් + අ = භඞ්ග. 'භඤ්ජ්' (බිඳීමෙහි) ධාතු සි. **උදාර**— මහත්. අසාධාරණ. **ධර්ම තත්ත්ව සකල සමය සාක්ෂාත්කරණයෙන්**— ධර්මයා ගේ තතු ද සියලු සමයයන් (දෘෂ්ටීන්) ද ප්‍රත්‍යක්ෂ කිරීමෙන් (ඉදුරා දැනීමෙන්.) 'සාක්ෂාත්' යනු 'ප්‍රත්‍යක්ෂ වශයෙන්' යන අර්ථයෙහි අව්‍යයයෙකි.

**පර ව්‍යසනාපහරණ කර්මයෙහි නිෂ්ණාත වූ**— (ව්‍යසන + අපහරණ) අනුන් ගේ විපත්ති දුරු කිරීමේ ක්‍රියායෙහි කෙළ පැමිණෑ (පාරඞ්ගත වූ - පර තෙරට ගොස්.) 'නිපුණ' යනු ද 'නිෂ්ණාත' යන්නෙහි අර්ථ සි. වි + අස් + අන = ව්‍යසන. 'වි' පූර්ව 'අස්' ධාතු විරුද්ධ සේ දැමීමෙහි වැටේ. අප + හෘ + අන = අපහරණ. 'අප' පූර්ව 'හෘ' ධාතු දුරු කිරීමෙහි වැටේ. කෘ + මන් = කර්මන්. 'කිරීම' යනු අර්ථ සි. 'කෘ' (කිරීමෙහි) ධාතු සි. නි + ස්නා + ත = නිෂ්ණාත. 'ස්නා' (නෑමෙහි) ධාතු සි. අතිශයින් නෑයේ යෑ (ස්නානය කෙළේ යෑ) යනු 'නිෂ්ණාත' යන්නෙහි අර්ථ සි. යම් කිසිවෙකු අතිශය නිපුණයකු වූ කලැ "හේ එහි නෑයේ යෑ" යනු ව්‍යවහාරයෙහි ද වෙයි. **ස්වර්ග මාර්ග ව්‍යාඛ්‍යාන විචක්ෂණයෙක්**— දෙව් ලොවට මඟ පහදා දීමේ ශාස්ත්‍රයෙහි. වි + ආ + ඛ්‍යා + අන = ව්‍යාඛ්‍යාන. 'වි' 'ආ' පූර්ව 'ඛ්‍යා' ධාතු පහදා කීමෙහි වැටේ. **අපාය ගාමි සත්ත්වයන්**— අපායයට යන සතුන්. ගම් + ඉන් = ගාමින්. 'යන සුලු' යනු අර්ථ සි. **වෙරළ කෙරෙමින්** - ගොඩ කෙරෙමින්. ගලවමින්. නහා සිටුවමින්. මුහුදෙහි හුණුවකු වෙරළ කිරීම නම් මුහුදින් ගොඩෑ ලීම සි. **මන්දර**— එ නම් පර්වතය. **තරල**— චඤ්චල. කම්පිත. බුදුන් ගේ ආශ්වාසයෙහි පාපිවී චලනය වන කලැ මෙරු මන්දර ආදි පර්වතයෝ ද සැලෙති. **ධවල**— සුදු. **කබල කෙරෙමින්**— අනුභව කෙරෙමින්. 'කබල' නම් මුවට එක් වර ගත හැකි අහර පිණ්ඩකි. **සාධු වාදයන් ප්‍රබල කෙරෙමින්**— සාධු කාර නාදයන් ඉතා බලවත් කෙරෙමින්. **වාතනයන්**— පැවැතුම්. **තුමුල**— තියුණු.

**2. සමස්ත චක්‍රවාලාචලානන්ත සීමාන්ත විභක්ත විශ්වාම්බර මණ්ඩලෛකමණ්ඩනායමාන වූ**—(චක්‍රවාල+අචල+අනන්ත සීමා+අන්ත, විශ්ව+අම්බර මණ්ඩල+එක) සියලු සක්වළ ගල්ලෙහි කෙළවර සීමාන්තයෙන් වෙන් කරන ලද සියලු ආකාශ මණ්ඩලයට අසහාය භූෂණය බඳු වූ. චක්‍රයක් මෙන් වාලනය (වෙළීම) කරනුයේ චක්‍රවාල සි. 'වල්' (වෙළීමෙහි) ධාතු සි. ලෝකය වටා ඇතැ සි යන පර්වත වලයයට මේ නම්. නො සැලේ නු යි අචල සි. පර්වතය සි. 'චල්' (සැලීමෙහි) ධාතු සි. චක්‍රවාල අචල නම් චක්‍රවාල පර්වතය සි. චක්‍රවාල අචල අනන්තය අම්බරයම (ආකාශයම) සීමාන්තය (සීමා කෙළවර) වෙයි. අම්බරය ඒ සීමාන්තයෙන් විභක්ත යෑ (වෙන් කරන ලද්දේ යෑ.) වි + භජ් + ත = විභක්ත. 'භජ්' බෙදීමෙහි ධාතු සි. මණ්ඩි + අන = මණ්ඩන. 'මණ්ඩි'

(සැරසීමෙහි) ධාතු යි. සක්විති රජ සකල පෘථිවියට එක් රජය කරන හෙයින් සක්වළින් සීමා වූ මුළු අහසම ගේ මණ්ඩපයක් බඳු යැ. **කුතූහල**— දැක්මට මහත් ආශාව. අපූර්ව වස්තුවක් ප්‍රත්‍යක්ෂ කිරීමට ඇති මහත් ආශාව 'කුතූහල' නාමයෙන් ගැනේ.

## 13. ප්‍රියදර්ශී විවරණ කථා

1. **ප්‍රඥා පුරස්සර**— ප්‍රඥාව ඉදිරියෙහි හැසිරෙන. ප්‍රඥාව පෙරටු කොටැ ඇති. **සාර ධීරතා යුගන්ධර** වූ— සාර වූ ධීරතායෙන් යුගන්ධරය (යුගන්දුරු පව්ව) වූ. ධීරයා ගේ භාවය ධීරතා යැ. ධෛර්‍ය යි (බලවත් බව යි.) **නිර්විකල්ප**— විකල්පයක් (වෙනස් වීමක්) නැති. **ලෝක සඞ්කල්ප සිද්ධි කාරණ** වූ— ලෝකයා ගේ මනොරථ සිද්ධියට හෙතු වූ. **ලෝචන**— ඇසට. **ප්‍රියදර්ශී** වූ— ප්‍රිය වූ දැකුම් ඇති. **සමස්ත තත්ත්වාර්ථදර්ශී** වූ— (තත්ත්ව + අර්ථ) සියලු තත්ත්වාර්ථයන් දක්නා සුලු වූ. 'තත්ත්ව' නම් ඇති සැටිය යි. ලොකයෙහි ඇති තාක් දෑ අර්ථ නම් වේ. ඇති දෑ තතු පරිදි (ඇති සැටි) දක්නේ තත්ත්වාර්ථදර්ශී යැ. **මධුරතර**— අතිශයින් මිහිරි.

2. **විධ්වස්ත සමස්ත බොධිපාක්ෂික ධර්ම ප්‍රතිබන්ධ ඇති වැ**— නසන ලද සියලු බොධිපාක්ෂික ධර්ම අන්තරාය ඇති වැ. බොධිපාක්ෂික ධර්මයනට වන සියලු ප්‍රතිබන්ධයන් (අන්තරායයන්- විඝ්නයන්) වන හ. වි + ධ්වංස් + ත = විධ්වස්ත. 'ධ්වංස්' (වැනැසීමෙහි) ධාතු යි. ප්‍රති + බන්ධ් + අ = ප්‍රතිබන්ධ. 'ප්‍රති' පූර්ව 'බන්ධ්' ධාතු වැළැක්මෙහි වැටේ. **පරිණත ප්‍රඥාතිරෙක**— (ප්‍රඥා + අතිරෙක) මුහුකුරා වූ ප්‍රඥා ප්‍රකර්ෂය. අති + රිච් + අ = අතිරෙක. 'අති' පූර්ව 'රිච්' ධාතුව අධික වීමෙහි වැටේ. **ප්‍රීණිත**— පිනවන ලද. ප්‍රීණ් + ඉ + ත ප්‍රීණිත. 'ප්‍රීණ්' (පිනීමෙහි-පිනා යෑමෙහි) ධාතු යි. **ධන්‍ය**— පින්වත්. **නර නාරී**— පුරුෂයන් ස්ත්‍රීන් විසින්. **මුග්ධ මධුර** වූ— බොළඳ වූ මිහිරි (රමණීය) වූ. **මුඛ චන්ද්‍ර මනොහර**— මුව නමැති සඳින් මනහර. **වාමලෝචනා නයන චකෝර පූර නිපෙය කාන්ති පීයූෂ නිෂ්‍යන්ද සුන්දර** වූ— ස්ත්‍රීන් ගේ ඇස් නමැති ඔඩම් පුරවා ගෙනැ පියැ යුතු වූ කැලුම් නමැති අමෘතය ඉසීමෙන් සොඳුරු වූ. ඒ බොධිසත්ත්වයන් ගේ (ශරීර) කාන්තිය ස්ත්‍රීහු ඇස් අයා බලති. වාම වූ (මනොහර වූ) ලෝචන ඇස් **ඇමක** ගේ ද ඕ වාමලොචනා. ස්ත්‍රියට නමි. වා + ම = වාම.

'චා' (සුඛයට පැමිණීමෙහි) ධාතු යි. මනොහරාඞ්ගයෙහි චාම යනු වෙයි. එ හෙයින් 'චාමා' යනු ද ස්ත්‍රියට නම්. චෂකයා ගේ පූරය චෂක පූර යි. චෂක පූරයෙන් නිපෙය වූයේ චෂක පූර නිපෙය යි. **නව යෞවනාවතාරයට**— අභිනව තාරුණ්‍ය භාවය පහළ වීමට. **විමල වදන කමල මනොහර**— පිරිසුදු මුහුණ නමැති පියුමින් මනහර. විගත වූ (පහ වූ) මල (කිලුටු) යමෙකු ද ඒ විමල. **මධුරාඞ්ක පාලි කෙලි රසික වූ**— (මධුර + අඞ්ක) රම්‍ය වූ ඇක පෙළෙහි ක්‍රීඩා කිරීමෙහි ලොල් වූ. 'අඞ්ක' නම් ඇකය යි (උකුළ යි) **උකටලියට වැට කොටැ**— උකටලී බවට වැට බැඳැ. කලකිරීම ළඟට පැමිණීම වළකනු පිණිස වැට බැඳැ. මෙහි 'උකටලිය' නම් කම් සැපයෙහි කලකිරීම යි. **උද්‍යානයෙහි**— උයනෙහි. උද් + යා + අන= උද්‍යාන. 'උද්' පූර්ව 'යා' ධාතු නැඟී යැමෙහි වැටේ. **අරතියට**— ඇල්මක් නැති බවට. රම් + ති= රති. න රති අරති. **වන දුර්ග සංස්කාර**— වන දුර්ගය සකස් කිරීම, වනය කාරණ කොටැ ගෙනැ දුක සේ යා යුතු වූ ස්ථානය වනු දුර්ග යි. දුර් + ගම් + අ= දුර්ග සම් + කෘ + අ= සංස්කාර. 'ස'කාරාගම යි. අයොග්‍ය වැ තුබූ දැයක් යොග්‍ය භාවයට පැමිණවීම සංස්කාර යි. වනයෙහි කෙළනා කෙළිය කො බඳු ද යත්, අරතිය ළං වීම වළකනු පිණිස වන දුර්ග සංස්කාරය කරන්නා වැන්නැ. **කෞසීද්‍යයට**— ('කුසීද්‍ය' යනු මෙ සේ ශුද්ධ කැරැ ගත යුතු.) අලස භාවයට. කම් මැළි බවට. කුත්සිත සේ (නින්දිත සෙ) සීදනය (හිඳීම) කරනුයේ කුසීද යි. අලසයාට නම්. කුසීදයා ගේ භාවය කෞසීද්‍ය යි. **ජල දුර්ග**— ජලය කාරණ කොටැ ගෙනැ දුක සේ යා යුතු වූ ස්ථානය. **සපයා**— සම්පාදනය කොටැ. ඇති කොටැ. **නො වෙනස් කැමින්**— වෙනස් කමක් නැති වැ. **නො බොරුයෙන්**— බොරු නැති වැ. ඒ බෝ සතුනට ගැහැනුන් ගේ බොරුවෙක් නො වී යැ. **ආරොග්‍යයෙන්**— නීරොග භාවයෙන්. රොග නැත්තේ යමකුට ද හේ අරොග යි. අරොගයා ගේ භාවය ආරොග්‍ය යි. ශබ්ද ව්‍යුත්පත්තිය මෙ සේ වන හෙයින් 'ආරෞග්‍ය භාව යැ යි යොදන්නෝ නො දන්නෝ යැ. **දෛවයා ගේ**— භාග්‍යයා ගේ. නියමයා ගේ. **ආනුකූල්‍යයෙන්**— අනුකූල භාවයෙන්. අවිරුද්ධ භාවයෙන්. උත්සාහයේ ප්‍රමාණයට ඵල ලැබේ නම් දෛවය අනුකූල යි. උත්සාහය මහත් වුව ද ඵල අල්ප නම්, ඵල නැත් නම්, දෛවය අනනුකූල යැ—ප්‍රතිකූල යැ. **බෝ සතාණන්** වනාහි

කළ කළ දූ සඵල යැ. එ හෙයින් දෛවය අනුකූල යැ. කූලයට (තීරයට) අනු වූයේ අනුකූල යි. ගඞ්ගායෙහි ප්‍රවාහය කූලයට අනු වැ යේ නම් ඒ අනුකූල යි. විරුද්ධ නො වන්නා වූ කුමකට වුව ද 'අනුකූල' නාමය යෙදෙයි. අනුකූලයා ගේ භාවය ආනුකූල්‍ය යි **අපශ්චාත්තාපයෙන්**— පසු තැවිලි නො වීමෙන්. පශ්චාත් + තප් + අ = පශ්චාත්තාප. 'පස්ස' යැ. යන අර්ථ ඇති 'පශ්ච' ශබ්දය පස් වන විබත් ගෙනැ 'පශ්චාත්' යනු වෙයි. 'පස්සෙන්' යනු අර්ථ යි. තාපය නම් තැවිල්ල යි. (ශෝක වීම යි.) න පශ්චාත්තාප අපශ්චාත්තාප. **වේෂ භාෂා දෙක්හි විදග්ධ භැවින්**— ඇඳුම යැ වචනය යැ යන දෙකෙහි නාගර (නො පිටිසර) භාවයෙන්. ඇඳුමෙහි ද කථනයෙහි ද ශිෂ්ට භාවයෙන්. නාගරයෝ මේ දෙකින් මැ විදග්ධ යෝ යැ. **සෞන්දර්‍ය සාරයෙන් උජ්ජ්වලිත** වූ— සුන්දර භාවය පිළිබඳ සාරයෙන් උසස් ලෙස බැබැළුණා වූ. උද් + ජ්වල් + ඉ + ත = උජ්ජ්වලිත. **රථ වරයෙන්**— උතුම් රථයෙන්. **විවිධ ලෝක පූජා විධෙය** වූ— නානා ප්‍රකාර වූ ලෝක පූජා කළ යුතු වූ. 'ලෝක පූජා' නම් ලෝකයා විසින් කැරෙන පූජා යැ. වි + ධා + ය = විධෙය. 'වි' පූර්ව 'ධා' ධාතු සැලැසීමෙහි යෙදේ. **කකුධ**— කුඹුක්. **මාර බල ව්‍යාල කුල වික්ෂෝභ කෙලි වෛනතෙය වැ**— මාර සේනා නමැති නාග සමූහයා කැලැඹීමට ක්‍රීඩාලොල වූ ගුරුළකු වැ. මෙහි 'ව්‍යාල' යනු නයාට නමි. වි + ක්ෂුභ් + අ = වික්ෂෝභ. 'ක්ෂුභ්' (කැලැඹීමෙහි- බිය ගැන්වීමෙහි) ධාතු යි. විනතාව ගේ පුත්‍රයා (විනතා + ය) වෛනතෙය යි. කශ්‍යපයනට 'විනතා' නම්හු භාර්‍යාවක් වූව. ඇය ගේ පුතා ගුරුළා යැ. **සමස්ත වස්තු විස්තාර ස්වභාව සර්ව ස්ව ග්‍රහණ රසික සර්වඥතා ඥාන සමධිගමයෙන්**— සකල වස්තූන් ගේ පැතිරීමේ ස්වභාවය නමැති සකල ධනය ගැනීමේ ලොල් වූ සර්වඥතා ඥානය මනා සේ ලැබීමෙන්. සකල ඥෙය මණ්ඩලය අවබෝධ කොට් යැ යූ සේ යි. සියලු වස්තූන් පිළිබඳ විස්තාරය සර්ව ස්වය නම්, සර්වඥතා ඥානය ඒ සර්ව ස්වය ගැනීමෙහි රසික යැ, ලොල් යැ. සියලු වස්තු පිළිබඳ විස්තර තත්ත්වය සමස්ත වස්තු විස්තාර ස්වභාව නමි. 'ස්ව' යනු ධනයට ද නමෙකි. ස්වන් + අ = ස්ව. (ධාත්වන්ත ලොපය වෙයි.) 'ස්වන්' (ශබ්දයෙහි) ධාතු යි. **සකල ලෝකාර්ථ චර්‍යා චාර ධෞරෙය වැ** — සියලු ලොකයාට අර්ථචර්‍යායෙහි හැසිරීමේ ධුරන්ධර වැ. අර්ථය (අභිවෘද්ධිය) පිණිස චර්‍යාව අර්ථචර්‍යා යැ. චරණය කළ යුත්තේ

(චර් + ය) චර්‍ය සි. ස්ත්‍රී ප්‍රත්‍යයක ('ආ') වීමෙන් චර්‍යා' යනු වෙයි. අභිචර්‍යායෙහි චාරය අභිචර්‍යාචාර සි ධුරය දරනුයේ ධෞරෙය්‍ය සි. **කරුණාප්‍රඥාපර වැ**— කරුණායෙහි ද ප්‍රඥායෙහි ද අතිශයින් යුක්ත වැ. කරුණාව ද ප්‍රඥාව ද පරම වූයේ යමක්හු හට ද හේ කරුණාප්‍රඥාපර සි.

3. **කරුණා වශ්‍ය වූ**— කරුණායෙන් වශග (යටත්) කළ යුතු වූ. බෝසත්හු කරුණාවට වශ්‍ය වෙති. කරුණායෙන් මෙහෙයුණු කලැ කො තරම් ගුරු කාර්‍යයක් වුව ද කෙරෙති. **නිර්වාණාරාමාභිරාම වූ**— (නිර්වාණ + ආරාම + අභිරාම) නිවනින් ප්‍රීත වන්නවුනට රමණීය වූ. ආ + රම් + අ = ආරාම. ප්‍රීතිය සි. 'රම්' (ඇල්මෙහි) ධාතු සි නිර්වාණයෙහි ආරාමය (ප්‍රීතිය) යමක්හු ගේ ද හේ නිර්වාණාරාම සි. නිර්වාණාරාමයනට අභිරාම වූයේ නිර්වාණාරාමාභිරාම සි. **බුද්ධාරාමයක්**— බුදුනට අරමක්. 'ආරාම' යනු උයනට ද විශ්‍රාමය කරන තැනට ද නම්. එ තන්හි දු ආරමණය වන හෙයිනි. **ශරණ ශීල දෙකෑ**— තිසරණ ගැන්ම යැ සිල් සමාදන් වීම යැ යන දෙකෙහි.

---

## 14. අභිදර්ශී විවරණ කථා

1. **සමස්ත තත්ත්ව විදර්ශී වූ**— සියලු තතු විශෙෂයෙන් දක්නා සුලු වූ **නිරුපදෙශ බුද්ධ ගොචර දර්ශී වූ**— උපදෙශ රහිත වැ බුද්ධ විෂයය දක්නාසුලු වූ. බුදු කෙනකුට ගොචර වූ (විෂය වූ) සියලු නුවණ පරොපදෙශ රහිත වැ දක්නා සුලු වූ. **සර්වාඞ්ග ශොභන**— (සර්ව + අඞ්ග) සියලු අඞ්ගයන් ගෙන් හොබනා ශුභ් + අන = ශොභන. 'ශුභ්' (හෙබීමෙහි) ධාතු සි. **මනුජ ලොක පුරන්දර**— මිනි ලොවැ පුරඳුරු (ශක්‍ර.) මනුෂ්‍ය ලොකයට ශක්‍රයා. මනුහු ගෙන් ජාත වූයේ (උපන්නේ) මනුජ සි. (අසුරයන් ගේ) පුරය දාරණය (නැසීම) කෙරේ නු සි ශක්‍ර 'පුරන්දර' නම් වෙයි. **රාජ මූර්ති සුන්දර වූ**— රාජ ලීලායෙන් සොඳුරු වූ. මූර්ඡ් + ති = මූර්ති = 'මූර්ඡ්' ධාතු ආකාර ග්‍රහණයෙහි වැටේ **ශ්‍රුත වෘත්ත බන්ධුර වූ**— ප්‍රසිද්ධ වූ චරිතයෙන් මනොඥ වූ. ශ්‍රැ + ත = ශ්‍රැත. 'ශ්‍රැ' (ඇසීමෙහි) ධාතු සි. අසන ලද්දේ ශ්‍රැත සි. යමක් ගැනැ සියලු තන්හි අසන ලද්දේ නම් ඒ ප්‍රසිද්ධ යැ. වෘත් + ත = වෘත්ත. 'වෘත්' (පැවැත්මෙහි) ධාතු සි. සාගර රජහු ගේ පැවැත්ම (චරිතය) ප්‍රසිද්ධ යැ. එ බඳු වූ ප්‍රසිද්ධ පැවැත්මෙන් එ රජ මනොඥ යැ.

**රාජ ලෝක ශේඛර** වූ— රජ වර්ගයාට මුදුන් මල් කඩ වූ. සියලු රජුන් කෙරෙහි අග්‍ර වූ. **චාරු භාව පඤ්ජර** වූ— මනොඥ භාවයට මැදිරියක් වූ. මැදිරියෙකැ පක්ෂියකු මෙන්, මනොඥ භාවය එ රජ කෙරෙහි වෙති සි යු සේ සි. මනොඥභාවයෙහි 'චාරු' යනු වෙසි. පජ් + අර = පඤ්ජර. 'පජ්' ආවරණයෙහි ධාතු සි. පක්ෂි ආදීන් බඳනා තැන පඤ්ජර නම් වේ. ශරීරාස්ථි සමූහය ද මෙ නමින් ගැනේ. **වික්‍රමෛක මන්දිර** වූ— (වික්‍රම + එක) වික්‍රමයට එක ම මැඳුර (ගෘහය) වූ. වික්‍රමය වසනා එක ම තැන වූ. මද් + ඉර = මන්දිර. එහි මිනිසුන් (සැතැපීම) කැරේ නු යි මන්දිර සි. 'මද්' (සැතැපීමෙහි) ධාතු සි. **ක්ෂිප්තාරාති සඞ්ගර** වූ— (ක්ෂිප්ත + අරාති) අවඥා කරන ලද (නො සලකා හරන ලද) ශත්‍රු යුද්ධ ඇත්තා වූ. සතුරන් ගේ යුද්ධයට මේ රජ අවමන් කෙළේ යැ. යුද්ධයෙකැයි ගණනට ද නො ගත්තේ යැ. ක්ෂිප් + ත. 'ක්ෂිප්' (අවමන්හි) ධාතු සි. සතුරාට 'අරාති' යනු ද නමෙකි. සම් + ගෘ + අ = සඞ්ගර. 'සම්' පූර්ව 'ගෘ' ධාතු ප්‍රතිඥාදියෙහි වැටේ. **විපුල කීර්ති සාගර** වූ— බොහෝ වූ කීර්තියට සාගරය වැනි වූ. සාගරයෙහි ජලය මෙන් බොහෝ වූ කීර්ති ඇති යැ සි යු සේ සි. **මදන මඞ්ගල මන්දිරාකාර චාරු ශරීර කාන්තීන්**— (මන්දිර + ආකාර) අනඞ්ගයා ගේ මඞ්ගල ගෘහය වැනි වූ මනොඥ වූ කාය ශොභායෙන්. එ බෝ සතුන් ගේ ශරීරය අනඞ්ගයා ගේ මඟුල් මැඳුර වැන්නැ යි කීමෙන්, ඒ ශරීරය දුටු ස්ත්‍රීන් ගේ සිත්හි බලවත් රාග උපදනා බව හැඟැවූ හ. **කන්දර්ප තරු වරාග්‍ර ශාඛායමාන** වූ— (තරුවර + අග්‍ර) අනඞ්ග නාමැති උතුම් ගසෙහි අග්‍ර ශාඛාව (මුදුන් අත්ත) වැනි වූ. කුත්සිත (නින්දිත) වූ දර්පය යමක්හු ගේ ද හේ කන්දර්ප සි. අනඞ්ගයාට නම්. 'කම්' යන අව්‍යය කුත්සිතාර්ථයෙහි වැටේ. **රුචිර නූපුර රවයෙන් අනාරත මුඛර** වූ— සිත් කලු වූ සලඹෙහි හඬින් සියලු කල්හි ශබ්දසහිත වූ. ස්ත්‍රීන් ගමන් කරන කලැ ද නටන කලැ ද නූපුර රවය ඇති වෙසි. පයේ ලන ගිගිරි වළල්ල නූපුර නම්. මුඛය හෙයින් මුඛ ව්‍යාපර සඞ්ඛ්‍යාත ශබ්දය රණය (දීම) කෙරේ නු යි මුඛර. මුඛ + රා + අ = මුඛර. 'රා' (දීමෙහි) ධාතු සි. **නිජ හර්ම්‍ය ස්ථල**— ස්වකීය ප්‍රාසාද තල. ධනවතුන් ගේ විශාල ශොභන ගෘහයෝ හර්ම්‍ය නම් වෙත්. **කල්ප තරු**— කල්ප වෘක්ෂ. **නාග කන්‍යාව**— නාග කුමාරිය. විවාහයට නො පැමිණි තරුණිය කන්‍යා නම්.

**වසන්තාවේශ සමුද්භූත ප්‍රභූත කුසුම සම්පත් ඇති—** (වසන්ත + ආවේශ) වසන්ත කාලයාගේ පැමිණීමෙන් ඇති වූ බොහෝ වූ පුෂ්පයන්ගේ සමාගමය (එක් වීම) ඇති. ප්‍ර + භූ + ත = ප්‍රභූත. මෙහි 'ප්‍ර' පූර්ව 'භූ' ධාතු බොහෝ වීමෙහි වැටේ. **චම්පක—** සපු. **පහන් ඇගෑයක්—** පහන් තොරණක්. පාලියෙහි 'අග්ඝිකා' යනු සතරැස් කොටැ හෝ, වට කොටැ හෝ, එක් මුදුනක් සිටුනා සේ තැනූ තොරණ වෙසෙසෙකි. මෙයට සමාන සංස්කෘත නාමයෙක් නො පෙනේ. සපු මල් පහන් බඳු වන හෙයින් පිපුණු සපු ගස පහන් ඇගෑයක් වැනි වෙයි. **බහලාන්ධකාර නිකරයෙහි—** (බහල + අන්ධකාර) ඝන අන්ධකාර සමූහයෙහි. **ප්‍රචණ්ඩ සංවර්ත මාර්තණ්ඩ මණ්ඩල වූ—** ඉතා සැඩ වූ ප්‍රලය (කල්පාන්ත) සූර්ය මණ්ඩලය (බඳු) වූ. සම් + වෘත් + අ = සංවර්ත. 'සම්' පූර්ව 'වෘත්' ධාතුව විනාශයෙහි වැටේ. **චණ්ඩතාව—** සැඩ බව. චණ්ඩයාගේ භාවය චණ්ඩතා නැ. **ඥෙය රේඛාව—** ඥෙය පරම්පරාව. දත යුතු දෑ සියල්ල. මෙහි රේඛා නම් පඞ්ක්තිය යි. **ශ්‍රී හස්ත රේඛා සේ—** (තමන්ගේ) ශ්‍රී හස්තයෙහි ඉරි සේ. හස්තයෙහි රේඛා යම් පමණ අනායාසයෙන් දත හැකි ද එ තරම් අනායාසයෙන් සකල ඥෙය මණ්ඩලය දත් බව මෙ සේ කී හ. **නිර්විශෙෂ කොටැ—** (හස්ත රේඛාවන් හා) නො වෙනස් කොටැ. එ තරම් අනායාසයෙන්. **ධර්ම ප්‍රාවීණ්‍යයට—** ධර්මයෙහි ප්‍රවීණ (නිපුණ) භාවයට. **ධර්ම නෛරන්තර්යයට—** ධර්මයෙන් නිරතුරු (අතරක් නැති) බවට. නිරන්තරයාගේ භාවය (නිරන්තර+ය) නෛරන්තර්ය යි. **ධර්මාභිඥානයට—** (ධර්ම + අභිඥානයට) ධර්ම ප්‍රභාවයට (ශක්තියට.) **ධර්මාහඞ්කාරයට—** ධර්මයෙහි අහඞ්කාරයට. **ධර්මොත්සෙකයට—** (ධර්ම + උත්සෙක) ධර්මය ඉසීමට. ධර්මය උතුරා යෑමට. උද් + සිච් + අ = උත්සෙක. 'උද්' පූර්ව 'සිච්' ධාතු උඩට ඉසීමෙහි වැටේ. **වෛශාරද්‍යයට—** විශාරද (දක්ෂ) බවට. **ධර්ම හර්ෂයට—** ධර්මයෙහි සන්තොෂයට. **ධර්මොත්තර—** (ධර්ම + උත්තර) ධර්මයෙහි උත්කෘෂ්ට (ප්‍රධාන.) **අධර්ම තර්ජනයට—** අධර්මය තැති ගැන්වීමට. **නිර්මථනයට—** නිඃශෙෂ කොටැ (සම්පූර්ණ වශයෙන්) මැඩීමට. නිර්+මථ් + අන = නිර්මථන. **නිෂ්ඨීවනයට—** පිළිකුල් කොටැ දුරු කිරීමට. කෙළ ගසන්නා සේ හැරැ දැමීමට. නි + ෂ්ඨීව් + අන = නිෂ්ඨීවන. 'ෂ්ඨීව්' (කෙළ ගැසීමෙහි) ධාතු යි. **එක නිදාන—** එක මැ හෙතුව. **සදන්නට—** සරසන්නට. අලඞ්කෘත කරන්නට.

**2. බ්‍රාහ්මණ මහාසාර වූ—** බමුණු මහසල් කුලයට අයත් වූවකු වූ. ත්‍රිවිධ මහාසාර කුලයන් ආචාර්ය ගුරුළු ගෝමීහු මෙ සේ වදාති:— “එහි යමක්හු ගේ ගෙහි පශ්චිමාන්තයෙන් සතලිස් කෙළක් ධන නිධාන ගත වේ ද, පසමුණක් කහවණු දවසැ වැය වේ ද, මේ ගෘහපති මහාසාර කුල නම් වේ. යමක්හු ගේ ගෙහි පශ්චිමාන්තයෙන් අසූ කෙළක් ධන නිධාන ගත වේ ද, දසාමුණක් කහවණු දවසැ වැය වේ ද, මේ බ්‍රාහ්මණ මහාසාර කුල නම් වේ. යමක්හු ගේ ගෙහි පශ්චිමාන්තයෙන් සියක් කෙළක් ධන නිධාන ගත වේ ද, විසි අමුණක් කහවණු දවසැ වැය වේ ද, මේ ක්‍ෂත්‍රිය මහා සාර කුල නම් වේ මහත් වූ සාරය යමක්හු ගේ ද හේ මහා සාර සි. **සබ්බ ලොක සම්මත වූ—** සියලු ලොකයා විසින් සම්මාන කරන ලදු වූ. සම් + මන් + ත = සම්මත. ‘සම්’ පූර්‍ව ‘මන්’ ධාතු උසස් කොටැ සිතීමෙහි වැටේ. **අභ්‍යස්ත- සමස්ත- විද්‍යා- නිරවද්‍යමති වූ—** අභ්‍යාස (පුරුණු) කරන ලද සියලු ශාස්ත්‍රයන් කරණ කොටැ ගෙනැ නිවැරදි වූ බුද්ධි (අවබොධ) ඇති වූ. අභි + අස් + ත = අභ්‍යස්ත. ‘අභි’ පූර්‍ව ‘අස්’ ධාතු ඉදිරියෙහි දැමීමෙහි (නැවැතැ නැවැතැ ඉදිරියට ගෙනැ පුරුදු වීමෙහි) වැටේ. මන් + ති = මති ‘මන්’ (සිතීමෙහි) ධාතු සි. **දොෂ ප්‍රපඤ්චය—** දොස් රාශිය. දූෂණය කරණුයේ දොෂ සි. දූෂ් + අ = දොෂ. ‘දූෂ්’ (දූෂණයෙහි) ධාතු සි. ප්‍ර + පච් + අ = ප්‍රපඤ්ච, ‘පච්’ (විස්තරයෙහි) ධාතු සි. **දීනානාථ මනොරථ පූරණය හා යොද්‍ය—** (දීන + අනාථ) දුඃඛිතයන් ගේ ද අශරණයන් ගේ ද අභිලාෂ පිරීම හා එක් කොටැ, (ධනයෙන්) දීනානාථයන් ගේ අභිලාෂ පූරවා, දී + න + දීන. ‘දී’ (ක්‍ෂයයෙහි) ධාතු සි. වස්තු ක්‍ෂයයට පැමිණියෝ දීනයෝ යැ.

**3. තමාල නීලච්ඡවි සුන්‍දර වූ—** (නීල ඡවි) තමලු (කොල්ලම්) මෙන් නිල් පැහැයෙන් සොඳුරු වූ. ‘මෙඝ’ යන්නට විශෙෂණ සි. මෙඝය තමලු මෙන් නිල් යැ. ‘ඡවි’ යනු කාන්තියට ද සිවියට ද නමි. **විද්‍යොතමාන විද්‍යුද්වලයාභිරාම වූ—** (විද්‍යුත් + වලය + අභිරාම) බබළන්නා වූ විදු ලිය වළල්ලෙන් (වෙළුමෙන්) අතිරමණීය වූ. ‘මෙඝ’ යන්නට විශෙෂණ සි. මෙඝයෙහි විදු ලිය වෙයි. විද්‍යුත් + අ + මාන = විද්‍යොතමාන. ‘ද්‍යුත්’ ධාතු බැබැළීමෙහි වැටේ. විද්‍යොතනය කරන හෙයිනි විදු ලිය ‘විද්‍යුත්’ නම් වූයේ. වලනය (වෙළීම) කරනුයේ (වල් + අය) වලය සි. **නිරන්තර**

**ඉන්ද්‍රචාපකලාපාවනද්ධ වූ**— (කලාප + අවනද්ධ) අතුරු නැති ව, දේදුනු කලඹින් වැසුණා වූ 'මෙඝ' යන්නට විශේෂණ යි. ඉන්ද්‍රයා ගේ (ශක්‍රයා ගේ) චාපය (දුන්න) ඉන්ද්‍ර චාප යි. කලාවට පැමිණෙන් නු යි කලාප යි. කලා + ආප් + අ = කලාප. 'ආප්' (පැමිණීමෙහි) ධාතු යි අව+නහ් + ත = අවනද්ධ. 'අව' පූර්ව 'නහ්' ධාතු වැසීමෙහි වැටේ. **මෙඝ කූටයකට**— වැසි වලා කුළකට. (දිය) ඉසිනුයේ මේඝ යි. මිහ් + අ = මෙඝ. 'මිහ්' (ඉසීමෙහි) ධාතු යි. **චාතකයකු** — කැදැත්තකු. **අතිශීතල සලිල භරිත වන සරසි විගාහනෛක රසික**— (විගාහන + එක) ඉතා සිසිල් දිය පිරුණු වන විලෙකැ ගැලීමේ එක මැ ආශාව ඇති. වි + ගාහ් + අන = විගාහන. 'ගාහ්' (ගැලීමේ- නිමගනා වීමේ) ධාතු යි. **ජනනී ස්තන දර්ශනයට**— මව ගේ පයෝධරය දැකීමට. උපදවන්නී ජනනී යැ. ජන් + අන් + ඊ = ජනනී 'ජන්' (ඉපැදීමෙහි) ධාතු යි. **තරුණ ස්තනන්ධයෙක් හු**— ('ස්තනන්ධයක්හු' යනු මුද්‍රණ දෝෂ යි.) අලුත් බිළිඳකු. ස්තනය උරනුයේ (බොනුයේ) ස්තනන්ධය නම්. ස්තනම් + ධෙ + අ = ස්තනන්ධය. 'ස්තන' ශබ්දය ද්විතීයාන්ත ව 'ස්තනම්' යි සිටියේ යැ. 'ධෙ' (ඉරිමෙහි- බීමෙහි) ධාතු යි. **පථිකයක් හු**— මගියකු. පථයෙහි (මාර්ගයෙහි) යනුයේ පථික යි. පථින්+ක = පථික 'පථින්' යනු මාර්ගයට නමි. **නිර්වාණොන්මුඛ ව**— නිවනට උත්සාහවත් ව (ආශායෙන්.) සසර දුක් නිවීම නිර්වාණ යි. නිර් + වා + ත= නිර්වාණ. 'නිර්' පූර්ව 'වා' ධාතු නිවීමෙහි වැටේ. ඌර්ධ්ව වූ මුඛය යමක්හු ගේ ද හේ (උද් + මුඛ) උන්මුඛ යි. යම් කිසිවකට ආශා කෙළේ එය බලා උන්මුඛ වෙයි. **යොගාවචරයක් හු**— ශ්‍රමණයකු. යොගයෙහි (ධ්‍යාන භාවනාදි ශ්‍රමණ ධර්මයෙහි) අවචරණය (හැසිරීම) කරනුයේ යොගාවචර යි. යුජ්+අ= යොග. යෙදීම. අව + චර් + අ= අවචර. **පරම ප්‍රීති ප්‍රසාද නිරන්තරීභූත**— ඉතා මහත් ප්‍රීතියෙන් ද ප්‍රසාදයෙන් (පැහැදීමෙන්) ද අතරක් නැති වූ. නිරන්තර + භූත= නිරන්තරීභූත. **දෘශ්‍යමාන**— දක්නා ලබන පෙනෙන දෘශ් + ය + මාන. 'දෘශ්' (දැක්මෙහි) ධාතු යි. **සමූලින්**— මුල පටන් ගෙනැ. **මල් ගෙනැ**— මල් හට ගෙනැ. **මුල්කි ගෙනැ**— මුලින් අල්ලා ගෙනැ. **පිලා අත්තක්**— ('පිල' යනු මුද්‍රණ දෝෂ යි.) කුඩා අත්තක්. 'පිලා' යනු කුඩා යන අර්ථයෙහි වෙයි.

"නිලා තිබෙන බැම ඉඳු දුනු පිලා වන්"

යන තන්හි 'පීලා' යනු මේ අර්ථ දෙයි. 'පිලවා' යන තන්හි සචෙතනක වාචී 'පිලා' ශබ්දය යි. **ලද**— තරුණ **පහරවා** - ගාවා. සසඟී කරවා **මල් සතක්**— පුෂ්පවෘන්තයක්. මල් කුඹයක්. **සද්ධම් වෂී**— සදහම් වැසි

4. **සතතොද්‍යුක්ත** - (සතත + උද්‍යුක්ත) නිරන්තරයෙන් උද්‍යෝගවත් (උත්සාහ ඇති.) උද් + යුජ් + ත = උද්‍යුක්ත. 'උද්' පූර්ව 'යුජ්' ධාතු උද්‍යෝගයෙහි වැටේ.

## 15. ධම්දර්ශී විවරණ කථා

1. **යථාර්ථ නාමාක්ෂර වූ**— (යථා+අර්ථ නාම+අක්ෂර) අන්වර්ථ වූ (අර්ථානුගත වූ) නම් අකුරු ඇති. අන්වර්ථ නාම ඇති යැ සි යු සේ සි. අර්ථ දක්නා සුලු වූයේ අර්ථදර්ශී යැ. අර්ථදර්ශී බුදුහු සාකල්‍යයෙන් අර්ථ දකිති. එ හෙයින් 'අර්ථදර්ශී' යන නමෙහි අකුරු අර්ථයට අනුගත මැ යැ. අර්ථ යම් සේ ද එ සේ යථාර්ථ අර්ථ එයින් නමිනු ලැබේ නු සි 'නාමන්' යනු ශවසි. නම් + අන් = නාමන්. 'නම්' නැමීමෙහි ධාතු යි. ක්ෂර නො වනුයේ අක්ෂර යි. ක්ෂර් + අ = ක්ෂර. 'ක්ෂර්' (දිය වී යෑමෙහි) ධාතු යි. න ක්ෂර අක්ෂර. අකුරු කො තරම් යෙදුව ද දිය වී ගිය බවක්— ගෙවී ගිය බවක්— නො වනුයෙන් 'අක්ෂර' නාමය යෙදෙයි. **අනන්තඃ කල්පය**— මහා කල්පයක් ඇතුළතැ වූ කල්පය අනන්තඃ කල්ප නම්. මනුෂ්‍යයා ගේ පරමායුෂ හවුරුදු දසය වූ කාලයෙන් පටන් ගෙනැ, පරමායුෂ හවුරුදු අසංඛ්‍යය වන තෙක් නැඟී, යළි දු ක්‍රමයෙන් බැසැ, හවුරුදු දසය වන කාලයට පැමිණි විටැ, එක් අනන්තඃකල්පයෙක් පිරෙයි. **ධර්ම දර්ශින**— ධර්මය දැකීම. **ත්‍රිභුවන ශරණ වූ**— එ නුවර බුදුන් උපදනා හෙයින් තුන් ලොවට ශරණ යැ. **විරචිත- රාජ- ලක්ෂ්මී- ස්වයංවර වූ**— කරන ලද රජ ලක්ෂ්මිය ගේ ස්වයංවර ඇති. රජ ශ්‍රීය විසින් මැ තමා ගේ ස්වාමි භාවයට තෝරා ගන්නා ලද්දී වූ. රජ ශ්‍රී (රාජ සම්පත්තිය) නම් ශ්‍රී කාන්තාව යි. ඇයට පතියකු තෝරා ගැනීමට ප්‍රස්තාවය පැමිණියේ යැ. එහි දී ඇය විසින් සිය කැමැත්තෙන් මැ මේ ශරණ නම් නර පති තෙමේ තෝරා ගන්නා ලද්දේ යැ. කුල ක්‍රමාගත වූ රාජ්‍යය අයත්නයෙන් මැ (නිකම් මැ) ඔහුට ලැබුණු බව මේ කී සේ යැ. ස්වයං (තමා විසින් මැ) කෘත වූ වරය තේරීම ස්වයංවර යි. 'ස්වයං' යනු 'තමා විසින් මැ' යන අර්ථයෙහි

අව්‍යය සි. වෘ+අ= වර. 'වෘ' (තෝරීමෙහි) ධාතු සි. ශික්ෂාමාර්ගයේ පස් වන පොතේ "ඉන්දුමතිය ගේ ස්වයංවරය" යන පාඨය කියැවූ විටැ 'ස්වයංවරය' නම් කෙබන්දෙක් ද යනු මැනැවින් වැටැහෙයි. **අනුපම චාරු කරණ විහිත සමස්ත ශාස්ත්‍ර චාපි නිස්තරණ** වූ— අසමාන වූ මනොඥ බුද්ධියෙන් කරන ලද සකල ශාස්ත්‍ර නමැති වැවෙන් එ තෙර වීම් ඇති. සව් ශාස්ත්‍ර නමැති වැවෙන් එ තෙර වූ. 'කරණ' යනු ඉන්ද්‍රිය පර්‍ය්‍යාය සි. මෙහි ගැනෙනුයේ අන්තඃ කරණය සි හෙවත් බුද්ධිය සි. වි+ධා+ත= විහිත. 'වි' පූර්ව 'ධා' ධාතු සැලැසීමෙහි- කිරීමෙහි- වැටේ. ශාස්+ත්‍ර= ශාස්ත්‍ර. වේදාදි ශාස්ත්‍ර සි. 'ශාස්' පැතිරීමෙහි ධාතු සි. වප්+අ= වාප. වැපිරීම සි. 'වප්' (වැපිරීමෙහි) ධාතු සි. ස්ත්‍රී ප්‍රත්‍යයය ('ඊ') වීමෙන් 'වාපී' යනු වෙයි. වැවට නම්. "ද්‍රොණාත් දශගුණා වාපී" යැ යූ බැවින් ද්‍රොණයක් (තඩාගයක්) මෙන් දශ ගුණයක් මහත් වූවා වාපී නමු. නිස්+තෘ+අන= නිස්තරණ. 'තෘ' (එ තෙර වීමෙහි) ධාතු සි. අසමාන වූ බුද්ධි මහිමයෙන් සකල ශාස්ත්‍රයන් ගේ පාරයට ගිය බව මෙ සේ කී හ. **ප්‍රණත- ධරණී- පති- ග්‍රාම- මණි- මෞලි- මාලා- ලම්බිත- චරණ** වූ— වැන්දා වූ රජ සමූහයා ගේ මිණි කිරුළු පෙළ එල්බුණු පාද ඇති වූ. නරේන්ද්‍ර සමූහයා විසින් ස්වකීය මිණි කිරුළු සහිත හිස් පා පිටැ තබා වඳනා ලද්දා වූ. රාජාධිරාජ භාවය මෙයින් හඟවන ලද. ප්‍ර+නම්+ත= ප්‍රණත. 'නම්' (නැමීමෙහි- වැඳීමෙහි) ධාතු සි. ධරන්නී ධරණී යැ. පෘථිවිය සි. ධෘ+අන+ඊ= ධරණී. 'ධෘ' (දැරීමෙහි) ධාතු සි. 'ඊ' ස්ත්‍රී ප්‍රත්‍යයය සි. ධරණිය ගේ පති ධරණී පති. රජ. 'ග්‍රාම' යනු සමූහාර්ථයෙහි වෙයි. 'මෞලි' යනු කිරිටයට ද බඳනා ලද කෙස් වැටියට ද නම් වෙයි. 'මාලා' යනු 'මල් දම්' යැ 'පේළිය' යැ යනාදි අරුත් දෙයි. 'මෞලි මාලා' නම් 'කිරුළු පෙළ' යැ සි ද හිසෙහි පැළැඳි 'මල් දම්' යැ සි ද කිය හැකි යැ 'මිණි මෞලි' සි කියැවුණෙන් කිරුළු ගත යුතු වෙයි. ලම්බ්+ඉ+ත= ලම්බිත. 'ලම්බ්' (එල්බීමෙහි) ධාතු සි. **පාර්ථිව සින්ධුර ගන්ධ වාරණ** වූ— රජයන් නමැති හස්තීනට ගන්ධ හස්තීන් (බඳු) වූ පෘථිවීනට ඊශ්වර පාර්ථිව සි. පෘථිවී+අ= පාර්ථිව. සින්ධු (මද ජලය) ඇත්තේ (සින්ධු+ර) සින්ධුර සි. ඇතා යැ. ගන්ධ වාරණ නම් ගඳැතා ය. ඔහු ගේ ලක්ෂණ මෙ සේ යැ:—

"යස්‍ය ගන්ධං සමාඝ්‍රාය න තිෂ්ඨන්ති ප්‍රතිද්විපාඃ
ස වෛ ගන්ධගජො නාම නෘපතෙර්විජයාවහඃ"

යමක්හු ගේ ගඳ අසා විරුද්ධ ඇත්තු නො සිටිත් ද රජුට විජය ගෙනැ දෙන්නා වූ හේ වනාහි ගඳ ගජ නමැ. යුද නැති වැ මැ ශරණ රජු කෙරෙන් සතුරු රජුන් පලා ගිය බව මේ හැඟැවූ සැටි යැ. **විරචිතෙන්ද්‍රියාහඞ්කාර නිවාරණ** වූ— (විරචිත + ඉන්ද්‍රිය + අහඞ්කාර) කරන ලද ඉන්ද්‍රිය ගර්ව වැළැක්මී ඇති. ඉන්ද්‍රියයන් ගේ ගර්වය වැළැක්ම කළා වූ. ඉන්ද්‍රියයන් ගේ එඩි මැඬා වූ. ඉන්ද්‍රිය දමනය කළා වූ. සත්ත්වයාට ඉන්ද්‍ර භාවය (අධිපති බව) කරන හෙයින් චක්ෂුරාදීහු ඉන්ද්‍රිය නම් වෙති. **සත්ත්වයෝ** ඉන්ද්‍රියයනට මෙහෙ කෙරෙති. ඉන්ද්‍රියයන් ගේ අහඞ්කාරය නම් තමන් තමන් හට වුව මනා පරිදි සත්ත්වයා හැසිරවීමෙන් උපදනා ගර්වය යි. නි + වෘ + අන = නිවාරණ. ප්‍රයෝජ්‍ය වන හෙයින් 'වෘ' වෘද්ධිය වී. 'නි' පූර්ව 'වෘ' ධාතු වැළැක්මෙහි වැටේ. **මාත්සර්‍ය ප්‍රත්‍යාඛ්‍යාන කාරණ** වූ— මසුරු බව දුරු කිරීමේ හේතුව වූ. ශරණ රජයාට මසුරු බවෙක් නැති. එ පමණෙක් මැ නො වේ. **අන්‍යයන්** ගේ ද මසුරු බව දුරු කිරීමට හේ හේතු යැ. ප්‍රති + ආ + ඛ්‍යා + අන = ප්‍රත්‍යාඛ්‍යාන. 'ප්‍රති' 'ආ' පූර්ව 'ඛ්‍යා' ධාතු තිරස්කරණයෙහි වැටේ. 'ආඛ්‍යාන' නම් කීම යි. 'ප්‍රත්‍යාඛ්‍යාන' නම් 'නැතැ'යි කීම යි. විරුද්ධාර්ථය එනුයේ 'ප්‍රති' යන උපසර්ගයෙනි. **ධර්මෛකපරායණ** වූ— (ධර්ම + එක) ධර්මය එක මැ උතුම් පිහිට කොටැ ඇත්තා වූ. **දුර්නීති විශාරණ** වූ— ('විසරණ' යනු මුද්‍රණ දෝෂ යි.) දුෂ්ට නීති විනාශ කරන්නා වූ. නී + ති = නීති. 'නී' (නයෙහි– 'ක්‍රියා මාර්ගය මෙ සේ යැ' යි දැක්වීමෙහි) ධාතු යි. දුෂ්ට වූ නීති දුර්නීති යි. වි + ශෘ + අන = විශාරණ. 'වි' පූර්ව 'ශෘ' ධාතු මැරීමෙහි වැටේ. **නයනානන්ද** වූ— (නයන + ආනන්ද) නෙත්‍රයට සන්තෝෂ ජනක වූ. **මුග්ධාඞ්ගනා වදන කමල කුඩ්මල විකාසනෛකක රජ හංසායමාන**— ('වැ' යනු අධික යි.) (මුග්ධ + අඞ්ගනා, විකාසන + එක) බොළඳ ගැහැනුන් ගේ මුහුණු නමැති නෙළුම් කැකුළු පිබිදීමෙහි අසහාය රජ හංසයා බඳු. 'නව යෞවනාවස්ථා' යන්නට විශේෂණ යි. යම් සේ රජ හංසයා තුඩින් ඇනැ නෙළුම් කැකුළු පුබුදුවා ද එසේ මැ මේ බෝ සතුන් ගේ අභිනව යෞවනාවස්ථාව බොළඳ ගැහැනුන් ගේ ඇසට වැදැ මුහුණු පුබුදුවයි. බොළඳ ගැහැනු බෝ සතුන් ගේ යොවුන දැකැ ප්‍රීතියෙන් ප්‍රේමයෙන් පුබුදු වූ- මද හස සහිත වූ- මුහුණින්

යුතු වෙති. වි + කස් + අන = විකාසන. 'වි' පූර්‍ව 'කස්' ධාතු ප්‍රකාශ වීමෙහි- පිබිදීමෙහි- වැටේ. 'විකාශන' යනු ද යෙදේ. **නව යෞවනාවස්ථාවතාරයෙන්**— (යෞවන + අවස්ථා + අවතාර) අභිනව තරුණ සමයය පැමිණීමෙන්. **අව්‍යාජ කෙළි රසික වූ**— නිබොරු වූ ක්‍රීඩා ලොල ඇති. **සර්‍වාඞ්ගීණ වූ අනඞ්ග පරිදාහ නිර්‍වාපණයෙහි**— ('සර්‍වාඞ්ගීන' යනු මුද්‍රණ දෝෂ සි) සකල ශරීරයෙහි පැතුරුණා වූ රාග නමැති දැවිල්ල නිවීමෙහි. සර්‍ව + අඞ්ග + ඊන = සර්‍වාඞ්ගීණ. ('ඊන' යනු 'ඛ' ප්‍රත්‍යයය ඇසුරු කොට නිපන්නෙකි.) අඞ්ගය ශරීරය නැතියේ යම්කුමට ද හේ (න + අඞ්ග) අනඞ්ග සි. කාමයට- රාගයට- නමි. පරි- හාත්පසින්- දවනුයේ (පරි + දහ් + අ =) පරිදාහ සි. නිර් + වා + ආප් = අන. නිර්‍වාපණ. 'ආප්' යනු ප්‍රයොජ්‍යයෙහි වේ. **නව චන්‍දන පල්ලව රස නිෂේකායමාණ වූ**— අලුත් සඳුන් දළු දිය ඉසීමක් වැනි වූ. සඳුන් දළු ඉතා සිසිල් යැ. සඳුන් දළු මුසු දිය ඉහුදු වැනි සිසිලින් යුක්ත වෙයි. **ශුභ ශ්‍රී**— ශෙති සම්පත්ති. ගිහි සැප **ගැවිරකර**— අතිශයින් සිත් කලු වූ. **බදර වනයෙහි**— ඩෙබර (මසන්) වනයෙහි. ඉංගිරිසියෙන් 'apple' යනු ද මේ බදර වර්ගයකට නම් යැ. **යව පාලකයා**— යව රකින්නා. 'යව' නම් ධාන්‍ය විශෙෂයෙකි. Barley. **නරාමර ලොක ප්‍රණත රක්ත කෝරක ඇති**— (නර + අමර) නරයන් අමරයන් (මිනිසුන් දෙවියන්) සහිත ලොකයා විසින් වඳනා ලද රතු (මල්) කැකුළු ඇති. නරයෝ ද අමරයෝ ද නරාමරයෝ යැ. නරාමරයන් සහිත වූයේ සනරාමර සි. 'කෝරක' යනු කැකුළට නම්. කුල් + අ = කෝර. 'කුල්' (සැඟැවීමෙහි) ධාතු සි. 'ල'කාරයට 'ර'කාරය වී. කෝර මැ කෝරක සි. ස්වාර්‍ථයෙහි 'ක' ප්‍රත්‍යයය සි. **කුරවක**— කෙළිඳ. **මාර වීර මුස්තොන්මූලන කෙළි මහා වරාහ වූ**— (මුස්ත + උන්මූලන) මාර වීර නමැති වම්මුතු (කලාඳුරු) මුල් උදුරන කෙළියට මහා සූකර වූ, නො හොත් මුල් ඉදිරීමෙහි කෙළි ලොල් මහා සූකර වූ. හූරෝ වම්මුතු උදුරා කනු කැමැත්තෝ යැ. මුස්ත් + අ = මුස්ත 'මුස්ත්' (සංහතියෙහි- එකතු වීමෙහි) ධාතු සි. 'මුස්තා' යනු දු මේයට මැ නම්. වරය (කැමැත්ත තෝරා ගැනීම) පිණිස ආහනනය (හැරීම කරනුයේ වරාහ සි. වෘ + අ = වර. ආ + හන් + අ = ආහ. **සර්‍ව ධර්‍ම නිරූපණ ප්‍රවීණ ප්‍රඥා ප්‍රකර්‍ෂ**— සියලු ධර්‍මයන් දැක්වීමෙහි නිපුණ වූ ප්‍රඥාව ගේ උසස් බව. **ජාති ව්‍යසනයෙන්**—

ඉපැදීමේ දුකින්. **ජරා පරිපන්ථවෙසෙන්**— ('පරිපන්ථයෙන්' යනු මුද්‍රණ දොෂ සි.) ජරාව ගේ සතුරු බැවින්. ජරාව සත්ත්වයාට සතුරු ව සිටී. පථය (මාර්ගය) හාත්පසැ යනුයෙන් සතුරා 'පරිපන්ථ' නම් වෙයි 'පවින්' යනු මාර්ග පර්‍යාය සි. සතුරා හරි මඟැ නො යෙයි. සතුරු කම් කරන්නට බලමින් මඟ වටා යෙයි. **මෘත්‍යු**— මරණ නමැති. මරනුයේ (මෘ+ත්‍යු) මෘත්‍යු සි. 'මෘ' (මැරීමෙහි) ධාතු සි. **ශොක විශොෂයෙන්**— ශොකය නමැති වියැළීමෙන්. වි + ශුෂ් + අ. **පරිදෙව ශූල තොදයෙන්**— වැලැපීම් නමැති හුලින් ඇනීමෙන්. පරි + දිව් + අ = පරිදෙව. 'පරි' පූර්ව 'දිව්' ධාතු විලාපයෙහි වැටේ. ශූල් + අ = ශූල. 'ශූල්' (රිදුවීමෙහි) ධාතු සි. තුද් + අ = තෝද. 'තුද්' (පෙළීමෙහි) ධාතු සි. **දුඃඛ ජාලානල ජ්වාලාවලෙපයෙන්**— (ජාල + අනල ජ්වාල + අවලෙපයෙන්) ('දුඃඛජ්වාලානල' යනු මුද්‍රණ දොෂ සි.) දුක් දැල (සමූහය) නමැති ගිනි සිළු වැදූ ගැනීමෙන්. ජ්වල් + අ = ජ්වාල. 'ජ්වල්' (දීප්තියෙහි) ධාතු සි. අව + ලිප් + අ = අවලෙප. 'ලිප්' (තැවැරීමෙහි) ධාතු සි. **දෞර්මනස්‍ය මූර්ච්ඡාවෙශයෙන්**— (මූර්ච්ඡා+ආවෙශයෙන්) දෞර්මනස නමැති මූර්ච්ඡාව (සිහි නැති වීම) පැමිණීමෙන්. දුෂ්ට වූ මනස යමක්හු ගේ ද හේ දුර්මනස්. දුර්මනස්හු ගේ භාවය දෞර්මනස්‍ය. දුර්මනස් + ය. **උපායාස විෂාවෙශයෙන්**— ('විෂාවෙෂයෙන්' යනු මුද්‍රණ දොෂ සි.) (විෂ + ආවෙශයෙන්) බලවත් ආයාස නමැති විෂ නැගීමෙන් (ඇවිස්සීමෙන්.) **නලවන්නට**— සනසන්නට. 'නල' (රැවැටීමෙහි) ධාතුව ප්‍රයොජ්‍ය වැ ණේද්‍රණ්‍ය නැති. 'නල' ධාතු 'බම' ආදි පර පද සි, අකර්මක සි. නලා- නලති- නිළී- නුළු. ලොක සත්ත්වයෝ ජාති- ජරා- මරණ- ශොක- පරිදෙව- දුඃඛ- දෞර්මනස්‍යොපායාසයෙන් පෙළුණාහු යැ. බුදුහු එ සේ පෙළුණවුන් නලවන්නට පටන් ගත් හ.

**2. ත්‍රි භුවන ව්‍යාපි**— තුන් ලොවැ පැතිරෙන්නා වූ. වි + ආප් + ඉන් = ව්‍යාපින්. 'වි' පූර්ව 'ආප්' ධාතු පැතිරීමෙහි වැටේ. **පූජා විසින්**— පූජා කරණ කොටැ ගෙනැ. **නිරන්තර කෙරෙමින්**— අතුරු නැති (සම්පූර්ණ) කෙරෙමින්. **වාද්‍යාදින්**— (වාද්‍ය + ආදීන්) තූර්‍ය ආදියෙන්. වාදනය කළ යුතු භෙරි වීණාදිය වාද්‍ය සි.

**3. මහොත්සාහ**— (මහා + උත්සාහ) මහත් උත්සාහ ඇති. මහත් වූ උත්සාහය යමක්හු ගේ ද හේ මහොත්සාහ සි.

**4. අචින්ත්‍ය**— නො සිතිය හැකි. චින්ත් + ය = චින්ත්‍ය. න චින්ත්‍ය අචින්ත්‍ය. **අතුල්‍ය**— සමාන කළ නො හැකි. 'තුල්' (සමාන කිරීමෙහි) ධාතු යි. තුල් + ය = තුල්‍ය න තුල්‍ය අතුල්‍ය. **අවාච්‍ය**— නො කිය හැකි. වච් + ය = වාච්‍ය. න වාච්‍ය අවාච්‍ය. **අවේද්‍ය**— නො දත හැකි විද් + ය = වේද්‍ය. 'විද්' (දැනීමෙහි) ධාතු යි. න වේද්‍ය අවේද්‍ය. **ප්‍රාර්ථනා**— පැතීම. ප්‍ර + අර්ථ් + අන + ආ = ප්‍රාර්ථනා. 'අර්ථ්' ධාතු කැමැති වීමෙහි වැටේ. **ඉහ ලෝකයටද්**— මෙ ලොවටද්. 'ඉහ' යනු 'මෙහි' යන අර්ථයෙහි අව්‍යය යි. **සර්ව සම්පත්ති නිර්වාණ සම්පත්ති**— (ලෞකික) සියලු සැපත් ද (කෙළවර) නිවන් සැපත ද.

## 16. සිද්ධාර්ථ විවරණ කථා

**1. විශුද්ධ**—අතිශයින් පිරිසුදු. **බුද්ධ කෘත්‍යානුෂ්ඨානයෙන්**— (කෘත්‍ය + අනුෂ්ඨාන) බුදු කිස කිරීමෙන්. අනු + ස්ථා + අන= අනුෂ්ඨාන. 'අනු' පූර්ව 'ස්ථා' ධාතු සිදු කිරීමෙහි වැටේ. **විස්මාපිත**— විස්මයයට පමුණුවන ලද. වි + ස්මෙ + ආප් + ඉ + ත = විස්මාපිත. ප්‍රයෝජ්‍ය වන හෙයින් 'ආප්' යෙදිණ. **ප්‍රහ්ලාදිත**— ඉතා සතුටු කරන ලද. ප්‍ර + හ්ලාද් + ඉ + ත. **නිර්වාපිත**— නිවන ලද. **සූවානූවක්**— (සිවු + අනූවක් = සූ + අනූවක්) අනූ සතරක්. **එක වීර**— අසහාය වීර. එක මැ වීර. **මාන්‍ය**— මානනය (ගෞරව) කළ යුතු. **වදන්‍ය**— බෙහෙවින් දෙන සුලු. මේ අර්ථයෙහි 'වදාන්‍ය' යනු ද වේ. වද් + ආන්‍ය. 'වද්' කීමෙහි ධාතු යි. ප්‍රිය වචන ඇත්තේ 'වදාන්‍ය' නම්. 'කව' 'බොව' 'ගනුව' යනාදිය පමණ ප්‍රිය වචන නැති තරම් ය. එ බඳු වචන ඇත්තේ බෙහෙවින් දෙන සුල්ලනට ය. එ හෙයින් බෙහෙවින් දෙන සුලු වූයේ ද 'වදාන්‍ය' නාමය ලද. 'වදාන්‍ය' යන්නෙහි 'ආ' කාරය හ්‍රස්ව වීමෙන් 'වදන්‍ය' යනු වී. **ශ්ලාඝ්‍ය**— ප්‍රශංසා කළ යුතු. ශ්ලාඝ් + ය. 'ශ්ලාඝ්' (ප්‍රශංසනයෙහි) ධාතු යි. **වාග්මී**— ප්‍රශස්ත වචන ඇති. විසිතුරු කථා ඇති. වචන ඇත්තේ වාග්මින්. වාච්+ග්මින් = වාක්+ග්මින් = වාග්මින්. 'වාච්' යනු වචනයට නම්. අස්ත්‍යර්ථයෙහි 'ග්මින්' ප්‍රත්‍යයයි. **ස්ව මති ප්‍රභාවාප්‍රතිෂිද්ධාර්ථ වූ**— (ප්‍රභාව + අප්‍රතිෂිද්ධ + අර්ථ) ස්වකීය බුද්ධි ශක්තිය කරණ කොටැ ගෙනැ නො වළක්වන ලද අභිලාෂයන් ඇත්තා වූ. අභිලාෂයන් ස්වකීය නුවණ බලයෙන් සිද්ධ කැරැ ගත්තා වූ. ප්‍රති + සිධ් + ත = ප්‍රතිෂිද්ධ. 'ප්‍රති' පූර්ව 'සිධ්' ධාතු වැළැක්වීමෙහි

වැටේ. න ප්‍රතිෂිද්ධ අප්‍රතිෂිද්ධ. **සංසිද්ධාශෙෂ-පුරුෂාර්ථ වූ—** (සංසිද්ධ + අශෙෂ + පුරුෂ + අර්ථ) මැනැවින් සිදු කරන ලද සියලු පුරුෂ අර්ථ ඇත්තා වූ. පුරුෂයා ගේ අර්ථ පුරුෂාර්ථ යි. ධර්ම, අර්ථ, කාම, මොක්ෂ, යන මේ චතුර්විධ පුරුෂාර්ථ යි. සම් + සිධ් + ත. = සංසිද්ධ. ශිෂ් + අ = ශෙෂ. ඉතිරිය. 'ශිෂ්' (ඉතිරි වීමෙහි) ධාතු යි. ශෙෂයක් නැත්තේ යමෙකැ දු ඒ අශෙෂ යි. අශෙෂ වූවාහු ද ඔහු මැ පුරුෂාර්ථයෝ ද ඔහු මැ නු යි. අශෙෂ- පුරුෂාර්ථයෝ යැ. සංසිද්ධ වූ අශෙෂ- පුරුෂාර්ථයෝ යමෙක්හු ගේ ද හේ සංසිද්ධාශෙෂ- පුරුෂාර්ථ යි. **විවිධ විබුධ විදග්ධා මධුර භාවානුභාව භාජනීභූත වූ—** ('විදග්ධ' යනු 'විදග්ධා' වියැ යුතු.) නානාවිධ වූ දිව්‍ය විදග්ධ,වන් ගේ මිහිරි වූ භාවයනට ද අනුභාවයනට ද පාත්‍ර වැ (ලක් වැ) විශෙෂයෙන් බොධනය (දැනීම) කරන්නාහු විබුධයෝ යැ. දෙවියනට ද පණ්ඩිතයනට ද නමි. මෙහි දෙවියෝ ගැනෙති. වි + බුධ් + අ. 'විබුධ' යනු විදග්ධා යන්නට විශෙෂණ යි. විදග්ධාවෝ නම් නිපුණ වූ (පැසුණු) ස්ත්‍රීහු යැ. 'භාව' නම් සිතෙහි පැවැති අදහස යි. එය පිටිනට හඟවන්නා වූ බැම බිදුම් නුවනග බැලුම් යනාදිය අනුභාව යි. විවිධ විබුධ විදග්ධාවෝ මේ බොධි සත්ත්වයනට ලොභ කොටැ, ඒ අදහසට ද එය හඟවන්නා වූ බැම බිදුම් ආදියට ද බෝසතුන් ලක් කෙරෙති. **ප්‍රකටීකෘත සමස්ත-මහිත-මහොත්සව-භාර වූ—** ප්‍රකට (ප්‍රකාශ) කරන ලද සියලු උසස් මහත් උත්සව සමූහයන් ඇති. සියලු උසස් ලෙස සලකන ලද මහා උත්සව සමූහයන් ප්‍රකාශ කළා වූ. ප්‍ර + කට් + අ = ප්‍රකට. 'ප්‍ර' පූර්ව 'කට්' ධාතු පැවැත්මෙහි වැටේ. ප්‍රකට + කෘත = ප්‍රකටීකෘත. මහ් + ඉ + ත = මහිත. 'මහ්' (උසස් කොටැ සැලැකීමෙහි) ධාතු යි. උද් + සු + අ = උත්සව. 'උද්' පූර්ව 'සු' ධාතු උත්සවයෙහි වැටේ. මෙහි 'භාර' යනු සමූහාර්ථ යි. භෘ + අ = භාර. 'භෘ' (පිරීමෙහි) ධාතු යි. **උදිත-සමස්ත-ලොක-හෘදුදයන වූ—** (හෘද් + උදයන) පහළ වූ සකල ලොකයා ගේ චිත්ත ප්‍රීති ඇති. උදයන රජු කෙරෙහි සකල ලොකයා ගේ චිත්ත ප්‍රීතිය උදිත (පහළ) වී යැ. 'හෘද්' යනු හෘදයයට නමෙකි. හෘ + ත් = හෘද්. 'හෘ' (හරණයෙහි) ධාතු යි. 'ත' කාරයට 'ද' කාරාදෙශ යි. උද් + ඉ + අන = උදයන. 'උද්' පූර්ව 'ඉ' ධාතු ඉහළ යෑමෙහි වැටේ. හෘදයය ඉහළ යෑම නම් සිත (ප්‍රීතියෙන්) මහත් වීම යි– පිපිම යි. **සකල යුවති ලීලාදර්ශා වූ—** (ලීලා + ආදර්ශා)

සියලු තරුණී ලීලාවනට කැමැ පතක් වූ. තරුණියන් ගේ ලීලා සියල්ලෙන් යුක්ත වූ. මෙහි ආදර්ශනාය (පෙනීම) වේ නු යි. ආදර්ශ යි. ආ + දෘශ් + අ = ආදර්ශ කැමැ පත යි. 'ආදර්ශා' යන තන්හි ස්ත්‍රී ප්‍රත්‍යය ('ආ') වී යැ. **ශත-වාර-විහත-කාර්පාස-තල්ප-ස්පර්ශා** වූ—සියක් වර පෙළූ කපු බඳු පහස් ඇති වූ. 'ශත' නම් සියය යි. වි+හන්+ත=විහත. ගසන ලද (පොළන ලද.) පුලුන් පෙළූ පමණින් මෘදු වෙයි. 'කර්පාස' නම් කපු ගස යි. කර්පාසයෙහි හට ගත්තේ (කර්පාස+අ) කාර්පාස. කපු පුලුනට නමි. 'තල්ප' යනු මෙහි ඇඳශාර්ථ යි. ස්පෘශ් + අ = ස්පර්ශ. ස්ත්‍රී ප්‍රත්‍යය වැ 'ස්පර්ශා' යනු වී. 'සුස්පර්ශා' දෙවිය ගේ ශරීර ස්පර්ශය සිය වර පෙළූ කපු පුලුනෙහි ස්පර්ශය වැන්නැ. **ප්‍රණයිනී ප්‍රණය සාකාංක්ෂ නිරීක්ෂ ලක්ෂීක්‍රියමාණ**— ('ලක්ෂ්මී' යනු මුද්‍රණ දෝෂ යි.) පෙම්වතියන් විසින් සාකාංක්ෂාකාරයෙන් යටැසින් බැලුම් හෙළීමට ලක් කරනු ලබන්නා වූ. 'නව යෞවන' යන්නට විශෙෂණ යි පෙම්වත් ගැහැනු, චුම්බනාදි අනුග්‍රහයක් පතන්නාහු, ඒ බව බසින් නො කියා, යටැසින් බැල්මෙන් හඟවති. එ බඳු බැලුමට බෝසතුන් ගේ නව යෞවනය ලකක් (කැළියක්-ඉලක්කයක්) කරනු ලැබී. නව යෞවනයෙන් හෙබි බෝසතුන් දෙස ප්‍රණයවතීන් සාකාංක්ෂා ලීලායෙන් යටැස් බැලුම් ලූ බව මෙයින් කී හ. ප්‍රණයය (ප්‍රේමය) ඇත්තී (ප්‍රණය+ඉන්+ඊ) ප්‍රණයිනී. ප්‍ර+නී+අ = ප්‍රණය. ප්‍රේමයට ද සාකාංක්ෂාවට ද මේ නමි. ලක්ෂ් + අ = ලක්ෂ. (එල්ල කිරීමෙහි) ලක්ෂ + ක්‍රියමාණ = ලක්ෂීක්‍රියමාණ. **ප්‍රතීත නව යෞවන භාජන වැ**— ප්‍රසිද්ධ වූ අභිනව තරුණ භාවයට පාත්‍ර (ස්ථාන) වැ. ප්‍රති + ඉ + ත = ප්‍රතීත. 'ප්‍ර' පූර්ව 'ඉ' ධාතුව දැනැ ගැන්මෙහි වැටේ. දන්නා ලද්දේ ප්‍රතීත යි 'ප්‍රසිද්ධ' නම් වනුයේ ලොකයෙහි දන්නා ලද්දේ යැ. **ළැගි**— ළං වූ. 'ළඟ' (ළං වීමෙහි) ධාතු 'රක්' ආදි **අත්** පද යි. ළැගේ- ළැඟෙති- ළැගිණි, ළැගි- ළැගුණු, ළැගි. **සෞමනස්‍ය**— **සොම්නස එළවන්නා** වූ—පමුණුවන්නා වූ. ඉදිරි පත් කරන්නා වූ. **හෘදයාහ්ලාද චන්ද්‍රොපම** වූ— (හෘදය+ආහ්ලාද චන්ද්‍ර+උපම) සිත සතොසා කිරීමට සඳ වැනි වූ. සඳ දුටු කලැ මිනිසුන් ගේ සිත මහත් සතුටට පැමිණේ. චඳ් + ර= චන්ද්‍ර. 'චඳ්' ධාතු ආහ්ලාදනයෙහි ද දීප්තියෙහි ද වැටේ. චන්ද්‍රයා උපමා වනුයේ යමකු හට ද හේ චන්ද්‍රොපම යි. **සමෘද්ධීන්**— සම්පත්හි කරණ කොටැ ගෙනැ. සම් + ඍධ් + ති= සමෘද්ධි. **අසදෘශ**—අසමාන. සමාන වූ දෘශාව (පෙනීම) යමක්හු ගේ ද හේ

සදෘශ සි. දෘශ් + ක්විප් + ආ= දෘශා. 'ක්විප්' යනු ප්‍රත්‍යය නාමයෙකි. එය පර කල්හි ධාතු ස්වරයට ගුණයෙක් හෝ වෘද්ධියෙක් හෝ නො වේ. 'ක්විප්' යන්න යෙදෙනුයේ මේ බව හැඟැවීමට පමණෙකි. ඒ මුත් 'ක්විප්' යන්නෙන් පද සිද්ධියට ගැනෙනක් කෙක් නැති. 'ආ' යනු ස්ත්‍රී ප්‍රත්‍යයය සි. සදෘශයකු නැත්තේ යමකුට ද හේ අසදෘශ සි. ඛදිර— කිහිරි. **පාලයා**— රක්ෂකයා. පාලනය කරනුයේ පාල සි. පාල් + අ= පාල. 'පාල්' (රක්ෂණයෙහි) ධාතු සි. **විනිද්‍ර-පුෂ්පාලඞ්කාර**— පිපුණු මලින් සැරසුණු. විනිද්‍ර වූ පුෂ්පයෝ යමකට අලඞ්කාරයෝ ද හේ විනිද්‍රපුෂ්පාලඞ්කාර සි. පිපෙනුයේ පුෂ්ප සි. පුෂ්ප් + අ. 'පුෂ්ප්' (පිපීමෙහි) ධාතු සි. **කර්ණිකාර**— කිණිහිරි. **උද්ධුර— මාර සර්ප දර්ප වාරණෛක වෛනතෙය වූ**— මහත් වූ මාර නමැති සර්පයා ගේ දර්පය (ඩඹය) වැළැක්මෙහි අසහාය ගරුඬයා (ගුරුළා) වූ. බඩ ගා යනුයේ සර්ප සි. සෘප් + අ= සර්ප. 'සෘප්' (බඩ ගා යැමෙහි) ධාතු සි. වෘ + අන= වාරණ. 'වෘ' (වැළැක්මෙහි) ධාතු සි. **දුර්දාන්ත දමනය**— දුක සේ දමනය (හික්මැවීම) කළ යුතු වූවන් දැමීම (හික්මැවීම.) දුෂ්ට වූ දාන්තය (දමනය) යමකු පිළිබඳ ද හේ දුර්දාන්ත සි. දම් + ත= දාන්ත. දම් + අන= දමන. **ද්වේෂ විෂෝච්චාටනය**— (විෂ + උච්චාටන) වෛර නමැති විෂ පහ කිරීම. ද්විෂ්+අ= ද්වේෂ. 'ද්විෂ්' (වෛරයෙහි) ධාතු සි. විෂ් + අ= විෂ. 'විෂ්' (පැතිරීමෙහි) ධාතු සි. උද්+චට් + අන= උච්චාටන. 'උද්' පූර්ව 'චට්' ධාතු පහ කිරීමෙහි වැටේ. **කුදෘෂ්ටි දිෂ්ටි සමුද්ඝාටනය**— (දෙවන 'දෘෂ්ටි' යනු මුද්‍රණ දෝෂ සි.) මිථ්‍යාදෘෂ්ටීන් ගේ ශික්ෂාවන් මනා සේ උගුළුවමින්. දෘෂ් + ති= දෘෂ්ටි. දර්ශනය සි. මෙහි දර්ශනය නම් ලොකයෙහි සත්‍යාසත්‍යයන් ධර්මාධර්මයන් විභාග කොට දක්නා පරිදි සි. බෞද්ධයෝ එක් ලෙසෙකින් දකිත්. ඒ ඔවුන් ගේ දර්ශනය සි. අන්‍යයෝ අන් ලෙසෙකින් දකිත්. ඒ ඔවුන් ගේ දර්ශනය සි. මෙයට 'ආගම' යනු ව්‍යවහාරයෙහි එන නම සි. කුත්සිත වූ (නින්දිත වූ) දෘෂ්ටීහු යමක්හු ගේ ද හේ කුදෘෂ්ටි. දිශ් + ති= දිෂ්ටි. 'දිශ්' (දැක්වීමෙහි— නියම කිරීමෙහි) ධාතු සි. 'දිෂ්ටි' යනු ශික්ෂාවට ද නියම කිරීම් ආදියට ද නම්. උද් + ඝට්+අන= උද්ඝාටන. 'ඝට්' (ගැළැපීමෙහි) ධාතු සි. 'උද්' පූර්ව 'ඝට්' ධාතු ඉගිළීමෙහි (බැඳුම් ලිහීමෙහි) වැටේ. **උද්දීපනය**— උසස් ලෙස බැබැළැවීම. උද්+දීප් + අන.

2. **අවමඞ්ගල** — අව මඟුල්. අශුභ. **සර්වලොක කාර්මණ වූ**— සකල ලොකයෙහි කර්ම දක්ෂ වූ. කර්මයෙහි කුශල (දක්ෂ

වූයේ කාමිණ යි. කමින් + අ=කාමිණ. **නිරන්තරීභූත** — අතුරු නැති වූ. පිරුණා වූ. නිරන්තර + භූත = නිරන්තරීභූත. **චිත්ත සන්තාන**— සිත් පරම්පරා (පෙළ.) **දඹ දිවට සලකුණු වූ**— ජම්බු ද්වීපයට ලක්ෂණය වූ. දඹ දිව හැඳිනැ ගැනීමේ ලකුණ වූ. ජම්බු ද්වීපය මේ නම් වූයේ හිමාලයෙහි ඇති මහ දඹ (ජම්බු) ගස නිසා යැ යෙති. **පක්**— ඵල. ගෙඩි. **දඹ රස**— දඹ පැන්. දඹ මිරිකා ගත් රස.

**3.** බුද්ධ භාවයෙහි බද්ධකක්ෂ **වැ**— බුදු බවට සැරැසී.

---

## 17. තීර්ථ්‍ය විවරණ කථා

---

**1 ප්‍රතිවිදිත සත්‍යාර්ථ ඇති**— (සත්‍ය+අර්ථ) දන්වන ලද ස්වභාවාර්ථ (සැබෑ අරුත්) ඇති. චතුස්සත්‍යය අවබෝධ කැරැවූ ප්‍රති + විද්+ඉ + ත = ප්‍රතිවිදිත. 'ප්‍රති' පූර්ව 'විද්' ධාතු දැනීමෙහි වැටේ. **තීර්ථකයන්**— මිථ්‍යාදෘෂ්ටීන්. **තෘ** + ථ= තීර්ථ. 'තෘ' (තරණයෙහි- එ තෙර වීමෙහි) ධාතු යි 'තීර්ථ' ශබ්දයෙහි අර්ථ බොහෝ යැ. හිත ශාසනය කරන්නා වූ ආගමය තීර්ථ නම් වෙයි. උපාධ්‍යායයා ද තීර්ථ නමි. පවිත්‍ර ස්ථානයට තීර්ථ නාමය යෙදේ. තීර්ථයා මැ තීර්ථක යි. බෞද්ධ සමයයෙහි තීර්ථක නාමය යෙදුණේ මිථ්‍යාදෘෂ්ටිකට යැ. **අදෘශ්‍ය**— නො දක්කැ හැකි. දෘශ්+ය= දෘශ්‍ය න දෘශ්‍ය අදෘශ්‍ය. **අදූෂ්‍ය**-- දූෂණය නො කළ හැකි. **දූෂ් + ය = දූෂ්‍ය**. න දූෂ්‍ය අදූෂ්‍ය.

**2. නානාප්‍රකාර චරිතයෙන් සාධන ලද්දා වූ**— විවිධ වූ චරිතයෙන් (හැසිරීමෙන්) සිදු කරන ලද්දා වූ (ලැබුවා වූ.) මේ කියැවෙන බන්ධු ජනයා ලැබීම ප්‍රඥාවෙන් කැරිණ. ඒ ප්‍රඥාව ද නානාවිධ චරිතයෙන් (ඇති) කරන ලද්දේ යැ. ඒ ඒ තන්හි හැසිර, ඒ ඒ කටයුත්තෙහි යෙදී, ලැබූ ප්‍රඥාව ඉතා උසස් යැ. නානාවිධ චරිතය නිසා මැ හිතකාරුවී වූ මනුෂ්‍යයෝ බන්ධුත්වයට පැමිණෙති. එ හෙයින් කියන ලද භර්තෘහරින් විසින්--

දාක්ෂිණ්‍යං ස්වජනෙ දයා පරිජනෙ ශාඨ්‍යං සදා දුර්ජනෙ
ප්‍රීතිඃ සාධුජනෙ නයො නෘපජනෙ විද්වජ්ජනෙ චාර්ජවම්
ශෞර්යං ශත්‍රුජනෙ ක්ෂමා ගුරුජනෙ නාරීජනෙ ධූර්තතා
යෙ චෛවං පුරුෂාඃ කලාසු කුශලාස්තෙෂ්වෙව ලොකස්ථිතිඃ

ස්වකීය ජනයා කෙරෙහි අනුකූල බව යැ. පරිජනයා කෙරෙහි දයාව යැ. දුර්ජනයා කෙරෙහි ශඨ බව යැ. සජ්ජනයා

කෙරෙහි ප්‍රීතිය යැ. නරපාල ජනයා කෙරෙහි නීතිය යැ. පණ්ඩිත ජනයා කෙරෙහි ඍජු බව යැ. ශත්‍රු ජනයා කෙරෙහි ශූර භාවය යැ. ගුරු ජනයා කෙරෙහි ඉවැසීම යැ. නාරී ජනයා කෙරෙහි ධූර්ත භාවය යැ. යම් පුරුෂ කෙනෙකු තුමූ මෙ සේ කලාවන්හි කුශලයෝ ද ලෝකය පැවැත්ම ඔවුන් කෙරෙහි මැ වෙයි. **ප්‍රඥා ලබ්ධ බන්ධු ජන ඇති**— ප්‍රඥයෙන් ලබන ලද බන්ධු ජනයා ඇත්තා වූ. ස්නෙහාදීන් සිත බඳී නු යි බන්ධු යි. බන්ධ්+උ= බන්ධු. **නිරත්‍යය වූ**— ඉක්මැවීමක් නැත්තා වූ. අති+ඉ+අ= අත්‍යය. 'අති' පූර්ව 'ඉ' ධාතු ඉක්මැ යැමෙහි වැටේ. අත්‍යයෙන් නික්මුත් වූයේ නිරත්‍යය යි. මේ කියැවෙන ස්වාමි සම්බන්ධයා ගේ අතික්‍රමණයෙක් නැති. ඒ සම්බන්ධය නො බිඳී සිටි සේ මැ සිටියැ යුතු යැ. **ලෝකාර්ථ සංහිත වූ**— (ලෝක+අර්ථ) ලෝකාභිවෘද්ධිය හා සංධානය (එක් කිරීම – බැඳීම) කරන ලද්දා වූ. මේ ස්වාමි සම්බන්ධය බැඳී පවත්නේ ලෝකාර්ථය පිණිස යැ. සම්+ධා+ත= සංහිත. **ස්වාමි සම්බන්ධ**— ස්වාමියා වශයෙන් බැඳීම. රජ ලෝකයාට ස්වාමි වෙයි. ලෝකයාට ඔහු ගේ සම්බන්ධය ස්වාමි සම්බන්ධය යි. **ප්‍රත්‍යාඛ්‍යාත වූ**— පහ කරන ලද්දා වූ. ප්‍රති + ආ+ඛ්‍යා + ත. **දුර්නීති ශබ්ද**— දුෂ්ට (නපුරු) නීතියෙහි ශබ්ද. එ රජු ගේ රජෙහි නපුරු නීතියක් පිළිබඳ ශබ්දයකුදු නැති. **කීර්ති ප්‍රබන්ධ**— කීර්ති සන්තාන. ප්‍රබන්ධ- නො කඩ- වූයේ ප්‍රබන්ධ යි. **වෘෂභ- ස්කන්ධ වූ**— වෘෂභයකු ගේ ස්කන්ධ මෙන් පිරුණා වූ ස්කන්ධ ඇත්තා වූ. 'ස්කන්ධ' නම් උර හිස් යැ. **සෞන්දර්ය- ශ්‍රී- නිවාස- කුශල- පද්ම- සමාත්ම වූ**— සුන්දර භාව (සංඛ්‍යාත) ශ්‍රීයට (ලක්ෂ්මියට) වාස ස්ථාන වූ කල්‍යාණ වූ පියුමක් බඳු ශරීර ඇති. සිරි කත වසන්නේයි පියුමෙකැ යැ. සුන්දර භාවය සිරි කත නම් පද්මා දේවිය ගේ ආත්මය (ශරීරය) කල්‍යාණ වූ පද්මයෙකි. 'කුශල' යන්නෙහි එක් අර්ථයෙක් නම් 'කල්‍යාණ' (ශුභ) යනු යි. **විනිද්‍ර- මුඛ- පද්ම වූ**— පිපුණු මුහුණු නමැති පියුම ඇති. **නව යෞවන සුන්දරතර**— අභිනව යෞවනයෙන් අතිශයින් සුන්දර වූ. **ස්නෙහ මන්දිර වූ**— ස්නෙහයට මන්දිර වූ. ස්නෙහයට නිවාස වූ **ප්‍රෞඪාවස්ථාවට**— (ප්‍රෞඪ + අවස්ථාවට) ස්වභාවයෙන් බලවත් අවස්ථාවට. 'ප්‍රෞඪ' යනු 'ස්වභාව බලවත්' යන අර්ථයෙහි ද වැටේ. **සර්වතොභද්‍ර වූ**— සියලු අතින් සුන්දර වූ. 'සර්වතස්' යනු 'සියලු අතින්' යන අර්ථයෙහි අව්‍යය යි. 'භද්‍ර' යනු සුන්දර- මඞ්ගල- යනාදි අර්ථ ඇත්තේ යැ. **නාසන කුමුද**

**විකාස නව චන්ද්‍රිකා ප්‍රවාහ වූ**— ඇස් නමැති කුමුදු පිපිවම අලුත් සඳ රැස් වතුරු වූ. **පරමානන්ද මූර්ති වූ**— (පරම+ ආනන්ද) ඉතා මහත් සන්තොෂ ශරීරයක් වූ. පරම සන්තොෂය මැ ශරීර භාවයට පැමිණියා වැනි වූ. **ප්‍රවීර පුරුෂාකීර්ණ වූ**— (පුරුෂ+ආකීර්ණ) අතිශයින් වීර වූ පුරුෂයන් විසින් ගැවැසී ගත්තා වූ. **අවිරල කුසුම කරාල වූ**— නො මඳ වූ (බොහෝ වූ) මලින් විෂම වූ. න විරල අවිරල 'විරල' යනු 'ඝන' යන අර්ථයෙහි වෙයි. මිනිසුන් දෙ තුන් දහසක් සිටිය හැකි පෙදෙසෙක දෙ තුන් දෙනෙක් වෙත් නම් එහි මිනිස්සු විරලයෝ යැ. තන්හි තන්හි බොහෝ මල් පිපී සෙසු තැන් හා අසම වැ සිටුනා හෙයින් කුසුම කරාල වෙයි. **සරල**— හොර ගස. **කලි නාශන**— ('නාසක' යනු මුද්‍රණ දොෂ යි.) පව් නසන. **අසන**— පියා ගස. පලු ගස. **මාන ප්‍රතාන ලතා ග්‍රන්ථි භෙදනයෙහි**— මානය (ගර්වය) නමැති පැතිරෙන්නා වූ ලතාවන් ගේ ගැට බිඳීමෙහි. පැතිරී යන්නා වූ (තිවෙන්නා වූ) වැල් එකින් එක එති ගැට ගැසෙයි. ඒ ගැටී ලිහී යන්නට සැලැස්සීම 'ලතා ග්‍රන්ථි භෙද' නම්. **ප්‍රබල ප්‍රභඤ්ජන වූ**— ඉතා බලවත් වූ මහා වාතයක් වූ. වෘක්ෂාදීන් ප්‍රභඤ්ජනය (බිඳැ හෙළීම) කරනුයෙන් මහා වාතය ප්‍රභඤ්ජන නම්. ප්‍ර + භංජ් + අන. 'භංජ්' (බිඳීමෙහි) ධාතු යි. **අනාරුණ කාරුණ්‍ය ධිෂණ්‍ය විෂයීකෘත සමස්ත ප්‍රාණි මණ්ඩල ඥෙය මණ්ඩල ඇති වූ**— ('ධිෂණ' යනු මුද්‍රණ දොෂ යි. බාලු නුවූ (ප්‍රෞඪ වූ) කාරුණාවට ද ප්‍රඥාවට ද ගොචර කරන ලද සකල ප්‍රාණි චක්‍රය (සමූහය) ද ඥෙය චක්‍රය ද ඇති වූ. කාරුණාවට ගොචර කරන ලද සකල ප්‍රාණි චක්‍රය ද, ප්‍රඥාවට ගොචර කරන ලද සකල ඥෙය චක්‍රය ද ඇති වූ. 'සියලු සතුන් කෙරෙහි කාරුණාව පතුරුවා, සියලු දත යුතු දැ දැනැ' යැ යු සේ යි. මෙ මැ කියැවිණ, ගුත්තිල දනෙහි—

"කුලුණු සව් ලෙව් වෙ ත
නුවණ සව් නේ පදරු ත
දහම් සත සිත පි ත
පැවැත්වී අප මුනිඳු දිය තෙ ත"—යි.

"කරුණා විය සන්තතසු පඤ්ඤා යස්ස මහෙසිනො
ඤෙය්‍යය ධම්මෙසු සබ්බෙසු පවත්තිත්ථ යථාරුචි"—

යනු බුද්ධඝොෂ වචන යි. එයින් දකි නු යි ප්‍රඥා ධිෂණා නම්. දෘශ්+ අන+ආ. ධිෂණා. 'දෘශ්' (දැකීමෙහි) ධාතුවට 'ධිෂ්' යනු ආදෙශ

වෙයි. විෂය+කෘත=විෂයීකෘත. යම් කිසිවෙකු ශක්තිය යම් පෙදෙසක් පුරා පැතිර සිටි නම්, ඒ පෙදෙස්හි වූ තාක් දෑ ඒ ශක්තියට ඇතුළත් නම්, එ පෙදෙස එයට විෂය සි. රජුට ඔහු ගේ රාජ්‍යය විෂය වන්නා මෙනි. සකල ප්‍රාණී මණ්ඩලය බුදුන් ගේ කරුණාවට ඇතුළති. ඒ කරුණාවට අසු නො වූ එක ද ප්‍රාණියෙක් නො වී යැ. එ හෙයින් සකල ප්‍රාණි මණ්ඩලය බුද්ධ කරුණාවට විෂයීකෘත යැ. ප්‍රකර්ෂයෙන් අනනය (ජීවත් වීම) කරනුයේ ප්‍රාණ සි. ප්‍ර+අන්+අ= ප්‍රාණ. 'අන්' (ජීවත් වීමෙහි) ධාතු සි. ප්‍රාණය ඇත්තේ (ප්‍රාණ+ඉන්) ප්‍රාණීන්. **ඤාණාභිෂෙක**— (ඤාණ + අභිෂෙක) නුවණින් (නුවණ නමැති දියෙන්) අභිෂෙචනය. (ධර්ම රාජ්‍යයෙහි) රජ බව. **ඇසෑ ඇසෑ ඇඳි ගියක්හු සේ**— 'සියලු ඇසට පෙනිපෙනී' යැ සූ සේ සි. **බැසෑ බැසෑ සැරැහි**— නැවැත නැවැත (අභිනව වැ) සජ්ජිත වී (පිළියෙළ වී.)

3. **විඥාත**— විශෙෂයෙන් දන්නා ලද. අ ති ප්‍ර සි ද්ධ. **නෘ ලොක පාරිජාත** වූ— මනුෂ්‍ය ලොකයෙහි පර සතු රුක වූ. පරසතු රුක දිව්‍ය වෘක්ෂ පසින් එකෙකි. එ හෙයින් සිතූ පැතූ දෑ දෙන්නේ යැ. බෝ සතුන් මනු ලොවට පරසතු රුක වූ හ සි කීමෙන් ඔවුන් ගේ මහා ත්‍යාගිත්වය හැඟැවිණ. **විචිත්‍රාග්‍රාමිකාපදාන ජාත** වූ— (විචිත්‍ර + අග්‍රාමික + අපදාන) විසිතුරු වූ ශිෂ්ට වූ පිරිසුදු චරිතයෙන් උපන්නා වූ (ඇති වූ.) 'උභය පක්ෂයෙන්' යන්නට විශෙෂණ සි. විශෙෂයෙන් චිත්‍ර වූයේ විචිත්‍ර සි. වි + චිත්‍ර් + අ = විචිත්‍ර. 'චිත්‍ර්' (අද්භූතයෙහි) ධා තු සි. ඒ අපදානයන් ආශ්චර්‍ය වූ බව හැඟැවීමට මේ යෙදිණ. ග්‍රාමයට (ගමට) අයත් වූයේ ග්‍රාමික සි. 'අශිෂ්ට' යනු අර්ථ සි. නාගරිකයෝ ශිෂ්ටයෝ යැ. ග්‍රාමිකයෝ සාමාන්‍යයෙන් අශිෂ්ටයෝ යැ. න ග්‍රාමික අග්‍රාමික. අප + දෛ + අන = අපදාන. 'දෛ' (පිරිසුදු කිරීමෙහි) ධාතු සි. පිරිසුදු වූ චරිතය 'අපදාන' නමි. 'අවදාන' යනු ද සමානාර්ථ සි. බෝ සතුන් ගේ පිරිසුදු චරිතයන් වන හෙයින් ජාතක කථාවනට 'බොධිසත්ත්වාපදාන' යනු නම් වෙයි. ඇතැම් කුලයෝ ඇතැමුන් ගේ ග්‍රාමික චරිතයන් කරණ කොටැ ගෙනැ අපිරිසුදු වෙති. මේ බෝ සතුන් ගේ මවු පිය කුලයෝ එ සේ අපිරිසුදු නුවූ හ. පිතෘ පිතාමහ ප්‍රපිතාමහාදි සියල්ලෝ මැ විචිත්‍ර අග්‍රාමික අපදාන ඇති වූ හ. එ හෙයින් ඒ දෙපක්ෂයෝ විචිත්‍ර අග්‍රාමික අපදාන ජාතයෝ යැ. **උභය පක්ෂයෙන්**— (මවු පිය) දෙ පසින්. **සුජාත**— මනා සේ උපන්. **ශ්‍රෙෂ්ඨ.**

**සාහිත්‍යයෙන්**— සහිත බැවින්. යුක්ත භාවයෙන්. **වල්ලි**— වනලයකි. **පාද සේවා**— පාද සෙවනය. පාදයට කළ යුතු මෙහෙ කිරීම. පා වැඳීම. යටත් වැ සිටැ මෙහෙ කිරීම ද 'පාද සෙවා' නම්. සේව් + ආ = සේවා. **කල්‍යාණ- කීර්ති**— ශුභ වූ යසස් ඇති. **ධර්‍ම- මූර්ති**— ධර්‍මය මැ ශරීර කොටැ ඇති. **තමා සේ**— මා සඳු. **දිව උයන් සතරට**— දිව්‍යෝද්‍යාන (දෙවියන් ගේ උයන්) සතරට. චිත්‍ර ලතා, පාරුෂක, නන්‍දන, මිශ්‍රක, යන මේ යැ දිව උයන් සතර. **මල් බිඳැ**— මල් නෙළා, **සමුග්ගෙක්හි**— සමුද්ගයෙක්හි. කරඬුවෙකැ. **චිත්‍ර වින්‍යාස මනොහර කුසුම පූජා**— විවිධ වූ වින්‍යාසයෙන් සිත් කලු වූ මල් පූජා. 'චිත්‍ර' යනු 'විවිධ' යන අරුත්හි දු වැටේ. වි + නි + අස් + අ = වින්‍යාස. 'අස්' (දැමීමෙහි) ධාතු යි. මෙහි වින්‍යාස නම් පිළිවෙළකට බහා තැබීම යි. දහසුදු මල් පුදන නුවණැත්තෝ මලස්නෙහි විවිධ වූ (චක්‍ර ධවජ ආදී) රූපයන් ඇති වන සේ පුෂ්ප වින්‍යාසය කෙරෙති. **පද්මරාග**— රතු මැණික්. පදමයා ගේ රාගය (වර්‍ණය) වනුයේ යමෙක්හි ද ඒ පදමරාග යි. **පත්**— පත්‍ර. මල් පෙති **කර්‍ණිකා**— කෙමි. **සුරභි කෙසර මනොහර**— සුවඳ (ඇති) කෙසුරින් (රේණුයෙන්) සිත් කලු. **වඩා**— නඟා. පමුණුවා. **පෙලෙන්**— පල+එන්= පළලන් = පෙලෙන්.

**5. වජ්‍ර ඥනොදයෙන්**— (ඥන+උදය) ඉතා තියුණු වූ නුවණ පහළ වීමෙන්. 'වජ්‍රය' මෙන් තියුණු වූ නුවණ වජ්‍ර ඥන යි. මැණික් ආදීය විදිනා විදුරු දියමන්ති) ශුචිය (කටුව) වජ්‍ර නම්. **වජ්‍ර ප්‍රාකාරයෙකැ**— ඉතා තද පවුරෙකැ. Adamantine wall.

## 18. පූෂ්‍ය විවරණ කථා

**1. අපගත**— පහ වැ ගියා. අප + ගම් + ත. **මනඃ කාලුෂ්‍ය**— (මනස් + කාලුෂ්‍ය) සිතෙහි කිලුටු. කෙලෙස්. පාපයට 'කලුෂ' යනු නමෙකි. කලුෂයා ගේ භාවය (කලුෂ + ය) කාලුෂ්‍ය යි. **අනුලොම**— අනුකූල. සපක්‍ෂ. **විලොම**— විරුද්ධ. විපක්‍ෂ. **සමස්ත ලොකාභි සිද්ධි පූෂ්‍ය වූ**— (සපක්‍ෂ විපක්‍ෂ) සියලු ලොකයාට හිත සිදු කිරීමෙන් පොෂණය (වර්ධනය) කළ යුතු වූ. ඒ බුදුන් පොෂණය කළ යුතු වූයේ ආහාරයෙන් නො වේ, සියලු ලොකයාට අභිය (හිත) සිදු කිරීමෙනි. එ සේ හිත සිදු කිරීමෙන් ඇති වන ප්‍රීතිය

ආහාරයට ද වඩා ශරීර පොෂණය කරන්නේ යැ. **නිර්ජිත වූ අරාති සේනා**— නිඃශෙෂ කොටැ දිනන ලද සතුරු සේනා. **සව බාහු පාශ නමිත නව යුවති ජන ප්‍රෞඪ ගාඪාශ්ලෙෂ රසික වූ අවස්ථාවට**— ස්වකීය බාහු බන්ධනයෙන් නමන ලද අභිනව තරුණී ජනයා ගේ නිපුණ (දක්ෂ) වූ තද වූ වැලැඳැ ගැනීමෙහි ලොල් වූ අවස්ථාවට. තරුණ බවට. බෝ සත්තු ස්වකීය හස්ත බන්ධනයෙන් බැඳැ (දෑත් ගෙල වටා දමා) නව යුවති ජනයන් නමති. එ කලැ ඒ යුවති ජනයෝ ස්වකීය කොමල හස්තයන් බෝසතුන් ගේ බඳ වටා වෙළා දක්ෂ ලෙස තද කොටැ බදා ගනිති. බෝ සත්තු එ බදු බඳ ගැන්මෙහි ලොලයෝ යැ. එයින් බාධනය කැරේ නු සි. හස්තය 'බාහු' නම්. බාධ් + උ = බාහු. 'ධ' කාරයට 'හ' කාරාදෙශ සි. පශනය (බාධනය - බන්ධනය) එයින් කැරේ නු සි 'පාශ' නම්. පශ් + අ = පාශ. 'පශ්' ධාතු බාධනයෙහි ද බන්ධනයෙහි ද වැටේ. මුව ආදීන් බඳනට ඇටැවෙන මල පාශ නම් දැන පාශයක් මෙන් යෙදෙන කලැ ඒ බාහු පාශ සි. නම් + ඉ+ත = නමිත. ප්‍ර + වහ් + ත = ප්‍ර + උහ් + ත = ප්‍ර+උඪ් + ඪ = ප්‍ර + ඌඪ = ප්‍රෞඪ. 'ප්‍ර' පූර්ව 'වහ්' ධාතු ඉදිරියට ගෙනැ යැමෙහි වැටේ. කාරණාකාරණාවබොධාදි වශයෙන් ඉදිරියට ගෙනැ යන ලද්දේ - විදග්ධ (නිපුණ) වූයේ - ප්‍රෞඪ සි. ගාහ්+ත = ගාඪ්+ත = ගාඪ්+ඪ = ගාඪ' 'ගාහ්' ධාතු (දියට මෙන්) බැසැ ගැනීමෙහි වැටේ. ආ + ශ්ලිෂ්+අ = ආශ්ලෙෂ. 'ශ්ලිෂ්' (ආලිඞ්ගනයෙහි) ධාතු සි. **අකෘශ වූ**— කෘශ (සිහින්) නු වූ. කෘශ් + අ = කෘශ. 'කෘශ්' (සිහින් කිරීමෙහි) ධාතු සි. න කෘශ අකෘශ. **ශෘඞ්ගාර ශයන සහාය වැ**— රති ශයනයෙහි (ඇඳෙහි) සහචර වැ (එක් වැ.) ශී+අන = ශයන. 'ශී' (ශයනයෙහි - වැතිරීමෙහි) ධාතු සි. සහ පැමිණෙනුයේ සහාය සි. සහ + ඉ+අ = සහාය **යානයෙන්**— වාහනයෙන්. එයින් යේ නු සි යාන සි. යා+අන. **උද්ධත සින්ධුර වර ස්කන්ධ සංඛ සමාරොහණ ප්‍රාවීණ්‍යයෙන්**— උත්තුඞ්ග (ඉතා උස්) වූ හස්ති රාජයා ගේ ග්‍රීවාවට නැගීමේ දක්ෂ භාවයෙන්. උද්+හන් + ත = උද්ධත. උත්තුඞ්ග, උද්ධුර, ගර්විත, දරුණ, කුපිත, යනාදි අනෙකාර්ථයෙහි මේ යෙදෙයි. සම් + ආ + රුහ් + අන = සමාරොහණ. 'රුහ්' (නැගීමෙහි) ධාතු සි **වාරණාධිරූඪ**— (වාරණ+අධි...) ඇතුට නැගුණු. අධි+රුහ්+ත = අධි + රුඪ් + ත = අධි + රුඪ් + ඪ = අධිරූඪ. 'ඪ' පර කලැ 'ඪ' ලොප් වැ පූර්ව ස්වරය දීර්ඝ වෙයි.

**පුරන්දර සෞන්දර්‍ය**— ශක්‍රයා ගේ සුන්දර භාවය. බෝ සත්තු උස් ඇතු පිටැ නැඟැ, එරාවණ ඇතු නැඟි පුරන්දරු ගේ ආකාරය ප්‍රකට කළ හ. **අභිවෘද්ධ**— අතිශයින් වැඩුණු. අභි+වෘධ් + ත. **සෞන්දර්‍ය ශ්‍රී** - සුන්දර භාවයා ගේ ශොභාව. **සකල ලොක පාලක**—සියලු ලොව රක්නා වූ. බුදු වන්තට වහල් වැ සිටි හෙයිනි. **ආමලක**— ඇඹුල. නෙල්ලි. **මාර චක්‍ර වික්‍රම විඝාතන කෙළි විදග්ධ වූ**— මර සෙනඟ ගේ වික්‍රමය නැළැඹීමේ ක්‍රීඩායෙහි නිපුණ වූ. **ප්‍රත්‍යාඛ්‍යාත වූ සමස්ත වස්තු විස්තාර යාථාතථ්‍ය විරොධනෛක රසික මොහ ප්‍රබන්ධ සම්බන්ධ ඇති වූ**— ('යථාතථ්‍ය' යනු මුද්‍රණ දොෂ සි.) (විරොධන + එක ) පහ කරන ලද සියලු වස්තු සන්තානයා ගේ සත්‍ය ස්වභාවයට විරුද්ධ වීම් එක මැ සාරය කොටැ ඇත්තා වූ අවිද්‍යා සන්තානයා ගේ (පරම්පරාව ගේ) සම්බන්ධය ඇති වූ. "මොහය (අවිද්‍යාව) නසා, සර්වඥතාඥානය ලැබූ" යනු මේ කී සැටි යැ. මොහයා ගේ එක මැ රසය (ස්වභාවය) නම්, යම් කිසිවෙකු ඇත්තා වූ ස්වභාවය විරුද්ධ කොටැ දැක්වීම සි. දුක සැපය කොටැ දැක්වීම යාථාතථ්‍ය විරොධනයෙකි. බුදුහු එ බඳු වූ මොහයා ගේ සම්බන්ධය ප්‍රත්‍යාඛ්‍යානය කළ හ. (පහ කළ හ ) එකෙකු හෝ දෙකෙකු හෝ සත්‍ය ස්වභාවය විරොධ කොටැ දක්වන්නා වූ මොහය පහ කළාහු නො වෙති. සකල වස්තු විෂයයෙහි එ බඳු වූ මොහය පහ කළ හ. සකල ඥෙය මණ්ඩලයා ගේ යාථාතථ්‍යය නිඃශෙෂ කොටැ අවබොධ කළ හ. රහල් වදතින්-

"තතු මුළු ලෙන් මඬ ල
සෙයින් දුනැ ගත් සේකැ අතැඹු ල"

යම් සේ ද එසේ වූයේ 'යථාතථ' නම් වේ. 'යථා' යනු 'යම් සේ' යන අර්ථයෙහි ද 'තථා' යනු 'එ සේ' යන අර්ථයෙහි ද වැටේ. 'යථාතථ' නම් සත්‍යය සි. යථාතථයා ගේ භාවය යාථාතථ්‍ය සි. වි + රුධ් + අන = විරොධන. 'රුධ්' (වැළැක්මෙහි) ධාතු සි. **සකල විනෙය වර්ගයා**— සියලු විනෙය (හික්මැවිය යුතු) ජන සමූහයා. **නිසර්ග මධුර තරණයෙන්**— ස්වභාවයෙන් මැ මිහිරි වූ එතෙර කිරීමෙන්. නි + සෘජ් + අ = නිසර්ග. 'සෘජ්' ධාතු නිර්මාණයෙහි වැටේ. 'ලොකය බ්‍රහ්මයා ගේ සර්ගයෙකැ' යන තන්හි 'සර්ග' නම් මැවීම යි. උත්පත්තියෙහි දී (ස්වභාව වශයෙන්) ලැබෙනුයේ නිසර්ග සි. මෙහි 'තරණ' නම් දුකින් එතෙර කිරීම සි.

**2. සකලාරාති දමනයෙන්**— (සකල + අරාති) සියලු සතුරන් දමීමෙන් (හික්මැවීමෙන්) **යථාර්ථ වූ නාම ඇති**— අන්වර්ථ වූ නම් ඇති. ඒ රජ සියලු සතුරන් දමී යැ. ඔහු ගේ නම වූ 'අරින්දම' යන්නෙහි අර්ථ නම් 'සතුරන් දමනය කරන්නා වූ' යනු යැ. එ හෙයින් ඔහු ගේ නම යථාර්ථ යැ. අරි+දම් = අරි + න් + දම්+අ = අරින්දම. මධ්‍යයෙහි 'න'කාරාගමය වෙයි. **කප හට ගන්නා මෙඝයක්**— කල්පය ඇති වන්නා වූ වැස්සක්. ලොකය නැසී ගොස් යළි හට ගන්නා කලැ මහ වැස්සක් වැසැ මුළු ආකාශ කුහරය දියෙන් පිරී යේ ල. **දාන වර්ෂී**— දන් වැසි. වැස්සක් මෙන් දෙන දන්. **නිස්සඞ්ග වූ**— ඇලීමක් නැති වූ. සංජ් + අ = සඞ්ග. 'සංජ්' (ඇලීමෙහි) ධාතු සි. සඞ්ගයෙන් පහ වූයේ නිස්සඞ්ග සි.

**4. ශාසන ප්‍රතිපත්ති**— සසුන් පිළිවෙත්. අනුශාසනය (නියමය) පිළිපැදීම. ප්‍රති + පද් + ති = ප්‍රතිපත්ති. 'ප්‍රති' පූර්ව 'පද්' ධාතු (පිළිපැදීමෙහි) වැටේ.

## 19. විදර්ශි විවරණ කථා

**1. අශොෂ්‍ය**— නො වියැළිය හැකි. ශුෂ් + ය = ශොෂ්‍ය. න ශොෂ්‍ය අශොෂ්‍ය. **කරුණා ප්‍රවාහ**— කරුණා වතුරු. **භූත— අතීත.** වූයේ භූත සි. **භවිෂ්‍යත්**— අනාගත. වන්නට සිටියේ භවිෂ්‍යත් යැ. **වර්තමාන**— (දැන්) පවත්නා. වෘත් + අ + මාන = වර්තමාන. **සමස්ත භුවන ත්‍රය බන්ධුර**— සියලු ලොක තුනට රම්‍ය **අක්ෂීණබන්ධුමත්**— නො පිරිහුණා වූ නෑයන් ඇති. **ප්‍රබුද්ධ- වදන- භානු- බන්ධුමතී**— පිපියා වූ මුහුණ නමැති පියුම ඇත්තී වූ. භානුහු ගේ (සූර්යයා ගේ) බන්ධු භානුබන්ධු යැ. පද්මය සූර්ය රශ්මියෙන් පුබුදුනේ යැ, සූර්යයාට ප්‍රිය යැ. එ හෙයින් ඒ සූර්යයා ගේ බන්ධු යැ. භානුබන්ධු ඇත්තී භානුබන්ධුමතී. **යුවති ජන නයනොත්පලාස්පද**— (නයන + උත්පල+ආස්පද) තරුණී ජනයා ගේ ඇස් නමැති උපුලට ස්ථාන වූ. තරුණියන් ගේ නයන නමැති උත්පලයෝ **බෝසතුන් ගේ** වක්ෂස්හි පිහිටිති. එ හෙයින් ඒ වක්ෂස නයනොත්පලයනට ආස්පද යැ. තරුණියන් එ දෙස මැ බලන බව කී සේ යැ. උද් + පල් + අ = උත්පල. 'පල්' (ගමන්හි) ධාතු සි. ජලයෙන් ඉහළට පලනුයේ (යනුයේ) උත්පල සි. මහනෙල් යැ. ආ + පද් + අ = ආස්පද. උපසර්ග ධාතු මධ්‍යයෙහි 'ස'කාරාගම යි. 'ආ' පූර්ව 'පද්' ධාතු

ලංවීමෙහි වැටේ. **තරුණ සවණ්ණ ඵලකායමාන වූ**— අලුත් රන් පුවරුවක් වැනි වූ. ශොභන වූ අණ්ණය (වණ්ණය) යමෙක්හි ද ඒ (සු + අණ්ණ) සවණ්ණ සි. 'සුවණ්ණ' යනු ද නමි. පළන ලද්දේ ඵල සි. ඵල් + අ. 'ඵල්' (පැළීමෙහි) ධාතු සි. ඵලය මැ 'ඵලක' සි. 'ක' යනු ස්වාර්ථ සි. 'ආයමාන' යනු නාමාඛ්‍යාතයෙහි එක් වූ කලැ එ වැනි යන අර්ථය දෙයි. රාජායමාන- සිංහායමාන- යනාදිය නිදර්ශන සි. **ප්‍රේම සීමාවිලඞ්ඝ්‍ය වූ**— (සීමා + අවිලඞ්ඝ්‍ය) ප්‍රේමයේ සීමාව කරණ කොටැ ගෙනැ නො ඉක්මැවියැ හැකි වූ. ඒ නාටක ස්ත්‍රීන් ගේ ප්‍රේම සීමාව කො තරම් විශාල වුව ද මේ පාත්‍රයට අධික නො වේ. කො තරම් ප්‍රේමය ඇති වුව ද ඒ සියල්ල ධරා සිටියැ හැකි පාත්‍රයෙකි. ප්‍රියයා ගේ භාවය 'ප්‍රේමන්' නමි. ප්‍රිය + ඉමන් = ප්‍ර + ඉමන් = ප්‍රේමන්. 'ප්‍රිය' යන්නට 'ප්‍ර' ආදේශ සි. භාවයෙහි 'ඉමන්' ප්‍රත්‍යය සි. සි + මන් = සීමන්. 'සි' (බැඳීමෙහි- ඇතුළු කිරීමෙහි) ධාතු සි. 'ඉ' කාරය දීර්ඝ වෙයි. සීමන් + ආ = සීමා. 'ආ' යනු ස්ත්‍රී ප්‍රත්‍යය සි. 'සීමන්' යන්නෙහි අන්ත්‍යය ලොප් වෙයි. වි + ලංඝ් + ය = විලඞ්ඝ්‍ය. 'ලංඝ්' (ඉක්මැවීමෙහි) ධාතු සි. ඉක්මැවියැ හැක්කේ විලඞ්ඝ්‍ය සි න විලඞ්ඝ්‍ය අවිලඞ්ඝ්‍ය. **ශෘඞ්ගාර සුධා නිෂේක පාත්‍ර වැ**— රාග නමැති අමෘතය වත්කිරීමට භාජන වැ. ශෘඞ්ගයට යේ නු සි ශෘඞ්ගාර සි. ශෘඞ්ග + සෘ + අ = ශෘඞ්ගාර. 'ශෘඞ්ග' යනු කාමයා ගේ අධික භාවයට නමි. 'සෘ' (යෑමෙහි) ධාතු සි. මනා සේ බොනු ලැබේ නු සි සුධා. සු + ධෙ + අ + ආ = සුධා. 'ධෙ' (බීමෙහි) ධාතු සි. මෙයින් බොත් නු සි පාත්‍ර සි. පා + ත්‍ර = පාත්‍ර. 'පා' බීමෙහි ධාතු සි. **නිර්ව්‍යූඪ ප්‍රේම බන්ධන ඇති**— වැඩුණා වූ පෙම් බැඳුම් ඇති. නිර් + වි + වහ් + ත = නිර් + වි + උහ් + ත = නිර් + වි + උඪ් + ඪ = නිර් + වි + ඌඪ = නිර්ව්‍යූඪ 'නිර්' 'වි' පූර්ව 'වහ්' ධාතු සම්පූර්ණ වීමෙහි- වර්ධනයෙහි- වැටේ. **සෛන්ධවයන්**— අශ්වයන්. සින්ධුව අසලැ වූයේ (උපන්නේ) සෛන්ධව සි. සින්ධු + අ = සෛන්ධව. සින්ධු නම් මුහුද සි. එයට සමීප වූ සින්ධු දේශයට අයත් අරාබි (අරාබි) දේශයෙහි උපන් හෙයින් සෛන්ධව නාමය යෙදේ සි. **සකමල්**— මල් සහිත. **බහල කුමුල මෝහ පටල පාටන සහාය වූ**— බොහෝ වූ ආකුල වූ අවිද්‍යා වෙෂ්ටනය (වෙළීම) පහ කිරීමට වහල් වූ. බහ් + අල = බහල. 'බහ්' (වෘද්ධියෙහි) ධාතු සි. කු + මූල = කුමූල. 'කු' (පිරීමෙහි) ධාතු සි.

පට්+අල = පටල. 'පට්' (ගෙවීමෙහි- වැසීමෙහි) ධාතු යි. පට්+ අන = පාටන. 'පට්' (පැළීමෙහි) ධාතු යි. **පාටල**— පළොල්. **ඝෝරතර**— ('ඝෝර තාර' යනු මුද්‍රණ දෝෂ යි) අතිශයින් භයඞ්කර. ඝුර් + අ = ඝෝර. 'ඝුර්' (බියකරු වීමෙහි) ධාතු යි. **හුංකාර විකාර නිකර දූරීකරණයෙන්**— හුංකාර විකාර සමූහය දුරු කිරීමෙන්. **අනූන**— නො අඩු. ඌන් + අ = ඌන. 'ඌන්' (පරිහාණියෙහි) ධාතු යි. න ඌන අනූන. **පාණ්ඩිත්‍යයට**— පණ්ඩිත බවට. පණ්ඩිතයා ගේ භාවය (පණ්ඩිත + ය) පාණ්ඩිත්‍ය යි.

## 20. ශිඛි විවරණ කථා

**1. ධර්මාධර්ම විභාග නිදර්ශි** වූ— ධර්ම යැ අධර්ම යැ යි බෙදීම දක්වන්නා වූ. **ක්ලේශ ඛණ්ඩන දහන** ශිඛි වූ— කෙලෙස් බැඳුම් දවන ගින්න වූ. ශිඛා (සිළු) ඇතියේ (ශිඛා + ඉන්) ශිඛින්. ගිනි ඇවිළෙන කලැ සිළු නැඟෙයි. එ හෙයින් ගින්න 'ශිඛි' නම් වේ. **ඥානාතිරේක ස්වයම්භූ** වූ— (ඥාන + අතිරේක) ඥානයා ගේ අධික භාවයෙහි ලා තමන් විසින් මැ ඇති වූ. බුදුහු අන්‍ය පණ්ඩිතයන් හා සමාන කරනු ලබන කලැ, ඥානාතිරේකයෙන් යුක්තයෝ යැ. ලෝකයෙහි ඇති තාක් නුවණැතියන් ගේ නුවණ එක් කළ ද බුදු නුවණ ඉනුදු අන්‍යයන්ගෙන් අධික වෙයි. එ බඳු වූ ඒ නුවණ අන්‍යයක්හු ගේ උපදේශයෙකින් ලැබුණේ නො වේ. තමන් විසින් මැ ඇති කරන ලද්දේ යැ. එ හෙයින් ස්වයම්භූ යැ.

**2. රාග නාග මද මර්දන** ශිඛි වූ— රාග නමැති නාගයා ගේ එඩි මැඩීමෙහි මයුරයා වූ. මයූරයා නයින් කන හෙයින් උන් ගේ මද මඩින්නෙකි. ශිඛාව (සිළුව) ඇති හෙයින් මයූරයා ද (ශිඛා + ඉන්) 'ශිඛි' නම් වෙයි. ('ඉන්' ප්‍රත්‍යයාන්ත ශබ්දයන් සිංහලයෙහි යෙදෙන කලැ අන්ත්‍ය 'න' කාරය ලොප් වන බව සැලැකියැ යුතු.) **පද්මරාග මණි ගණ කිරණ ස්ඵුරණයෙන්**— පියුම්රා (රතු) මැණික් සමූහයා ගේ රශ්මිය සැලීමෙන් (චඤ්චල වීමෙන්.) **අරුණවත්** වූ— අරුණයෙන් (අරුණාලෝකයෙන්) යුක්ත වූ. රක්ත මාණික්‍ය රශ්මිය අරුණාලෝකය වැන්නැ. අරුණාලෝකය ඇති වනුයේ සූර්යෝදයයට පෙරටු වැ මැ යැ. එ හෙත් එ නුවර සියලු කල්හි අරුණාලෝකයෙන් යුක්ත යැ. රක්ත මාණික්‍ය රශ්මිය පැතිරීමෙනි. **අතිතරුණ** වූ— 'මහ

රජාණන්' යන්නට විශෙෂණ යි. **තේජසින් අරුණ වූ**— තේජසින් රත් වූ. 'තෙජස රත්‍ය වැ' යනු කවි සමයය යි. **ශාරද-චන්‍ද්‍ර- ශොභාවති වූ**— ශරත් කාල චන්‍ද්‍රයා ගේ ශොභාවෙන් යුක්ත වූ. ශරදෙහි (සරා කල්හි) වූයේ ශාරද යි. ශරද් + අ = ශාරද. **ප්‍රණය කුපිත ප්‍රණයිනීන් ගේ මාන ග්‍රහ විෂ චිකිත්සාර්හ භෙෂජායමාන වූ නව යෞවනයට**— ප්‍රෙමයෙන් කිපුණා වූ පෙම්වතියන් ගේ මානය ගැනීම නමැති විෂයට ප්‍රතිකාර පිණිස සුදුසු බෙහෙදක් වැනි වූ අභිනව තරුණ භාවයට. දම්පතීහු නොයෙක් විටැ ප්‍රෙමයෙන් කිපෙති. පැතුවක් රිසි කල්හි නො ලැබීම ද කොපයට හෙතු වෙයි. අන් දෙසක් බැලීම ද කොප කාරණයෙකි. කිපුණු තැනැ කානීයට නො එළැඹෙයි, බසට බස නො දෙයි, තමාට මහත් වරදක් කළ සේ සිතා, සිත දැඩි කොටැ ගෙනැ වැටෙයි. ඉතර පක්‍ෂයෙන් සුදුසු කියුම් සුදුසු පැවැතුම් ලැබුණු කලැ, කොපය මහත් ප්‍රෙමයට හැරෙයි. මේ යැ ප්‍රණය කොප නම්. ප්‍රණයිනිය මෙ සේ කිපි, "මම ඔහු ළඟට වත් නො යමි" යනාදිය කියා තද මානයක් ගෙනැ සිටී. ඒ මානය ගැනීම විෂයෙකැ යි සිතමු. එයට පිළියම් කිරීම පිණිස සුදුසු බෙහෙදක් වෙයි. එ නම් බෝ සතුන් ගේ නව යෞවනය යි. කො තරම් දැඩි වූ මාන ග්‍රහයක් වුව ද, ඒ නව යෞවනය දුටු විටැ, සිහි වූ විටැ, ක්‍ෂණයෙන් දුරු වෙයි. ප්‍රබල මන්ත්‍රෞෂධයකින් විෂ බැසැ යන්නා මෙනි. එ කලැ ඇති වනුයේ මාන ග්‍රහයෙක් නො වේ. යම් කිසි ක්‍රමයෙකින් ළං වන්නට ඒ නව යෞවන රසය විඳින්නට බලවත් ආශාවෙකි. ප්‍රණයය ඇත්තී (ප්‍රණය + ඉන් + ඊ) ප්‍රණයිනී. (චිකිත්සා+අර්හ) කිත් + ස + ආ = කිකිත් + ස + ආ = චිකිත්සා. 'කිත්' (රොග දුරු කිරීමෙහි) ධාතු යි. 'ස' යනු ස්වාර්ථයෙහි ප්‍රත්‍යයය යි. 'ස' ප්‍රත්‍යයය පර කල්හි ධාතුහු ගේ (ස්වර සහිත වූ ආද්‍යක්‍ෂරය ද්විරූප වෙයි. මෙ සේ වූ 'ක' කාර දෙකින් පූර්වයට 'ච' කාරාදෙශ වෙයි. 'චිකිත්සා' නම් ලෙඩ පහ කිරීම යි (පිළියම් කිරීම යි.) 'අර්හ' යනු 'සුදුසු' යන අර්ථ ඇත්තේ යැ. 'භෙෂ' නම් රොග භය යි. භෙෂ් + අ. 'භෙෂ්' (බියෙහි) ධාතු යි. භෙෂය දිනනු යි. භෙෂජ යි. භෙෂ + ජි + අ = භෙෂජ. 'ජි' (ජයෙහි) ධාතු යි. **සමවාය ස්වරූප වූ**— රැසි වූවෙකැ (එකතු වූවෙකැ) ස්වභාවය (ආකාරය) ඇත්තා වූ. සම් + අව + ඉ + අ = සමවාය. 'ඉ' (ගමනෙහි) ධාතු යි. **නාසන මදන මදන ධුරන්ධර වූ**— ඇස

මත් වීමෙහි අනඞ්ග ධුරය ධරන්නා වූ. මදනයා (අනඞ්ගයා) මෙන් (ඒ ස්ත්‍රීන් ගේ) ඇස්හි මදනයට (මත් වීමට) හේතුව වූ. අනඞ්ගයා අතිවිශිෂ්ට රූප ශ්‍රීන් යුක්ත යැ. ඔහු දුටු ස්ත්‍රීන් ගේ ඇස් මත් වෙයි. මද් + අන = මදන. ‘මද්’ (මත් වීමෙහි) ධාතු යි. **සෞභාග්‍ය උද්වෘත්තාතුල වූ**— (උද්වෘත්ත + අතුල) සුභග භාවයා ගේ අධික භාවය කරණ කොට ගෙනැ අසම වූ. සෞභාග්‍යය නම් වාසනාවත් බව යි. අතුල කුමාරයාට සෞභාග්‍යය ඉතා අධික වැ ඇත. ඒ සෞභාග්‍යාධික භාවයෙන් හේ අතුල යැ. එයින් ඔහුට සමාන වන්නෙක් ලොකයෙහි නැති. උද් + වෘත් + අ = උද්වෘත්. ‘උද්’ පූර්ව ‘වෘත්’ ධාතුව ඉහළ යෑමෙහි - අධික වීමෙහි- වැටේ. තුලාව (සමාන බව) නැත්තේ යමකුට ද හේ අතුල යි. **සාදර මදන මදිරෙක්ෂණ වූ**— සිත් මත් වීමට සුරාවක් බඳු වූ. මද් + ඉර + ආ = මදිරා. ‘මද්’ (මත් වීමෙහි) ධාතු යි. එයින් මත් වේ නු යි මදිරා නම් වේ. **සකල භව දුඃඛ ප්‍රත්‍යනීක වූ**— සියලු සසර දුකට සතුරු වූ. ප්‍රතිකූල වූ (විරුද්ධ වූ) අනීකය (සේනාව) යමකුහු ගේ ද හේ ප්‍රත්‍යනීක යි. ‘අනීක’ යනු යුද්ධයට ද නමි. විරුද්ධ වැ කරන යුද්ධය යමකුහු ගේ හේ ප්‍රත්‍යනීක යැ යි එ කලැ ගත යුතු. **පූර්ණශරීක**— ඇටිඹ ගස. **ඛාල මෘණාල**— ළා නෙළුම් දඬු. **භේදනෙහි**— බිඳීමෙහි. **වරාහ**— හූරැ. හූරා නෙළුම් දඬු සාරා බිඳැ ගෙනැ කයි. **ක්ලේශාවරණ ව්‍යපගමයෙන්**— (ක්ලේශ + ආවරණ) කෙලෙස් නමැති වැස්ම පහ වී යෑමෙන්. වි+අප+ගම්+අ = ව්‍යපගම. ‘අප’ පූර්ව ‘ගම්’ ධාතු පහ වැ යෑමෙහි වැටේ. **අන්තඃකරණ**— බුද්ධිය. ඥානය.

**3. කල්ප ශිඛී**— කල්ප වෘක්ෂ. ශිඛාව (මුදුන) ඇත්තේ (ශිඛා+ඉන්) ශිඛින්. වෘක්ෂයට නමි. **සප්තාඞ්ග සමෘද්ධීන්**— (සප්ත + අඞ්ග) අඞ්ග සතින් සම්පූර්ණ භාවයෙන්. **අපරිභූත**— නො දිනන ලද. නො පැරදුණු. පරි+භූ + ත. ‘පරි’ පූර්ව ‘භූ’ ධාතුව ජය ගැන්මෙහි වැටේ. න පරිභූත අපරිභූත. අපරිභූත නගරය සප්තාඞ්ග සමෘද්ධියෙන් අන් කිසි නගරයකට නො පැරදුණේ යැ. එ හෙයින් අපරිභූත යැ. **විරචිත වූ අරි දමනය ඇති**— කරන ලද සතුරන් මැඩීම ඇත්තා වූ. සතුරන් මැඩීම කළ. ඔහු **උච්ඡ්‍රය ප්‍රමාණ**— ඔහු ගේ උස තරම් උසට,

4. **බුද්ධොත්පාදයෙහි**— (බුද්ධ + උත්පාදයෙහි) බුදුන් ගේ ඉපැදීම ඇති කල්හි. උද් + පද් + අ = උත්පාද. 'උද්' පූර්ව 'පද්' ධාතු ඉපැදීමෙහි වැටේ. **සුභාවිත** වූ— මනා සේ පුරුදු කරන (වඩන) ලද්දා වූ. භූ + ඉ + ත = භාවිත. ප්‍රයොජ්‍ය හෙයින් වෘද්ධි යි. 'භූ' ධාතු ප්‍රයොජ්‍ය වූ තන්හි වැඩීමෙහි වැටේ. වැඩීම නම් වෙන්නට සැලැස්වීම යි. **අභිප්‍රාය**— අදහස. අභි + ප්‍ර + ඉ + අ = අභිප්‍රාය. 'අභි' 'ප්‍ර' පූර්ව 'ඉ' ධාතු ආශයෙහි (අදහසෙහි) වැටේ.

---

## 21. විශ්වන්තු විවරණ කථා

1. **සංහෘත මදන ශිඛි ඇති**— නසන ලද කාම නමැති ගින්න ඇති. සම් + හෘ + ත = සංහෘත. 'සම්' පූර්ව 'හෘ' ධාතු නැසීමෙහි වැටේ. ශිඛා **ප්‍රාප්ත** වූ— මුදුන් පැමිණියා වූ. සම්පූර්ණ වූ **සුප්‍රතීත**— මනා සේ (අතිශයින්) ප්‍රසිද්ධ වූ. සු + ප්‍රති + ඉ + ත = සුප්‍රතීත. 'ප්‍රති' පූර්ව 'ඉ' ධාතු ප්‍රසිද්ධියෙහි වැටේ. **නව යෞවන සුන්දරී ජන මදන මහොත්සව මන්දිර** වූ— අභිනව තරුණ භාවය ඇති කාන්තා (ස්ත්‍රී) ජනයාට අනඞ්ග මහොත්සවය කරන මන්දිරය වූ. අනඞ්ග මහොත්සව මන්දිරය **මෙන්** යුවතීන් ගේ සිත් පොලඹවන්නා වූ. මදන මහොත්සව නම් වසන්ත සමයෙහි අනඞ්ගයා උදෙසා පැවැත්වෙන මහත් වූ ආනන්ද ජනක ව්‍යාපාරයෙකි. බෝ සතුන් ගේ නව යෞවනය යුවතීනට මදන මහොත්සව මන්දිරය වැන්නැ. **ආචාරයෙන්**— පැවැත්මෙන්. **විචිත්‍ර**— විසිතුරු. මුඛ **ව්‍යඤ්ජනොපනීත මධුර ගණ්ඩූෂ මධු පානයෙන් මත්ත වූ**— (ව්‍යඤ්ජන+උපනීත) මුඛ නමැති ඔබමින් එළවන ලද මිහිරි වූ ද කට පුරවන්නා වූ ද මී රස බීමෙන් මත් වැ. ස්ත්‍රීහු තමන් ගේ මුඛයට මී රස ගෙනැ බෝ සතුන් ගේ මුඛයට හෙළති. එයින් මී රස අධික රසයෙන් යුක්ත වෙයි. බෝ සතුනට ව්‍යඤ්ජන වනුයේ ස්ත්‍රීන් ගේ මුව යි. මධු පාන නම් මාද්වීකාදි මද්‍ය පාන යි. **ප්‍රසාද**- සුමුඛ වූ— පැහැදීමෙන් යහපත් මුඛ ඇති වූ. සුප්‍රබුද්ධ- **පද්මොපමමුඛ** වූ— මනා වැ පිපුණු පියුමක් බඳු මුව ඇත්තා වූ. සු + ප්‍ර + බුධ් + ත = සුප්‍රබුද්ධ. **පද්මොපම**— පද්මය උපමා වනුයේ යමකට ද ඒ පද්මොපම යි. ශෘඞ්ගාර **කාමුක නාග මාණවක මනොරථ වඩින** වූ— රතියෙහි ලොල් වූ නාග තරුණයන් ගේ අභිලාෂය වඩන්නා වූ. කම් + උක = කාමුක.

'කමි' (ආශායෙහි) ධාතු යි. ආශා කරනුයේ කාමුක යි. 'නාගී' යනු දිව්‍ය නාගයකු ගැහැනුවූනම් නමි. මෙහි 'මාණවක' යනු 'තරුණයා' යැ යන අර්ථ ඇත්තේ යැ. **ලොකාභි වසී වත්සල මාංසල** වූ— ලොවට වැඩ පිණිස හැසිරීමෙහි තදින් ඇලුණා වූ ශක්තිමත් වූ. ලොව සසර දුකින් ගලවන්නා වූ බුදුනම් වහල් වැ සිටි හෙයින් බෝධිස ද ලොකාභි වසී වත්සල යැ, ලොකාභි වසී මාංසල යැ. වද් + ස = වත්ස. පුත්‍ර ආදීනම (සෙනහයට සුදුසු වූවනම) නම්. 'වද්' (කීමෙහි) ධාතු යි. (සාමීප්‍යය) කියනුයේ වත්ස යි. වත්සයා ලාභය කරනුයේ (නනුයේ) වත්සල යි. වත්ස + ලා + අ = වත්සල. 'ලා' ධාතු ගැනීමෙහි වැවේ. යම් කිසිවකට බලවත් ඇල්ම ඇත්තේ වත්සල නම්. මාංස (මස්) ඇතියේ (මාංස + ල) මාංසල යි. බලවත්- ස්ථූල- යන අර්ථ ඇත්තේ යැ. **මාර වීර විජය කර්පූර දාහයෙහි** මාර වීරයාගේ විජය නමැති කපුරු දැවීමෙහි. ශූර භාවයෙන් යුක්ත වූ යේ ද ශ්‍රෙෂ්ඨ වූ යේ ද වීර නාමයෙන් ගැනේ. වීර් + අ. 'වීර්' (ශූර වීමෙහි) ධාතු යි. **ප්‍රබල වහ්නි විලාස** — ඉතා බලවත් ගින්නෙහි ආකාරය. යාග ද්‍රව්‍ය වහනය (ඉසිලීම්) කෙරේනු යි වහ්නි යි. වහ් + නි යාගයෙහි දෙවියනට පුදන දෑ ගින්නෙහි බහති. ගින්න දෙවියන් ගේ මුඛය වන හෙයිනි. **සම්බොධිය**— මනා සේ අවබොධ කිරීමට. බුදු බවට. සම් + බුධ් + ඉ = සම්බොධි. **අනන්තාපර්‍යන්ත**— (අනන්ත + අපර්‍යන්ත) අන්තයක් (කෙළවරක්) නැත්තේ යමෙක් ද ඒ අනන්ත යි. පර්‍යන්තයක් (සීමාවක්) නැත්තේ යමෙක් ද ඒ අපර්‍යන්ත යි. පරි + අන්ත = පර්‍යන්ත. 'පරි' යනු 'හාත්පසින්' යන අර්ථයෙහි උපසර්ග යි. **අවිශ්‍රාන්ත** වූ— නො විඩා වූ. වි + ශ්‍රම් + ත = විශ්‍රාන්ත. න විශ්‍රාන්ත අවිශ්‍රාන්ත. භුවනාවාසී— (භුවන + ආවාසී) ලෝ ඇඳුරු.

2. **වීසූ මහිමයෙන්**— (ඒ නගරයෙහි) විසුවා වූ අනුභාවයෙන්. **නිර්ධූත මාර භ්‍රූ කුටි ඇති**— අවඥා කරන ලද (ගසා හරින ලද) මාරයා ගේ බැම හිඳීම ඇති. මාරයා ගේ බැම බිඳීමට අවමන් කළා වූ. නිර් + ධූ + ත = නිර්ධූත. 'නිර්' පූර්ව 'ධූ' ධාතු අවඥාවෙහි වැවේ. යම් කිසිවකු විසින් රිදවන්නම කරන ලද දෑ, නුදුටු වන් වැ, නො ඇසූ වන් වැ, නො දත් වන් වැ, නො සලකා සිටීම එයට කැරෙන නිර්ධූතනය යි (අවඥාව යි.) කුට් + ඉ = කුටි. 'කුටි' (වක්‍ර කිරීමෙහි- නැමීමෙහි) ධාතු යි. **භ්‍රමණය** (වලනය)

වනුයේ 'භ්‍රෑ' යෑ. භ්‍රම් + ඌ = භ්‍රෑ. 'භ්‍රම්' (භ්‍රමණයෙහි- චලනයෙහි) ධාතු සි. ('අම්' යනු ලොප් වේ.) ඇස් බැම්ම 'භ්‍රෑ' යනු නමි. භ්‍රෑයෙහි කුටිය 'භ්‍රෑකුටි' යි. 'භ්‍රෑකුටි' යනු ද්‍ර භෙදයි. ඇස රවා බැලීමට මේ නමෙකි. රවනුයේ කොපයෙනි. එ හෙයින් භ්‍රෑකුටියෙන් කොපය හැඟැවෙයි. බුද්ධ කෙනකුන් ඇති වීම මාරයා ගේ කොපයට හෙතු යෑ. කො තරම් මහත් කොපයක් ඇති වුව ද බුද්ධනු එය නො සලකත්. **ගන්ධ කුටියක්**— ගඳ කිළියක්. කුට් + ඉ = කුටි. වක්‍ර වීමෙහි ද උණුසුමින් යුතු වීමෙහි ද 'කුට්' ධාතු වැටෙ මෙහි 'කුටි' නම් කුඩා ගෙය සි. 'කුටී' යනු ද්‍ර භෙදයි. බුද්ධන් ගේ වාස භවනය 'ගන්ධ කුටි' නමි. ගඳින් (සුවඳින්) යුත් වන හෙයිනි. **සිඝාරා**— වහා. හාත්පසැ [illegible] **ධුතාඞ්ගධර වැ**— ධුතාඞ්ග තෙළෙස (දහ තුන) දරන්නකු වැ. කෙලෙශ ධුනියෙහි (කෙලෙසුන් කම්පිත කිරීමෙහි) ගෙනෙදන අඞ්ග ධුතාඞ්ග සි. තෙළෙසෙකි. පංසුකූලික, තෙචීවරික, පිණ්ඩපාතික, සපදානචාරික, එකාසනික, පත්තපිණ්ඩික, ඛලුපච්ඡාභත්තික, ආරඤ්ඤික, රුක්ඛමූලික, අබ්භොකාසික, සොසානික, යථාසන්ථතික, නෙසජ්ජික, යන මේ තෙළෙසෙකි නමි. විස්තර විශුද්ධි මාර්ගයෙහි ආයේ යෑ.

## 22. කකුසන්ධ විවරණ කථා

**1. ධම්ම මාහාත්ම්‍යයෙව**— ධර්මයෙහි මහාත්ම භාවයට (මහිමයට.) මහත් වූ ආත්මය (යත්නය හෝ, මනස හෝ, ධෘතිය හෝ, බුද්ධිය හෝ) යමක්හු ගේ ද හේ (මහා + ආත්මන්) 'මහාත්ම' නමි. මහාත්මයා ගේ භාවය මාහාත්ම්‍ය සි. **ප්‍රතිභූ**— ලග්නක. ඇප කාරයා. ප්‍රතිරූප වනුයේ 'ප්‍රතිභූ' නමි. ප්‍රති + භූ + ක්විප් = ප්‍රතිභූ යම් කිසිවකු විසින් කළ යුත්තට ලග්නක වැ- ඇප වැ- සිටිනුයේ ඔහුට ප්‍රතිරූප වෙයි. ඔහු අතින් නො කැරුණු කොත් තමන් විසින් කළ යුතු වන හෙයින්, ඔහුට සදෘශ වැ සිටුනා හෙයිනි එ සේ ප්‍රතිරූප වනුයේ 'ප්‍රතිභූ' නම් වෙයි. **අප සේ වූවන් ගේ කුඩා ද තුනුරුවන්හි නම වත් පිහන්නට නොහොසක් වූ**— අප වැන්නන් ගේ මුවින්නුත් තුනුරුවන්හි නම් කියැවීමට සමර්ථ වූ. මෙ තන් පටන් අනතුරු (86 වන) පිටෙහි පස් වන පෙළ තෙක් සිටියේ එ පෙළෙහි එන 'ඉම් භද්‍ර කල්පයෙහි' යන්නට විශෙෂණ සි. ඉම් භද්‍ර කල්පය අප

වැන්නන් ලවා ද තුනුරුවන්හි නම් කියවන්නට සමර්ථ යැ. **ද්‍රොහීන්**— ද්වෙෂීන්. වෛරීන්. ද්‍රුහ්+අ=ද්‍රොහ. 'ද්‍රුහ්' (ද්වෙෂයෙහි) ධාතු යි. ද්‍රොහ ඇත්තේ (ද්‍රොහ+ඉන්) ද්‍රොහී. ඔවුන් ද්‍රොහීන්. **බුද් සරණ**— බුද්ධ + සරණ = බුද්ධ සරණ. ධය ස්වර ලොප යි. අශුද්ධභාෂාදෙශයෙන් 'බුන් සරණ' යනු වෙයි. **පරම්පරායෙහි ආ**— ඒ රැකින් අතු හෝ ඇට හෝ නෙතැ පැළ කිරීමෙන් ඇති වැ ආ. **මල**— මැරුණු. වියැළුණු. **සජීව**— දිවි ඇති. ජීවමාන. ජීව්+අ = ජීව. 'ජීව්' (පණ දැරීමෙහි) ධාතු යි. ජීවය (ප්‍රාණය) සහිත වූයේ සජීව යි. **අප**— දහම් සරණ කාරයෝ තමන් ගැනැ මැ මෙසේ කියති. බුදුන් තුදුටු හෙයින් ඔහු ස්වාමි දරුවන් නො හැඳිනැ වන්නෝ යැ. **ගිනි 'ගිනි යැ' යි නො සිතා**— රජ්ජුරුවෝ ගින්න වැන්නෝ යැ. අපි ඒ ගින්න 'ගින්න යැ' යි නො සිතා රජ කුලයට (රජ සෙවයට) වන්නම් හ. මෙ තැන් පටන් දස පෙළෙකින් කියැවෙන දූසින් හැඟෙනුයේ දහම් සරණ කාරයන් රජාමාත්‍යයකු හෝ අන් එ බඳු රජ සෙවකයකු හෝ වූ බව යි, අහීන පුරුෂයකු වූ බවට සැක නැති. නො එ සේ වූ නු නම්, සත්‍ය වුව ද, මෙ තරම් දැ රජුන් ගැනැ නො කියති. 'නො සිතා' යනු (රජ කුලයට) 'වැදූ' යන්නට විශෙෂණ යි. අපි භයංකර වූ රජ කුලයට වැදූ යෙහෙන් නිඳ පිබිදූ අකාල මරණයෙන් ගැලැවෙන පමණ පින් කරම් හ කෙ සේ රජ කුලයට වැදූ ද? ගිනි 'ගිනි යැ' යි නො සිතා වැදූ. විෂ 'විෂ යැ' යි නො සිතා වැදූ. වැසන 'වැසන යැ' යි නො සිතා වැදූ. චණ්ඩ වූ සිංහ ව්‍යාඝ්‍රාදීන් චණ්ඩ 'සත්ත්ව කෙනෙකැ' යි නො සිතා වැදූ. සැබැවින් මැ රජ සෙවාව එ තරම් භයඞ්කර යැ. එ හෙයින් කියැවිණ—

“රජසෙවා මනුෂ්‍යාණාමසිධාරාවලෙහනම්
පඤ්චානනපරිෂ්වඞ්ගො ව්‍යාලීවදනචුම්බනම්” ..... යි.

රජ සෙවාව නම් මිනිසුනට කඩු මුවහත තවරා ගැනීමෙකි, සිංහ යා වැලැඳැ ගැනීමෙකි, නැයින්න ගේ මුව සිඹීමෙකි. කෙ බඳු වූ රජ කුලයට වැදූ ද? අවිවෙකී වූ, රජ කුලයට, ප්‍රචණ්ඩ වූ රජ කුලයට, 'පර ලොවක් ඇත්තැ'යි නො සිතන්නා වූ රජ කුලයට, 'ජීවිතය අස්ථිර යැ' යි නො සිතන්නා වූ රජ කුලයට, රා බී මත් ආරොහකයක් නැඟි මත්තැතුන් සේ කිකීවන් කිකීවක් මැ කරන රජ කුලයට, භයඞ්කර වූ රජ කුලයට වැදූ. **අවිවෙකී**— (“මේ සත්‍යය යැ,

මේ අන්‍යාය යැ, මේ ධර්ම්‍ය යැ, මේ අධර්ම්‍ය යැ” යනාදි විසින්) විවේචනයක්- තේරීමක්- බේරීමක්- නො කරන සුලු වූ. වි + ඉච් + ඉන් = විවෙකින්. න විවෙකි අවිවෙකී. **ආරෝහකයන්**— අරුවන්. පිට නැඟුණවුන්. ඇතරුවන්. අරතුවේ- නගිතුවේ- ආරොහ සි. ආ + රුහ් + අ = ආරොහ. ‘ආ’ පූර්ව ‘රුහ්’ ධාතු නැඟීමෙහි වැටේ. ආරොහ මැ ආරොහක නම් **නෑගි**—(‘නැගි’ යනු මුද්‍රණ දෝෂ සි.) නැඟුණා වූ. පිටැ හුන්නා වූ. **මත්තුන්**— මත් ඇතුන්. මද කිපුණා වූ- සුරා මතින් යුතු වූ- උමතු වූ- ගර්විත වූ- ප්‍රීත වැ- කෙලිපර වූ- යනාදි අනෙකාර්ථයන්හි ‘මත්’ යනු වැටේ. **කීකීවන් කිකිවක් මැ කරන**— කී කී තැනැත්තන් කී කී දෑයක් මැ කරන්නා වූ. රූ බී මත් හෙයින් ආරෝහකයෝ කටයුතු නො කටයුතු පනඬ දීමට අසමර්ථයෝ යැ. මත් හෙයින් ඇත්තු ද කටයුතු නො කටයුතු තෝරා බේරා ගැනීමට අපොහොසත්තු යැ. එ හෙයින් එ බඳු ඇත්තු කුමක් කෙරෙත් ද? ඔබින් එකකු ‘යව’ යි කී කලැ යෙති. මොබින් එකකු ‘හැරෙව’ යි කී කලැ හැරෙති. චණ්ඩයකු ‘මරව’ යි කී කලැ මරති. ප්‍රශාන්තයකු ‘සන්හිඳෙව’ යි කී කලැ සන්හිඳෙති. රජ දරුවෝත් එ බඳු වෙත් මැ යි. ලං වැ සිටැ තමන් ගේ සිත ගත් යම් කිසිවකු කී දෑයක් මැ කෙරෙත්. **භයංකර**— භය උපදවන. **සෙමෙහන්**— සුව සේ. එ බඳු භයංකර රජ කුලයට වැද කෙ සේ නම් සෙමෙහන් නිඳ යහනෙන් පුබුදිත් ද? “තුනුරුවනට දැස වූ අපට කවර නම් උවදුරෙක් වේ ද?” යන සිත පහළ වීමෙන් බිය දුරු වෙයි. **සුචරිත පුරන්නට සුදුසු වූ**— පින් කරන්නට නිසි වූ. කිමෙක් සුචරිත පුරන්නට සුදුසු ද? මේ මහා භද්‍ර කල්පය සුදුසු යැ. බිණූ— කී. **පිරිතින්**— පරිත්‍රාණයෙන්. පරි (හාත්පසින්) ත්‍රාණය (රක්ෂණය) කොට් තු යි පරිත්‍රාණ යි. ‘ආරක්ෂාව’ යැ සි ව්‍යවහාරයෙහි එයි. දීනක් අඞ්ගුලි මාලයෝ මූළ්හගැබි මාගමක දැකැ, “මම ආර්ය ජාතින් උපන් තැන් පටන් කොටැ දැනැ දැනැ ප්‍රාණියකු දිවියෙන් ගැලැවූවා නො දනිමි ඒ සසින් තට ද ගබට ද සෙත් වේ වා” යැ යි පිරිතක් බිණූ හ. සෙත් එ සේ මැ වී යැ. , මේ කපැ මුළුල්ලෙහි ඒ පිරිත එ සේ මැ සෙත් කෙරෙයි. **ලද**— ලැබූ. **සිහිමුවන මහතුන්**— මේ ගෞතම බුදුන් සලකා කියත්. **අසහාය ශරණ වූ**— එ බඳු මහතුන් ඇති වීමෙන් මේ මහා භද්‍ර කල්පය ලොවට අසහාය ශරණ වී යැ. **මත්තැන්හු පවා**— මත් ඇතු ගේ පවා. එ දු සතුටු වූවන්

විසින් දමන ලද ධන පූජා ලද හෙයින් 'ධන පාල' නම් ද පන් සිල් ගෙනැ රැකි හෙයින් 'ශීල පාල' නම් ද ලද. **සතර රියන් දු නබ බැඳ වූ අසගෙස් වූවන්**— දහම් සරණ කාරයන් සර්වඥ ධාතු පිහිටුවා සතර රියන් දු ගබක් කැරැවූ බවෙක් මෙයින් හැඟෙයි. එ තරම් සුළු පිනක් කොටැ මතු නිවන් ලබන්නට හෙතු සම්පන්න වීම, බතවූහුණා බුදුන් මුහුණ බලා හිඳැ පසේ බුදු වන්නට හෙතු ලබන්නා වැන්නැ. **අමා මහ නිවනට ගබ ගන්වන්නා** වූ— අමෘත මහා නිර්වාණයට ගර්භ (හෙතුව) පිහිටුවන්නා වූ නිවන් ලැබීමට හෙතුව දූන් ගැන්වූ කලැ මතු නිවන් ලැබෙයි. ගර්භ දූන් ගැන්වූ කලැ මතු දරක ප්‍රසූතිය ඇති වන්නා මෙනි. කිමෙක් නිවනට ගබ ගන්වා ද? මේ මහා භද්‍ර කල්පය යි. **සකල ගුණ භද්‍ර** වූ— සියලු ගුණයෙන් සුන්දර වූ. **භව ප්‍රතිසන්ධි**— සසර පිළිසඳ ගැනීම. **ලොක ප්‍රණාම ගුණාගමන ඇති**— (ගුණ + ආගමන) ලොකයා ගේ වැඳීමට (සුදුසු වූ) ගුණයන් ගේ පැමිණීම (ලැබීම) ඇති. ප්‍ර + නම් + අ = ප්‍රණාම. ආ + ගම් + අන = ආගමන. 'ආ' පූර්ව 'ගම්' ධාතු ප්‍රාප්තියෙහි වැටේ. **ශ්‍රමණ ගජ ගන්ධ ද්විප** වූ— මහණුන් නමැති හස්තීන්ට ගන්ධ හස්ති වූ (ශ්‍රෙෂ්ඨ හස්ති වූ.) මහණුනට ඊශ්වර වූ යැ යූ සේ යි. ද්වයයෙන් (දෙකින්) පානය කරනුයේ ද්විප යි. ද්වි + පා + අ = ද්විප. 'ද්වි' නම් දෙක යි. 'පා' (බීමෙහි) ධාතු යි. ඇතා දිය සොඬට ඇදූ ගැනීම පළමු වන බීම යි. සොඬට ගත් දිය මුඛයට නමා ගෙනැ බීම දෙ වන බීම යි. මෙ සේ දෙකෙකින් බොන හෙයින් ඇතා ද්විප නම් වෙයි **නමන් ලද කනතුරු**— බුදු බව. **මිහිරි බව**— රම්‍ය භාවය. **මෛත්‍රෙය නාථයෝ**— මෛත්‍රී හිමියෝ. 'නාථ' යනු 'ස්වාමි' යන අරුත්හි වෙයි. **දවස් ගත වෑ**— දවස් ගත වෙමින්. කාලය පිරෙමින්.

2. **ක්ෂෙමකර** වූ— මඞ්ගලය (ශුභය) කරන්නා වූ. අශුභය ක්ෂය කෙරේ නු යි ක්ෂෙම යි. ක්ෂි + ම = ක්ෂෙම. 'ක්ෂි' (ක්ෂයෙහි) ධාතු යි. මඞ්ගලය, සංරක්ෂණය, මොක්ෂය, යනාදී අර්ථයන්හි ක්ෂෙම ශබ්දය වැටේ. **පුරොහිත**— ධර්මාධ්‍යක්ෂ. රජුන් ගේ දෘෂ්ටඵල වූ ද අදෘෂ්ටඵල වූ ද කර්මයන්හි ලා අග්‍රයෙහි (ප්‍රමුඛ ස්ථානයෙහි) නියුක්ත කරන ලද්දේ පුරොහිත යි. පුරස් + ධා + ත = පුරස් + හිත = පුරොහිත. 'පුරස්' යනු 'අග්‍රයෙහි' යනු අර්ථයෙහි අව්‍යය යි. 'ධා' (බැහීමෙහි) ධාතු යි. සඳැල

**පුත්‍ර ලාභයෙන් විශාඛා** වූ— බුදු වන පුත්‍රකු ලැබීමෙන් විශිෂ්ට ශාඛ යුක්ත වූ. දරුවෝ මෙහි ශාඛ (අතු) වැන්නෝ යැ. විශිෂ්ට වූ ශාඛ (අතු) වනුයේ යම් ස්ත්‍රියකට ද ඕ විශාඛා. වි + ශාඛ + ආ. ශාඛි + අ = ශාඛ. 'ශාඛි' (ව්‍යාප්තියෙහි- පැතිරීමෙහි) ධාතු යි. **බැමිණණියන්**— බැමිණි + අණි = බැමිණණි. **මදන දහනාවිෂ්ට විදග්ධ ගන්ධර්ව වධූ හෘදය නිර්වාපණෛක සුධා ප්‍රවාහයක් සමාන** වූ— ('ගන්ධ වධූ' යනු මුද්‍රණ දොෂ යි.) (දහන + ආවිෂ්ට, නිර්වාපණ + එක) රාග ගින්න ඇවිසුණා වූ නිපුණ වූ ගායක ස්ත්‍රීන් ගේ හද (සිත) නිවීමෙහි අසහාය අමෘත ඔසයක් (අමා වතුරක්) වැනි වූ. ගායක ස්ත්‍රීන් ගේ හෘදයයෙහි රාග ගින්න ඇවිසුණේ යැ. එ සේ වූ හෘදයය නිවීමට බෝ සතුන් ගේ නව යෞවනය අමෘත ප්‍රවාහයක් (අමා දිය වතුරක්) වැන්නැ. තරුණ වූ බොධි සත්ත්වයන් ගේ ආශ්‍රයෙන් ගන්ධර්ව ස්ත්‍රීන් ගේ රා ගිනි නිවුණු බව මෙ සේ කියැවිණ. දහ් + අන = දහන. 'දහ්' (දැවීමෙහි) ධාතු යි. ආ + විශ් + ත = ආවිෂ්ට. 'ආ' පූර්ව 'විශ්' ධාතු ආවෙශයෙහි වැටේ. ගන්ධයට (සෞරභයට- සුවඳට) යේ නු යි ගන්ධර්ව නම් ල. ගන්ධ + අර්ව් + අ. 'අර්ව්' (ගතියෙහි- ගමනයෙහි) ධාතු යි. මෙහි 'ගන්ධර්ව' යනු ගායකයනට නම් යැ. ගායනය ද වාදනය ද කරන්නෝ ගන්ධර්ව නාමයෙන් හැඳිනෙති. මෙ වධූහු ගායන- වාදනයන් කෙරෙති. එ හෙයින් ගන්ධර්ව වධූහු යැ. වහනය (ඉසිලීම) කෙරේ නු යි හො මහොත් වහනය කරනු ලැබේ නු යි වධූ නම් යැ. වහ් + ඌ = වධූ 'වහ්' (ඉසිලීමෙහි) ධාතු යි. 'විවාහ' යන තන්හි ද මේ ධාතු යැ. 'හ' කාරයට 'ධ' කාරාදෙශ යි. 'වධූ' යනු ස්ත්‍රියට නම් යැ. ප්‍ර + වහ් + අ = ප්‍රවාහ. ප්‍රකර්ෂයෙන් (බලවත් ලෙස) වහනය වනුයේ (ගලා යනුයේ) ප්‍රවාහ යි. **සෞන්දර්ය ශොභා විරොචිනී** වූ— සොඳුරු බැවෙහි කාන්තියෙන් විශෙෂයෙන් බබළන්නී වූ. වි + රුච් + ඉන් + ඊ = විරොචිනී. 'රුච්' (බැබැළීමෙහි) ධාතු යි. **ශෘඞ්ගාර යඥ සම්ප්‍රයොගයෙහි**— රති නමැති යාගය මිනා සේ යෙදීමෙහි. යජ් + න = යඥ. 'යජ්' (දෙව පූජායෙහි) ධාතු යි. සම් + ප්‍ර + යුජ් + අ = සම්ප්‍රයොග. 'යුජ්' (යෙදීමෙහි) ධාතු යි. නාටක ස්ත්‍රීන් ගේ රතිය යාගයෙක් නම්, බෝසත්හු ඒ යාගය මිනා සේ යෙදීමෙහි අග්‍ර ධුරීණයෝ යැ. **අග්‍ර ධුරීණ වැ**— ප්‍රධාන ධුරය දරන්නා වැ. පුරොහිත වැ. **ශුචිකර** වූ— ශුචිය (පිරිසුදු බව- පාප රහිත භාවය) දරන්නා වූ. ශුච් + ඉ = ශුචි. 'ශුච්' (පිරිසුදු වීමෙහි)

ධාතු යි. **ලෝක ශෝක ශාඛාපහාරී වූ**— (ශාක + අපහාරී) ලෝකයා ගේ ශෝකයෙහි ශක්තිය (බලය) පහ කරන්නා වූ. ශක් + අ = ශාක. 'ශක්' (ශක්තියෙහි) ධාතු යි. අප+හෘ+ඉන්= අපහාරින් 'අප' පූර්ව 'හෘ' ධාතු පහ කිරීමෙහි වැටේ. **මාර හෘදය පල්ලව දල කම්පායෙහි**— මාරයා ගේ හද නමැති පළු දල (තරුණ පත්‍ර) කම්පිත කිරීමෙහි. කම්ප් + අ + ආ = කම්පා. 'කම්ප්' (කම්පායෙහි) ධාතු යි. **යුගාන්ත වාත විභ්‍රම**— කල්පාන්ත වාතයා ගේ විලාසය. කල්පාන්ත වාතයෙන් මුහුදු දිය ගොඩැ ගෙ ල; මෙරැ මසැරුදීහු ඉගිලී අහසට නැගී සුනු විසුනු වැ ගෙත් ල. **චවා**— පවත්වා. වැටීම නම් (සක) පෙරළීම යි.

---

## 23. සොණාගමන විවරණ කථා

---

1. **විච්ඡින්න**— විශේෂයෙන් සිඳුනා ලද. වි + ඡිද් + ත= විච්ඡින්න. **භව බන්ධන**— සසර බැඳුම්. **චරණ ශරණාගමන**— (ශරණ + ආගමන) පාදය පිහිට කොටැ ගෙනැ පැමිණීම. පා වඳින්නට පැමිණීම. **ශාඛාග්‍රයෙහි**—(ශාඛා + අග්‍ර) කොත් මුදුනෙහි. ශාරණය (හිංසාව) කෙරේ නු යි ශාඛා යි. ශෘධ+න= ශාඛා 'ශෘධ' (හිංසායෙහි) ධාතු යි. මධ්‍යයෙහි 'න'කාරාගම යි. ධාතු ස්වරය හ්‍රස්ව වෙයි. 'ශාඛා' යනු අඟට ද නම්. එයින් හිංසා කරනු නම් සැබෑ යැ. එ බඳු ආකාර ඇති අන්‍ය වස්තූනු ද ඒ අර්ථයෙන් මැ 'ශාඛා' නම් වෙත්. මෙහි ගැනෙනුයේ ප්‍රාසාද මස්තකයෙහි යෙදෙන කොත යි. **නව රත්න**— මුක්තා, මාණික්‍ය, වෛදූර්‍ය, ගෝමේද, වජ්‍ර, විද්‍රුම (පබළු,) පද්මරාග, මරකත, නීල, යන නව විධ රත්න. **හෘදය හරණාචාර්‍ය වූ**— හද (සිත) පැහැරැ ගැනීමෙහි (ඇද ගැනීමෙහි) ඇදුරැ (ගුරු) වූ. 'ශෛෂවත' යන්නට විශේෂණ යි. **පරම මධුර ගාත්‍ර වූ**— අතිශයින් රමණීය ශරීර ඇත්තා වූ ශරීරය කෙරේ නුයි ගාත්‍ර යි. ගා + ත්‍ර. 'ගා' (ගතියෙහි) ධාතු යි. **ප්‍රණය කලහාවසාන සම්භාව්‍යමාන වූ සම්භොග ශෘංගාර සුධාස්වාදයෙන්**— (කලහ + අවසාන, සුධා + ආස්වාදයෙන්) ප්‍රේම කලහ අන්තයෙහි දී අපේක්ෂා කරනු ලබන්නා වූ සම්භොග රතිය නමැති අමෘතය විඳීමෙන්. ප්‍රණය කලහයෙන් අනුරක්ත වූ දෙදෙනා ගේ මැ නො ඉවැසිල්ල බලවත් වෙයි මානය රක්නට උත්සාහ කරන්නාහු

දෙ දෙන මැ උහුන් කෙරෙහි අනුරාගය නැති ලෙසක් හඟවන්නට තැත් කෙරෙති. එයින් වනුයේ අනුරාගය බලවත් වීම යැ. ඉවැසියැ නො හැකි මැ වූ කල්හි දෙ දෙන මැ උහුන් දෙස නො බලන්නාක් මෙන් බලුත්, උහුන් හා නො බණන්නාක් මෙන් බෙණෙත්, උහුන් ඇඟැ නො පිරිමදින්නා සේ පිරිමදිත්. එ කලැ පෙර නො විඳිවිරූ රසයෙක් දනෙයි. ඒ නම් අමෘත රසයෙකි. එය අපේක්ෂා කළ හැක්කේ ප්‍රණය කලහාවසානයෙහැ දී මැ යැ. ශෘඞ්ගාරය හෙවත් රතිය ද්විවිධ යැ. එකෙක් නම් සම්භොග ශෘඞ්ගාරය යි. ඒ මෙ සේ දක්විණ:—

"දශිතසපථිතාදීනි නිෂෙවෙතෙ විලාසිනෞ
යත්‍රානුරක්තාවන්‍යොන්‍යං සම්භොගඃ ස උදාහෘතඃ"

යමෙක්හි ලා උහුන් හට අනුරක්ත වූ විලාසිනු දෙ දෙනෙක් දශිත සපශිත ආදීන් සෙවිත් ද ඒ සම්භොග යැ යි දක්විණ. කලහය (මධුර ශබ්දය) හනනය (නැසීම) කරනුයේ කලහ යි. කල + හන් + අ= කලහ. කලහයෙහි දී කවර මධුර ශබ්දයෙක් ද? සම් + භූ + ය + මාන= සම්භාව්‍යමාන. 'සම්' පූර්ව 'භූ' ධාතු (ප්‍රයොජ්‍ය වූ තන්හි) අපේක්ෂායෙහි වැටේ. සම් + භුජ් + අ= සම්භොග. 'සම්' පූර්ව 'භුජ්' ධාතු විඳීමෙහි වැටේ. **ප්‍රණය රසාර්ථ වාහ** වූ—(රස + අර්ථ) ප්‍රෙම රසයෙහි අර්ථය (ඵලය) වහනය කරන්නා වූ (උසුලන්නා වූ.) ප්‍රෙම රසය කරණ කොටැ ගෙනැ ස්ත්‍රී පුරුෂයන් ගේ සම්බන්ධය වෙයි. එහි ඵලය නම් පුත්‍රයෝ යැ. "පුත්‍රප්‍රයොජනා දාරාඃ" යනු ආප්ත වචන යි. වාහ් + අ= වාහ. 'වාහ්' (ඉසිලීමෙහි) ධාතු යි. **සිහි කරක් මිහිරි** වූ— සිහි කරන කල්හි (පවා) රම්‍ය වූ. **සාඩම්බර** වූ— (ස+ආඩම්බර) ආඩම්බර (දර්ප) සහිත වූ. **උදුම්බර**— දිඹුල් **අසාධාරණ**— අසමාන. **කරුණාධීන**— (කරුණා + අධීන) කරුණාවට අධිස්වාමී (උපකෘතව ස්වාමී.) කරුණාදීම සිමි. අධි + ඉන. 'ඉන' යනු ස්වාමියාට (අධිපතියාට) නම්. ඉන් + අ= ඉන. 'ඉන්' (ස්වාමිත්වයට පැමිණීමෙහි) ධාතු යි.

**2.** **අශිථිල** වූ—ලිහිල් නුවූ. තද වූ. පිරුණා වූ. ශ්‍රථ් + ඉර= ශිථිල. 'ශ්‍රථ්' (ලිහිල් වීමෙහි) ධාතු යි. න ශිථිල අශිථිල. **අගර්විත** වූ— උඩඟු නුවූ **ප්‍රතිරාජ සෙනා නිවාරණ පර්වත** වූ— විරුද්ධ රජුන් ගේ සේනාවන් (පැමිණීම) වැළැක්වීමට පර්වතයක් වූ. ඉදිරියෙහි පර්වතයක් ඇති කල ගමන් වළකී. **චීන පට්ටාදි**— (පට්ට + ආදි) චීන කෞශෙය වස්ත්‍ර ආදී.

චීනය පුරාතනයෙහි දු පට වස්ත්‍ර (Silk) ගැන ප්‍රසිද්ධ යැ. පට්+ත= පට්ට. 'පට්' (විහිදීමෙහි) ධාතු සි.

3. **දළ්හ-ව්‍රත**— දළ්හ වූ (තද වූ) ව්‍රත (නියම) ඇත්තේ.

---

## 24. කාශ්‍යප විවරණ කථා

---

1. **විශකලිත- විගව- පාප** වූ— විශ්ලෂණයෙන් කැබැලි කරන ලද (සුනු කරන ලද- නසන ලද.) සියලු පාප ඇත්තා වූ. **ශෞවන විලාස පාටව** වූ ශෞවන විලාසයා ගේ පටුතවය (දක්ෂ භාවය) වූ. ශෞවන විලාසයා ගේ පටු බව නම් මේ කියැවෙන මධුරවස්ථාව යැ. පටුහු ගේ (දක්ෂයා ගේ) භාවය පාටව සි. පටු+අ=පාටව. **මධුරාවස්ථාවට**— (මධුර+අවස්ථාවට) රම්‍ය වූ දශාවට. **අමන්ද විලාස මන්දිර** වූ— අකල්ප වූ දීප්තියට ගෘහ (නිවාස) වූ. ඒ බැමිණිණියෝ නො මඳ වූ (බොහෝ වූ) (ශරීර) දීප්තිය වසනා ගෙයක් වැන්නෝ යැ. **කරුණා ශෘඞ්ගාර කෙලි සහාය** වෑ— කරුණා ක්‍රීඩාවට ද රති ක්‍රීඩාවට ද හවුල් වැ. කරුණා කෙළිය නම් දීනයනට කරුණාව දැක්වීමේ විනොදය සි. **විදිත**— දන්නා ලද. ප්‍රසිද්ධ. **උත්කණ්ඨායෙන් බාහිර** වූ— ශොකයෙන් බැහැරි (පිටත්) වූ. උද්+කඨ් + අ + ආ = උත්කණ්ඨා. 'කඨ්' (ශොකයෙහි) ධාතු සි. පතන ලද දෑයක් හෝ කෙනකුන් හෝ නො ලැබීමෙන් ශොක කිරීම උත්කණ්ඨා නම්. ඒ කිසිරි වනයෙහි හැසිරෙන කලැ අන් අනකම ආශාවක් නූපදී. එ හෙයින් උත්කණ්ඨාවකුදු නැති. උන්නත වූ (ඔසවන ලද) කණ්ඨය (ග්‍රීවාව) ඇත්තේ යමෙක්හි ද ඒ 'උත්කණ්ඨ' යැ සි ද විග්‍රහය වෙයි. ස්ත්‍රී ප්‍රත්‍යය ('ආ') වීමෙන් 'උත්කණ්ඨා' යනු නිපදී. කණ්ඨය උන්නත කිරීම ද ආශායෙන් වෙයි. **හෘදයානන්ද මන්දිර** වූ— (හෘදය+ආනන්ද) සිත් සතුටට ගෘහ වූ. **මාර විර විරොධ නිරොධ** වූ— මාර වීරයාගේ විරුද්ධ භාවයට විනාශය වූ. යම් කිසිවකු බුදු වීමට මාරයා ගේ විරොධය වෙයි. බොධි වෘක්ෂය නම් ඒ විරොධයා ගේ නිරොධය සි (විනාශය සි.) බුදු වන්නට පිහිට වන හෙයිනි. නි + රුධ් + අ= නිරොධ. 'රුධ්' (නාශයෙහි) ධාතු සි. **න්‍යග්‍රොධ**— නුග. න්‍යක්+රොධ= න්‍යග්‍රොධ. 'න්‍යක්' යනු 'පහළ' යන අර්ථයෙහි අව්‍යයයෙකි., "පහළට රොහණය (වැඩීම) වේ නු සි න්‍යග්‍රොධ නමැ" යනු එක් විග්‍රහයෙකි. රුහ් + අ= රොධ. අතුවලින් පහළට අරලු වැඩී අවුත් බිම් ගන්නා හෙයින් මේ යෙදෙයි. "පහළැ ආවරණය කෙරේ

නු සි න්‍යග්‍රොධ නමැ'' යනු තවත් විග්‍රහයෙකි. රුධ් + අ = රොධ. 'රුධ්' (ආවරණයෙහි) ධාතු සි. ආවරණය වනුයේ ද ඒ අරලු නිසා මැ යැ. **මාරානීක ප්‍රත්‍යනීක**— මර සෙනඟට විරුද්ධ සෙනඟ වූ. 'පරාක්‍රම ප්‍රභාව' යන්නට විශේෂණ සි. **නිජ පරාක්‍රම ප්‍රභාව**—ස්වකීය පරාක්‍රම ශක්තිය. **ගලමින්**—නිමගපා කෙරෙමින්. **උපුල්වමින්**—('උහුල්වමින්' යනු මුද්‍රණ දොෂ සි.) මතු පිටැ පාවෙන්නට සලස්වමින්. 'උල්පවමින්' යනු ව්‍යවහාර සි.

2 **ඝටීකාර**— මේ නමෙහි අර්ථය ද කුම්භකාර යනු සි. ඝට + කාර = ඝටීකාර. 'ඝට' නම් කළ යැ. ඝට් + අ = ඝට. 'ඝට්' (ආකාර විධානයෙහි- හැඩ ගැස්සීමෙහි) ධාතු සි. **කුම්භකාර**— කුම්භයන් (කළ) කරනුයේ කුම්භකාර සි. **සහායයන්**— යහළුවාණන්.

3. **දුගියක්හු**— දුගීතයක්හු. දිලින්දකු. **ප්‍රෙතයක්හු**— ප්‍රකෘතියෙන් ඉත වූයේ (ගියේ) ප්‍රෙත සි. ප්‍ර + ඉ + ත = ප්‍රෙත. මළ නොනැත්තනුට නමි. භූත විශෙෂයකට ද නම් වේ. 'මළ ප්‍රෙතයා' යනාදිය ව්‍යවහාරයෙන් එන්නෙන් ඒ අර්ථයෙහි ද මේ විග්‍රහ සි. **සුපටුන්**— යහපත් පටුනු (නගර.) සංස්කෘතයෙහි '**පත්තන**' යන්නෙන් හෝ 'පට්ටන' යන්නෙන් හෝ එ බදු අර්ථයක් නො ලැබෙතු දු, යාත්‍රා තීර්ථයක් (නැව් තොටක්) වූ නගරය '**පටුනු**' නමින් ගැනුණු සේ පෙණේ. **නැවියක්හු**— නාවිකයකු. නැව් දවවනුයේ (නැව් + ඉ) නැවි සි. **ග්‍රීෂ්මාභිතප්ත**— (ග්‍රීෂ්ම + අභිතප්ත) ග්‍රීෂ්මයෙන් තවන ලද. අභි + තප් + ත. **සරණක්**— පිහිටක්. **මුක්තියක්**— මිදීමක්. මුච් + ති = මුක්ති. 'මුච්' (මිදීමෙහි) ධාතු සි. **බන්ධන ගත**— බන්ධනයකට (බැම්මකට) ගිය. බැඳුණු **රොගාතුර**— (රොග + ආතුර) ලෙඩින් පෙළුණු. ආ (මැද කොට) අත්‍යාය (යෑම) කෙරේ නු සි ආතුර සි. ආ + අත් + උර = ආතුර. 'අත්' (ගමනයෙහි) ධාතු සි.

---

## 25. අපණ්ණකාදිය

ජාතක කථාවන්ගේ සාරය හෝ ජාතක නාමයන් ගේ විග්‍රහාදිය හෝ දක්වීමට ප්‍රයත්නයෙක් නො කැරෙයි. පොත මහත් වන හෙයිනි ජාතක කථා පිළිවෙළින් දක්වුණු හෙයින් ජාතක පොත ළං කැරැ ගත් කලැ අර්ථ සිද්ධිය අනායාසයෙන් කැරෙයි.

දහම් සරණ කාරයන් මෙකී ජාතක දශයක් හෝ තදුසනපා ගණනක් හෝ කැටි කොට සකණ්ඩ වශයෙන් දක්වන්නට සිතූ සේ පෙනේ. එක් එක් ඛණ්ඩයෙහි පමණ ඇතැයි සිතුණු තන්හි 'දහම් සරණ යා යුතු'' යන්නෙන් අවසන් කැරිණ. 'අපණ්ණකජාතකය' යනාදි විසින් මාතෘකා නම් යෙදුණේ අප විසිනි.

1. **වෙසතුරු අත් බව**— විශ්වනතර (වෛස්‍යනතර) අංතම භාවය (ජනමය.) **එක දෙශයෙකින්**— එක් දෙසෙකින්. අතිසංක්ෂෙප වශයෙන්. **සත්පුරුෂයන්**— ('සද් පුරුෂයන්' යනු මුද්‍රණ දෝෂ යි.)

2. **ල**— ළය. සිත. **සාකිසවා**— වෙදනාවට පමුණුවා. සතුන් ගන්නා දූතට තුඹු ශොකී වැ යැ යූ සේ යි. **මරු කතරම**— වාලුකා කාන්තාරයට, 'මරු' යනු වැල්ලට නම්. **කසු වූ**— අසු වී. **ඔවුනට ගොචර වූ**— ඒ සතුනට ගොදුරු වී. **ගොචර වූ පරිවාර**— ගොදුරු වන්නට සිටි පිරිවර.

3 **වණ්ණුපථ**— ('වණ්ණු පථ' යනු මුද්‍රණ දෝෂ යි.) **නිලන්නේ**-- නිල් වන්නේ. **මූලා**— කුමක් කළ යුතු දැයි නො දැනීමෙන් වන මූලාව.

4. **ලොභොබි**—ලොහොබ (ලෝබ) ඇතියේ ලොහොබි යි. **නිකම්**— කිසි මිලක් නො දී. **ගති**— නින්ද, 'ගර්හ්' ධාතු යි. **ඇත්තවුන්**— අයිති වූවන්. **ආදි**— පළමු. **නිශාවෙක්**— සැටියෙක් **තුලා** දංඩ— තාරාදි කඳ. **මතු**— පමණක්.

5. **ධන සිටු**— ධනවත් සිටු. සිටු පරපුරෙහි උපන්නාහු නිකම් මැ සිටු නම් ලබති. මේ එසේ නො වේ, ධනය ද ඇත්තෙකි. **දුගීක**— දිළිඳු. දුකින් යේ නු යි දුගීත යි. දුර්+ගම්+ත = දුගීත.

6. **සරජක**— රජ සහිත වූ. **අගය කරන කැනැත්තා**— වක්තකු පුරුෂයා. ''මෙකී මිල මෙතෙකැ'' යි නියම කරන්නා. Assessor.

7. **දෙව ධම්ම**— හිරි (විළි) ඔතප් (බිය) යන දෙකින් යුක්ත වීම. **මලුන්**— මල් බෑයන්. බාල සහෝදරයන්.

8. **රජ්ජුරුවන් නිසා**— රජ්ජුරුවන් ආශ්‍රය කොට. රජ්ජුරුවනට ජාතක කොට. **වඩා**— දීඝිතය කොට. **ගොවා**— සතපවා. **කින්**— පුත. පුත් මැ පිත්. සවාචි තද්ධිත ප්‍රත්‍යයාන්ත වීමෙන් නිපන් නාමයෙකි. මෙහි ප්‍රත්‍යය ලෝප් වෙයි, ස්වරයෝ අනභිත වෙත්. **කදලු**- කැදලි,

කබලු- කැබැලි, යනාදි ශබ්ද යුගලයනුදු පිරික්සන්නේ යැ. **නෑන නුවූ නම් ශී**— වැටි. **පලග් බැඳෑ**— පර්යඞ්ක බන්ධනය කොටැ. අරඹිණිය බැඳැ. **මහාරාජ, අහං තෙ පුත්තො ජනාධිප, ත්වං මං පොස. දෙවෝ අඤ්ඤෙ අපි පොසෙති. දෙවො සකං පජ. කිං ච?**— මහ රජ මම තා ගේ පුත්මි. ජනාධිපය, තෝ මා පුදු (පෝෂණය කරව.) දෙව (රජ) තෙමේ අන්‍යයනුදු පුසී දෙව තෙමේ ස්වකීය දරුවා සිම (නුපුසී ද?) **ගිවිස් වන්නෝ**- හදහවින්නෝ. ධර්ම **ස්වරූප**— ධර්මයා ගේ ස්වභාවය. **භගවත**— 'ධර්ම දෙශනා' යනු **මෙයට කර්‍ම වෙයි. බිජු වට**— මූල කාරණය. **එතු** ධර්ම දෙශනා ධර්ම ස්වරූප හගවන බව ගනෙයි. මේ ඒ ගස ඇති වීමට බිජු වට (ඇටය) සිදීවීම යැ.

9. **සිරෑ**— රැකි. **ධර්ම ප්‍රසඞ්ග**— ධර්මය ඉපැදවීම.

10. **හෙවෑ**— වැතිරැ. **වෑලි**— යළි දු. **තව පැල්හි** තපඃ කුටියෙහි. තපස් රක්නා පැලෙහි. **රැපෑ**— (ඇරැ + පෑ = රැපෑ. ආදි ස්වර ලෝප සන්ධි යි.) ඉදිරි පත් කොටැ දක්වා.

---

## 26. ලක්ෂණ මෘගාදිය

---

1. **අවිනීත**— නො හික්මුණු.

2. **අභය**— භයාභාවය. භය නැති **බව**. භී + අ = භය. 'භී' (භයෙහි) ධාතු යි. න භය අභය. **සරණ වන්**— පිහිට සොයා පැමිණි. **ගර්භිණී**— ගර්භය **ඇත්තී**. ගර්භ + ඉන් + ඊ. ගෘ + භ = ගර්භ 'ගෘ' (සෙකයෙහි- වැගිරීමෙහි) ධාතු යි. **ධෙනුව**— දෙන. පැටියා පොවා නු යි ධෙනු යි. ධෙ + නු = ධෙනු. 'ධෙ' පානයෙහි ධාතු යි. **දම් කෙඩියෙහි**— වධ්‍ය ස්ථානයෙහි. සිදීම (කැපීම) පිණිස හිස තබන කොටයෙහි. **හෝනෝ ද**— වැතිරෙන්නාහු ද.

3. **වසග වෑ**— බැඳී. **ශර ප්‍රහාරයෙන්**— හී පහරින්. ශාරණය (හිංසාව) කෙරේ නු යි ශර යි. ශෘ + අ = ශර. 'ශෘ' (හිංසායෙහි) ධාතු යි.

4, **රස තෘෂ්ණායෙන්**— රසයෙහි දූය ලොභයෙන්. තෘෂ් + න + ආ = තෘෂ්ණා. 'තෘෂ්' (පිපාසායෙහි) ධාතු යි. **මිහි මුසු**—මී පැණි මිශ්‍ර වූ. **රාජාඞ්ගණයට**—(රාජ + **අඞ්ගණයට**) රජ (ගෙ) මිදුලට, **ලමහි අඞ්ගනාය** (**හෙසින් නික්මැ යැම**)

කෙරේ නූ සි අඞ්ගත සි. අංග් + අත. 'අංග්' (ගමනයෙහි) ධාතු සි. 'අඞ්ගත' 'අඞ්ගණ' යන රූප ද්වයය මැ සාධු සි. **ධර්ම කථිකත්වය**— ධර්ම කථික බව. 'කථික' නම් කියන්නා යැ. 'කථ්' (කීමෙහි) ධාතු සි.

5. **බෑනා**— බෑනා (භාගිනෙය්‍ය) වූ.

6. **මලින්**— පාශයෙන්. මල පුඩුයෙන්.

7. **කෘෂ්ණ පක්ෂයෙහි**— කළුවර කොටසෙහි. පුර සඳ ඇති වූ දම පසු ද සිටැ පසළොස් දිනක් කෘෂ්ණ පක්ෂ නම්. සඳ එළිය හීන වැ ක්‍රමයෙන් අඳුර වැඩී යන හෙයින් කෘෂ්ණ නාමය ලද. **ශුක්ල පක්ෂයෙහි**— සුදු කොටසෙහි. සඳ වැඩෙමින් ගොස් කෙළවර දී පිරී ලොව සුදු කරන හෙයින් ශුක්ල නම්. වුව **බෑනෑ මැ යැ**— වුවත් යහපත් මැ යැ. වුවත් එක යැ. **පවනින්**— වාතයෙන්. වාතය කරණ කොටැ හෙනැ මැ ශීතය වෙති සි කී හ. **පැන**— ප්‍රශ්න. **ධර්ම න්‍යායයෙහි**— ධර්ම නීතියෙහි. නි + ඉ + අ = න්‍යාය. නියමයෙන් ගමන් කළ යුතු මාර්ගය. 'ඉ' (ගමනෙහි) ධාතු සි.

8. **මමත්වයක්**— 'මගේ යැ' යන බවත්. පක්ෂ පාතයක්. **රක්ෂා කරවකරවා**— රක්ෂා කරද්දීත්. **පෑ**— දක්වා. **ප්‍රාණාතිපාතයෙහි**— (ප්‍රාණ + අති–) පණ වැනැසුමෙහි. අති + පත් + අ = අතිපාත. 'අති' පූර්ව 'පත්' ධාතු අතික්‍රමණයෙහි වැටේ. **පණිවාසෙන්**— ප්‍රාණ ඝාතයෙන්.

9. **දෙවතාවන් ගේ**— 'දෙවතාවක ගේ' යනු ශුද්ධපාඨ සි. **ඇම**— ඇයම. දෙවතාවට. **බලි කර්මාන්ත**— බිලියම්. පූජා. බල් + ඉ = බලි. 'බල්' (දානයෙහි) ධාතු සි. **කුටුම්බිකයා**— කෙළෙඹියා. ගෘහපතියා. 'කුටුම්බ' යනු පවුල යැ, ගෘහ ධර්මය යැ, පූජාව යැ, සමූහය යැ, යනාදි අර්ථ ඇත්තේ යැ. කුටුම්බය ඇත්තේ (කුටුම්බ + ඉක) කුටුම්බික සි.

10. **උදක රාක්ෂසයා**— දිය රකුස්සා. උන්ද් + අක = උදක. 'න'කාර ලොප සි. 'උන්ද්' (කෙලදනයෙහි– තෙත් කිරීමෙහි) ධාතු සි. රක්ෂණය කෙරේ නූ සි. 'රක්ෂස්' නම් වේ. රක්ෂ් + අස් + රක්ෂස්. 'රක්ෂ්' රැකීමෙහි ධාතු සි. රක්ෂස්හු ගෙන් වූයේ (උපන්නේ) රාක්ෂස සි. රක්ෂස් + අ = රාක්ෂස. 'රක්ෂස්' යනු දෙව යොනියකට නම් වන බව–

"විද්‍යාධරොප්සරොයක්ෂරක්ෂොගන්ධර්වකින්නරාඃ
පිශාචො ගුහ්‍යකඃ සිද්ධො භූතොමී දෙවයොනයඃ"

යනුයෙන් අමරසිංහයෝ කී හ. රාවණ සමයෙහි ලක් වැස්සෝ රාක්‍ෂස නම් වූ හ. බ්‍රාහ්මණයන් ගේ කූට ධර්මයනට අසු වියැ නො දී ලොක රක්‍ෂණය කළ හෙයිනි. සතුරු වූ බ්‍රාහ්මණයෝ රාක්‍ෂසයන් ගේ අතිමානුෂ තෙජොබලවික්‍රමයන් නො සහන්නාහු, නොයෙක් බොරු ගොතා රාක්‍ෂසයන් මනුෂ්‍ය මාංසාදක නීච වර්ගයක් කොටැ සිය හැත්තවුන් අතරැ ප්‍රකාශ කළ හ. එසේ නො කරන ලද නම්, සකල ලොකයා මැ රාක්‍ෂසයන් ගේ ගුණ ධර්මයෙහි පැහැදීමෙන්, රාක්‍ෂසයෝ මුළු ලොවට ස්වාමි වන්නාහු යැ. සතුරන් ගේ ඒ ක්‍රියා කලාපය සතුරු කමට යෙදෙයි. එ හෙත් රාක්‍ෂසයන් නෙත් මැ පැවැතෙන්නා වූ සිංහලයන් විසින්, සතුරු බස් හැදෑරීමෙන්, සිය මුත්තන් වූ රාක්‍ෂසයන් ගැරැහීම් පිඬ ලොකයා ගේ සිනාවට කරුණු යැ. **අධිගෘහීත** - අරක් ගන්නා ලද අධි + ග්‍රහ් + ඉ + ත = අධිගෘහීත. 'අධි' පූර්ව 'ග්‍රහ්' ධාතු අරක් ගැනීමෙහි වැටේ. **ආශාවසී සවන්**— විසමය- ජනක ප්‍රවෘත්තිය. පුදුම පැවැත්ම. **උණ**— 'බට' යනු ද 'උණ' යනු ද සමානාර්ථ සේ යෙදිණ. වර්තමාන ව්‍යවහාරයෙහි අර්ථ භේදයෙක් පැණේ. **සසර ගැම**— සංසාර බන්ධන.

**11. දෙසෘ**— දෙශනා කොටැ. **පරිහරණ**— වැලැඳැ ගැනීම. ප්‍රයොජන විඳීම. පරි + හෘ + අන = පරිහරණ. 'පරි' පූර්ව 'හෘ' ධාතු වැලැඳැ ගැන්මෙහි වැටේ.

## 27. කුරුධම්මගාදිය

**1. ඉඳුරා**— සෘජු වැ. කෙළින්. **වඤ්චනයෙන්**— ('වඤ්චායෙන්' යනු මෙ සේ ශුද්ධ කළ යුතු) රැවැටිල්ලෙන්. වඤ්ච් + අන 'වඤ්ච්' (රැවැටීමෙහි) ධාතු සි. **අඩසවිය**— ශක්තිය. ඇතැ සිටැ දමා අතික ආයුධ විශෙෂ යෙකි. **වලකා**— වළකා. එයට මඟ හැරැ. **දිවි පිළිසැද්ද හ**— දිවි රැක්ක හ.

**2. දශ රාජ ධර්මයෙන්** —

"දානං සීලං පරිච්චාගං අජ්ජවං මද්දවං තපං
අක්කොධො අවිහිංසා ච ඛන්ති ච අවිරොධිතා" ......

යනුයෙන් දැක්වුණු, දානය, ශීලය, පරිත්‍යාගය, සෘජුත්වය, මෘදුත්වය, තපස, අක්‍රොධය, අවිහිංසාව, ක්‍ෂාන්තිය, අවිරොධිත්වය යන රාජ ධර්ම දශයයන්.

3. **අශ්වාධමයා**— (අශ්ව + අධමයා) නීච අශ්වයා. අශනය (ව්‍යාප්තිය) කෙරේ නු සි අශ්ව සි. අශ්+ව. 'අශ්' (ව්‍යාප්තියෙහි) ධාතු සි. වේගයෙන් දිවීම කරණ කොටැ ගෙනැ සියලු තන්හි පෙනෙන සේ පැතිරීම මෙහි ව්‍යාප්ති නම්. අධස් (පහත්) වූයේ අධම සි අධස් + ම = අධම. 'අධස්' යන්නෙහි අන්ත්‍ය ලෝප සි. 'අධස්' යනු 'පහත්' යන අර්ථයෙහි අව්‍යය සි. **බමුවා වූ**— බැඤ්සා වූ. **පිරිසිඳ**—පරිච්ඡින්න කොටැ. සම්පූර්ණ වශයෙන්. **කුළු ගත් හ**— සම්පූර්ණ කළ හ.

4. **පිළිපන්**— ප්‍රතිපන්න වූ. පිළිපැදියා වූ. 'පිළිපද' ධාතු පිළිපදී- පිළිපදිති- පිළිපනි- පිළිපනු- ඈ විසින් වරනැඟේ.

5. **විරහයෙන්**-- වෙන් වීමෙන්. වි + රහ් + අ = විරහ. 'රහ්' ත්‍යාගයෙහි- අත් හැරීමෙහි) ධාතු සි.

6. **කර**— ගෙලෙහි. **තණ පැන් ලා වැඩූ**— තණත් පැනුත් දී (කෑම බීම දී) වැඩූවා වූ. **මෑණියනට**— (කෑම් බීම් දෙන හෙයින්) මවු තනතුරෙහි සිටි ස්ත්‍රියට

7. **විවාහයට**— පුරුෂයකු විසින් පාවා ගනු ලැබීමට. වි + වහ් + අ = විවාහ. 'වහ්' (ඉසිලීමෙහි) ධාතු සි. විශිෂ්ට වූ වහනය (ඉසිලීම) විවාහ සි. **අමුතු බත්**— ආගන්තුක බත්. **මාළු**— ව්‍යඤ්ජන. **මාත්‍රයක්**— පමණක්. **අස්ථානයෙහි**— නො තන්හි. (බියට) කරුණක් නැති තන්හි. **සනඩාවී**— සනාථයනට අර්ථ (වැඩ)

8. **ජාති භේදයට**— ජාති වශයෙන් වෙනස් වීමට එක් ජාතියෙකැ මනුෂ්‍ය වැ උපදී. ඉක්බිති වඳුරු වැ උපදී. යළි නොන් වැ උපදී. මෙ සේ වෙනස් වෙනස් ජාතියට පැමිණීම ජාති භේදයට පැමිණීම සි. **පැමිණි වූ**— පත් කැරුවූ.

## 28. කුලාවකාදිය

1. **පෝතකයන්** - පැටියන් පූ+ත = පෝත. 'පූ' (පිරිසුදු කිරීමෙහි) ධාතු සි. පියා දරුවින් ලැබීමෙන් පිරිසුදු වෙයි. පෝතයා මැ (පෝත + ක) පෝතක සි. බිඳි **පැලැ**— පඩිකාතිය කඩා ගෙනැ පලා ගියෙ. **පිට පුරා**— පසු භාගය පුරා ගෙනැ. මෙහි 'පිට' 'නම්' යුද්ධ සේනාවෙහි පසු භාගය සි. ඉදිරියෙහි යුද කරන සේනාව දුබල වුව හොත් විහල් වීමට පස්සෙහි සේනාව නැවැතී

සිටිති. ඇතැම් විට ඇතැ නැවැති සිටි සෙනඟ පිටු පසින් අවුත් වනා වදිති. ශක්‍රයා පැරැදී රථය හරවා ගෙනැ දිවැ යළි දු පෙරළා ආයේ යැ. "එ සේ ආයේ ඔහුම උපකාර පිණිස පිටු පසින් මහ සෙනඟක් පැමිණි හෙයිනැ" යි අසුරයෝ සිතා, බිය ගෙනැ බිඳී පලා ගිය හ. තමන් මැ බිඳුණු කල්හි— සතුරන් ගෙන් බියක් නැත ද තමන් මැ බිය ගෙනැ දිවූ කල්හි. මෙහි බිඳීම නම් පෙළට සිටි සෙනඟ පෙළ කඩා හැරැ දිවීම යි.

**2. නො පැව මනා**— නො දක්වියැ යුතු. 'පැව' යනු 'පා' ධාතුයෙන් වූ අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. අතීත රූප යි. **ගුහ්‍ය**— සැඟැවියැ යුතු. ගුහ්+ය. 'ගුහ්' (සැඟැවීමෙහි) ධාතු යි. **හිරි**— හ්‍රී. ලජ්ජා. **ඔතප්**— අපත්‍රපා. භය. **බුන්**— බිඳුණු. නැසුණු. **නො කටයුත්තෙහි**— නො කටයුත්තක් කිරීමට.

**3. ඈසින්**— සිදුරින්. **විවාද**— විරුද්ධ වාද. විරුද්ධ වැකීම්. **සූරූ**— ශූර. **ශා**— යව.

**4. ගිජු**— තද ආශා ඇති. ගෘධ්‍ර. **මැසින්න**— මත්ස්‍ය ධෙනුව. 'ස' කාරාන්ත නාමයන් කෙරෙන් ස්ත්‍රී අර්ථයෙහි 'ඉනි' ප්‍රත්‍යය වෙයි. මස්+ඉනි=මැසිනි. ඇසිනි, වැලැසිනි (වැලැහිනි) යනාදිය ද පිරික්සන්නේ යැ. **මරද්**— මරණයත්. **වියෝගය**— වෙන් වීම. **ක්‍ෂමා**— ඉවැසීම. **කාමාතී වැ**— (කාම+ඍත) කාමයෙන් පෙළී. ඍ+ත. 'ඍ' (හිංසායෙහි) ධාතු යි. **උපද්දි දනෑ**— උපදී යනු දනැ. **චොදිත වැ**— මෙහෙයනු ලැබැ. චුද්+ඉ+ත=චොදිත. 'චුද්' (මෙහෙයීමෙහි) ධාතු යි.

**5. පිඤායෙහි පත්**— පක්ෂයෙහි පත්‍ර (තටු.) **නො හුන්**— නො ඉදුණු. නො හට ගත්. 'හුද' (හට ගැනීමෙහි) ධාතු බස් ආදි අත් පද යි. හිදේ- හිදෙති- හිදිණි, හිදි, හිනි- හිදුණු, හිදි, හුණු. **යක්**— යත හොත්. **වහලින්**— උපකාරයෙන්. **කොසොලාස් කිරියක් තෙනාඩ**— සූ සැට අමුණක් වැපිරෙන තරම් බිමට. අමුණු සතරෙක් කිරියෙකි. **සත්‍ය ක්‍රියා**— යම් කිසි සත්‍යයක් කියා, "ඒ සත්‍ය වී නම් මෙ සේ වේ වා, මෙ සේ නො වේ වා" යන විසින් පැතීම සත්‍ය ක්‍රියා නම්. **වෙරළෑ වලැ**— සමුද්‍ර තීරයෙහි වූ වනයෙහි.

**6. ඡ ඡ සෑඩි**— එකී එකී ඉළී. එකින් එක සපයි ම්. **ගොබා**— වැටෙක.

7. **සහාය වූ**—මිත්‍ර වූ. **අනවස්ථිත වූ**— අස්ථිර වූ. නියම නැති වූ. අව+ස්ථා+ඉ+ත = අවස්ථිත. 'අව' පූර්ව 'ස්ථා' ධාතු (ස්ථිර වූ සිටීමෙහි) වැටේ. න අවස්ථිත අනවස්ථිත. **ඇත්**— ඇතා. **කුමු**— වටුවාණන් සඳහා යෙදිණ. **අශුචි**— අසුවල්. **ශරීර ධර්ම**— ශරීර කෘත්‍ය. මල පහ කිරීම. **හට ගත්**— මේ 'හට' යනු 'භූද' ධාතුව නිසා නිපාතනයෙන් වූ පූර්ව ක්‍රියාවෙකැයි හැඟේ.

8. **විඤ්ඤුවා**— 'විඤ්ඤුවන' යි ශුද්ධ කළ යුතු. සෙසු තන්හි දූ මෙ සේ යැ. **නළින්**— (කඳුළු) අඹුයෙන්. **මැඩැ**— මිරිකා. **සූක්ෂ්ම**— සියුම්. සිහින් මුවහත් ඇති. සූච් + ම= සූච් + ස් + ම= සූක්ෂම. 'සූච්' (විදීමෙහි) ධාතු සි. 'ස' කාරාගම සි. **දුක්ඛ ජීවිකායෙහි**— දුහැමින් දිවි රැක්මෙහි.

9 **"බැහැර දී ධන පාමි" කියා**— බැහැර දී "ධන පාමි" කියා— යන විසින් ශුද්ධ කළ යුතු සි. සෙසු තන්හි දී ගේ "ධන පාමි" යි කිය සි. ධන තුබූ තෙකට ගිය කලැ අනෙකක් කිය සි. **මිඬිය පුත**— දාසිය ගේ පුත්‍රය. දඬුවම් පිණිස දාසින් ගේ හිස් මුඬු කරනු පෙර සිරිත් වියැ. එ හෙයින් දාසියට 'මිඬි' යන නාමෙක් ද වී 'මුඬු' යනු ස්ත්‍රී ප්‍රත්‍යයවත් වූ කලැ 'මිඬි' යනු වෙයි. **උද්ධත කම්**— උඩඟු කම්.

10 **සහලඟුරු වළක්**— (සහල + අඟුරු) ගිනි ගෙනැ දිළියෙන අඟුරු ඇති වළක්. 'සහල' යනු අතීතප්‍රත්‍යාර්ථ ඇත්තේ යැ. **මැඩැ ගෙනැ**— පෑ ගහා ගෙනැ. **පිප්පු**— පිබිදිවූ. පුප් + වි + උ = පිප්වූ= පිප්පු.

11 **අත් සරු කොටැ**— අතෙහි ඇති සාරය කොටැ. තමා අතෙහි ඇති දෑ අතුරින් සාරවත් වූ දෑය කොටැ. **පිරිමසා**— පුරවා.

## 29. ලොසකාදිය

2. **පසු මහණ කෙනකුට**— පස්සේ යන (ශිෂ්‍ය) ශ්‍රමණ කෙනකුට. **අවවාදයෙහි නො වැළැක්කැ**— අවවාදය කරණ කොටැ තෙනැ (ලොල් වීමෙන්) නො වැළැකී. **නන් කල**— යුතු කල. පිළියෙළ කළ. **ඉනිබ**— ඉන් පසු. ඉන් + ඔබ= ඉනොබ= (ස්වර පූර්ව රූපයෙන්) ඉනිබ. **අලෝල ධර්මයෙහි**— ලොල් බවක් නැති ධර්මයෙහි. ලෝඩ්+අ= ලෝල. 'ලොඩි

(ලෝභයෙන් උම්තු වීමෙහි) ධාතු යි. 'ඩ' 'ල' දෙක නො වෙනසි. ලොලය නැත්තේ යමෙක්හි ද ඒ අලොල යි.

4. **ගණ ශාස්තෘ**—සමූහයට අනුශාසක ශාසනා කරනුයේ ශාස්තෘ යි. ශාස්+තෘ කර්තෘ කාරක කෘදන්ත සාධනයෙහි 'තෘ' ප්‍රත්‍යයය යෙදේ. කෘ+තෘ= කර්තෘ **වඩා**— ඇති දූඛි කොට. **ඔහු අතැ**— ඔහු විසින්. **සංසාර ගෝචර වන**— සසරට ගොදුරු වන. **භව්‍ය පුද්ගලයනට**— සුදුසු තෙනැත්තවුනට. විය යුත්තේ භව්‍ය යි. භූ+ය = භව්‍ය. පුත් (කුත්සිතය) ගලනය (ගිලීම්) කෙරේ නු යි 'පුද්ගල' නම් වේ ල. 'ගල්' (ගලනාර්ථයෙහි) ධාතු යි. 'පුද්ගල' යනු පුරුෂ, ආත්ම, ශරීර, යනාදි අර්ථයන්හි වැටේ.

5. **නෙරමි**— පලවා හරිමි.

6. **වානර ජ්‍යෙෂ්ඨ**—වඳුරු දෙටුවා. වනයෙහි වූයේ (වන+අ) වාන යි. ඵල පත්‍රාදිය යි. වානය ගනී නු යි වානර යි. වාන + රා + අ. 'රා' (ගැනීමෙහි ධාතු යි. **අතිශයින්** වෘද්ධ වූයේ ජ්‍යෙෂ්ඨ යි. වෘද්ධ+ඉෂ්ඨ = ජ්‍ය + ඉෂ්ඨ ජ්‍යෙෂ්ඨ. 'වෘද්ධ' යන්නට ජ්‍ය' ආදෙශ යි.

7. **ධැහැ**— විකා. **මදින් වනැ**— මද බැවින් වැන්නැ. 'මද නිසා යැ' යි සිතමි. **රා නැසූ**— රා නිෂ්ප්‍රයොජන කළ.

8. **අන්තෑවැසි**— ශිෂ්‍ය. අතැ (වෙතැ) වසනුයේ අතැවැසි යි. **අවවාදක්ෂම**— අවවාදයට සුදුසු. අවවාදය ඉවසන. ක්ෂම් + අ= ක්ෂම **අපි**— වසතු.

9 **අපවත් වූ**— වෙන් වූ. **පරමාර්ථ ධර්ම**— ඉතා උතුම් අර්ථ ඇති ධර්ම.

10. **උදකාභිෂේක**— (උදක+අභිෂේක) දිය ඉසීම. **බාල**— අඥ. මෝඩ. බල් + අ= බාල. 'බල්' (ජීවනයෙහි) ධාතු යි. (ආශ්වාස ප්‍රශ්වාස මාත්‍රයෙන්) ජීවත් වනුයේ බාල යි. **අතුනු බාන්**— බඩ වැල්. **විජිතයෙහි**—දෙශයෙහි. වි + ජි + ත= විජිත. විශෙෂයෙන් දිනන ලද්දේ විජිත යි.

## 30. මහාසීලවාදිය

1. **සිව් කොළ හසා බැඳැ**— අත් පිටු පසට ඇද බැඳැ. **නිකටින්**— තමා ගේ නිකටින්. නිකටටත් බිමටත් අතරෙහි හිර කොටැ. **කොසගක් සා**— කොස් (ගස්) අගක් පමණ. **නො පාරවා**— නො පහරවා. නො ගාවා. **ධර්මිෂ්ඨ කම**—

දැමිටු බව. අතිශයින් ධර්මි වූයේ ධර්මිෂ්ඨ සි. ධර්මින්+ඉෂ්ඨ ධර්මය ඇතියේ (ධර්ම+ඉන්) ධර්මින්. **ප්‍රභාවය**— ශක්තිය. ප්‍රභූ බව. ප්‍රභූහු ගේ භාවය ප්‍රභාව සි. ප්‍රභූ+අ.

**3. හන් පලන්**— හැඳි පැලැඳි.

**5.** වුව - වූ කල්හි **සමෘද්ධ වූ**— ඵල සම්පන්න වූ.

**5. ඈලයේ**— අංශයෙහි. **ශෞර්යය**— ශූර භාවය. ශූර+ය= ශෞර්ය **නො බන්නේ**— භය නො වන්නේ. 'බා' බියෙහි) ධාතු සි. **එක් මරක්**— එක් මරණයක්. **ව්‍යාජාන්තරයෙකින්**— (ව්‍යාජ + අන්තර) එක්තරා ව්‍යාජයෙකින්. නැත්තක් ඇති සේ හැඟැවීම ව්‍යාජ සි. **දිනන්නට**— ජය ගන්නට. **නිබොසින්**— අඩු තරමින්. බොහෝ නො වනුයේ නිබෝ. ඉන් නිබොසින්. **සුගකුද්**— විතකුත්. **ජය සනමඟ**— ජය කණු. Victory Clumn.

**6. කෘෂික වූ** ගොවියකු වූ. කර්ෂණය (සී සෑම) කරනුයේ කෘෂික සි. කෘෂ්+ඉක. 'කෘෂ්' (සී සෑමෙහි) ධාතු සි. **ඇවිලෑ**— ඇවිණි. **ඇත්හු ද සොල්වා ගත නො හැක්කා වූ**— ඇතකු විසිනුත් සෙල්වියැ නො හැකි. **සල්හු කොමැ**— ඉතා ලඤු කොමැ. සැහැල්ලු කොමැ. **පඤ්ච ස්කන්ධ විභාගයෙහි**— රූප වේදනා සංඥා සංස්කාර විඥාන යන ස්කන්ධ පස බෙදා දැක්වීමට. **ද්වාර**— දොර. ධර්මයට දොර දීම නම් ධර්මය පිට කිරීම සි (දෙසීම සි.)

**7. පහණ**— එම්බා පාෂාණය (ගල.) **පාණ**— පහණ. ගල. **බණන වත**— කථා කරන සැටි යැ. **රෑහැණි**— කොප. **පියන්නා හා**— පියනු හා සමඟ මැ. **සෙඳක්**— පන්දුවක්. **එතෑ තීරයෙන්**— (එ+අතැ) එ ගොඩැ තීරයෙන්. **මෑතෑ**— (මෙ + අතැ) මෙ ගොඩැ. **ආත්ම පරිත්‍යාගය**— දිවි අත් හැරීම. ඉදින් කිඹුලාට අසු වී නම් මරණ ඒකාන්ත යැ. එය නො සලකා පිනූ හෙයින් ආත්ම පරිත්‍යාගය වෙයි.

**8. අද්භූතය**— පුදුමය. **ළ**— ළය. හෘදයය.

9. **පියන්**— පියාණන්. **ආදී**— පළමු. **පිඹැ ගසා ලූ විටැ**— සක් පිඹැ බෙර ගසා ලූ කලැ. **ඊශ්වර**— අධිපති. ඊශ්+වර 'ඊශ්' (ඉසුරු වීමෙහි) ධාතු සි. **කොනකුන්**— කොනකුන් ගේ, කොනකුන් සඳහා. **සුකන ප්‍රාජ්ඤ වූ**— යුතු වූ පැමිණියා වූ.

**10. සසාර වූ**— සාර සහිත වූ.

# 31. අඝාතමන්ත්‍රාදිය

**1. ජරා ජීර්ණ වූ** — ජරාවෙන් දිරා ගොස්. ජීර්+ත= ජීර්ණ. 'ජීර්' (දිරීමෙහි) ධාතු යි. **ලෙලිලෙලී** — වෙවුලවෙවුලා. **අනාචාර**— නො සිරිත්. වැරැදි හැසුරුම්. **දෘෂ්ටාන්ත** — උදාහරණ. දෘෂ්ට වූ (දක්නා ලද) අන්තය (කෙළවර) යමෙක්හි ද ඒ දෘෂ්ටාන්ත යි. යම් ධර්මයක් කියා, ඒ සත්‍ය බවට උදාහරණ දුන් කලැ, ඒ එයින් කෙළවර යැ. තවත් සැක කළ යුත්තෙක් නැති. එ හෙයින් උදාහරණය දෘෂ්ටාන්ත යි.

**2. ගබීසෙහි**— මේ කියැවෙන ස්ත්‍රිය මවු කුසෙහි වූ කාලයෙහි. **ශිඳුවා**— පාවා ගෙනැ. තම වෙතැ වාසය කරවා. **කඩක්**— වස්ත්‍රයක්. **ධූර්තයා**— ද්‍යූත කාරයා. දූ කෙළි ආදියෙහි යෙදෙන්නා. සලෙළුවා. ධූර් + ත = ධූර්ත. 'ධූර්' (හිංසායෙහි) ධාතු යි. **එවූ**— ඇන්නූ. 'ඩ' ධාතුයෙන් වූ ප්‍රයෝජ්‍ය අතීත කෘදන්ත නාම යි. **මුල් බැස්වූ හ**— ස්ථිර කළ හ.

**3. ධ්‍යාන ලාභී**— ධ්‍යාන ලැබූ. **සුළු පතක්**— හුළු එළියක්. 'පතක්' යනු පත්‍රයක්- කොළයක්- යන අරුත දෙයි. තණ පත් ආදියෙන් හුළු එළිය කැරෙනුයෙන් යෙදෙයි. සංස්කෘතයෙහි 'උල්කා' යනු ද දෙමළෙහි 'චූළු' යනු ද වේ. **නගා**— ගොඩ ගෙනැ. **ඒ**— ඒ තාපස තෙමේ. **ඉද්දෙක්**— සුවයෙක්. **රැහැසියන්**— රහස් කටයුතු කරන්නන්. ඔත්තු කාරයන්. රහස්හි සිටියේ රැහැසි යි. **හැලී**— ඇලී. සැහැවී. **හල්වා**— සඟවා. **රාවට**— ('රැයට' යනු මුද්‍රණ දෝෂ යි.) සුරාවට. **අවුළු**— කට ගැස්ම. **නුදුරැ**— ඇත් නො වේ. නුදුරු යැ. **නෙල**— මේ. **අවුළුවා**— දල්වා. **කෝධනා**— කීපෙන සුල්ල හ. **අකතඤ්ඤූ**— කළ ගුණ නො දන්නා හ. **පිසුණා**— කේලාම් කියන්නා හ. **මිත්තදූභිකා**— මිත්‍රද්‍රෝහිය හ. **වෘත්තාන්ත** — ප්‍රවෘත්ති. වෘත්ත වූ (පැවැතියා වූ) අන්තය (නිශ්චය) යමෙක්හි ද ඒ වෘත්තාන්ත යි. **එ**— එව. **සතුරා පිටු දක්මි**— සතුරාගේ පරාජය දකිමි. පැරදුණෝ දිනුවහුට පිටු පා දිවෙයි. එ හෙයින් දිනූයේ පැරැදුණහු ගේ පිටු දකී. මෙහි පිටු දක්ම නම් මරණය දැකීම යි. **පූල්වා**— අමෝරා. උරැක් කැරැ. **සූල්වා**— උස් කැරැ.

**4. සිනෙහ**— සෙනහ.

5. **සුකති බණන**— නඩු විසඳන. **සබ් සාධාරණයෝ යෑ**— සියල්ලවුනට මැ එක සේ අයත් වූවෝ යෑ.

6. **ආසනන** — ළං. ආ + සද් + ත = ආසන්න. 'ආ' පූර්ව 'සද්' ධාතු ළං වීමෙහි වැටේ. **දූළි**— රවුළ. **මාත්‍රාවට**— පමණට. **නට** - නැසුණු.

7. **සුක්ති සඟවන බසට**—සුක්තිය (ඇත්ත) සඟවන්නා වූ (වසන්නා වූ) වචනයට. **බෑණෝ**— බෑයාණෝ. සහෝදරයාණෝ. බෑ + ආණ = බෑ + ඇණ = බෑණ. **හරනාහු**— මුදන්නාහු. **සුභාෂිත**— යහපත් කීම. සු + භාෂ් + ඉ + ත.

10. **ස ඉම්ඩකැ**— ස වරෙකැ. **පෙරළපෙරළා**— නැවතැ නැවතැ. **ගෘහස්ථ වැ**— ගිහි වැ. ගෙහි සිටියේ (ගෘහ+ස්ථා+අ) ගෘහස්ථ සි. **දිනිමි**— ජය ගනිමි.

11. **අලෞකික වූ**— ලෞකික නුවූ. ලොකොත්තර වූ. ලෝකයෙහි වූයේ (ලෝක + ඉක) ලෞකික සි.

## 32. වරණාදිය

1. **වරණ**— ලුණුවරණ. **සුහු**— ශීඝ්‍ර.

2. **පිඩින් ඇදූ**— පීළෙහි නංවා ගෙනැ ගොස්. **කෙළෙසි**— කෙළෙහි. **දළ කළ හ**— දෘඪ කළ හ. මහත් කළ හ.

4. **කාලාන්තරයෙකින්**— අතරෙහි බොහෝ කාලයක් ගත වීමෙන්. **රූක්කනට**— ('රුකකට' යනු මුද්‍රණ දෝෂ සි) වෘක්ෂයනට.

5. **වැසි නට**— වැස්ස නටුවා වූ (නැති වූ) කල්හි.

6. **සාත්තුවක්**— සාමීයක්. තවලමක්. **මනස්කාරයෙන්**— මෙනෙහි කිරීමෙන් සිහිවිල්ලෙන්. **පහරනට**— පැහැර ගන්නට. සොර කම් කරන්නට. **පිණිස යෑ**— නිසා යැ. **නො බෑ ද?**— බිය නුවූ ද?.

7. **ස්වප්නයක්**— සිහිනයක්. ස්වප් + න = ස්වප්න. 'ස්වප්' (නිදීමෙහි) ධාතු සි. නිදූ කලැ දක්නා හෙයින් සිහින 'ස්වප්න' නම්. **අනිෂ්ට**— අනභිමත. නපුරු. න ඉෂ්ට අනිෂ්ට.

8. **ග්‍රාම භොජකයා**— ගම් මුලාදෑනියා. ගම බුදිනුයේ (අනුභව කරනුයේ) ග්‍රාම භොජක සි. භුජ් + අක = භොජක. **පරිහාස**— විහිළු. Ridicule. පරි + හාස් + අ = පරිහාස. 'හස්' (සිනාසෙහි) ධාතු සි. සියලු අතින් සිනා සියැ යුතු බවට පැමිණවීම පරිහාස කිරීම සි.

9. **සමණෙයහි**— සමාන වැ. **වංකති**— වැටුප්. පඩි. **අවමාන**— අවමන්. පහත් කොටැ සිතීම. **පශ්චිම**— පසු. **කැලයක්**— සමූහයක්.

10. **හසන සාර වැ**— අන් සරු වැ.

## 33. සුරාපානාදිය

1. **අනායක වැ**— නායකයකු නැති වැ. **මනුෂ්‍ය පථයට**— මිනිසුන් වසන පෙදෙසට. **පාන මත් වැ**— (සුරා) පානයෙන් මත් වී.

2. **උර චක්‍රයෙන්**— උර චක්‍ර නම් ළය වටා බැඳෙන ආයුධ මාලාවෙකි. එය කරකැවෙන කල්හි ශරීරය කැපිකැපී යෙයි.

3. **ශෛල මසක්**— මාස එක හමාරක් 'ශෛල' යනු එක හමාරට නමි.

4 **ඇසූ සිරිවූ**— (ගුරු මුඛින්) ඇසුවා වූ ද පාඩම් කළා වූ ද. 'පිරුව' ධාතුව පාඩම් කිරීමෙහි වැටේ. ''පිරුවන නිති අකුරු'' යනු ශ්‍රී රාහුල වචන යි. **ගින විසීනාවක්**— ක්ෂය වූ විසී ඇති බවක්. **අභි ද්වාර** — අභිවෘද්ධියට දොර (මාගී.)

5 **කිම් පල**— විෂ පල. **සවරූප**—සවභාවය.

6. **වැඩි**— මහත් වැ. **කර සපා පියා**— අත් එක් කොටැලා. **මී නියා**— මේ නියා. මෙ බඳු. **සථානානතර යෙකැ**— තනතුරෙකැ. පදවියෙකැ. සංස්කෘත යෙහි 'සථානානතර' යනු මේ අර්ථයෙහි යෙදෙන බවෙක් නො පෙණේ. 'අන්‍ය සථාන' යන අර්ථයෙහි නම් යෙදෙයි. **රාජාඥා**— රජ නියොගය. **කළම**— කළනු යැ.

7. **නො නැසුව**— විනාශ නො වව. **සුභුණු යැ**— ශකුන යැ. ශුභාශුභ නිමිති යැ. **පේන යැ**— දූත් 'පේන කියනවා' යනු වහරෙහි එයි.

9. **සණ පත හිසැ වැදී ගසැ යි**— තණ කොළය හිසෙහි රැඳී තුබුණේ යැ යි. **කුහක කම්**— වඤ්චක කම්. රැවැටිලි. කුහ් + අක= 'කුහ්' (වඤ්චනයෙහි) ධාතු යි. **පැලැවා වූ**— පලා ගියා වූ. **කූට ජටිලයා ගේ**— හොර තවුසා ගේ. ජටා (ගෙතුණු කෙහෙ) ඇත්තේ ජටිල යි. ජටා + ඉල= ජටිල.

# 34. ලිප්තාදිය

1. **අක්ඛ ධුත්ත**— දාදු කෙළින්නාර. 'අක්ඛ' යනු දාදු කැටියට නම්. **ජූත ඇට**— අක්ෂය. දාදු කැටය. 'පාශක' යනු සංස්කෘත නාම යි. **ගලන**— ගිලින්නා වූ. **හාලාහල**— දරුණු වූ විෂ වර්ගයකට නමි. **ප්‍රත්‍යවෙක්ෂා**— නුවණින් මෙනෙහි කිරීම. චීවරාදි ප්‍රත්‍යයන් පරිභොග කරන කල්හි "මේ සිවුර ශීතාදිය වැළැක්වීම පිණිස වලඳිමි. අලංකාරාදිය පිණිස නො වලඳිමි" යනාදීන් මෙනෙහි කිරීම ප්‍රත්‍යවෙක්ෂා නම්. ප්‍රති + අව + ඊක්ෂ් + අ + ආ. **ප්‍රත්‍යය**— සිවුරු ආදි සතර පසය. **පරිභොග**—ප්‍රයෝජනයට ගැනීම. **උපස්තම්භක**— පිහිට. රුකුල්. උප + ස්තම්භ් + අක. 'උප' පූර්ව 'ස්තම්භ්' ධාතු රුකුල් දීමෙහි වැටේ.

3. **අවිශ්වසනීය**— විශ්වාස නො කළ යුතු. වි + ශ්වස් + අනීය = විශ්වසනීය. 'වි' පූර්ව 'ශ්වස්' ධාතු විශ්වාසයෙහි වැටේ. න විශ්වසනීය අවිශ්වසනීය. **බිම් ගන්නාක් මෙන්**— භූමිය පිළියෙළ කරන්නා සේ

4. **නග්න වූ**— නිර්වස්ත්‍ර වූ. නජ් + ත = නග්න. 'නජ්' (ලජ්ජායෙහි) ධාතු යි. **වසුන්**— වස්ත්‍රන් ගේ. **මඤ්චකයෙහි**— ඇඳෙහි. මච් + අ = මඤ්ච. (මැස්ස.) 'මච්' (උස් කිරීමෙහි) ධාතු යි. මඤ්චය මැ මඤ්චක යි. **නිරය නිමිත්ත**— නිරයෙහි උපදනා බවට ලකුණු. ගිනි දැල් ආදිය පෙනීම.

5. **වස්තු කාම**— වස්තුවට (පස් කම් සැපතට) ආශාව. **ක්ලේශකාම**— වස්තු කාම සඞ්ඛ්‍යාත කෙලෙසුන්ට ඇති ඇල්ම. **අනාථ ශයනය**— අනාථව හෙවීම (වැතිරීම.) **අමාත්‍යයන්**— අමා (සහ) වසන්නුවෝ (අමා + ත්‍ය) අමාත්‍ය යි. 'අමා' යනු 'සහ' යන අර්ථයෙහි අව්‍යය යි. 'ත්‍ය' යනු විසීම් අර්ථයෙහි වෙයි. **සඞ්ඛාරා**— සංස්කාරයෝ. **උප්පාදවයධම්මිනො**— උත්පාදව්‍යය ස්වභාව කොටැ ඇත්තාහු. **වත**— ඒකාන්තයෙන්. **අනිච්චා**— අනිත්‍යයෝ යැ. **උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති**— ඉපැද නැසෙත්. **තෙසං වූපසමො සුඛො**— ඔවුන් ගේ ව්‍යුපශමය සුව යි.

7. **ජීවක**— 'ජීවත් වන්නේ' යනු අර්ථ යි. **ධන පාල**— 'ධනය රක්නේ' යනු අර්ථ යි. **පන්ථක**— 'මඟෙහි වූයේ' යනු අර්ථ යි.

8. **හුඹුලෙහි**— සිදුරෙහි. **අත් වැල් බැන්දග**— එක් වැ ගිය ග

10. **උත්කර්ෂයට**— උසස් බවට. උද් + කෘෂ් + අ= උත්කර්ෂ.

## 35. පරෝසතාදිය

1 **කෙලෙශ ඛශනයා සේ**— රාගයෙන් මැඬුණා වූ එකකු මෙන්.

2. **සඳි හැඹූ ත**— සන්ධිය පෑස්සූ ත. එක් කළ ත.

3. **යථාලාභ**— ලැබීම යම් සේ ද එසේ. ලද දෙයෙහි. **මහිමයට**— මහත් බවට.

4. **සැලි නැගි**— එසවුල වැ උස් වූ. **පූර්ව සෙවා**— පළමු සෙවනය. පුරුදු වීමට කරන සෙවනය.

6. **අත් සකුරු ගසා**— අතින් ගල් කැට ගසා. කුඩා ගල් කැටයට 'ශර්කරා' යනු සංස්කෘත නාම යි. ඇතැම් පුරාතනයෝ බිමැ හිඳැ කුඩා ගල් කැට ගසා ගස්හි පත්වලැ නානාවිධ රූප පෙණෙන සේ සිදුරැ කොටැ සමත් කම් දක්වූහු. එනම 'අතසකුරු ගැසීම' යනු නම් වී යැ. **පිළු**— කුඩා.

7. **සීහ පඤ්ජරය**— සී මැදුරැ කවුළුව. **අප්‍රතිච්ඡන්න වූ**— නො වසන ලදු වැ. ප්‍රති + ඡද් + ත = ප්‍රතිච්ඡන්න. 'ප්‍රති' පූර්ව 'ඡද්' ධාතු වැසීමෙහි වැටේ. **වපුව** - ශරීරය. **විශද**— ප්‍රසන්න. පිරිසුදු. **පිරීමෙන්**— කිරීමෙන්.

8. **කුඩු පූවක්**— කුඩු (වී කුඩුයෙන් කළ) කැවුමක්. **මුව විටින්**— මුඛයෙහි (කටෙහි) වාටියෙන්.

## 36. ශෘගාලාදිය

1. **ල**— ලව. **වමනින්**— මුත්‍රයෙන්. 'වමන්' යනු මූත්‍ර පර්යාය යි.

2. **ලිහිණි දෙමු**— පක්ෂි නායක. **සොපද්‍රව**—(ස+උපද්‍රව) උපද්‍රව සහිත. මෙ සේ "සොපද්‍රව යැ" කීයේ පසු වැ මළ පක්ෂියා යැ. එ සේ කීයේ අන්‍ය පක්ෂීන් එහි ගොදුරැ පිණිස හැසිරීම වළකනු පිණිස යැ. **ලෞල්‍යය**— ලොල් බව. ලොලයා ගේ භාවය ලෞල්‍ය යි. ලොල + ය.

4. **අඩයටි පෙනෙමි**— අඬ්ඩපිය සිටුවා එයට උඩින් පැනීම අඩ යටි පැනීම නම්. High jump

6. **පමා වන බව**— කල්පනාව (සිහිය) මෙන අනෙකැ යවන බව. **උපාය කෞශල්‍ය ධර්මය**— උපාය දක්ෂ භාවය සංඛ්‍යාත ධර්මය. කුශලයා ගේ භාවය කෞශල්‍ය යි.

8. **ප්‍රත්‍යනීකය**— පිටිසර **සන්හිඳුවන්නට**— (එ පෙදෙස්හි මිනිසුන් කිපී රජුට විරුද්ධ වැ සිටි හෙයින් ඔවුන්) සමතු

කරන්නට. **ලෝකාමිෂ**— (ලෝක + ආමිෂ) ලෝක විෂය වූ. ආ + මිෂ් + අ= ආමිෂ. 'මිෂ්' (සෙවනයෙහි) ධාතු යි. මාංස, ධාන්‍ය වස්තු, ලෝභ සඞ්ඛ්‍යාත, ලාභ, කාම ගුණ, භෝජන, යනාදි අර්ථයන්හි දු 'ආමිෂ' ශබ්දය වැටේ. **නඛ ව්‍රණ**— නිය ඇණීමෙන් කරන ලද වණ (තුවාල.) **ලෙහෙඩින්නක ද**— කුඩා ලෙහෙඩියක පවා. ලෙහෙඩි + ඉනි= ලෙහෙඩිනී. **නො පැහැර වූ විරිම්**— නො හැඹූ පුරුදු ඇත්තෙමි. **මෙවර ආ**— මෙමෙහෙවර පිණිස ආ.

---

## 37. කුසනාළි ආදිය

---

**1. වලහම් කරන්නට**— දුක් කියා හඬන්නට. **කුල ධම්**— කුලයෙහි පැවැතැ එන ධම්. **කබුසු බොහොඩ**— 'බොහොඩ' යනු ද කටුස්සාට මැ නම්. **පැනී**— පෙනී. **රුක් මැදින්**— ගසේ කඳ මැදින් (ඇතුළින්.) **සුහුඹුල්**— සමෘද්ධ. සාර වැ පුෂ්ටිමත් වැ වැඩුණෝ සුහුඹුල් වූයේ නමැ.

**2. ඔබා**— පිහිටුවා. **පුණ්‍යමය**— පිනින් ඇති වූ. පින් මුවා.

**3. නඟුලිසක්**— නඟුල් දංඩක්. නඟු යේ දංඩ නඟුලිස් නම්. **පරිචය**— පුරුද්ද. **ආකාර සාම්‍යයෙක්** - ආකාරයා යේ සම බවෙක්. සමයා යේ භාවය (සම් + ය) සාම්‍ය යි. **ගිවිසැ**— එකඟ වැ. පිළිගෙනැ. **උපෙක්ෂා කොට**— මධ්‍යස්ථ වැ. 'හරි යැ' යි හෝ 'වැරැදි යැ' යි හෝ නො කියා. **මියෙන්**— කටින්. මුව + එන්= මියෙන්. **දි කිරි බත්**— දී කිරින් බතුත්. මිදුණු කිරි දී කිරි යි.

**4. නිසංහි**— නියගෙහි. **දෙණක්**— ඔරුවක්. Trough **නාගම්හ**— ඇද්දූ දෙමිහ. **වතාවත්**— වත් පිළිවෙත්. පැවැත්ත යුතු පිළිවෙළ. **වත් සම්පත්තියෙහි**— වතින් යුක්ත වීමෙහි.

**5. ගැත්තවූ**— ගැත්තනු. දසයා. **තමන් ලීවා කොටැ**— තමන් ලියූ ලෙස හඟවා. **පතක්**— ලියමනක්. **පිතෑ යි**— පුත්‍රයා යැ යි. **පසල් දනවුවෙහි**— ප්‍රත්‍යන්ත (පිටිසර) ජනපදයෙහි. **කිඳුවා**— පාවා. **ඔබ**— එති. **ගැති මෙහෙ**— දස මෙහෙවර. **ශ්‍රී**— සම්පත්ති. **ඔ හට මතු**— ඔහුට පමණක්. **වාචාල කම්**— දෙඩමළු බව. වාච් + ආල= වාචාල. 'වාච්' නම් වචන යි. නින්දිතාර්ථ බහ්වර්ථ අස්ථාර්ථය යන තුන් අරුත්හි 'ආල' ප්‍රත්‍යය යි. නින්දිත වූ බෝහෝ වූ වචන ඇත්තේ වාචාල යි.

**6. මිරිස්**— ගම් මිරිස්. **කිවිසැ**-- 'කිඹිසැ' යැ යි දන් කිහුණි. **ඛඩ්ග පරීක්ෂකයා**— කඩු විමසන්නා. ඛඩ් + ග= ඛඩ්ග.

'ඛඬ්' (බෙදීමෙහි) ධාතු යි. ඛෙමි— මේ ඛඬින පරීක්ෂක තෙනමේ.

7. අයුක්තකාරී— අයුතු කරන.

9. **දුශ්ශීල භාවී**-- නපුරු පැවැතුම් ඇති බව. දුෂ්ට වූ ශීලය යමක්හු ගේ ද හේ (දුස්+ශීල) දුශ්ශීල. **ශීලිභාවයෙහි**— සිල්වත් බවෙහි. ශීල ඇතියේ ශීලීන්. ශීලිහු ගේ භාවය ශීලීත්ව.

## 38. අසම්පදනාදිය

1. **කුරු ගුලා කත්හි**— රෙදි පටේ කොනෙහි. **බොල්**— බොල් වී. **තිඹික්**— ලාස් (කුරුණි) සතරක්. **මා එතෙක් ධන දුන් නොතැන්සුවු හම**— එ පමණ ධන දුන්නා වූ මා හම. **ප්‍රත්‍යුපකාරයක්**— (ප්‍රති+උප...) කළ උපකාරයට පෙරළා උපකාරයක්. උප+කෘ+අ= උපකාර. **ධම් චින්තනායෙන්**— ධම්ය සිතීමෙන් චින්ත්+අ+ආ= චින්තනා.

2. **යක්ෂිණීන්**— යකින්නන්. යක්ෂණය (පිදීම) කරනු ලැබේ නු යි යක්ෂ යි. 'යක්ෂ්' (පිදීමෙහි) ධාතු යි. යක්ෂ+ඉනී 'ඉනී' ස්ත්‍රී ප්‍රත්‍යය යි.

3. **විෂාග්නි**— (විෂ + අග්නි) විෂ ගිනි. **දියෙන් නැගි**— විලැ දියෙහි හුන් නාගයා හරින හෙයින් ඒ ගිනි දියෙන් නැගි ගිනි යි. **සරණින් මැ**— සරණ (පිහිට) ලැබියැ යුතු තැනින් මැ. **දමින් පැලැහෙමින්**— දමවමින් පිළිස්සෙමින්.

4 **ජාත්‍යන්තරයෙහි**-- (ජාති + අනතරයෙහි) අන්‍ය ජාතියෙක්හි. **රන් පන්**— රන් (පියා) නටු.

6. **ඇලයෙහි**— අංශයෙහි.

7. **ගෝ වැ**— තල ගොයි වැ.

8. **ඉක්බිති ගෙයි**-- නමින් ගෙයට අනතුරු (ගෙය ළඟ මැ) ගෙයි. **මස් පිරිවුළ**--මස් තැගි කොටැ දීම **දඩැ හුණ**-- දඬයට වැටුණු කල්හි. ඔබර කළ හෙයින් අධිකරණයෙහි දී දඬ ගැසුම් කැ කලැ. **මොහු**-- ('මේ' යනු මෙ සේ ශුද්ධ කළ යුතු.) මේ බිළි වැද්දා. **නො දකුත**-- නො දක්නා කල්හි. **සිළි වලම ගියේ යැ**--- (තා ගේ) වස්ත්‍ර වනයට ගියේ යැ. සොරුන් විසින් ගන්නා ලදැ යි යු සේ යි.

## 39. ගොධාදිය

3. **වැරැදු හි**-- වැරැදි වැටි. **ගෑහැටි**-- නැළී.

4. **ලද්දෙදකෑ ලද්දේ**— ලැබුණු දෙයෙක්හි (දෙයෙකින්)

ලැබුණේ (ඉතිරි වූයේ.) **බ්‍රහ්මලෝක- පරායණ--** බ්‍රහ්ම ලෝකය පරම පිහිට කොටැ ඇති. බඹ ලොවැ ඉපැදුණු.

6 **අශක්‍යානුෂ්ඨානය--** (අශක්‍ය + අනුෂ්ඨාන) නො හැකි දෙයෙහි යෙදීම. ශක් + ය = ශක්‍ය. 'ශක්' (හැකි වීමෙහි) ධාතු යි. **භණ්ඩකාර--** ('භණ්ඩකාර' යනු මුද්‍රණ දෝෂ යි.)

7. **මනුක්**— මහාරජන. **ජීව ශූලයෙහි**— දිවස් හුලෙහි. පණ පිටින් හිඳුවන හුලෙහි. **පෙවු--** රඟ පෙවූ. සායම් පොවණ ලද. **රතක්**— රතු වස්ත්‍රයක්. **එකාංශ**— එකස්. එක් උර හිසක් වැසෙන සේ.

9. **ඇත් මිනිය**— ඇත් කුණ. **වත් මග හැසිරැ--** ඇතුළම වැදුණු මාර්ගය (සිදුර) ඇසිරි. **වම්ය--** සම. **ශිථිල--** ලිහිල්. බුරුල්. **විදැහි--** පළල් වී. **රූරා ගෙනැ--** සූරා ගෙනැ. වැගිරී ගෙනැ.

9. **මූලෝච්ඡින්න**— මුලුසුන්. මුල් සිඳුනා ලද. විනාශ. උද් + ඡිද් + න = උච්ඡින්න. **පරුෂභාවය--** පරුෂ (සැඩ) බව.

11. **ඇල වව--** අසින් වව. මහ හරුව. **සාරථිහු--** රථාචාර්‍ය්‍යා. **දැඩියනට--** තද (සැඩ) වූවන් හට. **දෙගනති--** දිනති. ජය ගනිති. **සි--** සිනා සී. 'සෙ' ධාතු යි. **හළ--** දුරු කළ. **සබා--** සැබෑ. **ධුර පැමිණෑ--** වාරය පැමිණි. **සුසුසු නම්** ඇති වැ.

## 40. ශෘගාලාදිය

1 **ස බෑ කෙනකු**— බෑයන් (සොහොයුරන්) ස දෙනකු **දැවාන**— ස්ඵටික. පළිඟු.

3. **මිහිවු**— මක්ෂිකයෝ.

4 **කිව්ස්සනට**— කිඹිසිම් සළවුන් හට. **ආ නො වැඩුවන්**— කිවිසි කලැ ලඟැ සිටියකු 'ආයුබෝවන්' කියනු ද කිවිසි තෙනැත්තාහු ද එයට 'ආයුබොවන්' කියනු ද සිරිති. **යක්ෂයා විසින්--** යකු ගෙන්.

6. **කාඤ්චන--** රන්. කාච් + අන = කාඤ්චන. 'කාච්' (දීප්තියෙහි) ධාතු යි.

7. **කුළු අසුට--** ශීලෑ නුවූ අශ්වයාට.

8. **මොර පිරිත්--** මයූර පරිත්‍රාණය. "උදේතයං චක්ඛුමා" යනාදි පිරිත. මොනරා විසින් පිරිවහන ලද හෙයින් 'මොර පිරිත්' නම් වී. **පිරිවහන්නාහු--** කීම අභ්‍යාස

කරන්නාහු. අභ්‍යාසයක් වශයෙන් යම් කිසිවක් කීම පිරිවැහීම සි.

**9. දඬු**— දඬුයෙහි. **අජ්ගු** — අශ්වයෝ.

**10. සාත්ම**— (ස + ආත්ම) ආත්මය (ජීවිතය) සමාන කොට. **වජ්‍ර කවචයෙකු**— විදුරුමුවා සන්නාහයෙකු. වජ් + ර = වජ්‍ර. 'වජ්' (ගමනයෙහි) ධාතු සි. කුමක් වුව ද කපා ගෙන යන හෙයින් මේ නම්. කය (වාතය) වළක්වනය කෙරේ නු සි. කවච සි. 'ක' යනු වාතයට නම්. 'වච්' (වළක්වනයෙහි) ධාතු සි. කවචය වාතයට ද ඇතුළු වන්නට නො දෙන හෙයින් යෙදෙයි.

---

## 41. ඉන්ද්‍රසමානගොත්‍රාදිය

**1. කාලාන්තරයෙකින්**— කල් යෑමෙකින්. **බහුශ්‍රැතතායෙන්**—බොහෝ උගත් බැවින්. බොහෝ වූ ශ්‍රැතය (ඇසූ බව- උගත් බව) යමක්හු ගේ ද ගේ බහුශ්‍රැත සි. බහුශ්‍රැතයා ගේ භාවය බහුශ්‍රැතතා යැ.

**2. නමා මෑ**— ('තමාට' යනු මුද්‍රණ දෝෂ සි.) ඒ ගින්න මැ. **සන්තර්පණය**— සැනැප්පීම. (පූජාදියෙන්) තෘප්තියට පැමිණවීම. **අකෘතඥ**— කළ ගුණ නො දත්. කෘතය දන්නුයේ කෘතඥ සි. න කෘතඥ අකෘතඥ.

**3. හස්ති මඞ්ගල**— ඇත් මගුල්. ඇතුන් ගේ දස් කම් දක්වීමට හවුරුද්දකට වරක් පැවැත්වෙන උත්සවය. ඒ මඞ්ගලයෙහි දී ප්‍රධාන වැ කට යුතු කරන්නුයේ හස්ති මඞ්ගල පුරෝහිත සි. **අන්‍යු**— අන්‍යයෝ. **හස්ති සූත්‍ර**— හස්ති ශාස්ත්‍රය. ඇතුන් හික්මැවීමට පාලකාප්‍ය ආදීන් විසින් උපදවන ලද ශාස්ත්‍රය. සූත්‍ර්+අ = සූත්‍ර 'සූත්‍ර්' (ගෙතීමෙහි) ධාතු සි. ශාස්ත්‍රයෙකැ ව්‍යවස්ථා සූත්‍ර නම්. **සඹිඳිම්**— නසම්. **දෙතිස් අකුරෙකු**— අකුරු (Syllables) තිස් දෙකෙකැ. මේ විවරණයෙහි 14 වන පිටෙහි අග වූයේ මෙබඳු ශ්ලෝකයෙකි. එහි එක් එක් පාදයෙහි අකුරු අට බැගින් වෙයි.

යස් | ය | ගන් | ධං | ස | මාස් | රු | ය

මේ ප්‍රථම පාදය අකුරු අටට ගැණෙන පරිදි සි. සෙස්සෙහි දු මෙ මැ නය සි. **සෝලෝවක්**— ශ්ලෝකයක්. **ග්‍රන්ථ**— දෙතිස් අකුරේ ශ්ලෝකයෙක් 'ග්‍රන්ථ' නම්. ග්‍රන්ථ්+අ. 'ග්‍රන්ථ්' (ගෙතීමෙහි) ධාතු සි. **නො විදහනා තුරු**—

විදහන්නට (ගෙවී යන්නට) පෙර. **වැටී කිණ**— මඟ හැරී වැටුණේ යැ. අත හැරී ගියේ යැ. **කඳුරු වරදවා පියන ලද**— හැදෑරීමෙහි දී (ඉගැනීමෙහි දී) වරද්දා ගන්නා ලද්දේ යැ. **සරු**— සරහා. **මධ්‍යයෙන්**— ඉදිරියෙහි. **අසම්භීත**— භීත නුවූ. කිසි බියක් නැති. සම් + භී + ත. න සම්භීත අසම්භීත. **සරාජිකා**— රජ සහිත. **පර්ෂද්**— පිරිස්. පෘෂ් + අද් = පර්ෂද්. 'පෘෂ්' (ඉසීමෙහි) ධාතු යි. **ශොකාතුර වූ**— ශොකයෙන් ලෙඩ වූ (පෙළුණු.) **සි පියා**— සිතා සී ලා.

**6. පෑ**— දක්වා. **ඔබ**— එ තැනට. **තුදුස් දහස්**— දස සතර දහස්. චතුද්දීශ සහස්‍ර.

**7. රූපාග්‍ර ප්‍රාප්ත වූ**— (රූප + අග්‍ර) රුවින් අග පැමිණි (සර්වොත්තම වූ.)

**9. රූසි**— සෘෂි. **සංවර්ත**— ලොකය විනාශයට පැමිණෙන කාලය. **විවර්ත**— ලොකය නැවැත නිර්මිත වන කාලය. විස්තර ධම්මප්‍රදීපිකාවෙහි වෙයි.

## 42. කල්‍යාණ ධම්මාදිය

**1. දද්දර**— ('දද්දර' යනු මුද්‍රණ දෝෂ යි.) **පැටගු**— පැටවා.

**5. කොහොහාන් කම්**—කුහක භාවය. නැති ගුණ ඇති සේ හැඟැවීම. **ආචාර සම්පන්න**— යහපත් පැවැතුම් ඇති. **අග්නි හොත්‍ර**— ගිනි පූජා. හු+ත්‍ර= හොත්‍ර. 'හු' (හොමයෙහි) ධාතු යි. **දෙවියන් උදෙසා** ගින්නෙහි ගිතෙල් ආදි යාග ද්‍රව්‍ය බැහීම හෝම නම්. **දූෂකයෙකු**— දූෂණය (කිලුටු) කරන්නෙකැ. **කමණ්ඩලු** **හෙද**— ජල පාත්‍ර බිඳීම. 'ක' නම් ජලය යි. 'මණ්ඩ' නම් සාරය යි. ජල සාරය ලාභය (ගැනීම) කෙරේ නු යි කමණ්ඩලු යි. 'ලා' (ගැනීමෙහි) ධාතු යි. ක + මණ්ඩ + ලා + උ. මන් + ඩ= මණ්ඩ. 'මන්' (උසස් කොට සැලැකීමෙහි) ධාතු යි.

**9. කුලීනයා ගේ**— කුලවතා ගේ. උසස් කුල ඇත්තා ගේ. කුලයා ගේ දරු කුලීන යි. **මා ඉඳුල්**— මා ගේ ඉඳුල්. **කරක්**— කරත හොත්. **උන්වා**— කිඳුවා.

**10. දුද්ද**— ('දුදද' යනු මුද්‍රණ දෝෂ යි.) **චිත්ත ප්‍රසාදය**— සිත පැහැදීම.

## 43. අසදෘශාදිය

1. **ලී**— ලියූ. **ඛෙමසථ**— නිරවුල්. නිරුපද්‍රැත.

2. **යන්ත්‍ර පාෂාණ**— යන්ත්‍ර බලයෙන් විසිදුවනු ලබන ගල්.

3. **නො මත් වූ**— මත් නුවූ. **කසට රස**— කහට දිය. **ගර්දභයන්**— ('ගද්‍රභයන්' යනු මුද්‍රණ දොෂ යි ) කොටළුවන්. බූරුවන්. ගර්දනය (නාදය) කෙරේ නු යි ගර්දභ යි. ගර්ද්+අභ. 'ගර්ද්' (නාදයෙහි) ධාතු යි.

5 **කම්කටුලින්**— දුකින්. කරදරයෙන් **සමාහිතො**— එකඟ සිත් ඇත්තේ. **යථාභූතං**— තත්වය. **පජානාති**— මැනැවින් දනී.

6. **විරස**— රස නැති.

10. **තිසරණ**— තුන් සරණය. **නියමු**— කණ්ණධාර. නැවේ කණ්ණිය (සුක්කානම) භාර වැ සිටින්නා. නැව පදවන්නා. Captain. **කරනැවැමියා**— නාවිකයා. ඇම්බැට්ටයා. කර නවාම් (කරයෙන් කැරෙන කම්) දතුයේ කරනැවැමි. **අනුමෙව්**— අනුමෝදන් වූ. 'අනුමෙවු' ධාතු යි. අනු වැ සතුටු වීම අනුමෝදනා යැ.

11. **බුන්නන්**— බිඳුණවුන්. **දෙසැ**— දෙස් යැ. සාක්ෂ්‍ය යි.

## 44. රැහකාදිය

1. **අස් සැද**— අශ්ව සජ්ජාව. අස් ඇඳුම. Saddle.

3. **උරින්**— හෘදයයෙන්. **පිටැ පෙළවා**— (තමන් ගේ) පිට උඩට වැටෙන සේ කොටැ. **කොටු**— කොටා. **පැසින්**— කුඩයෙන්. නො හොත් පෙට්ටියෙන්. **කිමෙක්**— (නෑ කමට) කවරෙක්.

3. (මේ වැරැදීමෙකි. 4 වියැ යුතු. අග දක්වා වැරැදුණු හෙයින් නො වෙනස් කැරෙයි.) **කඹා ගේ**— රජු ගේ.

4. **අන්තඃපුර**— ඇතුළු පුරය. රජු ගේ බිසොවුන් වසන මන්දිරාදිය ඇතුළු කොටැ, තැනුණේ අන්තඃපුරය යි. **ද්‍රෝහ**— විරුද්ධ කම්. අන්තඃපුර ස්ත්‍රියක හා අනාචාර.

5. **මිත්‍රාමිත්‍ර**— මිත්‍ර අමිත්‍ර. **කුශලාකුශල**— කුශල අකුශල. **අවිපරීත**— අනුකූල. අවිරුද්ධ. වි+පරි+ඉ+ත = විපරීත. 'වි' 'පරි' පූර්ව 'ඉ' ධාතු විරුද්ධ වැ යැමෙහි වැටේ. න විපරීත අවිපරීත.

7. **ඇලෑළෙන**— කැලෑඹෙන. රිදෙන.

8. **ගැහැවි**— ගෘහපති. **විප්‍රතිපන්න වූ**— විරුද්ධ ලෙස පිළිපැද්ද වූ (පැවැතුණා වූ.) වි+ප්‍රති+පද්+ත = විප්‍රතිපන්න.

9. **වයඃ සම්පන්න**— (සුදුසු) වයසින් යුත්. **සතර අගති**— ඡන්දය (අභිලාෂය,) ද්වේෂය, භය, මෝහය, යන අගති සතර. මෙහි අගති නම් අයුක්ති මාර්ගයෙහි යෑම යි. අගතියට වැටෙනුයේ මේ සතරින් එකක් හේතු කොටැ ගෙනැ යැ.

## 45. බන්ධනාගාරාදිය

1. **අපරිහීණධ්‍යාන වූ**— නො පිරිහුණු ධ්‍යාන ඇති වූ.

2. **කෙළිසිලු**— ක්‍රීඩාව ස්වභාවය කොටැ ඇති. කෙළනා සුලු. **ඥානවෘද්ධයන්**— නුවණින් වැඩි සිටියන්. **වයෝවෘද්ධයන්**— වයසින් වැඩි සිටියන්. **කෙළි**— කවට කම්. **අනප**— අවැඩ.

3. **ගඳකිළි කල**— ගන්ධකුටි භාවයට පමුණුවා ගත්.

4. **දිය කා**— දියෙහි වසන පක්ෂි විශේෂයෙකි.

5. **සාමුණෙයා**— ('සාමුණෙයා' යනු මුද්‍රණ දෝෂ යි.) **රූප ප්‍රශංසා**— රූප වර්ණනා. රුවට පැසැසුම්.

7. **දෙණෙහි**— (මිනී) පෙට්ටියෙහි.

9. **කුශල**— දක්ෂ. **නමන් දරුවන්**— ආර්ය පුද්ගලයන්.

10. **දල දස්**— දළ (දූඩි) වූ දසිය (එඩිය.)

## 46. සෝමදත්තාදිය

4. **ගූඪ**— සැඟැවුණු. **ප්‍රඥා සඞ්ඛ්‍යාත**— ප්‍රඥා යැ යි කියනු ලද.

8 **ය පළ**— ලෝහෝ (යකඩ) පළ. **මියන් කැ නැ යි**— මීයන් විසින් කන ලද්දේ නු යි. නු + යැ + යි = නැයි.

9. **ශත්‍රු විනාශ පූර්වඞ්ගම**— සතුරා ගේ විනාශය පෙරටු (මුල්) කොටැ ඇති.

## 47. ගර්හිතාදිය

4. **නිෂ්කරුණ**-- කරුණා රහිත.

10. **කාංචන පට්ටයක්**-- රන් පටක්.

11. **ධර්මාධිරාජ**-- ධර්මයට අග රජ වූ. **ත්‍රිභුවනේශ්වර**-- (භුවන + ඊශ්වර) තුන් ලොවට අධිපති වූ. **සුරාසුර ප්‍රජාපති**

**මකුට මණි ලලිත චරණ කමල ඇති**-- සුර-අසුර-බ්‍රහ්මයන් ගේ වොටුනු මිණින් බබළන්නා වූ පාද පද්ම ඇති. සුරාසුරබ්‍රහ්මයන් විසින් වඳනා ලද පා පියුම් ඇති. **ප්‍රජාවට** පති (ප්‍රධාන) වන හෙයින් බ්‍රහ්මයෝ ප්‍රජාපති නම් වෙති.

## 48. උපාහනාදිය

1. **ලෝ වැස්සන් කරන හසති ශික්ෂාව**-- සාමාන්‍ය ලොකයා කරන සේ ඇතුන් හික්මැවීම (හීලෑ කිරීම.) **යන්නට කල සංඥයෙහි සිටුනා පසිද්දෙන්**-- ඇතාට යන්නට සංඥා කළ කලැ (නො ගොස්) සිටුනා සැටියට. සංඥා කිරීම නම් දැන්වීම යි. **ලොක ශික්ෂාවට**— ලොකයා හික්මැවීමට. **ප්‍රතිපක්ෂ**— විරුද්ධ.

2 **කුදු පිටැද්** – කුදු ගේ පිටෙහින්. **ගැට**— (මොල්ලියක් වැනි) ගැටය. **තන් වූ පසිද්දෙන්**— තතු වූ (තත්ත්වය වූ) සැටියට. ශුභ **සංඥයෙන්**— 'ශුභ යැ' යි හැඟීමෙන්.

3. **වන විනාශය**— ('මත' යනු මුද්‍රණ දොෂ යි.)

4. **ලිය කිනනරාව**— සැලු ලිහිණි විවරණයෙහි 'ලිය කිඳුරඟන' යන්නට ලියූ ටිපපණිය බලන්නේ යැ.

6. **වාසනායෙන්**— පුරුද්දෙන්.

8. **නීල මණ්ඩූක වැ**— නිල් මැඩියා වැ. **කොමන**— මසුන් අල්ලන එ නම් උපකරණය.

9. **සැලෙන**— නටන. ප්‍රීත වන. **ඔ හට සිතා**— ඔහු සලකා. **යමයා**— යම රජු. **ඔන්තු**— එවුහු. ඇත්තාහු.

10 **ආවෙණික**— පරමපරාගත වැ අවුත් අයිති වූ.

## 49. සවිදංෂ්ට්‍රාදිය

1. **දැනෑ ගෙනෑ**— දිනා ගෙනැ. **දුනු**— දිනූ.

2. **බහන**— රන. ලණුව. **බන්ධන මුක්ත**— බැම්මෙන් මිදුණක්හු. **මුක්තියට**— මිදීමට. **පෙරදූරි**— පෙරටු.

3. **සමාදන්**— සමාදෘන. මිතා සේ ගැනීම.

4. **අසදෘශ**— අසමාන. **විහතමානයන්**— නසන ලද මානය ඇත්තන්.

6. **කොල් බිඳෑ ලන්නා වූ**— අසතොෂය හැඟැවීම සඳහා තොල් පෙරළා දක්වන්නා වූ.

7. **කණු කලෑ**— කණුවක් මෙන් ඉන්න සිටි වූ කලෑ. කැල අතු කපා වැටේ සිටුවනු සිරිති. **පක් කලෑ**— කොළු

හට ගත් කල්හි. **කැල**— එරබදු. **සාරපිහු**— රථාචාර්‍ය්‍යා. **සඩහන්**— ලකුණු. **සංශය**— සැකය. **සම් + ශි + අ = සංශය.** 'ශි' (ශයනයෙහි) ධාතු යි.

8. **වාණිජ**— වෙළෙඳ.

9. **කාමසුඛානුයෝගය**— (සුඛ + අනු) කාම් සැපයෙහි යෙදීම.

## 50. සඞ්කල්පාදිය

1. **කාමාතුර වැ**— (කාම + ආතුර) කාමයෙන් ලෙඩ වැ (පෙළි.)

2. **පත්තෙන්**— පතුරින්. **ගෙඩි**— බැම. පනර.

4 **ගෙන්**— ගෙයින්. **වැඩී**— වැඩුණා වූ.

5. **අතිපානයෙන්**— අධික කොමැ බීමෙන්. **අක්‍ෂම වැ**— (යනු) නො හැකි වැ. **අප්‍රමාණ**— ප්‍රමාණය ඉක්මැවූ.

7. **කථාන්තර**— (කථා + අන්තර) අන්‍ය කථාවක්.

9. **මෙගෙ නිමවමින්**— බත් අනුභව කෙරෙමින්. **දූතයෙකිමි**— පණිවුඩ ගෙනැ යන්නෙක්මි. දූ + ත = දූත. 'දූ' (ගමන්හි) ධාතු යි. **නසිද්**— නා ද. **ගෙරි**— ගවයන්.

## 51. පද්මාදිය

1. **නාසා හීන**— නාසය නැති. **පියුම් ගොව්වා**— නෙළුම් රකින්නා. **ශ්‍රෙෂ්ඨි පුත්‍රයන්**— සිටු පුතුන්. (ධනාදි වූ) ශ්‍රෙෂ්ඨය මෝ හට ඇත් හු යි (ශ්‍රෙෂ්ඨ + ඉන්) ශ්‍රෙෂ්ඨීන්. අතිශයින් ප්‍රශස්‍ය වූයේ ශ්‍රෙෂ්ඨ. ප්‍රශස්‍ය + ඉෂ්ඨ = ශ්‍ර + ඉෂ්ඨ = ශ්‍රෙෂ්ඨ. 'ප්‍රශස්‍ය' යන්නට 'ශ්‍ර' ආදෙශ යි. **නව**— නවුයේ යැ. නැති වූයේ යැ.

2. **ඔවුන්**-- ඒ දියණීයන්. **පෙරළා**-- නැවැතැ. **අසුණු**-- අගුණ.

3. **වුල්ල**-- ('චුල්ල' යනු මුද්‍රණ දොෂ යි) **ශඛඑ**-- නාටක. **අනුභාවයෙන්**-- බලයෙන් **නික්මුණ** - නික්මුණු කල්හි. **පෙලැඹි**-- ප්‍රලොභිත වැ. ආශා උපදවා. **කෝලට**-- දියෙහි තීරාසන්නයට. නො ගැඹුරු දිය 'කෝල්' නම්.

4. **කාශ වෙයාවච්ච**— ('වෙයාවච්චං' යනු මුද්‍රණ දොෂ යි.) **කුසින්** කරනු වතාවක්.

6. **කෙමැලිය**— කොමළ දෙන. **සම්භොගමය** — සම්භොගයක. **ලොමුදහ වූ**— (සාමීයෙන් වූ) රෝමෝද්ගම් ඇති වූ. **සිඹූ**— වැළඳී.

7. **මැඩූ**— පයින් සුනු කොටූ.

8. **ආරාම දූෂක**— උයන කෙලෙසන.

## 52. උදපාන දූෂකාදිය

1. **උදපාන** - උදක පානය. පැන් බීම.

2. **ආශ්‍රය වූ**— ඇසුරු කළ ප්‍රදේශය වූ. විමානය වනයෙහි වූයේ ය. එ හෙයින් වනය විමානයට ආශ්‍රය යි. ආ + ශ්‍රි + අ = ආශ්‍රය. 'ආ' පූර්ව 'ශ්‍රි' ධාතු ඇසුරු කිරීමෙහි වැටේ.

3. **කණ්ණ විවර**— කන් සිදුරු. **විප්‍රකාර**— වෙදනා. දරුණු කම්. වි + ප්‍ර + කෘ + අ.

5. **කලම්බකයෙක්**— කැලැමෙලක්. පලුද්දෙක්.

7. **මහිස**— මහිෂ. මීවූ. Buffalow. **නාග**— ඇත්.

8 **හිතකාමී**— වැඩ කැමැති. **සියොත්හු ගේ**— පක්ෂියා ගේ.

8. **පුටක**— (කොළ) ගොටුව.

9. **ශරණාගත වජ්‍ර පඤ්ජර**— (ශරණ + ආගත) පිහිට සොයා ආවවුනට විදුරු මැදිරියක් (Adamantine cage) වූ.

## 53. අභ්‍යන්තරාදිය

2. **බන්ධනාගාරයෙහි**— (බන්ධන + අගාර) දඬු ගෙයි. සිර ගෙයි. **මුල් කොටූ**— අරමුණු කොටූ.

3. **ගිල්ලු**— කෑ. **දනන**— දිනන.

4. **මහානුභාව වූ**— (රජ බවට පමුණුවන) මහ බල ඇති වූ.

5. **රොමයෙන්**— ලොමින්. **භවාග්‍ර** — භවයෙහි (ලොකයෙහි) අග්‍රයට. අන්තිම බ්‍රහ්ම ලොකයට.

6. **වධ්‍ය**— මැරිය යුතු. වධ + ය.

7. **විසරු ගුණුවන්**— පිස්සු වැටුණවුන්. **අලජ්ජී**— ලජ්ජා නැති. **අපරීක්ෂා**— නො විමසීම.

8 **මච්ඡුද්දාන**— ('මච්ඡුද්දාන' යනු මුද්‍රණ දෝෂ යි.) **මසු ගැලූ එ**— මත්ස්‍යයා විසින් ගිලින ලද. **පිසල්ල**— පෝමලිය ('පොට්ටනිය' යනු ගැමි වහර යි.)

9. **නෑකැත්තා**— නෑකාත්තියා. **ශුභස්**— නානතුරු ආදිය.

## 54. භද්‍රඝටාදිය

1. **භද්‍ර කුම්භය**— සිතූ පැතූ දෑ දෙන කළය.

2. **මූළු තැන පහල**— භොජන පැහැරූ ගත්.

3. **පොකුරු පතොක්කි**— නෙළුම් කොළයෙකැ.

4. **චතුෂ්පාදයන්**— සිවුපාවුන්. **භෛරව**— භය උපදවන. භී + රු = භීරු. බිය සුල්ලාට නම්. භීරුහු ගේ හු සි (භීරු + අ) භෛරව සි.

5. **කච්ඡප**— කැසුබු. කච්ඡයෙහි (තීරයෙහි) බොහුයේ කච්ඡප සි. කච්ඡ + පා + අ.

7. **විශෙෂයෙහි**— වෙසෙස් බැවෙහි.

8. **පරිච්ඡයෙන්**— පුරුද්දෙන්. **විප්‍රකාරයට**—කෙළියට.

9. **සිතාරා චතුකින් හසු වැ ගිය**— හාත් පසැ වතුරු ගලා මැදි වූ **කොක්නාවා**— වෘකයා. **ලොල** **චිත්තත්වය**—ලොල් සිත් ඇති බව.

## 55. චුල්ල කාලිඞ්ගාදිය

1. **දෙනෙකි සි**— දිනති සි. **පරාක්‍රම**— අනුන් මඩනා බලය. **දමන**— සිතෙහි සථිර භාවය. **සමාධි**— සිත එකඟ බව.

4. **රූක්ෂ**— රළු. රූක්ෂ් + අ. 'රූක්ෂ්'. (පරුෂ බැවෙහි) ධාතු සි. 'ර' 'ල' නො වෙනසි. **මරතු දු**—පහර දෙන කල්හි ද. **ශරබොයින්**— ගැරඬින්.

6. **රජ්ජුරුවන් කොරෙහි**— රජ්ජුරුවන් නිසා. රජ්ජුරුවනට අඹු වැ. **නෙරන්නට**— පලවා හරින්නට. **ශ්‍රී**— සම්පත්. **වුන්**— විදි. 'බස්' ආදි 'විදු' ධාතු සි. විදී-විදිති- වීනි-වූනු.

7. **කැහැල**— කැල. **ආරාධනා**— පූජා.

## 56. පූචිමන්දාදිය

3. **පරශු බරසා**— ('පරශු ධාරා' යනු මුද්‍රණ දෝෂ සි.) පොරෝ දරන්නා. වධකයා.

4. **ලොහො කුඹු**— ලොහො දියෙන් පිරුණ කළයක් වැනි හු සි එ නම් වි.

6. **සාමි**— බඩ හිමි ඇත්තෙමි. **ප්‍රතිබිම්බය**— පිළිරුව. **චන්ද්‍ර**— ('චන්ද්‍ර' යනු මුද්‍රණ දෝෂ සි.)

9. **සේ වටුවා**— සීලෑ වටුවා. අන් වටුවන් **අල්ලන්නට** යොදන සීලෑ වටු 'සේ වටු' නමි. 'සේ අලියා' යනාදිය වහරෙහි දු එයි. **භික්ඛවෙ**— මහණෙනි. **අහං**— මම. **චෙතනා**— සිත. **කම්මං**— කර්‍මය යි. **වදාමි**— කියමි.

## 57. කුටිදූෂකාදිය

1. **කදල්ල**— කූඩුව **ප්‍රත්‍යය**— හෙතු.

3. **එක්පට වහනක්**— තනි පට මිරිවැඩියක්. (උපානහයක්) **පත් කූඩුයක්**— තල් ආදී පතින් කළ කූඩුයක්.

4. **ඇත්මට**— ඇනිමට.

7. **ලාද්**— දමා ද. දැමීමෙනුත්.

8. **අනිත්‍යතා ප්‍රතිසංයුක්ත**— අනිත්‍යතායෙන් යුක්ත කරන ලද.

## 58. කොකාලෳාදිය

1. **කෙවිලි හඬ**— කොවුල් හඬ.

2. **සළු සෙව**— සියලු ධන. **නිශ්‍රය**— නිශ්‍රයය. නිර්+නී+අ=නිශ්‍රය. 'නිර්' පූර්‍ව 'නී' ධාතු නිශ්‍රයයෙහි වැටේ.

6. **සෘගාලයා**— සිවලා. 'අසෘජ්' යනු ලෙයට නමි. එය ආලාතය (නැනීම) කෙරේ නු සි සෘගාල සි. ආදි ස්වරය ලුප්ත වෙයි. මාංශව සජිත්‍ය (මැවීම) කෙරේ නු සි 'සෘගාල.' යැ සි ද කෙති. සෘජ්+ආල= සෘගාල. 'සෘජ්' (මැවීමෙහි) ධාතු සි.

"තාලව්‍යා අපි දන්ත්‍යාශ්ච ශම්බශම්බරශූකරාඃ
රශනා පි ච ජිහ්වායාඃ ශෘගාලඃ කලශොපි ච"

සි යු බැවින් මෙහි තන්හි 'ශ'කාරය ද 'ස' කාරය ද එක සේ යෙදෙයි. **ක්‍ෂුද්‍රයනට**— අල්පයනට. කුඩා වුවනට. ක්‍ෂුද්+ර. 'ක්‍ෂුද්' (පෙෂණයෙහි) ධාතු සි.

7. **තෘණයෙහි**— ('තණයෙහි' යනු මුද්‍රණ දෙෂ සි.)

9. **ප්‍රතිවචන මාත්‍රයක්**— පිළිතුරු වශයෙන් වචනයක් පමණකුත්. **නිර්විකල්ප වූ**— වෙනසක් නො සිතා. තුදුන ද දුන ද සමාන කල්පනා (අදහස්) ඇති වූ.

12. **කඩා ගෙනැ ගී**— (කද) කඩා ගෙනැ (බිමැ) වැටි. **භව සම්පත්තියක්**— ඉපැදීමෙන් ලබන (සසර) සැපයක්.

## 59. වානරාදිය

1. **ඇතෑ දියෙහි**-- දියෙන් එ ගොඩැ.

2. **පක්ෂිණීය ගේ**-- ('පක්ෂියා ගේ' යනු මුද්‍රණ දෝෂ යි.) කිරිල්ල ගේ.

6. **කන් කුළක් සා**-- කන් කුළක් පමණ. ගෙයි කෙළවරෙකැ පරාල කොන් එක් කොටැ සම්බන්ධ කරන ස්ථානය කන් සළු නම්. **ශ කුලක්**-- අඞ්ඃ කූටයක්. ලොහො කුළු ගෙහියක්. **නිරුපද්‍රැත වැ**-- උපද්‍රව නැති වැ. නිර්+උප+ද්‍රැ+ත.

7. **කිසුණු පරිකම්**-- කසිණ භාවනාවට පිළියෙළ වීම. භාවනාවට පළමු කළ යුතු දෑ පරිකම් යි.

## 60. මණිකුණ්ඩලාදිය

4. **උරසි ද**-- ඖරස. වැඩි වූ පරිදි පාවා ගත් සමාන ස්ත්‍රියක කුසෙහි තම හට දා වූ. **මරණ සි**-- මරණ සිහි. මරණානුස්මෘති.

7. **වලහා**-- වලහා. මහ හැරැ.

10. **සුපණ්**-- ගුරුළු. ශෝභන වූ පණ් (පියා පත්) යමක්හු ගේ ද ගේ සුපණ්. **භවනයෙහි**-- විමානයෙහි.

11. **ප්‍රාකාරයෙකැ**-- පවුරෙක් යැ.

## 61. වණ්ණාරොහාදිය

1. **සිඳිවූ**-- සිඳුවන ලද. ස්ථිර කරන ලද. **හීනොත්සාහ**-- (හීන+උත්සාහ) ක්ෂය වූ (නැසුණු) උත්සාහ ඇති. උත්සාහ රහිත.

4. **ආහිතුණ්ඩිකයා**-- නයින් නටවන්නා. අහි තුණ්ඩයෙන් (නයි තුඩින්) දිවි රක්නේ ආහිතුණ්ඩික යි. **පැලෑ**-- පලා ගිය.

5. **මධුවණ් වූ**-- මී පැණියෙහි වැනි වණ්ය ඇති.

6. **තරවා**-- තර කොටැ. **උගුරු ගෙනැ**-- ග්‍රීවායෙහි (ගෙලින්) අල්ලා ගෙනැ.

7. **ග්‍රාම ජාත**-- ගම්හි උපන්.

8. **ඔසුපත්**-- උත්සද. නරක විස්තර ධම්ප්‍රදීපිකායෙහි ආයේ යැ. **චක්‍රායුධයෙන්**— සකක් මෙන් වට වූ ආයුධයෙන්. **යථාලාභ සන්තොෂයක්**— ලද දෑයින් සතුටු වීමක්.

## 62. දිසිති කොසලාදිය

1. **ගුරු වචනයට**— මවු-පියන් ගේ කීමට. **උල්ලඞ්ඝනයක්**— උඩින් පැනැ යැමක්. උද්+ලංඝ්+අන.

3. **විද්‍යාභ්‍යාස කළා වූ**— ශාස්ත්‍රය පුරුදු කළ.

4. **සමකන්**— සැමියන්. **මස් වෙස්**— මත්‍ස්‍ය වෙශය. **පහන්නා හා**— පැනීම හා සමඟ. **ගඩුව**— කැටිය. **සි සූ**— සිනා සුණු. 'සෙ' (සීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාතය 'සි' යනු සි. 'සූ' යනු නිරර්ථක සි.

5. **කණපාත**— පරෙවි.

6. **අද්වෙෂයෙහි**— ද්වේෂ නො කිරීමෙහි.

7. **ඔහු පයට අස්සෙන්**— චණ්ඩාලයා ගේ පා අතරින්. එසේ යැම පහත් බව හැඟැවීමෙකි.

9. **එක වණ්**— ඒ පර්වතයේ රශ්මිය වැදීමෙන් ලං වූ සියල්ලෝ එක් පැහැ වෙති.

10. **සද්ම ගබ්සෙන්**— පියුම් ගැබින් (ඇතුළින්.)

11. **ශාඩ**— ගිජු ලිහිණි. **වෙරම්බ වාතයෙන්**— වෙරම්බ නම් වූ අතිචණ්ඩ මාරුතයෙන්.

12. **අනුතත් විලැ**— අනවතප්ත විලෙහි. හිමාලයයෙහි විලෙක් ල. හිරු රැසින් නො තැවෙන හෙයින් ඒ නම්. **පා පහළවන්**— පය ගැසූවන්. (ධර්මයට) පැමිණියවුන්. 'පහර' ධාතු සි. පහරී- පහරිති- පහළි- පහළ.

## 63. කුක්කුටාදිය

1. **බැලෑල**— බැළැලිය. 'බළල්' යනු ස්ත්‍රී ප්‍රත්‍යය ගෙනැ 'බැළැල්' යැ සි සිටී.

2. **බඳ ගෙනැ**— (සොනහයෙන් ඔමින්) වැලැඳැ ගෙනැ. යහළු කොටැ ගෙනැ.

5. **කඹුරු පුර වෙසෙහි**— කම්කාරයන් ගේ නගරයේ වීථියෙහි.

7. **විදසා**— නැති කොටැ. **දත් සිපිහෙළු**— දීම කඩ කළ.

9. **එසින්**— මල් සිඹීමෙන්.

10. **කෙලෙසි**— කිලිටි වැ. ගුණ නැති වැ.

## 64. කූස්කු ආදිය

1 **කැණි ඔබල**— පරළු කොන් එක් කොට වද්දන ස්ථානය.

5. **විලෝපනය**— සොරෙන්. ගැනීම. වි + ලුප් + අන = විලෝපන. 'ලුප්' (වැනැසීමෙහි) ධාතු යි.

6. **චෛතසික**— සිත පිළිබඳ. චෙතස් + ඉක.

7. **චක්ෂුසින්**— ඇසින්. චක්ෂ් + උස්. 'චක්ෂ්' (දැකීමෙහි) ධාතු යි.

8. **පැවැරුව ද**— පැවැරූ නමුත්. පැවැරීම නම් "මෙය පිළිගනුව" යි යැදීම යි. **යාචඤා**— ('යාඥ')යනු මුද්‍රණ දෝෂ යි.) යැදීම. යාච් + න + ආ. 'යාච්' (යැදීමෙහි) ධාතු යි.

9. **දශීන**— දැකීම.

## 65. ගන්ධාරාදිය

**ආලම්බනය**— අරමුණු. **ග්‍රාමාන්තයට**— ගම අසලට. **මාත්‍රාවෙක**— ටිකෙක.

2 **ජීවිත සංශයයට**— දිවි පිළිබඳ සැකයට. දිවි රැකේ දෝ නො රැකේ දෝ යන සැකයට. **පිටින්**— තමා ගේ පිටින්. **කෘතඝ්න**— කළ ගුණ නැසූ. කෘත + හන් + අ. **පරාල ඇට**— ඉල ඇට. වඳුරාණන් ගේ හෘදයය ඉවැසීම පිණිමට කළ පළිඟු මැඳුරක් වැන්නැ. ඉල ඇට ඒ මැඳුරෙහි පරාල වැන්නැ. **ඛෙදයෙක්**— ශොකයෙක්. ඛිද් + අ. 'ඛිද්' (ශොකයෙහි) ධාතු යි.

3. **මද අරමුණෙක්**— සුළු කාරණයක්. **වෛරාග්‍යයෙන්**— නො ඇලීමෙන්. වි+රජ + අ = විරාග. 'රජ' ධාතු ඇලීමෙහි වැටේ. 'වි' පූර්ව වූ කලැ විරුද්ධාර්ථය දෙයි. විරාගයා ගේ භාවය වෛරාග්‍ය යි.

8 **තිබී ආ**-- පැවැතැ ආ. **සංග්‍රහය**-- රැකුම් කිරීම. සම් + ග්‍රහ් + අ.

9. **නිද්‍රා ප්‍රාප්ත**-- නින්දට පැමිණි. නි + ද්‍රා + අ + ආ. 'ද්‍රා' (නිදීමෙහි) ධාතු යි. **මනස්කාරයෙහි**-- මෙනෙහි කිරීමෙහි. සිහිවිල්ලෙහි. **නිරත වැ**-- ඇලී. නි + රම් + ත.

10. **කොමු**-- කුල්මාෂ. අඩක් තැම්බූ ලද තිරිඟු කබල ආදිය කුල්මාෂ නාමයෙන් ගැණේ. **ජාතිස්මරණ ඥානයෙන්**-- පෙර ජාති සිහි කරන නුවණින්.

11. **ඛිහිඹි**— කුඩා කුඹුඹු. **භාෂිතයෙහි**— කීමෙහි,

## 66. කාත්‍යායන්‍යාදිය

3. **ගණිකාව**— වෙශ්‍යාව. වෙසඟන ස්වාමි වූ ගණයක් (සමූහයක්) ඇත්තී ගණිකා යැ. ගණ + ඉක + ආ

8 **දක්ෂිණාවට**— පූජාවට.

9. **නිබඳයෙන්**— නො කඩ වැ. **දූන**— දූන් කලැ. දූන් හෙයින්. **වෙශ්‍යාව**— වෙසඟන. වෙශ්‍යට (පිරිසමට) හිත වූවා වෙශ්‍යා යැ. විශ් + ය = වෙශ්‍ය. ‘විශ්’ (ප්‍රවෙශයෙහි) ධාතු යි. ස්ත්‍රී ප්‍රත්‍යයය ‘ආ’ එක් වූ කලැ වෙශ්‍යා. **දිවුණු**— ද්විගුණයක්. **අනුභව කැමැති බව මුත්**— (මා හා සමෙහාගය) විඳිනු කැමැති බව ඇතත්. **වස්තුවට සිනෙහැති**— ධනයට ආශා ඇති. ලොභී.

10. **දිවිශා**— දිවි (ද්වීප- ලං) ඇඟියේ දිව්.

12. **සහමල්පල**— පුෂ්ප ඵල සහිත වූ **ඒ රුක**— ඒ දිඹුල් කණුව. **ගිරු සන්දේශයෙහි**— “දිරු වැමෙන තුරු තුර” යනාදිය මේ සඳහා කියැවිණ.

## 67. හරිතවාදිය

1. අඩ **වාළු**— අඩක් වැසුවා. ‘අඩවල්’ යනු ගැමි වහරි. **කසිණය**— භාවනාවට අරමුණු කැරෙන පෘථිවි ආදිය කසිණ නම්. ‘කසිණ’ (කෘත්ස්න) යන්නෙහි අර්ථ ‘සියල්ල’ යනු යි. කසිණය සියල්ල කොටැ ගෙනැ අන් කිසිවක් නො සලකා හැරියැ යුතු හෙයින් ඒ නම්.

3. **ආර්ත ස්වරය**— දුක් හඬ. ආ + ඍ + ත. ‘ඍ’ (පෙළීමෙහි) ධාතු යි.

4. **සක්වා** - එ නම් ලිහිණියා.

6. **දානව රාක්ෂසයා**— දානව නම් අසුර වර්ගයට අයත් රකුස්සා. කශ්‍යප භාර්‍යා වූ දනුව ගේ පුත් (දනු + අ) දානව යි.

7. **පූති**— කුණු. පූය + ති. (‘ය’ ලොප් වෙයි. ‘පූය’ (විශරණයෙහි- කුණු වීමෙහි- (Decomposition.) ධාතු යි. **පරීෂණය**— සෙවීම. පරි + ඉෂ් + අන.

8. **ප්‍රභාවය**— උත්කෘෂ්ට භාවය. මහත් බලය. **ත්‍රිභුවනාතිශායී**— (ත්‍රි භුවන + අතිශායී) තුන් ලොව ඉක්මැ සිටුනා සුලු. තුන් ලොව ප්‍රමාණයට වඩා අධික ප්‍රමාණ ඇති. අති + ශී + ඉන්. ධාතු ස්වරයට වෘද්ධි වෙයි.

**9. තිව්‍ර— තියුණු.** අත්‍යුග්‍ර. **තීව්+ර.** 'තීව්' (මහත් බැවිහි) ධාතු යි.

**10. බ්‍රහ්මචර්‍ය්‍යා නිඃශ්‍රිත වූ**— බ්‍රහ්ම චර්‍ය්‍යාව විසින් ඇසුරු කරන ලද. බ්‍රහ්ම චර්‍ය්‍යාව හා සම්බන්ධ වූ.

---

## 68. චතුඃපෞෂධිකාදිය

---

**3. පාදපරිචාරිකා**— භාර්‍ය්‍යා. පාද පරිචරණය (පාද සේවාව) කරන්නී පාද පරිචාරිකා යැ. පාද සේවා නම් පා සේදීම් තෙල් ගැල්වීම් ආදිය යි. මේ භාර්‍ය්‍යාවකගේ මෙහෙ යැ.

**4. කාය ප්‍රයෝගයක්**— කාය යෙදීමක්. **වාක් ප්‍රයෝගයක්**— වචනය යෙදීමක්.

**7. පරමායුෂයෙන්**— හැකි තරම් දීර්ඝ වූ ආයුෂයෙන්. **අණකුඩු**— අණක් (අංශුවක්- ස්වල්ප වූ කොටසක්) වත්.

**10. තෛල**— තෙල්. තිලයෙහි (තල ඇටෙහි) වූයේ (තිල+අ) තෛල යි. **සුනු සුණකුඩු** – සුනු ටිකක් වුව ද. **දානාභිරත**— දානයෙහි අතිශයින් ඇලුණු. අභි+රම්+ත.

---

## 69. චක්‍රවාකාදිය

---

**1. අතෘප්ත වූ**— තෘප්තියට නො පැමිණි. අතෘප්ත වූයේ මතු කියැවෙන කාකයා යැ. **කාමන්**— ඒ සක්වා බෝ සතුන්.

**5. කොට කොටු**— අල සෑරීමෙන් දළ දෙක කොට වී යැ. **ච**— මෙව. **ඉඟි**— අභිප්‍රාය.

**6. අනුරූප**— සමාන. **පය පහළවනට**— පය පැහැරුවූවනට. පා ගැහුවනට.

**7. කාමාවචර**— කාම ලෝකයට අයත්. කාමයෙහි අවචරණය (හැසිරීම) කරනුයේ කාමාවචර යි. **දශ කුශල කර්‍ම පථ ධර්‍මයෙහි**— දශ පුණ්‍ය ක්‍රියා මාර්‍ගයෙහි වූ දහම්හි.

**8. සුපිණ්ඩන**—('සුරඤ්' යනු මුද්‍රණ දෝෂ යි.)

**9. බිකා**— භාර්‍යය.

**10. ආයුඃසංස්කාරය**— ආයුෂ ශක්තිය. **අනුදන්වා**— ශ්‍රිවිස්වා

## 70. දශරථාදිය

1. **කුලජ්‍යෙෂ්ඨයන් ගේ**— කුල දෙටුවන් ගේ.

2. **අදණ්ඩයෙන් අශස්ත්‍රයෙන්**— දඬු නො ගෙනැ සැත් (ආයුධ) නො ගෙනැ. යුද්ධ නැති වැ සැ යු ෙස් සි.

**වඩබා මුඛ**— මුහුදින් නරකයට දිය ගන්නා දොර ම නෙමැ යි බෞද්ධයෝ යෙති. 'වඩබා' යනු වෙළෙඹට නමි. මුහුදු පත්ලෙහි වෙළෙඹ වෙසින් සරන ගින්නැ යි ද එය යුගාන්තයෙහි ලොව වනසති යි ද පුරාණ කාරයෝ කියත්. **දවවා**— දිවෙන්නට සලස්වා. **රසයෙන්**— ජලයෙන්.

6 **ද්වීපාන්තරයකට**— එක්තරා දිවයිනකට. **සමුද්‍රෝත්පාත**— (සමුද්‍ර + උත්පාත) මුහුදෙ ඉහළ නැගීම. කුණාටු. **වචනකරයන්**— කීවා කරන්නන්.

7. **අසාධ්‍ය**— සුව නො කළ හැකි. සාධ් + ය. **ශොකාතිසාරයෙන්**— (තුන් රජයෙකින් පිරිහුණු) ශොකයෙන් ඇති වූ අතීසාර රොගයෙන්. අතිශයින් සාරණය (රෙචනය) කෙරේ නු යි අතීසාර යි. අති + සෘ + අ. 'සෘ' (යැමෙහි) ධාතු යි. 'අතීසාර' යනු ද යෙදෙයි.

8. **නරකසරායණ වන්නා වූ**— අඥනයෝ රජ බවෙහි සිටැ එ සේ වෙති. එ හෙත් බෝ සත්තු එ බඳු වූ රජ බවෙහි සිටැ ධර්මයෙහි පිහිටිය හ.

9. **මිනිස් ලොව දඩවැද්ද**-- මනුෂ්‍ය ලොක නමැති වනයට වැදී. **අධර්මාගයන්**-- අධර්ම නමැති මුවන්.

10. **ප්‍රපාතයෙහි**-- කෙළින් සිටි පර්වතාංශයෙහි. එයින් ප්‍රපතනය වේ නු යි ප්‍රපාත යි. ප්‍ර + පත් + අ.

12. **පවත් කොටැ** - ප්‍රවෘත්ත කොටැ. උපදවා.

## 71. ආම්‍රාදිය

1. **අවමාන**-- ('ආවමාන' යනු මුද්‍රණ දෝෂ යි.) අවමන්. **සම්මානයෙනුදු**— ('සම්මානෙයනුදු' යනු මුද්‍රණ දෝෂ යි) සම්භාවනායෙනුත්. ගෞරවයෙනුත්. **පූජ්‍ය**-- පිදියැ යුතු. පූජ් + ය.

3. **කරු**-- ග්‍රීවායෙහි. **ගණ්ඨාවක්**— ('ගණ්ඨාරයක්' යනු මුද්‍රණ දෝෂ යි.) ගණ්ඨ් + අ + ආ. 'ගණ්ඨ්' (කීමෙහි) ධාතු යි. **පැළඹකැ**— සනම්හයෙකැ. **අක්ෂණවෙධි වූ**-- විදු ලිය එළියෙන් විදිනා සුළු වූ. මෙ සේ අරුත් බිණුව ද සංස්කෘතයෙහි

'අසඤ්ඤ' යනු විදු ලියට නම් වන බවෙක් නො පෙනේ. විධ් + ඉන්=වෙධින්. 'විධ්' (විදීමෙහි) ධාතු යි. **ධනුර්ධරයන්**-- ('ධනුධීරයන්' යනු මුද්‍රණ දොෂ යි ) දුනු දරන්නන්. **ශර**--හී. **ජව වෙග**-- ශීඝ්‍ර භාවයා ගේ බලය. ජව් + අ. 'ජව්' (ඉක්මනෙහි) ධාතු යි. විජ් + අ= වෙග. 'විජ්' කම්පනයෙහි) ධාතු යි.

4. **කනකාඤ්ජලි**-- (කනක + අඤ්ජලි) රන් දෝහොත්. දෝහොත පුරා රන්.

5. **ඉද්දේ**-- එල්ලේ. **පිළ කඩ**-- වෙදිකාව. අවට බිමට වඩා උස් කොටැ (පිළක් කොටැ) බඳනා ලද්දේ පිළ කඩ යි. **සාලෙකැ**-- සාලක් යැ. අමුණු විස්සෙක් සාල නම්. ඒ ගැල් බරෙකි.

6. **නොලුණු නොඇඹුල්**-- ලුණු ඇඹුල් නැති. **කර පලා**-- කර කොළ පලා. **ඉඳුරා**-- සෘජු වැ. අනුකූල වැ.

7. **දුර්භාෂිතයෙන්**-- නපුරු වචනයෙන්. **අරාළ-පිඞ්ගලාදීන්**-- 'අරාළ' යනු මෙහි (වෙශ්‍යා ගෘහයට ගිය) සිටු පුතු සඳහා කියැවිණැ යි හැගේ. හෙතු නො පැහැදිලි යැ. 'පිඞ්ගල' යනු කැරලාම නම්. **කින්නරයන්**-- කිඳුරන්.

9. **ශරභ**--පා අටක් ඇති මෘග විශෙෂයෙක් ල. **නිවන්හි පහරවා**—නිවනෙහි ගාවා. නිවන හා සම්බන්ධ කොටැ.

## 72. ශාලිකෙදාරාදිය

1. **ක්ෂෙත්‍රයෙහි**— කුඹුරෙහි. **මවුන් පිණිස කනෙකි ලූ කොලක් සා** — මවුන් ගේ දනය පිණිස කොනෙකැ බැඳැ ලූ වී කරල් මිටියක් තරම් වූ. මවුන් ගේ දනය පිණිස වී කරල් මිටියක් වෙන් කොටැ බැඳැ තබනු සිරිති. **බඳ**— අසු කොටැ.

2. **පිළිබඳ වූ**— ප්‍රතිබද්ධ වූ. බැඳුණා වූ. **විෂපීත**— විෂ පොවන ලද. පා + ත= පීත.

5. **ශපථ**-- දිවිරීම. ශප් + අථ. 'ශප්' (ශාපයෙහි) ධාතු යි. "ඉදින් මා කීවා නො සබා වී නම් මට මෙ බඳු විපතෙක් වේ වා" යැ යි ශාප කරන හෙයින් 'ශපථ' නම්.

6. **පුත්‍ර වර**— පුත්‍ර ලාභයට වර.

7. **ජාති මානය**— (උසස්) ජන්මය නිසා වූ අහඞ්කාරය. **ජටා මණ්ඩලයෙහි**— ගෙතුණු කෙශ කලාපයෙහි.

8. **හිස බිම බලවා**-- පයින් උඩැ එල්ලූ හෙයිනි.

9. **මරු භූමියෙහි**—වැලි බිමැ. **ගිමැ**—ග්‍රීෂ්මයෙහි. **භස්ම**—අළු. හස්+මන්= හසමන්. 'හස්' (දීප්තියෙහි) ධාතු යි.

## 73. ස්වාධීන- රාජාදිය

1. **ස්වාධීන**-- (ස්ව+අධීන) තමා මැ අධිපති වූ. අනුනට යටත් නුවූ. පාලියෙහි 'සාධීන' යනු යි.

2. **ගුණ හෙයින්**— ගුණ හෙතුයෙන්. ගුණ වශයෙන්. **සදෙවක**—දෙවියන් සහිත.

4. **සිහින් ඉසිලූ**-- සිහි කළ.

6. **අමු රන්**-- පිරි සුදු නො කළ රන්. **තෙළුඹු දළ**—තෙළුම් දළු. **සහවොටුනු**-- වොටුන්න සහිත. **ආදි කියන්නට පටන් ගත්**-- තමන් විසින් මැ පළමු කියන්නට පටන් ගත්. කැපූ හිසෙහි මුඛයෙනුත් සාධුකාර කියැවෙන සේ යැ යි හැඟැවූ සැටි යි. **දේ වයි**— "දේව" යැ යි. දෙතත්. **දූතාභිරතිය**-- (දූත+අභිරතිය) දූතාශාව. අභි+රම්+ති. **පදාති**-- පා බල සෙනඟ. පාදයෙන් අතනය (යෑම) කරන්නේ පදාති යි. පාද+අත්+ඉ. 'පාද' යන්නට පදාදෙශ යි. 'අත්' (ගමන්හි) ධාතු යි.

9. **දඩ වැදෑ**-- වනයට වැදී.

## 74. සෞමනස්‍යාදිය

1. **මූර්ඛයන්**-- මෝඩයන්. මුහ්+ඛ= මූර්ඛ. 'මුහ්' (මුළාවෙහි) ධාතු යි. 'මුර්' ආදෙශ යි.

2. **ශ්වාස**— සුස්ම.

3. **හඹමින්**— ලුහුබඳවමින්. **ලුණු කර**— අතිශයින් ලුණු රස ඇති. 'ලුණු' යනු ද 'කර' යනු ද එකාර්ථ යි. **පර්‍යවසානයෙහි**— (පරි+අව...) කෙළවර.

5. **ය ගෙහි**— අයො ගෘහයෙහි. ලොහයෙන් කළ ගෙයි.

6. **අතැ ගී**— අතට වැටී. අසු වැ.

10. **බුද්ධි සම්පන්නයන්**— නුවණැත්තවුන්.

11. **අත්තෙන් වැරැදූ**— අත්තෙන් වැරැදී. අත්ත අත හැරී. **ඇලයෙහි**— අංශයෙහි. **පමා වැ**— පරීක්ෂා නැති වැ. **එක නමා ආත්මයෙහි**— තනි වූ තමා ගේ ජීවිතයට.

12. **අනුපාද**-- උපද්‍රව (බාධා) රහිත. **පහරවා**-- දක්වා. (කීවත්) දක්නා තාක්.

## 75. උදක- රාක්ෂසාදිය

2. ශිම්— වැටීම්.

3. **කුෂ්ඨ**— ('කුෂ්ට' යනු මුද්‍රණ දෝෂ සි.) හොරි. ශරීරය — ඉරා කා සි කුෂ්ඨ සි. කුෂ් + ඨ. 'කුෂ්' (ඉරීමෙහි) ධාතු සි.

7. **විසංඥ වැ**— සිහි සන් නැති වැ. සංඥාව (හැඟීම) — විගත වූයේ යමකු කෙරෙන් ද හේ විසංඥ සි. **කාම විකාර**— කාමයෙන් වූ විපර්‍යාස.

## 76. නලිනාදිය

1 **අනිවාර්‍යතාව**— නො වැළැක්විය හැකි බව. නි + වෘ + ය = නිවාර්‍ය. 'නි' පූර්ව 'වෘ' ධාතු වැළැක්වීමෙහි වැටේ.

3. **විමති**— විරුද්ධ අදහස්. වි + මන් + ති.

8 **සේනක පාශයෙන්**— සේනක නමැති බන්ධනයෙන් (මලින්.)

## 77. සුධාභෝජනාදිය

1. **අදත්තාභිරත**— දත්තාභිරත (දනයෙහි ඇලුණකු) නුවූ.

3 **නො ගොළු වූ ද ගොළු වැ**— ගොළු නුවුව ද ගොළුවකු මෙන් වී.

8. **පෙහෙවැ**— පෝෂධ ශීලය සමාදන් වැ. **පා විලිඹින්**— පයේ විලුඹින්. **කම් කටුල්**— දරුණු වධ.

9. **නුවටා ගේ**— නිර්ගුණයා ගේ. නීචයා ගේ.

10. **යක්ෂයා ගේ ලය තුමූ ...ගන්නාහු**— යක්ෂයා ගේ සිත තුමූ දිනා ගන්නාහු.

11. **අටළොස් අක්ෂෞහිණියක්**— අක්ෂෞහිණී දහ අටක්. ඇතුන් 21870 ද, අසුන් 21870 ද, රිය 65610 ද, පදාති 109350 ද ඇති සේනාව අක්ෂෞහිණී නම්. **වචනානුස්මරණයෙන්**— (වචන + අනු...) කීම් සිහි කිරීමෙන්. **බුන්**— බින්දු වූ.

13 **වජ්‍රාසනයෙහි පහරවා**— වජ්‍රාසනයෙහි වැඩැ හිඳිනා තාක්. **රක්ෂා මන්ත්‍ර**— ආරක්ෂා මන්ත්‍ර.

14. **අවිචිය**— ('අවීචිය' යනු මුද්‍රණ දෝෂ සි.) **ආවාසී කා කෙරෙම් ද ?**— කා ආවාසී කෙරෙම් ද ? **දූරාතිදූර යැ**— (දූර + අති...) දුරිනුත් ඉතා මැ දුර යැ.

15. **සෙල සිඝක්**— එක් සිය පනසක්. **කාරුණා කූසම්සෙහි**— කරුණාව ඇතුළතැ. **ආයීයෝ**— සතර මග සතර ඵලයට පැමිණියෝ උසස් බවට යන්නෝ ආයීයෝ යැ. සා + ය. 'සා' (ගමන්හි) ධාතු යි. **අනායීයෝ**— ආයී නො වන්නෝ. **අපායසථයෝ ශැ යි**— ('යි' යනු යොදා ගත යුතු.) අපායයෙහි සිටියාහු යැ යි. **දශ දිග්භාග වර්ති වූ**— දශ දිශා ප්‍රදෙශයන්හි පවත්නා වූ. **රස**— සවභාවය. **ත්‍රිකූට පර්වතයෙහි**— මෙරුව තුන් කුළක් ඇති පර්වතයෙකැ මුදුනෙහි පිහිටියේ ල. **අනොලොඹු**— (අත් + ඔලොඹු) හස්තාවලම්බය. අත් වැල. පිහිට. **ධම්මො ධම්මචාරිං හවෙ රක්ඛති**— ධර්මය (තෙමේ) ධර්මචාරීහු ඒකාන්තයෙන් රකී. **ධම්මො සුචිණ්ණො සුඛං ආවහාති**— ධර්මය තෙමේ මොනොවට අභ්‍යාස කරන ලද්දේ සුවය එළවයි. **ධම්මෙ සුචිණ්ණෙ එසො ආනිසංසො**— ධර්මය මොනොවට අභ්‍යාස කරන ලද කල්හි මේ අනුසස යි. **ධම්මචාරී දුග්ගතිං න ගච්ඡති**— ධර්මචාරී තෙමේ දුර්ගතියට නො යෙයි. **ප්‍රතිශරණ**— පිළිසරණ. පිහිට.

---

**දහම් සරණ විවරණයෙහි ප්‍රථම භාගය**
**නිමියේ යැ.**



